This is a digital copy of a book that was preserved for generations on library shelves before it was carefully scanned by Google as part of a project to make the world's books discoverable online.

It has survived long enough for the copyright to expire and the book to enter the public domain. A public domain book is one that was never subject to copyright or whose legal copyright term has expired. Whether a book is in the public domain may vary country to country. Public domain books are our gateways to the past, representing a wealth of history, culture and knowledge that's often difficult to discover.

Marks, notations and other marginalia present in the original volume will appear in this file - a reminder of this book's long journey from the publisher to a library and finally to you.

Usage guidelines

Google is proud to partner with libraries to digitize public domain materials and make them widely accessible. Public domain books belong to the public and we are merely their custodians. Nevertheless, this work is expensive, so in order to keep providing this resource, we have taken steps to prevent abuse by commercial parties, including placing technical restrictions on automated querying.

We also ask that you:

+ *Make non-commercial use of the files* We designed Google Book Search for use by individuals, and we request that you use these files for personal, non-commercial purposes.
+ *Refrain from automated querying* Do not send automated queries of any sort to Google's system: If you are conducting research on machine translation, optical character recognition or other areas where access to a large amount of text is helpful, please contact us. We encourage the use of public domain materials for these purposes and may be able to help.
+ *Maintain attribution* The Google "watermark" you see on each file is essential for informing people about this project and helping them find additional materials through Google Book Search. Please do not remove it.
+ *Keep it legal* Whatever your use, remember that you are responsible for ensuring that what you are doing is legal. Do not assume that just because we believe a book is in the public domain for users in the United States, that the work is also in the public domain for users in other countries. Whether a book is still in copyright varies from country to country, and we can't offer guidance on whether any specific use of any specific book is allowed. Please do not assume that a book's appearance in Google Book Search means it can be used in any manner anywhere in the world. Copyright infringement liability can be quite severe.

About Google Book Search

Google's mission is to organize the world's information and to make it universally accessible and useful. Google Book Search helps readers discover the world's books while helping authors and publishers reach new audiences. You can search through the full text of this book on the web at http://books.google.com/

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

Ind L 4103.9

Harvard College Library

THE BEQUEST OF

Charles R. Lanman

PROFESSOR OF SANSKRIT

1880–1926

Digitized by Google

164
18

THE

MAHÁWAṆSA.

FROM

FIRST TO THIRTY-SIXTH CHAPTER.

TRANSLATED AND EDITED, UNDER ORDERS OF THE CEYLON GOVERNMENT,

BY

H. SUMANGALA,
HIGH PRIEST OF ADAM'S PEAK,

AND

DON ANDRIS DE SILVA BATUWANTUDAWA,
PANDIT.

COLOMBO:
FRANK LUKER, ACTING GOVERNMENT PRINTER, CEYLON.

1883.

Digitized by Google

Digitized by Google

TO

HIS EXCELLENCY

THE RIGHT HONOURABLE

SIR WILLIAM HENRY GREGORY,

KNIGHT COMMANDER OF THE MOST DISTINGUISHED ORDER OF SAINT MICHAEL AND SAINT GEORGE, GOVERNOR AND COMMANDER-IN-CHIEF IN AND OVER THE ISLAND OF CEYLON,

THE FRIEND AND PATRON OF IMPROVEMENT,

UNDER WHOSE ORDERS THIS WORK HAS BEEN TRANSLATED AND PUBLISHED;

AND

WHOSE ADMINISTRATION HAS BEEN SO HIGHLY CONDUCIVE

TO THE ELEVATION OF THE NATIVES,

AND

THE IMPROVEMENT OF THEIR LITERATURE:

THIS WORK IS RESPECTFULLY INSCRIBED

BY THE TRANSLATORS.

24th January, 1877.

Digitized by Google

Digitized by Google

INTRODUCTION.

මහාවංශය.

“මහතං වංසො පවෙණි මහාවංසො” යනුවෙන් බුද්ධාදී මහතුන්ගේ පරම්පරාව මහාවංශයයි කියනුලැබේ. මේ ප්‍රකරණය සිංහලාර්ථකථා මහාවංශයයිද ව්‍යවහාරයි—ඒ සිංහල කථාව වැඩි විස්තර යැර අබුහැත් ආචාර්‍ය්‍යපරම්පරාවෙන් ඇසූ නියායෙන් පූර්වා දික්සඳ සෙනෙවියා පිරිවෙන් මාහිමි, මහානාම මහතෙරුන් විසින් ගාථා බන්ධනයෙන් රචනාකරණලදී. බුදුන් පිරිනිවී අවුරුදු දෙසිය සතිස් වන්නෙහි ලඞ්කාරාජ්‍යාභිෂෙකලත් දෙවෙනි පැතිස් මහරජනන් සෙනෙවියෙක් දික්පිළි සඳනා හෙයින් දීඝසන්ද සේනාපතියයි ප්‍රසිද්ධවිය. ඒ සේනාපතිහු මහෙන්ද්‍රස්ථවිර ප්‍රමුඛ මහාසඞ්ඝයා විසින් බඳනා ලද මහාසීමායෙහි මෙකල් මල්වතු හොයයි ව්‍යවහාරවූ කොළොම්හෝ තෙර තැනවූ සුළුවාගෙය, දික්සඳ සෙනෙවියා පිරිවෙන් නම්වී—බුදුන් පිරිනිවි හවුරුදු අටසියයක් පමණ කාලයෙහි මේ දෙවන පැතිස් රජහුගෙන් අවුරුදු පන්සියයකින් පසු රජවූ මහසෙන් මහරජනන් දවස මේ මහාවංශයෙහි පූර්ව්භාගය හෙවත් අතිරේකයක් සහිත සතිස් පරිච්ඡේදය කොට නිමියේය.

මේ තෙමේ මහාකාව්‍යලක්ෂණයෙන් උපලක්ෂිතයි.

ආචාර්‍ය්‍ය දණ්ඩින් විසින් කාව්‍යාදර්ශයෙහි.

“සර්ගබන්ධො මහාකාව්‍යමුච්‍යතෙ තස්‍ය ලක්ෂණම්,
ආශීර්නමස්ක්‍රියාවස්තු නිර්දේශොවාපි තන්මුඛම්.”

පරිච්ඡේද බන්ධන ඇතොත් මහාකාව්‍ය නම්වේ. එහි ලක්ෂණ කියනුලැබේ—ඒ මහාකාව්‍යයාගේ ආරම්භය ආශීර්වාද හෝ නමස්කාර හෝ වස්තු නිර්දේශ හෝ වෙයි.

විදග්ධමුඛ මණ්ඩනයෙහි,

“සිද්ධෞෂධානි භවදුඃඛමහාගදානාං
පුණ්‍යාත්මනාං පරමකර්ණරසායනානි,
ප්‍රක්ෂාලනෛක සලිලානි මනොමලානාං
ශෞද්ධොදනෙඃ ප්‍රවචනානි චිරං ජයන්ති.”

මේ ආදීන් ආශීර්වාද පෙරටු කාව්‍ය දතයුතු.

Digitized by Google

වාග්භටයෙහි,

"රාගාදි රෝගාන් සතතානුෂක්තා
නශේෂකායප්‍රසෘතානශේෂාන්,
ඖත්සුක්‍යමෝහාරතිදාන් ජඝාන
යෝ 'පූර්වවෛද්‍යාය නමෝ'ස්තු තස්මෛ."

නමස්කාර පූර්වවචන පරිදි මෙසේයි.

මාඝකාව්‍යයෙහි.

"ශ්‍රියඃපතිඃ ශ්‍රීමති ශාසිතුං ජග
ජ්ජගන්නිවාසො වසුදෙවසද්මනි,
වසන් දදර්ශාවතරන්තමම්බරා
ද්ධිරණ්‍යගර්භාංගභුවං මුනිං හරිඃ."

මේආදිය වස්තු නිර්දේශයි—තවද "නමස්සිත්වාන සම්බුද්ධං" යනාදි ගාථාචතුෂ්කයෙන් සංඥාදි පචකය හා ප්‍රකරණ ප්‍රකාරදිය දක්වනලදී. මෙහි පූර්වගාථාර්ධය මහාකාව්‍යකරණයෙහි අභීෂ්ටදෙවතා නමස්කාරයි.

මහාවංසං යනු සංඥායි—බුද්ධාදි මහතුන්ගේ වංශානුයාත ශාසන ප්‍රවෘත්තිකථනය ඇසියව්ජනයා නිමිත්තයි. පවක්ඛාමි යන උත්තම පුරුෂෙක වචන යුක්තින් අධ්‍යාහාර කරණලද අහං යන්නෙන් ගම්‍යවූ මහානාමස්ථවිරතෙම කර්තෘයි. මහාවංසං ශබ්දයට විශේෂණවූ "නානානූනාධිකාරිකං" යන පදයෙන් කර්තෘහු තමන්ප්‍රාරබ්ධ ප්‍රකරණයෙහි ආකාර ප්‍රමාණ දක්වති—පුරාතනයන් විසින් අර්ථකථාසිංහලමහාවංශය කළනමුත් ඒ අයොග්‍ය බැව් ද්වෙන ගාථාවෙන් දක්වති—තුන්වන ගාථාවෙන් තමන්කරණ ප්‍රකරණයෙහි පිළිපැදීම් සුකර බැව් දක්විම් උපායෙන් ප්‍රයොජන දක්වති—එහිම "සුතිතොච උපාගතං" යන සත්රවනපාදයෙන් තමන් කරණ ප්‍රකරණයෙහි උනුතැන් පූරවන බැව්දක්වති.

"අනුපමං වංසවරගයාවංදිනං
සබ්බං අනාකූලං තථ්සුපකාසිතං,
අරියාගතං උත්තමසබ්භිවණ්ණිතං
සුණථාතු දීපප්පුති සාධු සනාතනං."

මේ සිංහල අටුවා කථා නයින්ම වංශයාගේ මහත්බව ප්‍රකාශකරණලදී, එසේම.

"දීපාගමනං බුද්ධස්ස ධාතූනං බොධියාගමං,
සංගහාථේරවාදඤ්ච දීපෙයි සාසනාගමං,
නරින්දාගමනං වංසං කිත්තයිස්සං සුණාථමෙ"

මේ ගාථාවෙනුදු මහාවංසයාගේ සඩ්බත මහත්බව ප්‍රකාශ කරණලදී.

"සුණාථ සබ්බෙ පණිධාය මානසං
වංසං පවක්ඛාමි පරම්පරාගතං,
අතිප්පසන්නං බහුනාධිවණ්ණිතං
එතංහි නානාකුසුමං'ව ගන්ථිතං."

යනාදීන් මහාවංසයයි කියනලද මේ කථායෙහි ශාසනකථා ප්‍රධානකොට රාජ පරම්පරා කථායි. ලඞ්කාවීපයෙහි ඒ දෙදෙනාගේ පැවැත්ම දක්වන්නෙන් තුන්ප්‍රකාරයක් හැගෙයි. මෙහි ශාසන කථා නම් බුද්ධානුශාසනය හා ඒ ශාසනය පැවැති පරිදිද ලඞ්කාවීපයෙහි පැවැති රාජපරම්පරා හා ඒ ඒ රාජරාජමහාමාත්‍යාදීන් විසින් ශාසනය පැවැත්වූ පරිදිද ශාසනයට උපස්ථම්භ කළ පරිදිද කලක් ලක්දිවිහි පැවැති පරිදිද මෙහි දක්වනලදී.

මෙහි පස්වන ගාථා පටන් එකොළොස්වැනන අවසන්කොට ගාථා සතින් දීපඞ්කරාදි සූවිසි බුදුන් දැක ඒ බුදුවරයන්ගෙන් විවරණලැබ පාරමීන් සියල්ල පූරවා බුදුබව ලත්පරිදි කීමෙන් බුද්ධභාවයෙහි මහිමයත් ඓශ්වර්‍යාදි හේතුවකින් හෝ සංසාරෙන් පහනී හේතුවකින් හෝ නොව පූර්ණ සම්භාර භරණයෙන් එය ලැබිය යුතුබැව් ප්‍රකාශකෙරෙති.

මෙසින් සූවිසි විවරණ දක්වත්—මෙහි සූවිසි විවරණ නම්:-විසිසතර බුදුකෙනෙකුන්විසින් "තෙපි මෙතෙක්කල් ගිය තැන මෙබඳු ගොත්‍රයක ඉපිද මෙබඳු මෙබඳු මහත් ක්‍රියාකොට මෙනම් බෝධියක් මුල මාරවිජයකොට බුදුවනහුයහ" යි යනාදිය ප්‍රකාශකිරීමයි —මෙහි දීපඞ්කර බුදුන්කල අපමහ බෝසතාණෝ බමුණුමහසල් කුලයක ඉපිද පිතු පිතාමහාදීන්ගෙන් තමහට පැමිනි සම්පත් යාචකයන් විෂයෙහි පරිත්‍යාගකොට සඞ්ගනාවූ සියජන පරිජනයා නොතකා හිමව්පියස් වැද තපස් කරමින් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ලැබ වසනුයෝ එම බුදුන් හමුව එම බුදුන්ගෙන් සතරපද ගාථාවක් ඇසූ පමණින් පිළිසිඹියා සහිත රහත්ඵල ලබන්ට මහපින් ඇතිවත් හස්තප්‍රාප්ත ඒ නිර්වාණ සම්පත්තිය සංසාර දුඃඛයක් සෙයින් හැර සත්වයන් සඳහා සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලෙහි විඳිනා සංසාර දුඃඛය නිර්වාණය සෙයින් සලකා බුද්ධභාවය ප්‍රාර්ථනා සිය ජීවිතය බුදුන්ට පරිත්‍යාග කෙළේය. එම දීපඞ්කර භගවත්හුද මහාපුරිසා අදහස් දැන "මෙසින් සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් මතු ගෞතම නමින් බුදුවනහුයහ" යි වදාළහ.

එතැන් පටන් පාරමී සම්භරණය පටන්ගත්තාහූ අසඞ්ඛ්‍යයක් කප් ගෙවූහ, එකල කොණ්ඩඤ්ඤ නම් බුදුකෙනෙක් ලොව පහළවූසේක, එකල අප බෝසතාණෝ විජිතාවී නම් සක්විතිව වසනුවෝ බුදුන් ප්‍රමුඛවූ මහසඟනට මහදන්දී ඒ බුදුන්ගෙනුදු

"මෙයින් තුන් අසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයක් ගියකල බුදුවන්නේය" යි විවරණ ලදහ.—එයිනුදු කප්අසඞ්ඛ්‍යයක් ගියකල එක් කල්පයෙක්හිම මඞ්ගලය සුමනය රේවතය සෝභිතයයි සතර බුදුකෙනෙක් ලොව පහලවූහ, මඞ්ගල බුදුන් දවස අපමහ බෝසතානෝ සුරුචි නම් බමුණෙක්ව බුදුන් ප්‍රධාන මහසඟනට සත්දවසක් පස්ගෝරස දන්දී අවසාන දවස්හි පාපුරවා බෙහෙත් පිණිස ගිතෙල් මී උක්සකුරු දන් දුන්හ, ඒ බුදුහු අනුමෙවෙනි වදරා "මේ පුරුෂතෙමේ දෙයාසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයකින් මතෙහි ගෞතම නමින් බුදුවන්නේය" යි ප්‍රකාශකළහ.—ඉන්මෑත භාගයෙහි ලොව පහලවූ සුමන නම් බුදුන් දවස අපමහ බෝසතානෝ මහර්ධි මහානුභාව සම්පන්න නාරජක්ව වසනුවෝ බුදුකෙනෙක් ලොව පහලවූහයි අසා නෑසමූහයා විසින් පිරිවරණ ලද්දාහු නාලොවින් නික්ම අවුත් සපිරිවර බුදුන්ට දිව්‍යතූර්‍ය්‍යයෙන් පූජාකරවා මහදන් පවත්වා එකි එකී වහන්සේට සළුසහලක් බැගින් දන්දී සරණයෙහි පිහිටියහ. ඒ සුමන නම් තථාගතයෝ "මේ තෙමේ එනකල බුදුවන්නේය" යි විවරණ දුන්සේක.

එයින් මෑතභාගයෙහි රේවත නම් බුදුහු ලොව පහලවූහ. එකල බෝසතානෝ අතිදෙව නම් බමුණෙක්ව සතරහු දහම් අසා තිසරණ පිහිටා ඉස ඇඳිලි බැඳගෙණ ඒ සතරහු කෙලෙස් ප්‍රහාණයෙහි ගුණවණ උතුරුසළුවෙන් පිදූහ. එහිදීද "මේ තෙමේ එනකල බුදුවන්නේය" යි විවරණ කළහ.—ඉන් මෑත භාගයෙහි සෝභිත නම් බුදුහු ලොව පහලවූහ. එකල බෝසතානෝ අජිත නම් බමුණෙක්ව බුදුහු දහම් අසා සරණ පිහිටා සපිරිවර බුදුන්ට මහදන් දුන්හ. එහිදීද "මේතෙමේ එනකල බුදුවන්නේය" යි වදාළහ.

ඉන් මෑතභාගයෙහි කප් අසඞ්ඛ්‍යයක් ගියකල එක් කල්පයෙක්හි අනෝමදස්සීය පදුමය නාරදයයි යන බුදුවරයෝ ලොව පහලවූහ. ඉන් අනෝමදස්සි බුදුන් දවස අපමහ බෝසතානෝ මහර්ධි මහානුභාව සම්පන්න යක්සෙනෙවියෙක්ව නොයෙක් කෙලසුවහස් යක්‍ෂයන්ට අධිපතිවූහ, ඒ තෙමේ බුදුන් ලොව පහලවූබැව් අසා අවුත් සපිරිවර බුදුන්ට මහදන් දුන්නේය. ඒ ශාස්තෘතෙමේද "මොහු අනාගතයෙහි බුදුවන්නාහ" යි වදාළසේක.—ඉන් අපරභාගයෙහි පදුම නම් බුදුකෙනෙක් ලොව පහලවූහ. එකල අපමහ බෝසතානෝ කිසිපාපයකින් සිංහයෝනියෙහි ඉපිද වනලැහැබෙක නිරෝධ සමාපත්තියෙන් වැඩහුන් ඒ බුදුන් දැක ඒ අරමුණුකොට උපන් ප්‍රීතිය නොහැර ගොදුරටද නොගොස් සත්දවසක් උන්වහන්සේ ඇසුරුකොටගෙණ විසූහ,

Digitized by Google

ශාස්තෘතෙමේ සත්දවස් ඇවෑමෙන් සිංහයා බලා "මේතෙමේ සඞ්ඝයා වඳනේය සඞ්ඝතෙමේ ඒවා" යි ඉටුසේක, එකෙණෙහි භික්ෂූහු වැඩිසේක්ලාය, සිංහතෙමේද සඞ්ඝයා දැක සිත පැහැද විය, ශාස්තෘතෙමේ ඔහු සිත බලා "මේතෙමේ අනාගතයෙහි බුදුවන්නේය" යි වදාළසේක—ඉන් මෑතභාගයෙහි නාරද නම් භාග්‍යවතුන් වහන්සේ ලොව පහළවූහ, එකල අපමහ බෝසතාණෝ තවුස් පැවිද්දෙන් පැවිදිව පමාභිඥ අෂ්ටසමාපත්ති ලාභීව වහනුසෙවා සපිරිවර බුදුන්ට රක්ත චන්දනයෙන් පූජාකළහ, ඒ ශාස්තෘහුද "මේතෙමේ අනාගතයෙහි බුදුවන්නේය" යි විවරණ දුන්සේක.

ඉන් මෑතභාගයෙහි මෙයින් කල්පලක්ෂයකින් මත්තෙහි පදුමුත්තර නම් සර්වඥකෙනෙක් ලොව පහළවූහ, එකල අප මහබෝසත් තෙමේ ජටිල නම් මහරැටියෙක්ව බුදුන් ප්‍රධාන සඞ්ඝයාට සිවුරු දන් දීනි, ඒ සර්වඥයෝද "මේතෙමේ මතු බුදුවන්නේය" යි වදාළහ, එකල මිථ්‍යාදෘෂ්ටික තීර්ථකයෝ නූවූහ. දෙව් මිනිස් සියල්ලෝ තුනුරුවන් සරණ ගතවූමය—ඉන් කල්ප තිස්දහසකින් මෑත එක්කල්පයෙක්හි සුමෙධය සුජාතය යන බුදුවරයෝ දෙදෙනෙක් ලොව පහළවූහ. එයින් සුමෙධ නම් බුදුන් දවස අපමහ බෝසත්තෙමේ උත්තර නම් මානවකව නිධානගතව තුබූ අසූකෙළක් ධන වියදම්කොට සඞ්පිරිස් සහිත බුදුන්ට මහදන්දී බණඅසා තිසරණ පිහිටා ගිහියෙන් නික්ම පැවිදිවිය. ඒ බුදුහුද "මේතෙමේ අනාගත කාලයෙහි බුදුවන්නේය" යි වදාළෝ. ඒ බුදුන්ගෙන් මෑතකාලයෙහි සුජාත නම් ශාස්තෘකෙනෙක් ලොව පහළවූහ, එකල අපමහ බෝසතාණෝ සක්විති රජව බුදුකෙනෙක් ලොව පහළවියයි අසා උන්වහන්සේ කරා එළඹ දහම්අසා සඞ්පිරිස් සහිත බුදුන්ට සත්රුවනින් උපලක්ෂිත සිවුදිවිහි මහරජය පුදා උන්වහන්සේ වෙත පැවිදිවූහ, සියලු රටවාසීහු උපදනා අයගෙණ ආරාමික කෘත්‍යසාධනතාහු බුදුන් ප්‍රධාන මහසඞ්ඝයාට මහදන් දුන්නෝයි. ඒ සර්වඥයෝද "මේතෙමේ මතු බුදුවන්නේය" යි වදාළහ—ඉන් මෑතභාගයෙහි මින් එක්දහස් අටසියයක් කපින් මතුයෙහි එක් කපෙක්හිදීම පියදස්සීය අත්ථදස්සීය ධම්මදස්සීයයි තුන්බුදුවරයෝ ලොව පහළවූහ, එයින් පියදස්සී නම් බුදුන් දවස අප මහසත්හු කාශ්‍යපනම් මානවකව ත්‍රිවෙද පාරගතවූහු සතරහු දම්දෙසුම් අසා කෙළසුවහස් ධන පරිත්‍යාගයෙන් සඞරමක් කරවාදී සරණ සිල්හි පිහිටියහ, ඒ සර්වඥයෝද "එක්දහස් අටසියයක් කප්ගිය කල මේතෙමේ බුදුවන්නේය" යි වදාළහ—ඉන් මෑතභාගයෙහි අත්ථදස්සී නම් භගවත්හු ලොව පහළවූහ. එකල මහ

Digitized by Google

සත්‍වූ සුසීම නම් මහත් සෘද්ධිඇති තව්සක්ව දෙව්ලොවින් මදූරා මල්කුඩයක් ගෙණවුත් බුදුන් පිදූහ. ඒ සර්වඥයෝද "මේතෙමේ අනාගතයෙහි බුදුවන්නෝය"යි වදාළෝ. ඉන් මෑතභාගයෙහි ධම්මදස්සී නම් ශාස්තෲකෙනෙක් උපන. එකල බෝසතාණෝ සක්දෙව්රජව දිව්ගඳ මලින්හා දිව්‍යතූර්‍ය්‍යයෙන් පිදූහ, ඒ සර්වඥයෝද "මේතෙමේ මතු අනාගතයෙහි බුදුවන්නෝය"යි වදාළහ.

ඉන් මෑතභාගයෙහි මෙයින් සූවානූ කපකින් මතුයෙහි එක් කල්පයෙක සිද්ධාර්ථ නම් බුදුකෙනෙක් ලොව පහළවූහ, එකල බෝසතාණෝ උග්‍රතේජස් ඇති අභිඥ බලසම්පන්න මංගල නම් මහ තව්සක්ව වසනුවෝ මහ දඹඵලයක් ගෙණ තථාගතයන්ට දන් දුන්හ. උන්වහන්සේද එය වළඳා "සූවානූ කපකින් මතෙහි බුදුවන්නෝය"යි වදාළහ——ඉන් මෑතභාගයෙහි මින් දෙයානූකපකින් මතෙහි තිස්සය පුස්සයයිලද නම්ඇති බුදුවරයෝ දෙදෙනෙක් ලොව පහළවූහ, එයින් තිස්ස නම් බුදුන් දවස අප මහබෝසතාණෝ මහත් භොග හා යසස්ඇති සුජාත නම් ක්ෂත්‍රියව තවුස් පැවිද්දෙන් පැවිදිව මහසෘෂියට පැමින වසනුවෝ බුදුහූ ලොව පහළවූහයි අසා දිව්මඳාරා පියුම් පරසතුමල් ගෙණ සිවුපිරිස් මැද වඩනා තථාගතයන් පිදූහ, ඒ පිදූමල් අහස වියන්ව සිටියේය. ඒ ශාස්තෲතෙමේද "මේතෙමේ එනකල බුදුවන්නෝය"යි වදාළසේක——ඉන් මෑතභාගයෙහි පුස්ස නම් බුදුහු ලොව පහළවූසේක, එකල බෝසත්හු විජිතාවී නම් ක්ෂත්‍රියව වසනුවෝ රජය හැර බුදුන්වෙත පැවිද්ව තෙවළා බණ ඉගෙණ මහජනයාහට දහම් දෙස්මින් සීලපාරමින් පිරූහ, ඒ ශාස්තෲහු "මේතෙමේ මෙයින් දෙයානූ කපකින් මතෙහි බුදුවන්නෝය"යි වදාළහ ·· ඉන් මෑතභාගයෙහි මෙයින් ඒකානූ කපකින් මතෙහි විපස්සී නම් බුදුකෙනෙක් ලොව පහළවූහ, එකල අප මහසත්හූ මහර්ධි මහානුභාව ඇති අතුලනම් නාරජව වසනුවෝ සත්රුවන් එබ්බූ රුවන් මහ පුටුවකින් බුදුන් පිදීය, උන්වහන්සේද "මේතෙමේ මතු බුදුවන්නේයැ"යි වදාළහ——ඉන් මෑතභාගයෙහි මෙයින් එක්තිස්වන කප සිඛිය වෙස්සභූයයි යන බුදුවරයෝ දෙදෙනෙක් ලොව පහළවූහ, එයින් සිඛි නම් බුදුන් දවස අපමහ බෝසතාණෝ අරිඳම නම් රජව බුදුන් ප්‍රධාන සඞ්ඝයාට සිවුරු සහිතව මහදන් පවත්වා සප්තරත්නයෙන් ශොබිතවූ ඇතෙකු පූදා ඇතු පමණකොට කැපබඩු පිදූහ, උන්වහන්සේද "මේතෙමේ එනකල බුදුවන්නෝය"යි වදාළෝ——ඉන් මෑතභාගයෙහි වෙස්සභූ නම් බුදුකෙනෙක් ලොව පහළවූහ, එකල අප මහ බෝසතාණෝ සුදර්ශන නම් රජෙක්ව බුදුන් ප්‍රධාන සඞ්ඝයාට

Digitized by Google

සිවුරු සහිත මහදන්දී උන්වහන්සේ වෙත පැවිදිව ආචාර ගුණයෙන් යුක්තව බුදුරුවන්හි සැලකිම් බහුලවූහ, උන්වහන්සේද "මේතෙමේ එනකල බුදුවන්නේය" යි වදාළෝ——ඉන් මෑතභාගයෙහි මේ මහාභද්‍රකල්පයෙහිම කකුසඳය කෝණාගමනය කාශ්‍යපය අප භගවත්හුයයි සතර බුදුකෙනෙක් ලොව පහළවූහු, කකුසඳ බුදුන් දවස අප මහසත්හු ඛෙම නම් රජව බුදුන් ප්‍රධාන සඞ්ඝයාට පාසිවුරු සහිත මහදන් හා අඳුන් ආදී බෙහෙත්ද දන්දී බුදුහුවෙත දහම් අසා පැවිදිවූහ, ඒ ශාස්තෘන් වහන්සේද විවරණ දුන්සේක——ඉන් මෑතභාගයෙහි කෝණගමන නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූසේක, එකල බෝසතාණෝ පව්වත නම් රජව ඇමැති සමූහයා විසින් පිරිවැරුවෝ බුදුන්වෙත එළඹ දම්දෙසුම් අසා බුදුන් ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා පවරා මහදන් පවත්වා පත්‍රෝර්ණ චීනපට කෝෂෙය කම්බලද රත්පටද දන්දී උන්වහන්සේවෙත පැවිදිවූහ, උන්වහන්සේද "මේතෙමේ බුදුවන්නේය" යි වදාළසේක.

ඉන් මෑතභාගයෙහි කාශ්‍යප නම් ශාස්තෘන් වහන්සේ ලොව පහළවූසේක, එකල අපමහ බෝසතාණෝ ජෝතිපාල නම් මානවකව තුන්වෙද පරතෙර පැමිණියෝ ඝටීකාර සූත්‍රයෙහි වදාළ නියායෙන් ඝටීකාර නම් අනාගාමී උපාසකයන් කැටිව බුදුන්කරා එළඹ බණඅසා පැවිදිව වීර්‍ය වඩනානාහු තෙවලාව ඉගෙණ වත්පිළිවෙත් සම්පතින් බුදුසසුන් හෙබූහ,ඒ බුදුහුද විවරණ දුන්හ.

මෙසේ යටකී ආකාරයෙන් ලොකයෙහි මොහඳුරු දුරලා උපන් සුවිසි බුදුන්ගෙන් ලබනලද විවරණ අභිෂෙක ඇතිසේක් දශපාරමිය දශ උපපාරමිය දශ පරමාර්ථ පාරමිය යන සමතිස් පෙරුම් පුරා කෙළවර වෙසතුරු අත්බැව්හි සිට මහදන්දී සත් යළක් මිහිකත ගුගුරුවා අවි කෙළවර තුසී පුරයෙහි ඉපිද එහි ආයු කෙළවරතෙක් වැස දසදහස් ලෝදෑහි දෙව් බඹුන් විසින්.

"කාලො'යංතෙ මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං,
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සු අමතං පදං" යි අයදනා ලදුයේ පස්මහ බැලුම් බලා එසින් සැව ශාක්‍ය රජකුලයෙහි ඉපිදගෙණ එහි මහත්සිරින් පොෂණයකරණු ලබනුයේ අනුක්‍රමයෙන් නවයොවුන් පත්ව තුන්රිතුවට සුදුසුවූ තුන්පහයෙහි දෙව්සිරි බඳු රජසිරි අනුභව කෙරෙමින් උයන් කෙළියට යනුයේ අනුක්‍රමයෙන් ජරාජීර්ණය ව්‍යාධිගතය මෘතයයි කියනලද තුන් පූර්වනිමිති දැක හටගත් සංවෙග ඇතිව නැවතී සතරවෙනිවර පැවිදී වේසය දැක පැවිදු මැනවයි ඊට රුචි උපදවා උයන්වැද එහි දවස ගෙවා මගුල්පොකුණ වෙත ගුන්නේ කපු

වෙස් ගෙණ එලඹියාවූ විස්කම් දෙව්පිත්හු විසින් සැදුම් ලදුයේ රහල් කුමරහු උපන් පවත් අසා පුත්‍රස්නෙහයාගේ බලවත්බැව් දැන මේ බැම්ම තරවන්ට පළමුවෙන් සිඳින්නෙමැයි සිතා පස් වරු නුවරට වදිමින්.

"නිබ්බුතා නූන සාමාතා නිබ්බුතො නූන සො පිතා,
නිබ්බුතා නූන සා නාරී යස්සායං ඊදිසො පති" යි නැන්

දණියන් ඇයනිවූ කෘශාගොතමිය විසින් කියනලද මේ ගය අසා මම මැයවිසින් නිබ්බුත පදය අස්වන ලදුයෙමැයි සතුටුව කරපැලඳි මුත්හර ගලවා ඇයවෙත යවා තමා විමන් වැද ශ්‍රී යහනෙහි හුන්නේ නාටිකාවන්ගේ විප්‍රකාර දැක කලකිරුණු සිත් ඇත්තේ ජනනායා පුබුදුවා කණ්ඨක නම් අසු ගෙන්වා ඒ අසු නැගී ජනනායා යහළුකොට ඇතියේ දසදහස් ලෝදැහි දෙවියන් විසින් පිරිවැරූයේ මහාබිනික්මන්කොට අනෝමා හෝතෙරදී පැවිදිව අනුක්‍රමයෙන් රජගහනුවරට ගොස් එහි පිඩු පිණිස හැසිර පාණ්ඩව පව්වතච්ඡායාවෙහි හුන්නේ මගධෙශ්වර බිම්සාර රජහු විසින් රාජ්‍යයෙන් පැවරූයේ එය ප්‍රතික්ෂෙපකොට සර්වඥබවට පැමින තමා විජිතයට එනු පිණිස ඒ රජු විසින් ගන්නාලද පිළිණ ඇතියේ ආලාරකාලාම නම් තවුසාද උද්දකරාමපුත්ත නම් තවුසාද යන දෙදෙනාකරා එලඹ ඒ දෙදෙනාවෙත අවබොධකළ සමාධීන් පමණ නොවෙයි සිතා ප්‍රතික්ෂෙපකොට සහවුරුද්දක් මහාවීර්‍ය්‍යකොට වෙසක් පුණු පොහෝ දවස පෙර වරුම සුජාතාවන් විසින් දුන් කිරිපිඩු වළඳා නිල්දළා හොය රන් පය උල්පවා හැර එම හෝතෙර මහ වනලැහැබ නන්සමවතින් දවස ගෙවා සවස්වේලෙහි සොත්ථිය නම් බමුණ විසින් දුන් තෘණගෙණ මහාකාළ නාරජු විසින් අභිස්තුත ගුණඇතියේ සුදවුන් මහරජනන් පිත් ශාක්‍ය ශ්‍රෙෂ්ඨතෙමේ බෝමැඩ නැගී අපරාජිත පර්‍ය්‍යඞ්ක ස්ථානයෙහි තණඅතුට යම්තාක් මාගේ සිත ආශ්‍රවයන්ගෙන් නොමිදේනම් ඒතාක් මේ පළඟ නොහරිම් ඉටා නැගෙණහිරට මුනලා වැඩහිඳ හිරු අස්තගත නොවනතෙක්ම මාරබල විධ්වංශනයකොට ප්‍රථම යාමයෙහි පූර්වෙනිවාසානුස්මෘතිඥානය මධ්‍යම යාමෙහි චුතුපපාත ඥානය අලුයම අවසන්හි ප්‍රත්‍යය ආකාරයෙහි නුවනහෙලා දශබල චතුර්වෛශාරද්‍යාදී සකල ගුණයෙන් හෙබියාවූ නිරුත්තර සම්‍යක් සම්බොධි යයි කියනලද සර්වඥ පදප්‍රාප්තව බුදුවූසේක් පළඟ නොබිඳ බෝමැඩ හිඳගෙණ පලසම්වතින් සුවයෙන් කල්ගෙවන සේක් අනුත්තර මහාකරුණා සමාපත්තියට සමවැද එයින් නැගී සකල ලෝක ධාතුයෙහි විනයනය කටයුතු සත්වයන් බලනසේක් ආශයානුශය චරිතාධිමුක්ත්‍යාදී භෙදයෙන් භව්‍යාභව්‍ය සත්වයන් පිරි

Digitized by Google

විසිනම් හ සත්‍යප්‍රතිවෙධය පිණිස තුන්භවයෙහි සියලු සත්වයන් පිරිසිඳ සූවිසි අසඞ්ඛ්‍යයක් පුවුහේක.

මෙසේ දිවකුරු බුදුන් පටන් තුසිතපුරයෙහි සාරාසඞ්ඛ්‍ය කල්ලක්ෂයක් සමතිස්පෙරුම් පුරමින් සර්වඥපද ප්‍රාප්තිය පිණිස තුවනමුහුකල කාලය නවාඞ්ග ශාස්ත්‍රශාසනයට * දුරෙ නිදාන නම්වෙයි. එතැන් පටන් බෝ මැඩතෙක් කාලය අවිදූරෙ නිදාන නම්වෙයි. ඒ ඒ සූත්‍රාදීන් වදාරණ දෙශකාලාදිය තත්තත් සූත්‍රාදියට සන්තිකෙ නිදාන නම්. බුදුවූ තැන් පටන් පිරිනිවන් පෑ ක්ෂණය දක්වා පන්සාලිස් හවුරුද්දක් ලොකයෙහි හැසිර මින් පැවැත්තූ චාරිත්‍රය දම්සක් පැවතුම් සූත්‍රාදී ඒ ඒ දෙසනාද බුදුන් පිරිනිවි දෙමසකින් පසු රජගහනුවර වෙභාර පර්වත ප්‍රාන්තයෙහි සප්තපර්ණීගුහාවාරයෙහි අජාසත් මහරජහු විසින් කරවනලද ධර්මමණ්ඩපයෙහි රැස්වූ මහාකාශ්‍යපස්ථවි රාදි පන්සියයක් මහරහතන් වහන්සේලා විසින් සකස්කොට ප්‍රකරණාරූඪ කරණ ලදහ.

මෙ දම් දෙසුන් අතුරෙන් දම්සක්පැවතුම් සූත්‍රය ප්‍රථමයෙන් වදාළබැව් එම සූත්‍රනිදානයෙන් හැඟෙයි. ඒනම්, "එවං මෙ සු තං එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිග දායෙ තත්‍රඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි" මේ නිදාන පාඨය ප්‍රථම සඞ්ගීතිකාලයෙහි කාශ්‍යපමහතෙරුන් විසින් විචාරණලද්දාවූ අනඳමහතෙරණුවෝ "මාවිසින් මේ (සූත්‍රය) මෙසේ අසන ලදී එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවරවෙත සෘෂීන්ගේ පතනොත්පතනය වනහෙයින් ඉසිපතන නම්වූද, මෘගයන්ට අභයදායක හෙයින් මිගදායනම්වූද (ආරාමයෙහි) වසනසේක. එහිදී පස්වගමහ ණුන්ට මෙය වදාළසේක"යි කීහ. අන්‍යවූ භික්ෂූන්ට වදාළ හැමසූත්‍රයෙහිම එන "භික්ඛවො'ති භදන්තා'ති තෙ භික්ඛූ භග

---

* නවාඞ්ග නම්, සූත්‍රය ගෙය්‍යය වෙය්‍යාකරණය ගාථාය උදානය ඉති වුත්තකය ජාතකය අද්භූතධර්මය වෙදල්ලය යන මෙයි, සූත්‍ර නම් භික්ෂුභික්ෂුණී විභඞ්ග දෙවිසිකඳුවත් ආදියයි. ගෙය්‍ය නම් ගාථාසහිත සූත්‍රයි—සංයුත් නිකායෙහි සගාථක වර්ගයන් මෙනි. වෙය්‍යාකරණ නම් සියලු අභිධර්මපිටකයද නිගාථක සූත්‍රද ඉතිරි අටඟින් විප්‍රමුක්ත සියලු බුද්ධවචනද යනමෙයි. ගාථා නම් දම්පියා ථෙර ථෙරී ගාථා ආදියයි—උදාන නම් සොමනස් සහගත ඥාණයෙන් වදාලාවූ ගාථායෙන් ප්‍රයුක්ත ධර්මයි—"වුත්තංහෙතං භගවතා" යනාදි දසතුරසියක් සූත්‍ රීන් සඞ්ගෘහිතවූයේ ඉතිවුත්තකනම්—ජාතක නම් අපණ්ණක ජාතකාදි පන්සිය පණසක් දේසනායි—අද්භූත ධර්ම නම් ආශ්චර්ය අද්භූත ගුණයෙන් ප්‍රයුක්ත දෙස නායි—වෙදල්ල නම් වැඩි වැඩි දැන්මහා වැඩි වැඩි තුෂ්ටියද ලබමින් ප්‍රශ්න විසර්ජ න වශයෙන් පැවැති චූලවෙදල්ල මහාවෙදල්ල සම්මාදිට්ඨිආදි සූත්‍රයි—යන මෙයි.

Digitized by Google

වහෙතු පච්චයොසුං" යන කැබැල්ල මේ සූත්‍රනිදානයෙහි නායේය. මහණෙනි කියා 'භික්ෂූන් කැඳවූසේක' ස්වාමීන්වහන්සැයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නෝය යනු අර්ථයි.

කවරහෙයින් මේ නිදානපාඨ කැබැල්ල නායේද යතහොත්, මේ සූත්‍රදේශනාව අසනතෙක්ම ඒ පස්වගමහණුන් වහන්සේලා විසින් බුදුබැව්හි ශඞ්කා කළහෙයිනි. එ බව මධ්‍යම සඞ්ගීතියෙහි අරිය පරියෙසන නම් පාසරාසිසූත්‍රයෙන් හා එහි අටුවාවෙන් විස්තර බලා දතයුතුයි, මේ සූත්‍රය වදළාසින් පසු කොතැන් හිඳිවත් කොයි භික්ෂු කෙනෙකුටවත් බුදුබැව්හි සැඳෙහයක් නැතිබැවින් මෙබන්දක් නොවීයයි දතයුතු.

මහාකාශ්‍යප උපාලි ආනන්දාදී මහ රහතන් වහන්සේලා විසින් මෙබඳුදෑ අනාගත මහජනයාට සුවසේ තේරුම් ගත් නා පිණිස ශික්ෂාපදාදී ඒ ඒ තැන නිදාන පාඨයන් මේ ආකාරයෙන් තැබූබැව් කල්පනා කටයුතුයි.

ඒ ප්‍රථම සඞ්ගායනාවට නිදානනම්, මහළුවයස පැවිදිවූහෙයින් බුඩ්ඪපබ්බජිත නම්වූ මහණෙකු විසින් කියනලද අනාදරිය වචනයි, ඒ තෙමේ නොසරුප්දූයින් කැද දනයක් බුදුන් සහිත සඞ්ඝයාට දෙනු සඳහා පිළියෙළ කෙළේය, බුදුහු ඒ ප්‍රතික්ෂෙප කළෝ, ඒ කරණකොටගෙණ බුදුන්කෙරෙහි බඳනාලද වෛරඇත්තේ බුදුන්ගේ තේජෝමහිමයෙන් කිසිවක් කියනොහී පිරිනිවන් පෑවසි යනු අසා සතුරු පිටිද්දී මිසි මදක් අස්වස්ලැබ මතු දක්වන ආකාර කීය, කැඳදානය සැපයූපරිදි මෙසේයි, එක් කලෙක බුදුරජතෙමේ මල්ලරජුන්ගේ කුසිනාරා නුවර රිසිවූ කලක් වැස දෙළොස්සිය පණසක් භික්ෂූන් විසින් පිරිවරූසේක් ආතුමා නුවරට වැඩිසේක, එකල මහළු වයසෙහි ගිහිගෙන් නික්ම පැවිදිවූ පෙර ගිහිකල කරනැවැම්කම් කළාවූ සුභද්‍රනම් මහණ කෙනෙක් වෙසෙයි, ඒ තෙමේ බුදුන් මහ පිරිවරින් වඩනා බැව් අසා කැඳ දන්දෙනු කැමැත්තේ තමන් ගිහිකල පුත්වූ යහපත් රූ ඇති මනාව ගායනා කටහැක්කාවූ කරනැවැම් කම්හි ඉතා දක්‍ෂවූ දරුවන් දෙදෙනා කැඳවා "දරුවෙනි අඩ තෙළෙස් සියයක් භික්ෂූන්කැටිව තථාගතයන් වහන්සේ මේනුවරට වඩනාසේක්ල, තෙපි දැළිරවුළු අත්දම් තබන උපකරණ ගෙණ ගෙයක්පාසා ඇවිදිමින් ලුණු තෙල් සහල් හා කැවිලිදි එක්කරව් මෙහි වැඩි තථාගතයන්ට කැඳ දනක් දෙම්හ" යි කීහුල්හු, ඒ දරුවෝද එසේය පියාණෙනි කියා කිවා කළහු,

රූඇති ගිහියන ඔවුන්දූක් නුවර වැසියෝ සතුටුව ඉස රවුලු කපාවනු නොකැමැත්තෝත් ක්ෂුරකම් කරවාගෙණ බොහෝ දෙති, මෙසේ ඔහු දෙදෙනා බොහෝවූ උපකරණ එක් කළෝය, ඉක්බිති පිළිවෙළින් හැරිසරණ තථාගතයන්වහන්සේද වැඩීසේක, පසුවද බොහෝ කැඳ සපයවා "සොමිනි භාග්‍යවත්තෙමේ කැඳ පිළිගන්නාසේක්ව"යි භාග්‍යවතුන්වහන්සේට කැඳපිළිගැන්වීය, බුදුවරයෝ වනාහි දැනගෙණම හිසිතැනෙක විචාරති හිසිතැනෙක නොවිචාරති, කල් නොකල් දැන ලෝවැඩසඳහා විචාරති, අවැඩපිණිස නොවිචාරති, කරුණු දෙකකින් එනම් දහම් දෙසන්නම් සව්වන්ට ශික්ෂාපදයෝ පණවමැයි භික්ෂූන් විචාරති. මෙහිදී තථාගතතෙමේ "මහණ මේ කැඳ කොයින්දැ"යි ඒ මහළු මහණහු විචාළසේක. ඒතෙමේ එපවත් හැළකෙළේය. භාග්‍යවත් සබුදුතෙමේ නින්දාකොට "නභික්ඛවෙ පබ්බජිතෙන අකප්පියෙ සමාදපෙතබ්බං යො සමාදපෙය්‍ය ආපත්ති දුක්කටස්ස" තවද "නච භික්ඛවෙ නහාපිතපුබ්බෙන ඛුරභණ්ඩං පරිහරිතබ්බං යො පරිහරෙය්‍ය ආපත්ති දුක්කටස්ස" මෙහි භාව "මහණෙනි පැවිද්දහු විසින් නොකැපයෙහි සමාදන් නොකරවිය යුතුය යමෙක් සමාදන් කරවූයේනම් දුකුලා ඇවැත් වෙයි, මහණෙනි පූර්වයෙහි කරනැවැමිවූවෙකු විසින් කරනැවැමි බඩු පරිහරණය නොකොට යුතුය, යමෙක් පරිහරණය කෙළේනම් දුකුලාවෙයි. මහාවග භෙසජ්ජක්ඛන්ධකයෙන් ගන්නාලදී.

ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරතෙමේ ධාතු බෙදීමෙහි රැස්වූ භික්ෂුසඞ්ඝයාට වදාරණසේක් "එක්කලෙක මම පාවානුවරින් කුසිනාරානුවරට එන මාර්ගයට මහා භික්ෂුසමූහයාහා කැටිව පැමිණියෙම් මගින් ඉවත්ව එක් රුකක්මුල හිඳගතිම්, එකල එක්තරා ආජීවකයෙක් මහත් මදාරා මලක් ගෙණ කුසිනාරානුවරින් පාවානුවර මගට පිළිපන්නේය, ඇවැත්නි මම දුරින්ම එන ඒආජීවකයා දැක "කිමෙක්ද ඇවත අපගේ ශාස්තෲන්වහන්සේ දන්නෙහිදැ"යි කීම්. "දන්නෙම්, අදින් සත්දවසකින්මතු ශ්‍රමණ ගෞතමතෙම පිරිනිවන් පෑයේය, එයින් මේ මදාරාමල ගතිම්" කීයේය, එසේ කීකල කෙලෙස්සහිත භික්ෂූහු "ඉතා ඉක්මනින් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවීසේක, ඉතාවහා ලෝ ඇස අන්තර්ධානවිය"යි දෑත්ඉසබැද ගෙණ බිමවැටෙමින් පෙරළෙමින් ඇඬූය, යම් භික්ෂුකෙනෙක් අනාගාමි හෝ රහත්හෝ වූද ඒ සියල්ලෝ සිහිනුවණින් යුක්ත වූවෝ "සංස්කාරයෝ අනිත්‍යයහ ඒ නිත්‍යබැව් කොයින් ලැ

Digitized by Google

බෙද"යි ඉවසූහ, "ඇවැත්නි ඒ භික්ෂූන් අනුශාසනා කෙරෙමින්, ඇවැත්නි ශෝකවීමෙන් පමණි නොහඬව් බුදුන් විසින් පළමු කොටම ප්‍රියමනාප සියල්ලෙන් වෙන්වීම තොරවීම වදාරණ ලද් දේම නොවේද? ඊට විරුද්ධයක් කොයින් ලැබියයුතුද? යම් කිසිවක් උපන්නේනම් උත්පාදස්ථිති භඞ්ගනම් බිඳෙන ස්වභාව නම් අහෝ ඒ නොබිඳුනනම් යෙහෙකි යනු කොයින් ලැබේද? මේ අවිද්‍යමානයි" මෙසේ භික්ෂූන්ට කියෙම් එකල ඒ පිරිසෙහි උන් වුඩ්ඪපබ්බජිතතෙම කියනුයේ "ඇවැත්නි සෝකකිරී මෙන් පමණි නොහඬව්, ඒමහ මහණහුගෙන් අපි මොනවට මිදුනම්හ, මේ තොපට කැපය මේ තොපට නොකැපයයි (බුදු ජීවත්වනකල) උපද්‍රුතයම්හ, දැන්වූකලී අපි යමක් කැමතිවත් නොමුනම් ඒ කරන්නෙමු යමක් නොකැමැතිනම් ඒ නොකරන් නෙමුය" යි කීයේයයි වදාරා "ඇවැත්නි අපි ධර්මයත් විනයත් සඞ්ග්‍රහ කරන්නෙමු එන කාලයෙහි අධර්මය දීප්ත වෙයි ධර්මය පිරිහෙයි අවිනය දිලිහෙයි විනය පිරිහෙයි එසේම එනකාල යෙහි අධර්මවාදීහු බලවත් වන්නාහ ධර්මවාදීහු දුබලවන් නාහ, අවිනයවාදීහු බලවත් වන්නාහ විනයවාදීහු දුර්වලවන් නාහ ඊටපෙරතුව අපවිසින් අවශ්‍යයෙන් ධර්මසඞ්ගායනාව කළමැනව" යි වදාළසේක.

"එසේ වීනම් ස්වාමීනි ස්වාමීන්වහන්සේ භික්ෂූන් එක්කරණ සේක්වා" යි කිවූය, තෙරුන්වහන්සේද සාරසිය අනූනවනමක් රහතන් වහන්සේලාම එක්කළසේක.

කුමකට පන්සියය නොපිරවූදයත්—ආයුෂ්මත්වූ ආනන්ද තෙරුන් සඳහාය, කුමක්හෙයින් ඒ තෙරුන්වහන්සේ පළමු වෙන්ම එක්නොකළසේක්ද? පක්ෂපාත බවක්මෙන් සිතෙන බැවිනි, බොහෝ රහතන් වහන්සේලා සිටියදී සෝවාන් ආනන්ද තෙරුන් එක්කලේ කවරහෙයින්දැයි යමක් නොවිචාරා කියන සාහසිකයෝ කියති, බුදුන් විසින්ම ධර්මධරයන් අතුරෙන් අග්‍රයයි එතදග්‍රපාලියෙහි තබනලද ආනන්දතෙරුන් හැර සඞ්ගායනා නොකළහැක්කෙන් නොගත්තොත් හෙද වරදැයි කියති, භික්ෂුසමූහයාගේ ආයාචනායෙන් ගත්කල මේ වරද ඳදකම නැතිවෙයි, මෙය චුල්ලවග්ග පඤ්චසතිකක්ඛන්ධකයෙහි දක්වන ලදමැයි. "අථඛො ආයස්මා මහාකස්සපො එකෙනූනානි පඤ්චඅරහන්තසතානි උච්චිනි; භික්ඛූ ආයස්මන්තං මහාකස්සපං එතදවොචුං, අයං භන්තෙ ආයස්මා ආනන්දො කිඤ්චාපි සෙඛො අභබ්බො ඡන්දා දොසා මොහා භයා අගතිං ගන්තුං; බහුච අනෙන භගවතො සන්තිකෙ ධම්මොච විනයොච පරියත්තො තෙනහි භන්තෙ ථෙරො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනතූති.

Digitized by Google

"අථඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනි."

රැස්වූ මේ පන්සියයක්දෙනා වහන්සේලා රජගහනුවර වස්එලඹ පළමුවෙනි මාසය විහාරනවකම්න් ගෙවා මැදිමස පළමුවෙනිදා පන්සියයක්දෙනාවහන්සේලා පළමු කී මණ්ඩප යට රැස්ව විනයපිටකය පළමුවෙන් උපාලිතෙරුන් ධුරකොට ගෙණ උභතොවිභඟ ඛන්ධක පරිවාරවශයෙන් සඞ්ග්‍රහකළහ; මෙහි උභතො විභඟනම් භික්ඛුවිභඟ භික්ඛුණීවිභඟ දෙකයි එය පරිජ්ජිති පොත් දෙකෙන් අවසන්වෙයි, මෙහි ඛන්ධක නම් පළමු සඞ්ගායනාවේදී කඳුවත් විස්සකි, මහවග මහාඛන්ධකය පටන් කොසම්බක්ඛන්ධකය අවසන්කොටඇති කඳුවත් දශයයි; කම්මක්ඛන්ධකයපටන් භික්ඛුණී ඛන්ධකය අවසන්කොට ඛන්ධකදශය චුළුවගයි, මේ ප්‍රථම සඞ්ගීතියෙහි පවත් ලිඛූ පඤ්චසතිකක්ඛන්ධකය චූළවග එකොළොස්වෙනි ඛන්ධක වෙයි; මෙයින් අවුරුදු සියයකින් පසු කාලාසොක මහරජ්ජුරුවන් දවස විසාලාමහනුවරදී කළඅධිකරණ විනිශ්චය ධම්මසඞ්ගීති පවත් ලිඛූ කථා සත්තසතිකක්ඛන්ධකනම්, සියල්ල එක්වූකල දෙවිසි කඳුවතකි.

පරිවාරනම්, මේ විනයපිටකයෙහි ආවාවූ සියල්ලක් නොවර දවා විනිශ්චය කරගන්නා පිණිස සංක්ෂෙප සඞ්ග්‍රහයට නගණ ලදී. ඒ පරිවාර පාඨයෙහි පෙණෙයි, මේ විනයපිටකයි.

සූත්‍රපිටකනම්, සතළොස් දහස් පන්සිය පන්සැත්තෑවක් සූත්‍ර දෙශනායි. එය අනඳමහතෙරුන් ධුරකොට රජගහනුවර ප්‍රථම සඞ්ගීතියෙහිදීම දීඝ නිකායාදි සතරෙහි සහ සූත්‍ර නිපාත යෙහිත් සඞ්ගෘහීතයි. දීඝ ප්‍රමාණ සූත්‍රයන් එක්කළහෙයින් වර්ග ත්‍රයකින් උපලක්ෂිත සූතිස් සූත්‍රය දීඝ නිකාය නම්, මෙහි ප්‍රථම සඞ්ගීතියෙහිදී සූත්‍ර තිස්තුනයි, කුමාර කාශ්‍යපතෙරුන්හා රාජ න්‍යබ්‍රාහ්මණයාගේ ප්‍රශ්නොත්තරවශයෙන් පැවති පායාසි සූත්‍ර යත් දෙවන සඞ්ගීතියෙහිදී දික්සඟියෙහි මහාවර්ගයට එක් කරණ ලදැයි මහාවංශ ටීකායෙහි ආයේයි. මූල පණ්ණාස මජ්ඣිම පණ්ණාස උපරිපණ්ණාසයයි යන තුන් පණ්ණාසයෙන් උපලක්ෂිත මධ්‍යම ප්‍රමාණ සූත්‍රයන් එක්කළ බැවින් එසිය පණස්දෙකක් සූත්‍ර මධ්‍යම නිකායෙහි සඞ්ගෘහීතයි. ගුණයොවෘත්තින් පණ්ණාස යයි ව්‍යවහාර නමුත් උපරිපණ්ණාසයෙහි සූත්‍ර පණස්දෙකක් පෙණෙයි, මෙහිද මාධුර සූත්‍රය දෙවෙනි සඞ්ගායනාවෙහිදී මේ මධ්‍යම නිකායට ඇතුළත්කරණලදැයි සමහරු සිතති, මෙය මහාකස්සපත් තෙරුන් විසින් වදාරණලදී. ඊට අනතුරුව සං යුත් නිකාය සත්දහස් සත්සිය දෙසැට සූත්‍රයකින් නිමවන ලදී

ඉක්බිති අඞ්ගුත්තර නිකාය නවදහස් පන්සිය පණස් සතකින් සඞ්ගෘහිතයි. ඛුද්දක නිකායාන්තර්ගත සූත්‍ර නිපාතයෙහි සැත්තෑවෙකැයි මෙසේ සියලු සූත්‍ර ගණන සතළොස් දහස් පන්සිය පන්සැත්තෑවකි. නිකාය පඤ්චකය හැඳිනගන්නා පිණිස :—

“චතුත්තිංසෙව සුත්තන්තා තිවග්ගො යස්ස සඞ්ගහො
එස දීඝනිකායො'ති පඨමො අනුලොමිකො
දියඩ්ඪසතසුත්තන්තා ද්වෙච සුත්තානි යත්‍ථ සො
නිකායො මජ්ඣිමො පඤ්චදසවග්ගපරිග්ගහො
සත්ත සුත්තසහස්සානි සත්ත සුත්තසතානි ච,
ද්වාසට්ඨිචෙව සුත්තන්තා එසො සංයුත්තසඞ්ගහො
නව සුත්තසහස්සානි පඤ්ච සුත්තසතානි ච,
සත්තපඤ්ඤාසසුත්තානි සඞ්ඛා අඞ්ගුත්තරෙ අයං.
ඨපෙත්වා චතුරො'පෙතෙ නිකායෙ දීඝ ආදිකෙ,
තදඤ්ඤං බුද්ධවචනං නිකායො ඛුද්දකො මතො.

ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරථෙරීගාථා, ජාතක, චූලනිද්දෙස, මහානිද්දෙස, පටිසම්භිදා, අපදාන, බුද්ධවංස, චරියාපිටක, යන පසළොස් ප්‍රකරණයන්හා විනය පිටකයෙහි පොත්පසද, ධම්මසඞ්ගනි විභඞ්ග පුග්ගලපඤ්ඤත්ති ධාතුකථා කථාවත්ථු යමක පට්ඨානයයි කියනලද අභිධර්මප්‍රකරණ සතද මේ සත්විසි ප්‍රකරණය ඛුද්දක නිකාය නම්,. මෙයින් කථාවත්ථු ප්‍රකරණය පළමුවෙනි දෙවනි සඞ්ගීතිදෙක්හිදී බුදුන්වදාළ මාතෘකාව පමණකි, පසුව ධර්මාශෝක මහරජහුදවස මොග්ගලිපුත්ත තිස්සමහතෙරුන් ප්‍රධානකොට ඇති දහසක් රහතන් වහන්සේලා විසින් නවමසකින්කොට නිමවූ සාහස්සිකා නම් සඞ්ගායනාවසානයෙහිදී ඒ සඞ්ගායනාවට ප්‍රධානවූ මොග්ගලිපුත්ත තිස්සමහතෙරුන් විසින් ස්වකීයවාදයෙහි සූත්‍රපන්සියයක්ද පරවාදයෙහි සූත්‍රපන්සියයක් දැයි සූත්‍ර දහසක් එක්කරමින් විස්තරකොට මහත්කරණලදී.

දෙවන සඞ්ගායනායෙහි නිදානනම්.

බුදුන් පිරිනිවී අවුරුදු සියය පිරිකල විශාලාමහනුවර වජ්ජිපුත්‍රක භික්ෂූහු මේ දසවස්තුව ප්‍රකාශකළහ. එනම් 1. “කප්පති සිඞ්ගිලොණකප්පො, 2. කප්පති ද්වඟුලකප්පො, 3. කප්පති ගාමන්තරකප්පො, 4. කප්පති ආවාසකප්පො, 5. කප්පති අනුමතිකප්පො, 6. කප්පති ආචිණ්ණකප්පො, 7. කප්පති අමථිතකප්පො, 8. කප්පති ජළොගිපාතුං, 9. කප්පති අදසකංනිසීදනං, 10. කප්පති ජාතරූපරජතං,” යනාදශයයි. මෙහි විස්තර මත්තෙහි දක්වන

Digitized by Google

බැවිනුත් මහාවංසයෙහි සතරවෙනි පරිච්ඡෙදයෙහි දක්වන ගාථාවපටන් විස්තර දැක්වූ බැවිනුත් මෙහි නොදක්වමු.

එකල ආයුෂ්මත් කාකණ්ඩකපුත්‍ර යශස්ථවිරයන් වහන්සේ වජ්ජි රට හැසිරෙමින් විසාලාමහනුවරට පැමිණිසේක. එහි මහවන විහාරයෙහි වසනසේක් වජ්ජිපුත්‍රක භික්ෂූහු පොහොදා කස් බඳනක් දියෙන් පුරවා භික්ෂුසඞ්ඝයා මැද තබා එහි පැමිණෙන විසල්පුරවැසි උපාසක වරුන්ට කියන්නාහු "ඇවැත්නි සඞ්ඝයාට කහවණුද් අඩකහවණුද් පාදයක්හුද් මාසකයක්හුත් දෙව්, සඞ්ඝයාහට පිරිකරින් කටයුතුවන්නේය" යි මෙසේ කියති, යසස්ථවිරතෙමේ "ඇවැත්නි සඞ්ඝයාට කහවණුආදිය නොදෙන්වා ශ්‍රමණ ශාක්‍යපුත්‍රයන්ට කැපනොවෙයි ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ රන්රිදී මසුකහවණු නොඉවසන්නාහ" යනාදිය වදාළසේක, මෙසේ යසස්ථවිරයන් වහන්සේවිසින් කියනු ලබන්නාවූද විසල්පුරවැස්සෝ කහවණුආදිය සඞ්ඝයාට දුන්නාහුය, ඉක්බිති වජ්ජිපුත්‍රක භික්ෂූහු පසුවද ඒ හිරණ්‍යවර්ගය පිළිවෙළින් කොටස් කොට බෙදූහ, එසේ කොට යසස්ථවිරයන් වහන්සේගේ කොටස ගන්ට කීවූය; තෙරුන්වහන්සේ "නාහං මෙ ආවුසො හිරඤ්ඤස්ස පටිවිංසො නාහං හිරඤ්ඤං සාදියාමි" යි වදාළසේක, ඉක්බිති වජ්ජිපුත්‍රකභික්ෂූහු "ඇවැත්නි මේ කාකණ්ඩක පුත්‍රස්ථවිරතෙමේ සැදැහැති පහන් උපාසකයන්ට ආක්‍රොශපරිභව බෙණෙයි නොසතුටුකෙරෙයි එහෙයින් මොහුට පටිසාරණීය (ගිහියන් සමා කරවා ගන්නා) කර්මය කරමුය" යි කියා එසේ කළාහ, එකල යසස්ථවිරතෙමේ විනයෙහි ආ පරිද්දෙන් අනුදූත මහණකෙනෙකු ඉල්වාගෙණ ඒ මහණහු එක්ව විසාලාමහනුවරට පිවිස තමන් ධර්මවාදීබැව් ප්‍රකාශකෙරෙමින් බුදුන් වදාළ දෙසුතුරක්හා විනයප්‍රඥප්තියද උපාසකවරුන්ට වදාළසේක, එයින් පළමුවෙනි සූතුර සැකෙවින් මෙසේය. එක්කලෙක බුදුහු දෙව්රම්වෙහෙර වසනුවෝ "මහණෙනි සඳ හිරු දෙදෙනාට උපක්ලේශ සතරෙක, වලාය පිනිය මිදුමය ධූමය හා රජස රාහුය මේ කිලිටි සතරින් කෙලෙසුන සඳ හිරු දෙදෙනා යම්සේ නොබබලද්ද එසේම මේ ලොකයෙහි සමහර මහණ බමුණුකෙනෙක් රහමෙරය මෙවුන්දම් රන් රිදී මසුකහවණු පිළිගැණ්ම, නැකැත්වෙදකම් ආදී මිථ්‍යා ජිවයෙන් ජීවිකාය යන මේ උපක්ලේශයෙන් කිලිටිවූවාහු නොහොබිති." තවද අනික් සූතුරෙහි සංක්ෂෙපය, එක්කලෙක බුදුහු රජගහනුවර වේළුවනයෙහි වසනසේක, එකල රජාන්තඃ පුරයෙහි හිඳගත් රජපිරිස මේ කථාව පහළවිය, "ශ්‍රමණශාක්‍ය

පුත්‍රයන්ට රන්රිදී කැපය ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ ඒ පිළිගන්නාහ"යි කිවූය, එකල ඒ පිරිසෙහි මිණිසිළුනම් ගම්මුදලියෙක් හුන්නේ "පින්වත්නි එසේ නොකියන්වා ශ්‍රමණශාක්‍යපුත්‍රයන්ට රන්රිදී නොකැපය ඒ නොපිළිගණිති" යනාදින් කීය, පිරිසට තමාකීවා අදහවන්ට නොහැකිවූකල බුදුන්වෙත ගොස් විචාළේය, පසුව බුදුහු "ඒකාන්තයෙන් ගම්මුදලිය තා කීවා සරියයි යනාදිය වදාරා "යස්ස ඛො ගාමණි ජාතරූපරජතං කප්පති පඤ්චපි තස්ස කාමගුණා කප්පන්ති යස්ස පඤ්චකාමගුණා කප්පන්ති ඒකංසෙන ගාමණි ධාරෙය්‍යාසි අස්සමණධම්මො අසක්‍යපුත්තියධම්මො'ති අපිචාහං ගාමණි එවං වදාමි තිණං තිණත්ථිකෙන පරියෙසිතබ්බං එවමාදි" මෙහි භාවයනම් යමෙකුට රන්රිදී කැපනම් ඔහුට පස්කම්ගුණ කැපයහ යමෙකුට පස්කම්ගුණ කැපනම් ගම්මුදලිය ඒකාන්තයෙන්ම ඒ මහණදමෙක් නොවෙයි ශාක්‍යපුත්‍රයන්ට අයිති ධර්මයෙක් නොවෙයි ඒකාන්තයෙන් වරදැයි යනාදිය වදාළහ. මේ දෙසුතුර මහ තෙරණුවෝ උපාසකයන්ට වදාරා, තවද "ඇවැත්නි එක්කලෙක බුදුහු රජගහනුවර වසනුවෝ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රතෙරුන් අරභයා රන්රිදී පිළිගැන්ම ප්‍රතික්ෂෙප කළසේක, ශික්ෂාපද පැණවූසේක. මෙබඳු වාදඇති මම සැදැහැති පහන් ආයුෂ්මත් උපාසකයන් ආක්‍රොශකෙරෙමි පරිභවබෙණෙමි නොසතුටු කෙරෙමි" යනාදිය දුන්වූකල උපාසකවරු දන්වන්නාහු "එකො'ව භන්තෙ අය්‍යො යසො කාකණ්ඩපුත්තො සමණො සක්‍යපුත්තියො සබ්බෙ'විමෙ අස්සමණා අසක්‍යපුත්තියා,, යනාදින් "ස්වාමීනි අයිවූ කාකණ්ඩකපුත්‍රවූ යසස්විරනම් ඔබවහන්සේ පමණක්ම ශ්‍රමණය ශාක්‍යපුත්‍රය මේ සියල්ලෝම අශ්‍රමණයෝය අශාක්‍යපුත්‍රයහ" යනාදින් කියා "ස්වාමීනි මෙහි විසාලාමහනුවර විසුවමැනවැ" යි කිවූය. අනුදූත මහණහු සමග පෙරලා විහාරයට වැඩිසේක,

ඉක්බිති වජ්ජිපුත්‍රක භික්ෂූහු "මේ යසස්විරතෙමේ උපාසකවරුන් සමා කරවාගත්තේද" යි අනුදූත භික්ෂූහු විචාළාහ, "අප සියල්ලන් අශ්‍රමණයන් කොට තමන් පමණක් ශ්‍රමණවිය" යි යනාදින් දන්විය, ඉක්බිති වජ්ජිපුත්‍රකභික්ෂූහු යසස්විරයන්ට උත්ක්ෂෙපනීය කර්මය කරන්ට රැස්වූහ, ඉක්බිති යසස්විරතෙමේ සෘද්ධිබලයෙන් එතැනින් පිටත්ව ගොස් පාවා අවන්තීදෙරට බොහෝ භික්ෂූන්වෙත හසුන් යවා තමන් වහන්සේ අධොගඞ්ග පර්වතයට එළඹ එකල එහි වැසි සාණවාසී සම්භූත මහතෙරුන් වෙතට වැඩිසේක, පාවෙයකවනාපි භික්ෂූහුද එහි එළඹියෝය. මේ

සියල්ලෝම සාකච්ඡා කොටගෙණ සහජාතිරටට එලඹ රෙවත තෙරුන් දුටහ, එහි රැස්වූ සඞ්ඝයාට මෙසේ දන්වමින් "ඇවැත්නි සඞ්ඝතෙමේ මා කියන්නක් අසාවා, ඉදින් අපි මේ අධිකරණය මෙහිදී ව්‍යුපශමනය කරන්නෙමු නම් මුල ඉපදවූ භික්ෂූහු නැවත කර්‍මකරණු පිණිස කලහ කටහැකි වෙති, ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේවීනම් මේ අධිකරණය උපන් ස්ථානයෙහිම ව්‍යුපශමනය කරන්නෙමුයයි දැන්වූසේක" උන්වහන්සේ ඇතුළු සඞ්ඝයා ඒ අධිකරණය විනිශ්චය කරණු කැමැත්තෝ විශාලා මහනුවරට පැමිණියහ, එකල මුළුපොළොවෙහි සියලු සඞ්ඝයා කෙරෙහි වැඩිමහල් උපසම්පදවෙන් එක්සිය විසිවයස්වූ අනඳමහතෙරුන්ගේ සද්ධිවිහාරිත සබ්බකාමීනම් මහතෙර කෙනෙක් ඒ නුවර වසනසේක. මේ සියල්ලෝ ඒ තෙරුන්වෙත එලඹ උන්වහන්සේත් සමග මන්ත්‍රණය කොටගෙණ විශාලා මහනුවර වෙත මහාවනයෙහි කූටාගාරවිහාරයට රැස්වූහ, ඉක්බිති ආයුෂ්මත් රෙවතස්ථවිරතෙම "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අම්හාකං ඉමස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ අනග්ගානි චෙව භස්සානි ජායන්ති නචෙකස්ස භාසිතස්ස අත්ථො විඤ්ඤායති යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉමං අධිකරණං උබ්බාහිකාය වූපසමෙය්‍ය" සඞ්ඝයාට දැන්වූසේක. මෙහිභාවය, "වහන්ස සඞ්ඝතෙමේ මාකියන්නක් අසාවා; අපවිසින් මේ අධිකරණ විනිශ්චය කරණකල අවසන්නැති විස්තර කථා වන්නාහ, කා විසින් කියනලද බසෙකත් අර්ථ නොවැටහෙයි (එහෙයින්) සඞ්ඝයාට පැමිණිකල්ඇත්තේ නම් සඞ්ඝතෙමේ මේ අධිකරණය උබ්බාහිකා සමථයෙන් * ව්‍යුපශමනය කරන්නේය" යනුයි.

මෙසේ දන්වා නැගෙණහිරිරටවැසි සබ්බකාමිමහතෙරුන්ද සාළ්හමහතෙරුන්ද ඛුජ්ජසොභිතමහතෙරුන්ද වාසභගාමිමහතෙරුන්ද යන සතරදෙනාහා පාවා රට භික්ෂූන්අතුරෙන් රෙවත මහතෙරුන්ද සාණවාසි සම්භූත මහතෙරුන්ද කාකණ්ඩකපුත්‍ර යස මහතෙරුන්ද සුමණමහතෙරුන්ද යන අටමහතෙරුන් උබ්බාහිකායෙන් මේ අධිකරණය සමථයට නිශ්චයකොටගෙණ එම නුවර වාලුකාරාම විහාරයට වැඩිසේක්ලාය, එහිදී ආයුෂ්මත් රෙවතතෙරුන්වහන්සේ සඞ්ඝසම්මතයෙන් සබ්බකාමි

---

* "උබ්බාහිකාය සම්මන්නිතබ්බො'ති පරතො වුත්තාය ඤත්තිදුතියාය කම්මවාචාය, එවං සම්මතෙහි පන භික්ඛූහි විසුං වා නිසීදිත්වා තස්සායෙව වා පරිසාය අඤ්ඤෙහි වා න කිඤ්චි කථෙතබ්බන්ති සාවෙත්වා තං අධිකරණං විනිච්ඡිතබ්බං."

බෙද"යි ඉවසුහ, "ඇවැත්නි ඒ භික්ෂූන් අනුශාසනා කෙරෙමින්, ඇවැත්නි ශොකවීමෙන් පමණ නොහඬව් බුදුන් විසින් පළමු කොටම ප්‍රියමනාප සියල්ලෙන් වෙන්වීම තොරවීම වදාරණ ලද් දේම නොවේද? ඊට විරුඬයක් කොයින් ලැබියයුතුද? යම් කිසිවක් උපන්නේනම් උත්පාදස්ථිති භූතනම් බිඳෙන ස්වභාව නම් අහෝ ඒ නොබිඳුනනම් යෙහෙකි යනු කොයින් ලැබේද? මේ අවිද්‍යමානයි" මෙසේ භික්ෂූන්ට කියෙව් එකල ඒ පිරිසෙහි උන් වුඬ්ඪපබ්බජිතතෙම කියනුයේ "ඇවැත්නි ශෝකකිරී මෙන් පමණ නොහඬව්, ඒමහ මහණහුගෙන් අපි මොනවට මිදුනම්හ, මේ තොපට කැපය මේ තොපට නොකැපයයි (ඔහු ජීවත්වනකල) උපද්‍රුතයම්හ, දැන්වූකලී අපි යමක් කැමතිවන් නෙමුනම් ඒ කරන්නෙමු යමක් නොකැමතිනම් ඒ නොකරන් නෙමුය"යි කීයේයයි වදාරා "ඇවැත්නි අපි ධර්මයත් විනයත් සඞ්ග්‍රහ කරන්නෙමු එන කාලයෙහි අධර්මය දීප්ත වෙයි ධර්මය පිරිහෙයි අවිනය දිලිහෙයි විනය පිරිහෙයි එසේම එනකාල යෙහි අධර්මවාදීහු බලවත් වන්නාහ ධර්මවාදීහු දුබලවන් නාහ, අවිනයවාදීහු බලවත් වන්නාහ විනයවාදීහු දුර්වලවන් නාහ ඊටපෙරතුව අපවිසින් අවශ්‍යයෙන් ධර්මසඞ්ගායනාව කළමැනව"යි වදාළසේක.

"එසේ විනම් ස්වාමීනි ස්වාමීන්වහන්සේ භික්ෂූන් එක්කරණ සේක්ව"යි කිවුය, තෙරුන්වහන්සේද සාරසිය අනූනවනමක් රහතන් වහන්සේලාම එක්කළසේක.

කුමකට පන්සියය නොපිරවූදයත්—ආයුෂ්මත්වූ අනද තෙරුන් සඳහාය, කුමක්හෙයින් ඒ තෙරුන්වහන්සේ පළමු වෙන්ම එක්නොකළසේක්ද? පක්ෂපාත බවක්මෙන් සිතෙන බැවිනි, බොහෝ රහතන් වහන්සේලා සිටියදී සෝවාන් අනද තෙරුන් එක්කළේ කවරහෙයින්දැයි යමක් නොවිචාරා කියන සාහසිකයෝ කියති, බුදුන් විසින්ම ධර්මධරයන් අතුරෙන් අග්‍රයයි එතදග්‍රපාලියෙහි තබනලද අනදතෙරුන් හැර සඞ්ගායනා නොකළහැක්කෙන් නොගත්තොත් හෙද වරදැයි කියති, භික්ෂුසමූහයාගේ ආයාචනායෙන් ගත්කල මේ වරද දැකම නැතිවෙයි, මෙය චුළුවග්ග පඤ්චසතිකක්ඛන්ධකයෙහි දක් වන ලදමැයි. "අථඛො ආයස්මා මහාකස්සපො එකෙනූනානි පඤ්චඅරහන්තසතානි උච්චිනි; භික්ඛූ ආයස්මන්තං මහාකස්සපං එතදවොචුං, අයං භන්තෙ ආයස්මා ආනන්දො කිඤ්චාපි සෙඛො අභබ්බො ඡන්දා දොසා මොහා භයා අගතිං ගන්තුං; බහුච අනෙන භගවතො සන්තිකෙ ධම්මොච විනයොච පරියත්තො තෙනහි භන්තෙ ථෙරො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනථාති.

Digitized by Google

"අථඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තම්පි ආනන්දං උච්චිනි."

රැස්වූ මේ පන්සියයක්දෙනා වහන්සේලා රජගහනුවර වස්එලඹ පළමුවෙනි මාසය විහාරනවකමින් ගෙවා මැදිමස පළමුවෙනිදා පන්සියයක්දෙනාවහන්සේලා පළමු කී මණ්ඩප යට රැස්ව විනයපිටකය පළමුවෙන් උපාලිතෙරුන් ධුරකොට ගෙණ උභතොවිභඟ ඛන්ධක පරිවාරවශයෙන් සඞ්ග්‍රහකළහ; මෙහි උභතො විභඟනම් භික්ඛුවිභඟ භික්ඛුණිවිභඟ දෙකයි එය පරිජිප්විති පොත් දෙකෙන් අවසන්වෙයි, මෙහි ඛන්ධක නම් පළමු සඞ්ගායනාවේදී කඳුවත් විස්සකි, මහවග මහාඛන්ධකය පටන් කොසම්බක්ඛන්ධකය අවසන්කොටඇති කඳුවත් දශයයි; කම්මක්ඛන්ධකයපටන් භික්ඛුණී ඛන්ධකය අවසන්කොට ඛන්ධකදශය චූළවගයි, මේ ප්‍රථම සඞ්ගීතියෙහි පවත් ලිහූ පඤ්චසතිකක්ඛන්ධකය චූළවග එකොළොස්වෙනි ඛන්ධක වෙයි; මෙපින් අවුරුදු සියයකින් පසු කාලාසොක මහරජ්ජුරු වන් දවස විසාලාමහනුවරදී කළඅධිකරණ විනිශ්චය ධම්මසඞ්ගීති පවත් ලිහූ කථා සත්තසතිකක්ඛන්ධකනම්, සියල්ල එක්වූකල දෙවිසි කඳුවතකි.

පරිවාරනම්, මේ විනයපිටකයෙහි ආවාවූ සියල්ලක් නොවර දවා විනිශ්චය කරගන්නා පිණිස සංක්ෂෙප සඞ්ග්‍රහයට නගණ ලදී. ඒ පරිවාර පාඨයෙහි පෙණෙයි, මේ විනයපිටකයි.

සූත්‍රපිටකනම්, සතළොස් දහස් පන්සිය පන්සැත්තෑවක් සූත්‍ර දෙශනායි. එය අනඳමහතෙරුන් ධුරකොට රජගහනුවර ප්‍රථම සඞ්ගීතියෙහිදීම දීඝ නිකායාදී සතරෙහි සහ සූත්‍ර නිපාත යෙහිත් සඞ්ගායිතයි. දීඝ ප්‍රමාණ සූත්‍රයන් එක්කළහෙයින් වර්ගත්‍රයකින් උපලක්ෂිත චූතිස් සූත්‍රය දීඝ නිකාය නම්, මෙහි ප්‍රථම සඞ්ගීතියෙහිදී සූත්‍ර තිස්තුනයි, කුමාර කාශ්‍යපතෙරුන්හා රාජ න්‍යබ්‍රාහ්මණයාගේ ප්‍රශ්නොත්තරවශයෙන් පැවති පායාසි සූත්‍ර යත් දෙවන සඞ්ගීතියෙහිදී දික්සඟියෙහි මහාවග්ගයට එක් කරණ ලදයි මහාවංශ ටිකායෙහි ඈගෙයි. මූල පණ්ණාස මජ්ඣිම පණ්ණාස උපරිපණ්ණාසයයි යන තුන් පණ්ණාසයෙන් උපලක්ෂිත මධ්‍යම ප්‍රමාණ සූත්‍රයන් එක්කළ බැවින් එසිය පණස්දෙකක් සූත්‍ර මධ්‍යම නිකායෙහි සඞ්ගායිතයි. භූයොවෘත්තින් පණ්ණාස යයි ව්‍යවහාර නවූත් උපරිපණ්ණාසයෙහි සූත්‍ර පණස්දෙකක් පෙණෙයි, මෙහිද මාධුර සූත්‍රය දෙවෙනි සඞ්ගායනාවෙහිදී මේ මධ්‍යම නිකායට ඇතුළත්කරණලදයි සමහරු සිතති, මෙය මහාකසසින් තෙරුන් විසින් වදරණලදී. එට අනතුරුව සං යුත් නිකාය සත්දහස් සත්සිය දෙසැට සූත්‍රයකින් නිමවන ලදී

Digitized by Google

ම්හතෙරුන් විනය විචාළසේක, ඒ තෙරනුවෝත් සඞ්ඝසම්මත ගෙන්ම විසඳූහ, "වහන්ස ශෘඞ්ගි ලවණ කල්පය කැපද? ඇවැත්නි ඒ කවරේද? "ස්වාමීනි අඟින්කළ කුළාවෙක බහා ලුණුනැති ආහාර ලත්කල මිශ්‍රකොටගෙණ වළඳනා පිණිස ලුණුපරිහරණය සිඟිලෝණකප්ප නම් "ඇවැත්නි කැපනොවේ "කොහිදී මෙය ප්‍රතික්ෂෙපකරණලදද? සැවැත්නුවරදී ප්‍රතික්ෂිප්තයි, ඒබව මහාවිභඞ්ගයෙහි ආයේය, එසේ කරන්නා කවරවරදකට පැමිණේද? සන්නිධිකාරක භොජනයෙහි පචිත්තිඇවතට පැමිණෙයි. එකල රේවතතෙරුන්වහන්සේ "වහන්ස සඞ්ඝතෙමේ මාකියන්නක් අසාවා, මේ පළමුවෙනි වස්තුව සඞ්ඝයාවිසින් විනිශ්චයකරණලදී, මෙසේත් මේ වස්තුව ධම්මයෙන් විනයෙන් බුදුසස්නෙන් ඉවතය මේ පළමුවෙනි සලාකාව තබමි" වදාළසේක.

එම ක්‍රමයෙන් ඉතිරි නවයෙහිත් විනිශ්චය දතයුතුයි. මෙහි ද්වඞ්ගුලකප්පනම්, ඉරහැරී දෑඟුලක් සෙවනැල්ල වැඩෙනතුරු විකල්භොජුන් කැපය යනුයි, මෙද පචිත්තිඇවැත්කරයි, ග්‍රාමන්තරකප්පනම් පවාරිතවූ යමෙක් අන්ගමකට යනසිතින් කැපනොකොට ආහාරවැලඳීමයි, මෙද පචිත්තිඇවැත්කරයි, ආවාස කල්පනම්, නානා ආවාස ඇති එක්මූහ සීමාවෙක වෙන් වෙන් උපොසථකිරීමයි, එය උපොසථක්ඛන්ධකයෙහි දුකුළාබැව් වදාරණලදී, අනුමතිකල්පනම්, සතරවැන්නෙහි කිපරිද්දෙන්ම ඉවතාවෙනා ආවාසයන්හි වර්ගවූ සඞ්ඝයා විසින් විනය කටයුතු කිරීමයි, මෙද චම්පෙය්‍යක්ඛන්ධකයෙහි කිපරිද්දෙන් දුකුළායි, ආචිණ්ණකප්පනම්, ගුරුඋපාධ්‍යායන් විසින් කළදෙයක් කැපය යනුයි, යමක් ධම්මවිනයට එකඟනම් කැපයි එසේනැත්නම් අකැපයි, අමථිතකප්පනම්, යම්කිරක් කිරිබැව්න් තොරනම් දීබවටත් නොපැමිණියේනම් එසේවූදෙය පවාරිතවූවහු විසින් කැපකරවා නොගෙණ පීමයි මෙද පචිත්තිකරයි, මෙහි ජලෝගි පාන කල්පයනම්, යම්සුරාවක් මත්වෙනබවට නොගියේනම් එසේවූ පීමයි * මෙද පචිත්තිකරයි, දසවළුනැති නිසිදනය කැපය යනු එකෙක්, ඒ නොකැපයි, පරිහරණයකළ පචිත්තිකරයි, ජාතරූපරජතය කැපයයනු දසවැන්නයි, මේ පිළිගත පචිත්තිකරයි, මෙසේ දශය විචාරා නැවත නොකැපබැව් නිශ්චය කොටගෙණ මහාවනයෙහි කූටාගාර ශාලාවට එලඹ එහිදීත් මෙසේ පුච්ඡා විසජ්ජනයෙන් සඟමැද විනිශ්චය කළහ, දෙවන සඞ්ගීතියට නිදාන මෙසේයි.

---

* සමහර පොතක ජලෝගීයි පෙණෙයි.

මෙසින්පසු සත්සියයක් රහතන් වහන්සේලා රැස්ව සත්මසකින් දෙවන සඞ්ගායනාව නිමවනලදී.

තුන්වන සඟායනාවට නිදාන නම්.

බුදුන් පිරිනිවි දෙසිය අටළොස්වෙනෙහි දඹදිව් අගරජ පැමිණි මගධ රට පැළලුප්නුවර විසූ ධර්මාශොක මහරජු ඇතුළු මහජනයා බුඩශාසනයෙහි ශ්‍රඩාභක්ති උපදවා මහත් පූජාසත්කාර පැවැත්තුහ. ඒ මහරජු මල් තිස්‍යනම් යුවරජතෙමේද එම මහරජහුගේ දියණි සම්මිත්කුමරිය වල්ලභ අග්ගිබ්‍රහ්මානම් කුමරද සස්න පැවිදිවූහ. එසේම එම අගරජ පිත් මිහිඳුකුමරුහා සම්මිත් කුමරීත් පැවිදිවූහ——තවද මෙම පැළලුප්නුවර තිස්සය සුමිත්‍රාය යන කුන්තපුත්‍ර තෙරුන් දෙදෙනා ධර්මාශොක රජහු ඔටුනුපැළඳි අටවැනි හවුරුදුයෙහි සාඩිප්‍රාතිකායක් දක්වා පිරිනිවන්පෑසේක්ලාය——මේකාරණ හේතුකොටගෙණ බුදුසස්හට උපන් මහාගංවතුරු බඳු ලාභසත්කාරබලා එහි ලොල්වූ තීර්ථකයෝ අසන වසන මාත්‍රයකුත් නොලබන්නාහු භික්ෂූන්වෙතහා තමතමන්මත් කසාපිළි හැඳපෙරවගෙණ අපිත් සෞගත ශ්‍රමණයම්හයි භික්ෂූන් අතුරට වන්හුය. සුගත්සමයෙහි එසේ පැවිදි වෙස් ගත්නමුත් සවකීය පූර්වපරිචිත පර්වතාප ආදිත්‍යානුපරිවර්තනාදි තීර්ථකක්‍රියා කෙරෙති, භික්ෂූහු ධර්මයෙන් විනයෙන් අනුශාසනාකොට මොවුන් සසුන් පිළිවෙත්හි යොදන්ට හෝ ශාසනයෙන් බැහැර ලන්ටහෝ නොපොහොසත්වූහ.

භික්ෂුසඞ්ඝයා පොහෝපවුරුණු ආදි විනය කම් කරණට රැස්වූකල උක්තප්‍රකාර අනාචාරයෙහි හැසිරෙණ තීර්ථකයෝද අවුදින් අතරතුර ඉඳගණිති, මොවුන්හා පෙසල භික්ෂූහු විනය කම් නොකරති මෙසින් අශොකාරාමයෙහි සත්හවුරුද්දක් පොහෝ කිරීම සුන්විය. එ පවත්අසා රජ්ජුරුවෝ ඒ අධිකරණය සන්සිඳුවනු සඳහා ඇමතියෙකු යැවූය; මුග්ධ ඒතෙමේ ගොස් පොහෝ කරවියයි පිරිසට අණකෙළේය; පෙසල භික්ෂූහු මේ තීර්ථකයන් සමග පොහෝ නොකරම්හයි කීකල පොහෝ කරවම් කියා තෙරුන් කීපදෙනෙකුත් හිස් කපාහෙළීය, ඒ දැක රජහුමල් තිස්සතෙරහුවෝ වහා ගොස් ඔහුට ආසනනඅස්න හිඳගත්සේක ඇමති ඒතෙරුන් දැක උන්වහන්සේට එබන්දක් කරන්ට නොපොහොනේ හැරීගොස් රජහට එපවත් දැන්වීය.

ඒ ඇසූ රජතෙමෙ හටගත් දැහැඇතොත් වෙහෙරට ගොස් මේ අකුසල කර්මය කාටවේසි පිළිවිසෝය, සමහරු තොපටයයි කියාද සමහරු දෙදෙනාටමයයිද බුඩසමයෙහි නිපුණයෝ භික්ෂු

ඝාතාඝාතයෙහි නොපසිත්නැතිබැවින් ඔහුට පමණක්යයිද තුන් පක්ෂව තිබුය——රජතෙමේ නොසතුටුව මේ ශුද්ධා පුරළමටත් අධිකරණ විනිශ්චයටත් සමර්ථකවරේදැයි විචාරා එකලට අහෝගඟාපව්වත විහාරයෙහි විසූ මොග්ගලිපුත්තතිස්ස මහතෙරණු වන් ගෙන්වා උන්වහන්සේගේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දැක සතුටුව භික්ෂුඝාතනයෙන් පව්ඇද්දෙයි තමන්ට උපන් සැකය පිළිවිස්සේය, උන්වහන්සේ වට්ටකජාතකාදී බොහෝ දම්දෙසුන් දක්වා රජහට පව්නොවන පරිදි නිශ්චය කළසේක. ඉක්බිති සත්දවසක් උයන්හි වස්වා ඒ තෙරුන්වෙත හිඳගෙණ ශාශ්වතාදී දෘෂ්ටි මේ මේ යයි තීරණයකොට ඉගෙණ දඹදිව සියලු භික්ෂූන් කැවි කරවා පැවිදිවෙස් ගෙණ භික්ෂූන්අතරට වන් සියලු තීර්ථකයන් බැහැරලා ඒ මහතෙරුන් අනුශාසනායෙහි පිහිටාගෙණ ශාසනය ශුද්ධකෙළේය——මෙසේ නෙරපූ තීර්ථකයෝ පසල්දනව් ගොස් එහි රැස්ව සංවිධාන කොට ගෙණ අබුද්ධවචනයන්ද බුද්ධවචනයන්ද මිශ්‍රකොට වර්ණපිටකාදී බොහෝ පොත්කොට බුද්ධසමයයි ලොවට ප්‍රකාශකළෝ—මෙහි විස්තර සමන්තපාසාදිකා සාරසඞ්ග්‍රහාදියෙන් දත්තේයි.

තවද දෙවන සඞ්ගායනාකාරක මහතෙරුන් විසින් දශවස්තුඅධිකරණ විනිශ්චයෙන් නිග්‍රහකරණලත් වජ්ජිපුත්‍රක භික්ෂූහු දසදහසක් එක්ව පිටිසර ජනපදයට පැමිණ එහි දුර්වල රජුන් එක්කොට ගෙණ මහාසඞ්ගීතියයි නමලත් ශාසනාර්බුදයක් ඉපදවූහ, මේ කථාව මහාවංසටීකාය අටුවාදියෙහි ඉතාසංක්ෂෙපයි. දීපවංස කථාවත්ථුප්‍රකරණ අටුවා දෙක්හි විස්තරව පෙණෙයි, මෙම කියනලද්දී දීපවංසයෙහි.

නික්කඩ්ඪිතා පාපභික්ඛූ ථෙරෙහි වජ්ජිපුත්තකා
අඤ්ඤං පක්ඛං ලභිත්වාන අධම්මවාදී බහුජ්ජනා.

දසසහස්සා සමාගන්ත්වා අකංසු ධම්මසඞ්ගහං
තස්මායං ධම්මසඞ්ගීති මහාසඞ්ගීති වුච්චති.

මහාසඞ්ගීතිකා භික්ඛූ විලොමං අකංසු සාසනෙ
භින්දිත්වා මූලසඞ්ගහං අඤ්ඤං අකංසු සඞ්ගහං.

අඤ්ඤත්‍ර සඞ්ගහිතං සුත්තං අඤ්ඤත්‍ර අකරිංසු තෙ
අත්ථං ධම්මඤ්ච භින්දිංසු * නිකායෙසුච පඤ්චසු.

පරියාය දෙසිතංචාපි අථො නිප්පරියාය දෙසිතං
නීතත්ථඤ්චෙව නෙය්‍යත්ථං අජානිත්වාන භික්ඛවො.

අඤ්ඤං සන්ධාය භණිතං අඤ්ඤං අත්ථං ඨපයිංසු තෙ
ව්‍යඤ්ජනච්ඡායායතෙ භික්ඛූ බහුං අත්ථං විනාසයුං.

* විනයෙ-බොහෝ පොත්හි.

ඡඩ්ඩෙත්වා ඒකදෙසං සුත්තං විනයගම්භීරං
පතිරූපං සුත්තං විනයං තඤ්ච අකරිංසු තෙ.
පරිවාරං අත්ථුද්ධාරං අභිධම්මං ඡප්පකරණං
පටිසම්භිදඤ්ච නිද්දෙසං එකදෙසඤ්ච ජාතකං.
එත්තකං විස්සජ්ජෙත්වාන අඤ්ඤං * තඅකරිංසුතෙ
නාමලිඞ්ගං පරික්ඛාරං අකප්පකරණීයානිච.
පකතිභාවං විජහිත්වා තච අඤ්ඤං අකංසුතෙ
පුබ්බගමා භින්නවාද මහ සඞ්ගීති කාරකා
තෙසඤ්ච අනුකාරෙන භින්නවාද බහූ අහු.

මේ වජ්ජිපුත්‍රක භික්ෂූහු කශ්මීරදනව් ගොස් එහි රජුන් පිටිව හල්කොට ගෙණ පූර්ව්‍යංකත සඟායනාව කළහයි බෙහෝ දෙනා කියති, මෙහි සංඝපාල නාව (දෙවෙනි සඟායනාකාරු) තෙරුන් විසින් බැහැර කරණලද අධර්මවාදී බෙහෝදෙනෙක්වූ පාපභික්ෂූහු අනික් පක්ෂයක් ලැබගෙණ දසදහසක් සමාගම්ව ධර්මසඞ්ග්‍රහයක් කළහ. එහෙයින් (බොහෝ ගණනක්වූ හෙයින්) මහාසඞ්ගීතියයි කියනු ලැබෙයි. මහාසඞ්ගීතිකාරු භික්ෂූහු සස්න ව්‍යාකුල කළහ. (මහාකාශ්‍යපාදි ස්ථවිරයන් විසින් කරණ ලද) මුල්සඞ්ග්‍රහය බිඳ අනික් සඞ්ග්‍රහයක් කළහ; අන්තැනෙක එක්කළ සූත්‍ර ඉන්අන්තැන තැබූහ; පස්නිකායෙහිම අර්ථය ධර්මය බින්දෙව්ය, කාරණවත් සඳහා කරණලද දේශනාවද වැලි ධර්මවූ පරිද්දෙන් දේසිත දැයද අභිද්‍රාශක දේශනාවද අනික් ප්‍රකාරයකින් අවබොධ කටයුතු දේශනාවද පිරිසිඳනොදත් ඒ භික්ෂූහු අනිකක් සඳහා භාෂිතයට අනික් අර්ථයක් තැබූහ. ඒ භික්ෂූහු ව්‍යඤ්ජනසෙවනැල්ලෙන් බොහෝ අර්ථවිනාශ කළෝයි. තවද ඒ භික්ෂූහු සූත්‍රෙකදෙශයක්ද විනයගාම්භීර්‍යද බැහැරලා පිළිරූ සූත්‍රහා විනයඇතිපාලියද කළෝයි. පරිවාරය අත්ථුද්ධාරය ෂට්ප්‍රකරණ අභිධර්මය ප්‍රතිසම්භිදමාර්ගය නිද්දෙශපාලිය ජාතක සමහරෙක මෙතෙක්දැ හැර ඒසඳහා අනිකක්ම කළහ. නාමය ලක්ෂණය පරිෂ්කාරය ආකල්පකරණයෝය ප්‍රකෘති භාවය යනමෙය හැර අනික් සිතුනක්ම කළෝය. මහාසඞ්ගීකාරකයෝ අන්‍යවාද ඇත්තාහු එබඳුවූවන්ට ප්‍රධානවූහ ඔවුන් අනුව ක්‍රියාකිරීමෙන් බොහෝවූ භින්නවාද ඇතිවූහ යනාදී විස්තර දීපවංසයෙහි සහ කථාවස්තුඅටුවායෙහි ආයේයි.

මෙසේ බිදුනුවාද මෙහිම පස්වන පරිච්ඡෙදයෙහි පෙණෙයි උක්තප්‍රකාර බිඳුනාත්ගෙන් පළමුවැන්නෝ මහාසඞ්ඝිකය මහාසඞ්ගීතිකයයිද ලබන ලද නම්ඇති වජ්ජිපුත්‍රක භික්ෂූහුමය;

ලිච්ඡවිය වජ්ජිය යන නම්දෙක ඒකාර්ථයි, ලිච්ඡවිජනපදයෙහි උපන්නන් හෙයින් වජ්ජිපුත්‍රකයයි ව්‍යවහාරයි මහත්වූ බොහෝවූ භික්ෂුසමූහයා විසින් යුක්තබැවින් මහාසඞ්ඝිකයයිද එසේම බොහෝවූවන් විසින් කළ සඞ්ග්‍රහය හෙයින් මහාසඞ්ගීතිකයයිද කියති. මොව්හු ආත්මවාදීබැවි "පුග්ගලෝ උපලබ්භති සච්චිකට්ඨ පරමට්ඨෙන" ආදින් විස්තෘතකථාවස්තුප්‍රකරණාදීයෙහි ආයේය.

තවද මොවුන්ගෙන් සමහරු රහත්හු රහත්ඵලයෙන් පිරිහී අනාගාමීවෙති අනාගාමීහු ඉන්පිරිහී ශකෘදාගාමී වෙත් ඔව්හුද එයින් පිරිහී සොවාන් වෙති මෙසේ සොවාන්වූවෝ ඉන්පිරිහී පෘථක්ජන වෙතැයි නොකියති. උක්තප්‍රකාර සොවාන් ඵලයතෙක් පසු බැස්සාහු ශකෘදගාමි අනාගාමි නොව එකවටම රහත්වෙතැයි කියති. ථෙරවාදයෙන් බිත් වජ්ජිපුත්තිය භික්ෂූහුද සම්මිතියයෝද සබ්බජීවාදීහුද යන තුන් පක්ෂයත් මෙමවාද ඇත්තෝයි.

හව්දිග බුදුවරයෝ ඇතැයියන වාදයනම් මෙසේයි; නැගෙණහිරි බටහිරි උතුරු දකුණු දසාහි උඩයට අනේක බුද්ධක්ෂෙත්‍රයන් අතික්‍රාන්තකොට ඉන් ඈත බුදුවරයෝ වසන්නායයි වාද කෙරෙති නෙපාලාදීයෙහි ප්‍රසිද්ධ සුඛවතිවූහ මහායානසූත්‍රාදිය මොවුන්ගේ ප්‍රකරණයි—කෙබඳු වර්ණයක් ගොත්‍රයක් ඇත්තාහුදැයි පුළුවුත්කල "නහෙවං වත්තබ්බ" එසේ කියයුත්තේ නොවෙයි කියති මේවාද ඇත්තෝ මහාසඞ්ඝිකයෝයි.

බ්‍රහ්මචරිය වාසවාදය, මාර්ගභාවනාවද ප්‍රව්‍රජ්‍යාවද යන දෙක බ්‍රහ්මචරිය වාසයි. මෙයින් මාර්ගභාවනාව අසඤ්ඤසත්ත බඹුන් විනා කාමරූප අරූප දෙවියන් කෙරෙහි විද්‍යමානයි. ප්‍රව්‍රජ්‍යාව වනාහි මිනිස්ලොව හැර කොහිත් නැත්තේයි. මෙම සම්මිතිය භික්ෂූහු මාර්ගබ්‍රහ්මචරියාවත් දෙවියන් කෙරෙහි නැතැයි ලබ්ධිඇත්තෝයි, ඒ බුද්ධසමයට විරුද්ධයි. සබ්බජීවාදීහු නම් සියල්ලම විද්‍යමානයයි ලබ්ධිගත්තෝයි, එනම් අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න ඛන්ධායතන ධාත්වාදිය ඇත්තේය විද්‍යමානයැයි යනුයි.

සතිපට්ඨානවාදීහු සියලුධර්මයෝම සතිපට්ඨානයෙහිය, මෙයින් පිටත් ධර්මයෙක් නැතැයි ලබ්ධිඇත්තෝයි. මොවුන්ගේ සාමාන්‍යනාමය කස්සපිකය අන්කැයිද යෙත් පුබ්බසෙලිය අපරසෙලිය රාජගිරිය සිද්ධත්ථිකයයි නිකාය සතරෙකි—කුසලවාදීහු "සබ්බං භික්ඛවෙ ආදිත්තං" යනාදින් උරුවෙලකාශ්‍යපාදී දහසක් පුරාණ ජටිල භික්ෂූන්ට රජගහනුවර සමීපයෙහි ගයාශීස අතලගල්හිදී බුදුන් විසින් වදාරණලද ආදිත්තපරියාය සූත්‍ර නුසුවනින් සලකා අර්ථ වරදවාගෙණ මුළුතුන් ලොව සියල්ලම ඇවිලගත්

සිළුරක්ඛිත අඟුරුමුහු අළුවැන්නැයි ගන්නාලද ලබ්ධියයි, මේවාද ඇත්තෝ ගෝකුලිකයෝයි—අනුපුබ්බාභිසමය වාදනම් දුඃඛාදි චතුස්සත්‍යය අවබොධකිරීමෙන් සතරවරකින් කෙලෙස් නසා සෝවාන් ඵලයට පැමිණෙයි, ඉතිරිඵලත්‍රයද මෙම න්‍යායයි. මොවුන්ගේ කල්පනාවේ ක්‍රමයට සොළොස්වරකින් රහත්ඵලය අවබොධකටයුතුවේ, මේ වාද ඇත්තෝ පූර්වොක්ත අන්ධකනිකාය සතරහා සබ්බත්ථිවාදිසම්මිතිය භද්‍රයානිකය යන මොවුහුයි.

නිරොධවාදය නිවන්දෙකක් ඇතැයි ගන්නා ලබ්ධියයි, මේ වාද ඇත්තෝ මහිංසාසකයන්හා අන්ධක යෝයි—උක්තප්‍රකාර තීර්ථකයන්ගේ මිථ්‍යාවාදහා ශාසනිකයන්ගේ වෛතුල්‍යවාද මර්දනය සඳහා බුදුන් විසින් සංක්ෂෙපයෙන් වදාළ නය විස්තරකරන්නාවූ මොග්ගලිපුත්තතිස්ස මහතෙරනුවෝ කථාවස්තුප්‍රකරණය සඟමැදවදාරා තුන්වන සඞ්ගීතියටද ඇතුළත්කළහ.

මෙසේ දෙසැත්තෑවස්ඇති මොග්ගලිපුත්තතිස්ස මහතෙරුන් විසින් දම්සෝරජු ඔටුනුපලන් පන්තිස්වනු බුධ වර්ෂ දෙසියසතිස්වෙනෙහිදී තුන්වන සඟායනාව කොට නිමවා මධ්‍යදෙශයෙන් බැහැර ඒ ඒ රටවල බුදුසසුන් පිහිටුවනුපිණිස මෙහි දෙළොස්වන පරිච්ඡෙදයෙහි කීපරිද්දෙන් ඒ ඒ තෙරුන් ඒ ඒ ජනපදවලට යැවූසේක.

මහාකාශ්‍යපාදී මහරහතන් වහන්සේලා විසින් කරණලද ථෙරියනම් පළමුවෙනි සඞ්ගායනාව සර්වඥයන්වහන්සේ පිරිනිවන්පෑ වර්ෂයෙහි කරණ ලද්දීය, දෙවෙනි සඞ්ගායනාව ඒ සර්වඥයන්වහන්සේගේ පිරිනිවීමෙන් අවුරුදු 100 ක් ගෙවුන් කල්හි කාලාශොක මහරජනන්ගේ රාජ්‍යයේ 10 වෙනි හවුරුදු යෙහි කරණලද්දීය, එහි බුදුන් දුටු ස්ථවිරයන්වහන්සේලා අට නමක්වූහ. ඒ අනුරුද්ධානන්දාදී මහාශ්‍රාවකයන්වහන්සේලාගේ ශිෂ්‍යයෝයි. ඒ දෙවෙනි සඞ්ගීතියෙන් වර්ෂ 135 ක්වූ කාලයෙහි තුන්වෙනිසඞ්ගීතිය මොග්ගලිපුත්තතිස්සාදී මහරහත් තෙරුන් වහන්සේලා විසින් කරණලද්දීය.

ඒ තුන්වෙනි සඞ්ගීතියෙහි ප්‍රධානත්වය මොග්ගලිපුත්තතිස්සනම් මහරහතන්වහන්සේ විසින් දරණලද්දේය, උන්වහන්සේ සිග්ගව නම් රහතුන් වහන්සේවිසින් පැවිදිකරණ ලද්දේය චණ්ඩවජ්ජිස්ථවිරයන් වහන්සේලඟ සූත්‍රාභිධර්මාදිය ඉගෙණගත්සේක, උන්වහන්සේ පැවිදිකළ සිග්ගවතෙරුන්වහන්සේ සොණකනම් රහතුන්වහන්සේගේ ශිෂ්‍යයෙකි, ඒ සොණකතෙරණුවෝ දාසකනම් තෙරුන්ගේ ශිෂ්‍යයෙකි; ඒ තෙරුන්වහන්සේ වනාහි පළමුවෙනි සඞ්ගීතියේ විනය විසඳූ බුධකාලයෙහි වැඩ

Digitized by Google

සිව් විනයධරයන් අතුරෙන් අගතන්පත් උපාලි මහතෙරුන්
වහන්සේගේ ශිෂ්‍යයායි, එසේවූ කල්හි බුඬකාලයෙහි උපාලිස්ථ
විරයන් වහන්සේගේ ශිෂ්‍යවූ දාසකස්ථවිරයන් වහන්සේ ප්‍රථම
සඞ්ගීතිකාලයෙහි විසිවයස්ව වැඩසිටිසේක්නම්, දාසකස්ථවිරයන්
වහන්සේට වර්ෂ 90 ක් වන කාලය බුඬපරිනිර්වාණයෙන් වර්ෂ 70
ක්වූ කාලයයි; උන්වහන්සේවිසින් පැවිදිකරණලද ශෝණකස්ථ
විරයන්වහන්සේ උන්වහන්සේගේ කාලයෙහි විසිවයස් ඇතිව
වැඩසිටිසේක්නම්, දෙවෙනි සඞ්ගීතිකාලයෙහි ශෝණකස්ථවිර
යන්වහන්සේ, පණස්හවුරුදු වයස්ඇතෙත්යයි සිතියයුතුයි, ඒ
ශෝණකස්ථවිරයන් වහන්සේලඟ පැවිදිවූ සිග්ගවතෙරුන්වහන්
සේ ඒ දෙවෙනි සඞ්ගීතිකාලයෙහි ලදරුභික්ෂුව වැඩසිටිබව
සමන්තපාසාදිකා මහාවංසාදී පොත්වලින් ප්‍රකාශිතයි.

දෙවෙනි සඞ්ගීතිකාලයෙහි වැඩසිටි සබ්බකාමීනම් ස්ථවිර
යන්වහන්සේ එකල්හි උපසම්පදාවෙන් 120 වයස් ඇතිවවැඩසිටි
බව කියනලද්දේය, එහෙයින් උත්පත්තියෙන් 140 කට අඩුනොවූ
බව ප්‍රකාශිතයි, එහෙයින් සිග්ගවතෙරුන්වහන්සේට 110 ක්
පමණවයස වැලඳුයේනම් දෙවෙනි සඞ්ගායනාවෙන්පසු වර්ෂ 90
වක් ජීවත්ව වැඩසිටින්නට පුළුවන්ව තිබුනේය, උන්වහන්සේට
108 ක් පමණකාලයෙහි මොග්ගලිපුත්තතිස්සයන්වහන්සේ උප
සම්පදාව ලත්සේක්නම් ඒකාලය දෙවෙනි සඞ්ගීතියෙන් පසු
වර්ෂ 88 ක්වූ බුඬවර්ෂයෙන් 188 ක්වූකාලයයි එසේකල්හි, ඒ අත
රට තවත් හවුරුදු පසක් හැර සිග්ගවතෙරුන්වහන්සේට 103 ක
වූ කාලයෙහි බුඬවර්ෂයෙන් 183 හේදී සිග්ගවතෙරුන්වහන්සේ
ගේ ඉදිරියෙහි මොග්ගලිපුත්තතිස්සයන්වහන්සේ උපසම්පදාව
ලත්සේක්නම්, තවත් උන්වහන්සේගේ ආශ්‍රයෙහි නොහොත්
උන්වහන්සේගේ සහභාගී මිත්‍රවූ චණ්ඩවජ්ජිස්ථවිරයන්වහන්
සේගේ ආශ්‍රයෙහි පස්හවුරුද්දක් වසනකල, බුඬවර්ෂයෙන් 188 ද
මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන්වහන්සේගේ උත්පත්තියෙන්
වයස 25 ද වෙයි, ඒකාලයපටන් හවුරුදු 47 ගෙවෙනකල බුඬ
වර්ෂයෙන් 235 ක්ද මොග්ගලිපුත්තතිස්සස්ථවිරයන් වහන්සේගේ
උත්පත්තියෙන් වයස 72 කද වියයුතුයි, තුන්වනසඞ්ගීතිකාල
යෙහි මොග්ගලිපුත්තතිස්සස්ථවිරයන්වහන්සේ දෙසැත්තෑවයස්
ඇතිබැව් "රඤ්ඤසත්තරසෙවස්සෙ වාසත්තතිසමොඉසි" යන
මහාවංස පාඨයෙන් පෙණේ, තුමූත් ඒදෙසැත්තෑව උපසම්පදා
වෙන්ද උත්පත්තියෙන්දැයි නොකියනලදී "ථෙරොමහල්ලක
තෙතාපි" යනාදි පාඨවලින් මොග්ගලිපුත්තතිස්සස්ථවිරයන්
වහන්සේ තුන්වන ධම්මසඞ්ගීති කාලයෙහි ඉතා මහළුබැව්

Digitized by Google

යේ, එහෙයින් ඒදෙසැත්තෑව උපසම්පදාවෙන්යයි සිතියයුතුබැවි බලවති, ඉදින් එසේනම් තෙරුන්වහන්සේ උත්පත්තියෙන් දෙසානූ වස්ඇතෙත්සි, ඒ එසේනම් මෙහිදැක්වූ හවුරුදුගණනට තවත් විසැක්ලැබෙයි, එසේවූකල සිග්ගවතෙරුන්වහන්සේට වයස 83 පමණ කාලයෙහි උන්වහන්සේ ඉදිරියෙහි මොග්ගලිපුත්තතිස්සස්ථවිරයන්වහන්සේට උපසම්පදාව ලබනනට පුළුවන්ව තිබුනේය.

මෙය මෙතැන්හි අපවිසින් සඳහන්කරනනට කල්පනාකළේ දොස්තර් එච්. කැර්ණ් නම් ඉංග්‍රිසි උගතෙකු විසින් ශුඩකොට මුද්‍රිතවූ වරාහසංහිතාරම්භයෙහි යොදාතිබෙන කරුණුරහිත වාක්‍යයක් සඳහායි, ඔහුගේ වාක්‍යයෙහි සිග්ගවතෙරුන්වහන්සේවිසින් මහණකරණලද මොග්ගලිපුත්තතිස්සයන්වහන්සේ ලඞ්කාවාසී බෞඩයන්ගේ බුඩවර්‍ෂ ප්‍රමාණයෙන් වර්‍ෂ 235 හවූ කාලයෙහි 72 කක් වයස්ඇතිව සිටීම නුපුළුවන, එසේනම් සිග්ගවස්ථවිරයන්වහන්සේ අවුරුදු 165 ක් වයස්ඇත්තෙක්වියයුතුය කියාතිබේ, මෙසේකරුණු නොවිමසා පණ්ඩිතමානීව අනුන්ට දොස්කියන යුරෝපිය උගතුන්ගේ කිම්ඇසීම අපට පුදුමයක් නොවේ, ඒ යුරෝපියයන්ගේ බාහුල්‍යවෘත්තියෙන් පවත්නා චාරිත්‍රයෙකි.

බුඩකාලයෙහිද බුදුන් පිරිනිවන්පෑ ලඟකාලයෙහිද බොහෝ රහතන්වහන්සේලාට වර්‍ෂ සියයට වැඩි වයස් ගියබව හා උන්වහන්සේලා අනුවෙන් වැඩිවයසින් වෘඩවත් බ්‍රහ්මචර්‍ය්‍යාදි යහපත් චාරිත්‍රයෙන් ඉන්ද්‍රියබලඇතිව විශ්‍රවත්ව වැඩසිටිබවත් නොයෙක් පුරාණ සත්‍යවූ පොත්වලින් දැනගන්ට පුළුවන්ව තිබියදී ඒ නොදැනත් නොසලකාත් මෙයාකාර වාක්‍යපොත්වල ගල්පා තැබීම යහපත්ලෙස උගත් පණ්ඩිතයන්ට සිනාවට කරුණුමය, මෙයාකාර නොදනනාදෙය දනනාලෙස කියා යම් යම් තැන නැති දෙස් ගොඩනැගීම යුරෝපිය උගතුන්ගේ ස්වභාවෙන් පවත්නා චාරිත්‍රයක්බව මෙකල බුඩාගමේ පාලි පොත් ඉංග්‍රිසි අකුරෙන් මුද්‍රාකිරීමට ශුඩකොටදෙන දොක්තර් එච්. ඕල්ඩැන්බර්ග් උන්නැහේගේ ක්‍රියාවලින්ද හැඟෙන්ටතිබේ—ඔහු විසින් ශුඩකොට අච්චුගස්වනලද මහාවග්ගපොතේ මුල යොදා තිබෙන ඔහුගේ වාක්‍යයෙහි (XXVI පිටේ) පළමුවෙනි සන්ධියට නිදානය කියමින් සර්‍වඥයන්වහන්සේ විසින් තමන්වහන්සේ පිරිනිවන්පාන උදයට පූර්‍ව රාත්‍රියෙහි යම්සුභද්‍රනම් පරිබ්‍රාජකයෙක් තෙම පහදවා ශ්‍රාවක කරගනනාලද්දේද, බුදුන් පිරි

Digitized by Google

නිවන්පෑ බැව් අසා ඊට සතුටුව ඒ සර්වඥයන්වහන්සේගේ කැප
අකැප දක්වන ආඥාවෙන් මිදුනා යහපතැයි සිතා එහි සඬන
වලප්නා භික්ෂූන්ට නොසඬව් යනාදිය කීවේ ඒ සුභද්‍රභික්ෂූතෙ
මේයයි කියා තිබේ—ඒ බුද්ධපරිනිර්වාණය අසා සතුටුවූ සුභද්‍රනම්
මහළු පැවිදි කරනැවැම්මියෙක්ව සිට පැවිදිවූ අයෙක්බව සෙ
සජ්ජක්ඛන්ධකයෙන් ගෙණ මෙහි දක්වනලද්දේය—ඔහුගේ
පැවිදිවීම සර්වඥ පරිනිර්වාණයට වර්ෂ ගණනාකට පූර්වයෙහිවූ
එකකි. සුභද්‍රපරිබ්‍රාජකයා සර්වඥයන් වහන්සේගෙන් අවවාද
ඇසුවේ පිරිනිවන්පානනට පැගණනාකින් පූර්වයෙහිබව මහා
පරිනිර්වාණ සූත්‍රයෙන්ද එහි අටුවාවෙන්ද ප්‍රකාශවේ—ඒ විස්තර
යක් නොදැනත් දන්නෙකුගෙන් නොඅසාත් විකාර ලියා ප්‍රසිද්ධ
කර බුද්ධාගමේ ප්‍රවෘත්ති වෙනඅන්දමකින් යුරෝපියාදීන්ට
ඉගැන්වීම බලවත් අපරාධයකි—මෙයාකාර බුදුන් පිරිනිවන්
පාන්ට පැගණනාකට පූර්වයෙන් අවවාද කොට බුද්ධාගමට හර
වාගනනාලද පූරණ පරිබ්‍රාජකවූ සුභද්‍රතෙම ඉන් වර්ෂ ගණන
කට පූර්වයෙහි කරනැවැම්භාවයෙන් පහව පැවිදිවූ සුභද්‍ර වෘද්ධ
ප්‍රව්‍රජිතයායයි කියන, දොක්තර් ඕල්ඩැන්බර්ග් විසින් ධර්මසඞ්ගී
ති ආදියගැණ කියනලද කීම් කෙසේ ගරුකටයුතුද? ඔහු විසින්
මෙසේත් කියනලද්දේය, එනම්—මහා පරිනිර්වාණසූත්‍රය කළ
කර්තෲ පළමුවෙනි සඞ්ගායනාවගැණ කිසිත් දැනගණසිටියේ
නැත, එසේ කියන්නට කරුණුවසයෙන් දක්වන්නේ සුළුවග අව
සානයෙහි මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේගේ වාක්‍යයකි—එහි
බුදුන් පිරිනිවන් පැබැව් අසා කෙලෙස්සහිත බෙ.ගෝ භික්ෂූන්
සඬනවැලපෙනකල්හි සුභද්‍රනම් බුද්ධපබ්බජිතයා අයෝග්‍ය
ලෙස කී කීමයි—එය මහාපරිනිර්වාණසූත්‍රයට ඇතුළත් නොකළේ
ඒ සූත්‍රයේ කර්තෲ ඒ කථාව නොදන්නාතිසාලු—මහාපරි
නිර්වාණසූත්‍රයේ කාණ්ඩය කියනනාට අමුත්තෙක් නොමැත්තේ
ය, ඒ සූත්‍රයේ ධර්මයෝද තථාගතයන් වහන්සේ විසින්
දෙසිතයි, නිදානාදිය සඞ්ගීතිකාරක ස්ථවිරයන් වහන්සේලා
විසින් තබනලදී. සුභද්‍රනම් මහළු පැවිද්දාහුගේ කථාව දක්වා
තිබෙනෙන් පළමුවෙනි සඞ්ගීතිය කරනනට කරුණු පෙන්
වන පිණිසයි. එය සඞ්ගීති කථාවට ගැලපියයුත්තකි—මහාපරි
නිර්වාණසූත්‍රයට ඇතුළත් කටයුතුධර්මයක් නොවේ—සඞ්ගීති
කාරක් මහාස්ථවිරයන්වහන්සේලා විසින් ඒ ඒ කථාවෝ ඥදුසු
තන්හි ගළපනලද්දාහුය. ඒ යුක්තියුක්තය කිසිත් නොදන්නා
දොක්තර් ඕල්ඩැන්බර්ග් විසින් කියන ලද වාක්‍යය සැලකිය
යුතුනොවේ—බොහෝකොට කීමෙන් ප්‍රයෝජනකිම.

මෙහි මහාවංශ පූර්වභාගයෙහි ගාථාපනසක් උතුරුකොට ඇති පරිච්ඡෙද සතිසෙහි, ගාථාගණනින් දෙදාස් නවසිය තිප සෙකි, මහාවංශයෙහි මේ අර්ථයට ටීකාවකුත් තිබෙයි, මීට අවුරුදු සතළිහකට පමණ පූර්වයෙහිදී ජෝර්ජ්, ටර්නෝර් නම් ඉංග්‍රීසි ආණ්ඩුවේ වැඩවල යෙදිසිටි මහතෙකුවිසින් එකලට ලඞ්කාවේ ප්‍රසිද්ධ උගත් සෙංකඩගල නුවර විහාරවයෙහි තෙරුන්නාන්සේලාත් සමග පොත ශුද්ධකොට ඉංග්‍රීසි භාෂාවට නගා ඒ සමග පෙළ ඉංග්‍රීසි අකුරෙන් යොදා අච්චුගසනලදී.

මේ කාණ්ඩයෙහි අන්තර්ගතද්‍ර සැකෙවින් මෙහි දක්වමු, පළමුවෙනි පරිච්ඡෙදයෙහි සූවිසි විවරණය, බුදුබැව් පැමිණීම, තුන්වරක් ලක්දිවට වැඩීම, මහියංගන චෛත්‍යයාගේ පිහිටීම, යනාදියයි.

දෙවන පරිච්ඡෙදයෙහි මහාසම්මත වංශයෙහිපටන් බුදුන්පිය ශුද්ධෝදන මහරජ්ජුදක්වා රාජපරම්පරා දැක්වීම්ආදියයි.

තුන්වන පරිච්ඡෙදයෙහි ප්‍රථම සංගායනාදියයි.

සතරවැන්නෙහි දෙවන සංගායනාදියයි.

පස්වන පරිච්ඡෙදයෙහි තුන්වන සංගායනාව හා ඊට උපාථම්භක ධර්මාශෝකාදීන්ගේ කථාද්විස්තරයි.

සවන සත්වන දෙක්හි විජයකුමාරයාගේ උත්පත්තියහා ලඞ්කාවට පැමිනීම් ආදියයි.

අටවැන්නෙහි විජයරජ මල්හු පිත් පඬුවාසුදෙව කුමාරයාගේ ලඞ්කාවට පැමිනීම, බිසවුන් ලැබීම්ආදියයි.

නවවැන්නෙහි ඒ පඬුවාසුදෙව රජහුගේ දුවූ උන්මාද චිත්‍රාව හා පුතුන් දශදෙනාගේ කථායි.

දසවැන්නෙහි එම උන්මාදචිත්‍රාකුමරිය පිත් පඬුකාභයකුමරහු විසින් මයිලන් අටදෙනෙකුන්හා යුද්ධකොට ඔවුන් මරා ජය ගෙණ දූනට බසවක්කුලමයයි ව්‍යවහාරවූ අභය වැව බඳවා ලක්දිව මුද්ලෙලහිම ග්‍රාම සීමා නියමකොට අනුරාධපුරය එලිකොට මේ විපය බොහෝසෙපින් සමෘද්ධකිරීමයි.

එකොළොස් වන්නෙහි උහුපිත් මුටසිව කුමරහුගේ රාජ්‍යයහා එමරජහු පිත් දෙවැනි පෑතිස් රජුගේ කථාත් එමරජහු දම්සෝ රජුහා මිතුරුදම් පැවැත්වීම් කථාආදියයි.

දෙළොස් වන්නෙහි නැවතත් දඹදිව් පවත් එනම් තුන්වන සංගායනාව කළ මොග්ගලිපුත්තතිස්ස මහතෙරුන් විසින් ඒ ඒ ප්‍රත්‍යන්ත ජනපදවල බුදුසසුන් පිහිටුවනු සඳහා නොයෙක් රටවලට තෙරුන්වහන්සේලා යැවූ පරිදිද, ඒ වැඩිය තෙරුන්නාන්සේලා පැමිනි පැමිනි ජනපදවල පැවති කථා සංක්ෂෙපයි.

Digitized by Google

තුදුස්වැන්න පටන් පරිච්ඡෙද සයෙහි මෙම දිවයිනෙහි මහණ මෙහෙණි සසුන් පිහිටුවා ජයමහාබෝධි වැඩමවීම් ඒ ඒ තැන විහාර දාගැප් කරවීම් ආදි ශාසනය පිහිටවූ කථායි.

විසිවනෙනාහි ධම්මාශොකය දෙවෙනිපෑතිස්සය යන දෙදෙනාගේ කථිරියගා එම දෙවෙනිපෑතිස් රජ්ජුමල් උතතිය කුමරහුගේ රජවීමද හැටවස්පිරී මිහිඳුමහතෙරුන් පිරිනිවන්පෑමහා එම තෙරුන් නැගණි සඞ්ඝමිත්තතෙරනිය එකුන්සැටවස් පිරී පිරිනිවන් පෑමත් ඉතිරි ඉණ්ඩය ථෙර්විරාදින්ගේ පිරිනිවන්පෑමත් එම උතතිය රජු දසඅවුරුද්දකින් කථිරියකළබවත් දක්වනලදී.

එක්විසිවනෙනාහි එම උතතියරජහුමල් මහාසිවකුමර රජව දශ හවුරුදුක් රජකම්කෙළේය, ඔහුඇවෑමෙන් මල් රත්පිඩු තිස්කුමර සූරතිස්නමින් රජව දශහවුරුදුක් රජකම් කෙළේය, සේනය ගුත්තිකය යන අස්නැවිපුත් දෙමළු දෙදෙනෙක් සූර තිස් රජ්ජුමරා දෙවිසිහවුරුදුක් රජකම්කළහ, මුටසිවරජ්ජුපිත් දෙවෙනිපෑතිස්රජ්ජු හෑමටබාලමල් අසේලකුමර ඒදෙමළුන් බැහැර කොට දසහවුරුදුක් රජකම්කෙළේය, එලාළනම් දෙමළකෙනෙක් සොලිරටින් අවුත් අසේලරජුගෙණ සතළිස්සතර හවුරුදුක් දැහැමින් රජකෙළේය යනාදියයි.

දෙවිසිවැනි පරිච්ඡෙදය පටන් දෙතිස්වැනන අවසානය දක්වා ගැමුණු රජහුවිසින් දෙමළුන් සාද රජය එකසත් කොටගෙණ මිරිසවැටි ලොහොපහ රුවන්වැලි දාගැප්ආදි විහාර දාගැප්කරවා බොහෝ පින්හා ලෝවැඩකොටගෙණ ස්වර්ගීගාථිවූ කථායි.

තිස්තුන්වැනෙනාහි එක්සැටවස් නවමස් දසදිනක් ඇතුලත ගැමුණුරජ්ජු මල් සැදැහැතිස් රජ්ජුහා ඔහුපුතුන් සතරදෙනාකුගේ රජයත් අනතරයෙහි දෙමළරජුන් පස්දෙනෙකුගේරජයත් දක්වනලදී, තවද මහාවිහාරාරම්භයෙන් අවුරුදු දෙසියසතළිස කින් මතුයෙහි දසමසක්හා දිනදසයක් ගියකල වට්ටගාමිනී අභයයි කියනලද වළගම්අබාරජුවිසින් අභයගිරිවිහාරය පිහිටවන ලදී, ඒ කාලයෙහිපටන් ධම්මරුචිකයයි කියනලද මහාවිහාර යෙන් බුන් බයිරිනක භික්ෂුහු ඇතිවූහු, මොවුන්ගෙන්බිඳී දෙනාතක භික්ෂුහු ඇතිවූහු, මොවුහුම සාගලිකයයිද ව්‍යවහාරයි, මොවුන්ගේ විහාරය දැනට ජෙතවනයයිකියන දාගැබයිහාරයි මේආදි කථායි.

සිවුතිස්වනෙනාහි අනූපස්අවුරුදු තුන්මසක්කාලයයි. මෙහි මාසිථ, චොරනාග, තිස්ස, සිවබලත්, පූරවබුදෙමළ, දරකෑටිතිස්, නීලිය, අනුලා, භාතික, දෑසිය, යන එකොළොස් දෙනාරජකම් කළහ, මෙහි සිවබලත්ආදි පස්දෙනා දමරිකයෝයි, ඉතිරිසදෙ

Digitized by Google

නා විජයරජ පරපුරෙහි ඇත්තෝයි, සිවබලත්ආදීන්ගේ රාජ්‍ය යත් සතරඅවුරුදු දෙමසකි, මෙසින් චොරනාග රජහුවිසින් අට ළොස්මහාවිහාරය සිඳ බිඳදමනලදී, ඉතිරිසියල්ලෝ පූර්‍වපරා යණයෝයි, යනාදිකථායි.

පන්තිස්වැන්නෙහි රජුන්දොළොස්දෙනෙකි මෙහි දක්වූ අඹ ගැමුණුරජුට විජයපරම්පරාවේ නෑකමක් ඇතිබව නොකියන ලදී, ඉලනාගරජුතෙමේ අඹගැමුණුරජහුගේ බෑනායි, අටවෙනි බලත්රජ දෙරටුපල් නායකයි, නවවෙනි වසභරජ ලම්බකර්ණ ගොත්‍රයි, දොළොස්වෙනි මහළු නාරජ ගජබාගැමුණුරජහුගේ මෙහෙසිය පියායි, මේකීසියල්ලෝම ලෙව්සසුන් වැඩුවෝයි, මේ ආදියයි.

සතිස්වැන්නෙහි තෙළෙස් රජකෙනෙකි අවුරුදු එකසියතිස්හ යයි, මේරජුන් අතුරෙන් ව්‍යවහාරතිස්ස රජතෙමේ යහපත්කොට රාජනීති තනා ලක්දිව්වැසියන් හිංසාවෙන් තොරකෙළේයයි පෙණෙයි, සිරිසඟබෝ රජතෙමේ පවසිලයෙන්යුක්තව දැහැමින් රජකෙරෙමින් ලඞ්කායෙහි දුර්භික්‍ෂකාලයෙහි සත්‍යක්‍රියාබල යෙන් වැසිවස්වා රතැස්නම් යක්‍ෂයාදමනය කෙළේය, ඉඹ පිණිස දුමරිකයෙක් ආකල පවුනොකැමතිහෙයින් තුවරින් සැඟවීගොස් වනයෙහි වෙසෙමින් මාර්ගිකයෙකුට ඉසදන්දුන් නේයි, යනාදි ආශ්චර්‍ය්‍යකියනලදී.

සත්තිස්වන පූර්වාර්ධයෙහි මහසෙන්රජහුගේ කථායි, ඒ තෙමේ සත්විසිවසක් රාජ්‍යයකෙළේය, ඒ රජතෙමේ අසත්පුරුෂ සමාගමයෙන් මහාවිහාරය විධ්වංශනය කෙළේය, අභය ඇමතියා විසින් රජුපහදවනු ලදුයේ ඒ විහාරය නැවතකළේය ජේතවන මහදාගැබ බැඳවී, මින්නේරිවැවආදි සොළොස්වැවක් කරවී, මේආදිබොහෝ පිනුත් පවුත් කෙළේය යනාදිකථායි.

මහාවංශ පූර්වාර්ධ සංක්‍ෂෙපය මෙතෙකින් නිමියේය.

Digitized by Google

Digitized by Google

ERRATA.

ශුද්ධිපත්‍රය.

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
2	18	වීල	විල
,,	33	හසින්	ඉතා හසින්
3	9	(එකල්හි දෙවියෝ	(එකල්හි දෙවියෝ)
,,	21	ළද්දවූ	ලද්දවූ
,,	28	පාෂාණයකින්	පාෂාණයෙන්
6	14	කරුණාව	කරුණාවවේවා
,,	21	නාගරජයෙනි	නාගරාජයෙනි
,,	33	සිවුරු	සිවුර
10	18	වේවයි	වෙවයි
,,	30	සියදු	ධුරන්ධරවූ සියදු
17	1	යත	යතමෙ
25	17	තෙතෙමේ	තෙමේ
,,	27	යෙත්	යෙත්කල්වූසේ
32	18	කම්පාවෙක්	කම්පාවක්
,,	19	කම්පාවෙක්	කම්පාවක්
33	12	තියේය	තියා
,,	14	සමගි	සමගිව
34	6	ගිජුවූ	ගිජුවූවාය
,,	17	ඇළුනේ	ඇළුනේ ඇය
35	32	ප්‍රසිද්ධබැවිනුත්	සතුටුවූවෝ
36	4	නම	නම සියල්ලෝ පුතුන්දෙතිසෙක
37	6	පමනින්	පමණින්
38	31	ගැහුව	නැහුව
39	3	ගෙයකින්	ගෙයකින් තඹවන්බිම දුහුවි ලෙන් සපශ්කළ
,,	32	සැපසු	සම්බවූ
40	19	පුතුන	පුතුන්
43	2–3	මිනිසුන්	මිනිසුන් සියයක්
,,	14	දීඝායු	දීඝායුස්
,,	15	දීඝායුග්‍රාම	දීඝායුර්ග්‍රාම

Digitized by Google

පිට.	පේළි.	අශුද්ධ.	ශුද්ධ.
43	37	වැදීම්ගෙට	ඇ වැදීම්ගෙට
44	4	ඇතාති	ඇති
45	18	මෙහෙයන	එකෙණෙහි මෙහෙයන
,,	34	පුතු	පුතුවන්ද
,,	36	අස්වා	නම අස්වා
46	9	ඒ	එහි ඒ
,,	19	ඒසියල්ලන්	ඕතොමෝ ඒ සියල්ලන්
,,	28	නුවර	ගම
,,	30	කුමර	කුමරම
,,	32	කුමර	කුමර මහසේනාහා සමග
,,	28	හටසේනා	එසිත් නික්ම හටසෙනා
49	13	කළාහුය	නිබද කළාහුය
,,	16	පෙළ	පෙළ එකල
51	25-26	නානාදූතවෘතත	නානාදූතවත්තා
52	18	වප්	ඉල්
54	12	ප්‍රාණීන්ට	මිනිසුන්ට
,,	36	ජලරාක්ෂසියක්	එකල වනාහි ජලරාක්ෂසියක්
56	11	මේ	ඒ
58	11	මමමය	වහන්ස මමමය
59	38	උන්	මුන්
61	33	සතුටුවූයේය	සතුටුවූයේය මහජනතෙම තුටුපහටුවිය
62	17	රජගෙට	රජගෙට වැඩ ඇට
67	8	මෙහිම	එහිම
71	25	සීමාව	සීමාව සමකල්හි
75	14	නුවරට	පිඬුපිණිස නුවරට
76	14	දරමින්	දරවමින්
82	25	ප්‍රාතිහාර්යයෝ	ප්‍රාතිහාර්යයෝද
84	20	සිටියාවූ	ඇඳිලිබැඳ සිටියාවූ
85	1	පටන්	පටන් ආදරසහිතව
,,	7	යසි	යනනාමින්
86	24	ජනයෙද	ජනයෝද
90	18	බහා	සුනුව බහා
92	13	රාජ්‍යයෙන්	රාජාභිෂෙකයෙන්
,,	33	ලිහිණිතොම	ලිහිණිතොමගොස්
93	7	එහි	හෙතෙම එහි

Digitized by Google

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
,,	24	මුක්තාබැවින්	මුක්තාපමණින්
94	20	මුත්තාගේ	ආයසී
95	17	හත්තාය	ගත්තාය
96	29	නැගි	නැගිඹගු
98	8	දේවිය	දේවියගොස්
99	10	බබ්බූසහිත	ස්ථතිය යෝධයෝ
101	37	පෙළිය	ගෙළිය
102	1	කුඹිඃගත	කුටුඹියගත
,,	24	උග්	උස්උග්
103	4	කුරුවෙත	කුමරුවෙත
,,	10	වැවක්	මහවැවක්
104	20	කොට	කොට එකල
105	8	සපපදුරු	කප්කදුරු
106	3	චාලනය	ඔහු චාලනය
,,	31	ස්ථවිර	ඒස්ථවිර
108	23	නමිවි	නමින් පතළවි
109	5	ලහටුදූකල	දූලහටු දුමන කල
112	14	විචාළේය	ඔහු විචාළේය
114	25	කරද්දූයේය	කරවූයේය ඒථූපය සිහාරා විහාරයක්ද කරවිය
115	19	ඉක්බිතෙතත්	ඉක්බිති ඒ රජතෙම
,,	26	නැවතද	නැවතද නානාරත්නාලඞ්කෘත
116	21	අඹබළක	අඹලඞ්ක
117	10	වැඹින්	රුවන්මුවාවැඹින්
,,	12	වේදිකාවක්	පබලුවේදිකාංවක්
118	20	උදුරවූ	අතිඋදුරවූ
119	4	අණකෙළේය (කීතැනට)	ගැමුනුරජතෙම චෛත්‍යයට ගැඹඩොල් පිණිස සිතුයේය
,,	12	මෙසේ	හෙතෙම මෙසේ
163	9	මිහිපල්	ඒ මිහිපල්
,,	33	ගෙණ	ගෙණ දකුණුදෙරින්
164	1	නැවත	නැවත රජහට
,,	22	පිළිම	පිළිම තුණක්
165	27	පිදිය	මහසෑයෙහි පිදිය
166	7	සත්තිස්	සත්විසි
167	23	නුවරට	නුවරටම
168	11	මහඇමැති	විනිශ්චය මහඇමැති

Digitized by Google

INDEX.

ම හා වං ස ය.

ශු චි ප ත්‍ර ය.

පිට.	පෙළ.	කාරණයගේ ව්‍යාඛ්‍යානය.
1	1	උපන්‍යාසය
,,	13	සූවිසි විවරණය
2	3	සම්‍යක්සම්බොධිකථාදිය
,,	15	බුදුන් ලක්දිවටවැඩි 1 වෙනි ගමන (මහියඞ්ගනාගමන)
4	4	දෙවෙනි ගමන (නාගදීපාගමන)
5	25	තුන්වෙනිගමන(කල්‍යාණාගමන)
6	26	මහාසම්මත වංශය
8	9	බොධිසත්වාදි ප්‍රවෘත්තිකථා
9	1	බුද්ධපරිනිර්වාණයහා ප්‍රථම සඞ්ගීතිය
11	28	අජාසත්ආදි රාජවංශය
12	13	(කාලාශොක රජකාලයෙහි) දෙවෙනි සඞ්ගීතිය
16	20	ආචාර්‍ය්‍යවංශකථාව
17	19	කාලාශොක රජහුගේපරම්පරාව
,,	32	ධර්මාශොක රජහු අභිෂෙක කථාව
18	26	නිග්‍රොධ සාමණෙර කථාව
22	14	මොග්ගලිපුත්තතිස්සස්ථවිරයන්වහන්සේගේ පිළිවෙළ කථාව
26	7	තුන්වෙනි සඞ්ගීතියේනිදානකථාව
33	14	තුන්වෙනි සඞ්ගීති කථාව
34	1	විජයරජහුගේ උත්පත්තිකථාව
36	7	විජයරජහුගේ ආගමනකථාව
,,	30	විජයරජහු අභිෂෙකකථාව

Digitized by Google

රජ ගණන.	පිටු	පෙළ.	ප්‍රවෘත්ති.	බුඩ වෂි.	රාජ්‍ය වෂි.	මාස	දින
1	39	1	විජයරජහු රාජ්‍යය	1	38	0	0
2	14	8	විජයාමාත්‍යයන් රාජකහු ශාසනාව	39	1	0	0
	,,	11	පඬුවස් දෙව්කුමරහු ජම				
3	42	18	පඬුවස් දෙව්රජහු රාජ්‍යය	40	30	0	0
	43	6	ලක්දිවරාමගොණ අනුරාධාදි ගම් පිහිටි ක්‍රමය				
4	44	14	අභයරජහුගේ රාජ්‍යය	70	20	0	0
	,,	19	පණ්ඩුකාභය කුමරුවැඩීම				
	47	5	අභයරජු විසින් සියරජය මලුන්ට පාවාදීම				
(5)	,,	6	රාජශූන්‍යවූ (තිසසකුමාරයා ප්‍රධානවූ) කාලය	90	17	0	0
	,,	31	පණ්ඩුකාභය කුමාරයාගේ යුඞය				
5	48	18	පණ්ඩුකාභය රජහුගේ රාජ්‍යය	107	70	0	0
6	50	1	මුටසීව රජහු	177	60	0	0
7	,,	14	(දෙවානම්පියතිස්ස) දෙවැනි පැතිස්	237	40	0	0
	,,	16	ඔහුගේකාලයේවූ අරුම				
	,,	34	දෙවැනිපැතිස් රජහා දඹදිව දම්සෝරජහු මිතුරුදම්				
	52	2	දෙවැනි පැතිස් රජහු දෙවැනි අභිෂෙකය				
	,,	15	බුඩාගම නොයෙක් දේසවල පිහිටුවීම				
	55	24	බුඩාගම ලක්දිවට ගෙණජම				
	57	1	මහෙන්ද්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් දෙවැනි පැතිස්රජහු පැහැදවීම				
	59	16	උන්වහන්සේ අනුරාධපුරයට ප්‍රවිෂ්ටවීම				
	60	31	මිහිඳුමාහිමියන්ගේ ධර්මකථාදිය				
	64	7	සිව්බුදුවරයන් මහමෙවුනඋයනට වැඩිය කථාව				

Digitized by Google

රජ ගණන.	පිටු	පෙළ.	ප්‍රවෘත්ති.	බුඩ වෂ.	රජ වෂ.	මා.	දි.
	71	12	අනුරාධපුරයෙහි මහා සීමා බන්ධනය				
	75	31	එහි චෛත්‍ය පිහිටුවීම				
	79	31	මහබෝආදීන් ලක්දිව ට වැඩමවීමට දූතයින් පිටත්කිරීමාදිය				
	83	26	මහබෝආදීන් ලක්දිවට වැඩමවීමේවිස්තරකථාව				
	88	21	මහබෝ පිහිටුවීමාදියේ කල්නියමය				
	90	2	දෙවැනි පෑතිස් රජහු ගේ කාලක්‍රියාව				
8	,,	4	උත්තිය රජහුගේ රා ජ්‍යය	277	10	0	0
	,,	5	මිහිඳුමහහිමියන් පිරිනිවී මාදිය				
9	91	29	මහාසිවරජහුගේ රාජ්‍යය	287	10	0	0
10	92	1	සූරතිස්ස	297	10	0	0
11	92	15	සේනය ගුත්තිකය යන දෙදෙනා	307	22	0	0
12	,,	18	අසේල	329	10	0	0
13	,,	21	එළාරදෙමළ	339	44	0	0
	,,	25	ඔහුගේ ඍජුභාවාදිය				
	93	29	දුටුගැමුණු කුමරහු පිළි වෙළ කථාහා මහානාග යටාලතිස්සාදීන් පිළිබ ඳවූ කථා				
	95	5	දුටුගැමුණු කුමරහුගේ උත්පත්තිකථා				
	97	23	තිස්සකුමරහු උත්පත්ති කථා				
	98	23	දුටුගැමුණු කුමරහුගේ මහායොධයන් දසදෙ නා පිළිබඳ කථාදිය				
	104	1	දුටුගැමුණු තිස්ස කුමාර දෙදෙනාගේ යුද්ධාදිකථා				
	107	14	දුටුගැමුණු කුමරුගේ දෙමළුන්හා යුද්ධ				

Digitized by Google

රජ ගණන.	පිටු	පෙළ.	ප්‍රවෘත්ති.	බුද්ධ වර්ෂ.	රාජ්‍ය වර්ෂ.	මාස	දින
14	112	22	දුටුගැමුණු රජහුගේ රාජ්‍යය	383	24	0	0
	113	32	ථේරපුත්තාභය යොධයාගේ පැවිදිවීම				
	114	9	මිරිසවැටිවිහාරය කිරීම				
	115	19	දුටුගැමුණු රජහු සඳහා පූර්වයෙහි කියනලද වාක්‍ය ශ්‍රවණය				
	116	3	ලෝවාමහාපාය කරවීම				
	118	19	මහබෝපූද				
	„	23	දුටුගැමුණු රජහුවිසින් මහසෑය කරවීමට ආරම්භකිරීම				
	119	3	මහසෑය කරවීමට උපකරණලැබීම				
	121	7	මහසෑය කරවීමේ ආරම්භය				
	122	10	ථූපාරාමයෙහි සැණකෙළි පූජාදිය				
	125	11	මහසෑය කරවීම				
	128	15	ධාතුගර්භරචනා විස්තරය				
	130	26	ධාතුනිධානයේ විස්තර කථාව				
	137	28	දුටුගැමුණු රජහුගේ ස්වර්ගප්‍රාප්තිය				
15	142	10	සද්ධාතිස්සරජහුගේරාජ්‍යය	407	18	0	0
	„	18	සද්ධාතිස්සාදීන්ගේපින්කම්				
16	143	10	ථුල්ලත්ථන හෙවත් තුලු නරජහු රාජ්‍යය	425	0	1	10
17	„	16	ලජ්ජිතිස්ස හෙවත් ලඳු තිස්	425	9	8	0
18	„	32	ඛල්ලාටනාග	434	6	0	0
19	144	2	පළමුවෙනි වට්ටගාමනී අභය	440	0	5	0
20	145	10	පුලහත්ථ	441	3	0	0
	„	12	බාහිය	444	2	0	0*
	„	14	පණයමාර	446	7	0	0
	„	16	පිළයමාර	453	0	7	0
			දාඨිය (යන දෙමළ පස් රජුන්)	453	2	0	0

* මේ පස්දෙනාගේ රාජ්‍යවර්ෂ 14 මාස 7.

Digitized by Google

රජ ගණන.	ගු	ඡේද.	ප්‍රවෘත්ති.	බුද්ධ වර්ෂ.	රජ වර්ෂ.	මාස	දින
21	146	16	(නැවත) වට්ටගාමිනීඅභය	455	12	0	0
22	148	1	මහාසිළුමහාතිස්	467	14	0	0
„	„	3	ඔව්හු පින්කම්				
23	„	18	චෝරනාගරජහු රාජ්‍යය	482	12	0	0
24	148	25	කුඩාතිස්රජහු රාජ්‍යය	494	3	0	0
25 අනුලා බිසව	„	31	සිවබලත්	497	1	2	0
	„	35	වටුක්දෙමළ	498	1	2	0
	149	3	දරකැටිතිස්	499	1	1	0†
	„	9	නීලියබමුණු	500	0	6	0
	„	13	අනුලාබිසව	501	0	4	0
26	„	17	මකලන්තිස් (කාලකණ්ණිතිස්ස)	502	22	0	0
	„	18	ඔහුගේ පින්කම්				
27	„	30	භාතිකාභයරජහු රාජ්‍යය	524	28	0	0
	„	33	ඔහුගේ පින්කම්				
28	151	13	මහාදාඨික මහානාගරජහු රාජ්‍යය	552	12	0	0
	„	15	ඔහුගේ පින්කම්				
29	152	31	අමණ්ඩගාමනී අභයරජහුගේ රාජ්‍යය	564	9	0	0
30	153	14	කණිජානුතිස්ස	573	3	0	0
31	„	20	චූලාභයතිස්ස	576	1	0	0
32	„	24	සිවලිකුමරිය	577	0	4	0
		32	රාජශූන්‍යකාලය	577	3	0	0
33	154	9	ඉලනාගරජහු රාජ්‍යය	581	6	0	0
34	155	7	සඳමුහුනු (චන්ද්‍රමුඛ)	587	8	0	0
35	„	13	යසලාලකතිස්ස	595	7	8	0
36	„	24	සුභනම්බලත්	602	6	0	0
37	156	11	වැහැප් (වසභ)	609	44	0	0
38	158	14	වඞ්කනාසිකතිස්ස	653	3	0	0
39	„	18	1 වෙනි ගජබාගැමුනු	656	22	0	0
40	„	31	මහලුනා (මහල්ලකනාග)	678	6	0	0
41	159	6	දෙවෙනි භාතියතිස්ස	684	24	0	0
42	„	15	කණිටුතිස් (කණිට්ඨතිස්ස)	708	28	0	0

† අනුලාවගේ ස්වාමිපුරුෂ සතරදෙනාට ඇත්තේ—වර්ෂ 4 මාස 1,

රජ ගණන.	පිටු	පෙළ.	පවෘත්ති.	බුද්ධ වර්ෂ.	රජ වර්ෂ.	මාස	දින
43	160	5	චූළනා (චූළනාග)	736	2	0	0
44	,,	6	කුඩ්ඩනාග	738	1	0	0
45	,,	14	පළමුවෙනි සිරිනාග	739	19	0	0
	,,	15	ඔහුගේ පින්කම්				
46	,,	22	වොහාරතිස්සරජහු රාජ්‍යය	757	22	0	0
	,,	28	ඔහුගේ පින්කම්				
47	161	26	අභයනාග	779	8	0	0
48	161	31	දෙවෙනි සිරිනාග	787	2	0	0
49	,,	36	විජය නොහොත් විජයිඳු	789	1	0	0
50	162	14	1 වෙනි සංඝතිස්ස	790	4	0	0
51	,,	32	{ පළමුවෙනි නොහොත් දූහැම්සිරි සඟබෝ	794	2	0	0
	,,	35	ඔහුගේ ආශ්චර්ය්‍යකම්				
	163	31	ඔහුගේ හිස දන්දීම				
52	164	11	ගොඨාභය රජහු රාජ්‍යය	796	13	0	0
	,,	12	ඔහුගේ පින්කම්				
53	165	10	දෙටුතිස් රජු රාජ්‍යය	809	10	0	0
54	166	7	මහසෙන්	819	27	0	0
	,,	12	ඔහුවිසින් මහාවිහාරය නැසීමාදි ප්‍රවෘත්ති				

නිමි.

මහාවංශ ද්විතීයභාගයෙහි, මහාවිජයබාහු මහාරජනන්ගේ රාජ්‍යය. 55. පොතේ ලියවීතිබෙන නමුත් පටුනෙහි-50 හේ ඉලක්කම යෙදී තිබේ. එතැන්පටන් බුද්ධවර්ෂ-පසකින් අඩුවීගණ ගොස් සත්වෙනි පණ්ඩිතනාමාදි පරාක්‍රමබාහු රජුගේ කාලයෙන් මතෙහාගි සමව යෙදී තිබෙනබැව් දතයුතු.

නමො තසස භගවතො අරහතො සමමාසමබුඬසස.

ම හා වං ශ ය.

1 වෙනි පරිච්ඡෙදය.

ශුඬවංශයෙහි උපන් (සකලක්ලෙශයන් කෙරෙන්) අත්‍ය
න්ත පරිශුඬවූ සර්වඥයන් වැද නොඅඩු නොයෙක් පරි
2 ච්ඡෙද ඇත්තාවූ මහාවංශය කථනය කරන්නෙමි.——මේ
වංශයතෙම පුරාතනයන් විසින් කරණලද්දේ නමුත් කිසි
තැනෙක්හි ඉතා විස්තරකරණ ලද්දේය, කිසිතැනෙක්හි
අතිශයින්ම සඞ්ක්ෂෙපකරණ ලද්දේය, නොයෙක් පුන
3 රුක්ත දොෂ ඇත්තේය.——ඒදෙසින් තොරකරණලද්දවූ
[එහෙයින්ම] සුවසේ ග්‍රහණධාරණ කටහැකිවූ ප්‍රසාදසං
වෙගජනකවූ පරම්පරායාතවූද ඒ මහාවංශය (කථනය
4 කරන්නෙමි. සජ්ජනයෙනි තෙපි) ප්‍රසාද උපදවන්නාවූ
තන්හිද එසේම සංවෙගජනකතන්හිද පහන්සිත්හා හය
කම්පා උපදවමින් ශ්‍රවණයකරව්.

5 මහාවීරවූ අපගේ සර්වඥතෙම පූර්වයෙහි දීපඞ්කරනම්වූ
සම්බුදුන් දැක ලොකයා දුකින් මුදනු සඳහා සම්‍යක්සම්බො
6 ධියපිණිස ප්‍රාර්ථනා කළසේක. ඉක්බිත්තෙන් එම සම්බුදුන්
හා කොණ්ඩඤ්ඤනම් බුදුන්ද, මඟලනම් බුදුන්ද, සුමන
7 නම් බුදුන්ද, රෙවතනම් බුදුන්ද, සොභිතනම් බුදුන්ද,
අනොමදස්සිනම් බුදුන්ද, පදුමනම් බුදුන්ද, නාරදනම්
8 බුදුන්ද, පදුමුත්තරනම් බුදුන්ද, සුමෙධනම් බුදුන්ද, සුජාත
නම් බුදුන්ද, පියදස්සිනම් බුදුන්ද, අත්ථදස්සිනම් බුදුන්ද,
ධම්මදස්සිනම් බුදුන්ද, සිඬත්ථනම්බුදුන්ද, තිස්සනම් බුදුන්ද,
9 එසේම ඵුස්සනම් බුදුන්ද, විපස්සිනම් බුදුන්ද, සිඛිනම්
බුදුන්ද, වෙස්සභූනම් බුදුන්ද, කකුසන්ධනම් බුදුන්ද, කො
10 ණාගමනනම් බුදුන්ද, කාශ්‍යපනම් බුදුන්ද, යන සූවිසි
සම්‍යක්සම්බුඬයන් ආරාධනාකොට උන්වහන්සේලා විසින්
11 “සියලු (සමත්‍රිංශත්) පාරමිතාවන් පුරා උතුම්වූ සම්‍යක්ස

Digitized by Google

සම්බෝධියට පැමිණ උතුම් ගෞතමනමින් බුදුව සත්වයන්
12 දුකින් මුදන්නේය" යි සම්‍යක්සම්බෝධිය පිණිස ප්‍රකාශක
රණලද්දේය. ඒ මහාමුනිතෙමේ මගධරට උරුවෙල්ද
13 නව්වෙහි බෝමුලදී වෙසඟපුර පසළොස් වක්හි උත්තමවූ
සම්බෝධියට පැමිනීයේ. ඒ සර්වඥවසීතෙම උතුම්වූ විමු
14 ක්තිසුඛය වින්දේ ඒ මධුරභාවයද දක්වන්නේ සත්සති
යක් මුළුල්ලෙහි වාසයකළසේක. ඉක්බිත්තෙන් බරණැ
15 සට වැඩ ධර්මචක්‍රය පැවැත්වූසේක. එහි වස්වසන සේක්ම
සැටනමක් රහත්කළසේක. සර්වඥතෙම ධර්මදෙශනා ක
රණු පිණිස ඒ භික්ෂූන් යවා ඉක්බිත්තෙන් (ඔවුනොවුන්)
16 යහළුවූ භද්‍රවර්ගික රජදරුවන් තිස්දෙනෙක් (සොවාන්
පලාදිය දීමෙන්) හික්මවා කාශ්‍යපාදි ජටිලයන් දහස
දමනයකරණුපිණිස ඔවුන් තුවන මුහුකරවමින් හෙමන්ත
කාලයෙහි උරුවෙල්දනව්වෙහි වාසය කළසේක.
17 ශත්‍රුමර්දනය කරණශීලිවූ සර්වඥතෙම උරුවෙල් ක
සුප්නම් ජටිලයාගේ මහායාගය එලඹසිටි කල්හි තමන්
18 නොඒමෙහිවූ උහුගේ ඉච්ඡාචාරය දැන උතුරුකුරුදිවයි
නෙන් පිණ්ඩපාතය ගෙණවුත් අනවතප්තනම් විලසමිප
19 යෙහිදී වළඳා තෙමේ සවස්වේලෙහි සම්‍යක්සම්බෝධියෙන්
නවවනමහ දුරුතුපුර පසළොස්වක්හි ලඞ්කාද්වීපය ශුද්ධක
20 රණු පිණිස ලක්දිවට පැමිනිසේක. සර්වඥයන්වහන්
සේවිසින් ලඞ්කාතොමෝ සසුන් බබලන තැනෙකැයිද
යකුන්විසින් පිරුණු ලක්දිව යක්ෂයෝ බැහැර කටයුතු
21 යයිද දන්නා ලදී. ලඞ්කාද්වීපමධ්‍යයෙහි මනෝරම්‍යවූ ගං
ඉවුරෙහි තුන්යොදුන් දිගු එක්යොදුන් පුළුල්වූ රම්‍යවූ මහා
22 නාගවනනම් උයනෙහි යක්ෂයන්ගේ යුද්ධභූමියෙහි ලක්
දිව්වැසි යකුන්ගේ මහානිසාචර සමාගමය ප්‍රසිද්ධය.
23 ඒ මහා යක්ෂසමාගමයට පැමිනි සර්වඥතෙම එහි
24 සමාගම මැද ඔවුන්ගේ හිස්මතුයෙහි මහියඞ්ගන ථූප
යාගේ ස්ථානයෙහි අහස්තුස වැඩසිටිසේක් ඔවුන්ට භයජන
25 කවූ වර්ෂාවාතාන්ධකාරාදිය මැවූසේක. බියෙන් පෙළුනාවූ
ඒ යක්ෂයෝ නිර්භයවූ තථාගතයන් වහන්සේගෙන් අභය
ඉල්වූහ. අභයදයීවූ තථාගතයන්වහන්සේ භයින් පීඩිතවූ
26 ඒ යකුන්ට මෙසේ වදාළසේක "යක්ෂයෙනි, තොපගේ මේ
භය හා දුක් මම පහකරන්නෙම්, තොපි සමගිව මෙතන්හි
27 මට හිඳිනා තැනක් දෙන්නාහුද නොදෙන්නාහුද?" "නිදු
කාණෙනි, නුඹවහන්සේට මේ සියලුම ලක්දිව දෙමහ අපට
අභය දුනමැනවැයි" ඒ සියලුම යක්ෂයෝ තථාගතයන්

28 වහන්සේට තිවුය. ඔවුන්ගේ තියද ශීතද අන්ධකාර
යද නසා ඒ දුන් භූමියෙහි පත්කඩ අතුට එහි වැඩ
29 හුන් සර්වඥතෙම එතැනින් ඒ පත්කඩ ගිනිගෙණ දිළි
යෙන්නක්කොට හාත්පසින් විසාලකළසේක. ග්‍රීෂ්ම
30 යෙන් පීඩිතවූ ඒයක්ෂයෝ ත්‍රයපත්ව (ලක්දිව්) අන්තයෙහි
හාත්පසින් සිටියෝය. ඉක්බිත්තෙන් සර්වඥයන්වහන්සේ
ඔවුන්ට රම්‍යවූ ගිරිදිවයින මෙහි ලඟාකළසේක. උන් එහි
31 වන්කල තිබුනතන්හිම තැබූසේක. සර්වඥතෙම ඒ පත්
කඩ හැකුළූසේක. (එකල්හි දෙවියෝ සර්වඥයන්වහන්
සේකරා) පැමිණියෝය. ඒ සමාගමෙහි ශාස්තෘන්වහන්
32 සේ ඔවුන්ට ධර්මදෙශනා කළසේක. නොයෙක් කෙළග
ණන් සත්වයන්ට සොවාන්ඵලාදියෙන් ධර්මාවබොධවිය.
සඞ්ඛ්‍යපථාතීත සත්වයෝ තිසරණ පන්සිල් පිහිටියෝය.
33 සමන්තකූටපර්වත වාසිවූ මහාසුමනනම් දෙව්රජ
තෙම සෝවාන්පලයට පැමිණ පූජාහිවූ සර්වඥයන් වහන්
34 සේගෙන් පූජනියවූ කිසිවක් ඉල්වීය. සත්වයන් කෙරෙහි
හිතවූ නීලනිර්මල කෙශවත්වූ සර්වඥතෙම හිස පිරිමැද
35 කෙශයන් අත්ලක් පමණ ප්‍රදානය කළසේක. ඉක්
බිත්තෙන් හෙතෙම එය ස්වර්ණමයවූ උතුම් කරඬුවැකින්
36 ගත්තේ සර්වඥයන්වහන්සේ වැඩහුන් තැන්හි කරණ
ලද්දවූ, අයම්විතරින් සත්රියන්වූ අවටින් එක්විසිරියන්
නන්වැදුරුම් රුවන්රැසෙහි තබා හෙතෙම ඉන්ද්‍රනීලමයවූ
37 ථූපයකින් වසා නමස්කාර කෙළේය (නැවත) "සර්වඥයන්
වහන්සේ පිරිනිවිකල්හි ශාරීපුත්‍රස්ථවිරයන්වහන්සේගේ
38 ශිෂ්‍යවූ මහත් සෘද්ධි ඇති සරභූනම් ස්ථවිරතෙම දරසෑයෙන්
සර්වඥ ග්‍රීවාස්ථිධාතුව සෑයෙන් රැගෙණ (මෙහි) ගෙණ
39 වුත් එම චෛත්‍යයෙහි තබා භික්ෂූන් විසින් පිරිවරණලද්
දේ මෙදෙවණ් පාෂාණයකින් වස්වා දෙළොස්රියන් උස
දගැබක් කරවා වැඩිසේක.
40 දෙවැනිපෑතිස් මහරජහට සහෝදර උඩවූළාභයනම්
41 කුමාරතෙම අදහුතවූ ඒ චෛත්‍යය දැක වස්වා තිස්රියන්
උස්වූ චෛත්‍යයක් කරවීය. එහි සිට දෙමළුන් මඩ
42 නා දුට්ඨගැමුණුරජතෙම ඊට අසූරියන් කඤ්චුක චෛත්‍ය
යක් කරවීය. ඒ මේ මහියංගන ථූපයතෙම මෙසේ පිහි
43 විය්ය * නිර්විකාරප්‍රඥසම්පන්න මහත් වීරපරාක්‍රම ඇ

* සර්වඥයන්වහන්සේ මහියංගනයට වැඩියාවූ කථාවස්තුවයි එහි පසුව ද
ගැබ පිහිටි ප්‍රවෘත්තිය පළපසලදී.

නි ධර්මයට ඊශ්වරවූ සර්වඥයන්වහන්සේ මෙසේ මේ වීප
ය මනුෂ්‍යයන්ට යොග්‍යකොට උරුවෙල්දනාවූවටම වැඩි
සේක — මහියඞ්ගනාගමන කථා නිමි.
44 පස්මරුන් දිනූ මහත් කරුණා ඇත්තාවූ සියලු ලෝවැස්
සත්ගේ වැඩෙහි ඇලුනාවූ ශාස්තෘවූ සර්වඥයන්වහන්සේ
සම්‍යක්සම්බෝධියෙන් පස්වෙනි වස ජේතවනවිහාරයෙහි
45 වැඩවසනසේක්, මහොදර නාගය එසේම චූළොදරනාගය
46 යන පිරිස් සහිතවූ නාගයන්ගේ මිණිපළඟ හේතුකොට
47 එළඹ සිටියාවූ යුද්ධය දැක, බක්මස අමාවක් පොහෝදින
උදය කාලයෙහිම උතුම්වූ පාසිවුරු ගෙණ නාගයන්ට
48 අනුකම්පා පිණිස නාගදීපයට වැඩිසේක. එකල්හි මහත්
සෘද්ධිමත්වූ ඒ මහොදරනම් නාගතෙමේ මුහුද පන්සියයක්
49 යොදුන් අයම් නාගභවනයෙහි රජවී. උහුගේ නැඟ
නිතොම කන්වඩමන්නම් පව්වෙහි නාරජහට දෙන
50 ලද්දීය. උහුගේ පුත්‍රතෙම චූළොදරනම්. උහුගේ මෑනි
51 යන් පියවූ නාරජතෙම උතුම්වූ මිණිපළඟ මෑනියන්ට දී
කාලක්‍රියා කෙළේය. එසේහෙයින් මසිල් නාරජු හා බෑන
52 නුවන්ගේ යුද්ධයතෙම එළඹසිටියේය, පර්වත වාසීවූද ඒ
නාගයෝ මහත් සෘද්ධිමත්වූහ, සමිද්ධි සුමනනම් දෙවි
තෙමේද ජේතවනයෙහි පිහිටි තමන් යහපත් භවන
53 යවූ කිරිපලුරුක බුද්ධානුමතියෙන්ම ගෙණ ඡත්‍රාකාර
යෙන් සර්වඥයන් මත්තෙහි දරන්නේ ඒ පෙර විසූ ස්ථාන
54 යට ආයේය. ඒ දෙවිතෙම අනතුරු බැවෙහි නාගදීප
යෙහි මනුෂ්‍යයෙක් වීය, හෙතෙම කිරිපලුරුක පිහිටි
55 තන්හි බොජුන් වළඳන පසේබුදුවරයන් දුටුයේය. ඒ දැක
සිත්පැහැද පාත්‍රයන් සුද්ධකිරීමෙහි ශාඛාවන් උන්වහන්
56 සේලාට දුන්නේය, ඒ කර්මයෙන් හෙතෙම මනො
ඥවූ ජේතවනයෙහි දොරකොටු පස ඒ රුකෙහි උපන.
57 හෙතෙම පසුව ඉන් පිටවූයේය. දෙවාතිදෙවවූ සර්ව
ඥතෙම ඒ දෙවියාගේ අභිවෘද්ධියද බලා හිතපිණිස ඒ
58 දෙවියාද වෘක්ෂයද මෙහි පැමිනවූසේක, මොහාන්ධකාර
නාසන්නාවූ සර්වඥතෙම එහි යුද්ධ මධ්‍යයෙහි අහස වැඩ
හුන්නේ ඒ නාගයන්ට භය එළවන්නාවූ අන්ධකාරයක්
59 මවාපෑසේක. (සර්වඥයන්වහන්සේ) බියෙන් පෙළුන ඒ
(නයින්) අස්වසන්නේ ආලෝකයක් පැතිරවූසේක. සර්ව
60 ඥයන් දැක සතුටුවූ ඒ නාගයෝ සර්වඥයන්වහන්සේගේ පා
වැන්දෝය, පස්මරුන් දිනූ සර්වඥතෙම සමගිකරන්නාවූ
ධර්මයන් ඔවුන්ට දෙශනා කළසේක. සතුටුවූ ඒ දෙදෙනම

Digitized by Google

61 මිණිපලඟ සර්වඥයන්වහන්සේට ප්‍රදානය කළහ. ලොක
නායකවූ ශාස්තෘතෙම එහි බැස අස්නෙහි වැඩහිඳ, ඒ
නාගරාජයන් විසින් දිව්‍යාහාරපානයෙන් සතපන ලත්
62 සේක් දිය වැසිවූද ගොඩ වැසිවූද අසූකෙළක් නයින්
63 තුන්සරණයෙහිද සීලයෙහිද පිහිටවූසේක, මහෝදරනම්
නාගයාගේ මයිල්වූ මණිඅක්ඛිකනම්වූ කැලණියෙහි නා
64 රජතෙම යුද්ධකරණු පිණිස එහි ගියේය, සර්වඥයන්
පළමු මෙහි වැඩිකල සද්ධර්මදෙශනාව අසා සරණසීල
යෙහි පිහිටියේ එහිදී (මෙසේ) තථාගතයන්වහන්සේට
65 ආයාචනාකරන්නේ "ස්වාමීන්වහන්ස! මේතෙමේ තුඹව
හන්සේ විසින් අපට කරණලද මහත්වූ අනුකම්පාවෙක,
66 තුඹවහන්සේ මෙහි නොපැමිනිසේක්නම් අපි සියල්ලෝ
අළුවම්හ. පූර්ණහෘදය ඇත්තාවූ තථාගතයන්වහන්ස! මා
කෙරෙහිද මෛත්‍රවශයෙන් තුඹවහන්සේගේ කරුණාව
67 නැවත මෙහි ආගමනයෙන් මාගේ වාසභූමියට වඩිනා
සේක්වා" යි කීයේය. භාග්‍යවතුන්වහන්සේ තුෂ්ණීම්භා
68 වයෙන් මෙහි ආගමනය ඉවසා රාජායතන චෛත්‍යය
එහිම පිහිටවූසේක. ලෝකස්වාමීතෙම ඒ කිරිපලුරුකද
මහරු මිණිපලඟද නමස්කාරකරණු පිණිස නාරජුන්ට ප්‍රදා
69 නය කළසේක, නාගරජයෙනි, මාගේ පරිභොගචෛත්‍යය
වඳිව්, නාගයෙනි එය තොපට වැඩපිණිසද සැපපිණිසද
70 වන්නේය" යනාදිවූ අනුශාසනා නාගයන්ට වදාළ
ලොකානුකම්පාකාරීවූ සර්වඥයන් වහන්සේ ජේතවනයටම
වැඩිසේක—නාගදීපාගමනය නිමි.

71 එසින් තුන්වෙනි වර්ෂයෙහි ඒ මණිඅක්ඛිකනම් නාගරජ
තෙම එළඹ සඞ්ඝයා සහිත තථාගතයන් වහන්සේට නිම
72 න්ත්‍රණය කෙළේය. සර්වඥතෙම සම්‍යක්සම්බොධියෙන්
අටවෙනි වර්ෂයෙහි ජේතවනයෙහි වාසයකරණසේක් ලො
73 කස්වාමීවූ පස්මරුන් දිනූ මුනීශ්වර තෙමේ භික්ෂූන් පන්සි
යයක් විසින් පිරිවරණලද්දේ දෙවෙනිදවස භක්තකාලය
74 ආරෙචනාකළකල්හි රම්‍යවූ වෙසක්මස පොණීමාසි තිථි
යෙහි එහිදීම සඟලසිවුරු පොරවා පාත්‍රය (ශ්‍රීහස්තයෙන්)
75 ගෙණ ඒ කැලණිදෙසවූ මිණිඅක් (නාරජහු) නිවෙසට වැ
ඩිසේක, කැලණිසෑය පිහිටිතන්හි කරණලද රත්නමණ්ඩ
පයෙහි සඞ්ඝයාද මාහැඟිවූ පලඟෙහි තමන්වහන්සේද
76 වැඩඋන්සේක. සමූහය සමගවූ නාරජතෙම සෝම්නස්
වූයේ දිව්‍යවූ ඛාද්‍යභොජ්‍යයෙන් සඞ්ඝයා සහිතවූ සර්වඥ
77 යන් සන්තර්පණය කෙළේය. ලොකානුකම්පා ඇත්තාවූ

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

ලෝකනායකවූ සර්වඥතෙම එතන්හි ධර්මදෙශනාකොට අ
හසට නැගී (වැඩ) සමන්කූට මතුයෙහි පාසටහන දක්වූ
78 සේක. සඞ්ඝයා සහිතවූසේක් ඒ පර්වතපාදයෙහි සැපසේ
79 දිවාවිහරණය කොට දීඝවාපියට වැඩිසේක. ලෝකස්වාමී
තෙම සඞ්ඝයා සමගවූසේක් එහි චෛත්‍යස්ථානයෙහි වැඩ
හිඳ ස්ථානය ගෞරවයට පැමිනීමපිණිස සමාධියට සම
80 වන්සේක. ස්ථානාස්ථාන දක්මෙහි ප්‍රවීණවූ මහාමුනිතෙ
මේ එතැනින් නැගිට මහමෙව්නාඋයන පිහිටි තැනට වැඩි
81 සේකි. ශ්‍රාවකසඞ්ඝයා සහිතවූ ලෝකස්වාමීතෙම මහබෝ
පිහිටි තන්හි වැඩහිඳ සමාධියට සමවන්සේක. මහාථූපය
82 පිහිටිතන්හිද එසේම (සමාධිය) අර්පණය කළසේක. එසේම
ථූපාරාමයෙහි දාගැබ පිහිටි තන්හිද (සමාධියට සමවන්
83 සේක.) ඉක්බිත්තෙන් සමාධියෙන් නැගිට ශෛලචෛ
ත්‍යය පිහිටිතැනට වැඩ ගණාධිපතිවූ අවබොධකළ සර්වාඥ
ඇති සර්වඥතෙම සමග ආවාවූ දෙව සමූහයන්ට අනුශාස
නාකොට එතැනින් දෙව්රම්වෙහෙරට වැඩිසේක.
84 මෙසේ ඉතා මහත් දයා ඇත්තාවූ ලෝකයට ප්‍රදීපයක්
බඳුවූ ප්‍රමාණරහිත ප්‍රඥාඇති ලෝකස්වාමීතෙම ලඞ්කාවාසී
ජනයාගේ අනාගතාර්ථය බලමින් එකල්හි ලඞ්කාවෙහිවූ
දෙව නාග සමූහාදීන්ගේ වැඩද දක්වමින් මේ යහපත්
ද්වීපයට තුන්වරක් වැඩිසේක, ඒ කාරණකොටගෙණ මේ
ද්වීපය ධර්මනැමති පහනින් බැබළුම් ඇත්තාවූ සජ්ජනයන්
විසින් බුහුමන්කරණලද්දේය——කල්‍යාණාගමන නිමි.

මෙතෙකින් ශුද්ධජනයා පහන්සංවෙගපිණිස කළ මහවංශතථා
ගතාභිගමනනාම්වූ පළමුවෙනි අදියර නිමි.

දෙවෙනි පරිච්ඡෙදය.

1 මහාමුනි නම්වූ සර්වඥතෙම මහාසම්මත රජහුගේ වංශ
යෙහි උපන, කල්පාරම්භයෙහි මහාසම්මතනම් නරේන්ද්‍ර
2 යෙක් වූයේය. රොජය, වරරොජය, එසේම කල්‍යාණනම්
ඇත්තාවූ (කල්‍යාණය වරකල්‍යාණය යන) දෙදෙනෙක, උ
3 පොසථය, මන්ධාතුය, චරය, උපචරය යන දෙදෙනෙක,
චෙතියය, මුචලය, මහාමුචල නමැත්තේය, මුචලින්දය, සග
4 රය, සාගරදෙව නමැත්තේය, භරතය, භගීරථය, රුචිය,

Digitized by Google

සුරුචිය, ප්‍රතාපය, මහාප්‍රතාපය, එසේම පණාදනම්වූ (පණා
දය, මහාපණාදයයන) දෙදෙනෙක, එසේම සුදර්ශනනෙරු
5 නමැත්තාවූ (සුදර්ශනය, මහාසුදර්ශනය, නෙරුය, මහානෙ
රුය යන) පශ්චිමවූ දෙදෙන දෙදෙනායයි මහාසම්මත
6 රජහුගේ දරුමුනුබුරු රජදරුවෝ වූහ. අසඞ්ඛ්‍යායුෂකවූ
මේ අටවිසි මිහිපල්හු කුසාවතිය, රජගහය, මිථුලය, යන පුර
7 යන්හි විසූහ. ඉක්බිත්තෙන් ඒ රජුන්ගේ පරම්පරානුගතවූ
රජදරුවන් සියයක්ද, සපණසක්ද, සැටදෙනෙක්ද, අසූ
8 සාරදහසක්ද, ඉන් මැතවූ සතිස්දෙනෙක්ද, දෙතිස්දෙ
නෙක්ද, අටවිසිදෙනෙක්ද, ඉන් මැතවූ දෙවිසිදෙනෙක්ද,
9 අටළොසෙක, සතළොසෙක, පසළොසෙක, තුදුසෙක, නව
දෙනෙක, සත්දෙනෙක, දොළොසෙක, ඉන් අන්‍යවූ පස්විස්
සෙක, යළිත් පස්විස්සෙක, දොළොසෙක, නැවතත් දොළ
10 සෙක, නවදෙනෙක, මඛාදේවාදි අසූසාරදහසෙක, කළා
රජනකාදී අසූසාරදහසෙක, ඔක්කාක රජහු දක්වා සොළ
11 සෙක, මේ මුනුබුරු රජහු රාශිවශයෙන් වෙන් වෙන් පුර
12 යෙහි කැමැතිපරිද්දෙන් රාජ්‍යානුශාසනා කළහ. ඔක්කාක
රජහුගේ දෙවුපුත්වූ උක්කාමුඛනම් රජෙක් විය. නිපුරය,
13 චන්‍ද්‍රිමන්තය, චන්‍ද්‍රමුඛය, සිරිසජයය, වෙස්සන්තර මහර
ජය, ජාලිය, සිංහවාහනය, සිංහස්සරය, යනමොහු ඔහුගේ
14 දරුමුනුබුරෝය. සිංහස්සර රජහු දරුමුනුබුරු රජුන් දෙ
15 යාසූ දහසෙක, ඔවුන්ගේ අන්තිම රජ ජයසේනනම් විය—
16 මොවුහු කිඹුල්වත් පුරයෙහි ශාක්‍ය රජහුයයි ප්‍රසිද්ධවූහ, සිංහ
හනු නම් මහරජ තෙම ජයසේන රජහුගේ පුත්‍රවූයේය, ජය
සේනරජහුගේ දියනි තොමෝත් යසොධරානම්විය. දෙව
17 දහ නම් නුවර දෙවදහශාක්‍යනම්වූ මිහිපතියෙක් විය, උහු
ගේ අජනනම් කුමාරයෙක යළිත්කච්චානානම්වූ කුමරියෙ
කැයි දරු දෙදෙනෙක් වූහ. ඒකච්චානා කුමාරිකා තොමෝ
18 සිංහහනුනම් රජහුගේ මෙහෙසී විය, ඒ යසොධරානම් කුමා
රිකා තොමෝ අජනනම් ශාක්‍යරජහුගේ මෙහෙසී විය; අජ
නනම් ශාක්‍යරජහුගේ මායාය ප්‍රජාපතීයයි දූන් දෙදෙනෙක්
19 වූහ. දණ්ඩපාණී ශාක්‍යය, සුප්‍රබුද්ධ ශාක්‍යයයි පුත්‍රයන් දෙ
20 දෙනෙක්ද වූහ, සිංහහනුනම් ශාක්‍යරජහට වනාහි පුත්‍රයෝ
පස්දෙනෙක්ද දූන් දෙදෙනෙක්ද වූහ. සුද්ධෝදනය, ධෝ
තෝදනය, සුක්කෝදනය, අමිතෝදනය * යි මේ පව පුත්‍ර
21 යෝය. අමිතාය, ප්‍රමිතායයි මේ දියනි දෙදෙනාය. අමිතා

* එක් පුත්‍රයෙකුගේ නම පාඨයෙහි නොකියනලදී.

HARVARD COLLEGE LIBRARY
Digitized by Google

තොමෝ සුප්‍රබුද්ධනම් ශාක්‍ය රජහට මෙහෙසී විය, ඒ
22 මෙහෙසියට භද්දකච්චානාය, දෙවදත්තයයි දරු දෙදෙ
නෙක් වූහ, මායාය, ප්‍රජාපතීයයි සුද්ධොදනරජහුගේ මෙහෙ
23 සිදෙදෙනෙක් වූහ, සුද්ධොදන මහරජහට දූ ඒ මායාබිසව
ගේ පුත්‍රතෙම ඒ සර්වඥවූයේය. මහාමුනිවූ සර්වඥතෙම
සියලු ක්ෂත්‍රියයන්ගේ මුදුන්වූ ආවාහ විවාහාදීයෙන් අසම්භි
න්නව මෙසේ පැවැති මහාසම්මත වංශයෙහි අනතිම
ජාතියෙහි උපන්සේක.
24 බොධිසත්ත්වවූ සිද්ධාර්ථනම් කුමාරයාහට භද්දකච්චානා
නම් කුමාරිකාතොමෝ මෙහෙසී විය. ඒ මෙහෙසියගේ
25 පුත්‍රතෙම රාහුලනම් වූයේය, බිම්බිසාර කුමරතෙමේද
සිද්ධාර්ථකුමාරතෙමේද යහලු වූහ. ඒ දෙදෙනාගේ පියරජ
හු දෙදෙනද යහළුම වූහ. බොධිසත්ත්වතෙම බිම්බිසාර රජ
26 හට පස්හවුරුද්දක් වැඩිවයස් ඇත්තේ විය. වයසින් එකුන්
තිස් හවුරුදුවූ බොධිසත්ත්වතෙම (බුද්ධත්වය පිණිස) අභිනි
27 ෂ්ක්‍රමණය කෙළේය. සහවුරුදක් දුෂ්කරක්‍රියා කොට ක්‍රම
යෙන් සම්‍යක්සම්බොධියට පැමිණ, ඉක්බිත්තෙන් වයසින්
පන්තිස් හවුරුදු ඇතිවූසේක් බිම්බිසාර රජනාන්කරා පැමිනි
28 සේක. ඉක්බිත්තෙන් මහපැණැති බිම්බිසාර රජතෙම පස
ළොස් හවුරුදු වයස් ඇත්තේ සියපියහු විසින් අභිෂෙක
29 කරණ ලද්දේ රාජ්‍යයට පත්විය. සොළොස්වෙනි වස
පැමිනිකල්හි ශාස්තෘවූ සර්වඥතෙම ඔහුට ධර්මදෙශනා
30 කළසේක. හෙතෙමවනාහි දෙපණස් හවුරුද්දක්ම රජ
කරවිය. ඔහුට සර්වඥයන්වහන්සේ පැමිණෙන්නට පළමු
රාජ්‍යයෙහි හවුරුදු පසළොසක් වූහ. තථාගතයන්වහන්
31 සේ ජීවමානකාලයෙහි සත්තිස්හවුරුද්දක් වූහ. බිම්බි
සාර රජහු පුත්‍ර දුර්මතිවූ මහාමිත්‍රද්‍රොහි අජාතශත්‍රු කුමා
රතෙම ඒ බිම්බිසාර රජහු මරවා දෙතිස් හවුරුද්දක් රාජ්‍යය
32 කරවූයේය. අජාසත් රජහට අටවෙනි වර්ෂයෙහි තථාගත
යන්වහන්සේ පිරිනිවිසේක. පරිනිර්වාණයෙන් පසු හෙ
තෙම සූවිසි හවුරුද්දක් රජකරවිය.
33 සියල් ගුණයෙන් අගබැවි පැමිනි කෙලෙශයන්ට වසග
නුවූ තථාගතතෙම මරණවසප්‍රාප්තවූසේක. මෙසේ මේ
ලෝකයෙහි යමෙක්තෙම භය උපදවන්නාවූ අනිත්‍යතාව
(නුවනින්) දක්නේද හෙතෙම දුඃඛයාගේ පරතෙර පැමිනි
යේයි.

මෙතෙකින් සුදිජනයා ද සාද සංවෙග පිණිස කළ මහවස
මහාසම්මත වංසනම්වූ දෙවෙනි අදියර නිමි.

Digitized by Google

තුන්වෙනි පරිච්ඡෙදය.

1 පසැස් ඇත්තාවූ අතුල්‍යවූ සර්වඥයන් වහන්සේ පන්සාළිස්
වසක් ජීවත්වෙමින්, ලොකයට (හිතවූ) සියලු කෘත්‍යයන්
2 සර්වප්‍රකාරයෙන් කළසේක්. කුසිනාරා නුවර යමකසාලය
න්ගේ අතරවූ උත්තමස්ථානයෙහිදී වෙසක්මසපුරපසළො
ස්වක් දවස්හි, ලොකයාගේ ඒ ප්‍රදීපයතෙම නිමී ගියේය.
3 (පිරිනිවන්පෑසේකි) ගණනපථාතික්‍රාන්තවූ භික්ෂූහු එහි
රැස්වූහ, එසේම ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද, වෛශ්‍යයෝ
4 ද, ශූද්‍රයෝද දෙවියෝද, රැස්වූහ. ඒ භික්ෂූන් අතුරෙන් සත්
ලක්ෂයක් ප්‍රධාන භික්ෂූහු වූහ, එකල්හි මහාකාශ්‍යපස්ථවිර
5 යන්වහන්සේම සඞ්ඝස්ථවිරසේක, ශාස්තෘන්වහන්සේගේ
ශරීරසම්බන්ධිවූ ශාරීරිකධාතු කෘත්‍යයන් කරවා ඒ මහා
6 ස්ථවිරතෙමේ ධර්මනැමති ශාස්තෘන්ගේ චිරස්ථිතිය ප්‍රාර්ථ
නාකරණසේක්, ලොකස්වාමිවූ සර්වඥයන් පිරිනිවි සත්වන
දවස්හි, සුභද්‍රනම් මහලු පැවිද්දහු විසින් කියනලද දුර්භා
7 ෂිත වචනය මෙනෙහි කරමින්, (පාංශුකූල) චීවරදානයද,
තමන්වහන්සේ හා සමබැව්හි තැබීමද සද්ධර්මය පිහිටුවන
පිණිස සර්වඥයන්වහනසේ විසින් කරණලද අනුග්‍රහයද
8 සිහිකරණසේක්, ධර්මසඞ්ගායනාකරණුපිණිස, බුදුන්විසින්
අනුදන්නාලද්දාවූ නවාඞ්ගශාස්තෘශාසනධාරීවූ සර්වාංග
9 යෙන් උපලක්ෂිතවූ මහරහත්වූ සංයතභික්ෂූන්ම ආනන්දස්ථ
විරයන්වහන්සේගේ කාරණයෙන් එක්නමක් අඩුවූ පන්සි
10 යක් සම්මතකළසේක. නැවත ඒ ආනන්දස්ථවිරයන් හැර
සඞ්ගායනාව කරණු නොහැකියයි භික්ෂූන්විසින් විශෙෂ
යෙන් යාච්ඤාකරණලද්දේ ආනන්දස්ථවිරයන්ද සම්මතකළ
11 සේක. සාධුක්‍රීඩා සත්දවසය, ධාතුපූජා සත්දවසය යන
12 අර්ධමාසය ගෙවා සියලු ලොවට අනුකම්පාකාරීවූ ඒ ස්ථවිර
යෝ "රජගහනුවර වස්වෙසෙමින් ධර්මසඞ්ගායනාව ක
13 රම්හ අන්‍යයන් විසින් එහි නොවිසිය යුතුය" යි නිශ්චය
කොට, ඒ ඒ තැන ශොකයෙන් ආතුරවූ මහජනයා අස්වස
14 මින් ජම්බුද්වීපයෙහි චාරිකාකෙරෙමින් හැසිර කුශලපක්ෂය
පිහිටීම පතන්නාහු ඇසළමස ශුක්ලපක්ෂයෙහි සම්බවූ
15 සිවුපසඇති රජගහනුවරට එළඹියාහුය. එහිම වස්එළඹි
යාවූ ස්ථිරගුණයෙන් යුක්තවූ සර්වඥමතයෙහි දක්ෂවූ ඒ
මහාකාශ්‍යපාදී ස්ථවිරයෝතුමූ අජාසත්රජහට කියා වර්ෂා
16 මාසයන් අතුරෙන් පළමුවෙනි මාසයෙහි රජගහනුවර සිය
ලුම සෙනසුන්හි පිළිසකර කරවූහ, වෙහෙර පිළිසකරකම්

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

17 නිමිකල්හි "දැන් අපි ධර්මසඞ්ගායනා කරම්හ"යි රජහට වදා
ළහ, (මාවිසින්) "කටයුතු කුමක්දැ"යි පිළිවිසි රජහට හිඳිනා
තැනක් (කටයුතු) යයි දැන්වූහු. ඒ රජතෙමේ "කොතැන්හි
18 දැ"යි විචාරා උන්වහන්සේලාවිසින් වදාළ ස්ථානයවූ වෙභා
රපර්වතපාර්ශ්වයෙහි සප්තපර්ණිගුහාවාරයෙහි, රම්‍යවූ
19 දෙවසභාව හා සමානවූ මණ්ඩපයක් වහා කරවූයේය. ඒ
රජතෙම එය සර්වප්‍රකාරයෙන් සරසවා එහි භික්ෂූන්ගණ
20 නින්ම අනර්ඝවූ ඇතිරිළි ඇතිරවූයේය; එහි දක්ෂිණභාගය
නිසා උත්තරදිශාභිමුඛකොට මාහැඟිවූ උතුම් ථෙරාසන
21 යක් මොනවට පණවනලද්දේ විය. ඒ මණ්ඩපමධ්‍යයෙහි
පෙරදිගට අභිමුඛකොට සර්වඥයන්වහන්සේට සුදුසුවූ
22 උතුම්ධර්මාසනයක් මොනවට පණවනලද්දේවූයේය. රජ
තෙම "අපේ කටයුතු නිමියේය"යි ස්ථවිරයන්වහන්සේලාට
දැන්වූයේය.
23 ඒ ස්ථවිරයෝතුමූ ආනන්දජනකවූ ආනන්දස්ථවිරයන්වහන්
24 සේට "එම්බා ආනන්දය සෙටදවස රැස්වීමය එහි ශෛ
ක්ෂ‍යවූ තොපවිසින් ගමන නොහොබනේය, එහෙයින්.
ගුණමත්තෙමේ ස්වාර්ථයෙහි ප්‍රමාදරහිතවේව"යි වදාළෝ.
25 මෙසේ මෙහෙයනලද්දවූ ආනන්දස්ථවිරතෙම වීර්ය්‍ය සම
කොට (චතුර්විධ) ඊර්යාපථයෙන් වෙන්ව රහත්බැව් පත්
26 වූසේක. ඒ ස්ථවිරයෝතුමූ වර්ෂාමාසයන් අතුරෙන් දෙවෙනි
මස දෙවෙනිදවස්හි සිත්කලුවූ ඒ මණ්ඩපයෙහි රැස්වූහු.
27 රහතන්වහන්සේලා ආනන්දස්ථවිරයන්වහන්සේට සුදුසුවූ
අස්නක් තබා සුදුසු පරිද්දෙන් අසුන්හි වැඩඋන්හ. ඒ
28 ආනන්දස්ථවිරතෙමේ අර්හත්ඵලප්‍රාප්තිය හඟවනු කැමැත්තේ
උන්වහන්සේලා සමග නොම වැඩිසේක. "ආනන්දස්ථවිර
තෙමේ කොතැන්හිදැ"යි කිසිකෙනෙකුන් විසින් කියනු
29 ලබනකල්හි, උන්වහන්සේ පොළව හිමිද හෝ, අහසින්
අවුත් හෝ තමහට තබනලද අස්නෙහි වැඩඋන්සේක.
30 සියලු ස්ථවිරයෝතුමූ විනයෙහි උපාලි ස්ථවිරයන්වහන්සේද,
අවශේෂවූ සියලුම ධර්මයෙහි ආනන්දස්ථවිරයන්වහන්සේද,
31 ප්‍රධාන කළහ. (කාශ්‍යපනම්වූ) මහාස්ථවිරතෙම තමන්
වහන්සේම විනය විචාරනු පිණිස තමන් සම්මත කළ
සේක, උපාලිස්ථවිරතෙමේද විසඳනු පිණිස තමන්ම සම්මත
32 කළසේක. ඒ මහාකාශ්‍යපස්ථවිරතෙම ථෙරාසනයෙහි වැඩ
හිඳ ඒ උපාලිස්ථවිරයන් විනය විචාළසේක, ඒ උපාලිස්ථ
විරතෙම ධර්මාසනයෙහි වැඩහිඳ එයම විසඳූසේක.
33 ක්‍රම දක්ෂවූ ඒ සියල්ලෝම විනයඥයන් අතුරෙන් අග්‍රවූ

Digitized by Google

උපාලි ස්ථවිරයන්වහන්සේ විසින් විසඳු ක්‍රමයෙන් විනය
34 සජ්ඣායනා කළහ.—ඒ මහාකාශ්‍යපස්ථවිර තෙම තමන්
වහන්සේ සම්මතකොට ගෙණ, බහුශ්‍රැතාදීන් අතුරෙන්
35 අග්‍රවූ සර්වඥයන්වහන්සේගේ ධර්මභාණ්ඩාගාරරක්ෂාකාරී
(ආනන්ද ස්ථවිරයන්) ධර්මය විචාළසේක, ආනන්දස්ථවිරතෙම
එපරිද්දෙන් තමන්වහන්සේම තමන් සම්මතකළසේක්
ධර්මාසනගතව ඒ ධර්මය නිරවශෙෂ කොට විසඳුයේය.
36 ධර්මාර්ථයෙහි දක්‍ෂවූ ඒ සියලු ස්ථවිරයෝ තුමූ වෙදෙහ
මුනිවූ ඒ ආනන්දස්ථවිරයන්වහන්සේ විසින් විසඳු ක්‍රමයෙන්
37 ධර්මය සජ්ඣායනා කළහ. මෙසේ සියලු ලෝකයාට
හිතවූ රහතන්වහන්සේලා විසින් සියලු ලොකයාගේ වැඩ
පිණිස සත්මසකින් ඒ ධර්මසඞ්ගීතීතොමෝ නිමවනලද්
38 දිය. මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ විසින් මේ බුද්ධ
ශාසනය පන්දහසක් හවුරුදු පැවැත්මෙහි පොහොසත්
39 කරණ ලද්දේයයි ධර්මසඞ්ගායනාවසානයෙහි පෘථුවිසඞ්ඛ
රක ජලය අවසන්වූ මහා පෘථුවිතොමෝ ඉතාම හටගත්
40 ප්‍රමෝද ඇත්තියක්සේ සවරක් කම්පිතවිය. ලොකයෙහි
නොයෙක්පරිද්දෙන් නොයෙක් ආශ්චර්‍ය්‍යයෝද වූහ, මේ
පරම්පරාතොමෝ ස්ථවිරයන් විසින් කරණලදහෙයින්
41 ථෙරියනම්වේ, ඒ සියලුම ස්ථවිරයෝ තුමූ ප්‍රථම සඞ්ගීතිය
හා බොහෝ සියලු ලෙව්වැඩද කොට ආයු ඇතිතෙක් වැඩ
සිට පිරිනිවියෝය.
42 ප්‍රඥනැමති ප්‍රදීපයෙන් මොහාන්ධකාර විධ්වංශනය කළාවූ
ලොකාන්ධකාර නැසීමෙහි මහපහන් බඳුවූ ඒ ස්ථවිරයෝ
තුමූද, මරණනැමති භයානක මහපවනින් නිවනලද්දූ
හුය, එහෙයින්ද නුවනැත්තේ ජීවිතමදය හරණේයි.

මෙතෙකින් සුදීජනයා පහන්සංවෙගපිණිස කළ මහවංශ
ප්‍රථමසඞ්ගීති නම්වූ තුන්වෙනි අදියර නිමියේයි.

සතරවෙනි පරිච්ඡේදය.

1 අජාසත් රජහු පුත්‍ර මිත්‍රද්‍රොහිවූ උදයිභද්‍ර රජතෙම ඒ
අජාසත් රජහු මරවා සොළොස්හවුරුද්දක් රජය කරවූයේ
2 ය, උදයිභද්‍ර රජහු පුත්‍රවූ අනුරුද්ධකුමාරතෙම ඒ උදයිභද්‍ර

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

රජහු මරවාද, අනුරුද්ධරජහු පුත්‍රවූ මුණ්ඩකුමාරතෙම ඒ
3 අනුරුද්ධ රජහු නයාදසි මිත්‍රද්‍රොහි දුර්මතිවූ ඔව්හුද රාජ්‍යය
4 කරවූහු. ඒ දෙදෙනාගේ රාජ්‍යයන්හිද අටහවුරුද්දක් ඉක්
මුනාහ, මුණ්ඩරජහු පුත්‍රවූ පව්ටුනාගදාසකතෙම පියා මර
5 වා සුව්සිවසක් රජය කරවී. ඉක්බිත්තෙන් "මේ පිතෘඝාත
කවංශය"යි කිපී නුවරවැස්සෝ සමගිවූවෝ නාගදාසක රජහු
6 පහකොට සාධුන්විසින් සම්මතකරණලද්දාවූ සුසුනාගයයි
ප්‍රසිද්ධවූ අමාත්‍යයෙකු සියල්ලන්ට හිතසිත් ඇත්තෝ රාජ්‍ය
7 යෙහි මොනවට අභිෂෙක කළහ. ඒ රජතෙම අටළොස්
වසක් රජය කරවිය, උහුපුත් කාලාශොක රජතෙමේ අටවිසි
8 හවුරුද්දක් රජය කරවිය, කාලාශොකරජහු රාජ්‍යයෙහි දස
වෙනිවස ඉක්මුන කල්හි මෙසේ ගණන් පිළිවෙළින් සර්ව
9 ඥයන්වහන්සේගේ පිරිනිවි වසින් ව෴ සියයක් විය. එකල්හි
විශාලාමහනුවර වැසි අලජ්ජිවූ නොයෙක් වජ්ජිපුත්‍රක භික්ෂූ
හු, සිහිලොණකප්පය, වඞ්ගුලකප්පය, එසේම ගාමන්තරක
10 ප්පය, ආවාසකප්පය, අනුමතිකප්පය, ආචිණ්ණකප්පය, අම
ථිතකප්පය, ජලොගිකප්පය, අදසකනිසීදනකප්පය, ජාතරූ
පාදිකප්පයයි * මෙසේ (අකැපවූ) දශවස්තූන් කැපයයි ප්‍රකා
11 ශ කළහ. වැද්දරට චාරිකාවෙහි වඩනා යශස්ථවිර තෙම ඒ

---

* මෙහි ශෘඞ්ගලවණකල්ප නම් ලුණුනැති ආහාරලත්කල ඒ හා මිශ්‍රකොට වළඳනු පිණිස ගෙරිඅං ආදි කුලාවක බහා ලුණු පරිහරණයි—ද්‍ව්‍යඞ්ගුලකල්ප නම් ඉරනැමි දෑඟුල් සෙවනැලි වනතෙක් විකල්බොජුන් වැලඳිමයි-ග්‍රාමාන්තරකල්ප නම් දැන් අන් ගමකට යමැයි පවුරුණුකළහුවිසින් කැපනොකළ අනතිරික්ත භොජනය වැලඳිමයි—ආවාසකල්ප නම් මහාසීමායෙහි නානා ආවාසයන්හි වෙන් වෙන්ව පොහෝකිරීමයි—ආචිණ්ණකල්ප නම් ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් විසින් පුරුදුකළදේ පැවැත්වීමයි—අමථිත කල්ප නම් යමක් කිරිබැවින් තොරනම් දිබවට නොපැමිනියේ නම් එවැන්න පැවරුවහු විසින් කැපකොට නොගෙණ වැලඳිමයි—ජලොගි කල්පනම් යමක් සුරාත් නොවිද මද්‍යබවටත් නොගියේද එබඳු නොලා තුමුහුකළ සුරාපිමයි—අදශකනිෂීදන කල්පනම් දහවළුනැති නිසිදන පරිහරණයි—ජාතරූපාදි කල්පනම් රන් රිදි මසු කහවණු ආදිය පිළිගැන්මයි, යන මෙතෙක්දෑ භික්ෂූන්ට කැපයයි වජ්ජිපුත්‍රක භික්ෂූන් විසින් උපදවනලද දශවස්තූනම්—මෙහි පවාරණ පච්ඡගහණදියෙහි වැඩි විස්තර විනයනයින් දත්තේයි.

Digitized by Google

ඇතුළුයේ, ෂඩභිඥ ඇත්තාවූ බලද්‍රාපත්වූ කාකණ්ඩක පුත්‍රවූ
12 යශ:ස්ථවිර තෙම එය සංසිඳුවනු පිණිස උත්සාහ සහිතවූයේ
එහි මහාවනයට වැඩියේක.
13 ඒ වැද්දරට වාසී භික්ෂූහු පොහෝගෙයි දිය සහිත ලො
හො තළියක් තබා "සඟහට කහවණු ආදිය දෙව්" කියා උපා
සකයන්ට කීහු, ඒ ස්ථවිරතෙම "නොකැපය එය නොදෙ
14 ව" යි වැලකූයේය, එ භික්ෂූහු යශස්ථවිරයන්වහන්සේට පටි
සාරණීයනම් කර්මය කළහ, ඒ ස්ථවිරතෙම අනුදූතයෙකු
15 ඉල්වාගෙණ උහු හා සමග නුවරට පිවිසියේය. තමන්
ධර්මවාදිබව නුවර වැස්සන්ට හඟවා පෙරලා වැඩියේක.
16 අනුදූත භික්ෂූහුගේ බස් අසා ඒ ස්ථවිරයන්වහන්සේට
උක්ඛෙපනීයනම් කර්මයකරන්නට ආවාවූ භික්ෂූහු ස්ථවිර
යන් වහන්සේගේ ගෙය වටකොට සිටියෝය. ස්ථවිරතෙම
17 අහසට නැගී එතැනින් කොසඹෑනුවරට වැඩ, අධොගඟ
පර්වතවිහාරයට තෙමේ වැඩ පාවාරට වාසිවූද අවන්තිරට
18 වාසිවූද භික්ෂූන් සමීපයට වහා දූතයන් යැවූයේක. සාණ
වාසිවූ සම්භූතනම් ස්ථවිරයන්වහන්සේට ඒ සියල්ල කී
19 යේක. පාවාරට වාසිවූ සැට නමක්ද, අවන්තිරටවාසිවූ අසූ
නමක්ද යන සියලු මහරහත් ස්ථවිරයන්වහන්සේලා
20 අධොගඟ පර්වතවිහාරයෙහි බැසියේක්ලාය, එසේ ඒ ඒ
තැනින් රැස්වූ භික්ෂූහු සියල්ලෝම අනූදහසක් වූහ. රා
ගාදි ක්ලෙශරහිත ඒ ස්ථවිරයන් වහන්සේලා මන්ත්‍රණය
21 කොට, ක්ෂීණාශ්‍රවබහුශ්‍රැතවූ සොරෙය්‍යරට වැසි රේවත
ස්ථවිරයන්වහන්සේ ඒ කාලයෙහි ප්‍රමුඛවසයෙන් දැන උන්
වහන්සේ දක්නාපිණිස ඒ තෙරුන්වහන්සේලා නික්මු
22 නහ. ඒ ස්ථවිරයන්වහන්සේ ඒ මන්ත්‍රණය (දිව්‍යකණින්)
අසා විසාලාමහනුවරටම වඩිනු කැමැත්තේ (පිරිවර රහි
තව) එාසුගමන කැමැත්තේ, එතැනින් එකෙණෙහි
23 නික්මුනෙක. ඒ මහාධ්‍යානයඇත්තාවූ ස්ථවිරයන්වහන්
සේ විසින් උදය උදය නික්මුනතැනට, සවස සවස
පැමිණෙන්නාහු ඒ රේවත ස්ථවිරයන්වහන්සේ සහජාති
භූමියෙහිදී දුටහ. එතැනදී සම්භූතස්ථවිරයන්වහන්සේ
24 විසින් නියෝගකරණලද්දවූ යශස්ථවිරයන් වහන්සේ,
සද්ධර්මශ්‍රවණාවසානයෙහි, රේවත ස්ථවිරොත්තමයන් කරා
එළැඹ දශවස්තූන් විචාළේය, ඒ ස්ථවිරතෙම (වරදයයි)
25 ප්‍රතික්ෂෙපකොට වදළේය. ඒ අධිකරණයද අසාවදරා
වලක්වම්හයි වදළේය. ඒ පාප භික්ෂූහුද උත්තමවූ රේවත
26 ස්ථවිරයන්වහන්සේ පක්ෂකරගන්නට සොයන්නාහු බො

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

හෝවූ ශ්‍රමණසාරූප්‍ය පරිෂ්කාරයන් සපයාගෙණ වහා
27 නැවින් ගොස් සහජාතිභූමිසමීපයට ගියාහු, භක්තකාලය
28 පැමිනිකල්හි භක්තපරිභොගය කෙරෙත්, සහජාතිභූමි
යෙහි වසන්නාවූ රහත්වූ (ආනන්දස්ථවිරයන් වහන්සේගේ
සද්ධිවිහාරිකවූ) සාළ්හනම් ස්ථවිරතෙම සිතා වදාරා පාචෙ
ය්‍යක භික්ෂූහු ධර්මවාදීහුයයි දැනවදාළේය. මහාබ්‍රහ්මතෙම
29 උන්වහන්සේකරා එළඹ ධර්මයෙහි පිහිටුවයි කීයේය. ඒ
ස්ථවිරතෙම තමන් සතතයෙන් ධර්මයෙහි පිහිටිබව ඒ බ්‍රහ්ම
යාට වදාළේය. ඒ භික්ෂූහු පිරිකර රැගෙණ රේවතස්ථවිර
30 යන් දුටුහ. ඒ ස්ථවිරයන්වහන්සේ (පිරිකර) නොපිළිගත්
තේය, ඒ පක්ෂය ග්‍රහණයකළාවූ (උත්තරනම්) ශිෂ්‍යයා
නෙරපූයේය. ඉක්බිත්තෙන් ඔව්හු විසාලාමහනුවරට
31 ගොස් එතැනින් පැලලුප්නුවරට ගියාහුය. අලජ්ජිභික්ෂූහු
"අපගේ ශාස්තෘන්වහන්සේගේ ගඳකිළිය රකිමින් අපි
32 එහි වැද්දරට "මහාවනවිහාරයෙහි වසම්හ ගම්වැසිවූ භි
33 ක්ෂූහු වෙහෙරගණුම්හයි එති මහරජ ඔවුන් වලක්වයි"
කාලාශොකරජහට කීවුය. ඔව්හු රජහු දුර්ග්‍රාහිතකොට
34 විසාලාමහනුවරට ආවාහුය. මෙහි සහජාති භූමියෙහි රෙ
35 වතස්ථවිරයන්වහන්සේ සමීපයෙහි භික්ෂූහු එකොළොස්
ලක්ෂ අනූදහසක් රැස්වූවෝ ඒ දසවස්තු සංසිඳුවනපිණිස
36 සාලකළෝ. මුලස්වූ වැද්දරට වාසි භික්ෂූන්ගෙන් වෙන්ව
දශවස්තුසමනය (රේවත ස්ථවිරයන්වහන්සේට) රුචිනො
37 විය. ඉක්බිත්තෙන් ඒ සියලුම ස්ථවිරභික්ෂූහු විසාලාමහනු
වරට ගියාහුය. වරදවා පිළිගත්තාවූ රජ තෙමේද එහි
ඇමතියන් යැවූයේය. දෙවානුභාවයෙන් මුළාවූවෝ අන්
38 තැනෙක ගියාහුය. ඒ මිහිපල් තෙම ඔවුන් යවා ඒ රාත්‍රි
යෙහි ස්වප්නයෙන් ස්වකීයවූ දෙහය ලොහකුම්භනරක
39 යෙහි බැහූබව දුටුයේය, රජතෙම අතිසයින් බියපත්වූයේය
උහු අස්වසනු පිණිස උහුගේ නැගනිවූ නන්දානම් රහත් ස්
ථවිර්තොණමෝ අහසින් ආවාය, "තොපවිසින් බරවූ කර්මයක්
40 කරණලද්දේය, ධාර්මිකවූ ආර්ය්‍යයන් ක්ෂමාකරව, තෙපි
41 උන්වහන්සේලාට පක්ෂව ශාසනසඞ්ග්‍රහකරව, මෙසේ කළ
42 කල්හි තොපට සැපවන්නේයයි"කියා බැහැරගියාය. මිහිපතී
තෙමේ උදැසනම විසාලාමහනුවරට යන්නට නික්මුණේය,
43 ඒ රජතෙම මහවනයට ගොස් භික්ෂුසඞ්ඝයා රැස්කරවා උභ
යපක්ෂයාගේ වාදයද අසා ධර්මපක්ෂයට රුචිකොට, ඒ සියලු
44 ධාර්මිකභික්ෂූන් ක්ෂමාකරවා තමන්ගේ ධර්මපක්ෂභාවය
කියා තුඹවහන්සේලා රුචිවූපරිද්දෙන් ශාසනයාගේ ප්‍රග්‍රහ

Digitized by Google

45 ණය කරවයි කියා උන්වහන්සේලාට ආරක්‍ෂාත් දී ස්ථානිය
46 නගරයට ගියේය. එකල්හි ඒ දසවස්තූන් විනිශ්චයකරණු
පිණිස සඞ්ඝයා රැස්වූසේක, එහි කෙළවර නැත්තාවූ විවාද
47 කථාවෝ සඟමැද උපන්හ. ඉක්බිත්තෙන් ඒ රේවතස්ථවිර
යන්වහන්සේ සඟමැදට පැමිණියේ සඞ්ඝයාට අස්වා ඒව
ස්තුව (අධර්මවාදීන් පිරිසෙන් පිටකිරීමට) උබ්බාහිකාවෙන්
48 සංසිඳුවන්නට නිශ්චයකළසේක. පෙරදිගවැසි භික්‍ෂූන්
සතර නමක්ද පාවෙය්‍ය සතර නමක්ද වස්තුව සංසිඳුවන
49 පිණිස උබ්බාහිකාවට සම්මත කළසේක. සබ්බකාමිය, සාළ්හ
ය, ඛුජ්ජසෝභිතය, වාසභගාමිකයයි මේ පූර්වදිග්වාසීවූ ස්ථ
50 විරයෝය. සාණවාසී සම්භූතය, රේවතය, කාකණ්ඩපුත්‍රවූ
යසය, සුමනයයි මේසතර නම පාවෙය්‍යවූ ස්ථවිරයෝය,
රහත්වූ ඒ ස්ථවිර අටනම අල්පශබ්දවශයෙන් නිරවුල්කොට
51 ඒ වස්තූන් සංසිඳුවනුපිණිස වාලුකාරාමයට වැඩියාහුය. එ
තන්හි අජිතනම්වූ ඒ භික්‍ෂූනමක් විසින් පණවන ලද අස්
නෙහි සර්වඥයන්වහන්සේගේ අදහස් දන්නාවූ මහතෙරහු
52 වැඩහුන්හ. ප්‍රශ්නාවන්හි දක්‍ෂවූ රේවතනම් මහාස්ථවිරයන්
වහන්සේ ඒ වස්තූන් අතුරෙන් එක එක පිළිවෙළින් සබ්බ
53 කාමිස්ථවිරයන් විචාළසේක. ඉක්බිති උන්වහන්සේ විසින්
විචාරණලද සබ්බකාමිනම් මහාස්ථවිරතෙම ඒ සියල්ලම
54 වස්තුහු කැපනොවෙත්යයි සූත්‍රදක්වීමෙන් ප්‍රකාශකොටවදා
ළේය. ඒ ස්ථවිරයෝ තුමූ ඒ අධිකරණය පිළිවෙළින් බැහැර
කොටලා එහිම සඟමැද පිළිවෙළින් පළිවිසීම් විසඳීම්
55 කළහ. ඒ මහාස්ථවිරයෝ තුමූ දශවස්තූන් ප්‍රකාශකළාවූ ඒ
56 දසදහසක් පාපභික්‍ෂූන්ට නිග්‍රහකළහ. සබ්බකාමිනම් ස්ථ
විරයන්වහන්සේ එකල ලෝකයෙහි සියලු සඞ්ඝයාට වැඩි
මහලුවූසේක, එකල්හි උන්වහන්සේ උපසම්පදාවෙන් එක
57 සියවිසිවයස් වූසේක. සබ්බකාමිය, සාළ්හය, රේවතය, ඛුජ්ජ
සෝභිතය, කාකණ්ඩකපුත්‍රයසය, සාණවාසී සම්භූතය යන
මේ ස්ථවිරයන්වහන්සේලා ආනන්දස්ථවිරයන්වහන්සේගේ සද්ධි
58 විහාරිකවූ ශිෂ්‍යයෝය, වාසභගාමිකය, සුමනය යන මේ
59 ස්ථවිර දෙනම වනාහි අනුරුද්ධස්ථවිරයන්වහන්සේගේ සද්ධි
විහාරික ශිෂ්‍යයෝයි. පින්වත්වූ ඒ ස්ථවිර අටනමද පෙර
තථාගතයන්වහන්සේ දුටුවෝය. භික්‍ෂූන් දොළොස් ලක්‍ෂ
60 යක් රැස්වූහ, සියල්ලම භික්‍ෂූන්ට රේවතනම් ස්ථවිරයන්
61 වහන්සේ ප්‍රමුඛ වූයේය. එහෙයින් එකල්හි ඒ රේවත
ස්ථවිරයන්වහන්සේ බොහෝකල් සද්ධර්මයාගේ පිහිටීම
62 සඳහා, ධර්මසඞ්ගීතියක් කරවනු පිණිස සියලු භික්‍ෂූසමූ

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

හයෙන් ප්‍රභේද ප්‍රාප්ත අර්ථප්‍රතිසම්භිදාදී ගුණඇති පිටකත්‍රය
ධාරීවූ රහතුන්වහන්සේලා සත්සියයක් තෝරාගත්සේක.
63 රේවතස්ථවිරයන්වහන්සේ ප්‍රමුඛකොට ඇත්තාවූ ඒ සිය
ලෙලෝ වාලුකාරාමයෙහි කාලාශෝක (නම් නරනිඳුහු) විසින්
64 ආරක්ෂාකරණලද්දාහු ධම්මසඞ්ගායනා කළහ. පූර්වයෙහි
පූර්වෝද කළනයද කරණලද්දාවූ ඒ ධර්මය මෙසේ ග්‍රහණය
65 කොට මේ (ධර්මසඞ්ගීතිය) අටමසකින් නිමවූහ. මෙසේ
66 ඒ මහායශස් ඇත්තාවූ දෝෂක්ෂය ප්‍රාප්තවූ ස්ථවිරයන්වහන්
සේලාද දෙවෙනි සඞ්ගායනාවකොට කලකින් පිරිනිවන්
පා වදාළහ.
67 මෙසේ උත්තම ප්‍රඥාඇත්තාවූ පැමිනියාවූ ලෝකෝත්තර
විශේෂ ධර්ම ඇත්තාවූ භවත්‍රය වංසිත්ට වැඩසිදුකරනනාවූ
සර්වඥපුත්‍රයන් වහන්සේලාගේ ඒ මරණය සිහිකොට (ඇ
තිව නැතිවන) සඞ්ඛත ධර්මයන්ගේ සාරරහිත භාවය නිර
වශේෂ වශයෙන් ප්‍රඥාවෙන් පරීක්ෂාකොට (සාධුජනතෙම)
ප්‍රමාදරහිත වන්නේය.

මෙතෙකින් ශුද්ධජනයා ප්‍රසාදසංවේග පිණිසකළ මහාවංශ ද්විතීය සඞ්ගීතිනම්වූ සතරවෙනි අධ්‍යාය නිමියේයි.

පස්වෙනි පරිච්ඡේදය.

1 ආරම්භයෙහි මහාකාශ්‍යපාදී මහාස්ථවිරයන්වහන්සේලා
විසින් කරණලද ධර්මසඞ්ගීතිතොමෝ ථෙරියායයි කියනු
ලැබේ.
2 ආරම්භ වර්ෂ සියයෙහි ඒ එකම ථෙරවාදය වූයේය, ඉන් මෑ
3 ත අන්‍යාචාර්ය වාදයෝ උපන්හ. ඒ දෙවැනිවූ සඞ්ගායනා
කාරී ස්ථවිරයන් විසින් නිග්‍රහකරණලද සියලු දසදහසක්
ඒ පාපිභික්ෂූහු මහාසඞ්ගීති නම්වූ ආචාර්ය වාදයක් කළා
4 හුය. ඒ මහාසඞ්ගීතික භික්ෂූන්ගෙන් ගෝකුලිකය, එක
ව්‍යවහාරිකයයි ආචාර්යවාද ඇති ලබ්ධි දෙකක භික්ෂූහු
5 වූහ, ගෝකුලික භික්ෂූන්ගෙන් පුග්ගලපණ්ණත්තිවාදීහූය,
බාහුලිකයෝයයි ලබ්ධි දෙකක පිහිටි භික්ෂූහු වූහ. ඒ
භික්ෂූන් අතුරෙහිම චෛත්‍යවාද නම්වූ අන්‍යමතයක පිහිටි
6 භික්ෂූහු වූහ. ඒ සියල්ලෝ මහාසඞ්ගීති නම් වාදය ඇත්
තෝය. නැවතද ථෙරවාදී භික්ෂූන්ගෙන් මහිංසාසක නම්

භික්ෂූහූය, වජ්ජිපුත්‍රක භික්ෂූහූයයි යන දෙකොටසවූහ.
7 ඒ වජ්ජිපුත්‍රක භික්ෂූහූම ධම්මුත්තාරිය නම් භික්ෂූහූය, භද්‍රයා
නික භික්ෂූහූය, ඡන්නාගාරික භික්ෂූහූය සම්මිතිය භික්ෂූහූ
8 යයි මෙසේ (සතරකොටසක්) වූහ. මහිංසාසක නම් භික්ෂූන්
ගෙන් නික්ම සබ්බත්ථිවාදී නම් භික්ෂූහූය, ධම්මගුත්තිය නම්
9 භික්ෂූහූයයි මේ දෙකොටසවූමය. යළිත් සබ්බත්ථිවාදීන්
කෙරෙන් නික්ම කාශ්‍යපිය භික්ෂූහූ වූහ, එයින් සඞ්කාන්තික
නම් භික්ෂූහූ වූහ, එයින් වනාහි සුත්තවාද නම් භික්ෂූහූ වූහ.
10 ඒ මොව්හූ ථෙරවාදනම් මහඇති භික්ෂූන්හා සමග දෙ
ළොස් නිකායක් වෙති, පූර්වයෙහි කියනලද ෂඩ්වාදයෝ
11 දැයි මෙසේ සියල්ලෝම අටළොස් නිකායක්වූහ. මෙසේ
දෙවෙනි වර්ෂශතයෙහි සතළොස් මතයක්වූහ. ඉන්මෑත
12 අන්‍යවූ ආචාර්යවාද උපන්හ. එනම්, හෙමවතයෝය
රාජගිරිකයෝය, එසේම සිද්ධාර්ථිකයෝය, පුබ්බසෙලිකනම්
භික්ෂූහූය. එසේම අපරසෙලිකයෝය, වාජිරීකයෝය මේ
13 ෂඩ්විධ මතිකයෝ ජම්බුද්වීපයෙහි භිදුනෝය, ධම්මරුචික
යෝය, සාගලිකයෝයයි ලඞ්කාද්වීපයෙහි භින්නාවූහ.——
ආචාර්යවංශ භෙදයයි.

කාලාශොක රජහුගේ පුත්‍රවූ දසබෑ කෙනෙක් වූහ.
14 ඔව්හූ දෙවිසිහවුරුදක් රාජ්‍යානුශාසනා කළහ, ඒ දසබෑ
15 රජුන්ට අනතුරුව නවනඳ රජදරුවෝ පිළිවෙළින්වූහ,
ඔව්හූද දෙවිසිහවුරුදක් රාජ්‍යානුශාසනා කළහ.
16 ඉක්බිත්තෙන් ඒ චාණක්‍ය නම් බ්‍රාහ්මණතෙම නඳ රජුන්
අතුරෙහි නවවෙනිවූ ධනනඳ රජහු චණ්ඩක්‍රොධයෙන්
17 මරවා මෞර්යනම් ක්ෂත්‍රියයන්ගේ වංශයෙහි උපන්නාවූ
ශ්‍රීධරවූ චන්ද්‍රගුප්තයයි ප්‍රසිද්ධවූ රාජකුමාරයා මුළු දඹදිව
රාජ්‍යයෙහි අභිෂෙක කෙළේය, ඒ චන්ද්‍රගුප්ත රජතෙම සූ
18 විසි හවුරුදක් රජය කෙළේය. ඔහු පිත් බින්දුසාර ක්ෂත්‍රිය
තෙම අටවිසි හවුරුදක් රජය කෙළේය. බින්දුසාර රජහුගේ
19 පුත්‍රයෝ තුමූ ප්‍රසිද්ධවූ එකසිය එකදෙනෙක් වූහ. ඔවුන්
අතුරෙන් ධර්මාශොක කුමාරතෙම පුණ්‍යතෙජෝබල සමෘද්ධි
සම්පන්නාවූයේය, හෙතෙම භින්නමාතෘකවූ එකුන්සියයක්
20 සහෝදරයන් මරවා මුළුදඹදිව ඒකරාජ්‍යයට පැමිණි
යේය, සර්වඥයන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ඒ
21 රජහු අභිෂෙකයෙන් පූර්වයෙහි වර්ෂ දෙසිය අටළොස මෙ
සේ දතයුතු. මහා යසස්ඇත්තේ සිවුවසකින් ඒකරාජ්‍යයට
පැමිනි පාටලිපුත්‍ර නගරයෙහි තමන් අභිෂෙක කෙළේය.
22 ඒ රජහුගේ අභිෂෙකයහා සමගම, අහසෙහිද එසේම භූමි

Digitized by Google

23 යෙහිද යොදුනක් යොදුනක් තන්හි ආඥව සතතයෙන්
පතළවිය. (ඒ රජනන්ට) දෙවියෝ අනොතත්ත විලෙහි
24 පැන්කත් අටක් දවසක් පාසා ගෙණවාහුය, නරෙන්ද්‍රතෙම
එයින් ජනයාටද සංවිභාග කෙළේය, දෙවියෝම හිමවතින්
නොයෙක් දහස්ගණනකට පොහොනාවූ නාලියදැවටු ගෙ
25 ණවාහුය. එසේම බෙහෙත් ඇඹුලුහා බෙහෙත් අරළුද
වර්ණයෙන් ගන්ධයෙන් රසයෙන් උතුම්වූ අඹපලද එයින්ම
26 ගෙණවාහුය, (තවද) දෙවතාවෝ පඤ්චවර්ණ වස්ත්‍රයන්ද,
පීතවර්ණවූ අත්පිසිනා පළිකඩද දිව්‍යපාන වර්ගද ඡද්දන්ත
27 විලින් ගෙණවාහුය, ඒ නුවර මැරෙන්නාවූ මුව ඌරු
28 ලිහිණියෝ ඒ රජහුගේ මුළුතැන්ගේලගට අවුත් තමන්ම
මැරෙත්. එහි දිවියෝතුමූ ගවයන් ගොදුරුකවා ගාලට
29 ගෙණ එති. මුවන්හා ඌරෝ කෙත් වත් විල් ආදීන්
රකිති. හුනැත්තාවූ දිව්‍යවූ සමන්මල්පමහා උපුල්ද විල
වුන්ද අඳුන්ද, නාග විමානයෙන් නාගයෝ ගෙණඑති.
30 ගිරවූ වනාහි හැල්ගැල් අනූදහසක් ඡද්දන්තවිලින්ම දින
31 පතා ගෙණවාහුය. මීයෝ ඒ හැල් නොකඩා දහෙවිය
කුඩුනැතිකොට සහල් සුදුකළහ. ඒ සහලින් රජගෙයි
32 බත සිදුවිය. ඒ රජහට සතතයෙන් මීමැස්සෝ මීබැන්දෙ.
33 එසේම ඒ රජහුගේ කම්මුරුහල්හි වලස්සු කුළුගැසූහ.
34 මනොඥමධුරස්වර ඇත්තාවූ කුරවිකෙවිල්ලෝ අවුත් ඒ
රජහට මධුරවූ කූජනය කළහ. අභිෂෙක කරණලද්දාවූ
35 ඒ අශොක රජතෙම ස්වකීයබාලසහෝදරවූ තිස්සනම්වූ
කුමාරයා උපරාජ්‍යයෙහි අභිෂෙක කෙළේයි—ධර්මාශො
කාභිෂෙකය නිමියේයි.

ඒ රජහු පියතෙම බ්‍රාහ්මපාක්ෂිකවූ සැටදහසක් බ්‍රාහ්ම
36 ණයන් වැලඳවිය, ඒ ධර්මාශොක රජතෙමේද තුන්හවු
රුද්දක් ඔවුන්ටම දන්දුන්නේය. නුවනැත්තාවූ අශොක
37 රජතෙම දන්දෙන තන්හිදී ඔවුන්ගේ අනුපසම්ය දැක
"පරීක්ෂාකොට දනය දෙන්නෙමැ"යි ඇමැතියන් මෙහෙ
38 යා වෙන්වසයෙන් නානා පාෂණ්ඩයන් ගෙන්වා හිඳීමෙන්
විමසා වළඳවා හැරියේය, කාලයෙක්හි සිවුමැදුරුගතවූ
39 ඒ රජතෙම වීථියෙහි වඩනාවූ උපසමිත සංසුන් ඉඳුරන්
ඇත්තාවූ ඒ නිග්‍රොධ සාමණෙරයන් දැක සිත පැහැදවූ
යේය. ඒ නිග්‍රොධ සාමණෙරතෙම බිඳුසාර රජහුගේ පුත්‍ර
40 යන් අතුරෙන් සියල්ලන්ට වැඩිමහල් සහෝදරවූ සුමන
නම් කුමාරයාගේ පුත්‍ර වූයේය—(එහි පිළිවෙළකථාව
මෙසේයි.)

Digitized by Google

ඒ අශොක කුමාරතෙම පියානන්විසින් දෙනලද උදේනි
41 රට රාජ්‍යය හැර බිඳුසාර රජහු රොගාතුරකල්හි පාටලීපුත්‍ර
නගරයට පැමිණියේය, පුරය තමා අයත්කොට ගෙණ පියා
මළකල්හි වැඩිමහල් සහෝදරයා මරා පුරවරයෙහි රාජ්‍යය
42 ගත්තේය. සුමනනම් කුමාරයාගේ සුමනා නම්වූ ගර්භ
43 ණිවූ දේවීතොමෝ ඒ පුරයෙන් නික්ම නැගෙණහිරි දො
44 රින්පිට සැඬොල් ගමට ගියාය. එහි නුගරුක අධිවාසීවූ
දෙවතාතොමෝ නමින් ඇය කැඳවා ගෙයක්මවා දුන්නා
45 ය, ඕතොමෝ එදවසම උතුම් පුතෙකු වදා දෙවතානුග්‍රහය
අනුවගියා පුත්‍රයාට නිග්‍රොධයයි නම්කළාය. සැඬොල්දෙටු
46 තෙම ඇය දැක තමා සාමිදුවමෙන් සිතන්නේ සත්හවුරු
ඳුක් මනාකොට ඇයට උවටැන් කෙළේය. එකල්හි මහා
47 වරුණනම් අහිත් ස්ථවිරතෙම හෙතුසම්පන්නවූ කුමරුවා
දැක මෑනියන් විචාළේ ඒ කුමරුවා පැවිජිකරවූයේය, ඒ
48 කුමාරතෙම කරගෙහිම රහත්බවට පැමිණියේය. ඉක්
බිතෙතන් ඒ නිග්‍රොධ සාමණේරතෙම මවු බිසවුන් දක්
නට යන්නේ පුරවරයට දකුණු දොරින් පිවිස, එකල රජ
49 මළුවෙහි ඒ ගමට යන මගින් යන්නේය. ඒ රජතෙම
ශාන්තවූ ඊර්යාපථය කරණකොටගෙණ ඒ සාමණේරයන්
කෙරෙහි ප්‍රසන්නවූයේය.
50 පූර්වයෙහිම සම්ග විසීමෙන් උන්වහන්සේ කෙරෙහි
ප්‍රෙමය උපන්නේය. (ඒ පිළිවෙළ කථාව මෙසේයි) පූර්ව
51 යෙහි වනාහි මීවෙළඳ තුන්බෑකෙනෙක්වූහ. එක් වෙළ
දෙක් මී විකුණයි, දෙදෙනෙක් මී ගෙණඑති, එකල එක්
52 පසේබුදුකෙනෙක් ව්‍රණරොගයකින් ආතුරවිය, අන්‍යවූ
පසේබුදුකෙනෙක් උන්වහන්සේ පිණිස මී සොයමින්
53 එකල පිඩුසිඟන වතින් නුවරට පිවිසිසේක. දිය ගෙණනු
සඳහා තොටට යන්නාවූ එක් හටවෙටිකාවක් තොමෝ උන්
54 වහන්සේ දුටුවාය. විචාරා මී කැමතිබැව් දැන, "වහන්ස තෙ
ල මීසල්පිළය" අතින්දක්වා එහි වැඩිය මැනවැයි කීවා. එහි.
55 පැමිණි පසේබුදුන්ට පහන්වූ ඒ වෙළඳතෙම, පාත්‍රුවෙන්
උතුරුවමින් පාත්‍රයපුරා මී දන්දුන්නේය, පිරුණවූද ඉතිරී
56 ගියාවූද පොළෝතෙලෙහි වැටුනාවූද, මී දැක ප්‍රසන්නවූ ඒ
වෙළඳතෙමේ එකල්හි "මේ දානය කරණකොටගෙණ මට
ජම්බුද්වීපයෙහි එක රාජ්‍යය වේවා, අහස යොදුනක් තන්
57 හිද පොළොව යොදුනක් තන්හිද (මාගේ) ආඥාව පැතී
රේව" යි මෙසේ ප්‍රාර්ථනා කෙළේය. ආවාවූ සහොදරයන්ට
58 හෙතෙම "මෙබඳු කෙනෙකුට මිදුනිම් මී නුබලාවද අසිති

හෙයින් තුඹලාත් ඒ අනුමෝදන් වව්ය" යි කීයේය, ඒ වැඩි
59 මහලු සහෝදරතෙම නොසතුටු සිත්ඇතොත් "සැමකල්
හිම චණ්ඩාලයෝ කසාවත් හඳනාහුය, හෙතෙම චණ්ඩාල
යෙක් වන්නේද්‍යෙහෝයි" කීයේය. මධ්‍යම තැනැත්තේ
60 "ඒ පසේබුදුන් මුහුදින් එතරදම" යි කීයේය, ඒ මවුදයක
යාගේ බස්අසා ඔව්හු ප්‍රාප්තිදානය අනුමෝදන්වූහ.
61 ඒ සල්පිල දැක්වූ සටවෙට්කාතොමෝ වනාහි ඒ මවුදය
කයාගේ මෙහෙසි බැව්හා නොපෙණෙන සන්ධිඇති ඉතා
62 මනොහරවූ රූපයද ප්‍රාප්තාකළාය. මවුදයකවූ වෙළඳ
තෙම ධර්මාශොකනම් රජවූයේය, සටවෙට්කාතොමෝ
අසන්ධිමිත්‍රානම් දෙවී විය, චණ්ඩාලවාදිවූ වෙළඳතෙම
නිග්‍රොධ සාමණෙර වූයේය, පාරවාදිකවූ වෙළඳතෙම
63 දෙවැනි පැතිස්නම් රජවූයේය. යම්හෙයකින් හෙතෙම
චණ්ඩාලවාදි විනම් එහෙයින් සැඩොල්ගම උපන්නේය,
යම්සේ මොක්‍ෂය ප්‍රාර්ථනාකෙළේද, එහෙයින් සත්හැවිරිදි
64 වයස් ඇත්තේම මොක්‍ෂප්‍රාප්තද වූයේය. එහෙයින් ඒ සාම
ණෙරයන් කෙරෙහි පිහිටි ප්‍රෙමඇති ඒ රජතෙම, ඉතා දැහු
65 සුළුවූයේ ඔහු කැඳවූයේය, හෙතෙම සංසුන් පැවැතුම් ඇත්
තේම ලඟට පැමිනියේය, රජතෙම දරුව සුදුසු අස්නෙක
හුනමැනවැයි කීයේය. හෙතෙම අන්‍යවූ ශ්‍රමණයෙකු නො
66 දැක සිංහාසනයකරා පැමිනියේය, ඒ සාමණෙරයානත්
පය්‍ය්‍යඞ්කයකරා එනකල්හි රජතෙම "අද මේසාමණෙර
තෙම මාගේ ගෙයි ස්වාමිවන්නේය" යි සිතුයේය. හෙතෙම
67 රජහු අතඅල්වා පය්‍ය්‍යඞ්කයට නැංගේ රාජපය්‍ය්‍යඞ්කයෙහි
68 ශ්ස්සනයට වැඩහුන්නේය. ඒ ධර්මාශොක රජතෙම එසේ
හුන්නාවූ ඒ සාමණෙයන් දැක, ගුණයෙන් සම්භාවනා
69 කොට, එකල අතිශයින්ම සතුටුවූයේය. ඒ සාමණෙරයන්
තමන්ට පිළියෙල කරණලද ඛාද්‍යභොජ්‍යයෙන්සතපා, සම්
70 බුදුන් වදළ ධර්මයක් විචාළේය. ඒ සාමණෙරතෙම ඒ රජ
හට දම්පියායෙහි අප්‍රමාද වර්ගය වදළේය, ඒ මිහිපල්තෙම
71 ඒ අසා බුඩශාසනයෙහි ප්‍රසන්නවූයේ "දරුව තුඹවහන්
සේට නිත්‍යබත් අටක් දෙමැ" යි ඒ හෙරණුන්ට කීයේය,
ඒ සාමණෙරතෙම "මහරජ ඒ නිත්‍යබත් මාගේ උපාධ්‍ය
72 යන්ට දෙමැ" යි කීයේය. නැවත අටක් දුන්කල ඒ අට
ආචාර්‍ය්‍යන්ටද, නැවතත් අටක් දුන්කල්හි ඒ අට භික්‍ෂුසඞ්ඝ
73 යාටද ඒ සාමණෙරතෙම දුන්නේය. නැවතත් අටක් දුන්
කල්හි ප්‍රාඥවූ සාමණෙරතෙම ඉවසූසේක. දෙවෙනි දවස්
හි භික්‍ෂූන් දෙතිස්නමක් ගෙණ රජගෙට වැඩිසේක. රජහු

Digitized by Google

74 විසින් සියතින් තර්පණය කරණලද්දේ ධර්මදෙශනාකොට
මහජනයා සහිතවූ රජහු තිසරණ පන්සිල්හි පිහිටෙවූ
සේක. (නිග්‍රොධ සාමණෙර දර්ශනයි)
75 ඉක්බිත්තෙන් ප්‍රසන්නවූ ඒ රජතෙම, දවසක් දවසක්
පාසා පිළිවෙළින් විගුණයෙන් භික්ෂූන් සැටදහසකට උප
76 ස්ථාන කෙළේය, සැටදහසක් තීර්ථකයන් බැහැරකොට
77 සැටදහසක් භික්ෂූන් සතතයෙන් රජගෙහි වැලඳවිය. ඒ
රජතෙම සැටදහසක් භික්ෂූන්ට වලඳවනුපිණිස යුහුසුලු
78 වූයේ මාහැඟිවූ ඛාද්‍ය භොජ්‍යයන් පිළියෙලකරවා, නුවර
සරහවා ගොස් සඞ්ඝයා පවරා රජගෙට වඩාගෙණ වලඳවා
79 බොහෝවූ ශ්‍රමණ පරිෂ්කාර දන්දී ශාස්තෘන්වහන්සේ වි
සින් දෙසනලද ධර්මයතෙම කොතෙක්දැයි විචාළේය, මො
ග්ගලීපුත්තතිස්ස නම් ස්ථවිරතෙම එකල ඕහට ඒ ප්‍රශ්නය
80 විසඳ වදාළේය, අසූසාරදහසක් ධර්මස්කන්ධයෝයයි අසා ඒ
රජතෙම "මම ඒ ධර්මස්කන්ධයන් එකක් එකක් වශයෙන්
81 (එක එක) විහාරයෙන් පුදමැයි කීයේය. රජතෙම එකල්හි
සයානුකෙළක් වස්තුදී මිහිතෙලෙහි අසූසාරදහසක් පුර
82 යන්හි ඒ ඒ තන්හි රජුන්ලවාම විහාරයන් ආරම්භකර
වූහ, තෙමේ අශොකාරාමය කරවනනට ආරම්භකෙළේය.
83 ඒ රජතෙම රත්නත්‍රය, නිග්‍රොධ සාමණෙරය ගිලන්හුය
යන මොවුන්ට ශාසනයෙහි වෙන් වෙන් වශයෙන් දවසක්
84 දවසක් පාසා ලක්ෂයක් බැගින් ධනය දෙවූයේය. බුදුන්ට
දෙනලද ධනයෙන් සෑම්කල්හි නොයෙක් විහාරයන්හි
85 නොයෙක් පරිද්දෙන් ධූප පූජාකළහ. මනුෂ්‍යයෝ තුමූ ධර්ම
යට දෙනලද ධනයෙන් ප්‍රණීතවූ සිවුපසයන් ධර්මධර
86 භික්ෂූන්ට පැමිනවූහ. අනවතප්තවිල පැන්කදින් දවසක්
දවසක් පාසා සතරක් සඞ්ඝයාටද, ත්‍රිපිටකධර භික්ෂූන් සැට
87 නමකට එකක්ද දුන්නේය, එකක් අසන්ධිමිත්‍රා නම් දෙවි
යට දෙවිය. මිහිපතිතෙම දෙකක්ම තමන් පරිභොග
88 කෙළේය. දවසක් දවසක් පාසා සැටදහසක් භික්ෂූන්ටද,
සොළොස් දහසක් ස්ත්‍රීන්ටද නාගලතා නම්වූ දැහැටිදීන.
89 ඉක්බිති එක් දිනක් රජතෙම චතුස්සම්බුද්ධයන්ගේ දර්ශ
නයඇත්තාවූ මහත් සෘද්ධිඇති කල්පායුෂ්කවූ මහාකාලනම්
90 නාරජහු පවත්අසා, ඔහු ගෙණඑන්ට ස්වර්ණශෘඞ්ඛලිකා
91 බන්ධනය යවා, ඔහුගෙන්වා, ඡත්‍රයට පල්ලෙහි හිඳුවා,
නානාවිධ පුෂ්පයෙන් පුදා, සොළොස්දහසක් ස්ත්‍රීන් පිරි
92 වරා "පින්වත සද්ධර්මචක්‍රවර්තිවූ අනන්තඥානඇත්තාවූ
මහර්ෂිවූ සර්වඥයන්වහන්සේගේ රූපය මට දක්වව"යි

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

93 කීයේය. දෙතිස්මහා පුරිස්ලකුණෙන් යුක්තවූ අසූවක් අනු
ව්‍යංජනයෙන් බබලන්නාවූ බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් වට
කරණලදුවූ කේතුමාලාවෙන් විශෙෂයෙන් ශොභිතවූ ම
94 නොඥවූ බුඩරූපය ඒ නාගරාජතෙම මවාපෑයේය. ඒ දැක
අධිකවූ ප්‍රසාදයෙන් හා විස්මයෙන්ද පිරුණේ "මොහුවිසින්
95 මවනලද රූපය මෙබඳුය තථාගතයන්වහන්සේගේරූපය
කෙබඳුයෝසි" ප්‍රීතියෙන් අතිශයෙන් උසස්වූයේය. මහත්
96 සෘධි ඇත්තාවූ ඒ මහරජතෙම අක්ෂිපූජායයි නම්වූ ඒ මහත්
97 වූ පූජාවක් සත්දවසක් නිරතුරුකොට කරවූයේය, මහීපති
තෙම මෙසේ මහානුභාව ඇත්තේත් ශ්‍රද්ධාඇත්තේද විය.
මොග්ගලිපුත්තතිස්ස නම්වූ ස්ථවිරතෙමේද යන මොවුහු පූර්ව
යෙහි රහතුන්විසින් දක්නාලද්දෝය.—ධර්මාශොක රජ
හුගේ ශාසන ප්‍රවෙශය නිෂ්ඨිතයි.

98 දෙවෙනි සඞ්ගායනාවෙහිදී ඒ ස්ථවිරයෝතුමූ අනාගතය
බලන්නාවූ ඒ ධර්මාශොක රජහුගේ කාලයෙහි වන ශාස
99 නොපද්‍රවය දුටහ, ඒ උපද්‍රවය නසන්නෙකු සකලලෝක
යෙහි බලන්නාවූ නොබෝකල් පවත්නා ජීවිත ඇත්තාවූ
100 තිස්සනම් බ්‍රහ්මයා දුටහ, ඒ ස්ථවිරයෝතුමූ මහාප්‍රඥාඇති
101 ඔහුවෙත එළඹ මිනිසුන් කෙරෙහි ඉපද ඒ උපද්‍රව නැසීම
ඉල්වූහ. සතුන් බබලවනු කැමතිවූ හේතෙම ඒ ස්ථවිර
යන්ට ප්‍රතිඥා දුන්සේක. සිග්ගවය චණ්ඩවජ්ජිය යන නම්
102 ඇත්තාවූ බාල භික්ෂූන් දෙදෙනාට ඒ ස්ථවිරයෝ මෙසේ
වදාළහ. "අටළොසක් අධිකවූ හවුරුදු සියයකින් මතුයෙහි
103 ශාසනයට උවදුරෙක් වන්නේය, අපි ඊට නොපැමිණෙම්හ,
ඇවැත්නි තෙපි මේ අධිකරණයට නොඑළඹුනාහ එහෙ
යින් දඬුවමට සුදුසුයහ, මේ තොපට දඬුවම්නම්වේ. සතුන්
104 බැබලවීම පිණිස මහත් ප්‍රඥාඇත්තාවූ තිස්සනම් බ්‍රහ්ම
තෙම මොග්ගලිනම් බ්‍රාහ්මණයාගේ ගෙහි පිළිසිඳගන්
105 නේය. තොප අතුරෙන් එක්කෙනෙක් ඒ කුමාරයා පැවිදි
කෙරේවා. එක නමක් සර්වඥ වචනය මනාකොට උගන්
වාව" (යි වදාළහ.)

106 උපාලිස්ථවිරයන් වහන්සේගේ සද්ධිවිහාරිකවූ දාසකනම්
ස්ථවිරකෙනෙක ඒ තෙරුන් සද්ධිවිහාරිකවූ සොණස්ථවිර
කෙනෙක්විය මේ සිග්ගව, චණ්ඩවජ්ජී දෙදෙනා සොණ
තෙරුන් සද්ධිවිහාරිකයෝවූහ.

(එහි පිළිවෙළකථාව මෙසේය.)

107 පූර්වයෙහි විසාලාමහනුවර දාසකනම් බ්‍රාහ්මණයෙක්
විය, ශිෂ්‍යයන් තුන්සියයකට ප්‍රධානවූ හෙතෙම ආචාර්‍යන්

108 සමීපයෙහි වසන්නේ දොළොස්හැවිරිදි වූයේම වේදයෙහි
පාරප්‍රාප්තවූයේ ශිෂ්‍යයන් සහිතව හැසිරෙන්නේ වාලිකා
රාමයෙහි වසනනාවූ කරණලද සඞ්ග්‍රහඇති උපාලිතෙ
109 රුන් දැක උන්වහන්සේ සමීපයෙහි හිඳ, වේදයන්හි ග්‍රන්ථි
ස්ථානයන් විචාළේය. උන්වහන්සේ ඒ විසඳූසේක (ඉක්බිති)
"මානවකය සියලු ධර්මයන් අනුවවැටුනාවූ එක්ධර්මයක්
110 වේ, සියලු ධර්මයෝ එහි බැසගණිති ඒ ධර්මය කවරේද" යි
111 ස්ථවිරතෙමෙ නාමය සඳහා කීසේක, මානවකතෙමේ
නොදන්නේ "මේ කවර මන්ත්‍රයෙක්ද" යි විචාළේය, බුද්ධ
112 මන්ත්‍රයයි කියනලදුයේ (ඒ අපටත්) "දුනමැනව" යි කී
යේය, "අපවෙස් දරන්නෙකුට දෙමු" යි කීයේය, මන්ත්‍ර
113 පිණිස ආචාර්‍ය්‍යයන්හා මවුපියන් පිළිවිස මේතෙමේ මාන
114 වකයන් තුන්සියයහා සමග ස්ථවිරයන්වහන්සේ සමීපයෙහි
පැවිදිව සුදුසු කාලයෙහි උපසම්පන්නවිය. ඒ උපාලිස්ථවිර
තෙම දාසකස්ථවිරයන් ප්‍රධානකොට ඇත්තාවූ රහතුන් දහ
115 සකට ත්‍රිපිටකය ඉගැන්වූසේක. යම්කෙනෙක් ඒ ස්ථවිර
යන්වහන්සේ සමීපයෙහි පිටකයන් උද්ග්‍රහණයකළෝද ඒ
ශ්‍රොතාපන්නාදී ශෛක්‍ෂ්‍යයන් හා පෘථග්ජනයෝ ගණනින්
ඉක්ම පැවැත්තාහුය.

116 කාසිජනපදයෙහි සොණකනම්වූ සාර්ථවාහ පුත්‍රයෙක්
විය, වෙළඳම් පිණිස මවුපියන්හා රජගහනුවරට ගියාවූ
117 පසළොස් හැවිරිදිවූ ඒ කුමාරතෙම, වේළුවනාරාමයට ගි
118 යේය. මානවකයන් පස්පණස්දෙනෙක් උහු පිරිවරා
ගියහ, එහි පිරිවර භික්‍ෂුසමූහයා සහිත දාසකනම් ස්ථවිර
යන් දැක ප්‍රසන්නව පැවිදිඉල්විය, ඒ ස්ථවිරයන්වහන්සේ
119 තොපගේ මවුපියන්ගෙන් විචාරවයි වදාළසේක. ඒ සොණ
කනම් කුමාරතෙම බත් තුනක් අනුභවනොකොට මවුපි
120 යන්ලවා ප්‍රව්‍රජ්‍යාවට අනුඥාකරවාගෙණ ආයේය. ඒ පිරිවර
කුමරුන් සමග දාසකස්ථවිරයන්වහන්සේ සමීපයෙහි පැවි
121 දිව උපසම්පද ලැබ ත්‍රිපිටකය උගත්තේය, ඒ සොණක
නම් යතිතෙම පිටකත්‍රය දන්නාවූ ක්ෂීණාශ්‍රවයන් දහසක්
ඇති දාසකස්ථවිර ශිෂ්‍යසමූහයාට ජ්‍යෙෂ්ඨවූයේය.

122 පාටලි නම් නගරයෙහි ප්‍රාඥවූ සිග්ගවනම් අමාත්‍ය පුත්‍ර
යෙක් වූයේය, අටළොස් හවුරුදුඇති හේතෙමේ සෘතුත්‍ර
123 යට යහපත්වූ ප්‍රාසාදත්‍රයෙහි වසන්නේ චණ්ඩවජ්ජී නම්වූ
යහළු අමාත්‍යපුත්‍රයා කැටිව ලාගෙණ, පුරුෂයන් පන්සිය
124 යක් විසින් පිරිවරණලදුයේ කුක්කුටාරාමයට ගොස් සමා
පත්තියට සමවැද වසනලද ඉන්ද්‍රියඇතිව වැඩහුන් සොණ

125 කාස්ථවිරයන් දුටුයේය, වැන්දකල කථානොකරනාවූ උන්
126 වහන්සේ එහි වැඩඋන් ඒ සඞ්ඝයා විචාළේය, සමාපත්තියට
සමවන්නෝ කථා නොකෙරෙත්යයි ඒ භික්ෂූහු වදාළහ; කෙ
127 සේනම් නැගිටිත්දැයි විචාරණලදුවූ භික්ෂූහු කථනයක
ළෝ "ශාස්තෘන්වහන්සේගේ කැඳවීමෙන්ද සඞ්ඝයාගේ
කැඳවීමෙන්ද කාලපරිච්ඡේදයවූ පරිද්දෙන්ද ආයුෂයාගේ
128 ක්ෂයවීම වසයෙන්ද, නැගිටිත්යයි කියා ඔවුන්ගේ හේතු
සම්පත් දැක සඞ්ඝයාගේ වචනයක් යැවූහ; ඒ ස්ථවිරතෙමෙ
129 නැගිට එහි වැඩියේක. කුමාරතෙම "වහන්ස කුමකැයි
කථානොකළසේක්දැ"යි විචාළේය. "අනුභව කටයුත්තක්
අනුභව කළමිහ"යි ස්ථවිරතෙම වදාළේය. අපටත් අනුභව
130 කරවූවමැනවයි කුමාරතෙම කීයේය, "අපවැනිවූ කල්හි
අනුභවකරවනු හැකිය"යි ස්ථවිරතෙම වදාළේය. ඉක්බිත්
131 තෙන් මවුපියන්ගේ අනුදැනීමෙන් ඒ සිග්ගව කුමාරතෙ
මේද, චණ්ඩවජ්ජී කුමාරතෙමේද, ඒ පන්සියයක් පුරුෂ
යෝද සොණකනම් ස්ථවිරයන්වහන්සේගේ සමීපයෙහි පැ
132 විදිව උපසම්පන්නාව ඒ දෙනම උපාධ්‍යායයන් සමීපයෙහිම
133 පිටකත්‍රයද උගත්හ, සුදුසුකාලයෙහි ෂඩ්අභිඥද ලැබූහ.
ඒ සිග්ගවනම් ස්ථවිරතෙම තිස්සකුමාරයන් පිළිසිඳීම දැන
134 එතැන් පටන් සත්හවුරුද්දක් ඒ ගෙට එළඹියේය. යවයි
යන වචනමාත්‍රයකුත් සත්හවුරුද්දක් නොලද්දේය, අටවෙ
නි හවුරුද්දෙහි (අත්තැනකට) යව යන වචනයක් එතැන
135 දී ලද්දේය. ගෙට යනනාවූ මොග්ගලිනම් බමුණුතෙම නික්
මයනනාවූ උන්වහන්සේ දැක අපගේ ගෙයිදී කිසිදෙයක්
136 ලද්දේදැයි විචාළේ. සෙතෙම එසේයයි කීයේය. (ඒ බ්‍රාහ්ම
ණතෙම) ගෙට ගොස් විචාරා දැන් දෙවෙනි දවස්හි ගෙට
පැමිනි ස්ථවිරයන්වහන්සේට මුසාවාදයෙන් නිග්‍රහකෙ
137 ළේය. (වචන මාත්‍රයක් ලැබීම සඳහා ලද්දේයයි කියන
ලදුවූ ඒ) ස්ථවිරයන්වහන්සේගේ බස්අසා ප්‍රසන්නාවූ ඒ
138 බමුණුතෙම තමන්ට කරණලද බතින් උන්වහන්සේට
නිති බතක් පැවැත්වූයේය. ක්‍රමයෙන් ඒ ගෙයිවැසි සියලුම
මනුෂ්‍යයෝ උන්වහන්සේට ප්‍රසන්නවූහ, බ්‍රාහ්මණතෙම
උන්වහන්සේ ගෙයි වැඩහිඳුවා සැමදම වැලඳවූයේය.
139 මෙසේ ක්‍රමයෙන් කල්ගෙවෙන කල්හි ත්‍රිවේද නැමැති ස
මුද්‍ර පරතෙර පැමිනි ඒ තිස්සකුමාරතෙම සොළොස් හැවිරිදි
140 වයස් ඇතිවූයේය. ස්ථවිරතෙම (මෙසේ මේ ගෙහි) කථාහට
ගැණීමක් වන්නේයයි සිතා (එක් දවසක්) බ්‍රාහ්මණ මාන
වකයාගේ ආසනය හැර (අන්‍යවූ) ආසනයන් අතුරුදහන්

141 කළේය. ඒ බ්‍රාහ්මණ මානවකතෙම බඹලොවින් ආයෙ
සිත්ද පවිත්‍ර කැමැත්තේය. එහෙයින් ඔහු හිඳිනා පයඹ
142 ඩකයතෙම වස්ත්‍රයෙන් වසා එල්වාතබනුලැබේ. ස්ථවිර
යන්වහන්සේ වැඩසිටිකල්හි අනෘවූ ආසනයක් නොදකි
මින් සම්භ්‍රම සහිතවූ ගෙයිවැසි ජනතෙම ඒ බ්‍රාහ්මණ මාන
වකයාගේ ආසනය තෙරුන්වහන්සේට පැණවූයේය.
143 මානවකතෙම ආචාර්යයන් සමීපයෙන් දවුත් එහි උනනාවූ
144 තෙරුන්වහන්සේ දැක කිපී පරුෂවචන කීයේය. ස්ථවිර
තෙම "මානවකය කිමෙක මන්ත්‍ර දන්නෙහිදැ" යි ඔහුට කී
සේක, මානවකතෙම එම ප්‍රශ්නය ස්ථවිරයන්වහන්සේට
145 ප්‍රත්‍යාරෝපණය කෙළේය. ස්ථවිරයන්වහන්සේ "මන්ත්‍රදනි
මැ"යි ප්‍රතිඥකළකල්හි ඒ මානවකතෙම ස්ථවිරයන්වහන්
146 සේගෙන් වෙදයෙහි ග්‍රන්ථිස්ථානයන් විචාළේය; ඉක්බිත්
තෙන් ස්ථවිරතෙම ඔහුට (ඒ ප්‍රශ්නයන්) විසඳා වදාළසේක,
ඒ ස්ථවිරතෙම (පූර්වයෙහි) ගෘහස්ථවූයේම වෙදයෙහි පාර
ප්‍රාප්තවූයේය, ප්‍රතිසම්භිදාප්‍රාප්තවූයේ ඔහුට කිමෙ
කැයි ප්‍රකාශනෙ කරන්නේද? නිහීයවූ ස්ථවිරතෙතෙමේද
(මානවකය තාවිසින් බොහෝ ප්‍රශ්නයන් පිළිවිසිනලදේවී
මමද එකක් තා පිළිවිසින්නෙම්දැයි කියා පිළිවිසිනු මානවයි
147 ප්‍රතිඥදුන්කල්හි) "යමෙකුගේ චිත්තයක් උපදීද නිරුඩ
නොවේද ඔහුගේ චිත්තය(මතු) නිරුඩවන්නේය, නුපදනේ
ය. යමෙකුගේ චිත්තයක් යෝ වනාහි මතු නිරුඩවන්නේද
නූපදනේද ඔහුගේ චිත්තය උපදනේය නිරුඩනොවේයි"
148 යන ඒ චිත්තයමකයෙහි ප්‍රශ්නය විශාරද ස්ථවිරතෙමේ (මා
නවකයා) විචාළසේක. ඒ ප්‍රශ්නයතෙම උහුට අන්ධකාර
149 යක්මෙන් වූයේය, හෙතෙම "මහණ මේ කවරනම් මන්ත්‍ර
යෙක්දැ"යි ඒ තෙරුන්වහන්සේට කීයේය. ඒ ස්ථවිරතෙම
"බුඩමන්ත්‍රය"යි වදාළේය. මටද (මන්ත්‍රය) දෙවයි" කී
කල්හි "එය අපගේ වෙස් දරන්නෙකුට දෙමු"යි වදාළ
130 සේක. ඒ මානවකතෙම මන්ත්‍ර පිණිස මවුපියන් විසින්
අනුදන්නාලද්දේ පැවිදිවූයේය. ස්ථවිරතෙම (ඒ මානවක
යා) පැවිදිකොට සුදුසු පරිදෙන් කමටහන් දුන්සේක.
151 මහාප්‍රඥඇත්තේ භාවනාවෙහි යෙදෙමින් නොබෝකල
කින් සොවාන්පලයට පැමිණියේය, ඒ සිග්ගවනම් ස්ථවිර
152 තෙම එසේ සෝවාන්පලයට පැමිණිබැව් දැන චණ්ඩවජ්ජී
නම් ස්ථවිරයන්වහන්සේ වෙත සූත්‍රාභිධර්මයන් උද්‍රහ
153 ණය පිණිස යැවූයේය, උන්වහන්සේ එහිදී ඒ ඉගැන්ම
කළසේක, ඉක්බිත්තෙන් ඒ තිස්සනම් ලදරුභික්ෂුතෙම

154 විදර්ශනාභාවනාව ආරම්භකොට, සුදුසු කාලයෙහි ෂඩභිඥ
වෙන් යුක්තවූ අර්හත්වූයේක. ස්ථවිර භාවයටද ප්‍රාප්තවූ
155 යේක. ඒ ස්ථවිරතෙම චන්ද්‍රයාසෙයින්ද සූර්ය්‍යයාසෙයින්ද අති
ශයින් ප්‍රකටවූයේය. ලෝවැසිතෙම උන්වහන්සේගේ වච
නය සර්වඥයන් වහන්සේගේ වචනයමෙන් සැලකූ
යේය.——මොග්ගලිපුත්තනම් ස්ථවිරයන්වහන්සේගේ පහ
ළවීම මෙසේයි.

එක් දිනක් උපරජතෙමේ මුවදඩගියේ වනයෙහි කෙ
156 ළෙනා මුවන් දුටුයේය. ඒ දැක "වනයෙහි තණපත් ගොදු
රුකොට ඇත්තාවූ මුවෝපවා මෙසේ ක්‍රීඩා කෙරෙති. ති
157 මෙක සැපවූ ආහාරවිහරණ ඇත්තාවූ භික්ෂූහු ක්‍රීඩා නොකෙ
රෙද්ද"යි මෙසේ සිතුයේය. ඒ (යුවරජතෙම) ගෙටගියේ
තමන් සිතිවිලල රජහට දැන්වූයේය. ඔහට හඟවන පිණිස
158 ඒ රජතෙම සත්දවසකට රාජ්‍යය දුන්නේය "එම්බා කුමා
රය තෝ මේ රාජ්‍යය සත්දවසක් අනුභවකරව ඉන්මතු
159 තා මරවන්නෙමි" යන මේ වචනයද රජතෙම කීයේය.
සත්දවස ඉක්මුනකල්හි (වැහැරුණුවූ යුවරජහු දැක "තෝ
කුමකින් කෘශවූයෙහිද"යි රජතෙම කීයේය. "මරණ
160 හේතුවෙන්වන්නාවූ භයකරණකොට ගෙණය"යි කීකල්
හි ඔහට රජතෙම නැවත (කියන්නේ) "මම සත්දින
161 කින් මැරෙන්නෙමැයි සිතා තෝ ක්‍රීඩා නොකෙළෙහිය,
දරුව හැමකල්හි මරණසංඥා ඇත්තාවූ මේ භික්ෂූහු කෙ
සේ ක්‍රීඩා කෙරෙද්ද"යි කීයේය. මෙසේ සහෝදරයා විසින්
කියනලද්දාවූද හෙතෙම බුද්ධශාසනයෙහි ප්‍රසන්නවූයේය.

162 ඒ ප්‍රාඥවූ යුවරජතෙම කලෙක මුවදඩගොස් වෘක්ෂමූල
යෙහි හුන්නාවූ සල්අත්තකින් ඇතෙකුවිසින් පවන්සලනු
163 ලබන්නාවූ සත්පුන්වූ මහාධම්මරක්ඛිත නම් රහත්තෙරුන්
දැක "මේ ස්ථවිරයන්වහන්සේ මෙන් මමද බුද්ධශාසනයෙහි
164 පැවිදිව කවරකලෙක වනයෙහි වෙසෙම්ද"යි සිතුයේය, ස්ථ
විරතෙම ඔහුගේ ප්‍රසාද පිණිස උඩනැඟී අහසින් ගොස්
165 අශෝකාරාමයබද පොකුණුදියම්තුයෙහි සිටියේක්, උතුම්වූ
166 සිවුරු අහස තබා පොකුණට බැස ජලයෙන් ශරීරපරි
ශෝධනය කළයේක. උපරජතෙම ඒ සෘද්ධිය දැක අතිශයින්ම
167 පැහැද නුවනැත්තේ "අදම පැවිදිවෙමි"යි බුද්ධියක්ද
කෙළේ (මහ) රජනත්සහ එළඹ ආදරසහිතවූයේ පැවිදි
168 පිණිස යාච්ඤාකෙළේය. මහීපතිතෙම වළක්වනු නො
හැක්කේ ඔහු ගෙණ මහපිරිවරින් තෙමේම විහාරයට
ගියේය.

169 හෙතෙම මහාධම්මරක්ඛිතනම් ස්ථවිරයන්වහන්සේ සමී
පයෙහි පැවිදිවූයේය, උහුහා සමග සාරලක්ෂයක් මනුෂ්‍ය
170 යෝද පැවිදිවූහ. උහු අනුව පැවිදිවූවන්ගේ ගණනෙක්ද
නොමැත්තේය. අග්ගිබ්‍රහ්මයයි ප්‍රසිද්ධවූ රජහුගේ බෑණ
171 නුවෝ රජහුගේ දියනිවූ ඒ සඞ්ඝමිත්තාවගේ ස්වාමිපුරු
ෂයා වූයේය, ඔහුගේ පුත්‍රතෙමේද නාමයෙන් සුමන නම්
ඇතිවූයේය, හෙතෙමේද රජහට යාච්ඤාකොට යුවරජුහා
172 පැවිදිවූයේය, මහජනයාගේ වැඩසිදුවීම ඇත්තාවූ ඒ උප
රජහුගේ පැවිදිවීම තොමෝ ඒ අශෝක මහරජහුගේ (රා
173 ජ්‍යාභිෂෙකයෙන්) සතරවෙනි හවුරුදුයෙහි විය, එහිම
උපසපන්වූ උපනිශ්‍රය සම්පන්නාවූ ඒ යුවරජතෙම විදර්ශ
වඩන්නේ ෂඩ්අභිඥා සහිත රහත්පලයට පැමිණියේය.
174 සියලු පුරයන්හි ආරම්භකරණලද්දාවූ ඒ මනහරවූ විහා
රයන් තුන්හවුරුද්දකින් මනාකොට නිමදූහ. කර්මාධි
175 ෂ්ඨායකවූ ඉන්ද්‍රගුප්තනම් ස්ථවිරයන්වහන්සේගේ සෘද්ධිබලය
කාරණකොටගෙණ අශෝකාරාම නම් විහාරයද වහා නිම
176 විය. මහීපාලතෙමේ සර්වඥයන්වහන්සේ විසින් පරිභොග
කරණලද ඒ ඒ තන්හිද සිත්කලුවූ චෛත්‍ය කරවූයේය
177 "විහාරයෝ නිමවනලද්දාහුය"යි හසුනපත් හාත්පසින්
සුවාසූ දහසක් නුවරින් එකදිනම ගෙණවාහුය. මහත්
178 තේජස් ඍද්ධිවික්‍රම ඇත්තාවූ මහරජතෙම පත්හසුන් අසා
සියලු ආරාමයන් සඳහාවූ මහපූජාව එකවරම කරණු
179 කැමැත්තේ "මෙසිත් සත්වන දවස්හි සියලු දෙසයන්හි
සියලු ආරාමපූජාව එකවිට වේවා මිහිතෙලෙහි යොදුනක්
180 යොදුනක් තන්හි මහදන් දෙත්වා ග්‍රාමාරාමයන්ගේද
181 මාර්ගයන්ගේද සැරසිලිකෙරෙත්වා සියලු විහාරයන්හිද
භික්ෂුසඞ්ඝයාට සර්වප්‍රකාරයෙන් ශක්තිවූපරිද්දෙන් මහදන්
182 පවත්වත්වා, පහන්මාලා මල්මාලා අලඞ්කාරයෙන්ද ඒ ඒ
183 තන්හි සියලු තූර්‍ය්‍යයෙන්ද නොයෙක් පරිද්දෙන් පූජා ප
වත්වත්වා සියල්ලෝ පෙහෙවස් අහයන් ඉවාගෙණ ධර්ම
184 යද අසත්වා එදවස්හිද නොයෙක් පූජාවිශෙෂයන්ද කෙ
රෙත්ව"යි පුරයෙහි බෙරහැසිරවූයේය. සියල්ලෝ සැම
185 තැනම සර්වප්‍රකාරයෙන් ආඥාකල පමණටත් වැඩිවූද දෙව්
ලොව සැණකෙළිසෙයින් මනරම්වූ පූජාවන් පිළියෙල
කළහ.
186 එදවස ඇතොවුරන් සහිතවූ ඇමැතියන් සහිතවූ ඇත්
අස් ආදි සෙන්රැස් විසින් පිරිවරණලද සර්වාබරණින් සැර
187 සුනු මහරජතෙම මිහිතල බිඳිනසේ ස්වකීයාරාමයට පැමි

Digitized by Google

නියේ උත්තම සඞ්ඝයා වැද සගමැද සිටියේය. ඒ සමා
188 ගමයෙහි අසූකෙළක් භික්ෂූහු වූහ, උන්වහන්සේලා අතු
රෙහි අභීන් භික්ෂූහු ලක්ෂයක් වූහ. එහි අතුලක්ෂයක් භික්ෂු
189 ණීහු ඇතිවූහ, ඔවුන් අතුරෙහි රහත් මෙහෙණින්නෝ
190 දහසක්වූහ. ඒ රහතුන් වහන්සේලා ධර්මාශෝක රජහුගේ
ප්‍රසාදය පිණිස ලෝකවිවරණ නම් ප්‍රාතිහාර්ය්‍යයක් කළහ.
(ඒ රජතෙම) පාපකර්මය කාරණකොටගෙණ පූර්වයෙහි
191 චණ්ඩාශෝකයයි ප්‍රකටවූයේය, පසුව පුණ්‍යකර්ම බලයෙන්
ධර්මාශෝකයයි ප්‍රකටවූයේය. ඒ රජතෙම මුහුද කෙළවර
192 කොට ඇති දඹදිව හාත්පසින්ද නානා පූජායෙන් අලඞ්කෘ
තවූ සියලු විහාරයන්ද දුටුයේය. ඒ විහාරයන් දැක අතිශයෙ
193 න්ම සතුටුව හිඳ "වහන්ස බුඩශාසනයෙහි කාගේ පරිත්‍යා
ගයෙක් මහත්දැ"යි සඞ්ඝයා විචාළේය, ඒ මොග්ගලිපුත්ත
194 නම් ස්ථවිරතෙම "සර්වඥයන්වහන්සේ ජීවමාන කාලයෙ
හිද තොපහා සමවූ ත්‍යාගවන්තයෙක් නැත්තේය"යි රජ
හුගේ ප්‍රශ්නය විසඳා වදාළේය. එබස් අසා සතුටුවූ රජතෙම
මත්තෙහිද "මා වැන්නෙක් බුඩශාසනයෙහි නෑයෙක් වේ
195 දැ"යි නැවතත් ඒ ස්ථවිරයන් විචාළේය. ශාසනභාරධාරීවූ
ඒ ස්ථවිරතෙම මහිඳුනම්වූ රාජපුත්‍රයාණන්ද එසේම සඞ්ඝ
196 මිත්‍රානම්වූ රජදුවගේද හේතුසම්පත් බලා "එබඳුවූ මහා
197 පරිත්‍යාග ඇත්තෙක්ද ශාසනයාගේ දායාදයෙක් නොවන්
198 නේය, නරේන්ද්‍රය හෙතෙම ප්‍රත්‍යය දායකයයි කියනු ලබන්
නේය, යමෙක්තෙම වනාහි පුතෙක් හෝ දුවක් හෝ සස්
199 නෙහි පැවිදිකරවාද හෙතෙම ශාසනයට දායාදවන්නේය
හුදෙක් දායකම නොවන්නේය"යි රජහට ප්‍රතිවචන වදා
200 ළේය. ඉක්බිත්තෙන් ශාසන දායාදභාවය පතනනාවූ භූමි
පතිතෙම "කිමෙක දරුවෙනි පැවිදිවනාහුද ප්‍රව්‍රජ්‍යා
තොමෝ මහත්යයි දන්නාලදැ"යි එහි සිටියාවූ මිහිඳුකුමරුද
සම්මිත් කුමරියද විචාළේය.

201 පියානන් බස් අසා ඔව්හු "දෙවයන්වහන්ස ඉදින්
202 ඔබ කැමැතිසේක් නම් අදම පැවිදිවන්නෙමු පැවිද්
දෙන් අපටද තුඹවහන්සේටද ලාභය"යි පියරජානන්ට
කිවූය. ඒ මහිඳු කුමාරතෙම යුවරජහු පැවිදිවූකල් පටන්ද
203 ඒ සම්මිත් කුමරිතොමෝ අග්නිබ්‍රහ්ම කුමාරයා පැදිවිවූ කල්
පටන්ද පැවිදිවීම පිණිස කරණලද නිශ්චය ඇතිවූහ. මහී
204 පතිතෙමේ උපරජ තනතුර මිහිඳු කුමරුහට දෙනුකැමැත්
තේද ඊටත්වඩා (පැවිද්දෙහි) අධිකවූ ආසායයි ප්‍රව්‍රජ්‍යාවටම
205 රුචිකෙළේය. ශූනරූප බලයෙන් ප්‍රකටවූ මහෙන්ද්‍රනම්වූ

ප්‍රිය පුත්‍රයාද සඞ්ඝමිත්‍රා නම් දියණියන්ද පූජාසහිතකොට පැවි
දි කරවූයේය. එකල ඒ මිහිඳු නම්වූ රජකුමරතෙමේ විසිවයස්
206 ඇතිද්දයේය, සඞ්ඝමිත්තා නම්වූ රජදුතොමෝ අටළොස් හැවි
රිදි වයස්ඇතිවිය, ඒ කුමාරයාහට ප්‍රව්‍රජ්‍යාවද උපසම්පදාවද
207 එදවසම දුන්නේය, ඒ රජදුවටද ප්‍රව්‍රජ්‍යාව හා ශික්ෂාපදනය
එදවස්හි විය, මොග්ගලිපුත්තතිස්ස නාම ස්ථවිරතෙම මිහිඳු
208 කුමරහට උපාධ්‍යාය වූයේය, මහාදෙව නම් ස්ථවිරතෙම
පැවිදිකරවූයේය, මජ්ඣන්තික නම්වූ ස්ථවිරතෙම වනාහි
209 කර්මවාක්‍ය කථනයකෙළේය. ඒ ස්ථවිරයවූ උපසම්පදා මණ්ඩ
ලයෙහි ඒ මහින්ද යතිතෙම සිවුපිළිසිඹියා සහිතවූ අර්හත්
ඵලයට පැමිණියේය, ධර්මපාලායයි ප්‍රසිද්ධවූ මෙහෙණි තො
210 මෝ සඞ්ඝමිත්‍රා නම් කුමාරිකාවට උපාධ්‍යායවිය, ආයුපාලී
නම් මෙහෙණිතොමෝ ආචාර්‍ය්‍යාවිය; හෙතොමෝ සුදුසු කාල
යෙහි රහත්විය. ශාසනයට පහන්වූ ලඞ්කාවිපයට උප
211 කාරීවූ ඒ දෙදෙන ධර්මාශෝක නම් මහරජහුගේ
සවෙනි වර්ෂයෙහි පැවිදිද්දහ. ලඞ්කාවීප ප්‍රසාදකවූ මහා
212 මහෙන්ද යතිතෙම උපාධ්‍යායන්ගේ සමීපයෙහි තුන්හවු
රුද්දකින් පිටකත්‍රය උගත්තේය, චන්ද්‍රරේඛාවක් වැනිවූ ඒ
213 මෙහෙණිතොමෝද සූර්‍ය්‍යා සමානවූ මහෙන්ද්‍ර භික්ෂුතෙමේද
යන ඒ දෙදෙන ඒකාලයෙහි නිරන්තරයෙන් සර්වඥ ශාස
214 නනැමැති ආකාශය ශෝභමාන කළහ.

පූර්වයෙහි පැළලුප්තුවරින් නික්ම වනයෙහි හැසිරෙ
නනාවූ වනචර පුරුෂයෙක්තෙම කුන්ත කින්නරියක් සමග
සංවාසය කළේය. හෙතොමෝ උහුහා සංවාසයට පැමිණ
215 පුතුන් දෙදෙනෙක් ඉපිදවීය. දෙටුතෙමේ තිස්ස නම්
ඇතිවිය, කණිටුතෙමේ සුමිත්ත නම්විය. සුදුසු කාලයෙහි
මහාවරුණ නම් ස්ථවිරයන්ගේ සමීපයෙහි පැවිදිව, දෙ
216 දෙනම ෂඩභිඥ ගුණඇත්තාවූ අර්හත්භාවයට පැමිණියහ.
වැඩිමහල් තිස්ස ස්ථවිරතෙම පාදයෙහි ගොඩුසු විෂය
217 කින් ස්පර්ශ කරණලද්දේ වේදනා සහිතවූයේය. කණිටුවූ
සුමිත්‍ර ස්ථවිරයන් විසින් විචාරණලදුවූ ස්ථවිරතෙම ගිතෙල්
218 පතක් බෙහෙත (ලැබිය යුතුයයි) කීයේය. ඒ ස්ථවිරතෙම
ගිලන්වතින් නමුත් රජහට දන්වීමද, පස්වරු වේලෙහි
219 ගිතෙල් පිණ්ඩ හැසිරීමද ප්‍රතික්ෂේප කළසේක. "ඉදින්
තෙපි පිඩු පිණ්ඩ හැසිරෙමින් ගිතෙල් ලබන්නාහුනම්
ඒ ගෙණව"යි තිස්ස නම් ස්ථවිරතෙම සුමිත්තා නම් උතුම්
ස්ථවිරයන්වහන්සේට කීසේක. පිඩු පිණ්ඩ හැසිරෙන්නාවූ
220 උන්වහන්සේ විසින් ගිතෙල් පතක් නොලද්දේය; සව

ගත් රෝගයතෙම ගිතෙල්කලසියයකින් හෝ සාධ්‍යනො
කටහැකිවිය. ස්ථවිරතෙම එම රෝගයෙන්ම ආයුසයාගේ
221 අන්තයට පැමිනියේ අප්‍රමාදවවාදයෙන් (භික්ෂුසඞ්ඝයාට)
අවවාදකොට පිරිනිවන් පානට සිතුයේක. ඒ ස්ථවිරතෙම
222 ආකාශයෙහි හිඳ, තේජෝධාතු වසයෙන් රුචිවූ පරිද්දෙන්
ශරීරය අධිෂ්ඨානකොට තබා පිරිනිවියේය. ශරීරයෙන්
223 අග්නිජ්වාලාවෝ නික්ම මාංස භස්මරහිතකොට ස්ථවිර
යන්ගේ සකල දේහය දැවූහ, මහිපතිතෙම මේ තිස්ස
224 නම් ස්ථවිරයන්ගේ පරිනිර්වාණය අසා ජනසමූහයා විසින්
පිරිවරණලද්දේ සඞ්ඝියවූ අශෝකාරාමයට ගියේය. ඇත්
කඳ මත්තට පැමිනි රජතෙම ඒ අස්ථිධාතූන් අහසින් පහ
225 කොට බැස්විය. ධාතුසත්කාරකොට "ඒ (මරණ හේතුවූ)
රෝගය කිමෙක්ද"යි සඞ්ඝයා විචාළේය. ඒ අසා හටගත්
226 සංවේගඇත්තේ හතරවර (සතර) දොර පුණුවම්න් කරණලද
පොකුණු බෙහෙදින් පුරවා "භික්ෂුසඞ්ඝයාට බෙහෙත් දුලී
භනොවේවා"යි දවසක් දවසක් පාසා භික්ෂුසඞ්ඝයාට බෙ
227 හෙත් පැමිනවූයේය. සුමිත්‍රනම් ස්ථවිරතෙම සක්මන් මළු
වෙහි සක්මන්කරන්නේම පිරිනිවියේක, ඒ කරණකොට
228 සෙණද මහජනතෙම සස්නෙහි බෙහෙවින් පැහැදිවූයේය,
ඒ ලොකහිතකාරීවූ කුන්තාපුත්‍ර ස්ථවිර දෙදෙනාවහන්සේ
229 ධර්මාශෝක රජහුගේ (රාජ්‍යයෙහි) අටවෙනි වර්ෂයෙහි පිරි
නිවන් පෑවාහුය, පසුව ප්‍රසන්නවූ ජනයෝද යම් හෙයකින්
230 ලාභ පැවැත්වූද, එහෙයින් එතැන්පටන් සඞ්ඝයාට ලාභ
ඉතා මහත්විය.

ලාභසත්කාර හීනවූ තීර්ථකයෝ ලාභහෙතුවෙන් තමන්
231 ම සිවුරු දරාගෙණ භික්ෂූන් සමග විසූහ, ඔව්හු යම්සේ ස්ව
කීය වාදයද බුඩවාදයයි ප්‍රකාශකළාහුද, යම්සේ ස්වකීයවූ
ශාසනයෙන් බාහිරවූ අග්නිහෝමාදි ක්‍රියාවන් රුචිවූ පරිද්
232 දෙන් කලාහුද එසේ හෙයින් ස්ථිරවූ ගුණ ප්‍රකාශඇත්තාවූ
මොග්ගලිපුත්ත නම්වූ ඒ ස්ථවිරතෙම ඒ උපන් ඉතා කර්ක
233 ශවූ ශාසනාර්බුදය දැක, දීර්ඝදර්ශීවූයේ ඒ ශාසනාර්බුදයාගේ
234 ව්‍යුපශමනයෙහි කාලය බලාවදාරා, ස්වකීයවූ මහා භික්ෂු
සඞ්ඝයා මහෙන්ද්‍රස්ථවිරයන්වහන්සේට පාවාදී, ගඟානම්
235 නදියෙහි ඌර්ධ්වභාගයෙහිවූ අහෝගඟනම් පර්වතයෙහි
විවෙක කැමැතිවෙමින් සත්හවුරුද්දක් විසූයේය, තීර්ථක
236 යන් බහුලබැවින්ද දුර්වචබැවින්ද ඔවුන් දැහැමින් වලක්
වන්නට භික්ෂූහු නොහැකිවූහූ. එහෙයින්ම දඹදිව සියලු
237 ආරාමයන්හි භික්ෂූහු සත්හවුරුද්දක් පොහෝ පවුරුණු

Digitized by Google

238 නොකළහ. මහා යසස්ඇති ධම්මාශෝක මහරජතෙම ඒ
අසා "තෝ ගොස් මේ අධිකරණය සංසිඳුවා මාගේ ආරාම
යෙහි භික්ෂුසඞ්ඝයාලවා පොහොය කරවව" යි කියා එක්
239 ඇමැතියෙකු උතුම් අශෝකාරාමයට යැවූයේය. ඒ නුවණ
මද ඇමැතිතෙම ගොස් භික්ෂුසඞ්ඝයා රැස්කරවා "පොහෝ
240 කරව්" යයි රජහුගේ හස්න ඇස්විය. අපි "තීර්ථකයන්හා
සමග පොහෝ නොකරම්හ" යි භික්ෂු සඞ්ඝතෙම ඒ මූඪ
241 චිත්තාචිතවූ ඇමැතියාහට කීය. ඒ අමාත්‍යතෙම් පො
හොය කරවම්හයි පිළිවෙළින් තෙර කීපදෙනෙකුන්ගේ
242 හිස්කපා හෙළූයේය, රජහුගේ සොහොයුරුවූ තිස්සනම්
ස්ථවිරතෙම ඒ ක්‍රියාව දැක වහා අවුත් ඔහට ආසන්නවූ
අස්නෙක හුන්නේය. ඒ ඇමැතිතෙම තෙරුන් දැක ගොස්
රජහට දැන්වූයේය.

243 ඒ සියලු පවත් අසා සවගත් දහඇති රජතෙමේ හසින්
244 චකිත සිත්ඇත්තේ වහා ගොස් "මෙසේ කරණලද කර්මය
245 කරණකොටගෙණ කවරෙකුට පාපය වේදැ" යි භික්ෂුසඞ්ඝ
යා පිළිවිසියේය. ඒ භික්ෂූන් අතුරෙන් කිසිකෙනෙක් "පාපය
තොපටය" සිද කිසිකෙනෙක් වනාහි "තොප දෙදෙනාට
246 මය" යිද කීහු. පණ්ඩිතයෝවනාහි "පාපය තොපට නැ
තැ" යි කීහු. මහරජතෙම ඒ අසා "මාගේ විමතිය ජය
කොට ශාසනය යථාස්ථානයෙහි තබන්නට පොහොසත්
247 ශ්‍රමණකෙනෙක් ඇත්තේදැ" යි කීයේය. "මහරජතෙනි
ඒ මොග්ගලිපුත්තතිස්ස තෙරුන්වහන්සේ ඇත්තේය" යි
248 සඞ්ඝතෙම රජහට වදාළේය. රජතෙම උන්වහන්සේ කෙ
249 රෙහි ආදරසහිතවූයේය. වෙන්වසයෙන් භික්ෂූන් දහස දහ
සින් පිරිවරණලද්දාවූ ස්ථවිර සතරනමක්ද, එසේම මිනිස්සු
යන් දහස දහසින් පිරිවරණ ලද්දාවූ අමාත්‍යයන් සතරදෙ
250 නෙක්ද ඒ රජතෙම එදවසම තමන් වචනයෙන් තෙරුන්
වහන්සේ කැඳවන්නට යැවූයේය. ඔවුන් විසින් එසේ කිය
නලද්දාවූ ඒ ස්ථවිරතෙම නොවැඩියේක. ඒ අසා නැවත
251 පෙරපරිද්දෙන් ස්ථවිර අටනමක්ද වෙන්වසයෙන් දහස්
පුරුෂයන් පිරිවරකොට ඇත්තාවූ අමාත්‍යයන් අටදෙනෙ
ක්ද යැවූයේය, ඒ ස්ථවිරතෙම නොවැඩියේක, "කෙසේ
252 ස්ථවිරයන්වහන්සේ වඩනේද්දෝ" යි රජතෙම කීයේය.
භික්ෂූහු "මහරජ 'ස්වාමීන්වහන්ස ශාසනය උසුලාගන්නට
253 උපස්තම්භ වෙව' යි කියනලද්දේනම් ඒ ස්ථවිරතෙම වඩ
නේය" යි ඒ ස්ථවිරයන්වහන්සේගේ ආගමන කාරණය
කීහු. රජතෙම නැවතද වෙන්වසයෙන් දහස දහස පිරි

254 වරණාට ඇත්තාවූ ස්ථවිරයන් සොළොස් නමක්හා අමා
255 ත්‍යයන් සොළසක්ද ඒසේ තියා යැද්ද. මංගලබැව්හි සිටියා
වූද තෙරුන්වහන්සේ යානාවකට නොනැගින්නේයයි
(අසා) "තෙරුන්වහන්සේ නැවකින් ගඟෙහි ගෙණඑව්
ය" සිද කීයේය. ඔව්හු ගොස් (තෙරුන්වහන්සේට) එසේ
කිය, උන්වහන්සේ ඒ ඇසූ කෙණෙහිම නැගිටවදාළේය.
256 නැවකින් තෙරුන්වහන්සේ ගෙණවාහුය, රජතෙම එහි
257 පෙරගමන් කෙළේය, රජතෙම දනක් පමණ දියට බැස
ගෞරව ඇත්තේ නැවින් බස්නා තෙරුන්වහන්සේට දකු
ණුඅත දුන්නේය. රජහට අනුකම්පාකාරීවූ දක්ෂිණහීවූ ඒ
258 ස්ථවිරතෙම රජහට අනුකම්පාවෙන් ඒ දකුණුඅත අල්වා
ගෙණ නැවින් බටුයේය. පෘථිවීශ්වරවූ රජතෙම අලය
වඩනනාවූ උයනට තෙරුන්වහන්සේ පමුනුවා තෙරුන්
259 වහන්සේගේ පාදයන් ධොවනයකොට තෙල්ගල්වා හිඳ
260 ගෙණ ස්ථවිරයන්වහන්සේගේ සමීපතාවය විමසන්නේ
"වහන්ස මම ප්‍රෙළහරක් දකිනු කැමැත්තෙමි" යි කීයේය.
261 "කිමෙක්දැ"යි වදාළකල්හි "පෘථිවිකම්පාවක් (දකිනු කැමැත්
තෙමි)" යි කීයේය. "සර්වපෘථිවියගේ කම්පාවෙක්ද ප්‍රදෙශ
පෘථිවියක්හුගේ කම්පාවෙක් දකිනු කැමැත්තෙහිදැ" යි නැ
262 වතත් තෙරුන්වහන්සේ වදාළේය "එයින් කවරෙක් දුෂ්ක
රදැ" යි විචාර එකදෙශ පෘථිවිහුගේ කම්පාව දුෂ්කරයයි අසා
එය දකිනු කැමැතිබව සැලකෙළේය. ස්ථවිරතෙම යොදු
263 නක් ඉම අතර සතරදිග රථයක, අශ්වයෙක, මිනුෂ්‍යයෙ
ක, දියපිරූ තලියෙක, යන මොවුන් තබ්බවා, ඔවුන්ගේ
264 (ඉම ඇතුළට පත්) අවයවයන් සමග ඒ යොදුනක් පමණ
පොළොව සෘධියෙන් කම්පාකෙළේය, එහි උන් රජහටද
දක්වූයේය. ඒ ඇමැතියා විසින් භික්ෂූන් මැරීමෙන් තම
265 හටද පාපය ඇති නැති බැව් මහරජතෙම ස්ථවිරයන් විචා
ළේය. කිලුටුසිතින් වෙන්ව ඒනිසාවන කර්මයෙක් නැතැයි
266 තිත්තිරජාතකය වදාරා ස්ථවිරතෙම රජහට අවබොධ කර
විය. එහි සිත්කලුවූ රජ උයනෙහි සත්දවසක් වසන්නේ
267 යහපත්වූ සර්වඥගම රජහට ඉගැන්වූයේය. රජතෙම එම
268 සත්දවසෙහි යක්ෂයින් දෙදෙනෙකු යවා පොළෝ තෙලෙහි
සියලු භික්ෂූන් එක්තැන්හි රැස්කරවූයේය. සත්වන දවස්හි
සිත්කලුවූ සිය අරමට පැමිණ නිරවශෙෂ වශයෙන් භික්ෂු
සඞ්ඝයා රැස්කරවූයේය.

269 ස්ථවිරයන්වහන්සේ සමග තිරයතුළ එක් තැනෙක හුන්
270 නාවූ මහීපතිතෙම, එක එකා ලබ්ධිඇත්තාවූ භික්ෂූන් සම්

Digitized by Google

පයට කැඳවාගෙණ, "වහන්ස සර්‍වඥයන්වහන්සේ කීනම්
271 වාද ඇත්තේදැ"යි විචාළේය, ඔව්හු ස්වකීයවූ පරිද්දෙන්
ශාශ්වතාදි දෘෂ්ටි ප්‍රකාශකළෝය. ඒ සියලු මිථ්‍යාදෘෂ්ටිකයන්
රජතෙම සිවුරු හැරවූයේය.
272 සිවුරු හරවනලද සියල්ලෝ සැටදහසක් වූහ. "සුගත
තෙම කීනම් වාදඇත්තේදැ" යි ධාර්ම්මික භික්ෂූන් විචාළේය.
273 විභජ්ජවාදීභාවය උන්වහන්සේලා කීහු, මහීපතිතෙම "ව
හන්ස සර්‍වඥතෙම විභජ්ජවාදීදැ"යි ස්ථවිරයන් විචාළේය
274 ඒ ස්ථවිරතෙම "එසේය" යි වදාළේය. එකල්හි ඒ අසා සතුටු
සිත් ඇත්තාවූ රජතෙම, "යම් හෙයකින් සඞ්ඝතෙම ශෝ
ධිතද එහෙයින් වහන්ස සඞ්ඝතෙම පොහෝ කෙරේව" යි
275 මෙසේ තෙරුන්වහන්සේට කීයේය, සඞ්ඝයාට ආරක්ෂා දී
මහීපතිතෙම යහපත්වූ නුවරට ප්‍රවිෂ්ටවූයේය.
276 එකල සඞ්ඝතෙම සමගි පොහොය කෙළේය, ස්ථවිරයන්
වහන්සේ නොයෙක් සඞ්ඛ්‍යාඇති භික්ෂුසඞ්ඝයා අතුරෙන්
277 විශාරදවූ ෂඩ්අභිඥා ඇත්තාවූ ත්‍රිපිටකධාරීවූ ප්‍රභෙද ප්‍රාප්ත
ප්‍රතිසම්භිදා ඇති භික්ෂූන් දහසක් ධර්ම්මසඞ්ගායනා කරණු
278 පිණිස තෝරාගත්තේය. උන්වහන්සේලා සමග අශෝකා
රාමයෙහි ධම්මසඞ්ගීතිය කළේය. මහාකාශ්‍යප ස්ථවිරයන්
279 වහන්සේද යශස්ථවිරයන් වහන්සේද යන ඒ ස්ථවිරයෝ
තුමූ යම්සේ ධර්මසඞ්ගායනා කරවූද, මොග්ගලිපුත්ත තිස්ස
ස්ථවිරතෙමේ ඒ ධර්මසඞ්ගායනාව එසේම කරවූයේය. පර
280 වාද මර්ද්දනයකරන්නාවූ කථාවස්තු ප්‍රකරණය, ඒ සඞ්ගීති
මණ්ඩලයෙහි තිස්ස ස්ථවිරයන්වහන්සේම වදාළේය. මෙ
සේ ධර්මාශෝක මහරජහුගේ ආරක්ෂාව කරණකොට යෙ
281 ණ භික්ෂූන් දහසක් විසින් මේ ධර්ම්මසඞ්ගීතිතොමෝ නව
මසකින් නිමවනලද්දීය. රජහුගේ (රාජ්‍යාභිෂෙකයෙන්)
282 සතලොස්වන වර්ෂයෙහි දෙසැත්තෑ වස් ඇත්තාවූ ඒ ඍෂි
තෙම මහාපවාරණයෙහිදී සඞ්ගායනාව සමාප්ත කරවූ
යේය. ශාසනස්ථිති හෙතුවෙන් සාධුකාර දෙන්නියකමෙන්
සඞ්ගීති අවසානයෙහි මහපොළෝතොමෝ කම්පිතවීය.
283 ඒ මොග්ගලිපුත්තතිස්ස නම්වූ ස්ථවිරයන්වහන්සේ ම
නොඥ ශ්‍රේෂ්ඨවූ බ්‍රහ්මවිමානයද හැර ශාසනය හෙතු
කොට පිළිකුල්වූ මිනිස්ලොවට අවුත් කරණලද කටයුතු
ඇත්තේ ශාසනකෘත්‍යය කෙළේස. අන්‍යවූ කවරෙක් ශාස
නකෘත්‍යයෙහි ප්‍රමාදෙපෙත වේද? ·

මෙතෙකින් සුදිජනයා ප්‍රශාද සංවෙග පිණිස කළ මහ
වස තතියධම්මසඞ්ගීතිනම්වූ පස්වෙනි අදියර නිමියේය.

Digitized by Google

6 වෙනි පරිච්ඡෙදය.

1 අතීත කාලයෙහි වඟුරට වඟුපුරවර වඟුරජෙක් විය, කලි
2 ඟුරජු දුවක් ඒ රජහට මෙහෙසී වූවා. ඒ රජතෙමේ එම
දේවියගෙන් එක් දුවක් ලැබී. නෛමිත්තිකයෝ සිංහරාජ
3 යෙකුහා ඇයගේ සංවාසය කිවූය. ඉතා රූවත්වූ අතිශයින්
කාමයෙන් ගිජුවූ (ඕතොමෝ) රජය දේවිය යන දෙදෙනා
විසින් ලජ්ජාවෙන් පිළිකුල් කරණලද්දීය.

4 ඕතොමෝ සවච්ඡන්ද වෘත්ති සුවකැමැත්තී හුදකලාව අප්‍ර
සිද්ධ වේශයෙන් පිටත්ව මගධරට බලා යන වෙළඳසමූහ
5 යක් කැටිව ගියාය. ලාටරට අටවියෙහිදී සිංහයෙක්තෙමේ
වෙළඳසමූහයා වෙත දිවආය. (ඉස් දූ දූ අත දුවනාහු)
සෙසුසෝ අනික් දිගකට දිවූහ. ඒ කුමාරිකා සිංහයා ආදිගට
6 දිව්වාය. සිංහතෙමේ ගොදුරු ගෙණ (පෙරලා) යන්නේ
දුරදීම ඇය දැක සිත්ඇලවූයේ කන්හෙලාගෙණ නගුට සල
7 මින් සම්පව ආය. ඕතොමෝ උහු දැක අසනලද නෛමි
ත්තික වචනය සිහිකොට බිය නුවූවා ඇඟ උඩවමින් ඒ සිංහ
8 යාගේ අවයවයන් පරාමර්ශනය කළා හෝ අතගෑය. සිංහ
තෙමේ ඇයගේ පහසින් ඉතා ඇළුණේ පිට නගාගෙණ
වහා සියගුහාවට ගෙණගොස් ඇයහා සහවාසයෙහි හැසුරු
9 ණේය. ඒ රජදූ තොමෝ උහුහා සංවාසය කරණකොට
ගෙණ සුදුසු කාලයෙහි පුතෙක දුවකැයි කියා නිඹුල් දරු
10 දෙදෙනෙක් වැදුවා. පුත්‍රයාගේ හස්තපාදයෝ සිංහාකාරවූ
ය, එහෙයින් ඔහු සිංහබාහුයයි නම්කළාය, දුව සිංහසීවලී
11 යයි නම්කළාය. සොළොස්විය පැමිනි ඒ පිත්තෙමේ "මෑනි
යෙනි තුබගා අප පියාත් කවර හෙයින් අසමානයෙදැ"යි
12 සිත සැකය මෑනියන් විචාළේය. ඒ මවුතොමෝ ඔහුට
සියල්ල කීවා. ඒ තෙමේ "කුමක් හෙයින් මිනිස් පියසට
නොයමෝදැ"යි කීය. ඕතොමෝ "තාගේ පියා ගලෙකින්
13 ගුහාව වසයි (එහෙයින් යානොහෙම්හයි)" කීවාය. ඒ කුමර
මහ ගුහාදොර වසන ගල කර නගාගෙණ එක් දවසින්ම
14 පණස් යොත්නක් යාම් ඊම් කෙළේය. සිංහයා ගොදුරු
පිණිස ගියකල දකුණුකර මෑනියන්ද වම්කර නැගණි
15 යන්ද තබාගෙණ වහා ඒ ගුහායෙන් පලාගියේය. ඔව්හු
කොල හැඳගෙණ පසල් ගමකට අවූය. එකල ඒ පසල්
16 ගම රජදුව මසිල්ලු පිත්, වඟුරජු සෙනෙවියා සිටියේ විය.
ඒතෙමේ කර්මාන්ත විධාන කෙරෙමින් නුගරුකක් මුල

Digitized by Google

17 ගුත්තේය. උන් දැක "තෙපි කවුරුදැ"යි විචාළේය. ඔව්හු
"අප වෙනෙහි වසනාමෝය" යි කිවුය. ඒ සෙනෙවි තෙ
මේ ඔවුන්ට වස්ත්‍රදෙවිය.
18 ඒ වස්ත්‍රයෝ මහාඝවූහ. පණීයන්හි බත්දෙවිය, ඔවුන්
19 පිණින් ඒ පණීයෝ රත්බඳුන් වූහ. එයින් විස්මිත සෙනෙ
විතෙමේ "තෙපි කවුරුදැ"යි (නැවතද) විචාළේය ඒ රජදු
20 තොමෝ (තමා) ජාති ගොත්‍රයන් ඔහුට දැන්විය ඒ සෙනෙ
විතෙමේ ඇවැස්ස නෑන්දනියන් දීයනිවූ ඇය ගෙණ වඟු
නුවර ගොස් ඇය සමඟ වාසය කෙළේය.
21 සිංහතෙමේ වහා ගුහාවට ගොස් ඒ තුන්දෙනා නොදැක
පුත්‍රශෝකයෙන් පෙළුනේ නොම කෑයේය නොම බීයේය.
22 ඒ දරුවන් සොයමින් ප්‍රත්‍යන්ත ග්‍රාමයන්ට ගියේය. ඒ
සිංහතෙමේ යම් යම් ගමකට වදනේනම් ඒ ඒ ගම සිස්
23 වෙයි. පසල් දනව් වැස්සෝ ගොස් රජහට "දේවයෙනි
සිංහයෙක් තෙමේ ඔබගේ රට පෙළයි ඔහු වළක්කාව මැ
24 නව" යි එපවත් රජහට දැන්වූහ. ඒතෙමේ සිංහයා නස
නෙනකු නොලබමින් දහසින් බැඳි පියල්ලක් ඇත්කඳතබා
"සිංහයා දෙන තැනැත්තේ ගණිව" යි නුවර (බෙර) හැසිර
25 වී. නරේශ්වරතෙමේ දෙදහසෙක තුන්දහසෙකැයි එසේම
(බෙර) පියවී කරවී. මවුතොමෝ දෙවරෙක ඒ සිංහබා
26 කුමර වැළැක්කුවා. තුන්වන වර ඒ සිංහබා කුමර මවු නොවි
චාරම සියපියහු මරන්ට ඒ (රන්) තුන්දහස ගත්තේය. රජ
27 හට කුමරු දැක්වූය. රජතෙමේ ඔහුට "ඉදින් තාවිසින් සිංහ
28 තෙමේ ගන්නාලැබේ නම් එම රට තටදෙමු" යි මෙසේ කී
29 යේයි. කුමරතෙමේ ඒ ලෙනදොරට ගොස් පුත්‍ර ප්‍රේමයෙන්
එන ඒ සිංහයා දුරදී දැක ඒදීනට හීයක් යැවීය. හීයතෙම
30 නලලවැද උහු මෙත් සිතින් පෙරලා අවුත් කුමරහු පාමුල්
හි බිමහිනි. තුන්යලදක්වා එසේම විය. පසුව මෘගරාජතෙ
31 ම කිපියේය. ඉක්බිති යවනලද හීයතෙමේ උහු සිරුර විනි
විද නික්මිනි කුමරතෙමේ කේසර සහිත සිංහ ශීර්ෂය ගෙණ
32 පුරයට ගියේය. එකල වඟුරජු මළ සත්දවසක් විය. රජ
තමා අපුත්‍රක බැවිනුත් මොහුගේ කර්මයෙන් ප්‍රසිද්ධ බැවි
33 නුත් රජහු මුණුබුරු බැව් අසාත් මවුකුමරියද හැඳිනත්
සියලු ඇමැතියෝ රැස්ව එක්සිත්ව සිංහබා කුමරහට "රජ
34 වව" යි කීවෝය. හේතෙමේ රජය පිළිගෙණ මෑනියන්
වලලහයාට එය පාවාදී සිංහසීවලිය ගෙණ තෙමේ ජාත
35 භූමියට ගියේ එහි නුවරක් ඉදිකෙළේය, ඒ සිංහපුර නම්වී.
සියක් යොදුන් වෙනෙහි ගම්ද පිහිටවී. ලාටරට ඒ නුවර

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

36 සිංහබා රජතෙමේ සිංහසීවලිය මහේසිකාකොටගෙණ
37 රජය කෙළේයි. ඒ මෙහෙසී තොමෝ සොළොස් වරෙක
පුතුන් දෙදෙනෙක් දෙදෙනෙක් බැගින් සුදුසු කාලයෙහි
38 වැදූවා, දෙටුපිත් තෙමේ විජයනම දෙවැන්නා සුමිත්‍රනම
රජතෙමේ විජයකුමර සුදුසුකල උපරජයෙහි අභිෂෙක
කෙළේයි.
39 විජයතෙමේ විසම ආචාර ඇතිවිය. ඔහු පිරිස්ද එසේදුය
ඔව්හු ඉවසිය නොහෙන නොයෙක් බලාත්කාරකම් ක
40 ළෝය. කිපි මහජනතෙමේ රජහට එපවත් දැන්විය. රජ
තෙමේ ඔවුන් කටයුතු හගවා පුතුට මනාකොට අවවාද
41 කෙළේය. දෙවෙනි වරද සියල්ල එසේ විය. තුන්වන වර
42 වනාහි කිපි මහජනතෙමේ "ඔබ පුතු මැරුව මැනවැ"යි
රජහට කීය. ඉක්බිති රජතෙම ඒ විජයකුමරද ඔහුගේ ඒ
43 පිරිසද (යන) සත්සියයක් මිනිසුන් අඩක් (ඉස්) මුඩු කරවා
නැවක දම්මවා සමුදුර යැවිය, එසේම ඔවුන්ගේ භාර්‍යා
44 වන්ද එසේම කුමරුන්ද (මුහුදයැවිය) වෙන වෙනම දමන
ලදුවූ ඒ පුරුෂ ස්ත්‍රී කුමරුවෝ වෙන් වෙන් දිවයින්හි බැස්
45 සෝය. (එසේම) වාසයකළෝය. කුමරුවන් පිහිටි දිවයින
46 නග්නද්වීපයයි ප්‍රසිද්ධවිය. භාර්‍යාවන් පිහිටි දිවයින මහිළ
ද්වීපයයි වී. විජයතෙමේ සුප්පාරක නම් පටුන බැසගත්
තේය, මෙහි පිරිසගේ බලාත්කාර ක්‍රියායෙන් භයවූයේ
නැවතත් නැව් නැංගේය.
47 ස්ථිරබුද්ධිඇති විජය නම් කුමර ලඞ්කායෙහි හෝ තාම්‍ර
පර්ණි ද්වීපයෙහි යමකශාලාන්තරයෙහි හෙවත් සල්රුක්
දෙදෙනා අතුරෙහි තථාගතයන් පිරිනිවන් පිණිස සැත
පුනු දවස බටුයේය.
මෙතෙකින් සුදීජනයා පහන් සංවේග පිණිසකළ මහවස
විජයාගමනනම් සවෙනි අදියරනිමි.

---

7 වෙනි පරිච්ඡේදය.

1 සියලු ලෝවැසියාට වැඩකොට පරම ශාන්තිකාලයට පැමි
න පිරිනිවන් මචකයෙහි හොත්තාවූ ලෝහිම්වූ වාදින් අතු
2 රෙන් ශ්‍රෙෂ්ඨවූ මහාමුනි තෙමේ මයත්වූ දෙවසමාගමයෙ
3 හිදී එහි සම්පව සිටි ශක්‍රයාහට වදාරණසේක් "සිංහබා රජු
පිත් තෙල විජයකුමර අනුගත සත්සියයක් පිරිවර ඇතිව

Digitized by Google

4 ලාටරටින් (අවුත්) ලක්දිව් බැස්සේය. දෙවෙන්ද්‍රය මාගේ
සස්න ලක්දිව්හි පිහිටන්නේය එහෙයින් පිරිවරසහිත උහුද
ලඞ්කාවද මොනවට රකුව" යි වදාළසේක.
5 දෙවෙන්ද්‍රතෙමේ තථාගතයන් බස ගෞරවයෙන් ඇසූ
යේම උපුල්වන් දෙව්රජහට ලඞ්කාරක්‍ෂාව භාරකෙළේයි.
6 ඒ තෙමේ ශක්‍රයා විසින් කීපමනින් එකෙණෙහි ලක්දිව්
7 අවුත් පරිබ්‍රාජක වෙශයෙන් රුක්මුලෙක හුන්නේය. විජ
ය කුමාරයා ප්‍රධානකොට ඇති සියල්ලෝ උහුවෙත අවුත්
8 "පින්වත්නි මේතෙමේ කවර දිවයිනෙක්දැ" යි විචාළෝය.
හේතෙමේ ලක්දිවයයි කියා මිනිස්හු මෙහි නැත්තාහුයයිද
9 තොපට භයක් නොවන්නේයයිද කීය. මෙසේ කියා කෙණ්ඩි
කායෙන් ඒ මිනිසුන් (පිරිත්) පැන් ඉස, උන් අත්හි (පිරිත්)
හුද බැඳ අහසින් ගියේය.
10 පිරිවර යකින්නක් බැලිරුවින් තමා දැක්වීය. උන් අතු
රෙන් එකෙක් රජපින්හු විසින් නවතනු ලදුයේත් "ගම්
11 ඇතිකල බල්ලෝ ඇතිවන්නාහ" යි ඇය පසුපස්සෙහි ගි
යේය. ඇයගේ ස්වාමිදූවූ කුවේණී නම් යකිනීතොමෝ
(කපු) කටනා තවුසියක් සෙයින් එහි රුක්මුලෙක හුන්
12 නාය. ඒතෙමේ පොකුණද හුන් තවුසියද දැක එහි නහා
පැන්බී නෙළුම්ලද පොකුරුපතින් දියද ගෙණ ගොඩනැං
13 ගේය. ඕතොමෝ ඔහුට "මාගේ ගොදුරුද්‍රයෙහි සිටුව" යි
14 කීවාය. ඒ මිනිස්තෙමේ බඳනාලද්දෙකුසේ සිටියේය. ඕ
තොමෝ පිරිත් හුයෙහි තේජසින් (මිනිසා) කනනට අසමත්
15 වී. යකිනිය විසින් ඉල්ලනු ලබනනාවූද මිනිස්තෙමේ ඒ
හුය නුදුන්නේය. යකිනීතොමෝ හඬමින් සිටි උහු ගෙණ
උමගෙක බැහ්ය, මෙසේ එකඑකා බැගින් සත්සියයම ඒ
උමග බහාලීය.
16 සියල්ලන් නේනකල භයෙකැයි සැකකළාවූ විජයකුමර
තෙමේ සැරහුනු පසවි ඇත්තේ ගොස් මහා පොකුණ දැක
17 ගොඩනැගි පියවර සටහන් දිටී. ඒ තවුසියද දුටුයේය, "කි
මෙක්ද මැය විසින් මාගේ භටයෝ ගන්නාලදුවෝදෝ" යි
18 සිතා "කිමෙක්ද පිනැත්තිය නී මාගේ භටයන් නුදුටුයෙහි
දැ" යි ඇයට කීයේය. ඕතොමෝ "රජකුමාරයාණෙනි භට
යන්ගෙන් කාරිය කිම පැන් පූවමැනව නැහැව මැනව" යි
19 කීවා. "යකිනීතොම නිශ්චයෙන්ම මාගේ ජාතිය දන්නී
ය" යි නිසැකවූ ඒතෙමේ සියනම අස්වා වහාම දුනා සර
20 සාගෙණ වෙත එළඹියේ නාරචවලයෙන් බෙල්ලෙහි
යකින්න ගෙණ වමතින් කෙස්වැටිය ගෙණ දකුණතින්

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

21 කඩුව් අමෝරා "කෙල්ල මාගේ මිනිසුන් දෙව තී මරම්" කී
යේය. ඒ යකිනිතොම බියෙන් බැගෑදූවා "ස්වාමිනි මා
22 දිවි දුනමැනව මම ඔබට රජය දෙන්නෙමි ස්ත්‍රී කෘත්‍යයත්
අනික් කිසිවකුත් කැමැති පරිද්දෙකින් කරන්නෙමැ"යි
23 කියා දිවි ඉල්වීය. ඒ කුමර අද්‍රෝහ පිණිස යකිනිය සපථ
කරවී. "වහා මිනිසුන් ගෙණෙව"යි කීපමණින්ම ඕතො
24 මෝ ගෙණවා "මොව්හු බඩසා ඇත්තාහ"යි කියනලද්දාවූ
ඕතොමෝ කනලද වෙළඳුන්ගේ නැව්හිවූ නානාවිධවූ
25 බොහෝවූ සහල් ආදිය දැක්වීය. ඒ මිනිස්සු බත්හා සූපයත්
පිසා රජකුමරහු බත් කවා සියල්ලෝද කෑවෝය.
26 විජයකුමරහු විසින් දෙවනලද අග්‍රභාගය කා පිනාගියාවූ
27 යකිනීතොම සොළොස් හැවිරිදි සිත්ගන්නා රුවක් මවා
ගෙණ සර්වාභරණින් සැරසුනී රජකුමරු වෙත එළඹියාය.
28 රුක්මුලෙක තිරයෙන් මොනවට හාත්පස අවුරණලද්දාවූ
29 වියනින් මනාව අලඞ්කෘතවූ මාහැඟි යහනක්ද මැවීය. රජ
කුමර ඒ දැක අනාගත අභිවෘද්ධිය බලන්නේ ඈහා සමග
වාසය කොට යහනෙහි සැපසේ හොත්තේය. පිරිවර සියලු
මිනිස්සු තිරය සිසාරා හොත්තෝය.
30 රාත්‍රිභාගයෙහි ඒ කුමර තූර්යනාද සහිත ගීහඬක් අසා
31 "කවර ශබ්දයෙක්දැ"යි එක්ව නිදන යකිනිය විචාළේය.
32 "සියලු යකුනුදු මරවා රාජ්‍යයත් ස්වාමියාහට දියයුතෝය.
අවශ්‍යයෙන්ම මනුෂ්‍යවාස හෙතුයෙන් යක්‍ෂයෝ මා මරත්
නාහ" මෙසේ සිතා ඒ යකිනීතොම රජකුමරහට (කියනනී)
33 "ස්වාමිනි මෙහි මේ යක්‍ෂපුරය ශිරීෂවත්‍ථු නම එහි දෙටු
යකු පිණිස ලඞ්කා නගරවාසිවූ කුමරියක් මෙහි ගෙණෙන
34 ලද්දීය ඈයගේ මවුද ආවා, ඒ කැඳවා එන මගුල්හි මෙහිද
මහත් උත්සව පවති. මේ එහි ශබ්දයයි මේ සමාගමය
35 මහත්මැයි. අදම යකුන් මැරුව මැනව. මින් මතුයෙහි
නොහැක්කැ"යි කීවාය. කුමර "අදෘශ්‍යමාන ඒ යකුන්
36 මම කෙසේ මරම්දැ"යි කීයේය. "යම් තැනෙක ශබ්දෙක
වේනම් ඒ හඬින් ගැසුව මැනව. ආයුධය තෙමේ මාගේ
37 ආනුභාවයෙන් උන්ගේ කයෙහි හෙන්නේය"යි ඈගේ බස
අසා එසේකොට සියලු යකුන් මැරීය. තෙමේද ලබනලද
38 ජය ඇත්තේ යක්‍ෂරාජයාගේ ආභරණ පැළැන්දේය, සෙසු
ආභරණයෙන් ඒ ඒ භටයන්ද පැළඳවීය. කීපදවසක් මෙහි
39 වැස තාම්‍රපර්ණියට එළඹියේය. විජයකුමරතෙමේ තාම්‍රපර්ණී
නගරය ඉදිකොට ඇමැතියන්විසින් පිරිවරණලදුයේ යකි
නියහා විසීය.

Digitized by Google

40 එකල්හි නැවින් ගොඩබටුවාවූ විජයකුමර ආදීහු කලා
41 න්තවූවෝ අතින් භූමියෙහි ස්පර්ශකොට හිඳගත්තෝය. යම්
හෙයකින් තඹවන් අත්ල ඇතිවීද එහෙයින් ඒ දෙශයද
42 දිවයිනද ඒ නම් ඇත්තේ හෝ තාම්‍රපර්ණී නම් විය. ඒ
සිංහබාහු නරෙන්ද්‍ර සිංහයා ගත්තේය එහෙයින් සිංහල
නම්වී; ඔහුහා සම්බන්ධඇති මේ සියල්ලෝද සිංහලයෝයි.
43 ඔහුගේ ඇමතියෝ ඒ ඒ තැන ගම් පිහිටවූහ. අනුරාධ
නම් ඇමැතිතෙමේ කොලොම්හෝ ඉවුරෙහි අනුරාධ නම්
44 ගම පිහිටවීය. පෙරවී උපතිස්සතෙමේ අනුරාධ පුරයෙන්
උතුරුදිග ගම්භීරනදී තීරයෙහි උපතිස්ස ග්‍රාමය ඉදිකෙ
45 ළේය. අනික් ඒ ඇමැතියෝ තුන්දෙනෙක් උජ්ජේනිය උරු
වේලාය එසේම විජිත නගරයයි යන වෙන වෙන ගම් ඉදි
46 කළෝය. ජනපදය පිහිටුවා සියලු ඇමතියෝ රැස්ව ඒ
කුමරහට "ස්වාමීනි රාජ්‍යයෙහි අභිෂෙක කරව" යි කීහ.
47 මෙසේ කියනලද රජකුමරතෙමේ ක්ෂත්‍රිය කන්‍යකමෙහෙසි
යකගේ අභිෂෙකයක් නැතිව අභිෂෙකය නොකමැතිවීය.
48 වැලි ඒ ඇමතියෝ ස්වාමීහුගේ අභිෂෙකයෙහි කරණ
ලද ආදරඇත්තෝ දුකසේ කටහැකි කර්තව්‍යයෙහිද ඒ
49 අර්ථසිද්ධියෙහි බයබව ඉක්මවූවෝ ස්වාමියා කෙරෙහි භක්ති
ඇත්තාහු ස්වාමිවූ විජයකුමරහට පඬිරජු දියනියන් පිණි
50 සත් ඇමතිවර්ගයාහට සෙස්සන් දූන් පිණිසත් මිණිමුතු
ආදී මහාසාර බොහෝ පඬුරු ගත්වා මධුරාපුරයට දූතයන්
51 යැවූහ. ඒ රාජදූතයෝ වහා නැවින් මධුරාපුර ගොස් පඬු
52 රුද ලියුම්ද ඒ රජහට දැක්වූය. පසුව රජතෙමේ ඇමති
- යන්හා මන්ත්‍රණය කොට පිය දියනියන් හා අනික් ඇමති
53 යන්ගේ දූහුත් එවනු කැමැතිවූයේ එතුන් සියයක් කන්‍යා
වන් ලැබ නැවත "ලඞ්කාවට දූන් යවනු කැමැත්තාවූ මේ
54 මධුරා වැසි මිනිස්සු දූන් දෙගුණයක් සරහා ගෘහ වාරයන්හි
හිඳුවත්වා ඒ ලකුණෙන් උන් ඇරගන්නෙමු" යි බෙරපිය
විකරවී.
55 මෙසේම බොහෝ කන්‍යකාවන් ලැබ ඒ කුලයන් සතප්පා
56 සැපයූ සර්වාලඞ්කාර ඇති පිරිස්සහිත දියනියන්හා සුදුසු
පරිඅදුන් ලබනලද සත්කාරඇති ඒ සියලු කන්‍යකාවන්ද
57 රාජාර්හවූ හස්ත්‍ය ශ්ව රථප්‍රෙෂ්‍ය කාරකයන්ද අටළොස් ශිල්පි
සමූහයන්ගෙන් කුල දහසක්ද සතුරන් දීහු විජයරජහට
58 ලියමන්දී එවූයේය. ඒ සියලු මහාජනතෙමේ නැවින්
(අවුත්) මහතොට ගොඩබටුයේය. එහෙයින්ම ඒ පටුන
මහතොටයයි (මාන්තොට්ටම්) කියනුලැබේ.

Digitized by Google

59 විජයකුමරහට ද ඒ යකින්නියගේ පුතෙක්ද දුවක්ද වූහ.
60 විජයකුමරතෙමේ රාජකන්‍යාව ආබැව් අසා යකින්නියට
"සොඳුර දරුවන් දෙදෙනා තබා තී දුන් යා මනුෂ්‍යයෙ
61 හැමකල්ම අමනුෂ්‍යයන්ට බානහ" යි කීය. ඒ අසා යක්ෂ
භයින් භයවූ ඒ යකින්නට "තිට දහසකින් බලිදුනය කර
62 වම් සෝක නොකර" යි කීයේය. භයවූද ඕතොමෝ
නැවත නැවත ඔහු යාච්ඤාකොට දරුදෙදෙනා ගෙණ යා
63 යුතු අතක් නැතිබැවින් ලඞ්කාපුරයට ගියාය. පුතුන්
64 බැහැර හිඳුවා තොමෝ නුවරට වන්නාය. ඒ යකින්න හැ
ඳින සෙරයයි (සතුරු පක්ෂ) සංඥාඇති භයවූ ලඞ්කාපුර
යෙහි යක්ෂයෝ කැලඹුනෝය. එක් රෞද්‍ර යක්ෂයෙක් වූකලී
එක් අතුල් පහරිකින්ම යක්ෂණිය මැරූයේය.
65 ඇයගේ මසිල් යක්ෂතෙමේ නුවරින් බැහැර නික්මුනේ
66 ඒ දරුදෙදෙනා දැක "තෙපි කවුරුන්ගේ දරුවෝල" යි
පිළිවිසියේය. කුවෙණියගේයයි අසා "මෙහිදී තොපගේ
මවු මරණලද්දිය තොපත් දැක මරන්නාහ වහා පලායෙන්
67 ව" යි කීයේය. ඔව්හු එයින් වහා පලාගොස් සමන්කුළට
ගියෝය. ඒ දෙවුතෙමේ තරුණවූයේ ඒ නැගණියන් සමග
68 වාසය කෙළේය. ඔව්හු දු පුතුනගෙන් වැඩී ඒ කඳුරටම
විසූහ. මේතෙමේ වැද්දන්ගේ උත්පත්තියි.
69 පඬිරජහුගේ ඒ දූතයෝ (ගෙණ) පඬුරුද ඒ රජදුන්
70 ආදියද විජයකුමරහට පැමිනවූහ. විජයකුමර තෙමේ දූත
යන්ට සත්කාර සම්මානකොට ඇමති සමූහයාට සුදුසු
71 පරිද්දෙන් කන්‍යාවන් පාවාදුන්නේය. තවද සියලු ඇමති
යෝ රැස්ව විධිවූ පරිද්දෙන් විජයකුමරු රාජ්‍යයෙහි අභි
72 ෂෙක කළෝය, මහ සැණකෙළිද කෙළියහ. ඉක්බිති
විජයරජතෙමේ පඬිරජු දියනියන් මහපෙළහරින් මෙහෙසි
73 බැව්හි අභිෂෙක කෙළේයි. ඇමතියන්ට වස්තු දුන්නේය
එසේම මසිල් (රජ) හට වනාහි අවුරුදුපතා දෙලක්ෂයක්
වටනා සක්මුතු දුන්නේය.
74 ඒ විජය නරශ්‍රේෂ්ඨතෙමේ පළමු විසම හැසිරීම් හැර
දැහැමෙන් සෙමෙන් මුළු ලක්දිව අනුශාසනා කෙරෙමින්
පුරා අටතිස් හවුරුදක් තාම්‍රපර්ණීනගරයෙහි රජකම්
කෙළේය.

මෙතෙකින් සුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වස විජයාභිෂෙක නමවූ සත්වන අදියර නිමි.

Digitized by Google

8 වෙනි පරිච්ඡේදය.

1 ඒ විජය මහරජතෙමේ අන්තිම වස්හි සිටියේ "මම වෘද්ධ
යෙමි මාගේ පුතෙක් නැත්තේය දුකසේ පිහිටුවනලද මේ
2 රට මා ඇවෑමෙන් නස්නේය. එහෙයින් රජයපිණිස මා
මල් සුමිත් කුමරහු ගෙන්වන්නෙමැ"යි මෙසේ සිතුයේය.
3 ඉක්බිති ඇමැතියන්හා මන්ත්‍රණයකොට එහි හසුන්පත්
යැවූයේය. විජයතෙමේ හසුන්දී නොබෝ කලකින් දෙව්
ලෝ ගියේය.
4 ඔහු මළකල ඒ ඇමැතියෝ රජකුමරෙක් එනු බලනනාහු
5 උපතිස්ස ගම වෙසෙමින් රට අනුශාසනා කළෝය. විජය
රජු මළකල රජකුමරුවන් ඊමෙන් පළමුකොට එක්අවුරු
6 ද්දක් මේ ලක්දිව අරාජකවී. ඒ සිංහපුරයෙහි සිංහබා රජහු
7 ඇවෑමෙන් ඔහු පිත් සුමිත් කුමර රජවී. මදුරජු දූ මෙහෙ
සියගෙන් ඒ සුමිත්රජු පුතුන් තුන්දෙනෙක් වූහ. ලක්දිවින්
8 ගිය දූතයෝ සිංහපුරයට ගොස් රජහට පත්හසුන් දුන්
නෝය. ඒ රජ හසුන් අසා පුතුන් තුන්දෙනාට "දරු
9 වෙනි මම මහළුයෙමි තොප අතුරෙන් එකෙක් මා බෑයා
සතු නොයෙක් ගුණඇති සිත්කළුවූ ලඞ්කාවට යේවා. තවද
10 ඔහුගේ ඇවෑමෙන් එහිම රජකරවන්වත් හොබනේය"යි
කීයේය. තිස්දෙවුන්මල් පඬුවස්දෙවියයි නම් රජකුමර
11 තෙමේ යන්නෙමැයි සිතා සැපසේ ගමනද දැන පියහු
විසින් අනුදනනාලද්දේ පරිබ්‍රාජක වෙස්ඇත්තෝ දෙතිස්
ඇමැති දරුකෙනෙකුදු ගෙණ නැව්නැංගේය. මාකඳුරු
12 හොය හෝ මාඔය මෝයෙහි (කම්මල්තොට) ඔව්හු ගොඩ
බටහ. ජනතෙමේ ඒ පරිබ්‍රාජකයන් දැක මොනවට සත්
කාර කෙළේය.
13 මෙහි නුවර විචාරා ක්‍රමයෙන් යනනාවූ ඔව්හු දෙවියන්
විසින් රක්නාලද්දේවූ උපතිස් ගමට පැමිනියෝය. ඇමැති
14 යන් විසින් අනුමතකරණලද්දාවූ ඇමැතියෙක්තෙමේ බැහැ
ර නිමිත්තපාඨකයෙකු අතින් ක්ෂත්‍රියයන්ගේ ඊම විචාළේය.
ඒ නිමිත්තපාඨකතෙමේ විචාළාවූ ඇමැතියාට අනිකකුදු
15 (විසඳමින්) "සත්වන දවස්හි කැත්කුමරෙක් එන්නේය
ඕමාහුවංශ උපන්නෙක්ම බුදුසස්න පිහිටුවන්නේය"යිද
16 කියාත් විසඳූයේය. ඒ ඇමැතියෝ සත්වන දවස්හිම එහි
17 පැමිනි පරිබ්‍රාජකයන් දැක විචාරා දැන, ඒ පඬුවස් රජහු
ලක්රජයෙහි පිහිටවූහ. මෙහෙසියක් නැතිබැවින් ඒ කුමර
18 ඒතාක් අභිෂෙක නොකෙළේසි. අමිතොදන ශාක්‍යරජහට

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

පාණ්ඩුශාක්‍ය නම් පුත්‍රයෙක් විය. එතෙමේ ශාක්‍යයන්ගේ
19 පරිහානි දැන සියජනයා හැරගෙණ අප්‍රසිද්ධ වෙශයෙන්
ගඟා නම් ගඟින් එතර ගොස් එහි නුවරක් ඉදිකොට
20 රජය කරන්නේ දරුවන් සත්දෙනෙක් ලද්දේය. භද්‍ර
කච්චාන නම්වූ සියලු ස්ත්‍රීලක්‍ෂණයෙන් යුක්තවූ ජනයා
විසින් අභිප්‍රෙතවූ මනා රූඇති තිස්දෙවුන් දුවකුදු වූවා.
21 ඇය පිණිස සත් රජදරුකෙනෙක් මාහැඟි පඩුරු ඒ රජ
හට එවූය. ඒ පාණ්ඩුශාක්‍යතෙමේ වනාහි රජුන්ගෙන් භය
22 වූයේ, සුවගමන්ද අභිෂෙක ඵලද දැන දෙතිසක් ගැහැ
ණුන්හා ඇය වහා නැව්නංවා "පොහොසතෙක් මාදුව
23 අල්වා ගණීව" යි කියා ගඟානම් ගඟ බැහුයේය. ඒ රජ
දරුවෝ ගත්ට නොහැකිවූහ. ශීඝ්‍රගාමිනී ඒ නෞකාතො
24 මෝ, දෙවෙනි දවස්හිම ගොණගම් පටුනු පැමිනියාය. පැවි
25 දිවෙස් ගත් ඒ සියල්ලෝ එහි ගොඩබට්හ. මෙහි නුවර
විචාරා ක්‍රමයෙන් ඵලබෙනනාවූ එවුහු දෙවියන් විසින් රක්
26 නාලද්දාහු උපතිස් ගමට වන්නූය. නිමිත්තශාස්ත්‍ර හදාළාහු
බස් අසා එහි පැමිනියවුන් දැක උන් හැඳින ඇමැතිතෙමේ
27 රජහට භාරකෙළේය. මනා නුවනැති ඒ ඇමැතියෝ
පිරුණු සියලු මනෝරථ ඇති ඒ ද්‍ර ඩුවස්දෙව් කුමරහු රාජ්‍ය
යෙහි අභිෂෙකකලෝය.
28 පඩුවස් රජ අලාමක රූඇති යාපන් හද්‍රකාත්‍යන කුම
රිය තමාගේ මෙහෙසිබැව්හි අභිෂෙකකොට ඒ බිසව්
සමග ආවුන් තමාහා ආවුන්ට පාවාදී සුවසේ විසූයේය.

මෙතෙකින් ශුද්ධජනයා පහන්සංවෙග පිණිස කළ මහ
වංස පඩුවාසුදෙවාභිසෙක නම්වූ අටවන අදියර නිමි,

---

9 වෙනි පරිච්ඡෙදය.

1 ඒ මෙහෙසිතොමෝ පුතුන් දසදෙනෙකුහා එක් දුවකුදු
2 වැදූවා. සියල්ලන් දෙටුපත් අභයනම. කණිෂ්ඨාතෝම
චිත්‍රානාම මන්ත්‍රපාරගත බ්‍රාහ්මණයෝ ඇය දැක "මැය
3 පුතෙක් රජය පිණිස මයිලන් නසන්නේය" යි ව්‍යාකරණ
කළෝය (ඒ අසා) "නැගනියන් මරනොනමුය" යි නිශ්චය
කොට ගත්තාවූ සහෝදරයන් වැඩිමහල් අභයකුමරතෙම
4 වැලකීය. ඉබාහෝකලක් ඇය එක්ටැම් ගෙයක වැස්දූය.

Digitized by Google

රජහුගේ ශ්‍රියහන් ගබඩාව සමග ඒ එක්ටැම්ගෙහි දොර කර
5 වූය. තවද එක් දාසියක් මාලිගා ඇතුළෙහි සිටවූහ. මිනි
සුන් බැහැර රැකවල් ලූහ. යම් හෙයකින් මීතොමෝ දකුම්
ලත් පමණින්ම රුවින් මිනිසුන් උමතුකරවිද එහෙයින් උප
පද සහිතවූ උන්මාදචිත්‍රායයි නම්ලද්දීය.
6 භද්‍රකාත්‍යාන දේවියගේ ලක්දිව් ගමන් අසා මෑනියන්
7 විසින් මෙහෙයනලද පුත්‍රයෝ එතෙකු තබා මෙහි අවූය.
ආවාවූ ඔව්හු පඬුවස්දෙව් නම් ලක්හිමියාද ඒ නෑගනියන්ද
8 දැක සමග හඬා ඒ තියවුන් විසින් හා රජු විසින් කරණලද
සත්කාර ඇත්තෝ රජු අනුමතියෙන් ලක්දිව්හි චාරිකාහ
9 ළෝයි. රිසිසේ නිවාසද කළෝයි. රාමකුමරහු විසින් විසූ
තෙන රාමගෝණයයි කියනුලැබේ. උරුවෙලය අනුරාධය
යන දෙදෙනාගේ නිවාසයෝද එසේ එසේ (උරුවෙලය අනු
10 රාධයයි කියනුලැබෙති, එසේම විජිතය දීඝායුය රෝහණය
යන මොවුන්ගේ වාසස්ථානද විජිතග්‍රාම දීඝායුග්‍රාම රෝ
11 හණයයි කියනුලැබෙති. ඒ අනුරාධතෙමේ දකුණුදිගින්
වැවක් කරවීය. ඉන් ඉක්බිති රජගෙයක් කරවා එහි වාස
12 යකෙළේය. පඬුවස්දෙව් මහරජතෙමේ සිය දෙටුපිත් අභ
යකුමරහු සුදුසුකල උපරජයෙහි අභිෂෙකකෙළේයි.
13 දීඝායුකුමරු පිත් දීඝගාමනි කුමරතෙමේ ඒ උන්මාදචිත්‍රා
පවත් අසා ඈය කෙරෙහි සටගත් දශ්නාභිලාසා ඇතොත්
14 උපතිස් ගමට ගොස් රජහු දිටී. ඒ රජතෙමේ උපරජුහ
15 රාජෝපස්ථානය මේ කුමරහට දුන්නේය. දැල්කවුළු ඉදිරි
තන්හි ඒට එලඹ සිටියාවූ ඒ චිත්‍රාතොමෝ ගාමනී කුමරු
16 දැක ඇලුනු සිත්ඇතාත් දාසියට "මේතෙමේ කවරේදැ"යි
කීවා. පසුව "මයිල්හු පිතා"යි අසා දාසිය එහි නියෝ
17 ග කළාය. ඒ තෙමේ කවුළුයෙහි සන්ධිකොට පසුව වස්
වා රාත්‍රියෙහි කක්කාව යනතු නැගී දොරසිඳුවා එයින්
18 ඇතුල්විය ඈහා වැස අළුයම්හි බැහැරවී, මෙසේ නිතර
එහි වාසයකෙළේය. සිදුරක් නැතිබැවින් ප්‍රකාශනොවී.
19 මීතොමෝ උහුනිසා ගැප්ගත්තීය. පසුව ගැබ මුහුකුරා
20 ගියේය. දාසීතොමෝ මවුඛිසවට කීවා. මවුඛිසව් දියනියන්
විචාරා රජහට කීවාය. රජතෙමේ පුත්‍රයන් කැඳවා "මේ
21 තෙමේද අපවිසින් රැකගයුතේත්ය උහුටම ඈය දෙමුය"යි
කීයේය. ඉඳින් පුතෙක් වීනම් උහු මරන්නමෝය"යි ඒ දීඝ
ගාමනී කුමරහටම උන්මාදචිත්‍රාව දුන්හුය. වදන කල පැමි
නිකල්හි වැදීම්ගෙටද වන්නීය. රජකුමරුවෝ (ඒ කුමරිය)
22 රත්තා චිත්‍රනම් දාසය කාළවේළනම් දාසය යන ගැමුණු

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

23 කුමරහු කම්කරුවූ පිළිරූ නොදෙනනත් ඒ කර්මයෙහි යෙ
24 දුනුනයෝයයි කියා සැකකොට මැරවූහ. ඔව්හු දෙදෙනා
යක්‍ෂයොනියෙහි උපනෙනා ගැබහොත්තාවූම කුමරහට
අරක්ගත්තුය. ඒ කුමාරිකා වැදීමට ආසන්නකල්ඇති
අනික් ගැහැණියක් දසියලවා හැලකවී. ඒ චිත්‍රා කුමරී
25 පුතෙක් වැදූවා ; වැලි ඒ ගැහැණී දුවක් වැදූවාය. චිත්‍රා
තොමෝ ඒ ගැහැණියට මසු දහසක්හා සියපුතුදී ඒ දුව
26 ගෙන්වාගෙණ ලඟ හොවාගත්තීය. දුවක්ලදැයි අසා රජ
කුමරුවෝ තුටුවූහ——මවුකුමරීද මැතියන් මවුබිසවද
27 යන දෙනනා ඒ කුමරහට මුත්තනුවන්ගේ හා දෙටු මසිල්
හුගේ නම් එක්කොට පඬුකාභයයි නම්කළෝය. ලඞකා
28 රක්‍ෂක පඬුවස්දෙව් රජතෙමේ තිස්හවුරුදක් රජය කෙ
ළේය. පඬුකාභය කුමරහු උපන්කල ඒ තෙමේ මළේයි.
29 ඒ රජහු මළකල සියලු රාජපුත්‍රයෝ එක්වගෙණ අභය
දැයකවූ අභයනම් භාතෘ කුමරහට උදාරවූ රාජාභිෂෙකය
කළෝය.

මෙතෙකින් සුදිජනයා පහන්සංවෙග පිණිස කළ මහ
වංශ අභයාභිසෙක නම් නවවැනි අදියර නිමි.

---

10 වෙනි පරිච්ජෙදය.

1 උන්මාදචිත්‍රාව විසින් අණවනලදැවූ දසිතොමෝ ලදරු
2 කුමරහු කරඬුවෙක බහාගෙණ දොරමඬලා නම් ගමට ගි
යාය. රජකුමරුවෝද මුවදඩගියෝ තුඹුරු කඳුරෙහිදී දසි
3 ය දැක "කොයිසියෙහිද මේ කිමෙක්දැ" යි කියාත් විචාළෝය.
(ඕතොමෝ) "දොරමඩලාවට යෙම් මාගේ දුවට ගෙණයන
ගුඩපූය" යි කීවාය. රජකුමරුවෝ "බහා තබව" යි ඇව
4 කිවූය. චිත්‍රය කාලවේලය යන යක්‍ෂයෝ දෙදෙන කුමරහු
5 අරක් පිණිස නික්මියෝ එකෙණෙහි මහත් හූරුවෙසක්
දැක්වූය. ඒ කුමරුවෝ ඌරා ලුහුබැඳ ගියෝය. දසිතොම
ඒ කුමරහු ගෙණ එහි ගියාය. දරුවාද දහසද නිසුකතාය
6 හට රහසිගතව දුන්නිය. එදවස්හිම ඔහුගේ භාය්‍යාතොම
පුතෙකු වැදුවාය "මා බිරින්ද දරුවන් දෙදෙනෙකු වැදූ
7 වාය" යි උහු පොෂණය කෙළේය. ඒ කුමර සත්හැවිරිදි
වීය. මසිල්හු උහු දැන විලදිය කෙළනා දරුවන් මරන්ට

Digitized by Google

8 (මිනිසුන්) මෙහෙයූය. දියෙන් වසනලද සිදුරුඇති දියෙ
හිසිටි රුක් සිදුරකට කුමරතෙමේ කිමිදීමින් ඒ සිදුරෙන්
9 ප්‍රවිෂ්ටව බොහෝ වේලක් වැස පසුව එසේම නික්ම සෙසු
දරුවන් වෙත අවුත් උන්විසින් විචාරණ ලදුයේත් ඒ තෙ
මේ වචනයෙන් රැවටූයේය.
10 ඒ කුමරතෙමේ මිනිසුන් ආ දවස්හි රෙදිකඩ හැදගෙණ
11 දියෙහි ගිලී රුක් සිදුරෙහි සිටියේය. සෙසු දරුවන් මරා
කඩරෙදි ගැණ "සියලු දරුවෝ මරණලද්දහ" යි ගොස්
12 රජකුමරුවන්ට දැන්වූය. උන්ගියකල ඒ තෙමේ සඞ්කිය
13 ආයුක්තකයා ගෙටගොස් වෙසෙමින් ඔහු විසින් අස්වැසූයේ
දෙළොස් වස්වීය. නැවතද ජීවත්වන කුමරහු අසා උහු
14 ගේ මයිල්හු එහි සියලු ගොපලුන් මරන්ට මිනිසුන් මෙ
හෙයූය. එදවස්හි ගොපලෙලෝ එක් සිවුපාවෙකු ලැබ ඒ
15 කුමරහු ගිනිගෙණෙනු පිණිස ගමට යැවූය. හේතෙමේ
ගෙට ගොස් නියුක්තයාගේ පුත්‍රයාම "මා පාරිදෙනනාග
16 ගොපලුන් වෙත ගිනිගෙණ යා එහි තෝ අඟුරෙහි පැල
හු මස්ද කනෙහ'ය" යි යැවූයේයි, ඒතෙමේ එබස් අසා
17 ගොපලුන්වෙත ගිනිගෙණ ගියේය. මෙහෙයනලද
මිනිස්සු ඔවුන් වටලා මැරූය. සියලු ගොපලුන්මරා මයි
ලන්ට දැන්වූය.
18 පසුව සොළොස්වස්වූ ඒ කුමර මයිල්හුද දත්තෝය. මවු
19 තොමෝ දහසකුදු දිනී. කුමරහුගේ ආරක්ෂාවද විධානක
ළාය. ආයුක්තකතෙමේ මැනියන් කී සියල්ලම ඔහුට දන්වා
20 දහසෙකුත් මසු දහසකුත් දී පඬුල බ්‍රාහ්මණයා වෙත යැවූ
යේය. වේදපාරගතවූ බොහෝ සම්පත්ඇති පඬුල නම් බ්‍රා
21 හ්මණයෙක් දකුණුදිග පඬුල නම් ගම විසීය. කුමාරතෙමේ
22 එහි ගොස් පඬුල බමුණු දිටී "දරුව තෝ පඬුකාභය කුමර
දැ" යි විචාරා "එසේය" යි කීකල ඔහුට සත්කාරකොට "දරු
23 ව තෝ රජවන්නෙහිය සමසැත්තෑ වසක් රජය කරන්නෙ
හිය සිල්ප උගණුව" යි කියා ශිල්ප ඉගැන්වී. ඔහුගේ චන්ද්‍ර
නම් පුතුහු වහා සිප් නිමවූවහට යොධයන් සඞ්ග්‍රහ පිණිස
24 ඒතෙමේ මසු ලක්ෂයක් දුන්නේය. එසින් පන්සියයක් යොධ
යන් සඞ්ග්‍රහකළ කල්හි ඒතෙමේ "යමෙක් විසින් ගන්නාලද්දා
25 වූ පණීයෝ රන් (බදුන්) වූනම් ඇය මෙහෙසිය කරව මා පුතු
26 ද පෙරවිකර" යි කීය. මෙසේ කියා වස්තුදී යොධයන් සහිත
කුමර එසින් මෙහෙයි. පින්වත් ඒ කුමර මම (පඬුකාභ
යෙමි) අස්වා ඉන් පිටත්ව අවුත් කසාගලවෙත නුවරදී
27 සත්සියයක් පුරුෂයන්ද සියලුන්ට භෝජනද (ලැබ)

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

28 ලැබූ බලඇත්තේ ඉක්බිති එක්දහස් දෙසියයකින් පිරිවර
29 ණලද කුමරතෙමේ ගිරිකණ්ඩපව් නම් තෙනට ගියේය. පඬු
කාභය කුමරහු මයිල් ගිරිකණ්ඩසිව නම් කුමර පඬුවස්දෙව්
30 රජුවිසින් දෙනලද ඒ දෙසය අනුභව කෙරෙයි. ඒ ක්‍ෂත්‍රිය
31 තෙමේ එකල්හි සියක් කිරියක පැසුනු ගොයම් කප්වයි.
උහුගේ දියනිවූ රූවත්වූ පාලි නම් ක්‍ෂත්‍රිය කුමරියක් වූවා.
32 ඕතොමෝ සොබනා යානකට නැගී පියානන්ටත් ගොයම්
කපනනන්ට බත්ගෙනනාගෙණ සහපිරිවරින් යනනීය. කු
33 මාරයාගේ මිනිස්සු ඒ කුමරිය දැක කුමරහට දැන්වූය. කුමර
තෙමේ පිරිස් සහිතව වහා ආයේ ඒ පිරිස දෙකඩකොට
34 ඈය වෙතට සිය යානාව යැව්ය "කොහි යයිද" යි ඈය විචා
ළේය. ඈයවිසින් (වූපරිදි) සියලුල කීකල ඒ ක්‍ෂත්‍රියතෙමේ
35 ඈයකෙරේ ඇලුනු සිත්ඇත්තෝ තමහට බෙදනු පිණිස
බතින් යාච්ඤාකෙළේය. ඒ ක්‍ෂත්‍රියාතොමෝ යානාවෙන්
බැස රන් පසින් බත්ගෙණ නුගරුකක් මුලදී රජකුමරහට
36 දුන්නාය. සෙසුජනයා බත්කවන්ට නුගකොල ගත්තාය.
37 එකෙණෙහි ඒ පර්ණයෝ රන්බඳුන් වූහ. රජකුමර ඒ දැක
38 බමුණ කීවා සිහිකොට "මහෙසිකා භාවයට සොබනා
කනකවක් මට ලැබුනාය" යි සතුටුවී: ඒ සියල්ලන් බත්කැවී
ය. නමුත් ඒබොජුන් ක්‍ෂයනොවූයේය. එකෙකුගේ කොටස
39 ගත්තාසේ එහි පෙණුනේය. මෙවැනි පින්ගුණයෙන් යුක්ත
වූ සුකුමාල ඒ කුමාරිකා එතැන්පටන් ස්වර්ණපාලි නමින්
ප්‍රසිඬවිය.

40 ඒ කුමරියගෙණ යානාවට නැගී ක්‍ෂත්‍රියතෙමේ මහාබල
සේන් පිරිවරණලදුයේ නිසැකින් පලාගියේය. ඒ අසා කුම
41 රියගේ පියතෙමේ සියලු මිනිසුන් එව්ය. ඔව්හු ගොස්
කලහකොට කුමාරභටයන් විසින් තර්ජනය කරණලදාහු
42 පෙරලා අවුය. එහි කළ නුවර ඒ හේතුවින් කලහ නගර
නම්වී. ඒ අසා ඈයගේ පන්බෑයෝ යුදපිණිස අවුය. පඬුල
43 බමුණපිත් චන්ද්‍රකුමර උන් සියල්ලන් මැරවී. ඔවුන් යුදකළ
බිම ලෝහිත වාහඛණ්ඩයයි (ලේවාකඩයයි) නම් ලැබූය.

44 ඉක්බිති පඬුකාභය කුමර ගඟින් එතර දොළුගලට ගියේ
45 ය. එහි සතර අවුරුද්දක් වාසයකෙළේය. මයිල්හු එප
වත් අසා රජහු හැර ඔහුහා යුදපිණිස එළඹියෝය. දුම්
46 රක්ගල වෙත කඳවුරු පිහිටුවා බෑනාහා යුඬකළෝය. බෑ
47 නතෙමේ වනාහි මයිලන් ලුහුබැඳ ආය. ගඟින් මොබ
පළවා හැර උන්ගේ කඳවුරෙහි දවුරුද්දක් විසීය. ඔව්හු
48 උපතිස් ගමට ගොස් රජහට එපවත් කිවූය. ඒ රජ රහස්

Digitized by Google

සහිත හස්නක් කුමරහට (එවනුයේ) "තෝ ගඟින් එතර
49 අනුභවකර ඉන් මොබ නගම්හි එවා" යි කියා යැවීය.
50 රජහුගේ බෑයෝ නවදෙනා ඒ අසා රජහට කිපියෝ
"තෙපිම බොහෝකලක් ඔහුට උපකාර වෙහිය දැන් රට
51 දෙහි එහෙයින් තොප මරනාමුය" යි කීවුය. ඒ රජ උන්ට
රජය පාවාදුන්නේය. ඒ සියල්ලෝ එකඟව තිස්ස නම් බෑයා
52 රජයට ප්‍රධානකළෝය. අභයදයක මේ අභය රජතෙමේ
විසිහවුරුද්දක් ඒ උපතිස් ගම්හි වෙසෙමින් රජයකෙ
ළේය.
53 දුම්රක්ගල වසන වෙතියා නම් යකිනි තිඹිරියගහ
54 විලෙහි වෙළඹරුවින් ඇවිදිනීය. සුදුසිරුරු හා රත්පාඇති
55 සිත්කළු ඒ වෙළඹ එකෙනක් දැක "මෙහි මෙබඳු වෙළඹක්
වසන්නීය" යි කුමරහට දැන්විය. කුමරතෙමේ රුහැණගෙ
ණ ඇය අල්වාගන්ට එළඹියේය. පශ්චාත්භාගයෙන් ආවහු
56 දැක ඒ කුමරහු තෙදින් ඕතොමෝ හයදිවා අතුරුදහන්
නොවී දිවුවාය. ඒතෙමේ දුවන්නීය ලුහුබැන්දේය. දුව
න්නාවූ ඕතොමෝ ඒ විල සිසාරා සත්යලක් දිවුවාය. මහ
57 ගඟ බැස එයින් එතරව නැවත සත්යලක් දුම්රක්
58 ගල සිසාරා දිවුවාය. නැවත එම විල වටා තුන්යලක් දිවූ
59 වාය. ඉයින් ඉක්බිති කච්ඡකනම් තොටින් ගඟට බටුවාය.
ඒතෙමේ එහිදී වාලධියෙහි ඇයද ගෙහෙහි යන තල්පතක්ද
ගත්තේය. ඔහුගේ පින්තෙදින් ඒ තල්පත මහ කඩුයෙක්
60 විය. ඇට "තී මරම්" කියා කඩුව එසවීය "ස්වාමීනි ඔබට
රජය ගෙණදෙමි මා නොමැරුව මැනව" යි කීවාය. ඒ
61 තෙමේ ඇය ග්‍රීවයෙහි අල්වාගෙණ කඩුසිළින් නාසායෙහි
62 විද යොතින් බැන්දේය. ඈ වසඟවී. මහත් බලඇති ඒ
තෙමේ වෙළඹ නැගී දුම්රක්ගලට ගොස් එහි සතර අවුරුද්
63 දක් වාසයකෙළේය. හටසේනා සහිතවූයේ රිටිගලට අවු
දින් යුධකාලය බලමින් එහි සත්අවුරුද්දක් වාසයකෙ
ළේය.
64 මසිලන් දෙදෙනකුහැර ඔහුගේ සෙසු අටමපිල්හු දූද
65 යට සැරහුනෝ ඒ රිටිගලට එළඹ (එහි පෙරපිහිටි) සුඩාකුව
66 ර කඳවුරු පිහිටුවාගෙණ සිවුරඟ සෙන් දී සෙනෙවියා යවා
සාත්පසින් රිටිගල වටලැවූය. යකිනියගේ මනාත්‍රණයකොට
ඈගේ වාචොයුක්තියෙන් රාජපරීෂ්කාර පඬුරු ආයුධයන්ද
67 දී "මේ සියලු උපකරණයන් ගණිව මම තොප ක්ෂමාකාර
වනෙනාමි" මෙසේ කියා කුමාරතෙමේ පෙරතුව බලසෙන්
68 යැවීය. "ප්‍රවිෂ්ටවූ ඔහු ගන්නෙමෝය" යි ඔවුන් විශ්වාසවූ

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

28 ලැබූ බලඇත්තේ ඉක්බිති එක්දහස් දෙසියයකින් පිරිවර
29 කළද කුමරතෙමේ ගිරිකඬපව් නම් තෙනට ගියේය. පඬු
කාභය කුමරහු මපිල් ගිරිකඬසිව නම් කුමර පඬුවස්දෙව්
30 රජුවිසින් දෙනලද ඒ දෙසය අනුභව කෙරෙයි. ඒ ක්ෂත්‍රිය
31 තෙමේ එකල්හි සියක් කිරියක පැසුනු ගොයම් කප්වයි.
උහුගේ දියනිවූ රූවත්වූ පාලි නම් ක්ෂත්‍රිය කුමරියක් වූවා.
32 ඕතොමෝ සොබනා යානකට නැගී පියානන්ටහා ගොයම්
කපනනන්ට බත්ගෙනනාගෙණ සහපිරිවරින් යනනීය. කු
33 මාරයාගේ මිනිසසු ඒ කුමරිය දැක කුමරහට දැන්වූය. කුමර
තෙමේ පිරිස් සහිතව වහා ආයේ ඒ පිරිස දෙකඩකොට
34 ඇය වෙතට සිය යානාව යැවිය "කොහි යසිද" සි ඇය විචා
ළේය. ඇයවිසින් (වූපරිදි) සියලු කීකල ඒ ක්ෂත්‍රියතෙමේ
35 ඇයකෙරේ ඇලුනු සිත්ඇතියේ තමහට බෙදනු පිණිස
බතින් යාච්ඤාකෙළේය. ඒ ක්ෂත්‍රියාතොමෝ යානාවෙන්
බැස රන් පයින් බත්ගෙණ නුගරුකක් මුලදී රජකුමරහට
36 දුන්නාය. සෙසුජනයා බත්කවන්ට නුගකොල ගත්තාය.
37 එකෙණෙහි ඒ පණ්යෝ රන්බදුන් වූහ. රජකුමර ඒ දැක
38 බමුණ කීවා සිහිකොට "මයෙසිකා භාවයට සොබනා
කාන්තාවක් මට ලැබුනාය" සි සතුටුවී: ඒ සියල්ලන් බත්කැවී
ය. නමුත් ඒබොජුන් ක්ෂයනොවූයේය. එකෙකුගේ කොටස
39 ගන්නාසේ එහි පෙණුනේය. මෙවැනි පින්ගුණයෙන් යුක්ත
වූ සුකුමාල ඒ කුමාරිකා එතැන්පටන් ස්වර්ණපාලි නමින්
ප්‍රසිද්ධවිය.

40 ඒ කුමරියගෙණ යානාවට නැගී ක්ෂත්‍රියතෙමේ මහාබල
යෙන් පිරිවරණලදුයේ නිසැකින් පලාගියේය. ඒ අසා කුම
41 රියගේ පියතෙමේ සියලු මිනිසුන් එවිය. ඔව්හු ගොස්
කලහකොට කුමාරභටයන් විසින් තර්ජනය කරණලදාහු
42 පෙරලා අවුය. එහි කළ නුවර ඒ හේතුවින් කලහ නගර
නම්වී. ඒ අසා ඇයගේ පස්බෑයෝ යුදපිණිස අවුය. පඬුල
43 බමුණපිත් චන්ද්‍රකුමර උන් සියල්ලන් මැරවී. ඔවුන් යුදකළ
බිම ලෝහිත වාහඛණ්ඩයයි (ලේවාකඩයයි) නම් ලැබූය.

44 ඉක්බිති පඬුකාභය කුමර ගඟින් එතර දෙළුගලට ගියේ
45 ය. එහි සතර අවුරුද්දක් වාසයකෙළේය. මපිල්හු එප
වත් අසා රජහු හැර ඔහුහා යුදපිණිස එලඹියෝය. දුම්
46 රක්ගල වෙත කඳවුරු පිහිටුවා බෑනාහා යුදකළෝය. බෑ
47 නාතෙමේ වනාහි මපිලන් ලුහුබැඳ ආය. ගඟින් මොබ
පළවා හැරී උන්ගේ කඳවුරෙහි දෑවුරුද්දක් විසීය. ඔව්හු
48 උපතිස් ගමට ගොස් රජහට එපවත් කිවූය. ඒ රජ රහස්

සම්ග සමඅස්නෙහි හිදගෙණ දෙවි මිනිස් නැටුම් කරව
88 මින් රතික්‍රීඩායෙන් යුක්තව සිත්ඇලවී. දෙරගම් සතරද
අබාවැවද එසේම මහත් සොහොන්භූමිය හා දම්ගෙඩිය
89 හෝ වධස්ථානයද බටගිරි රාජනද වෙසමුණියා නුග (දෙ
වොල) ද වැදිදෙවියා තල් (දෙවොල) ද සභාග වස්තුවද
90 ප්‍රණහද ගොසද යන මෙතෙක්ද බටගිරිදොර දිසාභාගයෙහි
ඒ රජතෙමේම පිහිටවී.
91 නගරශොධක පන්සියයක් සැඬොල් මිනිසුන්ද වච්චශ්
ශොධක දෙසියයක් සැඬොල් පුරුෂයන්ද මලමිනී බැහැර
92 ගෙණයනනාවූ එක්සිය පණසක් සැඬොලුන්ද එතෙක්ම
(එක්සිය පණසක්) සොහොන්ගොව් සැඬොලුන්ද සො
93 හොනින් වයඹදිග උන්ගේ ගම්ද පිහිටවිය. ඒ මිනිස්සු
විධිවූ පරිදෙන් ඒ කම්මයන් කළාහුය. ඒ සැඬොල්ගමට
94 ඉසානදික්හි නීචසුසානයයි නම්ලත් සැඬොලුන්ගේ සො
95 හොන කරවී. ඒ සොහොනින් උතුරුදිග පහන්පව් අතර
වැදුන්ගේ ගෙවල්පෙළ පිහිටුවන ලද්දේවිය.
96 එට උතුරුදිග්හි ගාමුණුවැව දක්වා නොයෙක් තවුසන්
97 ගේ අසපුව කරණලද්දේවී. එම සොහොනට පෙරදිග
98 රජතෙමේ ජෝතිය නිගණ්ඨයාගේ ගෙය කරවී. එම පෙ
දෙස ගිරිනම් නිගණ්ඨතෙමේද නානා පාෂාඩයෝද බො
99 හෝ ශ්‍රමණයෝද විසූහ. එසේම රජතෙමේ කුම්භඬනම්
නිගණ්ඨයා පිණිස දෙවොලක් කරවී. ඒ දෙවොල එනම්
100 විය. එයින් බටගිරි භාගයෙහි වතබපාළියෙන් පෙරදිග
101 මිථ්‍යාදෘෂ්ටි කුලයන් පන්සියයක් විසීය. එසේම ඒ රජතෙ
මේ ජෝතියගෙයින් ඔබ ගාමුණුවැවින් මොබ පරිබ්‍රාජකා
102 රාමයක් කරවිය. ආජීවකයන් ගෙයක්ද බමුණන්ට ආධාර
ගෙයක්ද සිවිගෙයක් හා ආශිර්වාදශාලාවක්ද ඒ ඒ තැන
103 කරවී. ලංකෙන්ද්‍ර පඬුකාභය රජතෙමේ අභිෂෙකලත් දශ
104 වස් ඇතොත් මුළුලක්දිව්හි ග්‍රාමසීමා නියම කෙළේය. යක්ෂ
භූතයන් සගලුකොට ඇති ඒ රජතෙමේ දෘෂ්‍යමානවූ කාළ
වේළය චිත්‍රරාජය යන මොවුන් සමග සම්පත් අනුභව කෙ
105 ළේය. පඬුකාභය රජහටද අභයරජහටද අතර රජුන්
නැති සතලොස් අවුරුදක්වූහ.
106 ධෘතිමත් ඒ පඬුකාභය රජතෙමේ සත්තිස් වස්ඇතොත්
රජබවට පැමිණ රම්‍යවූ නොසබුවූ සමෘඩවූ මේ අනුරාපුරෙහි
සැත්තෑ අවුරුදක් රජය කෙළේය.

මෙතෙකින් සුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වංශ පඬුකාභයාභිෂෙක නම්වූ දසවන අදියර නිමි.

11 වෙනි පරිච්ඡේදය.

1 ඒ රජු ඇවෑමෙන් සුවර්ණපාලි බිසවුන්පිත් එම රජුටදාවූ
2 මුටසීවයයි ප්‍රසිද්ධ කුමර නිරාකුල රජයට පැමිණියේය. ඒ
රජතෙමේ පලමල්තුරින් ශොභනා මහාමෙඝවනොද්‍යාන
3 නම්වූ අනූනගුණයෙන් යුක්ත යහපත් උයන කරවීය. උයන්
බිම්ගන්නා දවස නොකල් මහවැස්සක් වටුයේය, එහෙ
4 යින් ඒ උයන මහාමෙඝවන නම්වී. මුටසීව රජතෙමේ
ලඞ්කා මහීකාන්තාවගේ මුහුණුබඳු යහපත් පුරශ්‍රෙෂ්ඨවූ
අනුරාධපුරෙහි සැටවසක් රජය කෙළේසි.

5 ඒ රජහට උනුන් හිතෙසිවූ පුතුන් දසදෙනෙක් වූහ. කුල
6 යට සුදුසු කීකරුවූ දූන් දෙදෙනෙක්ද වූය. දෙවානම් පිය
තිස්ස (දෙවෙනි පෑතිස්ස) යයි ප්‍රසිද්ධවූ දෙවැනි පුත්‍රතෙමේ
ඒ සියලු සහෝදරයන් අතුරෙන් පින්පැණ ගුණෙන්
අධිකවී.
7 ඒ දෙවෙනි පෑතිස් කුමර පියරජහු ඇවෑමෙන් රජ විය
8 ඒ රජහුගේ අභිෂෙකය කැටිවම බොහෝ අරුම දෑ වූහ. මුළු
ලක්දිවහි පොළෝතුළ පිහිටි නිධානයෝද රත්නයෝද
9 උඩනැගී පොළෝතලයට නැංගාහ. ලක්දිවවෙත බුන්
10 නැව්හි පිහිටියාවූද ඒ සමුද්‍රජාතවූද රත්නයෝ ගොඩනැං
ගාහ. ඡාතපව්වත පාදයෙහි හුණයටි තුනක් උපන්හ,
11 ප්‍රමාණයෙන් රියකෙවිටි පමණය; ඉන් එකක් ලතායෂ්ටි
නම, එහි ලතාවෝ කලධෞතවර්ණ ඇත්තෝය; සිත්කළු
12 ඒ ලතාවෝ රන්වන්ව සිත්අලවමින් පැණෙති, ඉන් එකක්
කුසුමයෂ්ටිනම එහි වනාහි නොයෙක් වර්ණඇති අතිශුභවූ
13 නොයෙක් කුසුමයෝ පැණෙති. එකක් ශකුනයෂ්ටිනම,
එහි බොහෝවූ නොයෙක්වර්ණඇති නානා වර්ගයෙහි
මෘග පක්ෂීහු දිවිඇත්තාවුන්සේ පැණෙති.
14 හයමුතුය ගජමුතුය රථමුතුය ආමලකීමුතුය වලලුමුතුය
අඟුලිවෙඨකමුතුය කකුධඵලමුතුය ප්‍රකෘතිමුතුය යන මේ
15 අටජාතිඇති මුක්තාවෝ මුහුදින් නැගී වෙරළෙහි වැටී
යක්සේ සිටගත්තාහ. මේ සියල්ල දෙවෙනි පෑතිස් රජහු
16 ගේ පින් පැලඹීමෙකි. ඉඳුනිල් වෙරළුමිණි පියුම්රාමිණි
යන මේ (මැණික් පොළෝතෙලෙහි නැගීසිටියහ). මෙකී
17 රුවන්ද යටකී මුතුද ඒ යෂ්ටීන්ද (ඔවුනුපලන්) සත්දවස
ඇතුළතම රජුවෙත එලවූහ, ඒ දැක සතුටුවූ රජතෙමේ
18 "අනර්ඝ මේ රත්නයන්ට මා මිතුරු දම්සෝ රජතෙමේ

Digitized by Google

සුදුස්සේය අනිකෙක් නුසුදුස්සේය, එහෙයින් මේ රුවන්
19 ඔහුට දෙන්නෙමැ"යි සිතුය. දෙවෙනි පෑතිස්සය දම්සෝය
යන මේ (මිහිපල්හු) දෙදෙනා බොහෝකල් පටන් අදුටු
මිත්‍රයෝය, ඉක්බිති ඒ (දෙවෙනි පෑතිස්) රජතෙමේ බෑ
20 ණවූ මහාරිට්ඨ නම් ඇමැතියා ප්‍රධානකොට බමුණය ඇමැ
21 තියාය ගණකය යන ඒ සතරදෙනා බලසමූහයෙන්
22 පිරිවරණලදුවන් දූතයන් කොට මැණික්ජාති තුනය ඒ
තුන් රථයෂ්ටීහුය දක්ෂිණාවෘත්ත ශඞ්ඛය යටකී අවජාති
23 මුතුය යන මේ අනගි රත්නයන් අතවදී (දම්සෝ රජුවෙත)
යවූයේය. ඔව්හු දඹකොළ පටුනෙන් නැව්නැඟී සැපයේ
සත්දවසකින් (මුහුදුපිට ගොස්) තොටලැබ පසුව ඉන් සත්
24 දවසකින් පැළලුප්නුවරට පැමිණ දම්සෝ රජහට පඬුරු
දුන්හ. ඒතෙමේ ඒ දැක සතුටුවිය.
25 “මෙබඳු රත්නයන් මෙහි මට නැත්තාහ”යි මෙසේ
26 සිතා සතුටුවූ රජතෙමේ අරිටුනම් (කුමරහට) සෙනෙවි
තනතුරුද බමුණට පෙරෙවිබැව්ද දුන්නේය. ඒ ඇමැතිය
27 හට වනාහි දණ්ඩනායක තනතුරුද ගණකයහට සිටු තන
තුරුද දුන්නේය. ඔවුන්ට අනල්ප භොගයන්ද වාසයට
ගෙවල්ද දී ඇමැතියන්හා මන්ත්‍රණය කොට ප්‍රතිපඬුරු දැක
28 වල්විදුනාය මඟුල්කඩුව සේසත මිරිවැඩිසඟල ඉස්වෙළුම
පාමගය කෙඩිකාව හරිපර්වතයෙහි හටගන්නා සඳුන
29 නොදෙව්නා කෙළක් පිළිය මාහැඟි අත්පිස්නාය නයින්
30 විසින් ගෙනෙණලද අජනය අරුණුවන් මැටිය අනෝ
තත්ත විලින් ගෙණ ජලය ගඟාජලය සක්ගෙඩිය නන්ද්‍යා
31 වෘත්තය වර්ධමානකය කුමාරිකාය රන්බඳුන් බඳුය මාහැඟි
32 සිවිකාය මාහැඟි අරළු නෙල්ලිය අමාඔසුය ශුකනාහත
33 ඇල් හැටදහසක් අමුණ පිරිවරින් වෙසෙසනලද අභිෂෙ
කොප කරණයන්ද දී නරෙශ්වරතෙමේ සුදුසු කාලයෙහි යහ
ලුවාට පඬුරුත් මේ මතුකියන දහම් පඬුරුත් දී දූතයන්පෙ
34 රලා එවූයේය. “මම බුදුන් දහම් සඟ සරණ ගතද්දෙමි
ශාක්‍යපුත්‍ර බුදුසසුන්හි උපාසකබැව් ගිවිසෙමි. නරෝත්ත
35 මය තෙපිද ශ්‍රද්ධාවෙන් සිත පහදාගෙණ මේ තුනුරුවන්
36 සරණ යව. නැවතත් මාගේ යහලුවාහට අභිෂෙක කර
ව”යි කියා යහලු දම්සෝ රජතෙමේ සත්කාරකොට ඒ
ඇමැතියන් එවී.
37 ඒ ඇමැතිදූතයෝ ඉතා සත්කාර කරණලද්දෝ පස්මසක්
එහි වැස වෙසක්මස ශුක්ලපක්ෂයෙහි පෑලවියදා පිටත්වූ
38 වෝ, දමලිපතියෙහිදී නැව්නැඟී දඹකොල පටුන බැස

Digitized by Google

39 දෙළොස්වක්දා මෙහි පැමිණ රජහු දුටහ. දූතයෝ ඒ පඬු
රු ලඞ්කාරජහට දුන්නාහුයි. ලඞ්කාපතිතෙමේ ඔවුන්ට
40 මහත් සත්කාර කෙළේය. ස්වාමියා කෙරෙහි ඇදහිලිඇති
ඒ ඇමැතියෝ උඳුවප් පුර පැළවිය දවස්හි අභිෂේක ලද්ද
41 වූද ලඞ්කේන්ද්‍රයා ධර්මාශෝක රජහුගේ වචනය කියා ස්වා
මින්ගේ අභිවෘද්ධියෙහි ඇළුනාහු ලඞ්කාවැස්සාහට හිත
වැඩෙහි ඇළුනු (රජහු) නැවතද අභිෂේක කළෝයි.
42 දෙවානම්පිය යනු උපපද නම්කොට ඇති ජනයාහට
සැපදෙන්නාවූ ඒ නරේන්ද්‍රයා වෙසක්මස පුණු පොහෝද
ලක්දිවිහි ඉතා ප්‍රසිද්ධ සමෘද්ධි උත්සවයෙහිදී මෙසේ තමන්
(නැවත) අභිෂේක කෙළේයි.

මෙතෙකින් හුදීජනයා පහන් සංවේග පිණිස කළ මහ
වස දෙවානම්පියතිස්සාභිෂේක නම්වූ එකොළොස්වන අදි
යර නිමි.

---

12 වෙනි පරිච්ඡේදය.

1 බුදුසසුන් බබුළුවන්නාවූ ඒ මොග්ගලිපුත්ත මහාස්ථවිර
2 තෙමේ (තුන්වන) සඞ්ගායනාව නිමවා මතුකාලය බලන
සේක්, ප්‍රත්‍යන්ත ජනපදයන්හි සසුන් පිහිටනබැව් බලා
වප්මස්හිදී ඒ ඒ තෙරුන් ඒ ඒ ජනපදයනට යැවූසේක.
3 කශ්මීර ගන්ධාර රටට මජ්ඣන්තික නම් මහාතෙරහු යැවූ
සේක. මහිස මඬලයට මහාදෙව මහතෙරහු යැවූසේක.
4 වනවාසි දෙසයට රක්ඛිත නම් මහතෙරහු යැවූසේක. වැළි
අපරන්ත දේශයට යොණක ධර්මරක්ෂිත නම් මහතෙරහු
5 යැවූසේක. මහාරාෂ්ට්‍ර ජනපදයට මහාධර්මරක්ෂිත ස්ථවිර
නම් මහතෙරහු යැවූසේක. මහාරක්ෂිත මහතෙරහු
6 වනාහි යවන ලොකයට යැවූසේක. හිමවත් පෙදෙසට
මධ්‍යම නම් මහතෙරහු යැවූසේක. සුවර්ණභූමි නම් දෙශ
7 යට ශොණය උත්තරය යන මහතෙර දෙදෙනා යැවූසේක.
ප්‍රසිද්ධ මහාමහෙන්ද්‍රස්ථවිරය ඉෂ්ටියස්ථවිරය උත්තියස්ථවිරය
8 ශම්බලස්ථවිරය භද්‍රශාලස්ථවිරය යන ස්වකීය සද්ධිවිහාරික
ස්ථවිර පස්දෙනා "තෙපි (යොස්) මනොඥ ලක්දිවිහි
මනොඥ බුදුසසුන් පිහිටුවව" යි පිටත් කළසේක.

Digitized by Google

9 එකල්හි මහාඍද්ධිඇති ආරවාලනම් භයඞ්කර නාග
10 රජයා පාණ වැසිවස්වා කශ්මීර ගන්ධාර දෙරට පැසුනු සස්‍ය
වර්ගය සියල්ල මුහුද හෙලයි. මධ්‍යාන්තික නම් මහාස්ථවිර
11 තෙම වහා අහසින් එහි වැඩ අරවාල විල්හි දියපිට සක්
මන් ආදිය කළසේක. නාගයෝ ඒ දැක රොස්වූවෝ රජ
12 හට දැන්වූහ. වැලි කිපුනු ඒ නාරජතෙමේ අනෙකප්‍රකාර
භයඞ්කර ක්‍රියා කෙළේය. (එනම්) මහා වාතයෝ හමති,
13 මේඝය ගර්ජනා කෙරෙයි, එසේම වසිති, ඉන්ද්‍රාසනීහු පුපු
රති, ඒ ඒ දිගින් විදුලිගසති, වෘක්ෂයෝද පර්වතයන්ගේ
14 කූටයෝද ඇදවැටෙති. විකෘත රූපඇති නාගයෝද හැම
අතින් භයගන්වති. නාරජතෙමේත් තමා දුම්යි, නොයෙ
ක් පරිදෙන් ආක්‍රොශ කෙරෙමින් (ගිනිගත්තාසේ) දිලි
සෙයි.
15 ස්ථවිරතෙමේ ඒ සියලු භීෂණය ඍද්ධිබලයෙන් ප්‍රතිබාහ
නය කොට තමන් උතුම් බලය දක්වනසේක් "ඉදින් දෙව්
16 යන් සහිත ලෝවැසිතෙමේ අවුදින් මා භයගන්වනොත්
නමුත් මට භයභෛරවයක් උපදවන්ට හැකෙක් නො
17 වන්නේය. මහානාගය තෙපි ඉදින් සමුද්‍ර පර්වත සහිත
සියලු පොළොව ඔසවා මා මතුයෙහි දමනෙනහිද මට භය
18 භෛරවයක් උපදවන්ට හැකි නොවන්නාහිය නාගරාජය
19 හුදක් තටම වෙහෙස වන්නේය" යි වදාළසේක. ඒ අසා මද
සිඳුනු නාරජහට ස්ථවිරතෙමේ ධර්මදෙශනා කළසේක. ඉන්
20 පසු නාරජතෙමේ ත්‍රිසරණ පන්සිල්හි පිහිටියේය. එසේම
සුවාසූ දහසක් නාගයෝද හිමවත්හි බොහෝ ගන්ධර්ව
21 යෝද යක්ෂයෝද කුම්භාණ්ඩයෝද යන මොව්හු (ත්‍රිසරණ
පන්සිල්හි පිහිටියෝය) පණ්ඩක නම් යක්ෂතෙමේ වනාහි
හාරිත නම් යක්ෂිනිය පන්සියයක් පුතුන්ය යන මොවුන්හා
22 සෝවාන් ඵලයට පැමිනියේය. ඉක්බිති ඒ මහතෙරහුවන්
විසින් "දැන් මෙයින්මතු පෙරසේ ක්‍රෝධය නූපදවාවා ස
23 ස්‍යහානියද නොකරව්. සත්‍වයෝ සුවයක්ම කැමැත්තාහ
සතුන් කෙරෙහි මෙත්කෙරෙත්වා මනුෂ්‍යයෝ සුවසේ
වසත්වා" යි මෙසේ අනුශාසනා කරණලද්දාවූ ඔව්හු එසේම
පිළිපැද්දෝය.
24 ඉක්බිති ඒ නාරජ තෙරහුවන් රුවන්පලඟ හිඳුවා පවන්
සලමින් උන්වහන්සේ වෙත සිටියේය. එකල කශ්මීර
25 ගන්ධාර රටවැසි මිනිස්සු නාරජහට පූජාපිණ්ඩ එළඹියාහු,
26 මහාඍද්ධිඇති තෙරුන්කරා ගොස්, තෙරුන්ම අභිවාදනාය
කොට එකත් පසෙක හුන්නාහ. ස්ථවිරතෙමේ ඒ මිනි

HARVARD COLLEGE LIBRARY

Digitized by Google

27 ඔහුන්ට ආශීවිෂොපම සූත්‍රය දෙසනාකළසේක. අසූදහ
සක් ප්‍රාණීන්ට ධර්මාභිසමය වී. ලක්‍ෂයක් මිනිස්සු තෙරුන්
28 වෙත පැවිදිවූහ. එතැන් පටන් ඒ කාශ්මීර ගන්ධාර වැස්
සෝ මෙදක්වාම තුනුරුවන් සරණ පරායණවූවෝ, කසා
පිළියෙන් හෙබියෝය.

29 ඒ මහාදෙවස්ථවිරතෙමේ මහිසමඬල දෙශයට වැඩ ජන
යා මැද පැමිණිසේක්, දේවදූත සූත්‍රාන්තය වදාළසේක. සත
30 ළිස් දහසක් ප්‍රාණීහු අධිගම ලැබූවෝය. සතළිස් දහසක්
31 පුරුෂයෝ උන්වහන්සේ වෙත පැවිදිවූහ.——වැලිරක්ෂිත
නම් මහාස්ථවිරතෙමේ වනවාස දනව් පැමිණ අහසෙහි
32 වැඩසිට ජනයා මධ්‍යගතවූසේක්, අනවරාග්‍රසංයුක්තය වදාළ
සේක. සැටදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය වී. සත්තිස්
33 දහසක් මිනිස්සු උන්වහන්සේවෙත පැවිදිවූහ. ඒ දෙශ
යෙහි විහාර පන්සියයක් පිහිටියේය. ඒ මහාස්ථවිරතෙමේ
34 ඒ ජනපදයෙහි බුදුසසුන් පිහිටවූසේක——ධර්මාධර්ම දැන්
මෙහි පණ්ඩිතවූ යොණක ධර්මරක්ෂිත නම් මහාස්ථවිරතෙ
මේ අපරන්තක දනව් වැඩ ජනයාමැද පැමිණිසේක්, අග්ගි
35 ක්ඛන්ධූපමසූත්‍රය වදාරා එහි පැමිණි සත්තිස් දහසක් ප්‍රාණීන්
36 දහම් අමා පෙවූසේක. පුරුෂයන් දහසක්ද ඊට වැඩියක්
37 ක්‍ෂත්‍රියද රජකුලෙන්ම නික්ම පැවිදිවූහ——ඒ මහාධර්ම
රක්ෂිත නම් මහර්ෂීතෙමේ මහරටට වැඩ එහිදී මහානාරද
38 කාශ්‍යප ජාතකය වදාළසේක. සුවාසූ දහසක් ප්‍රාණීහු
මාර්ගඵලයට පැමිණියෝය. තෙළෙස් දහසක් මිනිස්සු උන්
වහන්සේ වෙත පැවිදිවූහ.

39 ඒ මහාරක්ෂිත නම් මහාඍෂීතෙමේ යොන්රට වැඩ ජන
යාමැද පැමිණිසේක්, කාලකාරාම සූත්‍රාන්තය වදාළසේක.
40 එක්ලක්‍ෂ සැත්තෑ දහසක් ප්‍රාණීහු මාර්ගඵලයට පැමිණි
41 යෝය. දසදහසක් දෙනා පැවිදිවූහ——මධ්‍යමනම් මහර්
ෂීතෙමේ සතරතෙරකෙනෙකුන්හා හිමවත් පෙදෙස් වැඩ
42 දම්සක්පැවතුම් සූත්‍රය වදාළසේක. අසූකෙළක් ප්‍රාණීහු
මාර්ගඵලයට පැමිණියෝය. ඒ ස්ථවිරවරයෝ පස්දෙනා
වෙන වෙන පස්රටක් පැහැදවූහ. එක් එක් තෙරකෙනෙ
43 කුන් වෙත ලක්‍ෂයක් ලක්‍ෂයක් මිනිස්සු සම්මාසම්බුදු සසුන්
44 හි ප්‍රසන්නයෙන් පැවිදිවූහ——මහාසෘද්ධිඇති සොණස්ථ
විරතෙමේ උතුරුතෙරුන් සමග ස්වර්ණභූමියට වැඩිසේක.
45 ජලරාක්‍ෂසියක් තොමෝ මුහුදෙන් නික්මඅවුත් රජගෙයි
උපනුපන් දරුවන් භක්‍ෂණය කොට පෙරලා මුහුදු වදනී
46 ය. එකෙණෙහි රජගෙහි දරුවෙක්ද උපනෙන්ය. මිනිස්සු

47 තෙරුන් දැක "රකුසන්ගේ යහළුවෝය" යි සිතා මරන්ට
ආයුධගත් අත්ඇතිව එළඹුනාහ. ඒ තෙරුන්වහන්සේලා
48 "මේ කිමෙක්ද" යි විචාරා ඒ මිනිසුන්ට "අපි සිල්වත් ශ්‍රම
49 ණයවහ රාක්ෂසියගේ යහළුවෝ නොවම්හ" යි වදාළෝය.
පිරිස්සහිත ඒ රාක්ෂසිතොමෝත් සාගරයෙන් නික්මුනාය.
ඒ දැක මහජනයෝ මහහඬින් හැඬූහ. ස්ථවිරතෙමේ භයඞ්ක
50 රවූ රකුසන් දෙගුණයක් මවාගෙණ පිරිස්සහිත ඒ රකුසිය
හාත්පසින් වටලූසේක. ඕතොමෝ "මොවුන් විසින් මේ
51 ස්ථානය ලබනලදැ" යි සිතා බියවැද පලාගියා. හාත්පසින්
ඒ දෙශයට අරකුත් තබා ස්ථවිරතෙමේ ඒ රැස්වූ පිරිසෙහි
52 බ්‍රහ්මජාලය දේශනාකළසේක. බොහෝ මිනිස්සු සරණ
53 සිල්හි පිහිටියෝය. සැටදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය
විය. තුන්දහස් පන්සියයක් කුලදරුවෝ පැවිදිවූහ. එක්
54 දහස් පන්සියයක් කුලකුමාරිකාවෝ පැවිද්දූහ. එවක්
පටන් මිහිපල්හු රජගෙහි උපන් කුමරුවන්ට සොණ
උත්තර තෙරනුවන් හා සමාන නම්කළෝය.
55 උන්වහන්සේලා වනාහි මහාකරුණාඇති බුදුන්ගේපවා
චිත්තාකර්ෂණය කටහැකි අධිගතාමෘත නිවන් සැපයපවා
අනුභව කෙරෙමින් නොහිද ඒ ඒ දනව් සැරිසරා ලෝවැස්
සහට යහපතක්ම කළෝය, එහෙයින් ලෝවැඩෙහි කවර
නම් නුවනැත්තෙක් පමාවනොන්ද? නොවේමැයි.

මෙතෙකින් සුදිජනයා පහන් සංවේගපිණිස කළ මහ
වස නාන,දෙසප්පසාදක නම් දෙලොස්වන අදියර නිමී.

---

13 වෙනි පරිච්ඡෙදය.

1 එකල උපසපන් දෙළොස් හැවිරිදිවූ මහානුවනැති ඒ
මහාමහෙන්ද්‍ර ස්ථවිරතෙමේ උපාධ්‍යායවූ මොග්ගලිපුත්තති
2 ස්ස තෙරුන්හා සඞ්ඝයා විසින් අණවනු ලත්සේක්, ලක්දිව්
පහයනට කල්බලමින් "මුටසිව රජ මහළුය පුත්‍රතෙමේ
3 රජවේව" යි සිතූසේක. ඒ අතර ඥතිවර්ගයා දක්නට සිතා
උපාධ්‍යායන් වහන්සේද සඞ්ඝයාද වැඳ පියරජු විචාළසේක.
4 යටකී තෙරුන්වහන්සේලා සතරදෙනාද කැටිව සඞ්ඝ
මිත්‍රා පිත් ෂඩ්අභිඥාහා මහාඍද්ධිඇති සුමණ සාමණේර
5 යන්ද ගෙණ නෑයන් සඞ්ග්‍රහ කරණට දක්ෂිණගිරි දනව්
වැඩිසේක. ඉක්බිති එහි හැසිරෙණ උන්වහන්සේට සම

Digitized by Google

6 සත් ඉක්මුනාහ. ක්‍රමයෙන් මවුබිසවුන් වසන වෙදිසගිරි
නුවර අවුත් මෑනියන් දුටුසේක. දේවීතොමෝ ප්‍රියපුතු
7 දැක පිරිස් සහිත උත්වහන්සේ වළඳවා තමා විසින් කර
වනලද යහපත් වෙදිසගිරි විහාරයට නැංගවූසේක.
8 ඒ අශෝක රජතෙමේ කුමාර කාලයෙහි සිය පියහු විසින්
දෙනලද අවන්තිරට අනුභවකෙරෙමින් පෙර උදේනිනුවර
9 යනකල වේදිස නම් නුවර නවාතැන් ගෙණ එහිදී මනා
10 රූඇති සිටුකුලෙහි උපන් දේවිනම් කුමරියක් ලැබ ඈය
සමග වාසය කෙළේය. ඕතොමෝ එසින් ගැබ්ගෙණ උදේනි
11 නුවරදී යහපත් රූඇති මහින්‍ද නම් ඒ කුමරහු වැදූවා. දූවූ
රූඇත් ඉක්ම සඞ්ඝමිත්‍රා නම් දුවද වැදූවා. මේ කාලයෙහි
12 ඒ බිසව් වේදිස නුවර වසනානීය. කල්දන්නා මහෙන්‍ද්‍රස්ථ
විරතෙමේ එහි වැඩහිඳ “මපියානන් විසින් අණවනලද
දෙවන අභිෂෙක මහොත්සවය, ඒ දෙවෙනි පෑතිස් මහ
13 රජතෙමේ අනුභවකෙරේවා, දූතයන් අතින්අසා තුනුරුවන්
14 ගුණ දනීවා, පොසොන් පුණු පොහෝ දවස්හි මිශ්‍රක පර්ව
තයට නගීවා, එදවස්ම අපි ද්‍රවර ලක්දිව් යන්නමෝය” යි
සිතූසේක.
15 මහෙන්‍ද්‍රතෙමේ උතුම්වූ මහෙන්‍ද්‍රස්ථවිරයන් කරා එළඹ
“ලක්දිව් පහන් කරවන්ට වැඩිය මැනව, බුදුන් විසිනුදු විය
16 කරණ කරණලදුයෙහිය, අපිදු ඊට උපකාර වන්නමෝය” යි
17 කීයේයි. මෙහෙසිය බුහුනන් පිත් භණ්ඩුක නම් කුමාරතෙමේ
තෙරුන් විසින් මවුබිසවුන්ට දේසනාකළ දහම් අසා අනා
ගාමි ඵලයට පැමිනියේ තෙරහුවෙත විසීය.
18 එහි මසක් වැස පොසොන් පුණුපොහෝදවස්හි ස්ථවිර
19 තෙමේ තෙරුන් සතරදෙනාය සුමණ සාමණේරය භණ්ඩු
කනම් ඒ අනාගාමි කුමාරය යන මොවුන්හා කැටිව නෑ
20 සින් බලා එහි නොඇළුනුසේක්, ඒ විහාරයෙන් අහසට නැගී
මහාසෘද්ධි ඇතිසේක්, ක්ෂණයකින්ම මෙහි වැඩ සිත්කළු
මිශ්‍රක පර්වතයෙහි පියල්කුළ උතුම් රුචිර අඹතෙලෙහි
වැඩසිටිසේක.
21 පරිනිර්වාණ මචකයෙහි හොත් මුනිරාජයන් විසින් ලක්
වැඩ පිණිස ලක්දිව් ප්‍රසාදකර ගුණයෙන් ප්‍රකාශකරණ
ලද්දාවූ ලක්දිව්හි බුදුහු බඳු ඒ මහාස්ථවිරතෙමේ ඊට වැඩ
පිණිස ලක්දිව්හි දෙවියන් විසින් පුදනලදුයේ එහි වැඩ
උන්සේක.

මෙතෙකින් සුදිජනයා පහන්සංවේග පිණිස කළ මහ
වස මහින්‍දාගමන නම්වූ තෙළෙස්වන අදියරනිමි.

Digitized by Google

14 වෙනි පරිච්ඡේදය.

1 ඒ දෙවෙනි පෑතිස් රජ නුවර වැසියන්ට දියකෙළි විධාන
2 කොට තෙමේ මුවදඩකෙළියට ගියේය. සතළිස් දහසක්
3 මිනිසුන් විසින් පිරිවරණලදුයේ පයින්ම දුවමින් මිශ්‍රක
පව්වතයට ගියේය. ඒ පව්හි වසන දෙවියා රජහට තෙ
4 රුන් දක්වනු කැමැතේ ගෝණවෙස ඇතෙත් තණපඳුරක්
කමින් සිටියාසේ දැක්විය. රජතෙමේ දැක "පමාවූවනු විදි
5 නට යුතුනොවෙ" යි සිතා දුනුදිය පෙළීය. ගෝණතෙමේ
පව්වතාන්තරයට දිවීය. රජතෙමේ ලුහුබැඳ ගියේය. මෑග
වෙස්ගත් ඒ දෙවිතෙමේ තෙරුන්වෙත ගොස් රජුවිසින්
තෙරුන් දුටුකල තෙමේ අතුරුදහන්වී.
6 ස්ථවිරතෙමේ "අප බොහෝදෙනා දුටුකල වැඩියක්ම
බාණේය" යි සිතා තමන් පමණක් දැක්වූසේක. රජතෙමේ ඒ
7 තෙරහු දැක බියපත්ව සිටියේය. ස්ථවිරතෙමේ ඔහුට "එව තී
ස්‍යය" යි වදාළසේක. තිස්‍යයයි යන බසින්ම රජතෙමේ යක්‍ෂ
8 යෙකැයි සිතිය. ස්ථවිරතෙමේ "මහරජතෙනි අපි ධර්මරාජ
න්වූ බුදුන් සව්ශ්‍රමණයම්හ තොපට අනුකම්පා පිණිසම දඹදි
9 වින් මෙහි ආම්හ" යි වදාළසේක. ඒ අසා රජතෙමේ පහවූ
10 බියඇතෙත්වී. යහලුවාගේ අසුන් මෙනෙහිකොට ශ්‍රමණ
යෝයයි නිශ්චිතකරණලදුයේ දුනුහී දමා ඒ තෙරුන්වෙත
එළඹ ඒ තෙරුන්හාසමඟ සතුටුවනුයේ උන්වහන්සේවෙත
හිඳගත.
11 එකල්හි මහරජහුගේ පිරිස් අවුදින් පිරිවැරූය. එකල්හි
මහාස්ථවිරතෙමේ සමග ආ සෙසු සදෙනා දැක්වූසේක. රජ
12 තෙමේ උන්වහන්සේලා දැක "මොව්හු කවද ආවෝදැ" යි
13 කීය. "මාසමගය" යි තෙරුන් විසින් වදාළකල නැවතත්
"මෙබඳු අන්‍යවූත් යතිහු දඹදිව්හි ඇද්දැ" යි මේ විචාළේය.
14 ස්ථවිරතෙමේ "ජම්බුද්වීපය තෙමේ කාෂායවස්ත්‍රයෙන් බබලයි
එහිවනාහි ත්‍රිවිද්‍යා ඇත්තෝය ඍද්ධිප්‍රාප්තයෝය පරසිත්
දන්නෝය දිව්‍යශ්‍රොත්‍රඇත්තෝය යන බුඩ්ශ්‍රාවකවූ බොහෝ
15 රහත්හු ඇත්තාහ" යි වදාළසේක. "කුමකින් වැඩිසේක්
දැ" යි විචාළේය. "දියෙන්හෝ ගොඩින්හෝ නොආවහ" යි
16 වදාරණලද්දාවූ ඒ රජතෙමේ අහසින් වැඩියහයි දන්නේය.
මහපැණඇති ඒ මහාස්ථවිරතෙමේ රජහු නැණ විමසන
සේක් ඔහුගෙන් පැණ පිළිවිසිසේක. පුළුවූත් පුළුවූත් ඒ ඒ
17 පැණ රජතෙම විසදුයේය "මහරජතෙනි මේ රුක කිනම්
දැ" යි විචාළසේක. රජතෙමේ "මේ තුර අඹනමැ" යි කීය.

"මේහැර අඹරුකෙක් ඇද්දැ" යි විචාළසේක. "බොහෝ අඹ
18 තුරු ඇත්තාහ" යි කීය. "මේ අඹතුරද ඒ අඹතුරුද හැර
වෙන තුරු ඇත්දැ" යි විචාළසේක. "වහන්ස බොහෝ
19 තුරු ඇත්තාහ ඒ තුරු අඹ නොවෙති" යි කීයේය. "ඒ අඹත්
නොඅඹත් හැර වෙනතුරු ඇද්දැ" යි විචාළසේක. "ස්වාමිනි
20 මේ අඹරුකය" යි කීයේය, "නරේශ්වරය පණ්ඩිතයෙහි" යි
වදාළසේක. "මහරජ තොපගේ නෑයෝ ඇද්දැ" යි විචාළ
21 සේක. "බොහෝදෙනෙක් ඇත්තාහ" යි කීයේය. "නො
නෑයෝත් ඇද්ද" යි විචාළසේක. "බොහෝ නොනෑයෝ ඇ
තියහ" යි කීයේය. "ඒ නෑයනුත් නොනෑයනුත් හැර අනි
22 කෙකුත් ඇද්ද" යි විචාළසේක. "මමමය" යි කීයේය. "මහ
රජ මැනව තෙපි පණ්ඩිතැ" යි වදාළසේක. මහානුවනැති ස්ථ
විරතෙමේ රජු පණ්ඩිතැයි දැන රජහට චූළහත්ථිපදෝපම සූත්‍රය
23 වදාළසේක. දේශනා කෙළවර ඒතෙමේ සතළිස් දහසක්
ඒ මිනිසුන්හා සරණයෙහි පිහිටියේය.
24 ඒ දවස් සන්ධ්‍යාකාලයෙහි රජහට ආහාර එලවූහ. "දැන්
මුන්වහන්සේලා නොවළඳත්හ" යි දන්නාමවූත් රජතෙමේ
"විචාරන්ටමු යුතුනොත්ය" යි ඒ තෙරුන් බතින් විචාළේය.
25 "දැන් නොවළඳම්හ" යි වදාළකල්හි ඒ තෙමේ වළඳන කාල
26 ය විචාළේය. කාලය වදාළකල්හි "නුවරට යම්හ" යි මෙසේ
27 කීයූ "මහරජ තෙපි යා. අපි මෙහි වසනානමෝය" යි වදාළ
සේක. "එසේකල කුමාරතෙමේ අප සමග යේව" යි කීයේය.
28 "මහරජතෙනි මේතෙමේ වූකල් පැමිනි ඵල ඇතේය,
දැනගන්නාලද බුදුසසුන් ඇත්තේය. පැවිදි අපේක්ෂා කරමින්
අප වෙත වසයි දැන් මොහු පැවිදිකරනෙනාමු මහරජතෙ
29 නි තෙපි යව" යි වදාළසේක. "පෙරවරු රථය එවනෙනම්
නුඹවහන්සේලා එහි සිටියෝ පුරයට වඩින්ව" යි කියා
30 තෙරුන් වැඳ හඬුනම් කුමරහු ඉවතකැඳවා තෙරුන්ගේ
අධිකාරය විචාළේය. ඒ කුමර රජහට සියල්ල කීය. තෙරුන්
ඇඳින ඉතා සතුටුවූ ඒතෙමේ "මාගේ ලාභය" යි සිතුයේය.
31 හඬුනම් කුමරහු ගිහිබැවින් අපගත ශඞ්කාඇති නරේන්ද්‍ර
යා මිනිස්බව දත්තේය. ඒ ස්ථවිර තෙමේ "මොහු පැවිදි
32 කරනෙනාමු" යයි එකෙණෙහිම ග්‍රාමසීමාවෙහිදී හඬුකනම්
33 කුමාරයාගේ පැවිදුත් උපසම්පදාවත් කළසේක. ඒ ක්ෂණ
යෙහිදීම උන්වහන්සේත් රහත් බවට පැමිනිසේක. ඉක්
34 බිති මහාස්ථවිරතෙමේ ඒ සුමණ සාමණේරයන්දැට "ධර්ම
ශ්‍රවණ කාලය ඝෝෂාකරව" යි වදාළසේක. "ස්වාමිනි අස්
වනනාවූ මම කොතෙක්තැන් හඬගාලන්නෙම්දැ" යි විචාළ

Digitized by Google

35 සේක. තෙරුන්විසින් "චූළ හත්ථිපදොපම දිවසිනා" යි වදාළ
කල අස්වන සාමණේරයන්ගූ සෘද්ධිබලයෙන් මුළුලක්දිව
36 දහම්කල් ඝොෂාකෙළේය. ඒ රජතෙමේ නාගචතුෂ්ක නම්
ගල්කෙම්පස හිඳගෙණ බත් අනුභව කෙරෙමින් ඒ ශබ්දය
37 අසා ඇමැතියන් යැවූයේය. ඔහුගොස් "උපද්‍රවයෙක් ඇද්
දේ" යි කීහ. "උපද්‍රවයෙක් නැතොත්ය. සම්බුධ වචන ශ්‍රව
38 ණයට කාලය ඝොෂාකරණ ලදැ" යි වදාළසේක. සාමණේර
39 යන්ගේ හඬඅසා භූමිනිශ්‍රිත දෙවියෝ ඝොෂාකළහ. පිළිවෙ
ළින් ඒ ශබ්දය බ්‍රහ්මලොවට නැංගේය. ඒ ඝොෂාවෙන් දෙ
වියන්ගේ මහාසමාගමය විය. ස්ථවිරතෙමේ ඒ සමාගම
40 යෙහි සමචිත්ත සූත්‍රය දේශනාකළසේක. අසංඛ්‍ය ගණන්
41 දේවතාවුන්ට ධර්මාභිසමයවී. බොහෝ නාගසුපර්ණාදීහු
සරණයෙහි පිහිටියෝයි. සැරියුත් තෙරුන් විසින් මේ සූත
දෙසනකල යම්සේ විනම් එසේම මහෙන්ද ස්ථවිරයන්
දෙසනකලත් දිව්‍යසමාගමය වූයේය.
42 රජතෙමේ පසුවදා උදය රථය එවූයේය. ඒ රියැදුරුතෙ
මේ ගියේ "රථයට නැංග මැනව නුවරට යමුය" යි උන්
43 වහන්සේලාට කීයේ r. "රථයට නොනැගෙමුහ තෙපි යව
තව පසුව එන්නමෝය" යි මෙසේ වදරා යහපත් කල්පනා
44 ඇති ඒ මහාසෘද්ධිඇති තෙරුන්වහන්සේලා රියැදුරා යවා,
අහසට නැගී නුවරින් නැගෙණහිර පළමු සෑතැන් වැඩීසේ
45 ක්ලාය. තෙරුන් විසින් පළමුවෙන් බස්නාලදතැන කළ
සෑය එහෙයින් පඨමකචෙතියයි මෙසේ අදවනතුරුත් කිය
46 නුලැබේ. යම් හෙයකින් සියලු අන්තඃපුරස්ත්‍රීහු රජහුඅතින්
තෙරුන් ගුණ අසා තෙරුන් දක්නට කැමැතිවූද එහෙයින්
47 මිහිපල්තෙමේ රාජවාසලවතුළම රම්‍යවූ මණ්ඩපයක් කරවී.
සුදුවූ වස්ත්‍රයෙන් හා මලින් වසනලද්දේවී. එසේම අලඞ්කා
48 රකෙළේය. තෙරුන්ගුවතදී උස්අස්නෙත් තොරබැව් ඇසූ
49 බැවින් ස්ථවිරතෙමේ උස්අස්නෙහි හිඳිනේයෝ නොවේ
දෝයි ශඞ්කාඇතිවී. ඒ අතර රථාචාරියා එහි සිටියාවූ සිවුරු
පෙරවන්නාවූ ඒ තෙරුන් දැක ඉතා විස්මිත සිත් ඇත්තේ
50 ගොස් රජහට දැන්වීය. රජතෙමේ සියල්ල අසා "පුටුහි හිඳී
ම නොකරන්නාහ" යි නිශ්චිතවූයේ "ඉතා මනාකොට බුම
51 තුරුණු පණවව්" යයි කියා පෙරගමන්කොට සතොස තෙ
52 රුන් වැද මහමිහිඳු තෙරුන්ගේ අතින් පාත්‍රය ගෙණ සත්
කාර පූජා කෙරෙමින් පුරයට තෙරහු ප්‍රවේශකෙළේයි.
53 නිමිත්ත ශාස්ත්‍ර දන්නෝ මෙසේ අසුන් පැණෙව්වා දැක
"උන්වහන්සේලා විසින් පොළොවතාමෝ හණනා ලද්දීය.

Digitized by Google

54 මේ දිවයිහි ඊශ්වර වන්නාහ" යි කිවුය. නරේන්ද්‍රතෙම ඒ තෙ
රුන් පුදමින් අන්තඃ පුරයට වැඩමවීය. ඒ තෙරුන්වහන්
සේලා එහි සුදුසු පරිභෙදන් පිළි අතුල අසුන්හි හිඳගත්
55 තෝය. නරේන්ද්‍රතෙමේ ඒ තෙරුන් කැඳ අවුළු හා භොජන
යෙන් සන්තර්පණය කෙළේය. බත්කිස නිම්කල්හි තෙමේ
56 වෙත හිඳගෙණ මහානාග නම් මල්නුවරරජහුගේ මෙහෙ
සිවූ රජගෙහිම වසන අනුලා නම් බිසව කැඳවීය. ඒ අනු
57 ලා දේවීතොමෝ පන්සියයක් ස්ත්‍රීන්හා අවුදින් තෙරුන්
58 වැඳ පුද එකත්පසෙක ඉඳගත්තාය. ස්ථවිරතෙමේ පේවත්
විමන්වත් හා සච්චසංයුක්තය දෙසූසේක. ඒ ස්ත්‍රීහු ප්‍රථම
59 ඵලයට පැමිනියෝය. නුවර වැසෝ ඊයේ දුටු මිනිසුන්
අතින් බොහෝවූ තෙරගුණ අසා තෙරුන් දක්නා කැමැත්
60 තාහු රැස්වගෙණ රජගෙයි දොර මහත්අරගල කළෝය.
රජතෙමේ ඒ අසා විචාර දැන ඔවුන්ට හිතකැමැතෙහ්
"සියල්ලන්ට මෙහි සම්බාධය, මඟුලැත්හල ශුඬකරව
61 නුවරවැසෝ එහිදී මේ තෙරුන් දක්නාහ" යි කීයේය. එ
62 කෙණෙහි ඒ ඇත්හල ශුඩකරවා වියන් ආදියෙන් අල
63 ඞ්කාර කොට සුදුසු පරිභෙදන් සෙනසුන් පැණවූහ, ඒ
මහාස්ථවිරතෙමේ තෙරුන් සමග එහි පැමිණ වැඩහිඳ
64 මහාකළිකා වූසේක් දේවදූත සූත වදාළසේක. රැස්වූ නුවරු
ඒ අසා පහන්වූය. උන්අතුරෙන් දහසක් ප්‍රාණීහු සෝ
වාන් ඵලයට පැමිනියෝය.

65 ලඞ්කාව පිහිටුවීමෙහි හෝ අභිෂේකකොට තැබීමෙහි ශා
ස්තෘ කෙනෙකුන්ගේ ආකාරඇති ලක්දිවට පහනක් බඳුවූ
ඒ මහාස්ථවිරතෙමේ මෙසේ දෙතැනෙක්හිදී හෙලදිව්
බසින් දහම් වදාර ලක්දිව්වැසි ජනයා කෙරෙහි සම්බු
ද්ධයාගේ බැසගැන්ම කරවූසේක හෙවත් සම්බුද්ධයෙහි ජනයා
පිහිටවූසේක.

මෙසේ සුදිජනයා පහන්සංවෙග පිණිස කළ මහවංශ
නගරප්පවෙසන නම් තුදුස්වන අදියර නිමි.

---

15 වෙනි පරිච්ඡේදය.

1 එහි පැමිනි ආදර සහිතවූ ඒ මනුෂ්‍යයෝ ඇත්හලද අන
2 වකාසයයි නුවර දකුණු දොරින් පිට ශාන්ද්‍රච්ඡායාඇති නිල්
තණතණින් යුක්තාවූ සිහිල් මනරම්වූ නන්දන නම් රජඋය

3 එහි තෙරුන්වහන්සේලාට හසුන් පැණවූහ. ස්ථවිර
තෙම (නුවර) දකුණු දොරින් නික්ම එහිද වැඩහුන්සේක,
4 ශ්‍රේෂ්ඨ කුලවත්වූ බොහෝ ස්ත්‍රීහුද එහි අවුත් උයන පුරව
මින් තෙරුන්වහන්සේට හුදුරුව උන්හ—ස්ථවිරතෙම
ඔවුන්ට බාලපණ්ඩිත නම් සූත්‍රාන්තධර්මය දෙසනා කළ
5 සේක—ඔවුන් අතුරෙන් දහසක් ස්ත්‍රීහු පළමුවෙනිවූ
සෝවාන් පලයට පැමිනියහ. මෙසේ ඒ නන්දන නම් උය
නෙහිම සවස්වේලාව වූයේය.
6 ඉක්බිතෙන් ස්ථවිරයෝතුමූ "එම පර්වතයට යම්හ" යි
නික්මුනාහ. (මනුෂ්‍යයෝ ඒබැව්) මහරජනන්ට දැන්වූහ.
7 රජතෙමේ වහා එතන්හි එළඹියේය. එළඹසිට "දැන් සවස්
විය, පර්වතයද දුරය මේ නන්දන වනයෙහිම විසීම පාසු
8 ය" යි ස්ථවිරයන්වහන්සේට සැලකෙළේය. "පුරයට අතිශ
යින් ආසන්න බැවින් නොසරුප්ය" යි වදාළකල්හි "මහ
9 මෙවුනා උයන ඉතා හුදුරු නොලංනැත සිත්කලුදඡා
යොදක සමන්විතදනේ එහි විසීම රුචිවේවා වහන්ස නැව
තුන මැනවැ" යි කීකල්හි ස්ථවිරතෙම එහි නැවතිසේක.
10 ඒ නැවැතිතැන කොළොම්තොට සමීපයෙහි කරණලද
11 සැය නිවත්තචෙතියයි කියනුලැබේ. රජතෙමේම නන්දන
නම්වූ උයනින් නික්ම දකුණු පසින් මහමෙවුනා උයන
12 පැදුම්දෙරට ස්ථවිරයන් පැමිනවූයේය. එහි රම්‍යවූ රාජ
මන්දිරයෙහි යහපත්වූ ඇඳපුටු මනාකොට අතුරුවා "මෙහි
සුවසේ වාසයකරණ සේක්ව" යි කියා නරේන්ද්‍රතෙම ස්ථවිර
13 යන් වැඳ ඇමැතියන් විසින් පිරිවරණලද්දේ පුරයට ප්‍රවිෂ්ට
14 වූයේය—ඒ ස්ථවිරවරයෝතුමූ ඒ රැය එහි විසූසේක, රජ
තෙම උදෑසනම මල්ගෙන්වාගෙණ ස්ථවිරයන්වහන්සේලා
15 කරා එළඹ වැඳ මලින්ද පුදා "කිමෙක සුවසේ වාසයවිද
උයන යතින්ට පාසුදැ" යි විචාළේය "මහරජ සුවසේ වාසය
16 වූයේය, උයන තපස්වීන්ට පාසුවෙ" යි (වදාළසේක). ඒ
17 නරේන්ද්‍රතෙම "වහන්ස ආරාමය සඞ්ඝයාට කැපදැ" යි
විචාළේය. කැප නොකැප දැනීමෙහි දක්ෂවූ ස්ථවිරතෙම
'කැපය' යි වදාරා වේළුවනාරාමය පිළිගැණීම වදාළසේ
18 ක, ඒ අසා මහරජතෙම ඉතා සතුටුවූයේය. ස්ථවිරයන්
වඳනා පිණිස ආවාවූ අනුලා දේවීතොමෝ පන්සියයක්
19 ස්ත්‍රීන්හා සමග ශකෘදගාමි ඵලයට පත්විය. ඒ පන්සිය
යක් ස්ත්‍රීන් සහිතවූ අනුලාදේවි තොමෝද "දේවයන්වහ
න්ස පැවිදිවෙම්හ" යි කීවාය, රජතෙමේද "මොවුන් පැවි
දිකරණ සේක්ව" යි ස්ථවිරයන්වහන්සේට සැලකෙළේය.

20 ස්ථවිරතෙම "මහරජතෙනි අපට ස්ත්‍රීන් පැවිදිකිරීම
කැපනෑත්තේය, මාගේ නැගනිවූ සඞ්ඝමිත්‍රා නමින් ප්‍රසිද්ධවූ
බහුශ්‍රැතවූ මෙහෙණින්නක් තොමෝ පැළලුප් නුවර ඇත්
21 තීය. නරෙන්ද්‍රය ඕතොමෝ ශ්‍රමණෙන්ද්‍රවූ සර්වඥයන්වහන්
සේගේ මහාබෝධි වෘක්ෂරාජයාගෙන් දක්ෂිණ ශාඛාවද
22 එසේම උත්තමවූ භික්ෂුණීන්ද ගෙණ වඩනාසේක්වා යි අප
23 පියමහරජුකරා හසුන් යවව ඒ ස්ථවිරීතොමෝ මෙහි අවුත්
24 මේ ස්ත්‍රීන් පැවිදිකරන්නීය." යි රජහට වදාළසේක. රජතෙ
ම යහපතැයි කියා උතුම්වූ කෙණ්ඩිය ගෙණ "මේ මහමෙව්
25 නා උයන සඟහට දෙමි" කියා භික්ෂු මහතෙරුන්වහන්
සේගේ අත්ලෙහි දක්ෂිණෝදකය වැගිරවූයේය, ජලය මිහි
26 පිට වැටුනකල්හි මහපොළෝතොමෝ කම්පිතාවිය. "කුමක්
හෙයින් පෘථිවිතොමෝ කම්පා වන්නීද" යි මහීපල්තෙම ඒ
27 තෙරුන්වහන්සේ විචාළේය, ඒ ස්ථවිරතෙමේ "ලඞ්කාද්වීප
යෙහි (බුදු) සස්න පිහිටි බැවිනැ" යි වදාළසේක. ජාතිසම්ප
න්නවූ රජතෙම ස්ථවිරයන්වහන්සේට දෑසමන්මල් පිළි
28 ගැන්වූයේය, ස්ථවිරතෙම රජගෙට දකුණුපස වැඩසිටිසේක්
මල්මිටු අටක් හිඳුල්රුක්මුල ඉසිසේක. එහිදු පො
29 ළොව කම්පිතාවිය, රජහු විසින් විචාරනුලත්සේක් "නරෙ
න්ද්‍රය (කකුසන්ධාදී) තුන්බුදුන් කාලයෙහිද මෙහි සඞ්ඝ
කර්මප්‍රණිත මාලක සීමාවිය, මේ කාලයෙහිදු වන්නීය" යි
30 රජහට කරුණු වදාළසේක. ස්ථවිරතෙම රජගෙට උතුරු
දෙසින් මනොඥවූ පොකුණක්කරා වැඩිසේක්. එපමණම
මල් එහිද වැගිරවූසේක, ඒ මල් ඉසීමෙහිදු පොළොව කම්පි
31 තවිය, විචාරණලද්දාවූ ස්ථවිරතෙම "මහරජතෙනි මේ
පොකුණ (සඞ්ඝයාට) ගිනිහල්පොකුණ වන්නීය" යි ඊට
කරුණු වදාළසේක.

32 (මහාමහෙන්ද්‍ර නම්වූ) ඍෂිතෙම එම රජමන්දිරයාගේ
33 දොරකොටුවට වැඩ එපමණම මලින් ඒ ස්ථානය පිදූසේක.
එහිදු පොළොව කම්පිතවිය, අතිශයින් රොමොද්ගම්යෙන්
යුක්තවූ ඒ රජතෙම ඒ කාරණය ස්ථවිරයන් වහන්සේ
34 විචාළේය. ස්ථවිරතෙම "මහීපාලය මේ කල්පයෙහි තුන්
බුදුවරයන්ගේ බොධි වෘක්ෂයන්ගෙන් දක්ෂිණශාඛාවන්
ගෙණවුත් මෙහි රොපණය කරණලදහ, මහීපාලය අප
35 තථාගතයන් වහන්සේගේ බොධිවෘක්ෂයාගේ දක්ෂිණ ශාඛා
තොමෝද මේ ස්ථානයෙහිම පිහිටන්නීය" යි උහුට කරුණු
36 වදාළසේක. මහාස්ථවිරතෙම එතැනින් මහාමුචල නම්
වෘක්ෂයමූලට වැඩිසේක් එ පමණම මල් ඒ ස්ථානයෙහි වැගි

Digitized by Google

රචාළේක, එහිදු පොළොව කම්පිතවිය, (රජහු විසින්) විචා
37 රණලද ස්ථවිරතෙම " භූමිපාලය මෙහි සඞ්ඝයාගේ පො
හෝගය වන්නේය " යි ඔහුට කාරණා වදාළේක. මහරජ
38 තෙම එතැනින් පැණඹමලුවට සම්ප්‍රාප්තවූයේය, යහපත්
වූ ඉදීගියාවූ වර්ණ ගන්ධ රස සම්පන්නවූ මහත්වූ අඹපල
39 යක්ද උයන්පල්තෙමේ මහරජහට එලවූයේය, ඉතා සිත්
කලුවූ ඒ අඹපලය නරේන්ද්‍රතෙම ස්ථවිරයන්වහන්සේට
40 එලවූයේය. ජනසමූහයා කෙරෙහි වැඩකැමැතිවූ ස්ථවිර
යන්වහන්සේ වැඩහිඳිනු කැමැති ආකාරයක් (රජහට) දක්
වූසේක. නරේන්ද්‍රතෙම එහිම උතුම් ඇතිරිල්ලක් ඇතිරවූ
41 යේය එහි වැඩහුන් තෙරුන්වහන්සේට නරේන්ද්‍රතෙම
42 අඹය පිළිගැන්වූයේය, ස්ථවිරයන්වහන්සේ එය වළඳා අඹ
ඇටය රෝපණය කරණු පිණිස මහරජානන්ට දුන්සේක.
නරේන්ද්‍රතෙමේම ඒ අඹඇටය එහි රෝපණය කෙළේය.
43 ස්ථවිරතෙම එය පැලවී වැඩෙනු පිණිස ඒ මතුයෙහි හස්ත
යන් ධෝවනය කළසේක. එකෙණෙහිම ඒ ආම්‍රබීජයෙන්
අඞ්කුරයක් නැගී ක්‍රමයෙන් (වැඩී) පත්‍ර ඵලධාරීවූ ඉතා
44 මහත් රුකෙක් වූයේය. රජු සහිතවූ ඒ පිරිස්තොමෝ ඒ
පෙළහර දක හටගත් රෝමෝද්ගම ඇත්තී ස්ථවිරයන්
45 වඳිමින් සිටියාහ. ස්ථවිරතෙම එතැන්හි මල් අටමිටක් එහි
විසිරවූසේක. එහිදු පොළොව කම්පිතවිය (රජහු විසින්)
46 විචාරණලද ස්ථවිරතෙම " නරේශ්වරයාණෙනි මේ ස්ථානය
සඞ්ඝයාට උපන් නොයෙක් ලාභයන් සමගිව බෙදන ස්ථා
නය වන්නේය " යි ඒ රජහට කාරණය වදාළසේක.
47 එතැනින් චතුශ්ශාලාව පිහිටන තැනට වැඩ එපමණම
මල් එහි විසිරවූසේක. එහිදු පොළොව කම්පිත විය. නරේ
48 න්ද්‍රතෙම ඒ කම්පාවීමේ කාරණය විචාළේය, ස්ථවිරයන්
වහන්සේ " මහරජාණෙනි පූර්වවූ (කකුසන්ධාදී) තුන් බුදුවර
49 යන් (මේ) උයන පිළිගත්කල්හි ලක්දිව්වැසීන් විසින්
සියලු දිගින් ගෙණාවූ දනවැස්තුන් මෙහි තබා සඞ්ඝයා
50 සහිතවූ තුන්බුදුවරයන් වැළඳවූහ, මේ කාලයෙහි වනාහි
මෙහිම චතුශ්ශාලාව වන්නීය, නරශ්‍රේෂ්ඨය මෙහි සඞ්ඝ
යාගේ භක්තභෝජනස්ථානය වන්නේය " යි කාරණය ප්‍රකාශ
කළසේක.
51 කාරණාකාරණයන් දැනීමෙහි දක්‍ෂවූ ලක්දිව් බබුලුවන්
නාවූ මහින්ද නම් මහාස්ථවිරතෙම එතැනින් මහසැය පිහි
52 ටියයුතු තැනට වැඩිසේක, එකල්හි රජඋයනට ඇතුළත්වූ
තන්හි කකුධ නම්වූ කුඩාවැවක් විය, ඒ වැව මතුයෙහි දිය

Digitized by Google

53 කෙළවර සෑයක් පිහිටුවීමට යොග්‍යවූ උස්තැනක්විය, ස්ථ
54 විරයන්වහන්සේ එහි වැඩියකල්හි රජහට සපුමල් මුඨ
අටක් ගෙණවාහුය. නරෙන්ද්‍රතෙම ඒ සපුමල් ස්ථවිරයන්
වහන්සේකරා එලවූයේය ස්ථවිරයන්වහන්සේ ඒ සපු
55 මලින් ඒ උස්වූ ස්ථානය පිදූසේක. එහිදු පොළොව කම්පිත
විය, රජතෙම ඒ කම්පාවීමේ කාරණය විචාළේය, ස්ථවිර
56 තෙම පිළිවෙළින් ඒ කම්පාවේ කාරණය වදාළසේක. “මහ
රජතෙනි මේ ස්ථානය සිවුබුදුවරයන් විසින් සෙව්නා ලද්
දේය, සත්ත්වයන්ට හිතපිණිසද සැපපිණිසද සෑයකට සුදුසු
57 වනේය, මේ කල්පයෙහි පළමුවෙනුව සියලු ධර්මයන්
දන්නාවූ සියලු ලෝකයට අනුකම්පාකරවූ ශාස්තෘවූ කකුසඳ
58 නම් සර්වඥවරයෙක්වූසේක, (එකල) මේ මහමෙව්නා උය
59 න මහාතීර්ථ නම්විය, මින් පෙරදිග කොළොම් ගොයෙන්
එතර අභය නම් පුරයෙක් විය, එහි අභය නම් රජෙක්විය,
60 එකල මේ දිවයින ඔජදීප නම් විය, (එකල්හි) රකුසන්
කරණකොටගෙණ මෙහි ජනයාහට හුණලෙඩෙක් විය,
කකුසඳ නම්වූ සර්වඥතෙම ඒ උවදුර දැක එය නසා මේ
61 ද්වීපයෙහි සත්ත්වයන් හික්මීමද ශාසනයාගේ පැවැත්මද කර
ණු පිණිස කරුණාවේගයෙන් මෙහෙයනු ලත්සේක් සත
62 ළිස් දහසක් රහතුන් විසින් පිරිවරණලද්දේ අහසින් වැඩ
දෙවකූටනම් පර්වතයෙහි වැඩසිටිසේක. මහරජතෙනි
63 එකල්හි සර්වඥයන්වහන්සේගේ ආනුභාවයෙන් මේ මුළු
64 දිවයින්හි ජ්වරරොගය උපශාන්තවූයේය. නරෙශ්වරය
එහි වැඩසිටි මහාමුනිවූ සර්වඥතෙම “අද ඔජදීපයෙහි
65 සියලු මනුෂ්‍යයෝ මා දකිත්වා මාකරා එනු කැමැතිවූ සියලු
මනුෂ්‍යයෝ වහාම නිදුකින් එත්වා” යි අධිෂ්ඨාන කළ
සේක.

66 පර්වතය රැසින් බබුලුවනනාවූ සර්වඥයන්වහන්සේද රැ
සින්බබලනනාවූ පර්වතයද දැක රජතෙමේද නුවර වැසියෝ
67 ද වහා ලඟට පැමිණියෝය. දෙවියන්ට බිලිදෙන පිණිස
එහි ගියාවූ මනුෂ්‍යයෝද සඞ්ඝයා සහිතවූ ලොකස්වාමීන්ව
68 හන්සේ දෙවතායයි සිතූහ. අතිශයින් සතුටුවූ මහීශ්වරවූ ඒ
69 රජතෙම ඒ සර්වඥයන් මනාකොට වැඳ බතින් පවරා පුර
සමීපයට වඩාගෙණවුත්, සඞ්ඝයා සහිතවූ මුනීශ්වරයන්
70 වහන්සේගේ වැඩහිඳීමට යෝග්‍යවූ සිත්කලුවූ මේ ස්ථානය
අසම්බාධයයි සිතා මෙහි කරවනලද මනොඥවූ මණ්ඩප
යෙහි උතුම්වූ පර්‍යඞ්කයන්හි සඞ්ඝයා සහිතවූ සම්බුදුන්
71 වැඩහිඳවූයේය. මෙහි වැඩහුන්නාවූ සඞ්ඝයා සහිතවූ

Digitized by Google

ලොකනාථයන්වහන්සේ දන්නාවූද ලඞ්කාවීපයෙහි මනු
72 ෂ්‍යයෝ හාත්පසින් පඬුරුගෙණවෝය. ඒ නරේන්‍ද්‍රතෙම
තමන් සතුවූද ඒ ඒ මිනිසුන් විසින් ගෙණෙනලද්දාවූද ඛාද්‍ය
භොජ්‍යයෙන් ඒ සඞ්ඝයා සහිතවූ ලොකස්වාමීන්වහන්සේ
73 සන්තර්පණය කෙළේය. මෙහිම පසු බත්කල්හි වැඩහුන්නා
වූ සර්වඥයන්වහන්සේට ඒ මහාතිත්‍ථනම්වූ උයන ඒ රජතෙ
74 ම උතුම්වූ දක්ෂිණකොට දුන්නේය, එකල අකාලපුෂ්ප
යෙන් අලඞ්කෘත මහාතිත්‍ථනම්වූ උයන සර්වඥයන්වහන්
සේ විසින් පිළිගත්කල්හි මහපොළව කම්පිතවිය. ඒ
75 සර්වඥතෙම මෙහිම වැඩහිඳ ධර්මදෙශනා කළසේක, සත
76 ළිස් දහසක් මනුෂ්‍යයෝ මාර්ගඵල ප්‍රාප්තවූහ. පස්මරුන්
දිනූ ඒ සර්වඥතෙම මහාතිත්‍ථ නම්වූ උයන්හි දිවා විහරණ
77 යකොට සවස්වේලෙහි බොධිය පිහිටවන්ට යොග්‍යවූ පෘථිවි
ප්‍රදේශයට වැඩ එහි වැඩහුන්සේක් සමාධියට සමවැද එසින්
78 නැගී "ලක්දිව් වැස්සන්ට වැඩපිණිස මාගේ මහරී බෝ
රුකින් දක්ෂිණ ශාඛාව රැගෙණ මෙහෙණිනාන් සහිතවූ
රූපනන්‍දා නම් මෙහෙණිතොමෝ ආගමනය කෙරේවා" යි
79 සිතූසේක. මහරජතෙනි ඒ මහත්සෘද්ධිඇති රූපනන්‍දා නම්
තෙරණීතොමෝ උන්වහන්සේගේ ඒ සිත දැන ඊට අනතු
රුව එහි නරේන්‍ද්‍රයානන් කැඳවාගෙණ ඒ බෝධිවෘක්ෂය
80 කරා එළඹ දක්ෂිණ ශාඛාවෙහි රත්සිරියෙලින් රේඛාවක්
දෙවා (එතැනින්) සිඳී රන් බඳුනෙහි පිහිටියාවූ ඒ බෝධි
ශාඛාව සෘද්ධියෙන් ගෙණ පන්සියයක් මෙහෙණිනාන්
81 සහිතවූවා මෙහි ගෙණවුත් දෙවතාවුන් විසින් පිරිවරණ
ලද්දී රන්බඳුන සහිතවූ ඒ බොධි ශාඛාව සර්වඥයන් දිගු
82 කළ දක්ෂිණ හස්තයෙහි තැබූවාය, තථාගතයන්වහන්සේ
ඒ බොධිය රැගෙණ පිහිටුවන පිණිස අභය නම් රජහට
83 දුන්සේක, පෘථිවීශ්වරතෙම මහාතිත්‍ථ නම්වූ උයනෙහි
ඒ බොධිය පිහිටවූයේය.

84 සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන්වහන්සේ ඒතැනින් වැඩ
85 මෙසින් උතුරුදෙස මතරම් මහරී මලුවෙහි වැඩහිඳ ජන
යාට ධර්මදෙශනාකළසේක, මහරජතෙනි එහි විසිදහසක්
86 ප්‍රාණීන්ට ධර්මාවබොධය වූයේය. ඒ සම්‍යක්සම්බුද්ධවූ සර්ව
ඥයන්වහන්සේ එතැනින්ද උතුරුදෙසට වැඩ එහි ථූපාරාම
චෛත්‍යය පිහිටන ස්ථානයට වැඩ සමාධිය අර්පණයකොට
87 වැඩහුන්සේක් එසින් නැගී පිරිසට ධර්මදෙසනා කළ
සේක. එහි වනාහි දසදහසක් ප්‍රාණීහු සම්ප්‍රාප්තවූ මාර්ග
88 ඵල ඇතිවූහ. පස්මරුන් දිනූ සර්වඥයන්වහන්සේ සව

හිය ධබරව වඩිනා පිණිස මිනිසුන්ටද පිරිවර සහිතවූ ඒ
89 මෙහෙණින්නමෙහි වස්වා මහාදෙවනම් ශ්‍රාවකයානන්ද
භික්ෂූන් දහසක් සමග මෙහි වස්වා එසින් පැදුම්දෙස
90 රුවන් මළුවෙහි වැඩසිටියේත්ම ජනයාට මොනවට අනු
ශාසනාකොට සඞ්ඝයා සමග අහසට නැගී ජම්බුද්වීපයට
වැඩියේක."

91 මේ කල්පයෙහි දෙවනුව (බුදුවූ) සියලු ලෝවැසියන්ට අනු
කම්පාකරවූ සියලු ධර්මයන් අවබොධ කළාවූ ශාස්තෘවූ කො
92 ණාගමන නම් සර්වඥකෙණෙක් වූසේක, එකල්හි මේ මහ
මෙවුනා උයන මහානාම නම්විය, දක්ෂිණදිශාවෙහි වර්ධ
93 මාන නම් පුරයක්විය, එකල එහි සමිද්ධනම්වූ නරේන්ද්‍රයෙක්
වූයේය, එකල මේ ද්වීපයනොම වරදීපනම් විය. එකල්හි
94 මේ වරදීපයෙහි වර්ෂාහානියෙන්වූ උවදුරෙක්විය, කොණා
ගමන නම් සර්වඥයන්වහන්සේ ඒ උපද්‍රවය දැක ඒ උවදුර
95 නසා මේ ලක්දිව්හි ජනයන්ගේ හික්මීමද ශාසනයාගේ
පැවැත්මද කරණු පිණිස කරුණාබලයෙන් මෙහෙයනු
96 ලත්සේක් රගත්වූ තිස්දහසක් භික්ෂූන්වසින් පිරිවරණු ලත්
සේක් අහසින් වැඩ සුමනකූටකනම් පර්වතයෙහි වැඩසිටි
97 සේක. සර්වඥයන්වහන්සේගේ ආනුභාවයෙන් ඒ වර්ෂා
හානිය ක්ෂයවීමට ගියාය, එකල්හි ශාසනාන්තර්ධානය දක්
98 වා යහපත් වර්ෂාවම විය. නරේන්ද්‍රයානෙනි එහි වැඩසිටි
මහාමුනිවූ මුනීන්ද්‍රයන්වහන්සේ "අද වරදීපයෙහි සියලු
මනුෂ්‍යයෝ මා දකිත්වා මාකරා එනුකැමැත්තාවූ සියලු මනු
99 ෂ්‍යයෝ නිදුකින් වහාම එත්වා"යි අධිෂ්ඨාන කළසේක, (පර්ව
100 තය රැසින්) බබුළුවනාවූ ඒ මුනීන්ද්‍රයන්වහන්සේද බබ
ළනාවූ පර්වතයද දැක රජතෙමේත් නුවර වැසියෝත්
වහා සමීපයට පැමිණියහ.

101 දේවතා බිලි දෙනපිණිස එහි ගියාවූ මනුෂ්‍යයෝද සඞ්ඝ
යා සහිතවූ සර්වඥයන්වහන්සේ දේවතාවෝයයි සිතූහ. අති
102 ශයෙන් සතුටුවූ පෘථිවිශ්වරවූ රජතෙම ඒ මුනීන්ද්‍රයන් වැඳ,
බතින් පවරා වර්ධමාන නම් පුරය සමීපයට වඩාගෙණ
103 වුත් මේ ස්ථානය සඞ්ඝයා සහිතවූ මුනීන්ද්‍රයන්ගේ වාසයට
යොග්‍යය සිත්කළුය අසම්බාධයයි සිතා, මෙහි කරවනලද
104 රම්‍යවූ මණ්ඩපයෙහි උතුම්වූ පර්යඞ්කයන්හි සඞ්ඝයා සහි
තවූ ඒ සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ වැඩහිඳවූයේය. මෙහි
105 වැඩහුන්නාවූද සඞ්ඝයා සහිතවූ ලෝකස්වාමීන්වහන්සේ
දක්නාවූ වරදීපයෙහි මනුෂ්‍යයෝ හාත්පසින් පඬුරු

106 ගෙණඑය, ඒ නරේන්ද්‍රතෙම තමන් සතුවූද ඒ ඒ භික්ෂු
ෂූයන් විසින් ගෙණවූද බාද්‍ය භෝජ්‍යයන් සඞ්ඝයා සහි
තවූ ලෝකස්වාමීන්වහන්සේ සන්තර්පණය කෙළේය. ඒ
107 නරේන්ද්‍රතෙම භත්තයෙන් පසුකාලයෙහි මෙහිම වැඩහුන්
සර්වඥයන්වහන්සේට මහානාම නම්වූ ඒ උයන වර
108 දක්ෂිණකොට දුන්නේය. එකල අකාලපුෂ්පයෙන් අලඞ්කෘ
තවූ මහානාම නම් උයන සර්වඥයන්වහන්සේ විසින් පිළි
109 ගත්කල්හි මහපොළව කම්පිතවිය. ඒ සර්වඥතෙම මෙහිම
වැඩහිඳ ධර්මදෙශනාකළසේක, එකල්හි තිස්දහසක් මනු
110 ෂ්‍යයෝ මාර්ගඵල ප්‍රාප්තවූහ. සර්වඥයන්වහන්සේ මහානා
ම නම් උයන්හි දිවාවිහරණයකොට සවස්වේලෙහි පූර්ව
මහාබෝධිය පිහිටි භූමියට වැඩ එහි සමාධිය අර්පණය
111 කොට එසින් නැගීසේක්, සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ ලක්
දිව් වැසියන්ගේ වැඩපිණිස "මාගේ උදුම්බර බෝධි වෘක්ෂ
112 යෙන් දක්ෂිණ ශාඛාව රැගෙන භික්ෂුණීන් සහිතවූ කණක
දත්තා නම් මෙහෙණී නොමෝ එවා" යි සිතූසේක. මහත්
113 සෘද්ධිඇත්තාවූ ඒ තෙරණීතොම ඊට අනතුරුව උන්වහන්
සේගේ ඒ සිත දැන එහි රජු කැඳවාගෙණ ඒ බෝධිවෘක්ෂය
114 කරා එලඹ රත්සිරියෙලින් දක්ෂිණශාඛාවෙහි රේඛා
දෙවා, මහරජතෙමේ එතැනින් ඡින්නව රන් බඳුනෙහි
115 පිහිටියාවූ ඒ ශාඛාබෝධිය සෘද්ධියෙන් රැගෙණ මෙහෙ
ණීන් පන්සියයක් සහිතාවූවා දෙවතාවන් විසින් පිරිවර
116 ණලද්දී මෙහි අවුත්, රන් බඳුන සහිතවූ ඒ ශාඛාබෝධිය
සම්‍යක්සම්බුද්ධයන් විසින් දිගුකළ දක්ෂිණ හස්තයෙහි තැබූ
117 ව්‍යය, තථාගතයන්වහන්සේ ඒ හැරගෙණ පිහිටුවන පිණිස
සමිද්ධනම් රජහට දුන්සේක. ඒ මහීපල්තෙම ඒ බෝධිය
118 එහි මහානාම නම් උයනෙහි පිහිටවූයේය. සම්‍යක්සම්බුද්ධ
යන්වහන්සේ එතැනින් නික්ම මහරිම්ලුවෙන් උතුරු නාග
මාලකයෙහි වැඩහුන්සේක් ජනයාට ධර්මදෙශනා කළසේ
119 ක. පෘථිවිපාලය ඒ ධර්මදෙශනාව ඇසීමෙන් එහි විසිදහ
120 සක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය වූයේය පූර්වයෙන් උතුර පූර්ව
බුද්ධවරයන් වැඩහුන් තැනට වැඩ එහි සමාධිය අර්පණය
කොට වැඩහුන්සේක් එසින් නැගී සර්වඥයන්වහන්සේ
121 පිරිසට ධර්මදෙශනාකළසේක, එහි වනාහි දසදහසක්
ප්‍රාණීහු මාර්ගඵල ප්‍රාප්තවූහ. පස්මරුන් දිනූ ඒ සර්වඥ
122 යන්වහන්සේ භික්ෂූයන් විසින් වඳනා පිණිස කාය
බන්ධනධාතුව ප්‍රදානයකොට පිරිවර සහිතවූ ඒ මෙහෙ
123 ණීනා මෙහි වස්වා, භික්ෂූන් දහසක් සමග මහාතුම්ම

Digitized by Google

නම් ශ්‍රාවකයන්වහන්සේද මෙහි වස්වා රතනමාලකයෙන්
මෙපිට සුදර්ශන නම් මාලකයෙහි වැඩසිට ජනයාට අනු
124 ශාසනාකොට සඞ්ඝයා සමග අහසට නැගී ජම්බුද්වීපයට
වැඩියේක.

125 මේ කල්පයෙහි තුන්වෙනුව (බුදුවූ) කාශ්‍යප ගොත්‍රඇති
සියලු ධර්මයන් අවබොධකළාවූ සියලු ලොවැසියාට අනු
126 කම්පාකාරවූ ශාස්තෘකෙනෙක් වූසේක. එකල්හි මහ
මෙවුනා උයන මහාසාගර නම්විය. පශ්චිම දිශාවෙහි වි
ශාලනම් පුරයක්විය, එකල එහි ජයන්ත නම් නරේන්ද්‍රයෙක්
127 වූයේය, එකල මේ ද්වීපයතෙම මණ්ඩදීප නම්විය. එකල්හි
128 ජයන්තනම් රජහුගේද රජහුමල් (මණ්ඩකුමර) හුගේද
භයජනකවූ සත්වයන් පෙළනනාවූ යුධයක් එලඹසිටියේය,
129 ඒ මහාකරුණා ඇති දශබලධාරීවූ කාශ්‍යප සර්වඥයන්
130 වහන්සේ, ඒ යුධය නිසා සත්වයන්ට වනනාවූ මහත් ව්‍යස
නය දැක, එය සංසිඳුවා මේ ද්වීපයෙහි සත්වයන් හික්මීමහා
131 ශාසනාගේ ප්‍රවෘත්තියද කරණු පිණිස කරුණා බලයෙන්
මෙහෙයනු ලත්සේක්, විසිදහසක් රහතුන් විසින් පිරිවර
කුළුබ අහසින් වැඩ සුභකූට නම් පර්වතයෙහි වැඩසිටි
132 සේක, නරේන්ද්‍රය එහි වැඩසිටි මහාමුනිවූ සර්වඥයන්වහන්
සේ, "අද මණ්ඩද්වීපයෙහි සියලු මනුෂ්‍යයෝ මා දැකිත්වා
133 මාකරා එනුකැමැතිවූ සියලුම මිනුෂ්‍යයෝ නිරායාසයෙන්
වහාම එත්වා" යි අධිෂ්ඨානකළසේක. පර්වතයෙහි රැස්විහි
134 දුවමින් බබලනනාවූ ඒ සර්වඥයන්වහන්සේද විරාජමානවූ
පර්වතයද දැක රජතෙමේද නුවරවැසියෝද වහා එලඹි
135 නහ, බොහෝ ජනයෝ තමතමන්ට පැමිණි ජයනිසා
දෙවියන්ට බිලිදෙන පිණිස ඒ පර්වතයට එලඹුනෝ
සඞ්ඝයා සහිතවූ සර්වඥයන්වහන්සේ දේවතායයි සිතූ
136 හ. රජතෙමේද ඒ කුමාරතෙමේද විස්මයට පැමිනියෝ
137 යුධය හළහ. ඉතා සතුටුවූ ඒ පෘථිවීශ්වරවූ රජතෙම ඒ
මුනීන්ද්‍රයන් වැද බතින් පවරා නගරසමීපයට වඩාගෙණ
138 වුත් මේ ස්ථානය සඞ්ඝයා සහිතවූ මුනිරාජයන්වහන්
139 සේට වැඩහිඳිනට යොග්‍යය උතුම්ය සිත්කළුය සම්බාධ
රහිතයයි සිතා මෙහි කරවනලද රම්‍යවූ මණ්ඩපයෙහි උතු
140. ම්වූ පර්‍යංකයන්හි සඞ්ඝයා සහිතවූ සර්වඥයන්වහන්සේ
වඩා හිඳුවූයේය.

141 මෙහි වැඩහුනනාවූද සඞ්ඝයා සහිතවූ ලොකස්වාමීන්
වහන්සේ දක්නාවූ ද්වීපයෙහි මනුෂ්‍යයෝ හාත්පසින් පඬු

රැගෙණගියේය, ඒ නරේන්ද්‍රතෙම තමන් සතුවූද ඒ ඒ ජන
යන් විසින් ගෙණනලද්දාවූද ඛාද්‍ය භොජ්‍යයෙන් සමගයා
142 සහිතවූ ලොකස්වාමීන් සන්තර්පණය කෙළේය. භක්තභො
ජනයට පසුවූ (පස්වරු) කාලයෙහි මෙහිම වැඩහුන්නාවූ
සර්වඥයන්වහන්සේට ඒ නරේන්ද්‍රතෙම ඒ මහාසාගර නම්වූ
143 උතුම් උයන වර දක්ෂිණකොට ප්‍රදානය කෙළේය. අකාල
පුෂ්පයෙන් අලඞ්කෘතවූ මහාසාගරනම් උයන සර්වඥයන්
144 වහන්සේ විසින් පිළිගත්කල්හි මහපොළව කම්පිතවිය, ඒ
සර්වඥතෙම එහිම වැඩහිඳ ධර්ම දෙශනා කළසේක, එකල්
145 හි විසිදහසක් මිනුෂ්‍යයෝ මාර්ගඵල ප්‍රාප්තවූහ. සර්වඥයන්
වහන්සේ මහාසාගරනම් උයන්හි දිවාවිහරණයකොට
සවස්වේලෙහි පූර්වබොධිවෘක්ෂයන් පිහිටි භූමියට වැඩ
146 එහි සමාධියට පැමින වැඩහුන්සේක් එසින් නැගීසේක.
සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ "දිව්වැසයන්ගේ වැඩ පිණිස
147 සුධර්මානම් මෙහෙණීතොමෝ මාගේ න්‍යග්‍රොධ බොධි
වෘක්ෂයෙන් දක්ෂිණශාඛාව ගෙණ මෙහෙණීන්නත් සහි
තව දැන් ඒව" සි සිතුසේක. මහරජතෙනී ඊට අනතුරුව
148 මහත් සෘද්ධිඇත්තාවූ ඒ ස්ථවිරීතොමෝ උන්වහන්සේ
ගේ සිතිවිලි දැන එහි නරේන්ද්‍රයන් කැඳවාගෙණ ඒ බොධි
149 වෘක්ෂයකරා එලඹ රත්සිරියෙලින් දක්ෂිණ ශාඛාවෙහි රෙ
ඛාවක් දෙවා එතැනින් වෙන්ව රන්බඳනෙක පිහිටියාවූ
ඒ බොධිය සෘද්ධියෙන් රැගෙණ පන්සියයක් මෙහෙණීන්
150 නත් සහිතවූවා, මෙහි පමුනුවා දෙවතාවුන් විසින් පිරි
151 වරණලද්දී රන්බඳන සහිතවූ ඒ ශාඛාබොධිය සර්වඥයන්
152 විසින් දිගුකල දක්ෂිණ හස්තයෙහි තැබීය. තථාගතයන්
වහන්සේ එය පිළිගෙණ ජයන්ත රජහට එහි පිහිටුවන
153 පිණිස ප්‍රදානය කළසේක. ඒ රජතෙම ශාඛාබොධි වෘක්ෂය
ඒ මහාසාගර නම් උයනෙහි පිහිටවූයේය, සර්වඥයන්
වහන්සේ එතැනින් වැඩ, නාගමාලකයෙන් උතුරෙහි
154 අශොකමාලකයෙහි වැඩහිඳ ජනයාහට ධර්මදෙශනා කළ
සේක. නරේන්ද්‍රයාතෙනී එහි ඒ ධර්මදෙශනාව අසා සාර
155 දහසක් ප්‍රාණීන්ට ධර්මාවබොධය දුන්නේය. නැවත සර්වඥ
යන්වහන්සේ උතුරුදිග පූර්ව බුදුවරයන් වැඩහුන්නාවූ
ස්ථානයට වැඩ එහි සමාධිය අර්පණය කොට වැඩහුන්සේක්
156 ඒ සමාධියෙන් නැගී පිරිසට ධර්මදෙශනාකළසේක, එහි
157 වනාහි දසදහසක් ප්‍රාණීහු මාර්ගඵලයන්ට සම්ප්‍රාප්තවූහ.
පස්මරුන් දිනූ ඒ සර්වඥයන්වහන්සේ මිනිසුන් විසින් වඳ
158 නා පිණිස ජලසාටිකාධාතුව ප්‍රදානයකොට පිරිවරසහි

Digitized by Google

නවූ ඒ භික්ෂුණිය මෙහි වස්වා භික්ෂූන් දහසක් සහිතවූ
සබ්බනන්ද නම් ශ්‍රාවකයන්වහන්සේද මෙහි වස්වා නදී
159 යෙන් මෙතර සුදර්ශනනම් මාලකයෙන් (බැහැ.ර) සොම
නස්ස නම් මාලකයෙහිදී ජනයාට මොනවට අනුශාසනා
කොට සඞ්ඝයාහා සමග අහසට නැගී දඹදිව් වැඩිසේක.
160 මේ කල්පයෙහි සතරවෙනුව සියලු ධර්මයන් අවබොධ
කළාවූ සියලු ලොවට අනුකම්පාකාරවූ ශාස්තෘවූ ගෞතම
161 නම් සර්වඥයන්වහන්සේවූසේක, ඒ සර්වඥයන්වහන්සේ
ප්‍රථමකොට මේ ලක්දිව් වැඩ යක්ෂයන් දමනය කළසේක,
නැවත දෙවනුව වැඩ නාගයන් දමනය කළසේක, නැවත
162 තුන්වෙනුව පස්මරුන් දිනූ මුනීන්ද්‍රයන්වහන්සේ කැලණි
යෙහි මණිඅක්ඛික නම් නාගයා විසින් නිමන්ත්‍රණය කර
163 ණලද්දේ ආගමනයකොට එහි සඞ්ඝයා සමග ආහාර වළඳා
පූර්ව බොධීන් පිහිටි ස්ථානයද මේ චෛත්‍යස්ථානයද පරි
164 භොග ධාතුස්ථානවූ (ථූපාරාමය පිහිටන) ස්ථානයද වැඩ
හිඳීමෙන් පරිභොගකොට, පූර්වවූ කාශ්‍යප සර්වඥයන්
වහන්සේ වැඩසිටි (සොමනස්සමාලක) නම් ස්ථානයෙන්
165 මෑතභාගයට වැඩ ලොකයට ප්‍රදීපවූසේක් එකල ලඞ්කා
ද්වීපයෙහි මනුෂ්‍යයන් නැතිබැවින් ද්වීපයෙහි සිටියාවූ දෙව
සමූහයාටද නාගයන්ටද මොනවට අනුශාසනාකොට සඞ්
ඝයා සහිතව අහසට නැගී දඹදිව් වැඩිසේක.
166 නරෙන්ද්‍රයාණනි මෙසේ මේ ස්ථානය සතර බුද්ධවරයන්
විසින් සෙවනලද්දේය, මහරජතෙනි මේ ස්ථානයෙහි
167 අනාගතකාලයෙහි සර්වඥ ශාරීරික ධාතූන් සම්බන්ධවූ
ද්‍රෝණයක් ධාතූන්ගේ නිධානවූ එක්සිය විසිරියන් උස්
168 සුවර්ණමාලීයයි ප්‍රසිද්ධවූ සෑයක් වන්නේය—පෘථිවීශ්වර
තෙම (ඒ ස්තූපය) "මමම කරවන්නෙමි" යි කීයේය, "පෘථිවී
169 පාලයෙනි මෙහි තොපට අන්‍යවූ බොහෝ කටයුතුවෙති. ඒ
කටයුතු කරව. තොපගේ මුනුබුරෙක් තෙම මේ ස්තූපය කර
වන්නේය. (එහි පිළිවෙළ මෙසේයි)—යුෂ්මත්හුගේ
170 සහෝදරවූ මහානාග නම් යුවරජහුගේ පුත්‍රවූ යටාලතිස්ස
නමින් ප්‍රකටවූ නරෙන්ද්‍රයෙක්තෙම අනාගතයෙහි වන්නේ
171 ය. ඔහුගේ පුත්‍රවූ ගොඨාභය නම් නරෙන්ද්‍රයෙක් වන්නේය.
ඒ රජහුගේ පුත්‍රවූ කාවන්තිස් නම් රජෙක් වන්නේය,
නරෙන්ද්‍රය ඒ රජහු පුත්වූ දුෂ්ගාමණී යන ශබ්දයෙන් ප්‍රකට
172 වූ අභයනම් මහරජෙක් වන්නේය, මහත්වූ තේජස් හා
ඍද්ධිවික්‍රමයෙන් යුක්තවූ ඒ මහරජතෙම මෙහි ස්තූපය කර
173 වන්නේය"යි ස්ථවිරයන්වහන්සේ වදාළසේක, ස්ථවිරයන්වහ

Digitized by Google

න්සේගේ වචනයෙන් මහීපතිතෙම එපවත් ලියවා මෙහි
ගල්ටැඹක් එසවූයේය.
174 මහත් ප්‍රඥා මහත් සෘද්ධිඇත්තාවූ ඒ මහා මහෙන්ද්‍ර නම්
ස්ථවිරයන්වහන්සේ මහමෙව්නා උයනින් සිත්කළුවූ තිස්සා
175 රාමය පිළිගත්සේක. කාමාරහිතවූ ස්ථවිරතෙම අවතැන
කදී පොළව කම්පිත කරවා සමුද්‍රයා සමානවූ නුවරට පිවි
176 සීස ප්‍රවිෂ්ටව, රජගෙයි භත්තකෘත්‍යය කොට මන්දිරයෙන්
නික්ම නඳුන් වනයෙහි වැඩහිඳ එහිදී අග්ගික්ඛන්ධොපම
177 නම්වූ සූත්‍රය ජනයාට දෙශනාකොට, එහිදී මිනිසුන් දහසක්
මාර්ගඵලප්‍රාප්තකරවා මහමෙව්නා වෙනෙහි වැඩවිසූ
සේක.
178 ස්ථවිරයන්වහන්සේ තුන්වෙනි දවස්හි රජගෙයි වළඳා
නඳුන්වෙනෙහි වැඩහිඳ ආශීවිෂොපම සූත්‍රය දෙශනාකළ
179 සේක. මහාස්ථවිරයන්වහන්සේ දහසක් පුරුෂයන් මාර්ග
ඵලාවබොධයට පමුනුවා එතැනින් තිස්සාරාමයට (වැඩිසේ
180 ක) අසනලද දෙශනාඇති ඒ රජතෙමේද (පැමින) තෙ
රුන්වහන්සේ සමීපයෙහි හිඳ "වහන්ස බුඞශාසනය (මේ
181 හි) පිහිටියේදෝහෝ" සි විචාළේය. "නරෙන්ද්‍රය තවම නො
පිහිටියේය, ජනාධිපතිය උපොසථාදී කර්ම පිණිස බුඞාඥා
වෙන් මෙහි සීමාවක් බැන්දකල්හි ශාසනය පිහිටනෙන්
182 ය" සි මහාස්ථවිරයන්වහන්සේ වදාළසේක, රජතෙම උන්
වහන්සේට මේ වචනය සැලකෙළේය. "කාන්තිධරයන්
වහන්ස මම සර්වඥයන්වහන්සේගේ ආඥාව ඇතුළත
183 වාසය කරන්නෙම්, එහෙයින් පුරය ඇතුළත්කොට මහා
සීමාව බඳිනාසේක්වා" සි සැලකෙළේය. ස්ථවිරයන්වහන්
184 සේ ඒ රජහට "පෘථිවීශ්වරය එසේ කල්හි ශ්‍රීමත් තෙමේ
සීමාව යන තැන් දනුව අපි එය බඳුම්හ" සි වදාළසේක.
පෘථිවීශ්වරතෙම මැනවයි කියා නඳුන් වනයෙන් නික්
185 මෙන දෙවෙන්ද්‍රයාමෙන් රම්‍යවූ මහමෙව්නා උයනෙන්
නික්ම සවනියද්දූ මන්දිරයට ප්‍රවිෂ්ටවූයේය. ස්ථවිරයන්වහන්
186 සේ සතරවෙනි දවස්හි රජගෙහි වළඳා නඳුන් වෙනෙහි
වැඩහිඳ අනමතග්ගිය නම් සංයුක්තය දෙශනාකළසේක.
187 ඒ මහාස්ථවිරයන්වහන්සේ එහිදී දහසක් පුරුෂයන්ට අමෘ
තපානය පොවා මහාමෙඝවනාරාමයට එළඹිසේක. උදය
188 බෙර හසුරුවා පුරවරයද විහාරයට යන මාර්ගයද හාත්
පසින් විහාරයද සරසවා ඒ නරෙන්ද්‍රතෙම රථයෙහි සිටියේ
189 සර්වාලඞ්කාරයෙන් අලඞ්කෘතවූයේ ඇමැතියන් සහිතව
අන්තඃපුරවාසීන්හා රථ බලවාහන සහිතවූයේ මහපිරි

වරින් සවණියාරාමයකරා පැමිනියේය. එහි වඳනාවට
190 යොග්‍යවූ ස්ථවිරයන්කරා එළඹ වැඳ ස්ථවිරයන්හා සමග
උබුගඟ තොටට ගොස් රන්නගුලක් ගෙණ එතැන් පටන්
191 සාමින් ගියේය, මහාපදුමය, කුජරය යන නම් ඇත්තාවූ
අතිශයින් ශොභනවූ ඇතුදෙදෙන ස්වර්ණමයවූ . නගු
192 ලෙහි යොදනලද්දාහ. පළමුවෙනිවූ කුන්තමාලකයෙහි
193 (සිව්යේ) සිවුරඟ මහසෙනග ඇත්තාවූ සතුරු දමනයකළ
194 මහිපතිවූ නරේන්ද්‍රතෙම ස්ථවිරයන් සමගවූයේ මොනවට
සරසනලද්දාවූ පූන්කලස, නොයෙක් වර්ණඇත්තාවූ කො
ඩිය, යහපත්වූ සඳුන්සුණුසුත් තලිය, රන් රිදී දඬුඇති
195 කැවපත්ය, මලින් බරවූ සුමුගුය, මල්ඇගෑය, තොරන් කෙ
සෙලි ආදීයද ගත් අත්ඇති අඟනන් විසින් පිරිවරණ
196 ලද්දේ නොයෙක් තූර්‍ය්‍යයෙන් ඝොෂණය කරණලද්දේ සේ
නාසමූහයා විසින් පිරිවරණලද්දේ සතුතිමඞ්ගලගීතයෙන්
197 සිවුදිගුන් පූරවනොත් සාධුකාර නාදයෙන්හා පිළිගිය සියැ
රුම් සියගණිනින්ද මහත්වූ උත්සව පූජයෙන්ද යුක්තවූයේ
198 නගුල රැගෙන සිව්වුදක්වා සාමින් ගියේය. විහාරයහා
නුවරයද ප්‍රදක්ෂිණකරනොත් ගංතොටට පැමින සීමාව
199 යනතැන් සමාප්තකෙළේය. එහි සීමාතොමෝ කවර නිමි
ත්තකින් ගියාදැයි "සීමාව පැමිනිතැන් (දූතගණු) කැමැ
200 ත්තානි ඒ මෙසේ අවබොධ කරව්" (කොළොම් හොය)
ප්‍රහත්තොට පහණෙහි කුඩාවලටද එතැනින් කුම්බලනම්
201 වළ අගටද එතැනින් මහදූවටද ගියාය. එතැනින් කුඩුක්
පෙලට ගියේ, එසින් මහමලූවට ගියේය, එසින් කුදුම්රුක
වද එත. නින් මුරුතපොකුණටද ගියේ විජයාරාමනම්
202 උයනෙහි උතුරු දොරකොටුවට ගියේය, ගජකුඹුනම් ගල
වද, තුසවැව්ය මැද්න් අබාඋයනෙහි කොත්ගලටද (මහා
203 ස්) මහසොහොන මැදට ගියේය, දීඝපහනට ගොස් ක
ම්මාරදෙවයාගේ ඞඩහැලට වම්න් හුගමලූවට ගොස් හිය
204 ගල සමීපයෙහි ගිනිකොණ දියවස්බමුණගේ දෙවාලය
වද, එතැනින් තෙලුම්පෙලට ගියේ, එතැනින් තාලචතු
205 ෂ්කයට ගියේය, එතැනින් අස්මබුලලට වම්න් සසවානයට
206 ගියේය, එතැනින් බොරඑතොටටගියේ එතැනින් මතෙත
හි නදියට ගියේය, පළමු සෑයෙන් නැගෙණහිරද කො
207 ළොම්ගස් දෙකක් වූහ, සෙනිඥගුත්ත රාජ්‍යයෙහි උදක
ශුඩික ද්‍රවිඩයෝ නදිය දුරයයි සිතා බැඳ එය නුවරට ආස
208 න්නකළහ. එහි ජිවමානවූ කොළොම්රුක සීමාවට ඇතු
ළුකොට ගියේය, මළ කොළොම්රුක පිහිටි ඉවුරෙන් සීමා

තොමෝ මළකොළොම්රුකෙන් උඩව් භාගයට පත්විය, ස්ථ
209 විරතෙම සිංහස්නාන නම් තොටින් උඩව්භාගයට පැමිණ
ඉවුරෙන් වඩනේ පහන්තොටට පැමිණ නිමිති ගැළපූ
210 සේක. නිමිතෙතන් නිමිත්ත ගැළපූකල්හි සස්න මොනවට
211 පිහිටියේයයි දෙව් මිනිස්සු සාධුකාර පැවැත්තූහ. රජහු
විසින් හිවිට දුන්කල්හි මහත් ප්‍රඥාඇති ඉන්ද්‍රිය වසඟකළාවූ
මහාස්ථවිරයන්වහන්සේ නිමිත්තයන් හාත්පසින් කීර්ත්ත
212 නය කළසේක්. විධිවූපරිද්දෙන් දෙතිසක් බණ්ඩසීමාවන්
පිණිසද ථූපාරාමය පිණිසද සීමාන්තරික නිමිත්තයන්ද කී
ර්තනය කොට එම දවස්හිම සියලු සීමාවන් බන්ධනය කළ
213 සේක. සීමා බන්ධනය සමාප්තකළකල්හි මහපොළව කම්පි
තවිය.

214 ස්ථවිරයන්වහන්සේ පස්වන දවස් රජගෙහි වළඳා නඳුන්
215 වෙනෙහි වැඩහිඳ ඛජ්ජනීයක නම්වූ සූත්‍රාන්තය මහජනයා
හට දෙසනාකොට එහිදී දහසක් මිනිසුන්ට අමෘතපානය
216 පොවා මහමෙවුනා උයනෙහි වාසය කළසේක. දෙසනා
දනාවූ ස්ථවිරයන්වහන්සේසවෙනි දවස්හි රජගෙහි වළඳා
නඳුන් වෙනෙහි වැඩහිඳ ගොමයපිණ්ඩික නම් සූත්‍රය දෙස
217 නාකොට දහසක්ම මිනිසුන් මාර්ගඵලාවබොධයට පමුනුවා
218 මහමෙවුනා උයනෙහිම වැඩවිසූසේක. ස්ථවිරයන්වහන්සේ
සත්වෙනි දවස්හිද රජගෙහි වළඳා නඳුන්වෙනෙහි වැඩහිඳ
219 ධම්මචක්කප්පවත්තන නම්වූ සූත්‍රාන්තය දෙශනාකොට මිනි
සුන් දහසක්ම මාර්ගඵලාවබොධයට පමුනුවා මහමෙවුනා
උයනෙහි වැඩවිසූසේක. මෙසේ කාන්තිධරවූ ස්ථවිර
220 යන්වහන්සේ සත් දවසකින්ම අටදහස් පන්සියයක් මිනිසු
න් මාර්ගඵලාවබොධ කරවා (ඒ මහ නඳුන් උයනෙහි
221 වාසයකළසේක) ඒ මහ නඳුන්වනය ඒ ශ්‍රෙෂ්ඨවූ අර්හත්
වහන්සේ විසින් ශාසනය බැබලවූ ස්ථානය යන අර්ථ
222 යෙන් ජොතිවනයයි කියනුලැබේ. රජතෙමේ ශීඝ්‍රලෙස ගිනි
සුළින් මැටි වියලවා පළමුවෙන් තිස්සාරාමයෙහි ස්ථවිර
223 යන්වහන්සේට පිරිවෙණක් කරවූයේය. ඒ ප්‍රාසාදයතෙම
කාලව නිමිද්දයේය, එහෙයින් ඒ මන්දිරය එහි කාලප්‍රාසාද
224 පරිවෙණ යන නාමට පැමිණියේය. ඉක්බිතෙතන් මහ බෝ
ගෙයක්ද ලෝවාමහපායද ලහබත්ගෙයක්ද බත්ගලක්ද
225 මොනවට කරදුනේය, බොහෝ පිරිවෙන්ද සහපත්වූ
පොකුණුද රාත්‍රීස්ථාන දිවාස්ථානාදීන්ද කරවූයේය. පායන්
226 බොවනය කළාවූ උන්වහන්සේගේ නහන පොකුණුතෙර
කළාවූ පිරිවෙණ සුනහාත පරිවෙණයයි කියනුලැබේ.

227 ලඞ්කාවීපයට ප්‍රදීපයක්වූ ඒ උත්තමයන්වහන්සේ සත්
මත්තලු තන්හි කරණලද ඒ පිරිවෙණ දීඝචඞ්කමණයයි
228 කියනුලැබේ. ඒ ස්ථවිරයන්වහන්සේ යම් තැනෙක්හි
වනාහි අග්‍රවූ ඵල සමාපත්තියට සමවන්සේක්ද එහෙයින්
229 එය ඵලග්ගපරිවෙණයයි කියනුලැබේ. යම් තැනෙක්හි
බොහෝවූ දෙවසමූහයෝ උන්වහන්සේකරා එළඹ උපස්ථා
230 න කළාහුද එහෙයින්ම එය මරුගණ පරිවෙණයයි කියනු
ලැබේ. ඒ රජහුගේ සෙනෙවිවූ දීඝසඳ ඇමැතිතෙම මහ
231 වැම් අටකින් යුත් පහයක් කරවූයේය, එය ඒ වෙහෙරෙහි
දීඝසඳ සෙනෙවියා පිරිවෙණයයි කියනුලැබේ, ඒ පිරිවෙණ
ප්‍රධානවී ප්‍රධානවූ ස්ථවිරයන්ට ආකරදවේ.

232 දෙවානම්පියය යන වචනයෙන් වලදනලද නම්ඇත්තාවූ
යහපත් ප්‍රඥාඇති ඒ රජතෙම නිර්මල බුද්ධිඇත්තාවූ මහා
මහෙන්ද්‍රනම් ස්ථවිරයන්වහන්සේ කරා පැමින ලඞ්කාවීප
යෙහි පළමුවෙනිවූ මේ මහාවිහාරය මෙහි කරවූයේය.

මෙතෙකින් සුදීජනයා පහන්සංවෙග පිණිස කළ මහ
වංස මහාවිහාර පටිග්ගහණ නම්වූ පසළොස්වන අදියර නිමි.

16 වෙනි. පරිච්ඡේදය.

1 ඒ මහාමහෙන්ද්‍රස්ථවිරයන්වහන්සේ පිඩු පිණිස පුරයෙහි
හැසිර ජනයාට සඞ්ග්‍රහකොට රජගෙයි වලදමින් රාජ
2 සඞ්ග්‍රහකරන්නේ සව්සිදිනක් මහමෙවුනා උයන් වෙනෙහි
වාසය කළසේක, මහාප්‍රාඥවූ ඒ ස්ථවිරතෙම ඇසළමස ශුක්ල
පක්ෂය සම්බන්ධවූ තෙළෙස්වෙනි දවස්හි වනාහි රජගෙහි
3 වලඳා මහරජ ට මහාප්‍රමාදසූත්‍රාන්තය දෙශනාකොට ඉක්
බිත්තෙන්ද එහි චෛත්‍යපර්වතයෙහි විහාරකරණයක්
කැමැතිවෙමින් පෙරදිගින් නික්ම සැගිරියට වැඩිසේක.
4 තෙරුන්වහන්සේ එහි වැඩියා අසා මිහිපතිතෙම රියනැගී
5 දේවීන් දෙදෙනෙක්ද ගෙණ තෙරුන්වහන්සේගේ පියවර
6 පසුපස්සේ ගියේයි. ස්ථවිරයෝතුමූ එහි නාගචතුෂ්කස්ථා
නෙහිවූ විලෙහි නාගෙණ පර්වතයට නගිනා පිණිස පිළිවෙ
7 ළින් වැඩසිටියෝය. එකල්හි රජතෙමේ රථයෙන් බැස සිය
ලුම ස්ථවිරයන් වැන්දේය, ඒ ස්ථවිරයෝතුමූ "මහරජතෙනි

Digitized by Google

තුමට උෂ්ණයෙහි කල්‍යානතාව ඇයෙහිදැ"යි විචාරා වදළා
8 හුය. "තුඹවහන්සේලාගේ ගමනෙහි සැකහරමින් ආයේ
වෙමි" යි කීකල්හි "බන්ධකයන්හි දක්‍ෂවූ ස්ථවිරයන්වහන්
9 සේ මෙහිම වස්වසන පිණිස ආයෙයවූය" යි වදාරා වස්සූප
10 නායිකක්ඛන්ධකය රජහට වදාළසේක. රජහුගේ බෑනාවූ
මහාරිට්ඨනම් මහාමාත්‍යතෙමේද රජු ඉදිරියෙහි සිටියේය,
11 ඒ බඹමග අසා යාච්ඤාකොට දෙටු කණිටු සොහොවුරන්
පස්පණස්දෙනකුහා සමග ස්ථවිරයන්වහන්සේ සමීප
යෙහි එදවසම පැවිදිවූහ. මහත් ප්‍රඥාඇත්තාවූ ඒ සිය
12 ල්ලෝ කරකම් අවසානයෙහි අර්හත්ඵලප්‍රාප්තවූහ. ඒ නරේ
න්ද්‍රතෙම එදවසම කන්තකනම් චෛත්‍යස්ථානයෙහි හාත්
පස අටසැටලෙණ කර්මාන්තයා පටන්ගන්වා නගරයට සම්ප්‍රා
13 ප්තවිය, අනුකම්පාකාරණ ඒ ස්ථවිරයෝතුමූ (පෙරවරු) කාල
14 යෙහි නුවරට වදනෝ එහිම විසූහ. රජතෙම ලෙන්
කම් නිමවූකල ඇසළමස පුණු පොහෝදවස්හි ගොස් තෙ
15 රුන්වහන්සේලාට විහාර දක්ෂිණව දුන්නේය. කෙලෙස්
හිමි ඉක්මූ ඒ ස්ථවිරයන්වහන්සේ ඒ විහාරයටද ඒ මහාරිෂ්
ඨින්ගේද නැවත පැවිදි අපේක්‍ෂා කරනාහන්ගේද ප්‍රයෝජ
16 නය පිණිස දෙතිහක් සීමා මාලකයන්ටද එදවස්ම සීමාබ
න්ධනයකොට තමන් විසින් බදනාලද තුම්බුරු මාලකනම්
ඛණ්ඩසීමාහෙහි ඒ සියල්ලන්ගේ උපසම්පදාව පළමුකොටම
17 කළසේක. මේ සියලුම දෙසැට නම්ක් රහතන්වහන්සේ
ලා ඒ සෑගිරියෙහි වස්එළැඹ රජහට සඞ්ග්‍රහකළහ.
19 දෙවිමිනිස් සමූහයෝ තමන්කරා පැමිනියාවූ ඒ ගුණද්‍රව්‍ය
නාවූ ලෝරතුවන්ද ගුණයෙන් පතළාවූ කීර්තිමත්වූ ඒ
සඞ්ඝයාද පුදන්නෝ උන්වහන්සේලාකරාත් එළඹ (පුදන්
නෝ) මහත්වූ පින්රැස් කළාහුය.

මෙතෙකින් සුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වස චෛතියපබ්බතවිහාරපටිග්ගහණ නම්වූ සොළොස්වන අදි
යර නිමි.

---

17 වෙනි පරිච්ඡෙදය.

1 මහත් ප්‍රඥාඇත්තාවූ මහාස්ථවිරයන්වහන්සේ වසනලද
2 වස්ඇතෙත් පවරා ඉල්මස පුර පසළොස්වක්හි මහරජහට
"නරේන්ද්‍රයාණෙනි අපගේ ශාස්තෘවූ සම්බුද්ධයන් වහන්සේ

Digitized by Google

අපවිසින් බොහෝකලකින් පූර්වයෙහි දක්නාලද්දේය
3 අනාථ වාසයෙන් විසුම්හ, අපට මෙහි පූජනීය වස්තුවක්
නැත්තේය." යි මේ වචනය වදාළසේක. වහන්ස "සර්වඥ
යන්වහන්සේ පිරිනිවි සේකැයි මට වදාළාහු නොවෙද්ද"? යි
(රජතෙම කියේය) "ධාතූන් දුටුකල්හි සර්වඥයන්වහන්සේ
4 දක්නාලද්දේනම් වෙ" යි (ස්ථවිරයන්වහන්සේ) වදාළසේ
ක. "මාවිසින් සෑයක් කරවීමෙහිවූ බුද්ධවහන්සේලාගේ
අභිප්‍රාය දන්නාලද්දේය මම ථූපයක් කරවන්නෙම් බුද්ධ
වහන්සේලා ධාතූන් දැන වදාරණ සේක්ව" යි නරේන්ද්‍රතෙම
5 කියේය. ස්ථවිරයන්වහන්සේ "සුමනසාමණේරයන් හා
මන්ත්‍රණය කරව" යි රජහට වදාළසේක, ධාතූන් කොයින්
6 ලබම්දැ" යි ඒ සෙරණුවන්ට කියේය. "නරේන්ද්‍රයාණෙනි
පුරයහා මාර්ගය සරසවා පෙහෙවස් ඇත්තාහී පිරිස් සහිත
ව මඟුලැතුනැගී සේසත දරමින් තූර්‍යයන් සහිතව සවස්වේ
7 ලෙහි මහානාගවන නම් උයනට යව, නරේන්ද්‍රය ධාතුද්‍රභෙ
8 දවබොධය කළාවූ සර්වඥයන්වහන්සේගේ ධාතූන් එතන්
හිදී ලබන්නාහිය" යි ඒ සුමණ නම් සෙරණුවෝ සතුටු
9 සිත්ඇති නරනිදුහට වදාළහ.

ඉක්බිත්තෙන් ස්ථවිරයන්වහන්සේ රජගෙන් (නික්ම) සෑගි
රියට වැඩයහපත් මනොඥ ඇත්තාවූ සුමණනම් සෙරණ
10 නුවන් "යහපත්වූ සුමණය (මෙහි) එව" යි කැඳවා "තෝ
උතුම්වූ පුෂ්පපුරයට ගොස් තාගේ මුත්තානුවූ මහරජහට මෙ
11 සේ අපේ වචනය කියව "මහරජතෙනි සුමමතුන්ගේ යහළුවූ
දෙවියන්ට ප්‍රියවූ (දෙවැනි පැතිස් නම්වූ) මහරජතෙම බුද්ධ
ශාසනයෙහි ප්‍රසන්නවූයේ ථූපයක් කරවනු කැමැත්තේය.
12 බුද්ධ සමීපයෙහි බොහෝ (සුගත) ශරීරධාතු ඇත්තාහ සර්වඥ
යන්වහන්සේගේ ධාතුන්ද ශාස්තෘන්වහන්සේ විසින් පරි
13 භොගකරණලද්දාවූ පාත්‍රයද දෙව" යි කියා පාත්‍රය පුරා ඒධාතූ
න් ගෙණ සක්දෙව් පුරවරයට ගොස් ඒ සක්දෙව් රජහට මෙ
14 සේ අපේ වචනය කියව, "දෙවේන්ද්‍රයාණෙනි තුන්ලෝ වැ
සියන්ගේ දක්ෂිණාවට සුදුසුවූ (සර්වඥයන්වහන්සේගේ) දකු
ණු දළදාවද දකුණු අකුදාවද සුමනතුන් සමීපයෙහි ඇ
15 ත්තාහ, ඒ දළදාවම පුදව ශාස්තෘහුගේ අකුදාව දෙව දේවේන්ද්‍ර
ය ලක්දිවි වැසියාගේ කටයුත්තෙහි ප්‍රපමනොවෙව" යි (කිය
16 වයි වදාළසේක) ඒ මහත් සෘද්ධිමත්වූ සෙරණුවෝ "වහන්
ස එසේය" යි කියා එකෙණෙහිම ධර්මාශෝක මහරජුකරා
17 වැඩිසේක: එහි ශාලවෘක්ෂමූලයෙහි තබනලද කාර්ති
18 කොත්සවයෙන් පුදනුලබනනාවූ යහපත්වූ බොධියද දුටුසේ

ක. ස්ථවිරයන්වහන්සේගේ වචනය කියා රජහු සමීපයෙන්
ලද්දාවූ ධාතූන් පාත්‍රය පූරාගෙණ හිමවත ට පැමිණියේක.
19 ධාතුසහිතවූ උතුම් පාත්‍රය හිමවත තබා ශක්‍රදෙවේන්ද්‍ර
යාකරා ගොස් ස්ථවිරයන්වහන්සේගේ වචනය කීයේක.

20 ශක්‍රදෙවේන්ද්‍රතෙම සිළුමිණිසෑයෙන් දකුණු අකුදව ගෙ
21 ණ සෙරණතුවන්ට දුන්නේය. සුමණ සාමණේර යතිතෙම
ඒ අකුදව හා ධාතුපාත්‍රයද ගෙණ එතැනින් සෑගිරියට
22 අවුත් ස්ථවිරයන්වහන්සේට එය දුන්සේක. සවස් වේලෙහි
රාජසේනාව විසින් පෙරටුකරණ ලද්දාවූ නරේන්ද්‍රතෙම කිය
23 නලද විධියෙන් මහානාගවන නම් උයනට ගියේය. ස්ථවිර
යන්වහන්සේ ඒ පර්වතයෙහිම සියලු ධාතූන් තැබූසේක
එහෙයින් මිශ්‍රකපර්වතය චෛත්‍යපර්වත නම්විය.

24 ස්ථවිරයන්වහන්සේ ඒ ධාතු පාත්‍රය සෑගිරියෙහි තබා අකු
ධාතුව රැගෙන (සාමණේරයන් විසින්) ලකුණුකරණලද
25 ස්ථානයවූ (මහානාගවනයට) වැඩිසේක. නරේන්ද්‍රතෙම
"ඉදින් මේ සර්වඥයන්වහන්සේගේ ධාතුවෙක්නම් මාගේ
ඡත්‍රය (ධාතූන්වහන්සේ දෙසට) තෙමේම නැමේවා, හස්ති
26 තෙමේ දනින් සිටීවා, මේ ධාතුකරඬුව ධාතුසමග අවුත්
27 මාගේ මස්තකයෙහි පිහිටාව" යි සිතුයේය, සිතනලද එය එ
සේම විය—මහීපතිතෙම අමෘතයෙන් අභිෂෙක ලදෙක්
28 මෙන් අතිශයින් සතුටුවූයේය, ඒ ධාතු කරඬුව හිසින්ගෙණ
ඇත්කද මත්තෙහි තැබූයේය, සතුටුවූ හස්තිතෙම කුංචනාද
කළේය, පොළව කම්පිතවිය. හස්තිතෙම එතැනින් හැරී
29 ස්ථවිරයන් හා සේනාවාහන සහිතවූයේ පෙරදිග දොරින්
සහපත්වූ පුරයට ප්‍රවිෂ්ටව නැවත දකුණු දොරින් එයින්
30 නික්ම ථූපාරාමයෙහි චෛත්‍යස්ථානයෙන් පිටිපස කර
ණලද්දාවූ ප්‍රමොජවස්තුනම් දෙවස්ථානයට ගොස් බොධි
31 ස්ථානයෙහි නැවැතී පූර්වදිගට අභිමුඛව සිටියේය, එකල්හි
ඒ ස්තූපස්ථානය හිඟුරුවැල් හා හිය වැළින් වැසුනේවිය,
32 නරදෙවතෙම දෙවියන් විසින් රක්නාලද පවිත්‍රවූ ඒ ස්ථා
නය එකෙණෙහිම මනාකොට ශුද්ධද අලංකෘතද කරවා,
ඇත්කඳින් ධාතු පාතට වඩනා පිණිස ආරම්භකෙළේය,
33 හස්තිතෙම ඒ නොකැමැතිවිය, රජතෙම ඒ (ඇතුගේ)
34 සිත ස්ථවිරයන් විචාළේය. "තමන් කුම්භය හා සම උස්තැ
නෙක තැබීමට (හස්තිතෙම) කැමැතිවෙයි ධාතූන් පාත
වැඩීම උහුවිසින් අභිමත නොකරණලද" යි ස්ථවිරතෙම
වදාළසේක.

Digitized by Google

35 රජතෙම එකෙණෙහිම අණකොට ශුෂ්කවූ අබාවැවෙහි
ශුෂ්කකර්දම පිණ්ඩයෙන් ඒ හස්තිකුම්භයට සමකොට (ථූප
36 යක්) නිමවා ඒ උත්තම ස්ථානය බෙහෙවින් සරසා ඒ ධාතුව
37 ඇත්කඳින් බා එහි වැඩූයේය. ධාතු ආරක්ෂාකිරීම සංවි
ධානකොට, එහි ඇතුසිටුවා ධාතුචෛත්‍යය කිරීමෙහි යුහු
38 සුලුසිත්ඇත්තාවූ රජතෙම වහා ගඩොල් නිමවීමෙහි බො
හෝවූ මිනිසුන් මෙහෙයා ඇමැතියන් සහිතවූයේම
39 ධාතු කෘත්‍යය සිතමින් නුවරට ප්‍රවිෂ්ටවූයේය. සඞ්ඝයා සහි
තවූ මහාමහෙන්ද්‍රස්ථවිරතෙම වනාන්ත යහපත්වූ මහමෙවු
නා උයනට එලැඹ එහි වාසයකළසේක.

40 ඒ ඇත්තෙම රාත්‍රියෙහි ධාතුසහිතවූ ඒ ස්ථානය සිසාරා
ගමන් කෙරේ, දහවල් (ධාතුව කුම්භස්ථලයෙහි තබාගෙණ)
41 ධාතුසහිතවූයේ බෝධිස්ථානයෙහිවූ සාලාවෙහි සිටී, ස්ථවිර
යන්ගේ මතය අනුව පැවැත්තාවූ නරේන්ද්‍රතෙම ඒ චෛත්‍ය
ස්ථානය මත්තෙහි කෙණ්ඩයක් පමණ උස්වූ ථූපයක් කිප
42 දිනකින් බඳවා, එහි ධාතු පිහිටුවීම (නුවර) ඝෝෂාකරවා
43 ථූපාරාමයට එලඹියේය, ඒ ඒ තැනින් හාත්පසින් මහජන
තෙම රැස්වූයේය, ඒ සමාගමෙහි ඇත්කුම්භතෙලෙන් අහ
සට නැංගාවූ ධාතුතොමෝ සත්තලක් පමණ උස අහසෙහි
44 පෙණෙමින් සිටියා ජනසමූහයා විස්මයට පත්කරමින්
ගණ්ඩම්බ නම් රුක්මුල සර්වඥයන්වහන්සේ පෙළහරකළ
45 පරිද්දෙන් ජනයා රෝමෝද්ගමනය කරනනාවූ පෙළහර
කළසේක. නොයෙක්වර එයින් නික්මුනාවූ ගිනිදැලිත්හා
ජලධාරාවෙන් සකල ලඞ්කා පෘථිවිතොමෝ තමාම ආලෝක
46 ඇත්තීද තෙමනලද්දීද විය, පරිනිර්වාණ මංචකයෙහි හොත්
තාවූ පසැස්ඇති සර්වඥයන්වහන්සේ විසින් මහාධිෂ්ඨාන
47 පසක් කරණලද්දේය. "අශෝක නම් රජහු විසින් ගන්නා
ලබනනාවූ මහාබොධිදක්ෂිණශාඛාතොමෝ තොමෝම
48 සිඳී කටාරමෙහි පිහිටාවා, ඒ ශාඛාතොමෝ පිහිටා සියලු
49 දිගුත් රඳවමින් ඵලපත්‍රයන්ගෙන් යහපත්වූ සවණක් රැස්
මුදාවා, සිත්කලුවූ හිමතොමෝ රන්කටාරම සහිතවූවා අහසට
50 නැගී සත්දිනක් අදෘශ්‍යමානව හිමගර්භයෙහි සිටීවා. ථූපා
රාමයෙහි පිහිටනනාවූ මාගේ දකුණු අකුදාව අහසටනැගී
51 යමා මහපෙළහර කෙරේවා. ලඞ්කාවට ආහරණවූ රුවන්
වැලි සෑයෙහි පිහිටනනාවූ ප්‍රමාණයෙන් ද්‍රෝණයක් පම
52 ණවූ ධාතුහු බුද්ධවෙසධරව නැගී අහස සිට්යාහු යමා මහ
පෙළහරකොට පිහිටත්වා" යි මේ අධිෂ්ඨාන පස තථාගත
53 යන්වහන්සේ ඉටා වදාළසේක—එහෙයින් ඒ අකුදතො

Digitized by Google

මෝ එකල්හි ඒ පෙළහර කළසේක. ඒ ධාතුහොඹෝ අහ
54 සින් බැස, මහීපල්හු මුදුනෙහි පිහිටිසේක, අතිශයෙන්ම
සතුටුවූ රජතෙම ඒ ධාතුව චෛත්‍යයෙහි පිහිටෙවූයේය. එ
55 සමයෙහි ඒ ධාතුව චෛත්‍යයෙහි පිහිටුකල්හි රෝමෝද්ගම
නය කරන්නාවූ අද්භූතවූ භූමිකම්පාවෙක්විය.
56 "මෙසේ සර්වඥවරයෝ නොසිතියහැක්කාහ, බුද්ධධර්ම
යෝ නොසිතියහැක්කාහ, නොසිතියහැක්කවුන් කෙරෙහි
ප්‍රසන්නවූවන්ට නොසිතියහැකිවූ විපාකයද වන්නේයි."
57 ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දැක ජනයෝ සර්වඥයන් කෙරෙහි පැහැදුනා
හ, රජහු මල්වූ මත්තාභය නම් රාජකුමාරතෙම වනාහි
58 මුනීන්ද්‍රයන් කෙරෙහි පැහැද, නරේන්ද්‍රයන්ට යාච්ඤාකොට
පුරුෂයන් දහසක්හා සමග සස්නෙහි පැවිදිවූයේය. චෙ
59 තාපි නම් ගම්න්ද, දෙරමබුලු නම් ගම්න්ද, විහිරබීජ නම
ගම්න්ද, එසේම ගල්පිටියෙන්ද, එසේම උපතිස්නම් ගමින්
60 ද සතුටුවූ පන්පන්සිය ගම්දරුවෝද තථාගතයන් කෙරෙ
61 හි සටගත් ශ්‍රද්ධාඇත්තෝ පැවිදිවූහ. මෙසේ පුරයෙන්
බැහැරද එකල බුදුසස්නෙහි පැවිදිවූ සියලු භික්ෂූහු තිස්
62 දහසක්වූහ. මහීපතිතෙම ථූපාරාමයෙහි උතුම්වූ ථූපය
නිමවා නොයෙක් රත්නාදියෙන් සැමකල්හි පුදකෙළේය.
63 රජහු අන්තඃපුර වාසීහුද, ක්ෂත්‍රියයෝද, අමාත්‍යයෝද,
එසේම නුවර වැස්සෝද, සියලුම දනවුවැස්සෝද, එවින්
64 වෙන් වසයෙන් පුදකළහ. නරේන්ද්‍රතෙම ථූපය පෙරවූ
කොට එහි විහාරයක් කරවූයේය, මේ විහාරයතෙම එයින්
ථූපාරාමයයි ප්‍රකටවිය.
65 පරිනිර්වාණප්‍රාප්තවූත් ලෝකස්වාමීතෙම ස්ථිරධාතු
ශරීරයෙන් පවා මෙසේ ජනසමූහයාට වැඩ සහ සැප නො
යෙක් ආකාරයෙන් මනාකොට කළසේක; සර්වඥයන්වහන්
සේ ජීවමාන කල කියනුම කවරේද?

මෙතෙකින් සුදීජනයා පහන් සංවෙග පිණිස කළ මහා
වංශ ධාතුආගමන නම්වූ සතළොස්වන අද්‍යාර නිමි.

---

18 වෙනි පරිච්ඡේදය.

1 මහීපතිතෙම මහාබෝධියද (සංඝමිත්‍රා නම්) ස්ථවිරින්ද
2 ගෙන්වනු පිණිස ස්ථවිරයන්වහන්සේ විසින් වදාළ වචනය
සිහිකරමින් වස්කාලයතුළ එක්දිනක් සිංහෙයි. ස්ථවිර

යන් සමීපයෙහි හුන්නාන්, ඇමැතියන්හා සමග මන්ත්‍රණය
කොට තමන් බෑනාවූ අරිට්ඨනම් ඇමැතියා ඒ කර්මයෙහි
3 තෙමේම මෙහෙයම්න් (කරුණු) මෙනෙහිකොට උන්හු කැඳ
4 වා "දරුව ධර්මාශෝක මහරජනන් කරා ගොස් මහාබෝ
ධියද සඞ්ඝමිත්‍රානම් ස්ථවිරීන්ද මෙහි වඩාගෙණනු හැක්
5 කෙහිද" යි මේ වචනය කීයේය. (ජනයාගම) තුෂ්ටදයකවූ
දෙවයන්වහන්ස ඉදින් මම මෙහි ආයෙම් පැවිද්දවනු ලබ
6 නොහාම්නම් ඒ දෙනම පැළලුප් නුවරින් වඩාගෙණඑනු
හැකෙකකමි" යි (කීයේය) රජතෙම "එසේ වේව" යි කියා
උන්හු එහි යැවූයේය, හෙතෙම තෙරුන්වහන්සේගේද න
7 රේන්ද්‍රයන්ගේද හසුන්ගෙණ වැද, වප්මස ශුක්ලපක්ෂයෙහි
දෙවෙනි දවස්හි නික්මුනේය, නරනිඳුහුගේ කර්මයෙහි
8 අනුයුක්තවූ හෙතෙම දඹකොල පටුනෙහිදී නැව්නැගී, මහ
මුහුද තරණයකොට ස්ථවිරයන්වහන්සේගේ අධිෂ්ඨාන
9 ගෙන් යෙදීමෙන් නික්මුන දවස්හිම රම්‍යවූ පැළලුප්නුවරට
ගියේය.
10 එකල්හි වනාහි ශ්‍රේෂ්ඨවූ අනුලාදේවීතොම පන්
සියයක් කන්‍යාවන්හා අන්තඃපුරවාසිවූ ස්ත්‍රීන් පන්සිය
යක්ද සමග දසසිල් සමාදන්ව කාෂාවත්ඇතති පිරිසිදුවූවා
පැවිදි පතමින් ස්ථවිරීන්ගේ ආගමනය සොයනනී නුවර
11 එක් පෙදෙසෙක්හි නරනිඳුහු විසින් කරවනලද සිත්කලුවූ
12 මෙහෙණ් අසපුවෙක්හි යහපත් ව්‍රතඇතිව වාසයකළාය. ඒ
උපාසිකාවන් විසූ මේ මෙහෙණවර ඒ කාරණකොටගෙණ
13 උපාසිකා විහාරයයි ලක්දිව ප්‍රකටවිය. (නරනිඳුහු) බෑනාවූ
මහාරිට්ඨනම් ඇමැතිතෙම රාජසන්දේශය ධර්මාශෝකනරේ
14 න්ද්‍රයානන්ට පමුනුවා ස්ථවිරයන්වහන්සේගේ සන්දේශය සැල
කෙළේය. "රාජශ්‍රේෂ්ඨයන්වහන්ස බුද්ධවහන්සේගේ යහළු
15 රජානන් සහෝදරයානන්ගේ දේවීතොමෝ පැවිදි පතමින්
නිබද සංයමඇතිව වසනනීය, ඒ දේවිය පැවිදිකරණුපිණිස
16 සඞ්ඝමිත්‍රානම් මෙහෙණිනන මෙහෙයව. ඒ මෙහෙණිනන
සමග මහාබෝධි දක්ෂිණ ශාඛාවද යවව" මහාමහෙන්ද්‍රස්ථ
විරයන්වහන්සේගේ වචනයවූ එම අර්ථය තෙරණියටද
කීයේය, ඒ ස්ථවිරීතොමෝ පිය (මහරජනන්) කරා එළැඹ
17 ස්ථවිරයන්වහන්සේගේ මතය කියේක, "මැතියෙනි පුණම
තුන් නොදක්නාවූ මම දරු මුනුබුරන්ගේ වියෝගයෙන්
18 වූ ශෝකය කෙසේ දුරුකෙරෙම්ද" යි රජතෙම කීයේය, "මහ
රජතෙනි මාගේ සහෝදරයානන්ගේ වචනය මට ගරුය,
පැවිදිකටයුත්තියෝද බොහෝය එහෙයින් මාවිසින් එහි

Digitized by Google

යාඥතුය" යි හිමියෝ කීවාය.
19 "ශස්ත්‍රප්‍රහාරයට නුසුදුසුවූ මහාබෝධි වෘක්ෂයෙන් ශාඛාව
20 කෙසේනම් ගණිම්ද" යි රජතෙම සිතුයේය. ඒ මහීපති
තෙම මහාදෙවනම් අමාත්‍යයාගේ උපායෙන් භික්ෂුසංඝයා
21 පවරා වලදවා "වහන්ස ලංකාවට මහාබෝධිය යැවියුතු
22 ද්දෝ" යි විචාළේය. ඒ මොග්ගලිපුත්ත නම් ස්ථවිරයන්
වහන්සේ "යැවියයුතුය" යි වදාරා පසැස්ඇත්තාවූ සර්වඥ
23 යන් විසින් කරණලද මහාධිෂ්ඨාන පස නරේන්ද්‍රයන්ට වදා
ළහ, ඒ මහීපතිතෙම ඒ අසා සතුටුව මහාබෝධිය වෙතට
යනනාවූ සත්යොදුන් මග ශුද්ධකරවා සකස්කොට නොයෙක්
24 පරිද්දෙන් අලංකාරකරවූයේය. කටාරමක් කරණ පිණිස
රන් බැහැරකරවූයේය, තුලාධාරයෙකුගේ වෙස්ගත් ඒ
25 විස්කම් දෙව්පුත් තෙමේද අවුත් "කෙපමණ කටාරමක්
26 කෙරෙම්ද" යි ඒ නරනිඳුහු විචාළේය. "තෝම ප්‍රමාණ දැන
කරව" යි කීකල්හි, රන්ගෙණ අතින් පිරිමැද එකෙණෙ
27 හිම බඳන නිර්මිතකොටලාගියේය, නවරියන් අවට ඇත්තා
වූ ගැඹුරෙන් පස්රියන්වූ තුන්රියන් විෂ්කම්භයෙන් යුක්තාවූ
28 අටඅඟුල් ඝනවූ තරුණ ඇතෙකුගේ සොඬපමණ මුවවිට
29 ඇත්තාවූ තරුණ සූර්යසමාන කාන්ති ඇත්තාවූ සැපත්වූ
ඒ කටාරම ගෙන්වාගෙණ රජතෙම සත්යොත්නක් දිගුවූ
30 තුන්යොත්නක් පතලාවූ සිවුරඟ සේනාහා මහාභික්ෂු
සංඝයාත් සමග (ප්‍රසන්නාවූ ජනයන්ගේ පූජා සංඛ්‍යාත)
නානාවිධ අලංකාරයෙන් සැරසුනාවූ අනේකප්‍රකාර රත්න
31 යෙන් විචිත්‍රවූ නානාප්‍රකාර ධ්වජමාලා ඇත්තාවූ, නානාවිධ
පුෂ්පයෙන් ගැවසුනාවූ නානාවිධ තූර්යඝෝෂණය කරණ
32 ලද්දාවූ මහාබෝධි වෘක්ෂයකරා එළඹ සේනාවෙන් පිරිවරා
තිරයකින් අවුරා, මහාගණප්‍රධානවූ මහාස්ථවිරයන් දහස
33 හිත්හා ප්‍රාප්තාභිෂේකඇති දහසකින් වැඩිවූ රජදරුවන්
ගෙන්ද තමන්හා මහාබෝධිය මොනවට පිරිවරා ඇඳිලි
බැඳගෙණ මහාබෝධිය බැලූයේය. ඒ මහාබෝධීහුගේ
34 දක්ෂිණශාඛාව සම්බන්ධවූ සතරරියන් පමණ තැන්හා සෙ
35 සයද තබා ශාඛාවෝ අන්තර්ධානවූහ. ඒ පෙළහරදැක සතු
36 ටුවූ මහීපතිතෙම "මම රාජ්‍යයෙන් මහාබෝධිය පුදම්" යි
කියා මහාබෝධිය මහාරාජ්‍යයෙහි අභිෂේක කෙළේය, මහී
37 පතිතෙම මල්ආදියෙන් මහාබෝධිය පුදා ප්‍රදක්ෂිණකොට
38 අටතැනෙක්හි ඇඳිලි බැඳ නමස්කාරකොට, නොයෙක්
රත්නයෙන් සරසනලද රනින් නිමවනලද මහාකොට
39 නගිනුහැක්කාවූ ශාඛාවන් දක්වා උස්වූ පීඨයෙක්හි ඒ රන්

40 බඳන තබ්බවා නැගී උතුම්වූ ශාඛාව ගන්නා පිණිස රන්
තෙලෙලින් රත්සිරියෙල් ගෙණ ශාඛාවෙහි රේඛාවක්ඇඳ
“ඉදින් මේ මහාබෝධිය ලංකාද්වීපයටයායුතුවේද, ඉදින්
41 මම සර්වඥයන්වහන්සේගේ සස්නෙහි විමතිරහිතවෙම්ද
මේ යහපත්වූ දක්ෂිණමහාශාඛාව තොමෝම සිඳී මේ රන්
බඳනෙහි පිහිටාවා” යි සත්‍යක්‍රියා කෙළේය.
42 ඒ මහාබෝධිශාඛාතොමෝ රේඛාකළ තැනින් තොමෝම
43 සිඳී සුගන්ධකර්දමයෙන් පිරුණවූකටාරම මතෙහි පිහිටියා
ය, නරේශ්වරතෙම මුලරේඛාවෙන් මතෙහි තුණඟුලෙන්
44 තුණඟුල රත්සිරියෙලින් (නවතැනෙක) රේඛාදනය කර
මින් පිරිසින්දේය, ආද්‍යවූ රේඛාවෙන් මහත්වූ මුල්ද අනි
කුත් රේඛාවලින් කුඩාමුල්ද දශය දශය නික්මගෙණ දැල්
45 කවුළු හමාතව පාතබැස්සාහුය, ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දැක අතිශ
යෙන්ම සතුටුවූ නරේන්ද්‍රතෙම එහිම (සිට) උද්ඝොෂණය
46 කෙළේය, හාත්පස පිරිසද (තූර්‍ය්‍යඝොෂණය) කළාය, සතුටු
සිත්ඇතතාවූ භික්ෂුසඞ්ඝතෙම සාධුකාරය හැඟද්දේක, හාත්
47 පස දහස්ගණන් පිළිගිය සිසැරුම් පැවැත්තාහ, ඒ මහා
බෝධිතොමෝ මෙසේ මහජනයා පහදවන්නා මුල් සියය
කින් ඒ රන්කටාරමේ තිබූ සුවඳ මඩෙහි පිහිටියාය.
48 ඒ බෝධිස්කන්ධයතෙම දසරියන, මනරම්වූ ශාඛාපස සතර
49 රියන් සතරරියන් දූවාලූ පස්පලයකින් සැදුම්ලද්දාහ, ඒ ශා
ඛාවන් සම්බන්ධවූ කුඩා ශාඛාවන් දහසක්ද විය, මෙසේ
50 මහාබෝධිතොමෝ මනොහර ශ්‍රීධාරණයෙන් හෙබියාය.
51 කටාරමෙහි මහාබෝධිය පිහිටිකෙණෙහි පොළව කම්පිත
විය, නානාප්‍රකාර ප්‍රාතිහාර්‍ය්‍යයෝ වූහ, දෙවියන්හා මිනිසුන්
52 විෂයෙහි තූර්‍ය්‍යයන්ගේ ස්වකීය නාදයෙන්ද දෙව් බඹ සමූ
හයාගේ සාධුකාර නාදයෙන්ද මේඝයන්ගේද මෘගපක්ෂීන්
ගේද යක්ෂාදීන්ගේද ශබ්දයෙන්ද පෘථිවිකම්පා ශබ්දයෙ
53 න්ද එකකොළහල විය. බෝධිවෘක්ෂයාගේ ඵල පත්‍රයන්
යෙන් සවණක් රැස් නික්ම මුළු සක්වල හෙබවූහ. කටා
54 රම සහිතවූ මහබෝතොමෝ එතැනින් අහසට පැන නැගී
දශ්‍ය රහිතව සත්දවසක් හිමගර්භයෙක්හි පිහිටියාය.
55 රජතෙම පීඨයෙන් බැස ඒ සත්දවස එහි වෙසෙමින් සතත
යෙන් නොයෙක් පරිද්දෙන් මහබෝපූද කෙළේය. ඒ සත්
56 දවස ඉක්මගිය කල්හි සියලු ඒ තුසාර ජලඝයන් යුක්තවූ
මෙඝයෝද එකතුවූ රශ්මීහුද මහාබෝධියට ප්‍රවිෂ්ටවූහ.
57 කටාරම සහිතව පිහිටියාවූ මනරම්වූ මහබෝධිතොමෝ සිය
ලු මහජනයාට ශුද්ධවූ ආකාශයෙහි පෙණිනිය.

58 නානාවිධවූ ප්‍රාතිහාර්‍ය්‍යයන් පැවතිකල්හි මහබෝතොමෝ
ජනසමූහයා විස්මිතකරවමින් පොළෝතලයට බැස්සාය.
59 නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍යයන් කරණකොටගෙණ පිණාගියවූ
ඒ මහරජතෙම නැවත මහාබොධිය මහාරාජ්‍යයෙන් පිදූ
60 යේය. ඒ නරේන්ද්‍රතෙම මහාබොධිය මහාරාජ්‍යයෙන් අභි
ෂෙකකොට නානා පූජායෙන් පුදගෙණ නැවත සත්දවසක්
61 එහිම වාසයකෙළේය. දෙසතිය ඇවෑමෙහි වප්මස පූර
62 පසළොස්වක් පොහෝදවස්හි මහාබොධිය එතැනින් වඩා
ගෙනගොස්, වප්මස කෘෂ්ණපක්ෂයෙහි චාතුර්දශීවූ පොහෝ
දවස්හි නරේන්ද්‍රතෙම මහාබොධිය යහපත්වූ රථයෙහි
63 තබාගෙණ පුදමින් එදවස්ම ඪකීය පුරයට පමුනුවා
64 බෝගෝනසින් අලඞ්කාරකොට යහපත්වූ මණ්ඩපයක් ක
රවා කාර්ත්තික ශුක්ලපක්ෂයෙහි පෑළවිය දවස්හි මහාබොධිය
65 එහි පැදුම්දිග යුහවූ මහාසාලවෘක්ෂ මූලයෙහි වඩාතබා
දවසක්පසා නොයෙක් පූජාවන් කරද්දේය, ඒ බොධිය
ග්‍රහණයකළ දවසින් සතළොස්වන දවස්හි එකවිටම අං
66 කුර නවයක් උපන්හ, එසින් සතුටුවූ නරේන්ද්‍රතෙම නැව
67 තද මහාබොධිය රාජ්‍යයෙන් පිදූයේය. භූමිපතිතෙම මහා
බොධිය රාජ්‍යයෙහි අභිෂෙකකොට, නානාවිධවූ මහාබොධි
පූජාද කරද්දේය.
68 මෙසේ විලක්ෂා සමානවූ පුෂ්පපුරයෙහි රැස්සහිතවූ
නානාවිධ මනොඥවූ ධ්වජයෙන් ආකුල විශාලවූ අතිශ
යෙන් සිත්කලු උතුම්වූ මහාබොධිපූජාතොමෝ දෙව්මිනි
සුන්ගේ සිත් ප්‍රබොධකරන්නී විය.

මෙතෙකින් සුදීජනයා පහන් සංවෙග පිණිස කළ මහ වංශ මහාබොධි ග්‍රහණනම් අටළොස්වෙනි අදියර නිමි.

---

19 වෙනි පරිච්ඡේදය.

1 ඒ මහිපතිවූ මහරජතෙම මහබෝ රක්නා පිණිස අට
2 ළොස් කුලයක දෙවියන්ද, අටළොස් කුලයක ඇමැතියන්
ද, අටකුලයක බමුණන්ද, අටකුලයක කෙළෙඹියන්ද, ගො
3 පළු කුලයන්හා තරස්කුලයන්ද, කුලිඟු කුලයන්ද එසේම
පෙහෙර කුලයන්ද, කුඹල් කුලයන්ද, සියලුම සේනා සම්බ
4 න්ධ කුලයන්ද, නාග යක්ෂයන් සම්බන්ධ කුලයන්ද, අට

Digitized by Google

අටදී, අභිමතදායීවූයේ රන්රිදී මුවාකලයන් අටඅටදී. ගඞ්ගා
නම් නදියෙහි සරසනලද නැවට මහාබොධිය නංවා
5 එකොළොස්නමක් මෙහෙණින්නන් සහිතවූ සඞ්ඝමිත්‍රානම්
6 මහතෙරණින්ද එසේම අරිට්ඨකුමාරාදීන්ද නැව්නංගවා,
නුවරින් නික්ම වින්ධ්‍යවනය සත්දවසකින්ම ඉක්මවා තාම
7 ලිප්ති නම් තොටට පැමිනියේය, දෙවියෝද නාගයෝද
මිනුෂ්‍යයෝද, අතිශයින් උදාරවූ පූජායෙන් පුදන්නාහු සත්
8 දවසින්ම එහි පැමිනියහ. ඒ මහීපතිතෙම මහාබොධිය
මහාසමුද්‍ර තීරයෙහි වඩාහිඳුවා නැවතද මහාරාජ්‍යයෙන්
9 පිදූයේය, අභිමතදායකවූ ඒ නරේන්ද්‍රතෙම මහාබොධිය
මහාරාජ්‍යයෙහි අභිෂෙකකොට, උඳුවප්මස ශුක්ලපක්ෂ
10 යෙහි පෑළවිය දවස්හි එතැනින් මහාබොධිය (නැවට)
වඩන්නට (පැළලුප්නුවර) සාලමූලයෙහිදී දෙනලද ජාති
11 යෙන් උසස්වූ ඒ අටඅට කුලවාසීන්හා සමග මහාබොධිය
ඔසවාගෙණ එහි ග්‍රීවය දක්වා ජලයෙහිබැස, මනාකොට
12 නැවෙහි පිහිටවූයේය. ස්ථවිරීන් සහිතවූ ඒ මහතෙරණියද
13 මහාරිෂ්ට නම් මහාමාත්‍යයාද නැවට නංගවා මේ වචනය
කීයේය "මම තුන්වරක් මහාබොධිය රාජ්‍යයෙන් පිදූයෙමි.
14 එසේම මාගේ යහළුවූ රජතෙම රාජ්‍යයෙන් පුදාවා." මේ
වචනය කියා ඉවුරෙහි සිටියාවූ මහරජතෙම වඩනාවූ මහා
15 බොධිය දකිමින් කඳුලු වැගිරවූයේය. මහාබොධියෙන්
වෙන්වීම කරණකොටගෙණ ශොකඇතිවූ ඒ ධර්මාශොක
මහරජතෙම හඬා වැලප සියපුරයට සම්ප්‍රාප්තවූයේය.

16 මහාබොධිය ආරොපණය කරණලද්දාවූ නැව සාගරයට
වන්නේය, (ඒ) මහමුහුද හාත්පස යොදුනක් තන්හි රළ සං
17 සිඳුනේය, හාත්පස පස්වණක් පියුම් පිපුනාහ, නොයෙක්
තූර්‍ය්‍යයෝද අහස්හි වැදුනාහ. නොයෙක් දෙවතාවුන් විසින්
18 නොයෙක් පුදපවත්වනු ලැබූහ. නාගයෝ මහාබොධිය
19 ගන්නාපිණිසද සෘද්ධිවිකුර්වණය කළහ. අභිඥාබල පාර
20 ප්‍රාප්තවූ සඞ්ඝමිත්‍රා නම් මහතෙරණීතොමෝ ගුරුළු වෙස්
ඇතිව ඒ මහානාගයන් බියගැන්වීය. බියගන්වන ලද්දාවූ
ඒ මහානාගයෝ මහතෙරණින් යාච්ඤාකොට මහාබො
21 ධිය එතැනින් නාගභවනයට වඩාගෙණගොස් සත්දවසක්
මුළුල්ලෙහි නාගරාජ්‍යයෙන්හා නානාවිධ පූජායෙන් පුද
22 වඩාගෙණවුත් නැවෙහි පිහිටවූහ. මහාබොධිතොමෝ එද
වසම මෙහි දඹකොළ පටුනට වැඩියාය, ලෝවැඩෙහි ඇලු
23 නාවූ දෙවැනි පෑතිස් රජතෙම වනාහි, සුමණ සාමණෙර
24 යන් අතින් පූර්ව්වයෙහි අසනලද ඒ බොධිද්‍රුමාගමනය ඇ

ගොනා උළුවප්මය පලමුණුවිනිදින පටන් (නුවර) උතුරු දෙ
රින් දෘඝකොළ පටුන් මහාංග දක්වා සියලු මාර්ගය අල
25 ඞ්කෘතකරවා මහාබෝධිය කෙරෙහි ශ්‍රිය සිත්ඇතියේ, මුහුදු
අසල සාලාවෙක ස්ථානයෙහි සිට, මහමුහුද වඩනා මහා
බෝධිය මහාතෙරනුවන්ගේ ඍද්ධිය කාරණකොටගෙණ දුටු
26 යේය ඒ අද්භූතය ප්‍රකාශකරණ පිණිස ඒ ස්ථානයෙහි කර
ණලද සාලාතොමෝ මෙහි සමුද්‍රසන සාලායයි ප්‍රකටවිය.
27 යහපත් දෙහඇත්තාවූ මහරජතෙම සෙනාසහිතවූයේ
මහාස්ථවිරයන්වහන්සේගේ අනුභාවයෙන් ඒ ස්ථවිරයනුත්
28 හාසමග එදවසම දඹකොළ පටුනට මහාබෝධිය මෙහි
29 පැමිනීමෙහි ප්‍රීතියෙන් පත්වූයේ, ලඞ්කාශ්වර නරෙන්ද්‍රතෙම
ප්‍රීතිවාක්‍යය පවත්වමින් ග්‍රීවය පමණ ජලයට බැස, සො
ළොස්කුල ජනයන් සමග මහාබෝධිය හිසින් දරගෙණ
30 වෙරලට නගාගෙණ යහපත්වූ මණ්ඩපයෙහි වඩා ලඞ්කා
31 රාජ්‍යයෙන් පිදුයේය. නරෙන්ද්‍රතෙම තමන්ගේ රාජ්‍යය
සොළොස්කුල ජනයන්ට පවුනුවා තෙමේ දොරටුපාල තන්
32 හි සිට තුන්දිනක් එහිම නානාවිධ පූජාකෙළේය. කාරණ
යෙහි නුවනැත්තාවූ නරෙන්ද්‍රතෙම දසවක් දවස්හි මහාබෝ
ධිය යහපත්වූ රථයෙකින් වඩාගෙණ එන්නේ පැදුම්දෙස
33 විහාරස්ථානයෙහි තැබ්බවූයේය, ඒ නරෙන්ද්‍රතෙම (එතන්
34 හි) සඞ්ඝයාටහා ජනයාට පෙරවරු බත පැවැත්වූයේය,
මහාමහෙන්ද්‍රස්ථවිරයන්වහන්සේ එතන්හි දශබලධාරී තථා
ගතයන්වහන්සේ විසින් කරණලද නාගදමනය ඒ රජහට
නිරවශෙෂවශයෙන් වදාළසේක.
35 මිහිපතිතෙම ස්ථවිරයන්වහන්සේගෙන් අසා සර්වඥයන්
වහන්සේ විසින් වැඩහිඳුම් ආදියෙන් පරිභොගකරණලද්
36 දුවූ ඒ ඒ තන්හි ලකුණුකරවා, තිවකක නම් බ්‍රාහ්මණයාගේ
37 ගම්දෙරද ඒ ඒ තන්හිද මහාබෝධිය වඩාහිඳුවා සුදුවැලි
අතුල නානාවිධ පුෂ්පයෙන් ආකුලවූ ඔසවනලද කොඩි
38 ඇති මල් ඇගෑයෙන් සරසනලදුවූ මාර්ගයෙහි රුදවල්
අනලස්ව පුදකරමින් තුදුස්වක්හි අනුරාධපුර සමීපයට
39 මහාබෝධිය වඩාගෙණවුත් වැඩෙන්නාවූ සෙවනැලිඇති
සවස්කාලයෙහි පූජාකෙරෙමින් මොනවට සරසනලද පුර
40 යට උතුරු දෙරින් ප්‍රවිෂ්ටකෙළේය. ඒ නරෙන්ද්‍රතෙම දකු
ණුදෙරින් නික්ම සිවුබුදුවරයන් විසින් සෙවුනාලද මහමෙ
41 වුනා උයනට ප්‍රවිෂ්ටකර සුමණ සාමණෙරයන්ගේ වචන
යෙන්ම මොනවට සරසනලද්දවූ පූර්වබොධීන් පිහිටි
42 ස්ථානයවූ මනරම්වූ ප්‍රදෙශයට පමුනුවා රාජභරණයෙන්

Digitized by Google

අලඞ්කෘතවූ සොළොස්කුල ජනයන් සහසම්ගූ මහාබොධිය
43 තබා පිහිටුවනුපිණිස අතින් තොරකෙළේය. අතින්මුත්
පමණ කල්ඇති ඒ මහාබොධිතොමෝ අසූරියන් පමණ
44 අහසටනැගී සිටියා මනාවූ සවණක් රැස් විහිදුවාය.
මනොරම්‍යවූ ඒ රශ්මීහු ලඞ්කාද්වීපයෙහි පැතිර බ්‍රහ්මලොක
45 යෙහි හැපී සූර්‍ය්‍යයාගේ අස්තඞ්ගමය දක්වා සිටියාහුය. ප්‍රාති
හාර්‍ය්‍යයෙහි ප්‍රසන්නවූ දසදහසක් පුරුෂයෝ විදර්ශනාවඩා
රහත්බවට පැමින මෙහි පැවිද්දහ.

46 ඉක්බිති මහාබොධිතොමෝ සූර්‍ය්‍යා අස්තංගතවන කල්හි
රෙහෙණ නකතින් පෘථිවියෙහි පිහිටියා, පොළවද කම්පිත
47 විය. (පෙර කියනලද්ද) ඒ මුල් සතාරම් මුවවිටෙන් උඩ
නැගී ඒ රන්බඳුන වෙළාගණිමින් පොළෝතලට බැස්
48 සාහ. රැස්වූ සියලු ජනයෝ පිහිටියාවූ මහාබොධිය හාත්
49 පසින් සුවඳමල් ආදීවූ පූජාවස්තුවෙන් පිදූහ. මහාමේඝය
තොමේ වැස්සේය, හාත්පසන් හිමගැබ්හා සිහිල් වලාවෝ
50 මහාබොධිය වැසූහ. මහබෙ තොමෝ සත්දිනක් දකුම්
රහිතවූවා ජනයා කෙරෙහි ප්‍රසාද උපදවන්නී එම හිමගැ
51 බෙහි වැඩසිටියාය. සත්දවස ඇවෑමෙහි ඒ සියලු මේඝ
52 යෝ පහව ගියහ, සවණක් රැස්යා මහබෝතොමෝ ද පෙ
ණිනා, මහාමහෙන්ද්‍රස්ථවිරයන්වහන්සේද සඞ්ඝමිත්‍රා නම්
භික්ෂුණීතොමෝද, පිරිස් සහිතව එහි සම්ප්‍රාප්තවූහු, පිරිස්
53 සහිත නරෙන්ද්‍රතෙමේද පැමිනියේය, කතරගම (නිවාසි
වූ) ක්ෂත්‍රියයෝද, චන්දනග්‍රාම වාසීවූ ක්ෂත්‍රියයෝ ද තිවක්ක
54 නම් බ්‍රාහ්මණතෙමේද ලක්දිව්වැසි ජනයෝ ද මහබෝ පිදු
මෙහි හටගත් උත්සාහ ඇත්තෝ දෙවියන්ගේ අනුභාව
යෙන් ආවාහුය. ප්‍රාතිහාර්‍ය්‍ය කාරණකොටගෙණ විස්මයට
55 පත්වූ ඒ මහා සමාගමෙහි (ජනයන්) බලාසිටියදී පෑදුම්දිග
ශාඛාවෙන් වැටෙන්නාවූ විලිකුම් බෝපලය ස්ථවිරයන්
56 වහන්සේ රැගෙණ රොපණය කරණපිණිස නරෙන්ද්‍රයා
නන්ට දුන්සේක, සුගන්ධ ද්‍රව්‍ය මිශ්‍රවූ පසින්පිරූ රන් කටාර
57 මක් මහාසනස්ථානයෙහි තැබූකල්හි, ඒ බොපලය නරෙන්ද්‍ර
තෙම රොපණය කෙළේය, සියල්ලන් බලාසිටියදීම අඞ්කුර
58 අටක් නැගී තරුණ බෝරුක්වූවෝ සතරරියන් පමණව
සිටගත්හ, ඒ තරුණ බෝරුක් දැක විස්මයට පත්වූ සිත්
ඇති නරෙන්ද්‍රතෙම සේසතින් පිදුයේ අභිෂෙකයද දුන්
නේය.

59 ඒ අටක් තරුණ බොධිවෘක්ෂයන් දඹකොළ පටුනෙහි
60 එකල නැවින් ගොඩනැගී මහාබොධිය පිහිටිතන්හිද, තිව

ක්ක බ්‍රාහ්මණයාගේ ගම්හිද, එසේම ථූපාරාමයෙහිද, ඉසුරු
61 මුනි විහාරයෙහිද, පළමුවෙනි සෑමළුවෙහිද, සෑගිරි අරමෙ
62 හිද, එසේ ම කතරගම්හිද, සඳුන්ගම්හිද එක එක පිහිට
වූහ, අනුවූ පලසතරින් උපන් දෙතිසක් තරුණ බෝධි
63 වෘක්ෂයෝ දිවයින හාත්පස යොදුනෙන් යොදුන විහාර
ස්ථානයන්හි ලක්දිව වැසිජනයාගේ වැඩපිණිසම මහා
බෝධි වෘක්ෂය කෙරෙහිවූ සර්වඥයන්වහන්සේගේ තේජස
64 කරණකොටගෙණ පිහිටියහ. පිරිස් සහිතවූ ඒ අනුළාදේවි
තොමෝ සඞ්ඝමිත්‍රා නම් තෙරනිය සමීපයෙහි පැවිදිව
65 රහත්බවට පැමිණියාය. පන්සියයක් පිරිවරඇත්තාවූ ඒ
අරිට්ඨ නම්වූ ක්‍ෂත්‍රියතෙමේද ස්ථවිරයන් සමීපයෙහි පැවිදිව
66 රහත්බවට පැමිණියේය, යම් අටසිටුකුලයෙක ජනයෝ
මහාබෝධිය මෙහි වඩාගෙණවාහුද, එහෙයින් ඔව්හු
67 බෝධාහර කුලයෝයයි කියනුලබති. උපාසිකා විහාරයයි
ප්‍රසිද්ධවූ ඒ මෙහෙණිවරෙහි භික්‍ෂුණී සඞ්ඝයා සහිතවූ ඒ
68 සඞ්ඝමිත්‍රා නම් ස්ථවිරීතොමෝ වාසයකළාය. එහි (චූලඝන
මහඝන සිරිවඩ්ඪයයි) මන්දිර තුණක් ප්‍රමුඛකොට ඇත්
තාවූ මන්දිර දොළසක් (නරේන්ද්‍රතෙම) කරවූයේය, ඒ මන්දි ර
69 යන් අතුරෙන් එක් මහමැදුරෙක්හි මහාබෝධියෙ වැඩූ නැව
කූඹ ගවිය පිහිටෙවූයේය, එක් ගෙයෙක්හි පළපත තැබ්බවූ
70 යේය, එකෙක කෙනිපාතය තැබූයේය එයින් ඒ මන්දිරයෝ
ප්‍රකටවූහ. (ධම්මරුචිකාදීවූ) අන්‍යනිකායවූ කල්හිදු ඒ
ගෙවල් දොළසම හත්ථාළ්හක විහාරවාසී මෙහෙණින්නන්
විසින්ම සැමකල් පරිභොග කරණලදහ.
71 රජහුගේ ඒ මඟුලැත්තෙමේ සැපවූ පරිද්දෙන් හැසි
72 රෙන්නේ පුරය එක් පසෙක්හි සිහිල් කදුරුළියක් අගන
යෙහි හිඟුරුවැල් ලැහැබක්තුළ ගොදුරුකමින් සිටියේය,
73 ඇතා එහි ඇලුනාදැන එහි ඇත්හලක් කළහ, ඉක්බිත්
තෙන් එක්දවසක් ඒ ඇත්තෙම ආහාර නොගත්තේය, ඒ
නරේන්ද්‍රතෙම ලංකාධිපයාගේ ප්‍රසාදකවූ ස්ථවිරයන්ගෙන්
74 ඒ ඇතුගේ සිත කිමෙක්දැයි විචාළේය. "හිඟුරුවැල් ලැහැ
බෙහි ථූපයක් කිරීම ඇත තෙම අභිමත කෙරෙයි" මහාස්ථ
75 විරතෙම මහරජහට වදාළසේක. සතතයෙන් ජනයාගේ වැ
ඩෙහි ඇලුනාවූ නරේන්ද්‍රතෙම එහි ධාතුසහිතවූ ථූපයක්හා
76 ථූපයට (සුදුනු) ගෙයක්ද වහාම කරවූයේය. නුවණැත්තාවූ
77 සඞ්ඝමිත්‍රානම් ඒ මහාස්ථවිරීතොමෝ තමන් වසනවිහාරය
ජනයන්ගෙන් වියුගත් හෙයින් ශූන්‍යාගාර විහරණයෙහි අභි
ලාෂාඇත්තී ශාසනයාගේ අභිවෘද්ධිය පතන්නී මෙහෙණින්

Digitized by Google

78 නන්ට වැඩපිණිසද අන්‍යවූ මෙහෙණවරක් පතන්නී අති
සයින් විවේක සැපඇත්තාවූ යහපත්වූ ඒ චෛත්‍යමන්දිර
79 යට පැමිණ ආයසී විහාරණයෙහි දක්‍ෂව නිර්මලවූවා දිවාවිහර
ණය කළාය, පණ්ඩිතවූ රජතෙම තෙරණිය වඳනා පිණිස
80 මෙහෙණි අසපුවට ගොස් තෙරණිය එහි වැඩියා අසා එහි
ගොස් ඒ තෙරණිය වැඳ ඒ තෙරණින්හා සතුටුව එහි ඊමේ
81 කාරණයවූ ඒ තෙරණියගේ අභිප්‍රාය කිමෙක්දැයි අදහස්
දත්තේ, අභිප්‍රාය දත්තාවූ ඒ දෙවන පෑතිස් මහරජතෙම
82 ථූපාරාමයට හාත්පස සිත්කලුවූ මෙහෙණි අසපුවක් කරවූ
යේය, ඇත්හල සමීපයෙහි කරවනලද්දවූ ඒ මෙහෙණින්
83 නන්ගේ අසපුවතෙම එහෙයින් හත්ථාළ්හක විහාරයයි ප්‍රසිද්ධ
වූයේය. මහත් ප්‍රඥාසම්පන්න සුමිත්‍රවූ ඒ සඞ්ඝමිත්‍රා නම් මහ
තෙරණිතොමෝ රම්‍යවූ ඒ මෙහෙණි අසපුවෙහි වාසය
84 කළාය.

මෙසේ ලඞ්කාවාසී ජනයාගේ වැඩද ශාසනාභිවෘද්ධියද මනාකොට සිද්ධකරන්නාවූ මේ මහාබොධිද්‍රැමෙන්ද්‍රතෙම ලඞ්කාද්වීපයෙහි රම්‍යවූ මහමෙව්නා වනයෙහි නොයෙක් අද්භුතයන්ගෙන් යුක්තව දීර්ඝකාලිකව පිහිටියේය.

මෙතෙකින් ශුද්ධජනයා පහන් සංවෙග පිණිස කළ මහවංශ බොධිආගමන නම්වූ එකුන්විසිවන අදියරනිමි.

20 වෙනි පරිච්ඡේදය.

1 දම්සෝ රජහට අටළොස්වන හවුරුදුයෙහි මාමෙව්නා
2 උයන මහබෝ පිහිටියාය. එයින් දොළොස්වන හවුරුදු
යෙහි ඒ දම්සෝ රජහුගේ මෙහෙසිවූ රත්නත්‍රයමාමක
3 අසන්ධිමිත්‍රා නම් බිසව් කළුරියකළා, ඉන් සතරවන හවුරු
දුයෙහි දම්සෝ රජතෙමේ විෂම අදහස්ඇති තිෂ්‍යරක්‍ෂා
4 නම් කුමරියක් බිසෝබැව්හි තැබූයේය. ඉන් සතරවන
හවුරුදුයෙහි රුචින්මත් ඒ බාලබිසව් "මේ රජතෙමේ
5 මටත්වඩා මහාබොධිය මමායනය කෙරේ"යි කියා ක්‍රොධ
වශයට පැමිණ තමහට අවැඩකරන්නී මඬුකටු (විස) යෙදී
6 මෙන් මහාබොධිය මැරවී. ඉන් සතරවන හවුරුදුයෙහි
මහායසස්ඇති දම්සෝ රජතෙමේ අනිත්‍යබවට පැමිනි
යේය; මේ සතිස් හවුරුද්දයි.

7 දහම් ගුණෙහි ඇළුනු දෙවෙනි පෑතිස්රජ වනාහි මහ
8 වෙහෙර නවකම්ද එසේම සෑගිරිගල නවකම්ද, ථූපාරාම
යෙහි නවකම්ද සුදුසු පරිද්දෙන් නිමවා විචාරණලද්දහට
9 ප්‍රත්‍යුත්තරයෙහි පණ්ඩිතවූ දීපප්‍රසාදක තෙරුන් විචාරන්
නේ, "වහන්ස මම මෙහි බොහෝ විහාරයන් කරවන්නෙමි
ඒ විහාර ථූපයන්හි තබනු පිණිස කෙසේ ධාතුලබම්දැ" යි
විචාළේය.
10 "මහරජාණෙනි සම්මාසම්බුදුන් පයපුරා සුමණ සාමණේර
යන් විසින් මෙහි ගෙනෙණලද්දාවූ ධාතුහු සෑගිරියෙහි තැබූ
11 වෝ ඇත්තාහ. ඇත්කද තබා ඒ ධාතූන් මෙහි වඩා එව" යි
තෙරුන් විසින් වදාරණලදුයේ එසේම ධාතු වැඩූයේ යොදු
12 නෙත් යොදුන් තැන්හි විහාරකරවා ඒ දගැබ්හි සුදුසු
13 පරිද්දෙන් ධාතු නිධානකරවී. බුදුන් විසින් වළඳනාලද පය
14 වූකලී යහපත් රාජවස්තුගෘහයෙහි තබාගෙණ නානා පූජ
15 යෙන් හැමකල් පිදුයේය—පන්සියයක් ඉසුරන් විසින්
මහතෙරහු වෙත පැවිදිව විසූ තැන්හි කළ වෙහෙර ඉසුරු
16 මුනි නම් විය. එසේම පන්සියයක් වෛශ්‍යයන් විසින් තෙර
හු වෙත පැවිදිව විසූ තැන කළ වෙහෙර වෙස්සගිරිනම්
වී. මිහිඳුමහතෙරුන් විසින් යම් යම් ගුහායෙක වසනලද
17 නම් පර්වතවිහාරයන්හි ඒ ඒ ගුහා මිහිඳුගුහා නම්වී.
පළමුකොට මහවෙහෙරද දෙවෙනිව සෑගිරියද තුන්
18 වැනිව ථූපය පෙරටුකොටඇති යහපත් ථූපාරාමයද සතර
වැනිව මහබෝ පිහිටුවීමද පස්වැනිව මහසෑතන්හි සැකිමට
19 යහපත් ගල්ටැබ මොනවට පිහිටුවීමද බුදුහු ග්‍රීවාධාතුව
20 පිහිටුවීමද සවෙනිව ඉසුරුමුනි විහාරය පිහිටුවීමද සත්
වැනිව තිසාවැවද අටවැනිව පළමු සෑයද නවවැනිව
වෙස්සගිරි විහාරයද මෙමෙහෙණින්නන් එනුපිණිස රම්‍යවූ
21 උපාසිකා වෙහෙරහා එසේම හත්ථාළ්හකය යනමේ මෙහෙ
ණවර දෙකද හත්ථාළ්හක නම් මෙහෙණවර බැස භික්ෂු
22 සඞ්ඝයා කැවිව මෙමෙහෙණින්නන්ට බත්ගන්නා පිණිස
23 මනා උපහාරඇති සියලු උපකරණයෙන් යුත් එලඹසිටි පිරි
24 වර ජනයාඇති මහාපාළි නම් බත්හලද එසේම භික්ෂූන් ද
25 හසකට අවුරුදුපතා පිරිකර සහිතවූ උතුම් පවාරණ දනයද
26 නාගදීවසින දඹකොල වෙහෙරද එම පටුන්හි තිස්සමහා
විහාරයද පාචීනාරාමයද යනමේ කර්මාන්තයන් ලඞ්කා
27 වාසී ජනයාහට වැඩකැමැත්තාවූ පින්පැණ ගුණඇති ල
ඞ්කාඳුවූ ඒ දෙවෙනි පෑතිස් රජතෙමේ පළමුවෙනි හවුරුදු
යෙහිම කරවී. ගුණයෙහි ප්‍රියවූ ඒ රජතෙමේ දිවිහිම්යෙන්

28 නොයෙක් පින්කම් කෙළේය, ඒ රජහුගේ විජිතවූ මේ
දිවයින පිනාගියේය. ඒ රජතෙමේ සම සතළිස් හවුරුදක්
රාජ්‍යය කෙළේයි.
29 ඒ රජහු ඇවෑමෙන් උහු මල් උත්තියයි ප්‍රසිද්ධවූ රජකුමර
30 අපුත්‍රක රාජ්‍යය මොනවට කරවී. ඒ මහාමහෙන්ද්‍රස්ථවිර
වනාහි පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ යන උතුම්වූ බුදුසස්න
31 මොනවට ලක්දිව්හි බබුලුවා ලඞ්කාවට දැදිපයක් බඳුවූයේ
මහාසමූහඇතෙත් ලක්දිව බුද්‍ධත්වැනිවූයේ බොහෝ ලෝ
32 වැඩකොට ඒ උත්තිය රජහුගේ රාජාභිෂෙකයෙන් අටවැනි
ජයවර්‍ෂයෙහි සැටවස් පිරුණුයේක් වස්සාන මාසයන්හි
33 සෑගිරියෙහි (විසූයේක) වෙසෙමින් වප්මස ශුක්ලපක්‍ෂයෙහි
අටවක් දවස් වීපවණීනයට ගේතුවූ මහෙන්ද්‍රස්ථවිරතෙමේ
34 පිරිනිවන් පෑයේක. අටවක් දවස්හි මහෙන්ද්‍රස්ථවිරයන් පිරි
35 නිවි කරුණෙන් දවසද අටවකදැයි සම්මිතවී.
ඒ අසා උත්තිය රජතෙමේ ශෝකනැමැති හුලින් පහරණ
36 ලදුයේ සෑගිරි ගොස් තෙරුන්වැඳ නොයෙක්වර නො
යෙක් පරිදෙවුත් හඬා සුවඳතෙල් පූරවනලද රන්දෙණක
37 මහාස්ථවිරදෙහය බහා මොනවට වසනලද ඒ දෙණ අල
38 ඞ්කෘත රුවන්කුළුගෙහයක්හි තබ්බවා කුළුගෙය ගෙන්වා
ගෙණ සාධුක්‍රීඩා කෙළවමින් ඒ ඒ දිගින් ආ මහත් ජනසමූ
39 හයා හා කැටිව මහත්වූ හටසමූහයා ලවා පූජාවිධාන කරව
මින් සැරහූ මඟින් නොයෙක් අලඞ්කාරයෙන් සරහනලද
40 නුවරට ගෙණවුත් නුවර රාජවීථින්හි හසුරුවා මහවෙහෙ
41 රට ගෙණවුත් මෙහි පැණ්බ මළුවෙහි කුළුගෙය තබ්බවා
සත්දිනක් ඒ මිහිපල්තෙමේ තොරන් කොඩිමාලා හා ගඳ
42 පුණ් සටයෙන්ද විහාරයත් අවට තුන්යොදනකුත් රජහුගේ
43 ආනුභාවයෙන් සරහනලදුයේ වීය. එසේම මුළු ලක්දිව
දෙවියන්ගේ ආනුභාවයෙන් සරහනලදේදේ වීය. ඒ මිහි
පල්තෙමේ සත්දවසක් මුළුලෙලහි නානාප්‍රකාර පූජා සත්
44 කාර කරවා පූර්‍ව දිසාභාගයෙහි තෙරුන්ගේ බද්ධමාලක
45 නම් තැන සුවඳ දරසෑයක් කරවා මහසෑයප්‍රදක්‍ෂිණ කෙරෙ
ලින් මතරම් කුළුගෙය එහි පමුනුවා දරසෑයෙහි තබ්බවා
46 අන්තිම සත්කාරය කෙළේය. ධාතූන් ගන්වා මෙහි සෑයක්ද
කරවී. ක්‍ෂත්‍රියතෙමේ ධාතුභාගයක් ගන්වැ සෑගිරිවෙහෙ
47 රද සියලු විහාරයන්හිද සෑ බැඳවී. ඒ ස්වාමිහුගේ ශරීරය
48 බැහූ තැන අවකාසයද බුහුමනින් ඉසිභූමඟන නමැයි කිය
නලදී. එතැන් පටන් එය සියාරා තුන්යොදුන් මානයෙහි
49 කළුරියකළ ආර්‍ය්‍යයන්ගේ ශරීර ගෙණ ඒ පෙදෙස්හිදී දවනු
ලැබේ.

එසේම මහත් අභිඥා ප්‍රඥා ඇති සඞ්ඝමිත්‍රා නම් මහාථෙ
50 රීතොමෝ සසුන් හිසද බොහෝවූ ලෝවැඩද කොට
51 එකුන් සැටවස් ඇතිවී උත්තිය නම් එම රජහුගේ නවවෙනි
බෙම නම් හවුරුදුයෙහි ඇතාල නම් මෙහෙණිවර වසන්නී
52 පිරිනිවන්පෑවාය. රජතෙමේ ඒ මෙහෙණින්වද තෙරුන්ට
සෙයින් සත්දවසක් මුළුලැංහි උතුම්වූ පූජාසත්කාර එකෙ
ළෙසි. මහතෙරහුවන්ට සෙයින් සකල ලඞ්කාද්වීපය අල
53 ඞ්කාර කරණලද්දේ වී. කුළුගෙයෙහි තගණලද තෙරණී
සිරුර සත්දවසක් ඇවෑමෙන් නුවරින් පිටත්කොට ථූපා
54 රාමයට නැගෙණහිරින් චිත්‍රසාලා සමීපයෙහි මහාබොධි
55 උපාශ්‍රයෙහි තෙරණී විසූතැන ගිනිකිස කරවී. ඒ උත්තිය
මිහිපල්තෙම එහි සෑයකුදු කරවී.
56 මහෙන්ද්‍රස්ථවිරාදී ඒ පස්මහතෙරහුද අරිෂ්ටස්ථවිරාදීහුද
එසේම නොයෙක් දහස්ගණන් භික්ෂූහුද සඞ්ඝමිත්‍රාව ප්‍රධාන
57 කොටඇති ඒ දෙලොස් තෙරණීහුද බොහෝ දහස් ගණන්
රහත් භික්ෂුණීහුද බොහෝ ඇසූපිරූතැන් ඇත්තාවූ මහ
58 පැණ ඇත්තාවූ විනයාදී බුඩාගම බවුළුවා සුදුසුකල අනි
ත්‍යතා වසගයට ගියෝයි. ඒ උත්තිය රජතෙමේ දසහවු
රුද්දක් රජකම් කෙළේය මෙසේ මේ අනිත්‍යතාතොම සක
ල ලෝකය නසන්නීය.
59 අතිශයින් ලාගෙලා ක්‍රියාකරන්නාවූ ඉතා බලඇති චල
කාලිය නොහෙන්නාවූ ඒ මේ අනිත්‍යතාව යම් මිනිසෙක්
තෙමේ දන්නේම සසර ගමන්හි කලනොකිරේද, කලකිරු
ණේත් පාපයෙන් තොරවීමත් ඵන්හා ඇල්මත් නොකෙ
රේද; දනිමීන්ම දුඃඛයේ මුලාවේයයි යන මෝහතොමෝ ඔහු
ගේ අධික මෝහරාසියෙහි බලබවයි.

මෙතෙකින් හුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වංස ථෙරපරිනිබ්බාණ නම් විසිවෙනි අදියර නිමි.

---

21 වෙනි පරිච්ඡෙදය.

1 ඒ උත්තිය රජු ඇවෑමෙන් ඔහු තිස්දෙවුන්ටල් මහාසිව
රජ හුදනන් සෙවුනේ දසහවුරුද්දක් රජය කෙළේය. ඒ
2 රජතෙමේ භද්දසාල තෙරුන් කෙරේ පැහැද සිත්කළුවූ
නගරඟන විහාරය පෙරදිග කරවී.

3 මහාසිව රජු ඇවෑමෙන් උතුමල් සූරතිස්ස රජතෙමේ
කුසලකරණයෙහි ගෞරවඇතොත් දසහවුරුද්දක් රජය
4 කෙළේය. ඒ රජ දකුණුදිග නගරඟන නම් විහාරය කරවී.
5 නැගෙණහිර ඇත්කඳ විහාරයද ගොණගලද වඟුත්තර
පර්වතයෙහි නැගෙණගිරිපව් නම් විහාරයද එසේම රෙ
6 හෙරඅවුණු සමීපයෙහි කොලඹාලක විහාරයද රිටිගල
සමීපයෙහි ලඹකාරාමයද නැගෙණගිරි වලස්ගලද නුවරට
7 උතුරින් ගිරිනිල්පනාකඩද පෘථිවීශ්වරතෙමේ මේආදි රම්‍ය
වූ පන්සියයක් විහාරයන් ලක්දිව ඒ ඒ තැන ගඟින් එතරත්
8 මෙතරත් රජවීමෙන් පූර්වයෙහිත් පසුවත් සැටහවුරුද්දක්
9 මුළුලෙහි මොනවට දැහැමින් කරවී. තුනුරුවන් කෙ
රෙහි ගෞරවඇති ඒතෙමේ සුවණ් පිඬතිස්සයයි රාජ්‍ය
යෙන් පූර්වයෙහිදී නම්ඇතිවිය; රාජ්‍යයෙන් පසු ඒ රජහු
නම සූරතිස්සයයි වී.
10 මහත් බලඇති සේනය ගුත්තිකය යන අස්නැවි පුතුන්
11 දෙදෙනෙක් ඒ සූරතිස්ස රජහු ගෙණ දෙවිසිහවුරුද්දක්
දැහැමෙන් රාජ්‍යය කරවූය.
ඉක්බිති එක්කුස හොත් බෑයන් අතුරෙන් නවවැනි
12 සහෝදරවූ ඒ මූටසීව රජහු පුත් අසේල කුමර ඒ දෙදෙනා
ගෙණ අනුරාපුරෙහි දසහවුරුද්දක් රාජ්‍යය කරවී.
13 සෘජුස්වභාඇති එළාර නම් දෙමළතෙමේ රාජ්‍යය පිණිස
14 සොලීරටින් මෙහි අවුත් අසේල රජු අල්වාගෙණ සතළිස්
සතර හවුරුද්දක් රාජ්‍යය කෙළේය. රජතෙමෙ විනිශ්චය
කාලයෙහි සතුරන් කෙරෙහිත් මිතුරන් කෙරෙහිත් මධ්‍ය
15 ස්ථ වී. ඇඳඉස පසෙක ඉතාදික් යොතකින් විනිශ්චය කැ
16 මැත්තවුන් විසින් ගසවනු පිණිස මිණියක් එල්විය. ඒ රජ
හුගේ එක් පුතෙක්ද දුවක්ද වූහ; ඒ කුමරතෙමේ රථ නැ
17 ගී තිසාවැවට යනෙනා් මවුසමග මග හොත් ඉතා තරුණ
වස්සකු රියසකින් බෙල්ල ඇක්ම නොදැන මැරුයේය. ඒ
18 දෙන්තොමෝ කිපිසිත්ඇතාව් ගොස් ඒ මිණිගෙඩිය ගැසූ
වා. රජතෙමේ ඒ චක්‍රයෙන්ම පුත්‍රයාගේ හිස සිඳවී.
19 තල්රුකෙක (කැදැල්ලක හුන්) ලිහිණි පැටියෙක් එක්
සර්පයෙක් කෑයේය. ඒ පැටියාගේ මවු ලිහිණිතොම මිණි
20 ය ගැසූවා. රජතෙමේ ඒ සර්පයා ගෙන්වා උගේ බඩපලා
ඒ පැටියා බැහැර දමා තල්ගස ඇණ ගැස්වී.
21 උතුම් තුනුරුවන්ගේ රත්න බවත් එහි ගුණසාර බවත්
නොදන්නාවූම ඒ රජතෙමේ චාරිත්‍ර රක්ෂාකෙරෙමින් සෑගිරි
22 යට ගොස් භික්ෂු සඞ්ඝයා පවරා එමින් රථයෙහි හුනෙන් රථ

Digitized by Google

23 ඈගේ වියගස කොණින් බුදුසෑයෙහි එකදෙසෙක් බුන්නේ
ය. අමාත්‍යයෝ තුමූ රජහට "දේවයෙනි අපගේ සෑයතෙමේ
24 ඔබවිසින් බිඳිනාලද්දේ" යි කීවූය. මේ රජතෙමේ නොදැන
කළ දෙයෙහිත් රථයෙන් බැස "චක්‍රයෙන් මාගේ හිසද
25 සිඳිව්ය" යි මග හොත්තේය "මහරජානෙනි අපගේ ශාස්තෘ
තෙමේ පරහිංසා නොකමැතිවේක, තෑය පියවිකොට කමාක
26 රවුව මැනව" යි ඔහුට කීවූය. එහි බුනු පසළොසක් පමණ
ගල් (පියවිකොට) තබන්ට පසළොස් දහසක් කහවණු
දුන්නේය.
27 එක් මැහැල්ලක්තොමෝ වී වේලන්ට අවෙව්හි දැමුවා.
28 නොකල් වැස්සෙක් වැස ඒ වී තෙමුයේයි. ඕතොමෝ වී
ගෙණගොස් ඒ මිණිය පහළා. ඒ අකල්වැස්ස අසා මැහැලි
29 යවා "රජතෙමේ දහම්හි වැටෙනොන් සුදුසුකල වර්ෂාව ලබා
ය" යි ඈයගේ බස විනිශ්චය කරණු පිණිස පෙහෙව
30 හොත්තේය. බිලියම් ගන්නා දෙවපුත්‍ර රජහු තෙදින්
මඩනා ලද්දේ සතරවරම් මහරජුන් වෙත ගොස් එපවත්
31 දැන්වීය. ඒ දෙවියෝ උහු ගෙණ ගොස් ශක්‍රයාහට දැන්වූය.
ශක්‍රතෙමේ වැසවලාහකයා කැඳවා කාලවර්ෂණය අණකො
32 ළේය, බිලියම්ගන්නා දෙවපුත්‍ර රජහට එපවත් දැන්වීය.
33 එවක් පටන් ඒ විජිතයෙහි දහවල් වැසි නොවටුයේය.
වර්ෂාවතෙමේ සතියෙක් සතියෙක්හි රෑ මැදියම වැස්සේය
සෑම තන්හි කුඩා වලද (වැසිදියෙන්) පිරුණේය.
34 නොනසනලද මිථ්‍යාදෘෂ්ටි ඇතෝත්ද, මේතෙමේ අගති
ගාමී ද්වේෂයෙන් මුක්තබැවින් මෙවැනි මහිමයට පැමිනි
යේය; සම්‍යක්දෘෂ්ටි ඇත්තාවූ මේලෝකයෙහි උපන් නුව
නැතිම්නිස්තෙමෙ අගතිගමන් ද්වේෂය කෙසේනම් නො
හරණේද.

මෙතෙකින් සුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වංස පචරාජක නම් එක්විසිවන අදියර නිමි.

---

22 වෙනි පරිච්ඡේදය.

1 එළාළරජු මරවා දුටුගැමුනු කුමර රජවී. එබව ප්‍රකාශ
2 කරණ පිණිස මෝතොමෝ පිළිවෙළකථායි. දෙවෙනි පෑ
තිස්ස රජහුගේ දෙවෙනි සහෝදරවූ මහානාගනම්වූ එමරජ
3 හට ප්‍රිය යුවරජකෙනෙක්වී. රජහුගේ බිසව නැණහීනද්වා

සියපිත්හට රජයකැමැත්තා, නිරන්තරයෙන් යුවරජු මරණු
4 පිණිස හටගත් සඬකල්පනා ඇතිව, වලස්වැව කරවන
එම යුවරජහට විසයෙන් යෙදූ අඹයක් අඹමතුයෙහි තබා
5 යැව්වාය. ඒ බිසවුන් බාලපුත්‍රතෙමේ යුවරජුහා ගියේ භාජ
නය විවෘතකල කෙණෙහිම ඒ අඹය කා මළේය.
6 යුවරජතෙමේ එයින්ම ඇතොවුරුන්හා බලවාහන සමග
7 සියදේශය රක්නට රුහුණුබලා ගියේය. ඒ යුවරජුගේ
ගැබ්ගත් මෙහෙසීතොම යටාලවෙහෙරදී පිතෙකු වැදූවා.
8 යුවරජ පුතුට බැයානම් කෙළේය. ඉක්බිති ඒ ක්ෂත්‍රියතෙමේ
රුහුණුගොස් මුළු රුහුණුරට ඊශ්වරවූයේ, මහත් සම්පත්
9 ඇතිව මාගම්හි වෙසෙමින් රජයකෙළේය. ඒ තෙමේ සිය
නම්ඇති නාගමහාවිහාරය කරවීය; උඩුකඳුරු ආදිවූ තවත්
බොහෝ විහාරද කරවී.
10 එසේම ඒ මානාරජු ඇවෑමෙන් උහුපිත් යටාලතිස්ස
තෙමේ රජය කෙළේය. එසේම උහුපිත් අභයතෙමේද
11 රජය කෙළේය. ගෝඨාභය පිත් කාවන්තිස්සයයි ප්‍රසිද්ධවූ
ක්ෂත්‍රියතෙමේ පියරජු ඇවෑමෙන් එහි රජය කෙළේය.
12 ශ්‍රද්ධාඇති ඒ රජහට කැලණිරජහුගේ දූවූ විහාරදේවී
13 නම්වූ ශ්‍රද්ධාසම්පන්න කුමරියක් මෙහේසිකාවිය. කලණි
නගරයෙහි රජවූ තිස්සනම් ක්ෂත්‍රියයෙක්වී; මුහුගේ උත්
14 තිය නම් ඇති ඒ කුමර දේවියහා සංයෝගයෙන් හටගත්
වනලද කෝපඇතොත්, භයින් එතැනින් පලාගොස් අන්
15 තැනෙක විසීය; එයින් ඒ පෙදෙස ඒනාම්වී. ඒ ආර්‍ය්‍යඋත්තිය
තෙමේ දේවියට රහස් ලියමන්දී මහණවෙස්ගත් මිනිසෙක්
16 යැවීය. ඒතෙමේ රජගෙදර සිටියේය. රජගෙහි සැමද
වලදන රහත් තෙරණුවන්හා අප්‍රසිද්ධයේ රජගෙට වන්
17 නේය. තෙරුන්හා ආහාරගෙණ රජුහා පිටත්වනකල
18 දේවිය බලාහින්දදී ලියුම්පත බිම හෙළීය. ඒ ශබ්දයෙන්
රජතෙමේ පෙරලා බලමින් ඒ ලියුම්ගන්න දූන තෙරුන්ට
කිපියාවූ මුග්ධ මනස්ඇතොත්, ඒ තෙරුන්හා ඒ මිනිසා
19 ක්‍රොධයෙන් මරවා මුහුද දැමමවීය. එයින් දෙවියෝ කිපී, ඒ
20 රට මුහුදෙන් යටකළෝය. ඒ රජතෙමේ මනාරූඇති යහ
21 පත් ආචාරඇති දේවී නම් සිය දියනියන් රන්සැලෙක හිඳු
22 වා (එහි) රජදුවයයි ලියා සමුදුරම යුහුව යද්දයේයි. මුහුද
බඩාලනලද ඒ සැල එයින් ගොස් රුහුණුරට ලඞ්කාවිහාර
යෙහි ගොඩබට්වූයේය. ඒ කුමරිය කාවන්තිස් රජතෙමේ
23 (මෙහෙසී බැව්හි) අභිෂෙක කෙළේයි. එහෙයින් විහාර
යනු උපපද නම්වී (විහාරමහදේවීයයි නම්වී.)

Digitized by Google

තිස්සමහාවිහාරය එසේම සිතුල්පව්ව ගම්ඨවාලිය කුටා
24 ලිය යනමේ ආදිවූ විහාරයන් කරවා තුනුරුවන් කෙරෙහි
මනා පහන්සිතින් ඒ රජතෙමේ හැමකල් සඞ්ඝයාට සිවු
පසයෙන් උපස්ථාන කෙළේය.
25 එකල්හි කොටගල නම් විහාරයෙහි සිලයෙන් ව්‍රතයෙන්
යුක්තවූ හැමකල් නානාප්‍රකාර පින්කම් කරනනාවූ සාම
26 ණේරකෙනෙක් විසූයේය. ඒතෙමේ අහස් සැම්පුලට සුව
සේ නැගෙණු පිණිස ගිනි තුනක් හා ගල්ලෑහැලිද තැබූ
27 යේය. පැන් දන්දුනෙනෝය; සඞ්ඝයාට වත්ද කෙළේය; හැම
කල්හි කලානතවූ දේහඇති ඔහුට මහත් ආබාධයෙක් විය.
28 කෙළෙහිගුණ දන්නා භික්ෂූහු සිවිකාවයකින් උහු ගෙණවුත්
29 තිස්සාරාමයෙහි සිලාපස්සය පිරිවෙන්හි (තඹගෙණ) උප
ස්ථානකළෝයි. ඒ විහාරදේවීතොම සංඝුනනා මොනවට
30 සකස්කළ රජගෙහි පෙරබත සඞ්ඝයාට මහදන් දී පසුබත
ගඳමල් හා බෙහෙත්ද පිළිද ගෙන්වාගෙණ ආරාමයට ගියා
31 හුදුහු පරිද්දෙන් සත්කාර කළාය. එකල්හි ඒ බිසව් පෙරසේ
දන්දී සඞ්ඝස්ථවිරයන් වෙත හිඳගත්තාය, ස්ථවිරතෙමේ ඒ
32 බිසවට දහම්දෙසමින් මේවදාළසේක. "මේ මහාසම්පත්
තොමෝ පින්කම්න් ලබනලද්දීය. දැනුදු පින්කම්හි තොප
විසින් අප්‍රමාදයම කටයුතුතොත්ය"
33 මෙසේ වදාළකල්හි බිසොමෝ "මෙහි මේතෙමේ කවර
34 සම්පතියෙක්ද යම්බඳුවූ අපට දරුවෝ නැත්තාහු නම් ඒ
කාරණයෙන් අපගේ සැපත් වඳය"යි කීවාය. ෂඩ්අභිඥ
ඇති මහාස්ථවිරතෙමේ පුත්‍රලාභය බලා "දේවීනි ඒ ගිලන්
35 හෙරණුහු දනිව"යි වදාළසේක. ඒ බිසව් ගොස් මරණ
සන්නාවූ ඒ හෙරණුන්දූට "මාගේ පුත්බැව් පැතුව මැනව
36 අපගේ සම්පත් මහත්ය"යි කීවාය. නොකැමැත්තෝයයි
දැන ඒ හෙරණුන්දූ සඳහා මහත්වූ යහපත් මල්පූජවක්
37 කරවා මනා පැණඇතති නැවතත් යාච්ඤකළාය. මෙසේද
නොකැමැත්තාවූ හෙරණුහු පිණිස උපායෙහි පණ්ඩිතවූ ඒ
බිසව් නොයෙක් බෙහෙත්හා වස්ත්‍රයන් සඞ්ඝයා විසයෙහි
දන්දී නැවතත් ඒ හෙරණුහු යාච්ඤකළාය.
38 ඒ තෙමේ රජකුලය පැතූයේය. බිසොමෝ එතැන නො
39 යෙක් පරිඳ්දෙන් අලඞ්කාරකරවා වැද යානාවට නැඟී ගි
40 යාය. සාමණේරතෙමේ එසින් චුතව යනනාවූ ඒ දේවියකුස
පිළිසිඳගත්තේය. ඒ දැන බිසොමෝ නැවැත්තාය. ඒ කස්න
රජහට දන්වා රජුහා පෙරලා ගියාය. ඒ දෙනනාම හෙර
41 ණුහුගේ ශරීරයට කටයුතු (වූ ආදහනාදිය) කරවා සත්

Digitized by Google

සුත් සිත්ඇතෝ ඒ පිරිවෙන්හිම වසනාහු හැමකල්හි
42 භික්ෂුසඞ්ඝයාහට මහදන් දුනෝයි. මහපින්ඇති ඒ දේවි
යට මෙබඳු දොළෙක් ඇතිවී. ගොණකු පමණ මීයක්
43 ඉඳුර තබාගෙණ තොමෝ දකුණැලයෙන් යහපත් සයන
44 යෙක හොත්ති දොළොස් දහසක් භික්ෂූන්ට දන්දී ශෙෂවූ මී
වළඳනු කැමැතිවූය. වැළි එළාළ රජහුගේ යොධයන් අතු
45 රෙන් ශ්‍රෙෂ්ඨයාගේ හිස්සුන් කබුව දෙවියෑත් එම සුන්
හිසෙහි හිඳගෙණ බිපියන්ටත් අනුරාධ පුරයෙහිම උපුල්
46 කෙතින් ගෙණෙනලදවූ නොමැලවූන මල්වඩමක් පල
ඳින්ටත් කැමැතිවී. දේවිතොම රජහුට එපවත් කීවා. රජ
47 තෙමේ නෛමිත්තිකයන් විචාළේය. ඒ අසා නෛමිත්තික
යෝ "දේවියගේ පුත්‍රතෙමේ දෙමළුන් මරා (ලක්දිව) එක්
48 සේසත් කොට ශාසනය බබුළුවනේන්ය" යි කිවූය. යමෙක්
තෙමේ මෙබඳු මී ගුලාවක් දක්වනේන්නම් උහුට රජතෙමේ
මෙබඳු සම්පත් දෙනේන්යයි මිහිපල්තෙමේම දැසිබකරවී.
49 ගොඑමුහුද වෙරළ සමීපයෙහි මී පිරවූ මුනින් නමාපිය
50 නලද ඔරුවක් දැන දනව්වැසි මිනිසෙක් රජහට කීයේය.
රජතෙමේ දේවිය එහි පමුනුවා මොනවට සකස්කළ මඩු
වෙක්හි (හිඳුවා) රිසිපරිදෙන් ඒ බිසව්ලවා මී වැළඳවී.
51 රජතෙමේ ඒ බිසවුන් ඉතිරි දොළ සපයන්ට වේළුසුමන
52 නම් යොධයා මෙහෙයීය. ඒ තෙමේ අනුරාපුර ගොස් එහි රජු
මගුලසුගේ අස්ගොව්වා සමග මිතුරුව හැමකල උහුගේ
53 කෘත්‍යයද කෙළේය. ඒ අස්ගොව් යහළුබැව් දැන පෙරවරුම
උපුල්මල් හා කබුව කොළොම්හෝ තෙර තබා සැකතැත්
54 තේ අසු ගෙණගොස් උහු (පිට) නැගී උපුල්මල් හා කබුව
ගෙණ (මම කාවන්තිස් රජු වේළුසුමනයෙමි සමණිවූයේ
55 මා අල්වා ගණිවයි) තමා දන්වා අශ්වවේගයෙන් පලාගි
යේය. (එළාල) රජ ඒ අසා උහු ගන්ට මහායොධයා මෙ
56 හෙයීය. ඒ තෙමේ දෙවෙනි අශ්වයායි සම්මත අසුනැගී ලුහු
බැන්දේය. ඒ වේළුසුමනතෙමේ ලැහැබක් ඇසුරුකෙළේ
අසුපිටම හිඳගෙණ පිටිපසින් එනනාවූ උහුට කබුව හැද
57 දික්කෙළේය. අශ්වවේගයෙන් යනනාහුගේ හිස සිඳින.
අසුත් දෙනනාද ඉසද ගෙණ ඒ තෙමේ සවස්වේලෙහි
58 මාගමට එළඹියේය. දේවිතොම ඒ දොළද රිසිසේ වැළ
ඳුවා. රජතෙමේ යොධයාහට සුදුසු පරිදෙන් සත්කාර
කෙළේය.
59 ඒ බිසව් සුදුසුකල පින්වත් උතුම් පුතෙකු වැදුවා. රජ
කුලෙහි මහත් ආනන්දයද විය. ඒ කුමරහු පුණ්‍යානුභාව

Digitized by Google

ලයන් එදවස්ම නානා රත්නයන්ගෙන් සම්පූර්ණ නැව්
60 සතෙක් ඒ ඒ රටින් ආවුය. එම කුමරහු පින්තෙදින් ඇ
තෙක්තෙමේ ඡද්දන්ත කුලයෙන් ඇත්පැටවෙකු ගෙණ
61 වුත් මෙහි තබා පලාගියේය. තොට විල්තෙර පඳුරු අතු
62 රෙහි සිටියාවූ ඒ ඇත්පැටවා දැක කඹුල නම් කිලිවැදී රජ
63 හට දැන්වීය, එකෙණෙහි රජතෙමේ ඇතුන් බඳනවුන්
යවා ඒ ඇත්පැටවා ගෙන්වා පෝසනය කරවී. කඹුල නම්
තැනැත්තාහු විසින් දුටුහෙයින් ඒ ඇත් කඹුල නම්වී.
64 රත්බඳුන් ආදීන් පිරුණාවූ නැව් මෙහි ආවායයි රජහට
65 දැන්වීය. රජතෙමේ ඒ ගෙන්වාගත්තේයි. කුමරහට නම්
තබන මගුල්හි රජතෙමේ දෙලොස් දහසක් භික්ෂුසඞ්ඝයාට
66 ආරාධනා කෙළේය. මෙසේ "ඉදින් මාපිත් මුළු ලක්දිව්
67 තෙලෙහි රජය ගෙණ බුදුසසුන් බබුලුවන්නේනම් අටතුරා
දහසක් භික්ෂූහුම ප්‍රවිෂ්ටවෙත්වා, ඒ සියල්ලෝ උඩුකුරු
68 කොටගත් පාත්‍රාඇතිව සිවුරු පොරවත්වා, පළමුකොට
දකුණුපය එලිපතින් ඇතුල්කොට තබත්වා, එක් කුඩයකින්
69 යුත් ධබරාව බැහැර ලත්වා, ගොතම නම් ස්ථවිරතෙමේද
පුතු පිළිගණීවා, උන්වහන්සේම තිසරණ පන්සිල් දෙත
70 සේක්වා" යි සිතුයේය. සියල්ල එසේවීය. සියලු නිමිති දැක
තුටුසිත්ඇති මිහිපල්තෙමේ සඞ්ඝයාට කිරිබත් දන්දී පුතුට
71 නම්තබන්නේ මාගම්හි ප්‍රධානබවද සිය පියහු නමද යන
දෙක එකොට ගාමනී අභය කියා නම්තැබූයේය.
72 එසින් නවවන දවස් මාගම් ගොස් දේවියහා සඞ්ගමය
73 කෙළේය. ඒ තිසව් ඉන් ගැබ්ගත්තීය පුදුනුකල උපන්
කුමරහු රජතෙමේ තිස්ස නම් කෙළේය. දරුදෙදෙනා මහ
74 පෙළහරින් වැඩුනෝය. දෙනනාටම බත්කවන මගුල්
දවස්හි සොහඇතෙක් පන්සියයක් භික්ෂූන්ට කිරිබත් දන්
75 දෙවා උන්වහන්සේලා විසින් අඩක් වැලදූකල ඉන් සුහ
සුහ ඉල්වාගෙණ රන් තැටියක ලා මිහිපල්තෙමේ දේවිය
76 සමග "දරුවෙනි ඉදින් තෙපි සම්මාසම්බුදුන් සස්න හරිව්
නම් තොපගේ කුසගත මේ ආහාරය නොදිරාව" යි කවූන්ට
77 දෙවීය. ඒ රජකුමරුවෝ දෙදෙන තීඅණය දැන තුටුසිත්
ඇතෙතා ඒ කිරිබත අමෘතයක්සේ වැලදූය.
78 ඒ කුමරුවන් දස දෙලොස් හැවිරිදි කල විමසනු කැමැ
ත්තාවූ රජතෙමේ යටකී පරිද්දෙන් භික්ෂූන් වලදවා උන්
79 වහන්සේලාගේ ඉඳුල්බත තැටියකින් ගත්වා ඒ කුමරුවන්
80 වෙත තබ්බවා තුන්භාගයක් කරවා "දරුවෙනි අප කුල
81 දෙවි භික්ෂූන්ට අපි කලකිරුණෝ නොවන්නෙමුය" යි

Digitized by Google

සිතා මේ භාගය අනුභව කරව්යයිද "අපි දෙබෑයෝ
82 ගැමුකල්හි උනුන් අද්‍රෝහ වන්නෙමුය" යි සිතා මේ භාගය
අනුභව කරව්ය"යිද මේ කීයේය. දෙනනාම ඒ භාග
වය අමාවක්සේ අනුභව කෙළෝය. "දෙමළුන්හා යුධ
83 නො කරන්නෙමුය" යි (සිතා) මේ අනුභව කරව්ය" යි මෙසේ
කීකල ඒ තිස්සකුමර ආහාරය අතින් දූමිය. ගැමුණු කුමර
84 තෙමේ බත්පිඩ දමා ඇඳට ගියේ අත්පා හකුළුවාගෙණ
ඇඳෙහි වැතිරගත්තේය. දේවිය ගැමුණු කුමරු සතුටු කෙ
85 රෙමින් "දරුව අත්පා හෙලා ඇඳෙහි සැපසේ කුම්කින්
නොනිදයිද" යී මෙසේ කීවා ඒතෙමේ "ගඟින් එතර දෙම
86 ළුය මේ දියින් මහා ගොළුමුහුදය මම කෙසේනම් ප්‍රසා
රිතාඟ ප්‍රත්‍යඟ ඇතිව නිදම්දැ" යි කීයේය. ඒ කුමරහු
87 අභිප්‍රාය අසා මිහිපල්තෙමේ තුෂ්ණිම්භූතවී. ඒ කුමර
ක්‍රමයෙන් වැඩෙනුවා පින්යසස් තෙදයිස් ඇතිව තේජස්
බලපරාක්‍රමයෙන් යුක්තව සොළොස් ඇවිරිදිවිය.
88 සත්වයෝ තුමූ සංසාර ගතිය ඉතා චමලකල්හිත් ජන්
කරණකොටගෙණ රුචිපරිද්දෙන් (මනුෂ්‍යාදී) ගතියකට
එළඹිගණිති, නුවනැත්තේ මෙසේ මෙබව දැන කුසල් රැස්
කිරීමෙහි මහත් ආදර හෝ ගෞරව ඇතිවන්නේය.

මෙතෙකින් හුදීජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වංශ ගාමිණිකුමාර පසූතිනම්වූ දෙවිසිවන අදියර නිමි.

---

23 වෙනි පරිච්ඡේදය.

1 ඒ කඩොලැත්තෙමේ බල ලක්ෂණ රූචින්හා තේජස්
2 ජව ගුණයෙන්ද අග්‍රවූයේ මහාකඳ ඇතිවිය. ඒ ගැමුණු
කුමරහට නන්දිමිත්‍රය සුරනිම්ලය මහාසෝණය ගොඨයිම්
3 බරය ථෙරපුත්තාභය භරණය වේළුසුමනය එසේම ඛඤ
දේවය ඵුස්සදෙවය ලභියවසභයයි යන මහා බලඇති මේ
දසමහා යෝධයෝ ඇතිවූහු.
4 එළාල රජහුගේ මිත්‍රනම් සෙනෙවියෙක් ඇත්තේය. නා
ගෙණගිරි කඩරෙද (නම් රට) ඒ සෙනෙවියා කම්මාන්ත
5 ගම්හි සිත්පව් සම්පයෙහි බුහුනනියන් පිතෙක්වී. (ඒතෙ
6 මේ) කෝසෝහිත වත්ගුය්හා ඇත්තේ මිසිල්හු නම් ඇතිවී.
දුරද බඩගායන ඉනා ලදරු ඒ කුමරහු කටියෙහි ඩරපවින්

7 බැද ඇඹිරුම් ගල බැන්දේයි. ඔහු ඇඹිරුම් ගල ඇදගෙ
ණ හිම බඩගා යනකල එලිපත ඇක්මෙහිදී යම් හෙයකින්
8 වරපට හිදේද එහෙයින් නන්දිමිත්‍රයයි ප්‍රසිද්ධවී. ඇතුන් දස
දෙනෙකුගේ බලඇත්තේදවී. ඒතෙමේ වැඩුණේ නුවරට
9 අවුත් මයිල්හු උපස්ථානකෙළේය. එකල සෑ ආදියෙහි අසත්
කාර කරණ දෙමළුන් (දූත) ශක්තිසම්පන්න ඒතෙමේ එක්
10 පයකින් කලවිය පාගා හස්තයෙන් ඉතිරි කලවය ගෙණ
දෙපළු කොට බැහැරලයි; ඔහු විසින් දමනලද සිරුර දෙවි
11 යෝ අතුරුදහන් කරති. දෙමළුන් අඩුබැව් දූත රජහට
එපවත් දන්වූය "බඩුසහිත මොහු ගණිවය"යි රජ නියෝග
12 ලදහු එසේ කරන්ට නොහැකිවූහ. ඒ නන්දිමිත්‍රතෙමේ
"මා මෙසේ කරද්දීත් හුදක් ජන ක්ෂයමුත් ශාසනය බැබ
13 ලීමක් නැත්තේය. රුහුණුරට තුනුරුවන්හි ප්‍රසන්න රජ
14 දරුවෝ වෙසෙති, එහි ගොස් රජසේවයකොට සියලු දෙම
ළුන් ගෙණ ඒ ක්ෂත්‍රියයන්ට රාජ්‍යයදී බුදුසසුන් බබුළුවන්
15 නෙමි" සිතීය. මේ අභිප්‍රායෙන් ගොස් ගැමුණු කුමරහට එප
වත් ඇස්වීය. ඒ ගැමුණු කුමරතෙමේ මෑණියන් හා මන්ත්‍ර
ණය කොට උහුට සත්කාර කෙළේය. එසේ සත්කාරකරණ
ලද නන්දිමිත්‍ර යෙ ධතෙමේ කුමරුවෙත විසීය.
16 කාවන්තිස් රජ දෙමළුන් වලකනු පිණිස මහගඟ පියලු
17 තොට හැමකල්ම ආරක්ෂා කරවී. රජහුගේ අන්තිසවක
පුත් දීඝාභය නම් කුමරෙක්වී. ගඟායෙහි කසාතොට උහු
18 ලවා ආරක්ෂා කරවී. ඒතෙමේ ආරක්ෂා පිණිස හාත්පස දෙ
යොදුනෙන්හි (තැන) මහකුලයකින් එක එක දූතෙකු බැ
19 ගින් එහි (කඳපුරට) ගෙන්වීය. කොටවා දනව්වෙහි කඩ
විටි නම් ගම පුතුන් සත්දෙනෙක් ඇති සඞ්ඝ නම්වූ ප්‍රධාන
20 කුලපතියෙක් වීය. රජ කුමර දූතෙකු ගෙන්වනු කැමැත්
තේ ඔහු වෙතද දූතයෙක් යැවීය. නිමල නම් සත්වැනි පුත්‍ර
21 තෙමේ ඇතුන් දසදෙනෙකුගේ බලඇත්තේයි. උහු අකම්ම
ශීලීහෙයින් බෑයෝ සදෙනාම හෙළාදක්නාහු ඔහුගේ
22 ගමන් කැමැතිවූහ. මවුපියෝ එසේ කැමැතිනුවූහ. නිමල
තෙමේ සෙසු බෑයන්ට කිපී ඉතා උදයම තුන්යොදුන් මග
23 ගෙවා හිරු නැගෙණකලම රජකුමර දිටී. ඒතෙමේ ඔහු
24 විමසනු සඳහා දුර කටයුත්තක යෙදුයේය. "සෑගිරිගල
වෙත දෙරමඩලා නම් ගම මා යහලු කුඩල නම් බමුණෙක්
වෙසෙයි, උහුවෙත මුහුදුඋතර (කපුරු සඳුන් ආදී බඩු) ඇත්
25 නාහ. තෝ ගොස් උහුවිසින් දෙනලදවූ බඩු මෙහි
26 ගෙණව" මෙසේ කියා බත් කවා ලිපුම්ක් දී යැවී. මේ අනු

Digitized by Google

රාජූරයතෙමේ ඒ (හසාතොටින්) නාවයොදුන් මත්තෙහිය
27 ඒ තෙමේ පෙරවරුම ගොස් බමුණු දිටී, බමුණු "දරුව වැව
28 නාහා එව" යි කීය. මෙහි පෙර නාබැවින් තිසාවැව නාහා
මහාබෝධියද ථූපාරාමයෙහි චෛත්‍යයද පුදා සියලු පුරය
29 දක්නට නුවරටත් වැද සල්පිළින් සුගන්ධද්‍රව්‍ය ගෙණ එහි
30 උතුරු දෙරින් නික්ම උපුල්කෙතින් උපුල්මල්ද ගෙණ ඒ
බමුණුවෙත එළඹියේය. බමුණු විසින් විචාරණලද්දාවූ ඒ
31 තෙමේ තමා ගමන් කීය ඒ බමුණුතෙමේ උහුගේ පළමු
ඡමත් මෙහි ඡමත් අසා විස්මිතවූයේ "මේතෙමේ පුරුෂා
ජනීයයෙක; ඉදින් එළාලරජ දතහොත් මොහු අත්පත්
32 කොට ගන්නේය. එහෙයින් මේතෙමේ දෙමළුන් සමීප
යෙහි වස්වන්ට නුසුදුස්සේය, රජපිත් පියානුවෙත වාසය සුදුසු
33 ය" යි මෙසේ සිතීය. මෙසේම ලියා ලිපුම ඔහුටදී පුණ්
ණවඩ්ඪන නම් උසතුද (මහගුපිළි) බොහෝ පඬුර දදී ඔහු
34 බත් කවා විතුරු කුමරුවෙත යැද්දියේය ඒතෙමේ සවස් මා
නයෙහි රජකුමරු වෙත ගොස් ලිපුමද පඬුරුද රජකුමරහ
35 ට දිනි. තුටුවූ ඒතෙමේ "දසහසින් මොහු සතුටුකරව" යයි
36 කීයේය. රජකුමරහුගේ ඉතිරි සේවකයෝ උහුට ඊර්ෂ්‍යා
37 කළෝය. ඒ කුමර දසදහසකින් ඒ නිම්ලයා සතුටුකරවී.
38 ඔහු කෙස්ලියවා ගහම නාහවා පුණ්ණවඩ්ඪන වස්ත්‍රයුගක්ද
39 මහා ගඳමල්ද (දී) දුහුල් පටකින් හිසවෙළවා (කුමරු)
වෙත එළවූහ. කුමරතෙමේ තමා පෙළහරින් ඔහුට බත්
දෙවී; තමාගේ දසදහසක් අගණ යහපත් ඇඳ ඒ යෝධ
40 යාට සැතපෙනු පිණිස දෙවීය. ඒතෙමේ සියල්ල එක්කොට
ගෙණ මවුපියන්කරා ගෙණගොස් මෑනියන්ට දසදහසද
41 පියානන්ට ඇඳද දිනි. එම රෑ අවුදින් රක්‍ෂාස්ථානයෙහි
42 (තමා) දක්වී. උදෑසන රජකුමර ඒ අසා තුටුසිත් ඇතිව
ඔහුට වස්ත්‍රාභරණාදියද එසේම පරිවාර ජනයාද දසදහ
43 සක්දදී පියරජුවෙත යැවූයේය. යෝධතෙමේ දසදහස මවු
පියන්වෙත ගෙණගොස් උත්තදී කාවන්තිස් රජුවෙත එළ
44 ඹියේයි. ඒ රජ ගැමුනුකුමරුට උහු භාරකෙළේය. සත්
කාර කරණලද සූරනිම්ල යෝධතෙමේ ඒ කුමරුවෙත විසූ
යේය.

45 කුළුම්බරි කණ්ණිකායෙහි හුන්දරීවාපි නම් ගම තිස්ස නම්
46 (කෙළෙඹියා) සෝණ නම් අටවැනි පුතෙක් විය. සත්හැවි
රිදිකල ඒතෙමේ තල්පැල ඉදිරී; දසහැවිරිදිකල මහත්
47 බලඇතොත් තල්ගස් ඉදිරීය. කල්යාමෙන් ඒ මහාසෝණ
තෙමේ දස ඇත්බල ඇතිවී. රජතෙමේ එබඳුවූ ඔහු අසා

Digitized by Google

පියාවෙතින් ගෙණ පෝෂනය කරණුකැමැත්තේ ගැමුණු
48 කුමරහට දුන්නේය. ඉන්පසු ලබනලද සත්කාරඇති ඒ
යෝධතෙමේ ගැමුණුකුමරුවෙත විසීය.

49 ගිරි නම් දනව්වෙහි නිසෙල්විටි නම් ගම මහානාග නම්
50 තැනැත්තහුගේ පුත් දසඇත්බල ඇතියෙක් විය. මිටිසිරුරු
ඇති බැවින් ගෝඨක නම්වී. දෙටු සබෑයෝ ඔහුට කෙළි
51 සිනා කරන්නාහ. ඔව්හු ගොස් උඳු වපුරණ පිණිස මහ
වනය කොටා උහුගේ භාගය තබා ගොස් උහුට දැන්වූහ.
52 ඒ තෙමේ එකෙණෙහිම ගොස් ඉඹුරු නම් ගස් උදුරා බිම
53 සමකොට ගොස් දැන්වීය. බෑයෝ ගොස් උහුගේ ඒ අරුම
ක්‍රියාව දැක ඔහුගේ කම්මකිත්තනය කෙරෙමින් උහුවෙත
54 ගොස් දැන්වූහ. ඒ නිමිත්තකොටගෙණ ඒතෙමේ ගොට
සිම්බර නම්විය. රජතෙමේ උහුද යටකී පරිද්දෙන් ගැමුණු
කුමරුවෙත යැවීය.

55 කොටගල් අසල කතති නම් ගම්හි ජනවරවූ රොහණනම්
56 ගෘහපතියෙක් වූයේ තමහට දුව උපන් පුතෙක් ගොඨ
අබා රජහට සමාන නම් කෙළේය. ඒ දරුතෙමේ බලඇත්
57 තේවී. එකල්හි ඒතෙමේ දසදෙළොස් හැවිරිදි වූයේ
සතර පස්දෙනෙකුන් විසින් නගාගත නොහෙන ගල්
58 ක්‍රීඩාගුලයන්සේ කෙළිමින් දැමීය. සොළොස්ඇවිරිදි ඔහුට
පියතෙමේ සොළොස්රියන් දිග් වට අටතිස් අඟුල්ඇති ගදා
59 වක් කරවී. ඒතෙමේ එයින් තල් පොල් කඳ පැහැර බිම
60 හෙලා එයින්ම ඒ යෝධතෙමේ ප්‍රකටවී. එසේම රජතෙමේ
උහුද ගැමුණුකුමර වෙත යැවීය. ඔහු පියතෙමේ වනාහි
61 මහාසුම්මස්ථවිරයන්ගේ උපස්ථායකයි. ඒ කෙලෙඹිතෙමේ
මහාසුම්මස්ථවිරයන්ගෙන් බණඅසා කොටගල් වෙහෙරදී
62 සෝවාන් ඵලයට පැමිණියේය. හටගත් සසර කලකිරීම්
ඇති ඒතෙමේ රජුට කියා සංපත පුතුටදී තෙරහුවෙත පැවි
63 දිවිය. භාවනාවෙහි යෙදී රහත්බවට පැමිණියේය. ඒ
හේතුවින් මේ තෙරුන්ගේ පුත්‍රතෙමේ ථෙරපුත්තාභයයි
ප්‍රසිද්ධවී.

64 කප්කඳුරු නම් ගම්හි කුමාරයාගේ හරණ නම් පුතෙක්වි
65 ය. ඒතෙමේ කල්යාමෙන් දස දෙළොස් හැවිරිදිවූයේ, ගම්
දරුවන් හා වනයට ගොස් බොහෝ සාවුන් ලුහුබැඳ පහින්
66 පැහැර දෙකඩකොට බිමගැසීය. සොළොස්හැවිරිදි වූයේ
වනාහි ගම්වැස්සන් හා වලටගොස් එසේම මුවන් ගෝණුන්
67 ඌරන් වහා පෙළීය. හරණ නම් ඒ මහායෝධතෙමේ
එයින්ම ප්‍රකට විය. රජතෙමේ ඔහුද යටකී පරිද්දෙන් ගැමු
නුකුමරුවෙත වැස්වී.

Digitized by Google

68 ගිරි නම් දනවුවෙහි කුඹියගන නම් ගම එහි ප්‍රසිද්ධවූ
කුටිම්බවසභ නම් (කෙළෙඹියෙක්) වී. දනව්වැසි වේළු නම්
69 වූද, ගිරි නම් රට අනුභවකරනනාවූ සුමන නම්වූද යහළු
වෝ (දෙදෙනෙක්වූහ). කෙළෙඹියහට පුතෙක් උපන්කල
පඬුරු පෙරටුකොට දෙදෙනා ගොස් තමන් නම දරුවහට
70 කළෝය. ගිරිභොජකතෙමේ ඒ පුතු තමාගෙහි වැඩ්වීය.
71 ඔහුගේ එක් ගෙණවයෙක් තිසි පුරුෂයෙක් පිටනැ
ගෙන්ට නුදුන්නෝය. (ඒ ඇත්තෙම) වේළුසුමනයා දැකම
"මේතෙමේ මට සුදුසුවූ අසරුය"යි සිතා සත්තුෂ්ටව්‍යේ
72 ගේ සාරව කෙළේය. ඒ දැන ගිරිභොජකතෙමේ "අසුනැගෙ
73 ව"යි ඔහුට කීය. වේළුසුමනයා අසුනැගී ඒ අසු මඬල
යෙහි වහා මෙහෙයී. ඒ අස් සකල මඬලයෙහි ඒකාබද්ධ
74 වූයේ පෙණුනි. දුවනනාද්‍ද මේ අසුපිට පුරුෂ වලලුක්
සේ හුන්නේය; සැලනිලි නැත්තේ උතුරුසළුව මුදසි
75 නැවත බඳියි. ඒ දැක සියලු පිරිස ඔල්වරහඬ ගැසූය. ඒ ගිරි
භොජකතෙමේ උහුට දසදහසක් දී "මේතෙමේ රජහට
76 සුදුසුය"යි සතුටුව්‍යයේ රජහට දුන්නේය රජතෙමේ උහුට
සත්කාර කරවා වේළුසුමනයා බුහුමන්කෙරෙමින් තමන්
වෙතම වැඩ්වී.

77 නකුල්ගල් කණ්ණිකායෙහි මහෙන්ද්‍රද්‍රෝණී නම් ගම අභ
ය නම් තැනැත්තාහුගේ අන්තිම පුත්‍රවූ ශක්තිසංපන්න දේව
78 නම් තැනැත්තෙක් වී, මඳක් කොරගසා යනබැවින් බර
79 දේවයයි උහු දතහුය. එකල්හි ඒ මානවතෙමේ ගම්වැස්
80 සත්හා මුවදඩ ගොස් මහත්වූ උස් මිවුන් ලුහුබැඳ අතින්
උන් පා අල්වාගෙණ ඉසවට සිසාරා බිම පැහැර උන් ඇට
81 පොඩි කෙරෙයි.. මිපල්තෙමේ උපවත් අසාම බරදේවයා
ගෙන්වාගෙණ යැමුනුකුමරු වෙත රැඳවී.

82 සිතුල්පව් වෙත කපිෂ් නම් ගම උත්පල නම් තැනැත්තා
83 හුගේ පුසදේවයයි නම්ඇති පුතෙක් වීය. ඒ කුමරතෙමේ
ගම්දරුවන්හා විහාරයට ගොස් බෝධියට පුදනලද සකක්
84 ගෙණ තරයේ පිඹපීය. එහි ශබ්දය අසනිපාත රව සෙයින්
85 මහත්වීය. ඒ සියලු ගම්දරුවෝ බියවැද උමතුවූවන් සෙයින්
වූහ. ඒතෙමේ ඒ හේතුවින් උන්මාද පුසයයි ප්‍රසිද්ධවීය. ඔහු
ගේ පියතෙමේ වංශයෙහි පැවත ආ ධනුශ්ශිල්පය ඉගැන්
86 වී. ඒතෙමේ ශබ්දනුසාරයෙන් විදින සුළුවූයේද විදුලි එළි
යෙන් විදින සුළුවූයේද (කරබටු ආදී කිසි ලකුණකින්)
87 රෝම විදින සුළුවූයේද වී. වැලිපිරුණු ගැලෙක එසේම
බැඳි සම් සියක්පටය. අටගුල් පියාලු ගැලුල සොළසාඟුල්

Digitized by Google

88 දිඹුලලෑගෑලල එසේම දූහුල් යපව සතරගුල් ලොගොපට
ගියෙන් විදිනේසි. ගියද එකිදූ විනිවිද යවයි ගොඩ අව
89 ඉස්බක් යෙයි දියෙහි ඉස්බක් යෙයි මහරජ එපවත් අසා
ඔහුද පියහුවෙතින් ගෙන්වාගෙණ ගැමුනුකුරුවෙත වැස්
වීය.

90 තුලාධාර පව්වත සම්පයෙහි වෙහෙරවෑ ගම මතත නම්
කෙලෙඹියා පුත් වසභ නම් ඇතෙතක් වීය. මොනවට හට
91 ගත් ශරීරඇති බැවින් උසු ලඹියා වසභයයි දතහුය. හේ
තෙමේ විසිවස් පමණෙහි මහත් කායශක්ති ඇතෙතේවී.
92 කෙතක් කැමැති මහත් බලඇති ඒතෙමේ වැවකකරනෙන්
මිනිසුන් කීපදෙනෙක්ම ගෙණ ඒ වැව පටන් ගත්තේය.
93 දසදෙළොස් දෙනෙකුන් විසින් ඉසිලියයුතු මහත් පාංශු
පිඩයන් උසුලනනාවූ ඒතෙමේ වහාම වැවකොට නිමවී.
94 ඒ කරුණෙන් ඒතෙමේ ප්‍රකට වීය. රජතෙමේ ඔහුද ගෙන්
වාගෙණ ඔහුට සත්කාරදී ගැමුනුකුමරු වෙත වැස්වීය. ඒ
95 කෙත වසභ අවුනැයි ප්‍රකටවීය ඒ ලඹියා වසභ තෙමේ
ගැමුනුකුමරු වෙත විසීය.

96 එකල් මිහිපල්තෙමේ මේ දසමහ යෝධයන්ට පුතු සම
97 සත්කාර කරවී. දීප්පති රජතෙමේ මහායෝධයන් දස
දෙනා කැඳවා "තෙපි එකඑකා යෝධයන් දසදසදෙනා
98 සොයව්ය"යි කීයේය. ඔව්හු එසේම යෝධයන් ගෙණ
වෝය. නැවතත් මිහිපල් තෙමේ ඒ යෝධයන් සියයටත්
99 එසේම යෝධයන් පරීයෙෂණය පිණිස කීයේය. ඒ යෝධ
යෝද එසේම යෝධයන් ගෙණවෝය. මිහිපල්තෙමේ නැ
100 වත ඒ යෝධයන් දහසටත් එසේම පරීයෙෂණයට කීයේය.
එසේ ඔව්හුද යෝධයන් ගෙණඅවුය. කැවීකරණලද ඒ
සියලු යෝධයෝ එකොළොස් දහස් එක්සිය දසදෙනෙකි.
101 ඒ සියල්ලෝ මිහිපල්හු වෙතින් හැමකල ලබනලද සත්
කාර ඇතෙතා ගැමුනුරජපිත් පිරිවරා විසූය.

102 සුවකැමැති ප්‍රාඥ මිනිස්තෙමේ අද්භූත සුචරිත පරම
පරාව මෙසේ අසා අකුසලමාර්ගයෙන් පරාඞ්මුඛවූයේ හැම
කල් කුසල්මග ඇලෙණෙන්ය.

මෙතෙකින් සුදීජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වස යොධලාභ නම් තෙවිසිවන අදියර නිමි.

24 වෙනි පරිච්ඡෙදය.

1 හස්තිශිල්ප අශ්වශිල්ප ඛඩ්ගශිල්ප යන මෙහි දක්ෂවූ කරණ
ලද අභ්‍යාසඇති ගැමුණුකුමරතෙමේ එකල මාගම්හි විසීය.
2 රජතෙමේ සැපඳුනු බලවාහනඇති තිස්සකුමාරයා ජන
පදය රක්නා පිණිස දීඝවාපීහි වැස්වීය. ගැමුණුකුමර
3 තෙමේ හැකිවූ කාලයෙහි ශක්තිය හෝ බලසෙන් දක්නේ
"දෙමළුන් හා යුද්ධකරන්නෙමි" පියරජහට කථාකරවී. රජ
4 තෙම ඔහු රක්නේ "ගඞ්ගින් මෙතර පමණය"යි වැලකුයේය.
5 ගැමුණුකුමර තුන්වන වරතෙක් එසේම කථාකරවී. "පින්
වත්නි මපියතෙමේ පිරිමිවෙමින් මෙසේ නොකියන්නේමය
එහෙයින් මේ පළඳිව" යි රජහට ස්ත්‍රීආභරණ යැවීය.
6 රජතෙමේ ඔහුට කිපී "රන්හැකිළුලක් තනාව් එයින් උහු
බඳිනෙමි අනික්පරිද්දෙකින් ඒතෙමේ රැක්කහැක්කේ
7 නොවේ" යි කීයේය. පියරජහට කිපී පලාගොස් කඳුරටට
ගියේය. පියානන් කෙරෙහි දුෂ්ටවූ බැවින්ම ඔහුට දුඨගාම
ණීයයි කීහු.
8 ඉක්බිති රජතෙමේ මහානුගගල චෛත්‍යය කරන්ට
ආරම්භකෙළේය. සැය නිමිකල මහීපල්තෙමේ සඞ්ඝයා රැස්
9 කෙළේයි. සිතුල්පව්වෙන් භික්ෂූහු දොළොස් දහසක් වැඩී
යෝය; ඒ ඒ දිගින් තවත් දොළොස්දහසක් වැඩීයෝය.
10 චෛත්‍යපූජාව කොට සඞ්ඝයා සමුඛයෙහි සියලු යෙ ධ
යන් රැස්කරවා සපථකරවී. "කුමරුවන් උහුන්ගේ කලහ
11 ස්ථානයට අපි නොයමහ" යි සියල්ලෝ දිව්රූය. එහෙ
යින් ඒ යුද්ධයට ඔව්හු නොගියෝයි.
12 ඒ මහීපල්තෙමේ විහාරයන් සූසැටක් කරවා එතෙක් අවු
රුදු එහි වැස පසුව කාළක්‍රියා කෙළේය. රාජිනියතොමෝ
13 පිළිසන් යානාවකින් රජහු සිරුර ගෙන්වාගෙණ තිස්ස
මහාරාමයට පමුනුවා එපවත් සඞ්ඝයාට දැන්වීය. තිස්ස
කුමාරතෙමේ එපවත් අසා දීඝවාපියෙන් ගොස් පියහුගේ ශරී
14 රයට කටයුතු ආදාහනාදිය තෙමේ සකසා කරවා මෑනියන්ද
කඩොලෑතුද ගෙණ මහත් බලඇතොත් බෑයාට භයින්
15 එතැනින් වහා දීඝවාපියට ගියේය. එපවත් දන්වන්ට සියලු
16 ඇමැතියෝ රැස්ව ලියමන් දී දුටුගැමුණු කුමරුවෙත (දූත
17 යන්) යැවූහ. ඒතෙමේ ගුත්තාලට අවුත් තිස්සකුමරුවෙත
18 චරයන් යවා මාගම් එලඹ තමන් රාජ්‍යයෙහි අභිෂෙක කෙ
ළේය. මෑනියන් පිණිසත් කඩොලෑතු පිණිසත් බෑයාට
19 ලියුම් යැවීය, තුන්යල දක්වා නොලැබ යුදපිණිස උහු

Digitized by Google

බලා එලඹියේය. චූලඞ්ගනිය පිට්ටෙහි දෙදෙනාගේ මහත්
20 යුද්ධයෙක් විය. ඒ යුදෙහිදී රජහුගේ නොයෙක් දහස්
ගණන් මිනිස්සු වැටුණෝය රජතෙමේද තිස්සාමාත්‍යද දීඝ
21 ථූනිකානම් වෙළඹද යන තුන්දෙනා පමණක් පලාගියෝය,
කුමරතෙමේ උන් ලුහුබැඳ ගියේය. දෙපක්ෂය අතුරෙහි
භික්ෂූහු පර්වතයක් මැවූහ. ඒ දැක කුමරතෙමේ භික්ෂුසඞ්ඝ
යාගේ ක්‍රියාවෙකැයි දැන නැවැත්තේය.
22 ඒ රජතෙමේ සපාදුරුහොය ජීවමාලි තොටට එලඹියේ,
23 තිස්ස නම් ඇමැතියාහට "අපි සාපිපාස ඇත්තෙමෝය" යි
කීයේය. ඒ ඇමැතිතෙමේ රජ්ජුපිණ්ඩ රන්තැටියෙහි තුබූ
24 බත් බැහැරකෙළේය. සඞ්ඝයා විසයෙහි දන්දී අනුභව
කරණ හෙයින් සතර කොටස් කරවා "කාලඝොෂා කරව" යි
25 කීයේය. තිස්සතෙමේ කාලඝොෂා කෙළේය. රජහට ශික්ෂා
දුන් ස්ථවීරතෙමේ පුවඟු දිවයින වසනසේක්, (ඒ ශබ්දය)
දිවකණින් අසා කෙළෙඹි පුත් තිස්සතෙරුන් එහි නියෝග
26 කළසේක. උන්වහන්සේ අහසින් එහි වැඩිසේක; තිස්ස
ඇමැතිතෙමේ උන්වහන්සේ අතින් පාත්‍රය ගෙණ රජහට
දුන්නෝය; රජතෙමේ සඞ්ඝයාගේ භාගයත් ස්වකීය භාග
27 යත් පාත්‍රයෙහි බහාලූයේය; තිස්සතෙමේ ස්වකීය භාගයත්
පාත්‍රයෙහි බහාලීය; වෙළඹත් සියකොටස නොකැමතිවීය;
28 තිස්සතෙමේ ඇයගේ භාගයත් පයෙහි බහාලීය. රජතෙමේ
බතින් පිරූපය තෙරුන්ට දුන්නෝය, උන්වහන්සේ වහා
අහසින් වැඩ ගොතම නම් තෙරුන්ට දුන්සේක.
29 ස්ථවීරතෙමේ වළඳන පන්සියයක් භික්ෂූන්වහන්සේලාට
ආලොපවසයෙන් බෙදදී උන්වහන්සේලා වෙතින් ලැබූ
30 කොටසින් පාත්‍රයක් පුරවා රජ්ජුපිණ්ඩ අහස දැමූසේක; තිස්ස
තෙමේ ආකාසගත ඒ දැක ඇරගෙණ රජ්ජු වැළඳවීය.
31 තෙමේත් කා වෙළඹටත් කැවීය. සන්නාහය හුඹුලුකොට
රජතෙමේ පාත්‍රය යැවීය.
32 ඒතෙමේ මාගම්ගොස් හැටදහසක් බලසෙන් ගෙණ මළු
33 හා නැවත යුදපිණිස ගොස් යුදකෙළේය. රජතෙමේ
වෙළඹ පිටද තිස්සකුමර කඩොලෑතු පිටද නැගී සම්බුම
34 වූය. එකල්හි දෙබෑයෝ යුදකරනාහු යුධයෙහිදී රජ
තෙමේ ඇතු ඇතුළුකොට වෙළඹ මඬුලක් කෙළේය;
එසේද අවසර නොදැක පන්වන්ට සිතීය, වෙළඹ ඇතු මත්
35 තෙන් පනනවා සහෝදරයාගේ මස්තකයෙන් පිට සන්නා
36 හය කැපෙන පරිද්දෙන් තෝමරය දැමීය. ඒ යුධයෙහි කුමා
රයාගේ නොයෙක් දහස් මිනිස්සු යුදකෙරෙමින් වැටුණෝය;

37 (උහුගේ) මහත් බලයද බිඳුනේය. "ඈතරුවා විකල
බැවින් සත්‍රිය මා මතුයෙන් පැනවීය" යි කිපුනාවූ ඇත්
තෙමේ චාලනාය කෙරෙමින් එක් රුකක් වෙතට ගියේය.
38 කුමර රුකට නැංගේය, ඇත්තෙමේ හිම්යා වෙත ගියේය.
ගැමුනුරජ ඇතුනැගී පලායන කුමරහු ලුහුබැන්දේය. ඒ
කුමර විහාරයකට වැද මහතෙරුන් ගෙට වත්තේය.
39 කුමාරතෙම බැයාට හයින් යටහැඳ වැදහොත්තේය.
40 මහා සථවිරතෙම ඒ ඇඳ සිවුර අතුළෙේක. රජතෙමේ පශු
41 පස්සෙහි ගොස් "තිස්සයා කොහිදැ" යි විචාළේය. "මහරජ
තෙනි ඇඳෙහි නැතැ" යි ස්ථවිරතෙම රජහට කීයේය. මිහි
42 සල්තෙමේ යටහැඳයයි දැන එයින් පිටත්ව වෙහෙර සිහාරා
මුර තැබිය. ඒ කුමරහු වනාහි කුරුඇඳෙක හොවා මතෙහි
43 සිවුරෙකින් වසා ලදරු භික්ෂූහු සතරදෙනෙක් ඇඳකකුල්
අල්වාගෙණ මළ භික්ෂුකෙනෙකුන්මෙන් බැහැරලූය. මිහි
44 පල්තෙමේ ඒ ගෙණයනු ලබනනාහු හැඳින "තිස්සය තෝ
කුලදේවතාවන් ඉස හිඳගෙණ යනු නොලබ, කුලදෙවියන්
45 අතින් මාගේ පැහැරගැන්මක් නැත්තේය, තෝ කොයි දව
සත් කුලදෙවියන් ගුණ සිහිකරව" යි මෙසේ කීයේය.
46 මිහිපල්තෙමේ එතැනින් මාගමට ගියේය. මෑනියන්
කෙරෙහි ගෞරවඇත්තේ එහිදී මෑනියන් කැඳවාගත්තේ
47 ය. ධම්මයෙහි පිහිටි සිත්ඇති ඒ ගැමුනුරජ අටසැට වසක්
වෙසෙමින් අටසැට වෙහෙරක් කරවී.
48 භික්ෂූන් විසින් නික්මවනලද ඒ තිස්ස රජකුමර වනාහි
49 අනන්‍යතරයෙකුසේ එතනින්ම දීඝාවැවි ගියේය. ඒ කුමාර
තෙමේ ගොඩගතන තිස්සතෙරුන්ට "ස්වාමීනි මම අපරාධ
50 සහිතයෙමි බැයා කමාකරවනෙනාමැ" යි කීයේය. වනාවත්
කරණනාකුගේ වේසඇති තිස්සකුමරුද භික්ෂූන් පන්සිය
51 යක්ද ගෙණ ඒ ස්ථවිරතෙමේ රජුකරා එළඹියේය. ස්ථවිර
52 තෙමේ රජකුමරහු හිණිහිස සිටුවා සඞ්ඝයා සමග රජගෙට
වත්සේක. සැදැහැති මිහිපල්තෙමේ වඩාහිඳුවා කැඳආදිය
එළවූයේය. ස්ථවිරතෙම පාත්‍රය වැහූසේක. කිමෙක්දැයි වි
53 චාළුකල "තිස්සකුමරහු ගෙණ ආවහ" යි කීසේක. සොරතෙ
මේ කොහිදැයි විචාරණ ලදුයේ සිටිතැන් දැන්නුසේක. විහාර
54 දේවි ගොස් පුතු මුවහකොට සිටියාය. රජතෙමේ "තුඹ
වහන්සේලා විසින් අපගේ දසභාවය දැන් දනාලද්දේය,
ඉදින් තුඹවහන්සේලා සත්හැවිරිදි සාමණේර කෙනෙක්
55 එව්වාහුනම් ජනක්ෂයෙන් තොරවම අපගේ කලහයෙක්
නොවන්නේය" යි තෙරුන්ට කීයේය. ඒ රජතෙමේ "මෙ

Digitized by Google

සඞ්ඝයාගේ ප්‍රසාදය සඞ්ඝතෙමේ දඬුවම් කරන්නේයයිද
56 සුඛවසන්නේලා වැඩියාවූ කෘත්‍යය සිඛවනොප්‍යයිද කැඳ
ආදිය පිළිගත මැනව" යිද කියා භික්ෂුසඞ්ඝයාට දන්දී
57 මළු කැඳවා එහිම සඟමැද හුනෙන්, මළුහා එක්ව මේ නිම
58 වා භික්ෂුසඞ්ඝයා යැවීය. ගොයම් කරවනු පිණිස තිස්සකුමර
ඒ දිගාවැමබුලුලංවම යැවූයේය. තෙමේත් බෙරපියවි කාර
වා සස්කම් කරවී.

59 මෙසේ නානාප්‍රකාරයෙන් රැස්කරණ ලදුවූ බොහෝවූද
වෙරය සත්පුරුෂයෝ නිමති; සුවනැති කවර නම් මිනි
සෙක් මෙසේ සිතා අනුන් කෙරෙහි සත්සුන් සිත්ඇත්තේ
නොවන්නේද වන්නේමැයි.

මෙතෙකින් සුදිජනයා පහන් සංවෙග පිණිස කල මහ
වංශ වෙතානික යුඹ නම් සුවිසිවන අදියර නිමි.

---

25 වෙනි පරිච්ඡෙදය.

1 ඉක්බිති දුටුගැමුනු රජ ජනයා සඞ්ග්‍රහකොට ගෙණ කුනත්
යෙහි ධාතු නිදන්කරවා යානවාහන හා බලසෙන් ඇතිව
2 තිස්සමහාරාමයට ගොස් සඞ්ඝයා වැඳ "සාසනය බබුලු
වන්ට මම ගඟඑතර යනෙනවී, සත්කාර කරණු පිණිස
3 අප කැටිව යන්ට භික්ෂූන් දුනමැනව, භික්ෂූන්ගේ දර්ශනය
අපට මඟුල්ද ආරක්ෂාද වන්නේය" යි කීයේය. සඞ්ඝතෙමේ
4 දඬුවම් පිණිස භික්ෂූන් පන්සියයක් දුන්නේය. මිහිපල්තෙ
මේ ඒ භික්ෂු සඞ්ඝයා ගෙණ එසින් පිටත්ව මලයරට මෙහි
5 අනුරාපුර එන මාර්ගය සුඛකරවා කඩොලෑතු නැගී යෝධ
යන් විසින් පිරිවරණලදුයේ මහත් බලසෙන් හා යුදපිණිස
6 නික්මගත්තේය. මාගම පටන් ගුත්තාල දක්වා කඩනැති
සේනාතොමෝ ආය.

7 මීයුගුණට අවුත් ජත්‍රනම් දෙමළා අල්වා ගත්තේය. එහි
දෙමළුන් මරා ගඟා නැමැති පරිඛාවෙන් යුක්තවූ අඹතො
8 වට අවුත් තිත්ථම්බ නම්වූ මහත් බලඇති කාතගසතාවූ
දෙමළා යුඩකෙරෙමින් සාර මසෙකින් මැනියන් දක්වා ඒ
උපායෙන් අල්වා ගත්තේය. එසින් බැස මහත් බලඇති
9 දෙමළ සත්රජ කෙනෙක් එකදවසින්ම අල්වාගෙණ නිහිය
10 කොට මහත් බලඇත්තේ බලසේනාවට වස්තුදුන්නේය.

Digitized by Google

11 එහෙයින් (එහි) ආරාමය තෙමේ ඛෙමාරාමයයි කියනුලැබේ.
අතුරුහෙබ මාකොටු නම් දෙමළාද ද්‍රොණ නම් ගම ගවර
නම්දෙමළාද හල්කොල නම් ගම ඉසුරු නම් දෙමළාද නැළි
12 හෙබ තාළික නම් දෙමළාද අල්වාගත්තේය. දික්අබාගල
දික්අබා නම් දෙමළාද අල්වාගත්තේය. කස්තොට කවි
13 සීස නම් දෙමළා සාරමසෙකින් අල්වාගත්තේය. කෝට
නුවර කෝට නම් දෙමළාද ඊට ඉක්බිති හාලවහානක නම්
14 දෙමළාද වහිට්ඨනම් තැන එනම් දෙමළාද ගැමුණුගම ගැ
මුණු නම් දෙමළාද කුඹගම කුඹනම් දෙමළාද නන්දිගම්හි
නන්දිකනම් දෙමළාද ඛානුගම ඛානුනම් දෙමළාද තඹගම
15 තඹ නම්වූය උනානනම් ගම එනම්වූය යන මයිල් බෑන දෙ
මළුන් දෙනනාය යන මෙතෙක්දෙන අල්වාගත්තේය. ජම්බු
නම් ගම එනම් දෙමළාද අල්වා ගත්තේය. ඒ ඒ ගම්න්
ඒ ඒ ප්‍රධානීන්ගේ නම් සමානවූය.
16 “සියසෙන් නොහැඳින ස්වකීය ජනයෝම නසත්”යයි අභ
මිහිපල්තෙමේ එහිදී “මාගේ මේ ව්‍යායාමය තෙමේ කිසි
17 කලෙකත් රජසැප පිණිස නොවන්නේය, මාගේ මේ
18 උත්සාහය බුද්ධශාසනයාගේ පිහිටවීම පිණිසමැයි, ඒ සත්‍යය
කරණකොට ගෙණ මාගේ සේනාකායභාණ්ඩයන් ගිනිදැල්
19 වන් වේවා” යි සත්‍යක්‍රියා කෙළේය. එකල්හි ඒ එසේම විය.
ගංතෙර විසූ මරණලදින් ඉතිරි සියලු දෙමළු ආරක්ෂා පිණිස
20 විජිත නම් නුවරට වන්නූය. ඒසුවූ සමතලා තැනෙක කඳ
පුර පිහිටවී. එතැන කඳපුරු පිටිය යි නම්වී.
21 විජිතනුවර ගන්නා පිණිස විමසන්නාවූ නරනායක,
22 එන්නාවූ නන්දිමිත්‍රයා දැක කඩොලෑතු යැවිය. නන්දිමිත්‍ර
තෙමේ තමා අල්වන්ට ආ ඒ ඇතු දෙයතින් දෙදළ පෙළා
23 අල්වා උකසුවුකයෙන් හිඳවී. ඒ නන්දිමිත්‍රතෙමේ යම් හෙය
කින් යම් තැනෙක යුද්ධකෙළේ නම් ඒ හේතුවින් එහි කළගම
හත්ථිපෝරයයි කියනුලැබේ.
24 රජතෙමේ දෙනනාම විමසා විජිතනුවර බලා ගියේය.
25 දකුණු දොරදී යොධයන්ගේ බිහිසුනු සඞ්ග්‍රාමයෙක් විය. නැ
ගෙණහිරි දොර ප්‍රසිද්ධ වේළුසුමන තෙමේ අසුනැංගේ
බොහෝ ගණින් දෙමළුන් මැරීය. දෙමළු දොර වැසූහ. රජ
26 තෙමේ යොධයන් යැවීය. දකුණු දොර කඩොලෑතුය නන්දි
මිත්‍රය සුරනිමිලය යන මොවුන්හා මහාසෝණය ගෝඨය
27 ථෙරපුත්තාභය යන ඒ තුන්දෙනා ඉතිරි වාරතුනෙහි යුද්ධ
28 කළෝය. ඒ නුවර වනාහි පරිඛාත්‍රයක්ද උස්වූ පවුරු
තොරන්ය ලොහොකම්කළ දොරය (යන මෙයින්) සතුරන්

29 විසින් බිඳහෙළිය හැක්කේ නොවේ. ඒ ඇත්තේමේ දෙද
නින් හිඳ දෙදළින් ගල් සුණු ගඩොල් බිඳ යදොරට පැමිනි
30 යේය. තොරණ හුන් දෙමළු අනෙකප්‍රකාර ආයුධයන්ද
කකියාගිය ලොහොගුළිද එසේම කකාල මැලියම්ද දැමූය.
31 පිට ලහටු දූකල කඩොලැත්තෙමේ දුවමින් වේදනාවෙන්
මිරිකුණේ උදක ස්ථානයට ගොස් එහි ගිලිනි.
32 ගොටයිම්බරතෙමේ “මේ තට සුරාපාන නොවෙයි යදොර
33 හැරීමය යව දොර බිඳුව”යි මෙසේ කීය. ඒ උතුම් ඇත්
තෙමේ මත් උපදවා කුචනාදකොට දියෙන් ගොඩනැගී
34 එඩිඇතිව ගොඩ සිටගත්තේය. ඇත්වෙදතෙමේ ලහවු
ගලවා බෙහෙත් කෙළේය. රජතෙමේ ඒ ඇතුනැගී අතින්
35 කුම්භස්තලය පිරිමැද “දරුව කඩුලය මුළු ලක්දිව රජය
තට දෙනෙනමි”යි ඒ ඇතු තුටුකරවා වරබොජුන් කවා
36 සළුවෙන් වෙළා මනා සන්නාහ ලවා සන්නාහ මතුයෙහි
සත්ගුණකළ මීසම් බඳවා ඊමතොහි තෙල්සම් එලවා ඒ
37 ඇතු මෙහෙයී. ඒ ඇතෙතමේ සෙනගඩමෙන් ගුගුරමින්
38 උපද්‍රවයන් ඉවසමින් ගොස් දෙදළින් ලැගැලි බින්දේය,
එළිපත පයින් පහළේය. දොරබා සහිත ඒ යදොර ගුගුරා
39 ගෙණ බිම ගිනි. තොරණෙහි ද්‍රව්‍යසමහාරය ඇතුපිට හෙ
නනා දැක නන්දිමිත්‍රතෙමේ බාහුයෙන් පෙරලා දැමීය. කඩො
40 ලැත්තෙමේ ඔහුගේ ක්‍රියා දැක තුටුසිත් ඇතෙත් පළමු කර
41 ණලද දළපෙළිම් වෙරය හළේය. කඩුල නම් උතුම්
ඇතෙතමේ තමා පිටින්ම නුවරට වදනා පිණිස නැවතී සිට
42 යොධයාදෙස බැලීය. “ඇතුකළ මගින් මම නොවදනෙ
43 මැ”යි සිතා නන්දිමිත්‍රතෙමේ බාහුයෙන් ප්‍රාකාරයට ගැසීය.
අටළොස් රියන් උස් ඒ පවුර අටඉස්බක් දුර වැටුණේය. සුර
නිම්ලයාදෙස බැලීය. එතෙමේද ඒ මග නොකැමැතෙත්
44 පවුරපැන නුවර ඇතුළත ගිනි. ගොටයිම්බරයා හා සෝණ
තෙමේද එකී එකී දොර බිඳ ඇතුල්වූහ. ඇත්තෙමේ රිය
45 සකක්ද නන්දිමිත්‍ර ගැලතතක්ද ගොටයිම්බර තොරළු තුරක්
ද නිම්ලතෙමේ උතුම් කඩුවක්ද මහාසෝණතෙමේ තල්රු
46 කක්ද ථෙරපුත්තාභයතෙමේ මහා ගදාවක්ද ගෙණ වෙන්
වෙන්වම වීථිගතවූවාහු එහි දෙමළුන් සුණුකළෝය.
47 රජතෙමේ සාරමසකින් විජිතනුවර බිඳ එයින් ගිරිල
48 නම් නුවර ගොස් ගිරිල නම් දෙමළා මැරීය. එතැනින්
මහා පරිබාත්‍රයක් ඇත්තාවූ හිඟුරුවැලින් හාත්පසින් වෙ
49 ළනලදවූ එක් දොරටුවක් ඇති වදනට දුෂ්කරවූ මහෙ
ලනූරට ගොස් සාරමසක් එහි වෙසෙමින් රජතෙමේ

Digitized by Google

50 මනත්‍රුඹයෙන් මහේල රජු අල්වාගත්තේය. එතැනින්
අනුරාධපුරයට එනනාවූ මිහිපල්තෙමේ කසාගල්ලින් ඔබ
51 කඳඋරු පිහිටවී. පොසොන්මස්හි ඒ (ප්‍රදෙකත) නම් වැව
කරවා එහි දියකෙළියේයි. එතැන කළ නුවර පොසොන
52 නාගර නම්වේ. ඒ දුටුගැමුනු රජු යුදපිණිස ආබෑවී අසා
53 එළාලරජතෙමේ ඇමැතියන් රැස්කරවා "ඒ රජ තෙමේත්
යෝධය ඔහුගේ යෝධයෝත් බොහෝල ඇමැතියනි කුමක්
54 කටයුතුද අපගේ මේ පිරිස කුමක් සිතද්දැ"යි කීයේය.
එළාලරජහුගේ දීඝජන්තු ආදිවූ යොධයෝ "සෙට යුධකා
රනනමෝය"යි මෙසේ නිශ්චය කළෝය.
55 දුටුගැමුනු රජතෙමේත් මැතියන්හා මන්ත්‍රණයකොට
ගෙණ ඒ බිසවුන් උපායෙන් දෙතිස් බලකොටුවක් කරවී.
56 එහි රාජච්ඡත්‍ර ධරනනාවූ(දෙතිස්)රජරුවක් තැබූයේය. මිහි
57 පල්තෙමේ අභ්‍යන්තර කොටුවෙහි සිටගත. එළාල රජ
තෙමේ යුධයට සැරසුනේ මහාපබ්බත නම් ඇතුනැගී යාන
58 වාහන සහ බලසෙන් සමග එහි ගියේය. යුධ පවත්නා
කල භයංකරවූ මහත් බලඇති දීඝජන්තුතෙමේ කඩුපලහ
59 ගෙණ යුදකෙරෙමින් අටළොස් රියන් පමණ අහසට පැන
ඒ රජරුව කඩුවෙන් පැහැර පළමු බලකොටුව බින්දේය.
60 මහත් බලඇත්තේ එසේම සෙසු බලකොටුද බිඳ ගැමුනු
රජු සිටි බලකොටුව බලා ගියේය.
61 ඒ සුරනිම්ල යෝධතෙමේ මහා බලඇතෙත් රජු ඉදිරියට
යනනාවූ ඔහුට තමන් නම අසවා ආක්‍රොශ කෙළේය. දීඝ
62 ජන්තුතෙමේ කිපියේ උහු මරනෙනමැයි අහසට නැංගේය,
නිම්ලතෙමේ බස්නාහට පලහ එලවී. දීඝජන්තුතෙමේ
63 පලහ සහිත මොහු කපමැයි සිතා කඩුවෙන් පලහ පහ
64 ළේය, නිම්ලතෙමේ පලහ හැර බිම වැතිරගත්තේය, දීඝ
ජන්තුතෙමේ හළ පලහ පහරමින් එහි ගිනි, සුරනිම්ලතෙ
65 මේ (නැගිට) වැටුනහු කඩුවෙන් පහලේය (දෙපලුකොට
කැපිය). ඵුස්සදෙවයා සක පිඹිය දෙමළසෙන් බිඳිනි.
එළාලරජද නැවැත්තේය (හැරීගියේය) බොහෝ දෙම
66 ළුන් මැරුහු. එහි වැවදිය මරණලද දෙමළුන් ලෙයින්
කැලැත්විය එහෙයින් නමින් කලත් වැවයි ප්‍රසිඩවී.
67 එහිදී දුටුගැමුනු මිහිපල්තෙමේ "මාහැර අනිකෙක් එළා
68 ලරජු නොමරාව"යි බෙර හසුරුවා සනනාහ සන්නාධවූයේ
එසේම සන්නධකළ කඩොලැතු නැඟී තෙමේම එළාලරජු
69 ලුහුබඳිමින් දකුණු වහසල්දොරට ආය; නුවර දකුණු වහ
සල් දොරදී මිහිපළුන් දෙදෙනා යුධකළෝය; එළාලරජ

Digitized by Google

70 තෝමරය දුමීය. ගැමුණුරජ ඒ වැලකීය. ඒ පව්වත නම්
ඇතු සිය කඩොලැතුලවා දෙදළින් ඇණනවි, එළාලරජහට
තෝමරය දුමීය. ඇතුසහිත ඒතෙමේ එහි ගිනි.
71 එහිදී දිනතලද සඞ්ග්‍රාමඇති ඒතෙමේ යානවාහන බල
සෙන් සහිතව ලක එකසත්කොට නුවරට වනෙන්ය.
72 නුවර අණබෙරලවා හාත්පස යොදුනෙක මිනිසුන් රැස්කර
වා එළාල රජහට සත්කාර කරවී. සිරුර වැටුනතැන්හිදී
73 (කුළුගෙයකින්) ඒ මිනිය දැවීය. එහි චිතකයක්ද කරවී
74 පෙළහරද දුන්නේය. අදදක්වාත් ලක්දිවිහි රජදරුවෝ
ඒ පෙදෙස සමීපගතවූවෝ එම පෙළහරින් තූර්‍යවාදනය
75 නොකරවති. මෙසේ ඒ දුටුගැමුණු රජතෙමේ දෙතිස් දෙමළ
රජකෙනෙකුන් අල්වාගෙණ ඒකච්ඡත්‍රයෙන් ලඞ්කා රාජ්‍යය
කෙළේය.
76 විජිතනුවර බින්දකල ඒ දීඝජන්තු යොධතෙමේ බෑනා
ගොඩබෑව් එළාලරජයට දන්වා තමා බෑනා ඒ හල්ලුකය
77 හට මෙහි (ලක්දිව්) එනු පිණිස (හසුන්) යැවීය. හල්ලුක
තෙමේ ඔහුගේ (හසුන්) අසා එළාල රජු දැවූ දවසින් සත්
78 වෙනි දවස්හි සැටදහසක් මිනිසුන් සමග මෙහි ගොඩබට්
79 ටේය. ගොඩබට්වාවූ ඒතෙමේ ඒ රජහු වැටුනුබැව් අසා
80 "ලජ්ජයෙන් යුදකරණෙනමැ" යි මහතොටින් මෙහි ආයේ
ය. කොලඹහාලක නම් ගම කඳවුර පිහිටවී. රජතෙමේ
81 ඔහු ආබැව් අසා යුධසන්නාහයෙන් සන්නද්ධව කඩොලැතු
නැගී හස්ති අශ්ව රථ යොධයන් හා පදික සේනාවෙන්ද
සම්පූර්ණව යුදපිණිස නික්මුනේය.
82 ලක්දිවිහි අග්‍ර ධනුර්ධරවූ ඒ උන්මාද පුස්සදෙවතෙමේ
පඤ්චායුධ සන්නද්ධයේ එම ඇතුපිට රජහට පසු ආසනයෙහි
83 හිඳියේය. සෙසු යොධයෝද ඒ අනුව ගියෝය. එහි මහායුද
පැවතිකල සන්නාහ සන්නද්ධ හල්ලුකතෙමේ රජු ඉදිරියට
84 ආයේය. කඩොල හස්තිරාජ එනාහි ඔහුගේ වේගමන්දීභාවය
පිණිස සෙමෙන් සෙමෙන් පසුබැස්සේය. සේනාවද ඒ
85 කැටිවම සෙමෙන් සෙමෙන් පසුබැස්සාය. රජතෙමේ "පුස්ස
දෙවය පෙර අටවිසි යුධයෙහි මේ ඇත්තෙ නම් පසුනොබැස්
86 සේය මේ කිමෙක්දැ" යි කීයේය. ඒතෙමේ "දේවයන්
වහන්ස අපට උත්කෘෂ්ට ජයසි, මේ ඇත්තෙමේ ජයභූමිය
බලමින් පසුබසී, ජයස්ථානයෙහි සිටිනේය" යි කීයේය.
87 ඉක්බිති ඇතෙතෙමේ පසුබැස පුරදෙවොලට පසෙකින්
මහාවිහාර සීමාතුළ සුප්‍රතිෂ්ඨාවෙන් සිටගත. ඇත්රජු එහි
88 සිටිකල හල්ලුකතෙමේ එහි රජු ඉදිරියට අවුදින් රජහට

Digitized by Google

පිරිහෙලා කථාකෙළේය. රජතෙමේ කඩුවෙන් මුවවසා
89 ගෙණ ඔහුට ආක්‍රොශ කෙළේය "රජහු මුඛයෙහි විදිනෙ
මැ"යි හේතෙමේ ඊය විදපිය. ඒ ඊගස කඩුතලයෙහි වැද
90 බිම හිනි. "මුඛයෙහි විදිනලදැ"යි යන සංඥවෙන් හල්ලූක
91 තෙමේ මහත් ජයනාද කෙළේය. රජහට පසු අස්නෙහි
උන්නාවූ මහත් බලඇති ඵුස්සදෙවතෙමේ රජහු කණ මිණි
කොඩොල ගටමින් හල්ලූකයා මුඛයෙහි හීයක් විදපිය.
92 රජ්ජුදෙසට පාගෙලා වැටෙන ඔහුගේ දනට කෘතහස්තාවූයේ
අනික් හීගෙසක් විද රජ්ජුදෙසට ඉසලා උහු හෙලීය. හල්
93 ලූකයා වැටුනුකල ඒ දූඛාගනයෙහි මහත් ජයනාද පැවැත්
තේය.
94 ඵුස්සදේවතෙමේ එහිදී තමා දෙස්දක්වන්ට සැකීය කන්
වැල කඩා ලේපතක් තෙමේම රජහට දක්විය. රජතෙමේ
95 ඒ දුක (මේ) කිමෙක්දැයි විචාළේය. ඒතෙමේ "මාවිසින්
රාජදඬනය කරණලදැ"යි රජහට කීය. "තා දෙස් කවරේ
96 දැ"යි කියනලදුයේ කුඩල සට්ටනය කීයේය. "මලනු
වෙනි නිදෙස දෙසැයි යන සංඥවෙන් මේ කුමක් කෙළේ
97 ද" මෙසේ කියා මහරජතෙමේ කෙළෙ‍්‍රකිගුණ දන්නේ
"හීයට සුදුසුවූ මහත් සත්කාරය තට වන්නේය"යි මෙසේත්
කීයේය.
98 ඉක්බිති සියලු දෙමළුන් මරවා ලබනලද ජයඇති රජ
තෙමේ ප්‍රාසාදතලයට නැගී එහි සිංහාසනයෙහි හුන්නේ
99 නළු ඇමැතියන් මැද ඵුස්සදේවයා විසින් විදිනලද ඒ හීය
100 ගෙන්වා තලය සෘජුකොට පගිලියෙන් තබ්බවා මතුමත්
තෙහි කහවණු වගුරුවා ඒ ඊය වස්වා එකෙණෙහි ඵුස්ස
දේවයාහට දුන්නේය.
101 ඉක්බිති නරෙන්ද්‍රතෙමේ අලඞ්කාර කරණලද සුවඳ
තෙල් පහනින් අළුකලාවූ නොයෙක් සුවඳින් සමාකීර්ණ
102 නාටකජනයාගේ සමායෝගයෙන් දිව්‍යපසරාවන් විසින්
103 සෙසින් ශොබියාවූ රජගේ මතුමහල් තලයෙහි මහඟු ඇති
රිලි අතුලාවූ මොලොක් මනා සයනයෙහි හොත්තේ
104 මහත්වූ ශ්‍රිවිභූතිය බලාත් කරණලද අසඞ්ඛාගිණ සේනා
ඝාතය සිහිකරන්නේ සැපනොලත්තේය (සුවසේ නිදන්ට
105 නොහැකිවී). පුවඟු දිවයින් වැසි රහත්හු ඔහුගේ ඒ කල්ප
නාදැන ඒ ඉසුරුහු ආශ්වාස කරවන්ට රහතුන් අටදෙනෙක්
එවූහ. ඒ රහත්හු මැදියම අවුදින් රජගෙදෙර බැස්සාහ.
106 දන්වනලද අහස් ගමන් ඇතෙතා මතුමහලට නැං
ගෝය. මහරජතෙමේ ඒ රහතුන් වැද අස්නෙහි වඩා

107 හිඳුවා නානා සත්කාරකොට අකරුණු විචාළේය. "මනුෂ්‍ය
ශ්‍රෙෂ්ඨයාණෙනි පූවගු දිවසින සඞ්ඝයා විසින් මෙහෙයන ල
ඳුවූඅපි තොප අස්වසාලත්ට ආවහයි" යි කිහ. රජතෙමේ
108 නැවත උත්වඟත්සේලාට "ස්වාමීනි යම්හෙයකින් මාවිසින්
අසංඛ්‍යාහිණී මහා සේනාඝාතය කරවනලද්දේනම් එසේවූ
109 මට කෙසේ ආශ්වාසයෙක් වන්නේද" යි කීයේය. "ඒ කම්ම
යෙන් තොපට ස්වර්ග මාර්ගාන්තරායෙකුත් නැතෙත්ය
ජනශ්‍රෙෂ්ඨය මරණලද මිනිස්සුද එකෙක් හා අඩක්වන්
110 නේය. තිසරණ් පිහිටි එකෙක තිසරණ පන්සිල් පිහිටි
අනිකෙක සෙසු මරණලදදහු මිථ්‍යාදෘෂ්ටි දුස්සීලවූ සිවුපාවුන්
111 සමයෝය. තවද තෙපි බුද්ධශාසනයත් නොයෙක් පරිද්
දෙන් බබුලුවනෙනාහිය එහෙයින් නරෙශ්වරය චිත්තඛෙදය
112 දුරලව" යි කීවෝය. උත්වඟත්සේලා විසින් මෙසේ වද
රණලද මහරජතෙමේ ආශ්වාසලත්තේ වැද උත්වඟත්
113 සේලා යවා සැතපුනේ නැවත මෙසේ සිතීය. "සඞ්ඝයා
ගෙන් තොරව කිසිකලෙකත් ආහාර නොවලඳවියයි ලද
114 රුවූ අප මවුපිය දෙදෙනා ආහාරයෙහි දිවුරවූහ. භික්ෂු
සඞ්ඝයාහට නොදී අප විසින් අනුභවකරණලද කිසිවක්
115 ඇත්තේද්ද" යි (පරීක්ෂා කෙරෙමින්) මෙතෙහි නොකොට
පෙරබත්හිදී සඞ්ඝයාට නොතබා අනුභවකරණලද එකම
මිරිස්වැටියක් දුටුයේය. "ඒපිණිස මාවිසින් දඬුවම් කටයුතු
හෝ ඉවසිය යුතු" යයි සිතුයේය.
116 මේ මනුෂ්‍යලෝකයෙහි සත්පුරුෂතෙමේ නොයෙක් කෙ
ළගණන් මරණලද ඒ මේ මනුෂ්‍ය සමූහයන් සිතා මෙය
කාමයන් හේතුකොටයයිද ඒ ආදීනවයද මෙනෙහි කරන්
නේය; තවද සත්පුරුෂතෙමේ සියලලවූන්ගේ අනිත්‍යතා
වය යෙහෙකින් නිවන් නතුකොට සිතනෙන්; එසේම නො
පමාව දුඃඛ විමොක්ෂයටද නොහොත් මනාගතියටද පැමි
ණෙනෙන්සි.

මෙතෙකින් සුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වස දුඨගාමිනී විජයනම් පස්විසිවන අදියර නිමි.

---

26 වෙනි පරිච්ඡෙදය.

1 මහා යසස්ඇතතාවූ ඒ (දුටුගැමුනු මහරජ) තෙම ලඩකා
රාජ්‍යය එකසත්කොට යොධයන්ට තනතුරු සංවිධාන
2 කෙළේය. ථෙරපුත්තාභය නම් යොධතෙම දෙනලද ඒ

තනතුර දෙනාසිවපුයේය, "කුමක් පිණිසද" යි විචාරණලද්
3 දද් "යුඬයෙක් ඇතැ"යි කීයේය. "යුඬයෙන් එකරාජ්‍යය
කළකල්හි කිනම් යුදයෙක්දැ"යි කියාත් පිළිවිසියේය. "කෙ
4 ළෙස් සොරුන්හා අතිශයෙන් දුර්ජයවූ යුඬයක් කරනෙහි
මැ"යි කීයේය. රජතෙම උගු නැවත වැළැක්විය, හෙතෙ
ම නැවත නැවත යාච්ඤාකොට රජහු අනුමතයෙන් පැවිදි
5 විය. පැවිදිවත් (විදර්ශනායොග) කාලයෙහි රහත්බැව් පත්
වූයේ, රහතුන් පන්සියයක් පිරිවරද වූයේය.
6 සේසත් ඔසවන මඟුලින් ඇත් සත්දවස ගියකල්හි හයානි
ස්‍රානන කළාවූ අභය නම් ඒ රජතෙම කරණලද රාජාභි
7 ෂෙක ඇත්තේම ක්‍රීඩා කරණුපිණිසද, අභිෂෙක කරණ
ලද (ක්ෂත්‍රිය) යන්ගේ චාරිත්‍රය පාලනයකරණු පිණිසද
මහාක්‍රීඩා විධියෙන් මොනවට සරසනලද්දාවූ තිසාවැවට
8 සම්ප්‍රාප්තවූයේය. රජහුගේ සියලු පරිභොග භාණ්ඩජනයද
(ගෙණෙනලද) සියගණන් පඬුරුද මිරිසවැටි වෙහෙර
9 (පිහිටන) තන්හි තැබූහ. එහිම ධූපය (පිහිටන) තන්හි
කුන්තායුධය උසුලනනාවූ රාජපුරුෂයෝ ධාතුසහිතවූ කු
10 න්තායුධය සෘජුකොට තැබූහ. මහරජතෙම අන්තඃපුර වා
සීන් සහිතවූයේ දිවාභාගයෙහි ජලයෙහි ක්‍රීඩාකොට සවස්
වේලෙහි "භවත්නි යනුකැමැත්තම්හ කුන්තායුධය වඩව
11 යැ"යි කීයේය. රාජපුරුෂයෝ ඒ කුන්තායුධය සොලවන්නු
12 නොහැකිවූහ, රැස්වූ රාජසේනාවෝ සුවඳමලින් පිදූහ. රජ
තෙම ඒ මහත් ආශ්චර්‍ය්‍යය දැක සතුටු සිත්ඇත්තේ, එහි
13 ආරක්ෂා සංවිධානකොට පුරයට දැවිත්ව නැවත එහි කුන්තා
යුධය පරික්ෂිප්තකරවා චෛත්‍යයක් කරවූයේය, ඒ වෙහෙර
14 තුන්හවුරුද්දකින් නිමවිය, ඒ නරේශ්වරතෙම විහාරපූජ
15 කාරණයෙන් සඞ්ඝයා රැස්කරවූයේය. එදවස රැස්වූ
16 භික්ෂූන් ලක්ෂයක්වූහ, භික්ෂුණීහුද අනූදහසක්වූහ. මිහි
පතිතෙම ඒ සමාගමයෙහිදී සඞ්ඝයාට මෙය සැලකෙළේය.
"වහන්ස සඞ්ඝයා පිහිනොකොට මිරිස්වැටියක් අනුභව කෙ
ළෙම්, ඊට දඬුවම් වේවයි චෛත්‍යය සහිතවූ අතිශයින්
18 සිත්කළුවූ මිරිසවැටිවෙහෙර කරවිමි එය සඞ්ඝතෙමේ පිළි
ගන්නා සේක්වා"යි කියා සතුටු සිත්ඇත්තාවූ හෙතෙම
දක්ෂිණොදකය වගුරුවා විහාරය භික්ෂුසඞ්ඝයාට දුන්නේය.
19 එම වෙහෙරද ඒ වෙහෙර හාත්පසද යහපත්වූ මහාමණ්ඩප
කරවා එහි සඞ්ඝයාට මහදන් පැවැත්වූයේය, අඩාවැව ජල
යෙහිදු වැම් සිටුවා ඒ මණ්ඩපය කරණලද්දේවිය, අව
20 ශෙෂවූ අවකාශයෙහි (කළ මණ්ඩපයන්) කියනුම කවරේද?

Digitized by Google

21 නරේශ්වරතෙම සත්දිනක් මුළුල්ලෙහි ආහාර පානාදිය
(සඞ්ඝයාට) දී ශ්‍රමණ සාරූප්‍යවූ මාහැඟි සියලු පිරිකර දුන්
22 නේය. ඒ ප්‍රථම පරිෂ්කාරයතෙම ලක්‍ෂයක් අගනේවිය,
අන්ත්‍යමවූ පරිෂ්කාරයතෙම දහසක් අගනේවිය, සඞ්ඝ
තෙමේම ඒ සියල්ල ලත්සේක.

23 යුද්ධයෙහි හා දානයෙහි ශූරපණ්ඩිතවූ රත්නත්‍රය කෙරෙහි
ප්‍රසන්න නිර්මල සිත්ඇත්තාවූ ශාසනය බබලවනු කැමැතිවූ
24 කෘතෝපකාර දන්නාවූ ඒ නරනිඳුහු විසින් රත්නත්‍රය පුදනු
පිණිස ථූපය කරවීම පටන් විහාරපූජාව අවසන්කොට
25 ඇති මෙහි පරිත්‍යාග කරණලද ධනයෝ අනර්ඝ වස්තූන්
හැර සෙසෙයෝ පමණක් එකූන් විසිකෝටියක් වෙති.

26 (අග්නිආදී) පංචවිධ දෝෂයෙන් දූෂිතවූද භෝගයෝ ප්‍රඥා
විශේෂයෙන් යුක්තවූ ජනයන් විසින් පැමිණියාහු (බහුජන
ප්‍රියතාද්‍යවූ) පංචගුණයන් හා යෙදීමෙන් ගන්නාලද සාර
ඇතිවෙත්යයි සිතා ඒ භෝගයාගේ සාරග්‍රහණයෙහි නුව
ණැත්තෝ උත්සාහ කරණෝය.

මෙතෙකින් සුදිජනයා පහන්සංවේග පිණිස කළ මහ
වංශ මරිචවට්ටි විහාරමහ නම්වූ සව්සිවන අදියර නිමි.

---

27 වෙනි පරිච්ඡේදය.

1 ඉක්බිත්තෙන් ප්‍රසිද්ධවූ මනාකොට අසනලද්දාවූ ඇසීම
විශේෂයෙන් සිතූයේය, "ලඞ්කාද්වීපය පැහැදවූ සැමිකල්හි
2 පවිත්‍රවූ මහපිණැති ස්ථවිරයන්වහන්සේ ප්‍රඥාවෙන් කරණ
3 ලද නිශ්චය ඇතිසේක් මාගේ මුත්තනුවූ රජහට මෙසේ
වදාළේල—තොපගේ මුනුබුරුවූ දුටුගැමුණු යන නමින්
යුක්තවූ මහපිණැති මිහිපතියෙක් තෙම අනාගතයෙහි
4 මනොහරවූ එකසිය විසිරියන් උස්වූ සොණ්ණමාලි නම්
මහාථූපය කරවන්නේය, නැවතද ලෝහප්‍රාසාදයක් වන
පොහොයගෙයක්ද නවමහල්කොට කරවන්නේය" යන
5 මෙයි. පෘථිවීශ්වරතෙම මෙසේ සිතා මෙසේ ලියාතබන
ලද්දක් බලවන්නේ රජගෙයි කරඬුවෙක්හිම තිබුනාවූ රන්
6 පට ලැබ එහි ලේඛනය කියවූයේය. "වර්‍ෂ එක්සිය සතළිසක්
ගෙවා අනාගතයෙහි කාවන්තිස් මහරජහු පුතුවූ දුටුගැ

Digitized by Google

7 මුහුනාම් තිරිදෙක් තෙම මේ මේ දෙයද මෙසේද කරවන්
නේය"යි කියවනලද්ද අසා සතුටුවූ මහීපතිතෙම ප්‍රීතිවාක්‍ය
8 පවත්වා අත්පොළසන් දුන්නේය. ඉක්බිතෙන් උදෑසන
යහපත්වූ මහමෙව්නා උයනට පැමිණ භික්ෂුසඞ්ඝයා රැස්
9 කරවා "තුඹවහන්සේලාට මම දිව්‍යමන්දිරයක් සමානවූ
10 ප්‍රාසාදයක් කරවනෙනම් දිව්‍ය විමානයකට යවා එහි ආකාර
සිතියමක් මට ගෙන්වා දෙනසේක්ව" යි කීයේය. භික්ෂු
11 සඞ්ඝතෙම රහත් අටනමක් එහි යැවූසේක. කාශ්‍යප සම්
බුදුන් වහන්සේගේ කාලයෙහි අශොක නම් බ්‍රාහ්මණයෙක්
තෙම ලහබත් අටක් සඞ්ඝයාට පිරිනමා ගෙතෙම (ඒ බත්)
12 "නිබද දෙව" යි භරණී නම් දාසියට කීයේය, ඕතොමෝ
ඒ බත් සකස්කොට ජීවිතාන්තය දක්වා දී එයින් චුතවූවා.
13 සිත්කළු යහපත්වූ ආකාශස්ථ විමානයෙක්හි උපන්නීය.
හැමකල්හි දිවසරන් දහසක් විසින් පිරිවරණලද්දී විය.
14 ඇගේ රත්න ප්‍රාසාදය තෙම දොළොස් යොදුනක් උස්
15 විය අවට යොදුන් අටසාළිසෙක, කුළුගෙවල් දහසකින්
සැරසුනේ නවමහල් විය, දහසක් ගබඩාවෙන් සමන්විතවූ
16 යේ සතරදිගට මුඛඇතිව බබලන්නේය, දහසක් මනාව
පැවති සිවුමැදුරු කවුළු නැමැති නෙත්ඇත්තේය, කිකි
ණිදැල් සහිතවූ පිළිකඩින්ද සැදුම් ලද්දේය.
17 ඒ පහය මැද අම්බඞ්ක නම් ප්‍රාසාදයක් පිහිටියේය, නග
18 නලද ධවජයෙන් ආකූලවූයේ හාත්පසින් පෙණෙන්නේය,
ඒ ස්ථවිරයෝතුමූ තව්තිසා දෙව්ලොව වඩනෝ ඒ පහය දැක
19 දැහිඟුලෙන් වස්ත්‍රයෙක්හි ඒ විමානාකාරය සිතියම් කො
ටගෙණ එතැනින් නැවති ආගමනයකොට වස්ත්‍රය සඞ්ඝ
යාට දක්වූහ. සඞ්ඝතෙම ඒ වස්ත්‍රය රැගෙන රජුකරා යැවූ
20 සේක ඒ දැක සතුටුසිත් ඇත්තාවූ රජතෙම උතුම්වූ ආරා
මයට අවුත් ඒ සිතියම් ආකාරයට උතුම්වූ ලෝහ ප්‍රාසාදය
21 කරවූයේය. භොගඇත්තාවූ නරෙන්ද්‍රතෙම ප්‍රාසාද කර්මය
ආරම්භකරණ කාලයෙහිම සතරදොර අටලක්ෂයක් කහවණු
22 තැබ්බවූයේය, (එහි) දොරක්පාසා දහස් ගණින් පිළිපොදිද
සිනි තලතෙල් සකුරු මීපිරූ නොයෙක් සැළිද තැබ්බවූ
23 යේය. මෙහි නොමිලයේ කරණ කර්මයක් නොකටයුතු
යයි කියා කලකම් අගය කරවා ඒ කම්කරුවන්ට වැටුප්දීලූ
24 දෙවූයේය. එක එක පසින් රියන් දහස දහස වූයේය, සතර
25 දොර ඇත්තාවූ ඒ ප්‍රාසාදයතෙම උසින් එපමණවූයේය, ඒ
26 ශ්‍රෙෂ්ඨවූ ප්‍රාසාදයෙහි මහල් නවයක්වූහ, එක එක මහ
ලෙහි කුළුගෙවල් සියයක් සියයක් වූහ, සියළු කුළුගෙවල්

Digitized by Google

27 රිදියෙන් නිමවනලද්දැයි, ඒ කූටාගාරයන්ගේ සම්බන්ධවූ පබළු
පළිකඩ නානාවිධ රත්නයෙන් සැදුම්ලද්දැයි, ඒ පළිකඩ
සම්බන්ධවූ පද්මද නානාවිධ රත්නයෙන් විචිත්‍රවූහ, ඒ වේදි
28 කාවෝ රජතමය කිංකිණි පෙළින් පරික්ෂිප්තවූහ. ඒ පහ
යෙහි මනාකොට සදනලද ගඩඩා දහසක් නානාවිධ රත්න
29 යන් බඳිනලද්දැයි, සිවුමැදුරුනෙත්ඇතිවූහ, ඒ නරේ
න්ද්‍රතෙම වෛශ්‍රවණ දෙවරජයාගේ නාරිවාහන නම් යානා
30 වගේ පරිද්දෙ අසා එබඳුවූ රත්නමණ්ඩපයක් ප්‍රාසාද මධ්‍යයෙහි
කරවූයේය. මේ මණ්ඩපයතෙම සිංහ ව්‍යාඝ්‍රාදි රූපයෙන්ද
31 දෙවතා රූපයෙන්ද ඇත්තාවූ වැඩින් අලංකෘත වූයේය.
මෙහි මණ්ඩපාන්තයෙහි හාත්පස මුතුදැලින් වටකරණ
32 ලද්දාවූ පෙර කියනලද පරිද්දවූ වේදිකාවක්ද විය. සප්තවිධ
රත්නයෙන් විචිත්‍රවූ මණ්ඩපයාගේ මධ්‍යයෙහි රම්‍යවූ පළිඟු
33 අතුල සිත්කළු උතුම් පලඟක් (පිහිටුවන ලද්දේය) මේ පල
ගෙහි දන්තකර්මයෙන් නිම්වනලද අපාශ්‍රය සඞ්ඛ්‍යාත පිට
අටුවක්ද රණින් නිවම්නලද හිරුම්ඩලක් හා රිදියෙන්
34 නිම්වනලද සඳම්ඩලක්ද මුතුපෙළින් නිම්වනලද තාරකා
රූපද පිහිටුවනලදහ). ඒ ඒ තන්හි සුදුසු පරිදෙන් නානා
රත්නමයවූ පද්මද, එහිම රන්ලිය අතර ජාතකද (සවහත්
35 කරණලද) වූහ. මාහැඟි පසතුරණුඇති අතිසසිත් සිත්
කළුවූ පලඟෙහි තබනලද ශොභාමත්වූ දන්තමය විජිනි
36 පත සිත්කළුවිය. එහි පළිඟු මතුයෙහි පබළු පාදුකාවක්
පිහිටිවියේය; පලඟ මතුයෙහි රිදී මිටින් යුක්තවූ ශ්වේත
37 හෙඩිණේය. මෙම ඡත්‍රයාගේ අන්තයෙහි සප්තවිධ රත්න
යෙන් කරණලද අෂ්ටමංගලිකාකාර රූපයෝද මිණිමුතු
38 අතරතුර ඇතිවූ චතුෂ්පාද රූප පන්තීහුද වූහ. ඡත්‍රයාගේ
අන්තයෙහි එල්බුනාවූ රිදී මිණිගෙඩි පන්තීහුද වූහ. ප්‍රා
සාදය ඡත්‍රය පර්‍ය්‍යඞ්කය මණ්ඩපය යනමොහු අනර්ඝවූහ.
39 සුදුසු පරිදෙන් මාහැඟිවූ ඇඳපුටු පැණවූයේය, එසේම
40 බුම්තුරුණුද මාහැඟි පලසක්ද විය. ඒ ප්‍රාසාදයෙහි රණින්
නිමවනලද බොවන ජලය තබන සැලද කිණිසැසදවූයේය,
ප්‍රාසාදයෙහි පරිභොගවූ සෙසු බඩු කියනුම කවරේද?
41 සතර දොරකොටු ඇත්තාවූ මනොඥවූ ප්‍රාකාරයෙන් පරි
ක්ෂිප්තවූ ඒ ප්‍රාසාදයතෙම තව්තිසා දෙව්ලොව (සුධර්මා
42 නම්) සභාවසේ සරසනලද්දේවිය. මේ ප්‍රාසාදයතෙම තඹ
ලෝ උළින් වසනලද්දේය. එහෙයින් ඒ ප්‍රාසාදයට ලොහ
43 ප්‍රාසාදය යන නාමය වූයේය. ඒ නරේන්ද්‍රතෙම ලෝවාමා
පහය නිමවූ කල්හි සඞ්ඝයා රැස්කරවූයේය, මිරිසවැටි

44 විහාර පූජායෙහි මෙන් සඞ්ඝයා රැස්වූයේය. පළමුවෙනි
මහලෙහි පෘථග්ජන භික්ෂූහුම සිටියහ, දෙවෙනි මහලෙහි
ත්‍රිපිටකධර භික්ෂූහු සිටියහ, සෝවාන් ආදිවූ ආර්‍ය්‍යයෝ වනා
45 හි තුන්වෙනි මහල ආදිවූ එක එක මහලෙහි වැඩසිටි
යෝය, උඩ සිවුමහල්හි රහතුන් වහන්සේලාම වැඩ
සිටියහ.

46 නරේන්ද්‍රතෙම දක්ෂිණෝදකය පෙරටුකොට ප්‍රාසාදය සඞ්ඝ
යාටදී සත්දවසක් මුළුලෙහි පූර්වවූ මිරිසවැටි වෙහෙර
47 මහදන මෙන් මහදන් දින. මහා පරිත්‍යාග ඇත්තාවූ නරේ
න්ද්‍රයන් විසින් ප්‍රාසාද පූජායෙහි පරිත්‍යාග කරණලද වස්තු
අනර්ඝ වස්තූන් හැර තිස්කෙළක් (කහවණු) අගනාහු වූහ.
48 නිස්සාරවූ වස්තුවෙන්ද රැස්කිරීමෙහි විශේෂවූ සාරය
දානවශයෙන් යගපත් ප්‍රඥාඇත්තාවූ යම් ජනකෙනෙක්
ප්‍රමාණ කෙරෙද්ද, ඒ සත්ත්වයන්ගේ වැඩ පරමකොට ඇත්තා
වූ ඒ ජනයෝතුමූ පහවූ චිත්තාලය ඇතිව විපුලවූ දානය
මෙසේ දෙන්නාහුය.

මෙතෙකින් සුද්ධජනයා පහන්සංවේග පිණිස කළ මහ
වංශ ලොහපාසාද මහනම්වූ සත්විසිවන අදියර නිමි.

28 වෙනි පරිච්ඡේදය.

1 ඉක්බිත්තෙන් ඒ මහීපතිතෙම ලක්ෂයක් වියදම්කොට
2 උදාරවූ උතුම් මහාබෝධි පූජාවක් කරවූයේය. ඉක්බිති නුව
රට වදනේ සැතන්හි පිහිටුවනලද්දාවූ ගල්ටැඹ දැක (තමන්
3 කටයුතු පිණිස) පෙර (ලියාතබන ලද්දන් ලත්) ඇසීම
සිහිකොට, මහාසෑය කරවන්නෙමැයි (සිතා) සතුටුවූයේ
මහාප්‍රාසාද තලයට නැගී බොජුන් අනුභවකොට රාත්‍රියෙහි
4 ශයන ප්‍රාප්තවූයේ මෙසේ සිතුයේය. "දෙමළුන් මඩනාවූ
මාවිසින් මේ ජනයා පෙළනලද්දේය, (එහෙයින් ජනයා
ගෙන්) අය උපයනු නොහැක්කේය, ඒ අය ගැණීම හැර
5 සෑය කරවන්නාවූ මම කෙසේ දැහැමින් ගඩොල් උපයම්

Digitized by Google

දූ"යි මෙපරිද්දෙන් සිතන්නාහුගේ සිත ජේසත වසන දේව
6 තාතොමෝ දැනගත, එයින් දෙවියන් අතර කොලාහල
විය, ශක්‍රදේවෙන්ද්‍රතෙම ඒ දැන විශ්වකර්ම දිව්‍යපුත්‍රයාට
7 අණකෙළේය "ගොස් අනුරාධපුරයෙන් යොදුනක් තන්හි
ගම්භීර නම් නදිය සමීපයෙහිවූ ඒ ස්ථානයෙහි ගඩොල්
මවව"යි සක්දෙව් රජහු විසින් අණවනලද්දාවූ විශ්වකර්ම
8 තෙම මෙහි අවුත් එතන්හි ගඩොල් මැවූයේය. අලුයම්
කාලයෙහි එහි වැද්දෙක් සුනඛයන් හා සමග වනයට ගි
9 යේය. භූම්‍යාට්ඨ දෙවතාවක්තොමෝ ගොධා වෙශයෙන් වැද්
10 දට තමා දැක්විය, ඒ ගොයා ලුහුබැඳ යනුයාවූ වැද්දතෙම
ගොස් ගඩොල් දැක, ගොයා අතුරුදන්වූ කල්හි එහි සිට
11 මෙසේ සිතුයේය. "අපගේ මහීපතිතෙම මහසෑයක් කර
වනු කැමැත්තේල, උන්වහන්සේට මේ පඬුරෙකැ"යි සිතා
ගොස් සැලකෙළේය.

12 ජනයා වැඩෙහි ඇලුනාවූ රජතෙම ඔහුගේ ඒ ප්‍රිය වච
නය අසා සතුටු සිත් ඇතෙත් ඔහුට මහත්වූ සත්කාරකර
වූයේය.

13 පුරයෙන් ඊසානදෙස තුන්යොදුනකින් මතෙහි ආචාර
විට් නම් ගම සොළොස්කිරියක් පමණවූ භූමිප්‍රදේශයෙහි
14 ප්‍රමාණයෙන් නානාප්‍රකාරවූ ස්වර්ණ බීජයෝ උපන්හ,
උඩත් පිරිසෙයින් වියත් පමණ යටත් පිරිසෙයින් අඟුල්
15 පමණද වූහ. ස්වර්ණයෙන් පිරුණාවූ ඒ භූමිය ඒ ගම්
වැස්සෝ දැක, තලියක් පිරූ රන් ගෙණගොස් රජහට සැල
16 කළහ.—පුරයෙන් ඉදුරුදෙස සත්යොදනකින් මතෙත
17 හි ගඟ එතර තඹවිටි නම් ගම තඹලෝ උපන, එගම් වැස්
සෝ තලියකින් තඹලොහො බිජුවට ගෙණ රජ්ජුරුවන්
18 කරා එලඹ ඒ කාරණයද සැලකළහ.—පුරයෙන් ගිනි
කොන් පෙදෙස සතරයොදුනක් දුර සමින්වැව් නම් ගම
19 බොහෝ මැණික් උපන්හ, එගම්වැස්සෝ උපුල් කුරුවින්ද
20 ගල්හා මිශ්‍රවූම (ඒ මැණික්) තලියකින් ගෙණවුත් රජහට
සැලකළහ.—නුවරින් දකුණුපස අටයොදුන් මතෙහි
21 අඹස්කොල නම් දනාවුවෙහි ලෙනක රිදී උපන, නුවරවැසි
වෙළෙඳෙක්තෙම බොහෝ ගැල්ගෙණ මලයරටින් ඉඟුරු
22 ආදිය ගෙණෙන පිණිස ඒරටබලා යනුයේ ලෙණට නුදුරු
23 තන්හි ගැල් තබවා, කැවිලි සොයන්නේ ඒ පර්වතයට
නැංගේය. සැලියක් පමණ පලයක් ඇත්තාවූ පලබරින්
24 නැමුනාවූ කොස් පැලයද ගලක්පිට පිහිටි ඒ පලයද දැක
එය පිහියෙන් තුවටුව කපා "අගස් දනක් දෙමැ"යි සිතා

Digitized by Google

25 ශ්‍රද්ධායෙන් සඞ්ඝයාට කාලඝොෂා කෙළේය, රහත් සතර
නමක් වැඩියහ, සතුටුවූයේ උත්වහන්සේලා වැඳ, ආදර සහි
තව වැඩහිඳුවා, පිහියෙන් එය තුවට්ටුව හාත්පස සිව්ය කපා
26 වහලල මුඳු ආවාටය පුරා සිටි ශුස පතින් ගෙණ ද්‍රසින් පුර
වනලද ඒ පාත්‍ර සතර උත්වහන්සේලාට ප්‍රදානය කෙළේය.
27 උත්වහන්සේලා ඒ පිළිගෙණ වැඩියහ, ඒ වෙළඳතෙම
නැවතත් කාලඝොෂා කෙළේය. අන්‍යවූ අභීත් ස්ථවිරයෝ
28 සතර නමක් එහි වැඩියහ. හෙතෙම උත්වහන්සේලාගේද
පාත්‍රයන් ගෙණ වරකාමදුලෙන් පුරවා පිළිගැන්වූයේය,
උත්වහන්සේලා අතුරෙන් තුන් නමක් බැහැරවැඩියාහුය,
29 එක්වහන්සේ නමක් නොවැඩියසේක. ඒ ස්ථවිරයන්වහන්
සේ ඕහට රිදී දක්වනු පිණිස එතැනින් බැස, ලෙණසමීප
30 යෙහි වැඩහිඳ, ඒ මිදුලු වැළඳූසේක. වෙළඳ තෙමේද ඉති
රිවූ මදුලු කුසපොහොනතෙක් අනුභවකොට, ඉන් අවශෙ
ෂය පොදියකින් ගෙණ ස්ථවිරයන්වහන්සේගේ පා අනුව
31 ගියේය. ඒ ගොස් ස්ථවිරයානන් දැක වනාවත්ද කෙළේය,
ස්ථවිරතෙමේද ලෙණදෙරින් ඔහුට මාර්ගයක් මැවූසේක.
32 හෙතෙම ස්ථවිරයන් වැඳ ඒ මගින් යනෙන් ලෙණ දුටු
33 යේය, ඒ උතුම් වෙළඳතෙම ලෙණදොරසිට රිදීද දැක, පිහි
34 යෙන් ගසා රිදීයයි දැන එක් රිදීපිඩක් ගෙණ ගැල් සමීප
යට ගොස් ගැල් එහි තබවා ඒ රිදීපිඩ ගෙණ වහා අනුරා
35 පුරයට අවුත් නරේන්‍ද්‍රයන්ට රිදී දක්වා ඒ කාරණයද දැන්
වූයේය.

36 පුරයෙන් බටහිර පස පස්යොදුනකින් මතෙතාහි උරු
වෙල් පටුනෙහි මහ ඇඹුලුපල පමණවූ මුතුපල අතරතුර
37 පබලු සමග මුහුදින් ගොඩනැංගාහ. (ඒ මුහුදුබඩ වැසි)
කෙවුලෝ ඒ දැක පබලු සහ මුතු එකතුකොට ගෙණ තලිය
38 කින් ගෙණවුත් රජ්ජුරුවන්කරා එළඹ ඒ කරුණද සැල
කළහ.——නුවරින් උතුරුපස සත් යොදුනකින් මතෙතාහි
39 පෙළවැව් නම් ගම වැවපිච්චි කඳුරැලියෙහි වැලිපිට ඇඹ
40 රුම්ගල් පමණ දියමෙරලිමල්වත් පැහැඇති යහපත්
උතුම් මිණිරුවන් සතරක් උපන්හ. බලුවැද්දෙක්තෙම ඒ
41 දැක රජ්ජුරුවන් වෙත අවුත් "මාවිසින් මෙබඳු මිණිරුවන්
දක්නා ලදහ"යි සැලකළේය, මහපැණැති මහපිණැති ඒ
42 රජතෙම මහසැය පිණිස උපන් ගඩොල්ආදී මේ ද්‍රව්‍යයන්
එදවස්ම ඇසූයේය. සතුටු සිත්ඇතොත් සුදුසු පරිද්දෙන්
(ප්‍රවෘත්ති දැන්වූ) ඔවුන්ට සත්කාර කොට ඔවුන්ම රැක
වරණ කරුවන්කොට ඒ සියලු ද්‍රව්‍යයන් ගෙන්වායත්තේය.

43 කය උපන් නොසිවසියහැකිවූ ඛෙදයද නොසලකා
ප්‍රසන්න සිත්ඇත්තාහු විසින් මෙසේ රැස්කරණලඳවූ
පුණ්‍යය සැපයට අකරවූ උපකරණ සියයත් සිදුකෙරේ
මෙසේ ප්‍රසන්න සිත්ඇත්තෙම පින්කරනෙන්ය.

මෙතෙකින් සුදිජනයා ප්‍රසාද සංවෙග පිණිස කළ මහ වස මහාථූපසාධනලාභ නම්වූ අටවිසිවන අදියර නිමි.

---

29 වෙනි පරිච්ඡේදය.

1 මෙසේ උපකරණ සම්පූර්ණවූ කල්හි වෙසග පුර පස
ළොස්වක විසානකත පැමිනි කල්හි මහසෑය පිණිස ආරම්භ
2 කෙළේය. මිහිපල්තෙමේ එහි ගල්ටැඹ පහකරවා අනෙක
ප්‍රකාරයෙන් ස්ථිරකරණු පිණිස සෑතැන සත්රියනක් කැණ
3 වූයේය. අණිනාණි දූත්මෙහි දක්‍ෂවූ නරෙන්ද්‍රතෙම එහි
සුණු ගල් යොධයන්ලවා ගෙන්වා, කුළුගස්වා සුණුකරණ
4 ලද ගල් භූමිය ස්ථිරවන පිණිස සමින් වසනලද පතුල්
ඇත්තාවූ මහඇතුන් ලවා මැඩවී.
5 අහස්ගඟ හුනුතන්හි සතතයෙන් තෙත්වූ එහි සාත්පස
6 තිස්යොදුන් බිම මැටිසියුම්. ඒ මැටිතොමෝ සියුම් බැවින්
වෙඩරු මැටියයි කියනුලැබේ, එතැනින් රහත් සාමණේර
7 වරයෝතුමූ මැටි ගෙණාහ. එහි ගල් අතළෙහි මැටි ඇතිර
විය, නරෙන්ද්‍රතෙම මැටි මතුයෙහි ගඩොල් ඇතිරවූයේය.
8 ඒ මතුයෙහි සුඹවූ කරගල්ද ඒ මතුයෙහි කුරුවිඳ පාෂාණද
ඒ මතුයෙහි යදැල්ද ඉන් මතෙහි බොරළුද ඇතිරවූයේය.
9 පෘථිවීශ්වරතෙම හිමවතින් සාමණේරවරයන් විසින් ගෙණෙ
නලද පළිඟු ගල් ඒ මතෙහි ඇතිරවූයේය. පළිඟු අතළ
10 මතෙහි ගල් ඇතිරවීය, සැමතන්හි මැටියෙන් සවහුත්
11 තෙහි නවනීත නම් මැටිමවීය. නරෙන්ද්‍රතෙම රසජලයෙන්
මිශ්‍රකළ ගිවුලු මැලියමින් අවගුල් බොල් ලොහොපටක්
12 ගල් ඇතිරිය මතෙහිද, ඊමතෙහි තලතෙලින් තෙමන
ලද රත්සිරියෙලින් සතගුල් බොල් රිදීපටක්ද ඇතිරවූ
13 යේය. මිහිපතිතෙම මහසෑය පිහිටන තන්හි විශෙෂ
යෙන් ප්‍රසන්නවූ සිතින් මෙසේ පිරියම්කරවා, ඇසළමස පුර
14 තුදුස්වක් දවස්හි භික්‍ෂුසඞ්ඝයා රැස්කරවා "ස්වාමිනි මහ

15 සෑය පිණිස මගුල් ගඩොළු සෙට පිහිටුවන්නෙමි ඉමහී
අපගේ (සවාමිවූ) සියලුම සඞ්ඝතෙම රැස්වේවා බුධපූජා
16 යෙදීමෙන් මහජනයාගේ වැඩ කැමැත්තාවූ මහජනතෙ
මේද පෙහෙවස් සිල්ඇතිව සුවඳමල් ආදිය ගෙණ මහාසෑය
17 පිහිටුවනතැනට සෙට යේවා" යි මේ වචනය කීයේය.
චෛත්‍යස්ථානය සරසන පිණිස අමාත්‍යයන්ද යෙදූයේය.
18 නරනිඳුහු විසින් ඇණවූකල්හි සර්වඥයන්වහන්සේ කෙ
රෙහි ප්‍රිය ගෞරව ඇත්තාවූ ඔව්හු ඒ ස්ථානය අනේකප්‍රකාර
යෙන් සැරසූහ.
19 නරේන්ද්‍රතෙම මුළු නුවර හා මේ මහාවිහාරයට එනනාවූ
20 මාර්ගයද නොයෙක් ආකාරයෙන් සරසවා උදෑසනම නුවර
21 සතරදොර කරනෑවැමියන්ද නහනුද කපුවන්ද එසේම
බොහෝ වස්ත්‍රයන්ද තැබ්බවූයේය, මහජනයාගේ අභිවෘද්ධි
22 යෙහි ඇළුනාවූ පෘථිවීශ්වරතෙම මහජනයාගේ වැඩ පිණිස
සුවඳමල්ද මිහිරි ආහාරයන්ද රුචිවූ පරිද්දෙන් පිළියෙළ
කරණලද්දාවූ මේ ද්‍රව්‍යයන් තැබ්බවූයේය. පුරවැසියෝද
23 දනව්වැසියෝද චෛත්‍යස්ථානයට එළඹුනාහ. තනතුරු
ලෙස කරණලද නියොගවසයෙන් මොනවට සැරසුනාවූ
24 නොයෙක් ඇමැතියන් විසින් රැකවරණ කරණලද්දාවූ මිහි
පතිතෙම මොනවට සැරසුනාවූ දෙවකන්‍යාවන්හා සමා
නවූ නාටිකාවන් විසින් පිරිවරණලදුව සහපත්සේ සැරසී
25 පිළියෙළ කරණලද්දේ සතළිස් දහසක් මිනිසුන් විසින්
පිරිවරණලද්දේ නානාවිධ තූර්‍ය්‍යයන් ඝොෂණ ශබ්ද
යෙන් යුක්තවූයේ සක්දෙව් රජහු විලස් ඇත්තේ ස්ථානා
26 ස්ථාන දුන්මෙහි විචක්ෂණවූයේ මහජනයා සතුටු කෙරෙ
27 මින් මහාථූපය පිහිටන ස්ථානයට සවස්කාලයෙහි සම්ප්‍රාප්ත
වූයේය. ඒ මිහිපතිතෙම පොද්බඳනාලද අටතුරා දහසක්
28 වස්ත්‍රයන් මැද තබ්බවා ඉන් සතරපස නොයෙක් පිළි රැස්
කරවූයේය. මංගල්‍ය පිණිස මීගිතෙල් උක්සකුරු ආදිය
29 තැබ්බවූයේය. නොයෙක් දෙසයෙන්ද භික්ෂූහු මෙහි පැමි
ණියාහුය. මේ දිවයින වැසි සඞ්ඝයා මෙහි පැමිනීම කිය
30 නුම කවරේද, රජගහනුවර සමීපයෙහි (වැඩවිසූ) ඉඳගුත්ත
නම් ස්ථවිරයන්වහන්සේ අසූදහසක් භික්ෂූන් (පිරිවරකොට)
31 ගෙණ වැඩියේක. ධම්මසේන නම් මහාස්ථවිරයන්වහන්සේ
භික්ෂූන් දොළොස් දහසක් (පිරිවරකොට) ගෙණ ඉසිපත
32 නාරාමයෙන් චෛත්‍යස්ථානයට පැමිනියේක. පියදස්සී නම්
මහාස්ථවිරයන්වහන්සේ සැට දහසක් භික්ෂූන් (පිරිවරකො
33 ට) ජේතවන විහාරයෙන් මෙහි පැමිනියේක. බුධරක්ඛිත

Digitized by Google

නාම් ස්ථවිරයන්වහන්සේ අටළොස් දහසක් භික්ෂූන් (පිරිවර
කොට) ගෙණ විසාලාම්හනුවර මහවනයෙන් මෙහි පැමිනී
34 සේක. මහාධම්මරක්ඛිත නාම් ස්ථවිරයන්වහන්සේ තිස්දහ
සක් භික්ෂූන් (පිරිවරකොට) ගෙණ කොසඹෑ නුවරවූ ඝොෂි
35 තාරාමයෙන් මෙහි පැමිනීසේක. මහාධම්මරක්ඛිත නාම්
ස්ථවිරයන්වහන්සේ සතළිස් දහසක් භික්ෂූන් රැගෙණ
උදේනී නුවර දක්ෂිණගිරි විහාරයෙන් මෙහි පැමීනිසේක.
36 මිත්තිණ්ණ නාම් ස්ථවිරයන්වහන්සේ භික්ෂූන් එක්ලක්ෂ සැට
දහසක් රැගෙණ පැලලුප්නුවර අශොකාරාමයෙන් (මෙහි
පැමිනිසේක.)
37 උත්තිණ්ණ නාම් තෙරුන්වහන්සේ දෙලක්ෂ සැටදහසක්
භික්ෂූන් රැගෙණ කාශ්මීර මණ්ඩලයෙන් (මෙහි පැමිනී
38 සේක) මහාප්‍රාඥවූ මහාදේව නාම් ස්ථවිරතෙම සාරලක්ෂ
සැටදහසක් භික්ෂූන් රැගෙණ පල්ලවභොග්‍ය නාම් ජනපද
39 යෙන් (මෙහි පැමීනිසේක). ඒ මහාධම්මරක්ඛිත නාම් ස්ථ
විරයන්වහන්සේ භික්ෂූන් තිස්දහසක් රැගෙණ යොනක
40 රට අලසන්ද නාම් නුවරින් මෙහි පැමිනිසේක. උත්තර
නාම් ස්ථවිරයන්වහන්සේ භික්ෂූන් සැටදහසක් රැගෙණ
විංධ්‍යවනයෙහිවූ වත්තනිය නාම් සෙනස්නෙන් මෙහි පැම
41 නිසේක. චිත්තගුත්ත නාම් මහාස්ථවිරයන්වහන්සේ තිස්
දහසක් භික්ෂූන් රැගෙණ බෝමැඩ වෙහෙරින් මෙහි පැමි
42 නිසේක. චන්‍ද්‍රගුත්ත නාම් මහාස්ථවිරයන්වහන්සේ අසූදහ
සක් භික්ෂූන් රැගෙණ වනවාස ප්‍රදෙශයෙන් මෙහි වැඩි
43 සේක. සූරියගුත්ත නාම් මහාස්ථවිරයන්වහන්සේ සයානූ
දහසක් භික්ෂූන් රැගෙණ කෛලාස විහාරයෙන් මෙහි
44 පැමිනිසේක. මෙහි පැමීනි ලක්දිව් වැසිවූ භික්ෂූන්ගේ
සංඛ්‍යා පරිච්ඡේදයක් සර්වප්‍රකාරයෙන් පූරාණචාර්‍ය්‍යයන්
45 විසින් නොකියන ලද්දේය. ඒ සමාගමෙහි රැස්වූ සියලු
භික්ෂූන් වහන්සේලා අතුරෙන් රහතුන්ම සයානූකෙළ
46 සැයි කියනලද්දාහුය. ඒ භික්ෂූහු සුදුසු පරිද්දෙන් මහා
චෛත්‍යස්ථානය පිරිවරා මධ්‍යයෙහි මහරජනන්ට අවකාස
47 තබා සිටගත්හ. නරේන්‍ද්‍රතෙම එහි පිවිස එසේ සිටියාවූ
භික්ෂු සංඝයා දැක ප්‍රසන්න චිත්තයෙන් ශුකාව වැද සතුටු
48 සිත්ඇතිවූයේ, සුවඳ මලින් පුදා තුන්වරක් ප්‍රදක්ෂිණකොට
මධ්‍යයෙහි මංගල්‍ය වස්තුසහිතවූ පූන්කලස පිහිටි ස්ථානයට
49 ප්‍රවිෂ්ටව රන්කණුවෙහි බහනලද රිදීයෙන් නිමවනලද්දාවූ
සුඹවූ සිසාරණ දඬගුඩ ප්‍රීති බලප්‍රකාශය ඇනෙවා යහපත්
50 ජාති ඇත්තාවූ සැරසූනාවූ විශෙෂයෙන් මංගලවූ අමාත්‍ය

Digitized by Google

යෙකුලවා අලලවාගෙණ සත්වයන්ගේ සම්පත්තිය පරායණ
51 කොට ඇතෙත්ා, මහත්වූ චෛත්‍ය මණ්ලයක් කරවන්නට
කරණලද නිශ්චය ඇතෙත් පිරියම් කරණලද බිම සිසාර
52 වනනට ආරම්භකළේය. නම්න් සිද්ධාණී නම්වූ මහත් සෘද්ධි
මත්වූ දීඝදර්ශී මහාස්ථවිරයන්වහන්සේ එසේ කරනනාවූ
53 නරනිඳුහු වැලකූසේක. (ඒ කුමක් හෙයින්දයත්?) "ඉදින්
මේ නරේන්ද්‍රතෙම මේසා මහත්වූ ථූපයක් කරන්නට ආරම්භ
කරනෙන්ද ථූපය නොනිමි කල්හිම මොහුට මරණය පැමි
54 ණෙනෙන්ය. පිළිසකර කිරීම දුෂ්කරවූ මහත්වූ සැයක්ද
වනෙන්ය" මෙසේ උන්වහන්සේ අනාගතය දක්නේ මහත්
55 බැව් වැලකූසේක. සඞ්ඝයාගේ අනුදැනීමෙන්ද ස්ථවිරයන්
වහන්සේ කෙරෙහි ගෞරවයෙන්ද ස්ථවිරයන්වහන්සේගේ
56 වචනය පිළිගෙණ මහත් චෛත්‍යයක් කරණු කැමැත්තේද
ඒ ස්ථවිරයන්වහන්සේගේ උපදෙශයෙන් නරේන්ද්‍රතෙම
ගඩොල් පිහිටුවනු පිණිස මධ්‍යමවූ චෛත්‍යස්ථාන මණ්ඩ
57 ලයක් කෙළේය. නොපසුබට වීර්‍ය්‍යඇත්තාවූ නරේන්ද්‍රතෙම
මණ්ඩලය මධ්‍යයෙහි රතින්ද රිදීයෙන්ද නිමවනලද
58 කුම්භයන් අට අට තැබ්බවූයේය. එතැනින් (හාත්පස) අට
තුරාදහසක් අභිනව කුම්භයන් පිහිටවූයේය, වස්ත්‍රයන්ද
එකසිය අට බැගින් තැබ්බවූයේය, අනෙක ප්‍රකාරයෙන්
59 සැරසූනාවූ සම්මත කරණලද ඇමැතියා ලවා සහපත්වූ
ගඩොල්කැට අටක් වෙන් වෙන් වසයෙන් තැබ්බවූයේය,
60 එසින් නානාප්‍රකාර මඞ්ගල ලක්ෂණ වසයෙන් සම්මත කර
ණලද එකක් ග්‍රහණයකරවා පූර්වදිග්භාගයෙහි මනොඥවූ
61 සුවඳ කලලෙහි පළමුවෙනි මඟුල්ගඩොල වසයෙන් සකස්
කොට පිහිටවූයේය. දූසමන් මලින් පිදූකල්හි එහි භූමික
62 ම්පා වූයේය, අවශෙෂවූ සතද අමාත්‍යයන් සත්දෙනාකු
63 ලවා පිහිටවූයේය. මෙසේ සහපත්සේ සම්මතකරණලදුවූ
64 ඇසළමස පුර පසළොස්වක් දින ගඩොල් පිහිටවූයේය, එහි
සතරදිග වැඩසිටියාවූ රහත් මහතෙරුන් පිළිවෙළින් වැඳ
65 පුදා අතිශයින් සතුටුවූ ඒ නරේන්ද්‍රතෙම ඊසාන දෙසට
ගොස් පියදස්සී නම් රහත් මහතෙරුන්වැඳ උන්වහන්
66 සේ හමුයෙහි සිටියේය. ඒ ස්ථවිරයන්වහන්සේ මඟල
වර්ණනය කරමින් ඔහට ධර්මදෙසනා කළසේක. ස්ථවිර
67 යන්වහන්සේගේ දේශනාතොමෝ ඒ ජනයාහට සාර්ථක
විය. සතළිස් දහසක් ප්‍රාණීන්ට (මාර්ගඵල මූලකාව) ධර්මාව
68 බොධය වූයේය, සතළිස්දහසකට සෝවාන්ඵලය සිදුවිය.
දහසක් සකෘදාගාමී වූහ, එපමණම අනාගාමී වූහ, එහි

ගිහිජනයන් දහසක්ම රහත්වූහ, අවලොස් දහසක් භික්ෂූ
69 හුද තුදුස් දහසක් භික්ෂුණීහුද රහත් බැව්හි පිහිටි
යහ.
70 මෙසේ රත්නත්‍රයෙහි ප්‍රසන්න ප්‍රඥාඇති පරිත්‍යාගයෙහි
අභිමුඛ්‍ය සිත්ඇති සත්ව සමූහයා කෙරේ හිතවූ (ජනයා
කරණකොටගෙණ) උතුම්වූ ලොකාර්ථසිද්ධිය වන්නේයයි
දැන (ජනතෙමේ) ශ්‍රද්ධාදී නොයෙක් ගුණයන්හා යෙදී
මෙහි ඇල්ම කරන්නේය.

මෙතෙකින් සුදිජනයා පහන් සංවේග පිණිස කළ මහ
වංශ ථූපාරම්භ නම්වූ එකුන්තිස්වන අදියර නිමි.

---

30 වෙනි පරිච්ඡේදය.

1 මහරජතෙම සියලු සඞ්ඝයා වැඳ "චෛත්‍ය කර්මාවසා
නය දක්වා මාගේ පිණ්ඩපාතය ගන්නාසේක්වා" යි කියා
2 නිමන්ත්‍රණය කෙළේය. සඞ්ඝතෙමේ ඒ පැවරීම නොයිවසූ
සේක, හෙතෙම පිළිවෙළින් සත්දවසක් දක්වා යාච්ඤා
3 කරන්නේ අඩයක් භික්ෂුසඞ්ඝයාගෙන් සත්දවසක් ඉවසීම
ලැබූයේය. හෙතෙම ඒ ලැබ සතුටුසිත් ඇතිවූයේම සෑ
4 තැන හාත්පස අටළොස් තැනෙක මණ්ඩපයන් කරවා එහි
සත්දවසක් සඞ්ඝයාට මහදන් පැවැත්තුයේය, ඉක්බිති
5 සඞ්ඝයා යැව්වේය, ඉක්බිති බෙර හසුරුවා වහාම උළුවඩු
6 වන් රැස්කරවූයේය, ඔව්හු පන්සියයක් පමණ වූහ. කෙ
සේ (ගඩොල්) කරන්නාහිදැයි විචාළ කල්හි එකෙක් "මම
මෙයොකරුවන් සියයක් ලැබ මැටි ගැලක් ගෙන්වා එක
7 දවසින් ගඩොල් ඉදිකරමි" යි මහරජහට කීයේය, රජතෙම
ඒ වැළැක්විය, එයින් අඩය අඩය මැඩ මැටි දුමුණක්ද
8 එක එකා කීහු, රජතෙමේ ඒ වඩුවන් සතරදෙනාව වැළැක්
වූයේය.

ඉක්බිතෙතන් පණ්ඩිත ව්‍යක්තවූ උළුවඩුවෙක්තෙම (කියන
9 නෙත්) වනෙහි කොටවා කුල්ලෙන් වැඩූකල්හි මම දිය
ලෙහි අඹරවා මැටි අමුණක් (එකදවස ගෙවන්නෙමි)
10 මෙහි චෛත්‍යයෙහි තෘණාදීහුද නොවන්නාහුයයි නරනිඳු
හට කීයේය. මෙසේ කියනලදැවූ ශක්‍රයාහා සමාන පරා
11 ක්‍රම ඇත්තාවූ මහීපාලතෙම අනුදත්තේය. "තෝ කෙසේ

Digitized by Google

30 පතන්නේ මෙහි පැමිණියේ එහි ගඬොල් සෑදිනගෙණ
31 ඒසා ගඬොලක් කොට මෙහෙකරුවන් රවටා එය වඩු
වාට දුන්නේය, හෙතෙම එය එහි යෙදූයේය, කොලහලද
32 වීය, රජතෙම ඒ අසා ඒ ගඬොල දනහැකිදැයි විචාළේය,
වඩුතෙමේ දනිමින්ම නොදනිමැයි රජහට කීයේය, තෝ
33 ඒ තෙරුන් දන්නෙහිදැයි කියනලදුවූ හෙතෙම එසේයයි
කීයේය, ඒ දන්වන පිණිස මිහිපතිතෙම ඕහට බලතෙක්
පැමිනවූයේය.

34 බලත්තෙමේ එසින් තෙරුන් සෑදින රජහුගේ අනුඥ
යෙන් එලඹියේ කළුගාල පිරිවෙන්හිදී තෙරුන් දැක එක්ව
35 කථාකොට තෙරුන් වඩනා දවසද වැඩීතැනද දැන "නුඹ
වහන්සේලා සමග සියගමට යමැ"යි කියා (පෙරලා අවුත්)
36 රජහට සියල්ල දැන්වූයේය. රජතෙමේ දහසක් අගනා පිළි
සඟලක්ද මාහැඟි රක්තකම්බලයක්ද බොහෝ ශ්‍රමණ පරි
37 ෂ්කාරද සකුරුද සුවඳතෙල් නැළියක්ද ඒ බලහාට දෙවිය.
(ඒසියල්ල දෙවා) ඔහුට අනුඥාසනාකෙළේය. ඒතෙමේ තෙ
38 රුන්හාගොස් පියගලු වෙහෙර පෙණෙන තැන්හිදී තෙරහු
39 දියසව්පවූ සිහිල් සෙවනෙක හිඳුවා, සකුරු හා පැන්පොවා
40 තෙලින් දෙපාමැඩ වහන්යොදැ පිරිකර එලවිය. "මේ පිරි
කර මා කුලූපග තෙරකෙනෙකුට හැරගන්නා ලදැහ. මේ
වස්ත්‍රයුග්ලය මාවිසින් පුත්‍රයාහට ගන්නාලද්දේය. ඒ සියල්ල
41 නුඹවහන්සේට දෙමි" මෙසේ කියා ඒ පිරිකරදී පිරිකර
රැගෙණ වඩනා තෙරුන්ට වැද රජහු බසින් රජහුගේ
පතිවිඩය ඒතෙමේ කීයේය.

42 මහසෑය කරණලබන කල්හි බැලමෙහෙකරුවූ බොහෝ
43 ගණන් මනුෂ්‍යයෝ ප්‍රසන්නාවූවෝ සුගතියට ගියෝය. බුදුන්
කෙරෙහි චිත්තප්‍රසාද මාත්‍රයෙන් උතුම්ගති ලබන්නේයයි
44 දැන නුවනැත්තේ චෛත්‍යපූජාව කරණෙන්යි. මෙහිම බැල
මෙහෙකොට ස්ත්‍රීයෝ දෙදෙනෙක් තව්තිසා දෙව්ලොව
45 උපනෝ මහසෑය නිමිකල දෙදෙන පූර්වකර්ම ආවර්ජනා
46 කොට ගඳමල් ගෙණ සෑය පුදන්නට ආවාහු ගඳින් මලින්
සෑයපුද අභිවාදනය කළෝය. ඒ වේලායෙහි භාතිවඩක
විහාරවාසී මහාසිව ස්ථවිරතෙම රාත්‍රිභාගයෙහි මහසෑය
47 වඳනෙමැයි ආසෙක් එවුන්දෙදෙනා දැක මහාසප්තපර්ණි
48 රුක ඇසිරැකොට සිටියේ, තමා නොදක්වා අද්භූත
සම්පත් දකිමින් සිටගෙණ ඔවුන්ගේ වන්දනා අවසාන
49 යෙහි ඔවුන් විචාරමින් "සියලු ලක්දිව නොපගේ ශරීර
ලෝකයෙන් හෙබෙයි මෙහි තොපි කවර පුණ්‍යකර්මයක්

Digitized by Google

50 කොට මෙසින් දෙව්ලොව ගියාහුදැ" යි විචාළසේක. දෙව්
දුහු මහසෑයෙහි කළකම් උන්වහන්සේට කීවුය. මෙසේ
බුදුන් කෙරෙහිම ප්‍රසාදයතෙම මහත් ඵලයි.
51 මහසෑයෙහි මල්අසුන් තුන ගඩොලින් ඉදිකරණලද්දේ
නිමවනලදී, සෑඩිමත්හු පෑවුවිය සමකොට පොළෝ ගිල්ල
52 වූහ. නවවරෙක්හි ඉදිකරණලද සියල්ල මෙසේම ඒ සෑඩි
මත්හු පොළෝ ගැල්ලද්දූහ. ඉක්බිති මහරජතෙමේ භික්ෂු
53 සඞ්ඝ සන්නිපාතය කරවී. ඒ සන්නිපාතයෙහි අසූදහසක්
54 භික්ෂූන්කරා රජතෙමේ එළඹ පුද වැඳ ගඩොල් ගැල්මෙහි
හේතුව විචාළේය සඞ්ඝතෙම විසඳූයේය. "මහරජානෙනි
55 සෑය නොගිලෙන පිණිස සෑඩිමත් භක්ෂූන් විසින් මේකර
ණලදී දූන් නොකරණුලැබෙයි. අන්‍යථා භාවයක් නො
56 කොට ඒ මහසෑය නිමවව. ඒ අසා පහන් සිත්ඇති රජ
තෙමේ සෑකම් කරවිය. මල්අසුන් දසයෙහි ගඩොල් දස
57 කෙළක්හ. භික්ෂු සඞ්ඝතෙමේ උත්තර සාමණේරය සුමණ
සාමණේරය යන දෙදෙනා "චෛත්‍යයාගේ ධාතුගර්භපිණිස
58 මේවන් පහන් ගෙණඑව්ය" යි මෙහෙයූහ. ඒ දෙදෙනා
උතුරුකුරු දිවයින් ගොස් අසූරියන් දිගපුළුල් හිරුමඬුලසේ
59 බබලන අටහුල් බොල්ගැටපුප් බඳු සහපත් මේවන්පහන්
සයක් ක්ෂණයකින් ඒ උතුරුකුරු දිවයිනෙන් ගෙණ
60 අවූය. මල්යහන් මතුයෙහි මැද ඉන් එක් ගලක් අතුට
61 සතර දිග්හි සතරක් පෙට්ටියක්සේ වසා, එක් ගලක්
පියන් පිණිස නැගෙණහිර දිසාභාගයෙන් අදෘශ්‍යකොට
මහඹීඇති ඔව්හු තැබූහ.
62 රජතෙමේ ඒ දාගැබ මැද සර්වාකාරයෙන් මනොරම්‍යවූ
63 රුවන් මුවා බෝරුකක් කරවිය. ඒ බෝරුක අටළොස්
රියන් කඳය, එහි අතු පසෙක, පබළුමුවා මුල, ඉඳුනිල්බිම
64 පිහිටියේය, ඉතා ශුද්ධ රිදීකඳය, මිණිමුවාපතින් සෑබියේය,
රුවන්මුවා පාණ්ඩුපත්‍ර ඵල ඇතොත්ය, පබළුමුවා අකුරු දළු
65 ඇත්තේය. ඒ බෝකඳ අෂ්ටමඞ්ගලිකාය පුෂ්පලතාය
66 සිවුපා පන්තිය හොබනා හංස පන්තිය උඩ හැසිරෙණ
වියන් කෙළ මුතුහා කිංකිණිදැල්ය රන්කලස මාලාය ඒ ඒ
67 තන්හි මල්දම්හ. වියන සිව්කොන්හි මුතුමය කලාප
ඇත්තේය එල්වනලද ඉන් එකි එකී කලාපයක් නව
68 ලක්ෂයක් අගණේවි. හිර සඳ තාරකා රූපයන්ද නොයෙක්
පියුම්ද රුවිනින් නිමනලද්දූවූ වියනෙහි අමුනනලද්දූහ.
69 අනේකප්‍රකාර මහඟුවණ්ණ ඇති අටතුරා දහසක් වස්ත්‍ර
70 යන්ද වියන්හි එල්වනලද්දූහුය. බොධිය පිරිකෙව්කොට

Digitized by Google

නාන්රුවන් පිළිකඩය, මහ ඇඹුළුපලසා මුතුයෙන් ඒ පිළි
71 කඩ අතුරේහි අතුරණ ලද්දේය. නානා රත්නමය පුෂ්ප
යෙන්ද සිවුද්ද ගඳදියෙන්ද පිරුණාවූ පූර්ණ ඝටපඞ්ක්තීහු
72 බෝමුල තබනලද්දහ. බෝධිය නැගෙණහිරින් පණවන
ලද අනර්ඝ පය්‍යීඞ්කයෙහිත් හාස්වරවූ රන්මුවා බුදුපිළිමයක්
73 හිඳුවිය ඒ පිළිරුව ශරීර අවයවයෝ සුදුසු පරිදෙන්
74 නානාවර්ණ රුවනින් කරණලද්දාහු ඉතා හෙබූහ. රිදී ශෙව
තච්ඡත්‍රධර මහාබ්‍රහ්ම තෙමේ එහි තබනලද්දේය. අභිෂෙක
75 දශක ශක්‍රද ජයතුරාසකින් යුක්තකොට තබනු ලැබීය. විණ
ගත් අත්ඇති පචසිඛය, නාටිකාවන් සහිත කාලනාගරාජය,
76 ඇතුසා පිරිවර සහිත දහසක් අත්ඇති මාරද එහි තබන
77 ලදහ. නැගෙණහිර පය්‍යීඞ්කය සෙයින් සෙසු තුන්දිසාහිද
කෙළක් කෙළක් වස්ත්‍ර අගනා පය්‍යීඞ්කයෝ අතුරණ ලද්දාහ.
78 බෝධියට ඉසලා නන්රුවනින් සරසනලද කෙළක් වස්ත්‍ර
79 අගනා මහසයනය පණවනලද්දේවි. සත්සතියවන තන්හි
ඒ ඒ තැන සුදුසු පරිදෙන් ප්‍රධාන ක්‍රියාද, බ්‍රහ්මාරාධනාවද
80 කරවිය. දම්සක් පැවැතුම, යසස්ථිරයන්ගේ පැවිද්ද, භද්‍ර
81 වග්ගීය කුමරුවන් පැවිද්ද, ජටිලදමනය, බිම්බිසාර රජහුගේ
එලඹීම, රාජගෘහ ප්‍රවේශනය, වේළුවනය පිළිගැන්ම, එසේම
82 අසූමහ සව්වන්ය, කිඹුල්වත් ගමන, එසේම රුවන්සක්මන,
රාහුලකුමරහු නන්දකුමරහු පැවිද්ද, දෙව්රම්වෙහෙර පිළි
83 ගැන්ම, ගඩඹරුක්මුල පෙළහර, තව්තිසා දෙව්ලෙව්හි
දේසනාව, දේවෝරෝහණ පෙළහර, ස්ථිරප්‍රශ්න සමා
84 ගම, මහාසමය සූත්‍රාන්තය, රාහුලෝවාද සූත්‍රාන්තය, මහා
85 මඞ්ගල සූත්‍රාන්තය, ධනපාල සමාගමය, ආලවක දමනය,
අඞ්ගුලිමල් දමනය, අපලාල දමනය, පාරායණ සමාගම,
86 එසේම ආයුස්සංස්කාරය හැරීම, සූකරමාංස ප්‍රතිග්‍රහණය,
ශෘඞ්ගිස්වර්ණවර්ණ වස්ත්‍රයුග්මග්‍රහණය, පහන්දිය වැල
87 දීම, පිරිනිවන්පෑම, දෙවිමිනිසුන් විලාපය, කාශ්‍යප තෙරුන්
විසින් පා වැඳීම, දරසෑයෙහි දූම, ගිනි නිවීම, එහි සත්කා
88 රය, ද්‍රෝණ බමුණා විසින් ධාතුබෙදීම, බොහෝ සෙයින්
ජාතකයන්ය යන මෙතෙක්ද මනාජාති ඇති රජතෙමේ
කරවිය.

89 වෙස්සන්තර ජාතකය වනාහි විස්තරයෙන්ද, එසේම
තුසිතපුරය පටන් බෝමැඩතෙක් විස්තරයෙන්ද කරවිය.
90 සතරදිග ඒ සතරවරම් මහරජහු සිටියාහුය. තෙතිසක් දෙව
91 පුත්හුය එසේම දෙතිසක් කුමරියෝය අටවිසි යක්සෙනෙවි
යෝය, ඉන් මතෙහි ඇඳිලිබැඳගත් දේවතාවෝය, ඉන්

Digitized by Google

92 මතුයෙහි මල්සහිත පූර්ණඝටය, නටන දේවතාවෝය
තූර්‍ය්‍යවාදනය කරණ දේවතාවෝය කැඩපත් ඔසවාගත්
93 දෙවතාවෝය, එසේම මල්අතුගත් දේවතාවෝය, පියුම්
ගත් දේවතාවෝය, නොයෙක් පරිදෙන් අනිකුත් දේවතා
වෝය, රන්ඇගෑපෙළ. දම්සක්පෙළ. කඩුගත් දේවතා
94 පන්තිය, එසේම පාත්‍රගත් දේවතාපන්තිය, උන්ගේ හිස
ගන්ධතෛලයෙන් පූරවණලද්දාවූ පස්රියන් දුහුල්පට පහන්
95 වැටිපෙළ හා මකල් අවුලන ලද්දාහ. පිළිමිණි ඇගෑකොණ
96 එකෙකී මහගු මිණිරුවන, රුවන්ය මිණිය මුතුය විදුරුය
යන මෙයින් එකි එකී ගොඩක් බැගින් ප්‍රභාස්වර සතර
97 ගොඩක් සතරකොණ කරණලද්දේය. මේවත් පහන් බිතු
යෙහිම දීලියෙනනාවූ විදුලිහු අලවනලද්දාහු ධාතුගර්භ
98 යෙහි හෙබ්යාහ. මේ මනරම් දගැබ්හි සියලු රූම සතවූ
99 තැඹූ රනින් මිහිපල්තෙමේ කරවීය. ෂඩ්අභිඥ හා මහා
ප්‍රඥඇති ඉන්ද්‍රගුප්ත මහාස්ථවිර කර්මාධිෂ්ඨායකයෙක් මේ
සියල්ල මෙහි විධානකළසේක. මේ සියල්ල රාජර්ධියෙන්
දේවතර්ධියෙන් ආර්‍ය්‍යර්ධියෙන්ද නොගැටී පිහිටනලද්දේය.
100 තමහට සුවපතනනාහු විසින්, අවශ්‍යයෙන් පිදියයුතු
ලොකොත්තමවූ (අවිදතඳ) තමස්රහිත ජීවමාන බුදුහුද
උන්වහන්සේ (දැවූතැන) විශීර්ණ ධාතුද, පූද (ලබන) පින්
සමයි; සැදැහැගුණයෙන් සැරහුනු නුවනැත්තෝ එය එසේ
දැන මේ බුදුන් ධාතුද දිවමනු බුදුහු සෙයින් යෙහෙන් පූජා
කරණොත්ය.

මෙතෙකින් හුදීජනයා පහන්සංවෙග පිණිස කළ වහ
වහ ධාතුගබ්භරචන නම් තිස්වන අදියර නිමි.

---

31 වෙනි පරිච්ඡෙදය.

1 නරේන්ද්‍රතෙම ධාතුගර්භයෙහි කර්මනිමවා සඞ්ඝයා රැස්
2 කරවා "ස්වාමීනි ධාතුගර්භයෙහි කටයුතු කර්මයෝ මාවිසින්
නිමවන ලද්දාහුය, සෙටදින ධාතු නිධාන කරනෙනාමැ" යි
3 මේ වචනය සැලකෙළේය. මහරජතෙම මේ වචනය කියා
නුවරට වණොන්ය. ඉක්බිතෙන් භික්ෂුසඞ්ඝතෙම ධාතු
4 ගෙණඑම කරණුහැකිවූ යති නමක් සිතා, පූදප්රීවෙන්වැසි

ෂඩ්අභිඥ ප්‍රාප්තවූ සොණුත්තරනම් යතිහු ධාතු ගෙණඊම
කර්මයෙහි යෙදුණේක.
5 ලෝකස්වාමිවූ සර්වඥයන්වහන්සේ ලෝවැඩ පිණිස
(ලොව) හැරිසරා වඩනාකල්හි, ගඞ්ගානදීතීරවාසී
6 නන්දුත්තර නම් මානවකයෙක් තෙම සඞ්ඝයා සහිතවූ
සම්බුදුන් පවරා වැලඳවූයේය, ශාස්තෲන්වහන්සේ පයාග
7 පතිඨාන නම් තොටදී සඞ්ඝයා සහිතව නැව්නැඟීසේක.
එහි (වැඩහුන්) ෂඩභිඥඇති මහත් සෘද්ධිමත්වූ භද්‍රජිත්
නම් ස්ථවිරතෙම (ගඟමැද) දිය පැහිලෙන තැනක් දැක
8 භික්ෂූන්ට මේ වචනය වදාළේය, “මහාපනාද නම් (රජ) වූ
මාවිසින් වසනලද පස්විසි යොදුන් ප්‍රාසාදයතෙම මෙහි
9 වැටුනේය, ගඟාවේ ජලයතෙම ඒ පශයට පැමින මෙහි
පැහිලෙසි.” භික්ෂූහු එය නොඅදහමින් ශාස්තෲන් වහන්
10 සේට එය හැලකළාහුය, “භික්ෂූන්ගේ ශඞ්කාව දුරැකර
ව” යි සර්වඥන්වහන්සේ වදාළසේක, ඉක්බිතිතන් ඒ
11 ස්ථවිරයන්වහන්සේ බඹලොවද වසයෙහි පවත්වනු සමර්ථ
භාවය හඟවනු පිණිස සෘද්ධියෙන් අහසවනැඟී සම සත්
12 තලක් තන්හි වැඩසිටිසේක් දිඝුකරණලද හස්තයෙහි බඹ
ලොව සඑවිණිසැය තබාගෙණ මෙහි ගෙණවුත් ජනයාට
දක්වා එය නැවත එහි තිබූතතන්හි තබා සෘද්ධියෙන් ගඟා
13 වට පැමිනි උන්වහන්සේ පය මාපටඇඟිලෙලන් ප්‍රාසාද
කොත්කැරැල්ල අල්වාගෙණ ඔසවා ජනයාට දක්වා එය
එහිම බහාලූසේක.
14 නන්දුත්තර නම් මානවකතෙම ඒ ප්‍රාතිහාර්‍ය්‍යය දැක, “මම
අනුන් අයත්වූ ධාතු ගෙණඑනනට පොහොසත්වෙම්” යි
15 ප්‍රාර්ථනා කෙළේය, එහෙයින් සඞ්ඝතෙමේ මේ සොණුත්තර
නම් භික්ෂූහු හොලොස්වස් නමුත් ඒ කර්මයෙහි යෙදූ
16 සේක. ඒ සොණුත්තර යතිතෙම “කොසින් ධාතු ගෙණ
එම්දැ” යි සඞ්ඝයා පිළිවිසියේය, සඞ්ඝතෙම ඒ ස්ථවිරයන්ට
17 ඒ ධාතු මෙසේ වදාළසේක. “පරිනිර්වාණ මචකයෙහි
වැදහොත්තාවූ ලොකස්වාමිතෙම ධාතූන් කරණකොට
18 ගෙණද ලෝවැඩ කරනනට ශක්‍රදෙවේන්ද්‍රයාට (මෙසේ)
වදාළසේක.” “දෙවේන්ද්‍රය මාගේ ශරීරධාතු ද්‍රෝණ අට
19 අතුරෙන් එක් ද්‍රෝණයක් රාමගම කොලිය රජුන් විසින්ද
සත්කාර කරණලද්දේ එයින් නාලොවට ගෙණයනලද්දේ
20 නයින් විසින් පුදනලද්දේ එයින් ලක්දිව මහාථූපයෙහි
නිධානය පිණිස වන්නේය, දීර්ඝදර්ශීවූ මහාකාශ්‍යප මහා
ස්ථවිරතෙමේද, ධර්මාශෝක නරෙන්ද්‍රයන් විසින් ධාතු පතුරු

Digitized by Google

21 එන කාරණයෙන් රජගහනුවර සමීපයෙහි අජාසත් රජහු
ලවා මහා ධාතුනිධානය කරවනසේක් ධාතූන් සම්බන්ධිවූ
22 ද්‍රෝණ සතක් ගෙණවුත් යහපත්සේ රැස්කොට කරවූසේක,
සර්වඥයන්වහන්සේගේ සිත දන්නාසේක් රාමගම තුබූ
23 ද්‍රෝණය නොගත්සේක. ධර්මාශෝක මහීපාලතෙමේද ඒ
මහා ධාතුනිධානය දැක අටවෙනිවූ ද්‍රෝණය ගෙන්වන්නට
24 මතියක් කෙලේය. එහි රහත් භික්ෂූහු සර්වඥයන්වහන්සේ
විසින් එය මහාථූපයෙහි නිධානය පිණිස නියමකරණ ලද්
25 දේය"යි ධර්මාශෝක නරේන්ද්‍රයන් වැලැක්වූසේක. රාම
ගම්හිවූ ථූපය එනාහි ගංඉවුරෙහි කරණලද්දේය, එහෙයින්
ගඟායෙහි මහාජල ප්‍රවාහයෙන් බිඳුනේය, ඒ ධාතුකරඬුව
26 එනාහි සමුද්‍රයට ප්‍රවිෂ්ටව එහි ජලය දෙබෑව බුත්කල්හි
නානාවිධ රත්නයන් මස්තකයෙහි රශ්මියෙන් ගැවසී සිට
27 ගත. නාගයෝ ඒ කරඬුව දැක මඤ්ජෙරික නම් නාගභවන
28 යට ගොස් කාළ නම් නාරජහට දැන්වූහ. ඒ නාගරාජතෙම
දසකෙළ දහසක් නාගයන්හා සමග එහි ගොස් ඒ ධාතූන්
29 විශෙෂයෙන් පුදනොත් ස්වකීය භවනයට පමුනුවා, සර්ව
රත්නමයවූ ථූපයක්ද එසේම ඒ මතෙහි ගෙයක්ද නිර්මිත
කොට ආදර සහිතවූයේ නාගයන් සමග සෑමකල්හි පුදයි.
30 එහි ආරක්ෂාව මහත ගොස් ධාතූන් මෙහි ගෙණඑව සෙට
දීන මහීපාලතෙම ධාතුනිධානය කරනොත්ය" ඒ යතිතෙම
31 එනාහි මෙසේ වදාරණලදුවූ සඞ්ඝයාගේව චනය අසා මැන
වැයි කියා යාසුතු කාලය බලමින් ස්වකීයවූ පිරිවෙණට
32 පැමිනිසේක. මිහිපතිතෙම "සෙට ධාතුනිධානය වන්නෝ
ය"කියා නුවර බෙර හැසිරවූයේය, සියලු කටයුතු විධාන
33 කොට ඒ මුළුනුවරද මෙහි එනනාවූ මාර්ගයද, සකස්කොට
සැරසවූයේය, නුවර වැසියන්ද අලංකෘත කරවූයේය. සක්
34 දෙව්රජතෙමේද විශ්වකර්ම දෙව්පුත් කැඳවා මුළු ලක්දිව
නොයෙක් පරිඅඳුන් සැරසවූයේය, නරෙශ්වරතෙම පුර
35 යාගේ සතරදොර මහජනයාගේ උපභොගය පිණිස අනේ
කප්‍රකාරයෙන් බත් හා වත් තැබ්බවූයේය.
36 රාජකෘත්‍යයන්හි විචක්ෂණවූ නරේන්ද්‍රතෙම පසළොස්වක්
පොහෝදින සවස්වේලෙහි යහපත් සිත්ඇතොත් සර්වාභර
ණයෙන් සැරසුනේ, සියලු නාටිකාවන් විසින්ද ආයුධ සහි
37 තවූ යොධයන් විසින්ද, මහත්වූ සේනාසමූහයා විසින්ද,
38 ඇත් අස් රථ සේනාවන් විසින්ද, නානාප්‍රකාරවූ ආභරණ
යෙන්ද සියලු දෙසින් පිරිවරණලද්දේ යහපත්වූ ධවල
39 සෛන්ධවයන් සතරදෙනෙකු යොදනලද යහපත්වූ රථයට

Digitized by Google

නැඟී, හරසනලඳුවූ යහපත් කඹලෑතු පෙරටුකොට රන්
40 කරඬුවක්ගෙනෝ ජේසනයට සිටියේය. අටතුරා දහසක්
පුරුෂයෝද, යහපත් පුන්කලස් හා ආභරණ ඇත්තාවූ යහ
41 පත් ස්ත්‍රීහුද ඒ රථය පිරිවැරූහ. ඒ ඒ පමණවූ නානාවිධවූ
මල්පුඹුහුද එසේම දඬුවැට පහන්ද දරාගෙණ ස්ත්‍රීහු පිරිවැ
42 රූහ. මොනවට සරසනලඳුවූ අටතුරා දහසක් ලදරුවෝ
43 නානාවර්ණවූ යහපත් ධවජයන් ගෙණ පිරිවැරූහ. ඒ ඒ
තන්හිවූ නානාවිධ තූර්‍ය්‍යශබ්දයෙන් හා අනේකවිධවූ හස්ත්‍ය
ශ්ව රථ ශබ්දයෙන්ද පොළෝතල කිඳීතුලබනසේවූ කල්හි,
44 සොභාවෙන් යුක්තව මහමෙවුනා උයනට යනාවූ ඒ මහා
යසස්ඇති නගරෙන්ද්‍රතෙම නදුන්වන වදනා සක්දෙව්රජහු
45 සෙයින් බැබලීය. පිරිවෙණ වැඩහුන් සොණුත්තර යති
තෙම රජහුගේ නික්‍ෂමණාරම්භයෙහි නගරයෙහි මහත්වූ
46 තූර්‍ය්‍යශබ්දය අසා, පොළොව කිම්ද වහා නාගභවනයට වැඩ
එහි නාරජහු ඉදිරියෙහි පහළවූසේක.
47 නාරජතෙම හුනස්නෙන් නැගී වැද උන්වහන්සේ පළ
48 ගෙහි හිඳුවා සත්කාරකොට ආවාවූ දෙශය පිළිවිසියේය.
එය වදාළකල නැවතත් තෙරුන්වහන්සේ වැඩිය කරුණ
49 විචාළේය, ඒ ස්ථවිරතෙම සියලුම කරුණු කියා සඞ්ඝයාගේ
හස්න වදාළේය. “සර්වඥයන්වහන්සේ විසින් මහා ථූප
යෙහි නිධානකරණු පිණිස නියමකර වදාරණ ලද්දාවූ ධාතු
50 හු මෙහි තොපගේ හස්තප්‍රාප්තවූහ, ඒ ධාතූන් තෝ මට
දෙව” ඒ අසා අතිසයින්ම නොසතුටු සිත්ඇත්තාවූ නාග
රාජතෙමේ “මේ ශ්‍රමණ තෙම බලාත්කාරයෙන් ගන්නවද
51 සමණිය එහෙයින් ධාතූහු අන්තැනෙක පැමින වියයුතු
ය” යි සිතා එහි සිටි බෑනනුවන්ට ආකාරයෙන් දැන්වූයේය,
52 නම්න් වාසුලදත්ත නම් හෙතෙම ඔහුගේ ඉඟි දැන ඒ
චෛත්‍ය මන්දිරයට ගොස් ඒ කරඬුව ගිල මේරුපර්‍වතපාද
53 යට ගොස් කුණ්ඩලාවර්තව ශයනය කෙළේය. තුන්සියක්
යොදුන් දීඝවූ ශරීරය ඇතිවිය, දරණය යොදුනක් අවට
54 ඇතෙත්ය, නොයෙක් දහස්ගණන් පෙණද මවනලද්දහ.
ඒ මහත් සෘද්ධිමත් තෙම ශයනයකොට දුමනෙත්ය, ගින්
55 නෙත් ප්‍රජ්වලිතවනෙත්ය, නොයෙක් දහස්ගණන් තමන්
සමානවූ නයින් මවා හාත්පස පිරිවරකොට ශයනය කරවූ
56 යේය, එකල්හි බොහෝවූ දෙවියෝද නාගයෝද “නාගයන්
57 දෙදෙනාගේ යුද්ධය අපි බලම්හ” යි එහි රැස්වූහ. මසිල් (නා
රජ) තෙම බෑනනුවන් විසින් ඒ ධාතූහු ගෙණයන ලද්දහු
යයි සිතා “මාලඟ ධාතු නැත” යි ඒ ස්ථවිරයන්හට කීයේය.

Digitized by Google

58 ස්ථවිරයන්වහන්සේ ඒ ධාතූන්ගේ ගමනය මුලපටන්
59 දැන ‘,ධාතු දෙව” යි ඒ නාරජහට කීසේක. ඒ නාරජතෙම
අත්පරිඅඳකින් හගවන පිණිස ඒ තෙරුන්ගෙණ චෛත්‍ය
60 මන්දිරයට ගොස් උන්වහන්සේට එය වර්ණනා කෙළේය.
නොයෙක් රත්නයෙන් නොයෙක් පරිඅඳුන් සකස්කරණ
ලදුවූ මොනවට නිර්මිතකරණලද චෛත්‍යයද සෑගෙයද
ශ්‍රමණය බලව “මුළු ලක්දිව සියලුම රත්නයෝත් (මේ)
61 හිනිමුල සඳහා පහනටත් නොඅගණ්ණූය අන්‍යවූ වස්තූන්
කෙරෙහි කවර වර්ණනාවෙක්ද? ශ්‍රමණය තුඹවහන්සේලා
විසින් මහාසත්කාර පවත්නාතෙනින් ස්වල්ප සත්කාර පවත්
62 නාතැනකට මේ ධාතූන් ගෙණයෑමනම් අයුක්තතක.” “නා
63 ගය නොපවද සත්‍යාවබොධය නැතොත්ය ධාතූන් සත්‍යාව
64 බොධය ඇත්තාවූ තැනකට ගෙණයායුතුය. තථාගතයෝ
තුමූ සසරදුක් මිදීමපිණිසම උපදිති සර්වඥයන්වහන්සේගේ
65 මේ අභිප්‍රායෙති ඒ කරණකොටගෙණ ධාතූන් ගෙණයම්හ.
ඒ රජතෙම වනාහි ධාතු නිධානය අදම කරනොන්ය, එහෙ
සින් ප්‍රපඤ්චනොකොට වහාම මට ධාතූන් දෙව්සි” කීසේක.
66 “වහන්ස ඉදින් තුඹවහන්සේ ධාතූන් දක්නෙහිනම් ගෙණ
යව” යි නාගතෙම කීයේය.
67 ස්ථවිරතෙම ඒ වචනය ඔහුලවා තුන්වරක් කියවාගෙණ
68 එහි වැඩසිටියේම සිහුම් අතක් මවා එකෙණෙහිම නාරජහු
බෑනනුවන් මුඛයෙහි අතබහා, දුකරඬුව ගෙණ “නාගය
69 සිටුව” යි කියා පොළොව කිමිදගෙණ පිරිවෙණෙහි නැගීසිටි
සේක. නාගරාජතෙම “අපවිසින් රවටනලද භික්ෂූතෙම
ගියේය” යි සිතා ධාතූන් ගෙණෙන පිණිස බෑනනුවන්ට
70 හසුන් යැවීය. ඉක්බිති බෑනතෙමේ කුසෙහි කරඬුව නො
71 දක හඬමින් අවුත් මාමාට දැන්වූයේය, එකල ඒ නාරජතෙ
මේද “අප රවටනලදැම්හ” යි සිතා හැඬූයේය, පෙළනාවූ
72 සියලුම නාගයෝ හැඬූහ. රැස්වූ දෙවියෝ භික්ෂුශ්‍රෙෂ්ඨයන්
ගේ ජයෙහි සතුටුවූවෝ ඒ ධාතූන් පුදනොනෝ උන්වහන්සේ
73 සමග ආවෝය. නාගයෝ හඬමින් අවුත් ධාතු ගෙණජමෙන්
74 දුක්පත්වූවෝ සඞ්ඝයා සමීපයෙහි බොහෝසෙසින් හැඬූහ.
සඞ්ඝතෙම අනුකම්පාවෙන් ඔවුන්ට ධාතු ස්වල්පමාත්‍රයක්
75 දෙවූයේය, එසින් සතුටුවූ ඔව්හු ගොස් පූජාභාණ්ඩයන් ගෙණ
වෝය. සක්දෙව්රජතෙම රුවන්පළඟක් හා රන්කරඬුවක්
76 ගෙණ දෙවියන් හාසමග ඒ ස්ථානයට ආයේය. තෙරුන්
වහන්සේ නැඟුන තන්හි විශ්වකර්ම දෙව්පිත් ලවා කර
77 වන ලදුවූ යහපත්වූ රත්නමණ්ඩපයෙහි පළඟ පිහිටුවා ඒ

තෙරුන්වහන්සේ අතින් දකුරඬුව ගෙණ (තමන්) කරඬු
78 වෙහි තබා උතුම් පලංගෙහි තැබූයේය. බ්‍රහ්මතෙම ඡත්‍රය
දැරූයේය, සන්තුසිත දෙව්තෙම වල්විදුනාව දැරූයේය,
සුයාම දෙව්තෙමේ මිණිතල්වැට දැරූයේය, ශක්‍රතෙම දිය
79 සහිතවූ ශඞ්ඛය දැරූයේය. සතරවරම් දෙව්මහරජදරුවෝ
කඩුගත් අත්ඇතිව සිටගත්හ. මහත් සෘද්ධිඇත්තාවූ තෙතිස්
80 දෙව්පිත්හු තුමූ සුවුගුගත් අත්ඇත්තාහු පරසතු මලින් පුද
මින් එහි සිටගත්හ, දෙතිස් දෙව්කුමරියෝ දඬුවැට පහන්
81 දරමින් සිටියෝය, අෂ්ටවිංශති යක්‍ෂසෙනාධිපතිහු වනාහි
82 දුෂ්ටවූ යකුන් පලවා ආරක්‍ෂාකෙරෙමින් සිටගත්හ. පඤ්චසිඛ
නම් දෙවපුත්‍රතෙම වීණා වයමින් එහි සිටියේය, තිම්බරු
දෙව්පිත්තෙම නෘත්‍ය භූමියක් මවා තූර්‍ය්‍යඝොෂා ඇතිව සිටි
83 යේය. නොයෙක් දෙවපුත්‍රයෝද සාධු ගීතිකා ගොදනොත්
දූහ. මහාකාල නම් නාරජතෙම නොයෙක් පරිද්දෙන්
84 ස්තුතිකෙරෙමින් සිටියේය. දිව්‍යතූර්‍ය්‍යයන් වයනු ලබති දිව්‍ය
සඞ්ගීතයද පවති. දෙවතාවෝ දිව්‍යසුගන්ධඇත්තාවූ වැසිද
වස්වති.

85 ඒ ඉන්ද්‍රගුප්ත නම්වූ ස්ථවිරතෙම වනාහි මරු පසුබස්වන්
නාවූ ලෝහමය ඡත්‍රයක් සක්වළ සමකොට මැවූයේක. ධාතූ
86 න්ගේ ඉදිරියෙහි ඒ ඒ (දිග) පස්තැනෙක්හි සියලු භික්‍ෂූහු
87 ගණසජ්ඣායනා කළහ. අතිශයෙන් සතුටුවූ දුටුගැමුණු මහ
88 රජතෙම එහි ආයේ හිසින්දරා ගෙණවාවූ ස්වර්ණමයවූ
කරඬුවෙහි දකරඬුව තබා අස්නෙහි පිහිටුවා දපුද වැද
89 දෙහොත් මුදුනබැන්දේ එහි සිටියේය. ක්‍ෂත්‍රියතෙම මෙහි
(පවත්නාවූ) දිව්‍යඡත්‍රාදින්ද දිව්‍යගන්ධාදීන්ද දැක, දිව්‍ය
90 තූර්‍ය්‍යාදීන්ගේ ශබ්දයන් අසාද, බ්‍රහ්මයන්හා දෙවියන් නො
දැක ආශ්චර්‍ය්‍යඅද්භූත සිත්ඇතිව සතුටුවූයේ ජෙසතින් ධාතූන්
91 පිදූයේ ලඞ්කා රාජ්‍යයෙහි අභිෂෙකද කෙළේය. ඒ නරෙන්ද්‍ර
තෙම "දිව්‍යච්ඡත්‍රයද මානුෂික ඡත්‍රයද විමුක්තිච්ඡත්‍රයද යන
ඡත්‍රත්‍රය දරනනාවූ ලෝකස්වාමීවූ ශාස්තෲන් වහන්සේට
92 තුන්යලක්ම මාගේ රාජ්‍යය දෙමි" කියා සතුටු සිත්ඇතොත්
93 ලඞ්කාරාජ්‍යය තුන්වරක් ධාතූන්ට දුන්නේය. ක්‍ෂත්‍රියතෙම
දෙව් මිනිසුන් සමග ඒ දපුදවින් කරඬුහා සමග හිසින්
94 ගෙණ භික්‍ෂු සඞ්ඝයා විසින් වටකරණලද්දේ චෛත්‍යය
ප්‍රදක්‍ෂිණකොට පෙරදිගින් ගෙණවුත් ධාතුගර්භයෙහි බැස්
95 සේය. සයානුකෙළක් රහතුන්වන්සේලා උතුම් ථූපය හාත්
96 පසින් පිරිවරා කරණලද ඇඳිලි ඇතිව වැඩසිටගත්හ.
ධාතුගර්භයට බැස ප්‍රීතියෙන් පූර්ණ නරනිද්‍රයා මහැගිවූ

Digitized by Google

අඹර හැසිරවූයේය. "ලක්දිව ද වඩිනු කැමැත්තාවූ යම්
110 මනුෂ්‍යයෙකෙනෙක් වෙත්නම්, එකෙණෙහිම මෙහි අවුත්
ද වැද කැමතියේ සියගෙට යෙත්වා" යි ඉන්‍දගුත්ත නම්වූ
117 මහත් සෘද්ධිමත්වූ ස්ථවිරතෙම අධිෂ්ඨාන කළේක. එය
ඉටනලද පරිද්දෙන් විය. ඒ මහා යසස්ඇත්තාවූ මහරජ
118 තෙම මහාසඞ්ඝයාට ඒ සත්දවස නිරතුරුකොට මහදන්
පවත්වා "මාවිසින් ධාතුගර්භයෙහි කටයුතු නිමවන ලද්
දේය ධාතුගර්භය වැසීම දැනගන්නට සඞ්ඝයා සුදුස්සේ" යයි
119 කීයේය. සඞ්ඝතෙම ඒ සාමණේර දෙනම ඒ කර්මයෙහි
යෙදුයේය, ඔව්හු ගෙනෙණලද (මේඝවර්ණ) පාෂාණයෙන්
120 වැසුහ. "මෙහි මල් නොමැලවෙත්වා මේ ගන්ධයෝ නො
වියලෙත්වා පහන්ද නොනිමෙත්වා කිසිවකුත් නොනසීවා,
121 මේඝවර්ණ පාෂාණයෝ අතුරු නැතිව ගැළපෙත්
වා" යි රහතන්වහන්සේලා ඔම් සියලු අධිෂ්ඨාන කළහ.
122 වැඩකැමතිවූ මහරජතෙමේ "මහජනතෙම මෙහි ශක්තිවූ ප
රිද්දෙන් ධාතුනිධානයන් කෙරේව" යි අණවූයේය. මහ
123 ජනතෙමේ මහාධාතුනිධානය පිටද දහස්ගණන් ධාතුන්
සම්බන්ධවූ නිධානයන් ශක්තිවූ පරිද්දෙන් කෙළේය, නරේ
124 න්‍ද්‍රතෙම ඒ සියලු පියවා ථූපය සමාප්තකරවූයේය, මෙහි
චෛත්‍යයෙහි සතරැස්කොටුවද නිමවූයේය.
125 මෙසේ පිරිසිදු සිත්ඇත්තාවූ චේතොඛිල රහිතවූ සත්
පුරුෂයෝ සියලු සම්පත්තීන් අතුරෙන් උතුම්වූ නිර්වාණ
සම්පත්තිය හේතුකොට නිර්මලවූ පුණ්‍යයන්ම තුමූත්
කෙරෙති, නානාප්‍රකාර විශේෂ ඇත්තාවූ ජනසමූහයා පිරි
වර කිරීමට හේතුවූ පින්කරවනාහුද වෙති.

මෙතෙකින් සුදීජනයා ප්‍රසාද සංවේග පිණිස කළ මහ
වංශ ධාතුනිධාන නම්වූ එක්තිස්වන අදියර නිමි.

32 වෙනි පරිච්ඡේදය.

1 (යටකී පරිච්ඡේදන් කරණලද රුවන්වැලි) සෑයෙහි සත්
කර්මය සුණුකම් නොනිමිකල මාරණාන්තිකරෝගයෙන්
2 රජතෙමේ ගිලන්විය ඒ තෙමේ මල් තිස්සකුමරහු දීඝා
වැපින් කැඳවා "සෑයෙහි නොනිමි කර්මාන්තය නිමව" යි

3 තිබේය. ඒ කුමර තමා බෑයා දුර්වලබැවින් සනනාලින්
ලවා සුදු පිළියෙන් හැට්ටයක් කරවා ඒ හැට්ටයෙන් ඇය
4 වස්වා, සිත්තාරුන්ලවා එහි පිළිකඩද පූර්ණ ඝට පන්තින්ද
5 පසඟුල් පන්තියද මනාකොට කරවීය. එසේම සත්කාරුවන්
ලවා, ගුණදඬු මුවා ඡත්‍රයද, මුදුන්පිළිකඩ කරපත්මුවා සඳ
6 හිරද කරවීය. මෙසේකළ ඇය ලාකඩ හා කොකුම්න් මොන
වට සිත්තම් කරවා "ඇයෙහි කටයුතු නිස නිමියේය" යි රජ
7 හට දැන්වීය. රජතෙමේ සිව්ගෙයක පෙවගෙණ සිව්ගෙ
8 සින්ම ඇය පැදකුණුකොට වැද; දකුණු දොරටුයෙහි බිම
අතුළ සයනයෙක හෙව, ඒ තෙමේ දකුණැලයෙන් හෙව
9 උතුම් මහසෑයද වම්ඇලයෙන් හෙව උතුම් ලොහොපහ
සද, දනිමින් භික්ෂුසංඝයා විසින් පිරිවරණ ලදුයේ පහන්
10 සිත්විය. ගිලන්බැව් පුළුවුස්නා පිණිස ඒ ඒ දිගින් වැඩි,
11 සයාතූ කෙළක් භික්ෂූහු ඒ සමාගමයෙහිවූහු. භික්ෂූහු වග
බැඳගෙණ ගණසජ්ඣායනා කළහ. මිහිපල්තෙම ඒ සමාග
12 මයෙහි ථෙරපුත්ථාභය නම් මහතෙරුන් නොදැක "අටවිසි
මහයුඩයෙහිදී යුඩකෙරෙමින් පරාජය නොවූ මාගේ
13 මහායොධවූ වසිවූ ථෙරපුත්ථාභය නම් ස්ථවිර දැන් මාරයුඩ
පැමිනිකල මාකරා නොඑලඹෙනසේක; පරාජය දැක උන්
14 වහන්සේ නොවඩනාසේකැයි සිතමි" රජතෙමේ මෙසේ
සිතුයේය. ඒ මහා ස්ථවිරතෙමේ කිර්දියොය හිස පජලි නම්
15 ගල වෙසෙමින් රජහු සිතිවිලි දැන පන්සියයක් රහත් පිරි
වරින් ඍඬිබලයෙන් අහසින් අවුත් රජහුවෙත සිටගත්
16 සේක. රජතෙම උන්වහන්සේ දැක පහන්වූයේ ඉදිරියෙන්
17 හිඳුවාගෙණ "මම පූර්වයෙහි දසමහයොධවූ තුඹවහන්
සේලා ගෙණ යුදකෙළෙම්, දැන් හුදකලාවම, මිරුහා යුද
පටන්ගනිමි මරසතුරා පරදවන්ට නොහැක්කෙමි" සිද තී
යේය.

18 ස්ථවිරතෙමේ වදාරණසේක්. "ජනප්‍රධානවූ මහරජනෙහි
නහම්ක් බියවේවා, කෙලෙස් සතුරා නොපරදවා මරසතුරා
19 පැරදවිය නොහැක්කෝය "සියලු සංස්කාරයෝ අනිත්‍යහ"
20 යි ශාස්තෘන් විසින් දෙසිතමැයි, ලජ්ජාභය රහිතවූ මේ අනි
ත්‍යතා තොමෝ බුදුන්කරාද එලඹෙයි, එහෙයින් සංස්කාර
21 යෝතුමූ අනිත්‍යහ, දුක්ඛයහ, අනාත්මයහයි, සිතා (පැවැතන
යුතෙත්ය) මීට (පූර්වයෙන්) දෙවන අත්බැව්හිද තොපගේ
22 කුසල කරණයෙහි අභිප්‍රාය මහත්මැයි, දෙව්ලොව එලඹ
සිටිකල තෙපි ඒ දිව්සැප හැර මෙහි අවුදින් නොයෙක්
පරිදෙන් බොහෝ පින්කම් කළහ, තොපවිසින් එක්සේ

23 සත්කොට රාජ්‍යකරණයත් සසුන් බැබලවීම පිණිසය. එබැ
වින් මහපින්ඇත්තාණෙනි අද දවසතෙක් තොපවිසින් කළ
24 පින් සියල්ල මෙතෙහිකර, මේ උපායෙන් තොපට එකෙ
ණෙහි සුවවන්නේය" යි වදාළසේක. තෙරුන් බස්අසා රජ
තෙමේ පහන්සිත් ඇතිවිය "ඔබ මාරයුද්ධයෙහිත් මට අත්‍ය
25 න්තෝපකාර සේක" යි උන්වහන්සේට කීයේය. පහන්සිත්
26 ඇතොත් එකෙණෙහිම පින්පොත ගෙන්වා ඒ කියන්ට
ලියන්නා මෙහෙයීය. ඒ තෙමේ ඒ පොත කීයේය.
27 "මහරජහු විසින් එකුන්සියයක් විහාරයෝ කරවනලද්දාහ.
එසින් මිරිසවැටියම එකුන්විසිකෙළකින් කොට නිමියේය,
උතුම්වූ ලෝහප්‍රාසාදය තිස්කෙළකින් කොට නිමවනලදී
28 "මහරජනෙනි මනා බුද්ධිඇති ඔබවිසින් මහසෑයෙහි ඇතුළ
කරවනලද ගණන් නොකටහැකි සුවිසක් හැර සෙසු
29 මහසෑ කර්මාන්තයෝ කෙළදහසක් අගණිත" යි කීයේය.
"කොලඹනම් මලයරට බුරුකෑ සායෙහිදී මහගු මිණිකො
30 ඩොල් සහල විකුණ මිළගෙණ පන්සියයක් ක්ෂීණාශ්‍රව මහ
31 තෙරුන්ට පහන්සිතින් උතුම්වූ ඇඹුල්සහිත තණසාලේ
පිණ්ඩපාතය දෙනලද්දේය. චූලගනිය යුද්ධයෙහිදී පැරද පලා
32 යනාහු විසින් කාලඝෝෂා කරවා අහසින් වැඩියාවූ ක්ෂීණ
ශ්‍රව යතිකෙනෙකුට තමා නොතකා රන්තැටියෙහි බත
33 දෙනලද්දේය" මෙසේ කීකල රජතෙමේ (කියන්නේ) "වෙ
හෙර පෙළහර සතියෙහිද එසේම ප්‍රාසාද පූජාසතියෙහිද ම
හසෑ ආරම්භ සතියෙහිද එසේම ධාතුනිධානයෙහිද සතර දි
34 ගින් වැඩියාවූ මහත්වූ උභතෝසංඝයාට මාවිසින් මාහැ
35 ගිවූ අවිශෙෂ මහාදානය පවත්වනලද්දේය. සුවිසක් මහත්
වෙසක් පූජාද කරවීම, ලක්දිව සියලු සඞ්ඝයාට තුන්වරක්
36 තුන්සිවුරු පූජාකරවීමි, පහන්සිත්ඇති මම සත් සත් දවස
බැගින් ලක්දිව්හි මේ රජය පස්වරක් සසුන් විසයෙහි දුන්
37 නෙමි, සතතයෙන් දෙළොස්මහතන්හි පිරිසිදු වැටියෙන්
ගිතෙලින්ම බුදුන් පුදමින් පහන් දහසක් දැල්වීමි. තවද
38 මම අනවරතයෙන් අටළොස් තැනෙක වෙදුන් විසින්
39 විධානකරණ ලද්දාවූ ගිලන් බත්හා බෙහෙත් ගිලනුන්ට
40 දෙවීමි, සුසාළිසක් තැන සකස්කළ කිරිබතද (දුනිමි,)
එතෙක්තැන්හිම තෙල් කැවුම්ද එතෙක්තැන්හිම ගිතෙ
41 ලෙහිබැදී මහදැල් කැවුම් එසේම බත්සමග නිත්‍යයෙන්
දෙවීමි, මසක් පාසා පෙහෙවස් දවස්හි ලක්දිව අටමහ
42 විහාරයෙහි පහන් තෙල් දෙවීමි, ආමිසදානයට වඩා ධර්‍මා
දානය මහත්සී අසා ලෝහප්‍රාසාදය යටමහලෙහි සඟමැද

Digitized by Google

43 අස්නෙහි හිඳගන්නාවූ මම මහාමඞ්ගල සූත්‍රය සඞ්ඝයාට
දෙසන්නෙමැයි (සිතා) සඞ්ඝ ගෞරවයෙන් අස්වන්ට නො
44 හැකිවීමි, එතැන් පටන් ලක්දිව ඒ ඒ තැන විහාරයන්හි
45 ධර්මදෙසකයන්ට සත්කාරකොට දහම් දෙස්වීම්, ධර්ම
46 කථික එක් එක් නමකට ගිතෙල් ගුඩ ශක්කාර නැළියක්
නැළියක්ද දෙවීමි, සතරඟුල් දික් වැල්වූ මිටක් මිටක්ද
දෙවීමි, එසේම පිළිසගලක්ද දෙවීමි, (මේ කියනලද) ඉසු
47 රෙහි පිහිටා දුන් යසිලූ දානයෝ මේතරම් මාසිතු නොපහ
දවයි, දිවිනොබලා දුගීගතවූම මාවිසින් දෙනලද යම් දන්
දෙකෙක්වේනම් එයම මාසිත පහදයි'' කීයේය.
48 ඒ අසා අභයස්ථවිරතෙමේ බැගෑකල දුන් දානවයම
රජහු සිත් පහන් පිණිස නොයෙක් ආකාරයෙන් වර්ණනා
49 කරණසේක් "ඒ තෙරුන්වහන්සේලා පස්දෙනා අතුරෙන්
ඇඹුල් සහිත තණබත්ගත් මලියදේව මහාස්ථවිරතෙමේ
50 සමන්කුළු පව්හි නවසියයක් භික්ෂූන්ටදී වැලඳූසේක. පෑවි
51 පාලක ධම්මගුප්තස්ථවිරතෙමේ ඒ පිඩපාතය, කැළණි
විහාරයෙහි පන්සියයක් භික්ෂූන් සමග බෙදාගෙණ තෙ
52 මේත් වැලඳූසේක. තලගුරුවැසි ධම්මදින්න ස්ථවිරතෙමේ
පුවඞුදිවයින දසදහසක් භික්ෂූන්ට බෙදාදී එය වැලඳූසේක.
53 මඞ්ගනවැසි මහා සෑඩිඇති කුඩාතිස්ස ස්ථවිරතෙමේ කෛ
ලාස විහාරයෙහි සැටදහසක් දෙනාට බෙදාදී වැලඳූසේක.
54 මහාව්‍යග්‍ර ස්ථවිරතෙමේද උකනාහුවර විහාරයෙහි සත්සිය
55 යක් භික්ෂූන්ටදී තෙමේත් පරිභොග කළසේක. රත්තැවි
යෙහි බත්ගත් (කුටිංඛික පුත්‍ර මහා) ස්ථවිරතෙමේ දොළොස්
56 දහසක් භික්ෂූන්ටදී ඒ වැලඳූසේක.'' අභය ස්ථවිරතෙමේ
මෙසේකියා රජහුගේ සිත පහන්කරවූසේක.

රජතෙමේ සිත පහදවාගෙණ ඒ තෙරුන්ට මෙසේ සැල
57 කෙළේය. "සූවිසි වසක් මුළුලෙලෙහි සඞ්ඝයාට උපකාරක (වූ
58 යෙම්) මෙම කායද සඞ්ඝයාට උපකාරවේවා. මහසෑයට පෙ
ණෙන්නාවූ සඞ්ඝයාගේ කර්මමාලකයෙහි සඞ්ඝදාසවූ මාගේ
59 සිරුර ආදාහන කළමැනවැ''යි කියා මලුට (කියනෙන්)
"තිස්සය තෙපි මහසෑයෙහි නොනිමියාවූ සියලු කර්මාන්තය
60 සකස යෙගෙන් නිමව. උදයත් සවසත් මහසෑයෙහි මල්
පුදව මහසෑයට (දවස තුන්වරක්) පෙලහරකරව. පියේ
61 තෙපි මාවිසින් සුගත් සසුන්හි යම් වෘත්තියක් පිළියෙළ කර
62 ණලද නම් ඒ සියල්ල නොපිරිහෙලා පවත්වව. තවද පියේ
හැමකල සඞ්ඝකෘත්‍යයන්හි නහමක් ප්‍රමාදවව''යි මෙසේ
රජතෙමේ ඔහුට අනුශාසනාකොට තුෂ්ණීම්භූතවූයේය.

Digitized by Google

63 එකෙණෙහි භික්ෂු සමූහතෙමේ ගණසජ්ඣායනා කළ
සේක. දෙවියෝ සදිව්‍යලෝකයෙන් රථ සයක් එලවූහ.
64 රථයෙහි සිටියාවූ ඒ දෙවියෝ වෙන් වෙන්ව රජහට “මිහ
රජතෙනි සිත්කළුවූ අප අපගේ දෙව්ලොවට ඔබ අවමැන
65 ව” යි යාච්ඤා කළෝය. රජතෙමේ ඔවුන් බස් අසා “මම
යම්තාක් බණ අසම් නම් ඒතාක් ඉවසව්” යි හස්තසංඥාවෙන්
66 වැලක්වූයේය. භික්ෂූහු “ගණසජ්ඣායනාව වලකන්නේය” යි
සිතා දේශනාව නැවැත්වූහ. රජතෙමේ ඒ නැවැත්මට
67 හේතු විචාළේය. ඒ භික්ෂූහු “නැවැත්ත මැනවයි සංඥා
දුන් බැවිනැ” යි වදාළෝය, රජතෙම “ස්වාමිනි ඒ එසේ නො
68 වෙ” යි කියා දෙවියන්ට දුන්නුබව කීයේය. ඒ අසා සම
හර දෙනෙක් “මරණභයින් හයවූ මේතෙමේ වලප්නේ
69 ය” යි සිතූහ. ඔවුන්ගේ සැක දුරලනුපිණිස ඒ අභය ස්ථවිර
තෙමේ රජහට වදාරණසේක් “(මහරජ තොපට) රථ එලවන
ලදහයි කෙසේ දන්විය හැක්කේද” යි මෙසේ වදාළසේක.
70 පණ්ඩිතවූ රජතෙමේ මල්දම් අහසෙහි දැම්මවිය. ඒ මල්දම්
වෙන් වෙන්ව රියහිස්හි ලැගුණාහු එලූනෝය. මහජන
71 තෙමේ අහස එල්ලෙනාවූ ඒ මල්වඩම් දැක සැතහළේය.
රජතෙමේ “වහන්ස කවර දෙව්ලොවෙක් රමණීයේ” යි ඒ
72 තෙරුන් විචාළේය. ඒ ස්ථවිරතෙමේ “මහරජතෙනි තුසිත
පුරය සිත්කළුයයිද සත්පුරුෂයන් විසින් අභිමතයිද මහා
73 කරුණාඇති මෙතේ බෝසත්තෙමේද බුදුබව පිණිස කල්
බලමින් තුසිපුර වෙසෙ” යි වදාළසේක.
74 මහප්‍රාඥ ඇති රජතෙමේ තෙරුන් බස්අසා මහසැය බල
75 මින්ම හොත්තේ ඇස්පියා ගෙලිය. එකෙණෙහිම මෙසින්
චුතව තුසිතපුරයෙන් එලවූ රියෙහි ඉපිද සිටගත්තෝය.
76 දිව්‍ය දෙහඇත්තේ කළපින්කම් හුගේ එල දුටුයේය. මොහ
77 වට සරහනලද තමා අත්බැව් මහජනයාට දක්වනුසඳහා
රථයෙහි සිටගෙණම මහසැය තුන්යලක් පැදකුණුකොට
78 සැයත් සඞ්ඝයාත් වැද තුසිපුර ගියේය—නාටකස්ත්‍රීහු
මෙහි අවුදින් යම් තැනෙක්හිදී (මළරජහු) ඔටුනත ගැල
79 වූද ඒ මෙහි කළ සාලාතොමෝ මකුට මුක්තශාලායි නම්
විය. රජහු සිරුර දරසැයෙහි තැබූකල්හි මහජනතෙමේ
80 යම්තැනෙක්හිදී හැඬූයේද එහි සාලාව රාවවර්තී නම්විය.
යම් නිස්සිම මාලකයෙක්හි රජහුගේ සිරුර දැවූද මෙහි එම
මාලකය රජමාලකයයි කියනුලැබේ.
81 රාජනාමයට යොබනාවූ ඒ දුටුගැමුනු මහරජතෙමේ
82 මෙතේ බුදුහුගේ අගසව් වන්නෝය. රජහු පියතෙමේ ඒ

Digitized by Google

බුදුනූ පියද මවුහොමෝ මවුද වෙත්, මල් සැදෑහැතිස් රජ
83 දෙවනහට වන්නේය. ඒ දුටුගැමුණු රජු පුත්වූ ප්‍රසිද්ධ
සාලිරාජ කුමර මෙතේ බුදුනූ පුත්වන්නේය.
84 යමෙක් මේ ආකාරයෙන් කුසල්ම උතුමැයි සිතාගෙණ
පින්කෙරේනම් ඒතෙමේ බොහෝවූත් අනියම් පාපයන්
වසමින් සියගෙට සෙයින් දෙව්ලොව යෙයි. එහෙයින් නුවණ
ැත්තෝ පින්කම්හි නිති ඇලුනෝ වන්නෝය.

මෙතෙකින් සුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහා
වංශ තුසිතපුරගමන නම්වූ දෙතිස්වන අධ්‍යාය නිමි.

33 වෙනි පරිච්ඡේදය.

1 දුටුගැමුණු රජහුගේ රජයෙහි ජනයා පිනාගියෝද්වූහු.
2 සාලි රාජකුමාරයයි ප්‍රසිද්ධවූ පුතෙක් ඒ රජහට ඇතිවිය අති
ශයින් වාසනාවන්තය, හැමකල පින්කම්හි ඇළුනේවී, හේ
3 ඉතා ලාවන්‍ය රූඇති චණ්ඩාලියක් කෙරෙහි ඇලුනේය. පූර්ව
ජාතියෙහි සම්බන්ධවූ ඒ අශෝකමාලා දේවිය රූබැවින් අති
ශයින් ප්‍රියකරනෙන් රජය නොම පැතිය.
4 එහෙයින් දුටුගැමුණු රජහු මල් සද්ධාතිස්ස කුමර ඔහු
ඇවෑමෙන් අභිෂේක කරණ ලදුයේ, සම අටළොස් හවු
5 රුදුක් රජය කෙළේය. සැදැහැ ගෙයින් කරණලද සද්ධා
6 තිස්ස යයි නම්ඇති හේතෙමේ මහසෑ පිළිබඳ සත්කම්ද
සුණුකම්ද ඇත්පවුරද කරවීය. මනාකොට සැදුම්ලද
ලොහොපායතෙමේ පහනකින් දැයේය. ඒ පහය නැවත
7 ඒතෙමේ සත්මහල්කොට කරවීය. එකල්හි ඒ පහය අනූ
ලක්ෂයක් අගණේවී. ඒ රජතෙමේ දක්ෂිණගිරි විහාරය
8 කල්ලක ලෙන කුළුඹාල විහාරය එසේම පෙතගවැලි
9 විහාරය වෙලගවැටිය දුබ්බිල්වැතිස් විහාරය දුරතිස්වැව
එසේම මාතුවිහාරය දීගාවැව දක්වා යොදනෙන් යොද
10 නෙහි විහාරද කරවීය. දීගාවැ වෙහෙරද සැයක් සහිත
කොට කරවීය. ඒ සැය වසා එලන සත්රුවන් ඇවුනු
11 සැටවායක් කරවීය. රියසක් පමණඇති ගින්කළු රන්මල්
කරවා ඒ දැල සත්ධියක්පාසා ඇමිනවීය. පරාහිගවකරවූ

12 ඒ රජතෙමේ සුවාසූදහසක් ධම්මස්කන්ධයන්ට සුවාසූදහ
13 සක් පූජාද කරවී. ඒ රජතෙමේ මෙසේ නොයෙක් පින්
කොට ශරීර භේදයෙන් පසු තුසිදෙව්යන් කෙරෙහි උපන්
නේයි.

14 සැදැහැතිස් මහරජු දීගාවැව වසනකල ලදුතිස් නම්
15 දෙටුපිත් ගිරිකුම්භිල නම් රම්‍ය විහාරය කරවීය. ඒ රජහු
බාල පිත් ථූලථන නම් කුමාරතෙමේ කඳුර නම් විහාරය
16 කරවීය. ථූලථන කුමර හාතාවූ දුටුගැමුනු රජුවෙත එන
පියාතන් සමගව තමන් කළ විහාරයාගේ සඞ්ඝභොග
17 පිණිස ආයේය. සැදැහැතිස් මහරජු මළකල සියලු ඇමැති
18 යෝ ථූපාරාම විහාරයෙහි රැස්වූවෝ සියලු භික්ෂු සඞ්ඝයා
රැස්කොට රට රක්නා පිණිස සඞ්ඝානුමතියෙන් ථූලථ
19 න කුමරහු අභිෂෙක කළහ. ලදුතිස් කුමර ඒ අසා මෙහි
අනුරාපුර අවුදින් උහු අල්වාගෙණ තෙමේ රජයකරවී.
ථූලථන රජ විතාහි එක්මස් දසදිනක් (රජයකෙළේය)

20 ලදුතිස් රජතෙමේ තුන්හවුරුදුක්ම සඞ්ඝයා කෙරෙහි
ගෞරව නැතිව වැඩිමල් පිළිවෙළ නොදනෙත'යයි ඒ
21 සඞ්ඝයාට පරිභාෂණය කෙළේය. පසුව රජතෙමේ සඞ්ඝයා
ක්ෂමාකරවා දඩුවම් පිණිස තුන්ලක්ෂයක් (කහවණු) දී
22 මහසෑයෙහි සෙල්මුවා මල්අසුන් තුනක් කරවීය. වැලි
ඒ භූමීශ්වරතෙමේම ලක්ෂයකින් මහසෑ ථූපාරාම අතර බිම
23 සම්කොට ගොඩකරවීය. තවද ථූපාරාමයෙහි සෑයම ගලින්
24 උතුම්වූ දාගොබක්ද කරවී. ථූපාරාමයට පෙරදිග ගල්ද
ගැබද භික්ෂුසඞ්ඝයාහට ලජ්ජික නම් (තමා නමින්) ආසන
25 සාලාද කරවී. සෑගිරි වෙහෙර කටුසෑගෙහි ලක්ෂයක්දී
26 සෙල්මුවා දාගොබක්ද කරවී. එම රජතෙමේ ගිරිකුම්භිල නම්
විහාර පූජායෙහි සැටදහසක් භික්ෂූන්ට තුන්සිවුරු දෙවී.
27 රිටිගල විහාරය එසේම කඳුරහිනක නම් විහාරයද කරවී.
28 ගුණුබුර භික්ෂූන්ට බෙහෙත්පස දෙවී. කුමක් කැමැතිදැයි
විචාරා කැමැති දෑයද සහල්ද භික්ෂුණීන්ට දෙවීය, ඒ රජ
තෙමේ මේ නුවර නවහවුරුදු අටමසක් රජයකරවී.

29 ලදුතිස් රජු මළකල උහුමල් ඛලැංටනාග නම් රජ
30 සහවුරුදක්ම රජය කෙළේය. මේ රජ ලෝවාමහ පාය
සිසාරා ඉතා මනරම් දෙතිස් ප්‍රාසාදයක් ලොහොපායයේ
31 ශොභා පිණිස කරවීය. මනරම් රුවන්මල් නම් මහසෑය
32 හාත්පස වැලිමළු සීමායෙහි පවුරුද කරවීය. ඒ තෙමේම
කුරුඳ පාසක නම් විහාරයද කරවීය. මිහිපල්තෙමේ
අන්‍යවූත් පින්කරවීය.

Digitized by Google

33 මහාරත්තක නම් සෙනෙවිතෙමේ ඛල්ලාටනාගරජනම්වූ
34 ඒ මිහිපල්හු නුවරදීම ගත්තේය. ඒ රජු මල් වට්ටගාමිණි
35 නම් කුමර ඒ දුෂ්ට සෙනෙවියා මරා රජයකරවී——ඒ වළ
ගම්බා රජතෙමේ ස්වකීය භාතෲවූ ඛල්ලාටනාග රජහුගේ
36 ලදරු පිත්වූ මහාචූලික නම් කුමරද පුත්‍රස්ථානයෙහි තැ
බ්බ. ඒ කුමරහු මෑනිවූ අනුලා දේවියත් බිසවකොට ගත්
තේය. මේ කුමරනු පියතනතුරෙහි සිටි බැවින් (ලෝවැ
සෝ) පිතු රජයයි ව්‍යවහාර කළහ.
37 මෙසේ අභිෂෙක කරණලද ඔහුගේ රජයෙහි පස්වෙනි
මස්හිදී රුහුණුරට නකුල නගරයෙහි තිස්ස නම් අපණ්ඩිතවූ
38 එක් බමුණු චේටකයෙක් බමුණෙකු වදන් අසා දමරික
39 විය. එසේම ඔහුගේ පිරිවරද මහත්විය. සෙන් සහිත
40 දෙමළුන් සත්දෙනෙක් මහතොට ගොඩබට්හ. එකල බමු
ණුතිස් තෙමේත් ඒ දෙමළුන් සත්දෙනාත් ඡත්‍රය පිණිස
41 රජහුවෙත ලියුම් එවූහ. නීතිදත් රජතෙමේ බ්‍රාහ්මණ
තිස්සයහට "දැන්ම රජය තාගේමය තෝ දෙමළුන් ගණු
ව"යි ලියුම් යැවීය. ඒ තෙමේ මැනවැයි කියා දෙමළුන්
හා යුද්ධකෙළේය, දෙමළු ඔහු ගත්තුය.
42 ඉක්බිති ඒ දෙමළු කොලඹැල සමීපයෙහි රජුහා යුද්ධක
43 ළෝය. යුදයෙහිදී රජතෙමේ පැරදුණේ රියනැගී තිත්ථා
44 රාම වාරයෙන් පලායයි. ඒ තිත්ථාරාමය වනාහි පණ්ඩුකා
භය රජු විසින් කරවනලදුයේ, අනවරතයෙන් එක්විසි රජ
45 කෙනෙකුන් දවස තබනලද්දේම විය. පලායන ඒ රජුදක
ගිරි නම් නිගණ්ඨතෙමේ "මහකළු සිංහලයා පලායෙ"යි
කියා අතිශයින් හඬගිය. එකල මහරජ ඒ අසා 'මාගේ
මනෝරථය මුදුන් පැමිනිකල මෙහි වෙහෙරක් කරවනෙන
46 මැ"යි මෙසේ සිතුයේය. ගැබ් සහිත අනුලා දේවිය රක්ෂා
කටයුතුතීයයි හැරගත්තේය. එසේම රුකෂා යුත්තේයයි
47 සියා මහාචූල මහානාග කුමරුන් දෙදෙනාත් ගත්තේය,
රථයාගේ සැහැල්ලුබව පිණිස යහපත් සිළුමිණක්දී, මිහි
48 පල්තෙමේ සොමදේවිය ඇයගේ අනුමතියෙන් රථයෙන්
බැස්වීය. යුදපිණිස ගමන්හිදීම පරාජයෙහි ශඞ්කාඇ
49 නොත් පුත්‍රයන්හා දේවීන් දෙන්නා ගෙන්වාගෙණ බුදුන්
වැලදූ ඒ පය ගෙන්වාගන්ට නොහැකිව නික්මුනේය.
50 පලාගොස් වෙස්සගිරි විහාරබද වනයෙහි ඒ තෙමේ සැඟ
විනි. එහිදී කුප්කකුල මහාතිස්ස ස්ථවිරතෙමේ ඒ රජු දැක
51 අනාමෘෂ්ට පිණ්ඩපාතය හැර ආහාර දුන්නේය. ඉක්බිති
පහත් සිත්ඇති රජතෙමේ වැටකේපත ලියා, ඒ විහාරයට

Digitized by Google

52 සඞ්ඝභොග දුන්නේය. එයින් ගොස් ගල්හෙබකඩ විසීය.
53 එසිහුදු පලාගොස් සල්ගල වෙත මාතුවේලඟයෙහි විසීය.
54 එහිදී රජතෙම පෙරදුටු තෙරුන් දිටීය. ස්ථවිරතෙමේ උප
55 ස්ථායකවූ තනසීවයයට මිහිපල්හු දැඩිසේ භාරකෙළේය. ඒ
රජ, රට නායකවූ තනසීවයා වෙත ඔහු විසින් උපස්ථාන
කරණලදුයේ තුදුස් හවුරුදුක් විසීය.
56 දෙමළුන් සත්දෙනා අතුරෙන් එකෙක්, මදුවක සෝම
57 දේවිය (දක ඇය) ගෙණ වහා පරතෙර ගියේය. එකෙක්
අනුරාධපුරයෙහි තුබූ බුදුහු පය ඇරගෙණ එයින් සතුටුවූ
58 යේ වහා පරතෙර ගියේය—පුලහත් නම් දෙමළතෙමේ
බාහිය නම් දෙමළා සෙනෙවි කොට තුන්හවුරුදක් රජය
කෙළේය. බාහියතෙමේ ඒ පුලහත්තයා ගෙණ දෑවුරුද්දක්
59 රජය කෙළේය. පණයමාරතෙමේ ඔහු සෙනෙවි විය.
පණයමාරතෙමේ ඒ බාහිය නම් දෙමළ රජු ගෙණ සත්හවු
60 රුදක් රජ විය. පිළයමාර ඔහු සෙනෙවි විය. ඒ පිළයමාර
තෙමේ පණයමාර රජු ගෙණ සත්මසක් රජවිය. දාඨිය
61 තෙමේ ඔහු සෙනෙවි විය. ඒ දාඨියතෙමේ පිළයමාර රජු
62 ගෙණ අනුරාධ පුරයෙහි දෑවුරුදක් රජවිය. මෙසේ ඒ
63 දෙමළ රජුන් පස්දෙනාගේම (රාජ්‍යය) තුදුස් හවුරුදක්හා
මතෙහි සත්මසක් විය.
64 තනසීවයා කිරිඳ නිවාප පිණිස කන්දෙහි ගියාවූ අනුලා
දේවියගේ පැසෙහි පයින් පහලාය. ඕතෙමෝ කිපී හඬ
65 මින් රජුවෙත එළඹියාය. ඒ අසා ඒ තනසීවතෙමේ දුනන
ගෙණ නික්මිනි. දේවිය බස් අසා උහුගේ ඊමෙන් පෙරතුව
66 රජතෙමේ කුමරුන් දෙනනාද දේවියද ගෙණ එතැනින්
පිටත්විය. මහාසීවතෙමේ දුනන සරහාගෙණ එනනාවූ
67 සීවයා විද්දේය—රජතෙමේ (මම වළගම්බා රජයෙමි
68 නමා) නම අස්වා ජනයා එකෙකළේය. මහත්වූ යෝධසම්ම
තවූ ඇමැතියන් අටදෙනෙක්ද ලැබූයේය. රජහුගේ පිරී
වරද මහත් පෙළහරද ඇතිවී. මහත් යසස්ඇති රජතෙමේ
69 කුම්හිලක මහාතිස්ස තෙරුන් දැක, වලස්ගල් විහාරයෙහි
70 බුද්ධපූජාව කරවීය. මළුව ශුද්ධකරණු පිණිස නැංගාවූ කපි
සීස නම් ඇමතියා බස්නාකල දේවිය සමග රජතෙමේ උඩ
71 සැමළුවට නැගෙමින් මග හිඳගත්තාහු දැක "හොතොත්
නොවේය" සි කිපී කපිසීසයා මැරවීය. ඒ කරණකොට
72 ගෙණ සෙසු සත් ඇමැතියෝද රජුහා කලකිරුණාහු, රජහු
වෙතින් පලාගොස් කැමැති පරිදෙන් යන්නාහු මඟදී
73 සොරුන් විසින් කොල්ලකන ලදාහු හබුගල් වෙහෙරට

Digitized by Google

වැද බහුශ්‍රැතවූ තිස්සස්ථවිරයන් දුටුහු. චතුර්නිකාය
74 හදාළ ඒ තෙරණුවෝ ලත්සැටියෙන් වස්ත්‍රය පැනිය තෙල්ය
සහල්ය යනආදීගනතුක උපකාරයන් දෙවිය. එසේම ඒ ස්ථ
75 විරතෙමේ "නොසුව කාලයෙහි කොයි යවුද" යි විචාළේය.
ඒ ඇමැතියෝ තමන් (අසවල්ලුයයි) ප්‍රකාශකොට එපවත්
දැන්වූහ. (තෙරුන් විසින්) "බුද්ධශාසනානුග්‍රහය කවුරුන්
76 හා කරවන්ට හැකිද? දෙමළුන් කැටිවද නොහොත් රජු
කැටිවද" යි විචාරණලද ඒ ඇමැතියෝ "රජහු කැටිව
77 හැකකැ" යි කීවෝය. මෙසේ ඔවුන් කටයුතු හඟවා තිස්ස
මහාතිස්ස යන තෙරුන් දෙදෙනා ඇමතියන් ගෙණ
එතැනින් රජුවෙතට පමුනුවා උන්හුන් කමාකරවූහ.
78 රජතෙමේද ඒ ඇමැතෙතෝද මෙසේ ඒ තෙරුන් යාච්
ඤාකරණනාහු "කර්ම සඵලවූකල එසේම දූතයන් එවූ
79 කල අපවෙත අවමැනවැ" යි යාච්ඤාකළෝය. ඒ තෙරහු
80 ප්‍රතිඥාදී යථාස්ථානයට ගියෝය. මහා යසස්ඇති රජ අනුරා
පුර අවුත් දාඨික දෙමළහු මරා තෙමේ රජය කරවිය— ඉක්
81 බිති මිහිපල්තෙමේ ඒ නිගණ්ඨාරාමය විධ්වංසනය කරවා
එහි දොළොස් පිරිවෙණක් ඇති විහාරයක් කරවී. මහා
විහා රය පටන්ගැත්තෙන් හවුරුදු දෙසියසතළොස් දසමස්
82 දසදිනක් ඉක්මුනුකල (තුන්රුවන්හි) ගෞරවඇති ඒ මිහි
83 පල්තෙමේ අභයගිරි විහාරය පිහිටවිය. ඒ තෙරුන් දෙ
දෙනා කැඳවා උන්වහන්සේලා අතුරෙන් පූර්වෝපකාර
84 කවූ මහාතිස්ස තෙරුන්ට මානදෑයක රජතෙමේ ඒවිහා
රය දුන්නේය— යම්හෙයකින් ගිරිනම් තැනැත්තාහුගේ
85 ආරාමයද යම්හෙයකින් අභය රජතෙමේ විහාරය කරවීද,
එහෙයින් නමින් අභයගිරියයි කියාද ඒ විහාරය විය.

ඒ රජතෙමේ සෝමදේවිය ගෙන්වා යථාස්ථානසංඛ්‍යාතවූ
86 සිය තනතුරෙහි පිහිටවිය. ඒ බිසවුන්ගේ එම නම් කොට
සෝමාරාමය කරවිය. ඒ උත්තමාගනා තොමෝ චනාහි
87 රථයෙන් බස්වනලද්දී එතැන කදඹපුෂ්ප ගුල්පයෙහි
සැඟවී හුනනා අතින් මාගීගය වසාගෙණ මූත්‍රකරණ සාම
88 ණේරකෙනෙක් දුටුවාය. රජතෙමේ ඒ බිසවුන් බස්අසා
89 මහසෑයට උතුරැදිග උස්බිම්ඇති ගල්හෙබ්කඩනම් සෑයද
විහාරයක්ද එහි කරවිය.

ඒ සත්යොධයන් අතුරෙන් උත්තිය නම් තැනැත්තෝ
90 නුවරට දකුණුදිගින් දක්ෂිණ නම් විහාරයක් කරවිය. මූලව
91 තෙමේද එහිම විහාරයක් කරවිය. මූල නම්වූ ඇමැති
තෙමේද විහාරයක් කරවිය. එහෙයින් ඒ විහාරයද 'එම

Digitized by Google

නම් ඇතිවිය. සාලිය නම් ඇමැතිතෙමේ සාලියාරාමය කර
92 විය. පබ්බත නම් ඇමැතිතෙමේ පබ්බතාරාමය කැරවිය.
තිස්සාමාත්‍යතෙමේ තිස්සාරාමය කරවිය.

93 රම්‍යවූ විහාරයන් කොට නිමවා ඒ ඇමැතියෝ තිස්ස
තෙරුන්වෙත එළඹ "ඔබවහන්සේලාගේ උපකාර සාමා
ර්ථ්‍යයෙන් අපවිසින් කරවනලද්දාවූ විහාරයන් ඔබවහන්
94 සේලාට දෙමුය" යි කියා පුදනෝය. ස්ථවිරතෙමේ හැමතන්
හිම සුදුසුපරිදෙන් ඒ ඒ භික්ෂූන් වැස්වූසේක.

95 ඇමතියෝතුමූ ශ්‍රමණසාරූප්‍ය නානාප්‍රකාර පරිෂ්කාර
යන් සඞ්ඝයාට පුදනෝය.—රජතෙමේ සියවෙහෙර වසන්
96 නවුන් නොඅඩු සිවුපසයෙන් උපස්ථාන කෙළේය. එහෙ
සින් ඒ භික්ෂූහු බොහෝ වූහ.—මහාතිස්සයයි ප්‍රසිද්ධවූ
97 කුලයන්හා සංසර්ගඇති ඒ තෙරහු කුලසංසර්ග දෝෂය
කාරණකොටගෙණ සඞ්ඝතෙමේ මේ මහවෙහෙරින් නෙර
98 පිය. ඒ තෙරුන් ශිෂ්‍යවූ බහලමස්සු තිස්සස්ථවිරයයි ප්‍රසිද්ධවූ
99 තැනැත්තේ කිපියේ අභයගිරියට ගොස් පක්ෂය උසුලන්
නේ හෝ පක්ෂපාතව එහි විසීය. එතැන් පටන් ඒ භික්ෂූහු
100 මහාවිහාරයට නොඅවූය. මෙසේ ඒ භික්ෂූහු ථෙරවාදයෙන්
වෙන්ව දෙපරිද්දකින් බිඳුනාහ. දිව්වැසි ඒ මහාඅභය
101 ගිරිභික්ෂූන් වඩන්ට ඒ වළගම්බා රජතෙමේ ප්‍රාපති නම්
102 වැටුප් දෙවිය. "මෙසේ නවකම් කිරීම (සුව) වන්නේය" යි
103 සිතා පනතිබැඳි විහාරයා පිරිවෙන් කරවීය.—ත්‍රිපිටක
පාලියද එහි ඒ අර්ථකථාවද මහා ප්‍රඥඇති පූර්වක භික්ෂූහු
මුඛපාඨයෙන් ගෙණආවෝය එකල් වැසිවූ භික්ෂූහු සත්ව
104 යන්ගේ පරිහාණි දැක, ධර්මයාගේ චිරස්ථිති පිණිස පොත්හි
ලියවූහ.—වට්ටගාමනී අභය රජතෙමේ මෙසේ දෙ
ළොස් හවුරුද්දක්ද ආදියෙහි පස්මසක්ද රජය කරවී.

105 මෙසේ ප්‍රාඥ තැනැත්තෝ ඓශ්වර්ය්‍ය ලැබගෙණ පර
වැඩයා තමාවැඩ කෙරෙති; සම්පත්හි ලොල්වූ මඳබුද්ධි
තැනැත්තෝ මහත් සම්පත් ලැබත් ආත්මාර්ථ පරාර්ථයන්
නොකෙරෙති.

මෙතෙකින් සුදීජනයා පහන්සංවේග පිණිස කළ මහා
වංශ දසරාජක නම්වූ තෙතිස්වන අදියර නිමි.

34 වෙනි පරිච්ඡේදය.

1 ඒ රජහු ඇවෑමෙන් මහසිළු මහතිස්රජ තුදුස් හැවි
2 රිද්දක් දැහැමෙන් සෙමෙන් රජය කෙළේය. ඒ රජතෙමේ
"සියතින් කළ(වතින්)දෙනදන මහත් ඵලය"යි අසා, රජවූ
3 පළමු වස්හිම අප්‍රසිද්ධ වේසඇතිව (පසල්දනව්) ගොස් ඇල්
ගොයම් කපා එයින් ලත් කුලියෙන් මහාසුම්ම තෙරුන්ට
4 පිඬපාතය දුන්නේය. නැවත ක්ෂත්‍රිය කුලඇති භූමිශ්වර ඒ
රජතෙමේම සුවණ්ණගිරියෙහි තුන්හවුරුදක් උක්යත උපුලා
5 එයින් කුලී උක්සකුරු ලැබ ඒ උක්සකුරු ගෙන්වාගෙණ
6 නුවරට අවුත් භික්ෂු සඞ්ඝයාට මහදන් දුන්නේය. භික්ෂූන් තිස්
7 දහසකටත් එසේම දොළොස්දහසක් භික්ෂුණීන්වටත් වස්ත්‍ර
දන් දුන්නේය. මිහිපල්තෙමේ මොනවට පිහිටි විහාරයක්
8 කරවා භික්ෂූන් සැටදහසකට තුන්සිවුරු දෙවිය. භික්ෂුණීන්
9 තිස්දහසකටද දෙවිය. ඒ රජතෙමේ මණ්ඩවාපි විහාරයද
අබාගලද වගුපටගලද දීගාබාගලද වාලගම් වෙහෙරද
10 කරවිය. මෙසේ ඒ රජතෙමේ සැදැහැයෙන් නොයෙක්
පරිද්දෙන් පින් කොට තුදුස්වස් ඇවෑමෙන් දෙව්ලෝ
ගියේය.

11 වළගම්බා රජු පිත් චොරනාගයයි ප්‍රසිද්ධවූ කුමරතෙමේ
12 මාසිළු රජු දවස්හි දමරිකව හැසුරුණේය. මාසිළුරජු කළු
රියකළු කල අවුද්දන් රජය කරවී දුෂ්ටබුද්ධිඇති ඒතෙමේ
13 තමන් දමරිකකල යම් වෙහෙරෙක නිවාස නොලත්තේ
නම් ඒ අටළොස් විහාරයන් විධ්වංසනය කරවී. ඒ චොර
14 නාගතෙමේ දොළොස් හවුරුදක් රාජ්‍යය කරවිය. ඒ
පාපිෂ්ඨතෙම ලොකාන්තරික නිරයෙහි උපනී.

15 ඒ රජු ඇවෑමෙන් මාසිළුරජු පිත්වූ තිස්සයයි ප්‍රසිද්ධ රජ
තෙමේ තුන්හවුරුදක්ම රජය කරවී. චොරනාග රජු
16 කිසව් විසම අදහස්ඇති අනුලාදේවී බලතා කෙරෙහි
ඇළුනු සිත්ඇතනී විස දී විසමකූයා ඇති (චොරනාගරජු)
17 මැරවීය. එම බලතා කෙරෙහි ඇළුනු සිත්ඇති අනුලා
තොමෝම තිස්සරජු විසයෙන් මරවා බලතාට රජය දුන්
18 නීය. ඒ සිව නම්වූ දෙටු දොරටුපල් බලත්තෙමේ අනුලාව
මහේසිකා කොට දෙමසක් අධික හවුරුදක් ඒ නුවර
රජය කරවිය. අනුලා තොමෝම වටුක දෙමළා කෙරෙහි
19 ඇළුනි විසයෙන් සිවයාමරා වටුකයා කෙරෙහි රාජ්‍යය පැමි
20 නවී. නුවරවබු ඒ වටුකදෙමළ වනාහි අනුලාව මහේසිකා
කොටගෙණ දෙමසක් අධික හවුරුදක් නුවර රජය කර

Digitized by Google

21 විය. අනුලා තොමෝම එහි පැමිනි දරකැටියා දැක උහු
කෙරෙහි ඇළුනු සිත්ඇතිව විසයෙන් වටුකයා මරා ඔහුට
22 රජය පැමිනවී. ඒ දරකැටීතිස් තෙමේ අනුලාව මහේසිකා
කොට ගෙණ එක්මසක් අධික හවුරුද්දක් නුවර රජය කර
23 විය. ඒ තෙමේ මහමෙවුනා උයන්හි පොකුණක් කරවී.
එම අනුලා තොමෝ නීලිය නම් දෙමළ පෙරවි බමුණා
24 කෙරෙහි රාගයෙන් ඇළුනා උහුහා සංවාස කැමැත්තී ඒ
දරකැටිතිස් රජු විසදී මරවා නීලිය බමුණාට රජය දුන්
25 නාය. ඒ නීලිය බමුණුතෙමේද ඇය මහේසිකා කොට
26 ගෙණ නිතර ඇය විසින් උපස්ථාන ලද්දුයේ, මේ අනුරාපුර
යෙහි සමසක් රජය කරවී. රුචිවූ පරිදෙන් දෙතිස් බල
27 තුන් සමග වසනු කැමැති එම අනුලා බිසව විෂයෙන් ඒ
නීලියරජු මරවා තොමෝම සාරමසක් රජය කරවී.
28 මහාචූලික රජහු දෙවනපිත් මකලන්තිස් නම් ඒතෙමේ
29 අනුලාදේවියට භයව පලාගොස් පැවිදිව සිද සුදුසුකල්හි
30 ලත්බල ඇතොත් මෙහි අවුදින් දුෂ්ට මනස්ඇති ඒ අනුලා
රාජිනිය මරවා දෙවිසි හවුරුද්දක් රජය කරවිය. රජ
31 තෙමේ සෑගිරියෙහි මහපොහෝගෙය කෙළේය. ඒ ගෙට
ඉද්රියෙහි ගල්සෑයද බැදවී. ඒ තෙමේ එම සෑගිරිගල
32 බොධිවෘක්ෂයද ඉඳුවී. අතුරුගඟ තේලගාම විහාරයද
33 කරවී. එහිම වණ්ණකනම් මහමොවු ඇලද, අම්බුදුග්ග මහ
වැවද, භයෝලූපපලනම් වැවද නුවර සත්රියන්උස් පව
34 රහා එසේම පරිඛාවද (කරවිය). මහාවස්තුයෙහි නොසන්
හුන් අනුලාව ආදගනකරවා එතැනින් මදක් තොරකොට
35 මහාවස්තුව කරවිය. නුවරම පද්මස්වරවන උයනද කර
විය.—මේ රජු මවුබිසව දන්තයන් ධොවනයකොට බුදු
36 සසුන්හි පැවිද්දවූවාය. කුලසම්ප ගේනැන්හි මවු මෙහෙ
ණින්නට මෙහෙණවරක් දන්තගේහ නමින් කරවිය.
එහෙයින් ඒ දන්තධොවන මෙහෙණවරයයි ප්‍රසිඬවිය.
37 ඒ මකලන්තිස් රජු ඇවෑමෙන් උහුපිත් භාතිකාභය නම්
38 ක්ෂත්‍රියතෙමේ අටවිසි හවුරුද්දක් රජය කරවිය. මහදාඨිය
තිස් රජු සහොදර බැවින් ධාම්මික මිහිපල්තෙමේ භාතිය
39 රජැයි ලක්දිවහි ප්‍රකටවිය. ඒතෙමේ මේ ලොහොපහය
නවකම්ද කරවිය. මහසෑයෙහි පිළිකඩ දෙකද ථූපාරාම
40 යෙහි පොහෝගෙයද කරවිය. තමාට උපදනා අය විසදූ
41 නුවර යොදනක් මානය සිසාරා දූසමන් සිනිඳුමල් බොහෝ
කොට ඇතිකරවා නරශ්‍රෙෂ්ඨතෙමේ පාපිළිකඩ පටන්
42 බුරවජනුයතෝක් සතරඟුල් බොල් ගදකලලින් මහසෑය

Digitized by Google

ආලේප කරවා එහි මනාකොට නැටියෙන් මල්වඩු සැය
43 මල්ගුලාවක්සේ කරවිය. නැවතද දැහැල් බොල් මනෝ
සිලා කලලින් සැය ආලේප කරවා පෙර සෙයින්ම මල්ඇටි
44 නිම කරවිය. ඉක්බිතිද හිණිගස පටන් බුරවත්‍රය තෙක්ම
45 මල් රැසිය විසුරුවා ඒ මල්රැසින් සැය වැසීය. අබාවැවින්
යන්ත්‍රයෙන් දිය නගාගෙණ ඒ දියෙන් සැදූඇති ඒ රජ සැය
තෙමමින් ජලපූජාව කරවිය.

46 ආලේප කටයුතු හුණු සියක්ගැලක් මුතෙතන් තලතෙල්
47 හා මනාකොට ගනවා හුණුකම් කරවිය. පබළු දැලක්
කරවා ඒ සැයෙහි බහා රියසක් පමණ රත්පියුම් (තනවා)
48 සහස්‍රියෙහි සනධියෙහි අවුළුවා එතනින් බිමතෙක්ම මුතු
වැල් එල්වා පියුම්දු එහි එල්වා මහසැය පිදීය ඒ රජ
49 තෙමේ දාගැබ්හි රහතුන් පිරිත් බණන හඬඅසා "මම
එය නොදක නැගී නොසිටිනෙනම්" යි නිශ්චය කරණ
50 ලදුයේ නැගෙණහිරි ගල්මැඬුල නිරාහාරව හොනෙත්ය.
තෙරුන්වහන්සේලා දොරක් මවා ඒ රජහු දාගැප්තුළට
51 ගෙණගියහ. ඒ මිහිපල් දාගැප් ඇතුළෙහි සියල්ල දැක
බැහැර නික්මුනේ එබඳුවූම පෙනැලි රූවින් පිදීය. මහු
52 නාබුයෙන්ද ගණ පිඩයෙන්ද; (පිසුම් උපුල් කලප් එබ්බු
53 පුත්) කලසින්ද; ගණ රසයෙන්ද; අඳුන් හිරියල්හා එසේම
මනෝ සිලායෙන්ද; සැමළුවෙහි මනෝසිලා බහා ගොප්මහ
පමණ සිවිකල (පූජමල්) වස්වා ඉන්පසු අතුරු සිදුරු
54 නැතිව විනාකසතල උපුල් මලින්ද; මුළු සැමළුව ගඳකල
ලින් පුරා එහි සිතියම් පැදුරු සිදුරෙහි අවුනනලද උපුල්
55 මලින්ද; එසේම සැමළුව සොරෙවු අවුරා පිරවූ ගිතෙල්හි
නොයෙක් පටපිලි වැටියෙන් දල්වූ පහනින්ද; එසේම මී
56 තෙල්හිද තලතෙල්හිද එපරිද්දෙන්ම පටවැටියෙන් දල්
වනලද බොහෝවූ පහනින්ද; (පූජකෙළේයි)—ක්ෂත්‍රිය
57 තෙමේ තිපරිදිවූ මේදෙසින් වෙන් වෙන්ව සත් සත්වර
බැගින් දාගැප් පූජාව කෙළේය.

58 අවුරුදුපතා නියමකොට කරවනලද උතුම්වූ සුණුපිරි
යුම් මඟුලය, එසේම ජයමහාබොධිය බොධිස්නානපූජය,
59 අටවිස්සක් මහ වෙසක්පූජය, නොමහත්කොට සුවාසූ දහ
60 සක් පූජය, නානාවිධවූ නැට්වුවන් විසින් කරණලද නැටුම්
හා නානාප්‍රකාර පවාහිත තූර්‍ය්‍යනාදය; යන පූජාවගියය
ශ්‍රද්ධාවෙන් යොදවනලද රජතෙමේ මහසැයෙහි පැවැත්
61 වී. දවස තුන්යලක් බුද්ධොපස්ථානයට ආයේය, ඒ තෙමේම
62 නියතකොට දෙවරක් මල්පූජායෙහි බෙර ගැසිරවී. පෙළ

ශර දානයද පවාරණ දානයද නියම කොට තෙල් පැනි
වස්ත්‍රාදිය ශ්‍රමණසාරූප්‍ය පරිෂ්කාරය සඞ්ඝයාට බොහෝ
63 කොට දුන්නේය. ක්ෂත්‍රියතෙමේ සෑයෙහි පිරියම් පිණිස ඒ
සෑයට ක්ෂෙත්‍රයන්ද පූජාකෙළේය. තවද ඒ භූමිශ්වර
64 තෙමේ සෑගිරි වෙහෙර භික්ෂූන් දහසකට හැමකල සලාක
65 බතුත් දෙවිය. චිත්‍රප්‍රාසාද මණිප්‍රාසාද මූවෙලප්‍රාසාද නම්
උපස්ථාන කරණ තැන්හිද; එසේම පද්මස්සර ප්‍රාසාදය
66 මනෝරම්‍ය ඡත්‍රප්‍රාසාදය යන පස්තැන්හි හැමකල බණ
යෙහි ගෞරවඇති ඒ තෙමේ ගුණධුරයෙහි යුක්ත භික්ෂූන්
67 ප්‍රත්‍යයෙන් උපස්ථානකෙළේය. ඒ භාතිකාභය මිහිපල්
තෙමේ පූරාණ රජුන් විසින් නියමකරණලදුවූ සම්භිසි
සඟුන් පිළිබද දෙයෙක් වීනම් ඒ සියලු පින්කම් කෙළේයි.

68 ඒ භාතියරජු ඇවෑමෙන් උහුමල් මහදැළියා මහානාග
69 තෙමේ නන්පින්කම් පරමාර්ථකොට ඇත්තේ දෙළොස්
70 හවුරුද්දක්ම, රජය කරවිය. මහසෑ මළුවෙහි කිජල්ක
පාෂාණයන් ඇතිරවිය, මළුව මහත්කරවා වැලිමළු සීමාවද
71 කරවිය. ලක්දිව සියලු විහාරයන්හි දහම් අසුන් කරවිය.
72 රජතෙමේ අඹතලා මහසෑය කරවිය. ගෙපල බිඳවැටෙන
කල බුදුගුණ මෙනෙහිකොටගෙණ තෙමේ එහි හෙව
ස්ථිය ප්‍රාණය පරිත්‍යාගකොට එහි සෑභූමිය නවත්වා සෑය
73 පිහිටුවා, සතර දොරටුයෙහි දක්ෂ සිල්පීන් විසින් මොනවට
බෙදනලද නන්රුවනින් හෙබියාවූ රුවන්ඇගෑ සතරක්
74 තැබවිය. නන්රුවනින් කළ සැට්ටයක් සෑයෙහි බහා
පලඳවා, ඒ සැට්ටයෙහි රන්බුබුළුහා එලෙන මුතුදැල්ද
තැබවී.

75 සෑගිරිය අවට යොදනක් මානය සරසවා, හාත්පස මනා
76 වීථිඇති සතරදොරටුවක් යොදවා, වීථි දෙපලයෙහි සල්පිල්
77 අතුට කොඩිඇගෑ තොරණින් තන්හි තන්හි සරසවා, හාත්
පසින් පහන්මාලා ආලෝක කරවා, නැට්වුම්වන්ලවා නැටුම්
78 හා ගීතවාදිතයන්ද කරවිය—කොළොම්තොට පටන්
සෑගිරියතෙක් මාර්ගයෙහි දෙව් පසින් යනුපිණිස, ඇතිරිලි
79 ඇතිරවීමද කරවිය. නැටුම් ගීවැයුම් සහිත නාන
80 යද, එහි කරවිය. නුවර සතරදොර මහදනුත් දෙවිය. අතුරු
නැති පහන්මාලාවන් මුළුලක්දිවහිද, හාත්පස යොදනක්
81 මානයෙහි මුහුදු දියෙහිද පැවැත්විය. ඒ රජහු විසින් සෑ
පෙලහරෙහි කරවන ලදුවූ මනාවූ උදාරවූ ඒ පූජාතොම
මෙහි ගිරිභණ්ඩ මහාපූජායයි කියනුලැබෙ.

82 රජතෙමේ ඒ පූජාසමාගමයෙහි රැස්වූ භික්ෂූන්ට අට
83 තැනෙක දන් තබ්බවා, එහි තබ්බවනලද අට රන්බෙරන්
84 ගස්වා, සුවිසිදහසකට මහදන් පැවැත්වීය. ෂට්දකාර
සිවුරු දුනෝය. අඬු බන්ධනාදියෙන් බඳනාලද්දවුන්ගේ
මුක්තියද කරවීය. සතර දොරටුයෙහි කරනැවැමියන් ලවා
85 හැමකල කරකම් කරවීය. මේ රජ පෙරරජුන් විසින් තබන
ලද්දවූද, එසේම බෑයාවිසින් තබනලද්දවූද, පින්කම්
86 සියල්ල නොපිරිහෙලා කරවීය. තමාගේ බිසවිය කුමරුන්
දෙනාගේ මඟුලැත්ය මඟුලස්ය සඞ්ඝයා විසින් වලකනු
87 ලබනෝම සඞ්ඝයාට දුනෝය. ඒ තෙමේ භික්ෂු සඞ්ඝයාට
සලක්ෂයක් අගනාවූද භික්ෂුණී සඞ්ඝයාට ලක්ෂයක් අගනා
88 වූද (පිරිකර) දුනෝය. විධානයෙහි පණ්ඩිතවූ රජතෙමේ
නන්වැදෑරුම් සරුප්බඩු දී, තම්හුත් සෙසහුත් සඞ්ඝයා
89 ගෙන් මුදාගත්තේය. ජනාධිනාථතෙමේ (රුහුණු ජනපද
යෙහි) කාලායන කණ්ණිකං නම් තැන මණිනාපව් නම්
විහාරයක්ද, එසේම කලන්‍ද නම් විහාරයක්ද කරවීය. කුඹුක්
90 බන්ධන නම් ගෝතෙර මුහුදුවිහාරයද, රුහුණම හුවාව
කණ්ණික නම් තැන චූලනාග නම් විහාරයද (කරවීය.)
91 ක්ෂත්‍රිය කුලඇති ම්හිපල්ලොමේ ගල්දිවසින්හි තමාවිසින්
92 විහාරයක් කරවූකල පැන් එලවූ හෙරෙණ කෙනෙකුගේ
93 ආචාරයෙහි පැහැද විහාරය සිහාරා අටයොදනක් ඒ විහාර
යට සාඞ්ඝිකකොට දුනෝය——ඒ ක්ෂත්‍රිය තෙමේ පඹුවැ
වෙහෙරද හෙරණ කෙනෙකුට තුටුවූයේ, විහාරයද එසේම
සඞ්ඝයා කෙළෙහි භොගයද දෙවීය.
94 මෙසේ මහනැණැත්තෝ අතල්ප සම්පත්ලැබ මද ප්‍රමාද
දෙකින් තොරවූවෝ, එසේම කාම ආසාවෙන්ද තොරව
ජනයාට දුක්නොකොට පින්කම්හි ඇලුම්ඇත්තාහු සුප
සන්වූවාහු මහත්වූ නානා පින්කම් කරන්නාහුය.

මෙතෙකින් සුදිජනයා පහන්සංවෙග පිණිස කළ මහ
වංශ ඒකාදසරාජදීපන නම් සූතිස්වන අදියර නිමි.

---

35 වෙනි පරිච්ඡේදය.

1 මහදැළියාරජු ඇවෑමෙන් එම රජු පුත් ආමණ්ඩගාමනී
2 අභයරජ නවහවුරුදු අටමසක් රජය කරවීය. මනරම් මහ
සෑයෙහි ඡත්‍රය මතුයෙහි ඡත්‍රයක් කරවීය. එහිම පාපිළි

Digitized by Google

3 කඩහා මුදුන් පිළිකබද කරවිය. එසේම ලෝවාමහ පායෙ
හිත් ථූපාරාම පොහෝ ගෙහිත් ඇතුල් මිදුලහා ඇතුළ
4 ආලින්දයද කරවිය. දෙතැනම මනා රුවන්මඩුද කරවිය.
නරශ්‍රෙෂ්ඨතෙමේ රිදීලෙන් විහාරයද කරවිය. පූර්ණකරණ
5 යෙහි දක්ෂ ඒ තෙමේ මාගම්හි දකුණුදිග වැව කරවා,
දක්ෂිණ විහාරයට පුදෙයාය. ජනශ්‍රෙෂ්ඨතෙමේ ලක්දිව
6 මුළුලෙහි මාඝාතය හෝ සතුන් නොමරවයි යන වෘව
7 ස්ථාව කරවිය. ඒ ආමණ්ඩිය රජ එල උපදනා සියලු ලතාවන්
ඒ ඒ තන්හි රෝපණය කරවා (එල එකොකාට) මස්කොමඩු
නම් දනයක් පාත්‍රය පුරවා වසනු ඹුඹුළුවක් කොට අතිශය
8 පහන් සිතින් දෙවිය. (යම් හෙයකින්) පාත්‍රයෙහි පුරවා
(දන්පුන්නේද) එහෙයින් ලෝවැසෝ ආමණ්ඩගාමනීයයි ඔහු
දතහු.
9 ඔහුමල් කණිජ්ජණුතිස්ස කුමර බෑයා මරා, තුන්හවුරුද්
10 දක් නුවර රජය කරවිය. ඒ රජ සෑගිරි පොහෝගෙහි අධි
කරණය විනිශ්චය කෙළේය. (එසින් කිපි) රාජපරාධ කර්ම
11 යෙහි හෙවත් රජු මරනාගමෝයයි සම්මතකරගත් දුස්සිල
සැටක් පමණ භික්ෂූන් රජතෙමේ වරද ගිව්ස්වා අල්වා
12 ගෙණ සෑගිරියෙහි කණිර නම් ප්‍රාග්භාරයෙහි දැමවී—
කණිරජාණු රජු ඇවෑමෙන් ආමණ්ඩගාමනී පින් චූලාභය
13 කුමර එක්හවුරුදක් රජය කරවිය. ඒ මිහිපල්තෙමේ නුව
රින් දකුණුදිග ගෝණක නම් හෝතෙර ඉළුගල් වෙහෙර
14 කරවිය. චූලාභය රජු ඇවෑමෙන් ඒ රජු නැගෙණිවූ
ආමණ්ඩරජ දූවූ සීවලී කුමරිය සාරමසක් රජය කරවී.
15 ආමණ්ඩරජු බෑනතෙමේ ඒ සීවලී කුමරිය ඉවතලා ඉළ
16 නාගයයි යන නමින් නුවර සේසත් නැගීය. ඒ රජු රජ
පැමිනි හවුරුදුයෙහි තිසාවැව් ගියකල බොහෝ ලම්බකර්ණ
17 යෝ රජු හැර නුවරට අවුය. රජතෙමේ ඔවුන් එහි නො
දැක කිපියේ, වැව්පසෙක මහසෑයක් උන්ලවා, මඩවමින්
18 තෙමේම කරවිය. සැඩොලුන් ඔවුන් විචාරනාන්කොට
තැබ්බවී.
19 එසින් කිපි ලම්බකර්ණයෝ සියලල එක්ව, ඒ රජු අල්වා
ගෙණ සියගෙහිම සිරකොට තබා, තුමූම රජය විචාළෝය.
20 එකල රජහු දේවිතොමෝ සියපිත් සඳමුහුනුසිව නම් ලදරු
කුමරහු සරසවා තිරිමවුන් අතෙහි තබා මගුලැතු වෙතට
21 හසුන්දී යැවූවාය. ඒ තිරිමවුහු කුමරු එහි ගෙණගොස්
බිසව් පණිවුඩ සියලලු මගුලැතුට කිවූය. "මේ තෙමේ
22 තාගේ ස්වාමීන් පිත්‍රය, ස්වාමීතෙමේ සිරගෙහි සිටියේය, මේ

Digitized by Google

කුමරහු සතුරන් විසින් මැරීමට වඩා තාවිසින් මැරීම උතුම
23 එහෙයින් මොහු මරව, මේ දේවීන්ගේ බසැ" යි කියා ඇතු
24 පාමුල්හි ඒ කුමරහු හෙවූහ. ඒ ඇත්තෙමේ දුක්වූයේ හඬා
ඇත්හල බිඳගෙණ මහාවශතුවට නෝ රජගෙවුයනට
25 වැද උත්සාහයෙන් දොර බිඳහෙලා, රජහු හුන්තැන්හි
දොර උපුටා, ඒ රජු පිට හිඳුවාගෙණ, මහතොටට එළඹි
26 යේය. එහිදී ඇත්තෙමේ රජහු නැව්නගා, තෙමේ බටහිරි
මුහුදුතෙරින් මලයරටට නැ.ගේය.
27 ඒ රජතෙමේ තුන්හවුරුඇක් පරතෙර වැස නැවින් බල
සෙන් ගෙණ රුහුණුරටට පැමිනියේය. මිහිපල් තෙමේ
28 සකුරුහෙබ නම් තොට ගොඩබැස ඒ රුහුණු ජනපදයෙහි
29 මහබලසෙන් කැටිකෙළේය. රජහුගේ යටකි මඟුලැත්
තෙමේ ඒ දකුණු මලයරටින් රජහු කටයුතු කරණු පිණිස
30 රුහුණටම එළඹියේය. ඒ ජනපදයෙහි තුලාධාර පව්වත
විහාරවාසී ජාතකභාණී මහාපදුම නම් මහතෙරහු වෙත
31 කපිජාතකය අසා බෝසතුන් කෙරෙහි ප්‍රසනනවූ ඒ රජ
නාගමහා විහාරය බන්ධනමුක්ත දුතු සියයක් කොට කර
32 විය. සැයද තුබූපරිඡෙදන් වැඩූයේය. තිසාවැවද එසේම
දුරතිස්වැවද කරවීය.
33 ඒ රජ බලසෙන් ගෙණ යුදපිණිස නික්මියේය. ඒ අසා
34 ලම්බකණ්ණයෝද යුදපිණිස රැස්වූය. කබල්කඩදොර සකර
35 පිටි කෙත උතුන් පෙළුන දෙපක්‍ෂයාගේ යුඩය පැවැත්
තේය. නැව්හිදී කළානත දෙස ඇතිබැවින් රජහුගේ
මිනිසුනු දුර්වල වෙති, එහෙයින් ඒ රජතෙමේම (මම ඉළ
36 නාග රජයෙම්) නම අස්වා යුඩයට වශොපාය. එයින් භයවූ
ලම්බකණ්ණයෝ මුනින් ඔත්ත. ඒ තෙමේ ඔවුන්ගේ හිස් රථ
37 නාභියතෙක් සිඳ කැටිකෙළේය, තුන්යලක් මෙසේ කළ
කල මිහිපල්තෙමේ කරුණ උපදවා "නොමරා ජීවග්‍රාහ
යෙන් ගණිවිය" යි කියේය.
38 ඉක්බිති දිනූ සඞ්ග්‍රාමඇති මිහිපල් තෙමේ නුවරට අවුත්,
39 සේසත් නගා තිසාවැව කෙළියට ගියේය. දියකෙළියෙන්
ගොඩනැගී මොනවට සැදපැලඳියේ තමා ශ්‍රීසම්පත් දැක
40 ජට අන්තරාය කරවූ ලම්බකණ්ණයන් මෙනෙහිකොට කිපියේ
රථයෙහි යෙදූයේය. රථ පිළිවෙළින් ඔවුන්ට පෙරතුව
41 නුවරට වශොපාය. රජගෙවුයන් එළිපත සිට ඒ රජතෙමේ
"පින්වත්නි මොවුන්ගේ හිස් මේ එළිපතදීම සිඳිවිය" යි
අණකෙළේය. ඉක්බිති මැතියන් විසින් "රථ ශ්‍රෙෂ්ඨයා
42 නෙති මොංච්හු තොපගේ රථයෙහි යොදනලදූවූ ගොන්
43 නුය, එහෙයින් මූන්ගේඅංගා කුර සිඳුව" යි මෙසේ සගවන

Digitized by Google

ලද රජතෙමේ ශිරශ්ඡේදය නොකොට නාසයත් පය
44 මහපට ඇඟිලිත් කැපෙවී. රජතෙමේ ඇතුළුවූ ජනපදය
ඇතුළට දුන්නේය. එහෙයින් නමින් හත්ථිභෝග ජනපද
45 යයිවී. මෙසේ ක්ෂත්‍රිය ගොත්‍රඇති ඉළනාග මිහිපල්තෙමේ
අනුරාධ පුරයෙහි නොහඩු සහවුරුද්දක් මුළුල්ලෙහි රජය
කරවී.

46 ඉළනා රජු ඇවෑමෙන් උහුපුත් චන්ද්‍රමුඛසිව රජ අටනවූ
47 රුදු සත්මසක් රජය කරවී. ඒ මිහිපල් මණිකාරගම වැවක්
48 කරවා ඉසුරුමුනි විහාරයට පිදීය. දෙමළ දේවියයි ප්‍රසිද්ධ
ඒ රජහු බිසව්ද ඒ ගමෙහි තමහට උපදනා ලාභය එම
වෙහෙරට පිදුවා.

49 ඒ සඳමුහුණු රජු තිසාවැව් කෙළියෙහිදී මරා, යසලාලක
50 තිස්සයයි ප්‍රසිද්ධ උහුමල් තෙමේ රජව ලඞ්කා පෘථිවියට
මුහුණු බඳු යහපත් සිත්කළු අනුරාපුරෙහි සත්හවුරුදු අට
51 මසක් රජය කරවීය. දත්ත නම් දොරපල් පිත් දොරපල්
රජහුගේ රූපසාදෘශ්‍යයෙන් ශුභනම් ඇත්තේවී. යසලාලක
52 රජ සිනා පිණිස ඒ ශුභ නම් බලතා රාජාභරණයෙන් සරසා
පයඞ්කයෙහි හිඳුවා, බලතාගේ හිස්වෙළුම සිය හිස ලා
53 ගෙණ අතින් යෂ්ටිය ගෙණ තෙමේ දොරවෙත සිටියේය.
අස්නෙහි උන් ඔහුට ඇමතියන් වඳනා කල්හි රජතෙමේ
54 සිනාසෙයි. ඒ තෙමේ අතරතුර මෙසේ කෙරෙයි.

55 ඒ බලත් එක්දිනෙක සිනාසෙන රජහු (බලා) “මේ
56 බලත් කවරහෙයින් මාහමුයෙහි සිනාසේදැ”යි රජු මරවා ඒ
ශුභ නම් බලත් තෙමේ ශුභ රජයි ප්‍රසිද්ධවූයේ සහවුරුද්දක්
57 මෙහි රජය කරවී. ශුභරාජ මහාවිහාර දෙක්හි ශුභරාජ
58 නම් ඇත්තාවූම සිත්කළු පිරිවෙන් දෙකක් කරවී. එසේම
උරුවෙල් සමීපයෙහි වල්ලි විහාරයද නැගෙණහිර එක
වාර විහාරයද ගංතෙර නන්දිග්‍රාම විහාරයද කරවී.

59 ලම්බකර්ණ ගොත්‍රයෙහි ජාතවූ උතුරුදිග වැසි වසභ නම්
60 එක් (මානවකයෙක්) මයිල් සෙනෙවියහට උපස්ථාන කෙ
ළේය. “වසභ නම් ඇතියෙක් රජවන්නේය” යි ශ්‍රැතියෙන්,
61 රජතෙමේ හැමකල්හි ලක්දිව වසභ නම්ඇති සියල්ලන්
මරවයි; ඒ සෙනෙවි “රජහට මේ වසභ නම් තැනැත්තාහු
දෙන්නෙමුය”යි බිරින්දගා මන්ත්‍රණය කොට, උදෑසන රජ
62 ගෙට ගියේය. (සෙනෙවි බිරින්ද) ලාගෙලා උහුකෑව්ව
යනනාවූ වසභයා අතට උහු මොනවට රක්නා පිණිස සුණු
63 නැති බුලත් දුන්නේය. රජ ගෙදොරදී චූර්ණවජ්ජිත බුලත්
64 බලා සෙනෙවිතෙමේ හුණු පිණිස ඔහු යැවීය. සෙනෙවියා

Digitized by Google

65 කිරින්ද සුළු පිණිස ගිය වසභයාට, රහස කියා දහසකුත්දී
උඩු පැලවිය. ඒ වසභ වනාහි මහාවිහාරස්ථානයට ගොස්
66 එහි තෙරුන් විසින් කිරින් බතින් වතින් කරණලද සඞ්ග්‍රහ
ඇතොත්, ඉන් ඔබ්බෙහි රජබව පිණිස නිශ්චය කරණ
ලද්දාවූ (ශාස්ත්‍ර දන්නා) කුෂ්ඨරෝගාතුරයා වචනය අසා ප්‍ර
67 සන්නවූයේ "දමරික වන්නෙමැ"යි නිශ්චය කරණ ලදුයේ,
සමණ මිනිසුන් ලැබ ඉන් මතෙහි ගම්පැහැරීම් කෙරෙ
68 මින් රුහුණු ගොස් කබල්පූරවින් ක්‍රමයෙන් රට ගණිමින්
සමස්ත බලවාහන ඇතොත් දැහැවුරුද්දකින් නුවරවෙත
69 අවුත්, සුභරජු රජගේ මිදුලෙහිදී මරා, මහත් බලඇති
ඒ වසභ රජතෙමේ නුවර ජෙසත් නැගියා. මයිල්තෙමේද
යුඬයෙහි ඝිනි.

70 පූර්වෝපකාරීවූ මෙත්තා නම්වූ මයිල් කිරින්ද ඒ වසභරජ
තමහට අගමෙහෙසුන් කෙළේයි—ඒ රජ තමන් ආයු
71 ප්‍රමාණය හෝරා පාඨකයා විචාළේය. ඒ තෙමේද දොළොස්
72 හවුරුද්දකැයි රහසම ඔහුට කීයේය. රහස් රක්නා පිණිස
73 දහසක් ඔහුට දෙවා, ඒ තෙමේ සඞ්ඝයා රැස්කරවා, වැඳ
විචාරමින් "වහන්ස ආයුවැඩීමට හේතු ඇත්තේදැ"යි
74 විචාළේය. සඞ්ඝතෙමේ "අන්තරාය විමොක්ෂය ඇත්තේ
ය"යි කියා "නරශ්‍රේෂ්ඨයාණෙනි පෙරහන්කඩ දානයද
75 ආවාස දානයද ගිලන් වැටුප් දානයද දියයුතුය, එසේම
ජීර්ණාවාස ප්‍රතිසංස්කරණයද කටයුතුය, පන්සිල් සමාදානයද
76 කොට ඒ මනාව රැකියයුතුය, පොහෝ දවස්හි පෙහෙවස්
සමාදානයද කටයුතුය"යි විසඳූයේය. ඒ රජ මැනවයි කියා
ගොස් ඒසියල්ල එසේම කෙළේය.

77 මිහිපල්තෙමේ තුන් තුන් හවුරුදු ඇවෑමෙන් ලක්දිව්හි
78 සියලු සඞ්ඝයාට තුන්සිවුරු දෙවිය. නොවැඩිය තෙරුන්
වෙත සිවුරු යවා දෙවිය. දෙතිස්තැනෙක මිශ්‍රී කිරිබත්
79 දෙවිය. සූසැටක් තන්හි මිශ්‍රක මහදන් දෙවිය. සෑගිරි
විහාරය ථූපාරාම චෛත්‍යය මහසෑය මහබෝගේයයි යන
80 මේ සතරතන්හි දහසක් පහන් පැවැත්විය, සිතුල්පව් විහාර
81 යෙහි මනරම් සෑ දසයක් කරවිය. තවද සියලු ලක්දිව්හි
82 ජීර්ණාවාසයන් ප්‍රතිසංස්කාර කෙළේය. ඒ තෙමේ වලලියේර
නම් මහවිහාරයෙහි තෙරුන් කෙරෙහි පැහැද මහාවලලි
83 ගොත්‍ර නම් විහාරයද කරවී. මාගම් වෙත අනුරා රාමය කර
විය. හේලිගම්හි අටදහසක් කිරිය ඒ විහාරයට දෙවිය. ඒ
84 තෙමේ තිස්වඩමන්හි මුචේල විහාරය කරවා, ඇලිසර දිය
85 භාගය විහාරයට දෙව්ය. ගලඹතොට සෑයෙහි උළුවැස්මද

Digitized by Google

කරවීය. පොහෝගෙයද කරවීය. ඉමම පොහෝගෙයි
86 වැටීතෙල් පිණිස ඒ තෙමේ දහස්කිරිවෑවද කරවා පුන්
87 නේය. කුඹුගල විහාරයෙහි පොහෝගෙය කරවීය. ඒ රජ
තෙමේ මෙහි ඉසුරුමුනි විහාරයෙහි පොහෝගෙයද ථූපා
88 රාමයෙහි දාගෙයද කරවී— මහවෙහෙර බටහිරබලා
පිහිටි පිරිවෙන් පෙළද සතරැස් සාලාවද කරවීය. දිරෑ
89 තැන්ද සකසේ කෙළේය. එසේම ඒ රජතෙමේ සතර බුදු
වරයන්ගේ පිළිමයෙන් රම්‍යවූ පිළිමගෙය රම්‍යවූ මහබෝ
මළුවෙහි කරවීය.
90 ඒ රජහුගේ ප්‍රසිඬවූ බිසව් බෝමළුවෙහිම සිත්කළුවූ
91 චෘතන නම් සැයක්ද සැගෙයද කරවීය— මිහිපල්තෙමේ
ථූපාරාම විහාරයෙහි සැගෙය කොට නිමවා ඒ අවසන්
92 පෙළහරෙහි මහදන් පුනොය. ග්‍රන්ථධුරයෙහි යුක්ත
භික්ෂූන්ට ප්‍රත්‍යයද ධර්මකථික භික්ෂූන්ට ගිතෙල්හා උක්
93 සකුරුද නුවර සතර දොරටුවෙහි දිළිඳුන්ට වැටුප්ද ගිලන්
94 භික්ෂූන්ට ගිලන් වැටුප්ද දෙවීය— මයෙත්වැව රජ්ජුපුල්
වැව කොලබෑගම්වැව මානිකවිට්ටිවැව මාගම වැව් දෙක
95 කේහාලවැව කේලිවාසවැව ඇඹිට්ටිවැව වාතමහනවැව අබි
වඬමන්වැව යන එකොළොස්වැවහා දොළොස් මොවූ ඇ
96 ලක්ද (රට) සුභික්‍ෂය පිණිස කරවී. එසේම (නගර) ආරක්‍ෂා
97 පිණිස උස්වූ නගර ප්‍රාකාරයද කරවීය. සතර දොරටුවෙහි
තොරන්ද මහවතුද කරවීය. උයන් කරවා එහි හංසයන්
98 හැරියේය. රජතෙමේ නුවර ඒ ඒ තන්හි බොහෝ පොකුණු
කරවා එහි සොරොවුවෙන් දිය යැවූයේය. හැමකල පින්
99 කම්හි ආදරඇති ඒ වසභ මිහිපල්තෙමේ මෙසේ නන්වැදෑ
100 රුම් පින්කම්කොට නසනලද අනතුරාය ඇතොත්, සුසාළිස්
හවුරුදුක් පුරයෙහි රජකම් කෙළේය. සුසාළිසක් වෙසක්
පූජාද කරවී.
101 ඒ ශුභරජ ජීවත්වනෙන්ම වසභයාගෙන් භය ශඞ්කා
102 ඇතොත් තමා එක්දුව උළුවඩුවාට භාරකෙළේය. තමාගේ
කම්බලයද රාජභාඬද (සලකුණු) පිණිස දුන්නේය. වසභ
103 යා විසින් ඔහු මැරූකල උළුවඩුතෙමේ ඇය භාරගෙණ,
දූ තනතුරෙහි තබා තමා ගෙහි වඩයි. ඒ ලදූරිතොම කම්
104 කරණ ඔහුට බත් එලවීය. නුවනැති ඕතොමෝ හිගුරු
වැල් ලැහැබෙක නිරොධ සමාපත්තියට සමවත් (තෙර
105 කෙනෙක්) සත්වෙනි දවස දැක බත් දන්දුනානාය. නැවත
බත් සපයා පියාට බත් එලවීය. පමාවූ කරුණු විචාරණ
106 ලද්දී එපවත් පියහට කීවාය. මේ වඩුතෙමේ තුටුවූයේ

Digitized by Google

නැවත නැවතත් තෙරුන්ට බත් දෙවිය. විස්වස්ඇති
107 සඞ්ඝරතෙමේ අනාගතය දැක "කුමාරිකාවෙනි තීගේ
ඓශ්වර්‍ය්‍යය හටගත්කල මෙතැන මෙනෙහිකර" යි කියා කුම
රියට වදාළසේක. සඞ්ඝරවනාහි එකල්ම පිරිනිව්සේක.
108 ඒ වසභ රජතෙමේ වියපැමිනි සියපිත් වක්නාතිස් කුමර
109 හට අනුරූප කන්‍යාවක් පරීක්‍ෂාකරවී. ස්ත්‍රීලක්‍ෂණ දත්
මෙහි පණ්ඩිත මිනිස්සු උළුවඩුගම ඒ කුමරිය දැක රජහට
110 දැන්වූය. රජතෙමේ ඇය ගෙන්වන්ට පටන්ගත; එකල
උළුවඩුතෙමේ ඇය තමා රජදූබැව් කීය, එසේම කම්බලා
111 දියෙන් ශුභරජහු දූබැව් හැඟවීය. රජතෙමේ තුටුවූයේ,
මනාකොට කෘතමඞ්ගල්‍ය විධිඇති ඇය පුත්‍රයහට පාවා
දුන්නේය.
112 වසභ රජු ඇවෑමෙන් ඔහුපිත් වඞ්කනාසිකතිස් රජ අනු
රාධ පුරයෙහි තුන්හවුරුදක් රජය කරවී. ඒ වක්නාතිස්
113 රජ ගොණගංතෙර මහාමඞ්ගල නම් විහාරය කරවිය.——
114 මහාමාත්‍රවූ ඒ දේවීතොම තෙරුන් වදාළා මෙනෙහි
කරනනී වෙහෙරක් කරණුපිණිස වස්තු රැස්කළාය.
115 වක්නාතිස් රජු ඇවෑමෙන් පිත් ගජබා ගැමුණුරජ දෙවිසි
116 හවුරුදක් රජය කරවී. ඒ තෙමේ මවුකිසවුන් බස්අසා මවු
117 කිසවුන් පිණිස හිඟුරුවැල් ලැහැබ් තන්හි රාජමාතු විහ
රය කරවී. පණ්ඩිත ඒ කිසව් බිම පිණිස මහාවිහාරයට
118 ලක්‍ෂයක් දුන්නීය විහාරයද කරවී. එහි සෙල්මුවා සෑය
තොමෝම කරවී. ඒ ඒ තැනින් මිළටගෙණ සඞ්ඝභොග
119 යද දුන්නාය. අභයගිරි මහසෑය මහත්කොට බැඳවී, එහිම
සතර දොරටුයෙහි ආදිමුඛ තොහොත් තොරන් කරවී. ඒ
120 මිහිපල්තෙම ගැමුණුතිස් වැව කරවා අභයගිරි විහාරයෙහි
බත්වැටුප් පිණිස දුන්නේය, මිරිසවැටි සෑයෙහි සැට්ටයද
121 කරවී. තවද ලක්‍ෂයකින් මිළටගෙණ සඞ්ඝභොගයද දුන්
122 නේය. අවසාන හවුරුදුයෙහි රමක විහාරය කරවීය.
(අනුරාධ) පුරයෙහි මහ අසුන් හලද කරවී.
123 ගජබාරජු ඇවෑමෙන් ඒ රජු කිසවුන් පිය මහළුනා රජ
124 සහවුරුදක් රජය කරවී. නැගෙණහිරි දිග ජේජලකනම්
විහාරක්ද දකුණුදිග කොටගල් වෙහෙරද බටහිර උද
125 පහන් නම් විහාරයද නාගදිවයින ඇල්ගිරියද කිජගාම
සම්පයෙහි තෙනවේලි විහාරයද රුහුණු ජනපදයෙහි
126 තොබල්නා පව්වද ඇතුළුරට ගිරිහාලික විහාරයද යන
මේ සත්විහාරයන් මහපැණැති ඒ මහළුනා මිහිපල්තෙම
මන්දවූ ආයුකාලයෙහිද කොට නිමවී.

Digitized by Google

127 පැණැත්තෝ මේ ආකාරයෙන් අසාරවූ ධනයෙන් සාරවූ
බොහෝ පින්කොට ගණිති, අඥයෝ වූකලී මෝහ නිමිත්
තෙන් කාම හේතුකොටගෙණ බොහෝ පවුකරන්නාහුයි.

මෙතෙකින් සුදිජනයා පහන් සංවෙග පිණිස කළ මහ
වංශ වාදශරාජක නම් පන්තිස්වන අදියර නිමි.

---

36 වෙනි පරිච්ඡේදය.

1 මහළුනා රජ්ජු ඇවෑමෙන් උහු පිත් භාතියතිස් රජ සුවිසි
2 වසක් ලක්රජය කරවී. මහාවිහාරය සිසාරා ප්‍රාකාරය කර
3 විය. ඒ මිහිපල්තෙමේ ගවරතිස්ස විහාරය කරවා, මේ
විහාරයට මහගැමුනු වැවත් පුනොන්ය, භාතියතිස් නාම්
4 විහාරයද කරවිය. මිහිපල්තෙමේ මනරම් ථූපාරාමයෙහි
5 පොහොයගෙයද වතනිරට එක්වැවද කරවිය. සතුන් කෙ
රෙහි මොලොක් සිත්ඇති සඞ්ඝයා කෙරෙහි දැඩි ගෞරව
ඇති ඒ මිහිපල් භික්ෂු භික්ෂුණී සඞ්ඝයා විෂයෙහි මහදන්
පැවැත්විය.
6 භාතියතිස් රජ්ජු ඇවෑමෙන් උහු මල් කණිටුතිස් රජ අට
7 විසි හවුරුද්දක් ලක්දිව්හි රජය කරවී. ඒ රජ භූතාරාම
මහානාග තෙරුන් කෙරෙහි පැහැද අභයගිරි විහාරයෙහි
8 රත්නප්‍රසාද නම් ගෙයක් යහපත්කොට කරවිය. අඹගිරි
9 පව්වද මහපිරිවෙණද මණිසෝම විහාරයෙහි මහපිරිවෙ
ණද එහිම දාගෙයද එසේම අම්බත්ථල සෑගෙයද නාගදීප
10 සිත ගෙයි ප්‍රතිසංස්කාරයද කරවිය. මිහිපල්තෙමේ මහා
විහාර සීමාන්තය මැඩ එහි කුක්කුටගිරි පිරිවෙන් පන්තිය
11 සකස්කොට කරවිය. මනුෂ්‍ය ශ්‍රේෂ්ඨතෙමේ මහවෙහෙර
දශ්නීය මනරම් මහත්වූ සතරැස් පහ දෙළොසක් කරවිය.
12 දකුණු වෙහෙර සෑයෙහි සෑගෙයද කරවිය. මහාමෙඝ
13 වන මහාසීමාව මිරිකා දකුණු වෙහෙර බත්හලද (කර
විය). ඒ තෙමේ මහවෙහෙර පව්ර පාශ්වයකින් පහකොට
14 දකුණු වෙහෙර බලා යන මාර්ගයද කරවිය. භූතාරාම
විහාරයද රාමවිහාර සමීපයෙහි රාමගොණක විහාරයද
15 එසේම නන්තිස් අරමද කරවිය. නැගෙණහිරදිග ගඟ
රාජියෙහි අනුලතිස්ස පව්වත විහාරයද නියෙල්තිස් අරමද

Digitized by Google

16 පිලපිට් වෙහෙරද එසේම මනුෂ්‍ය ශ්‍රේෂ්ඨතෙමේ රජමහ
17 වෙහෙරද කරවීය. ඒතෙමේම කැලණිවෙහෙර මඬොල්
ගිරිය දුබ්බලවාපිතිස්ස යනමේ විහාර තුන්තන්හි පොහෝ
ගෙවල් කරවීය.
18 කණිට්ඨතිස් රජු ඇවෑමෙන් උහු පිත් චූළනාගයයි ප්‍රසිද්ධ
19 කුමර දෙවසක්ම රජය කරවී—චූළනා රජු මල්වූ කුඩ්ඩ
20 නාගරජ සොහොයුරු රජුමරා එක්වසක් මෙහි රජය කරවී.
මිහිපල්තෙමේ මහාපාළි නම් බත්ශාලද වැඩූයේය, එක්නැ
ළිහැයෙහි පන්සියයක් භික්ෂූන්ට නිතොර (දන් දුන්නේය)
21 එකල කුඩ්ඩනාග රජහු බිසව් සොහොයුරු සිරිනා සෙ
22 නෙවි තෙමේ රජහට දමරිකව, බලවාහනයෙන් යුක්තව
නුවර වෙත අවුත් රජසෙන්හා යුදකෙරෙමින් කුඩ්ඩනාග
23 මිහිපල්හු පලවා ලබනලද ජයඇතොත් ශ්‍රේෂ්ඨ අනුරා
පුරෙහි (වෙසෙමින්) එකුන් විසිහවුරුදු ලක්රජය කරවී.
24 මිහිපල්තෙමේ ප්‍රවර මහා චෛත්‍යයෙහි ඡත්‍රය කරවා මන
රම් දැකුම් කටයුතු රත්කම් කරවීය. පස්මහල් කොට
25 ලොහොපහයද කරවීය. මහබෝ සතර දොරටුයෙහි හිණි
26 (පහනිය) නැවත කරවීය. ඡත්‍ර ප්‍රාසාදය කරවා පෙළ
හෙරෙහි (මහ) පූජා කෙළේය. දයා පරමකොට ඇතොත්
ලක්දිව්හි කුලඹුවශීයයාත් (රාජකෘත්‍යයෙන්) තොර
කෙළේය.
27 සිරිනා රජු ඇවෑමෙන් ඔහු පිත් තිස්සකුමර ධර්ම ව්‍යව
28 හාරයෙහි පණ්ඩිතවූයේ දෙවිසි හවුරුදක් රජය කරවී.
ඒ තෙමේ යම්හෙයකින් හිංසාවෙන් තොරවූ නීතික්‍රමය
29 මෙහි පිහිටවීද එහෙයින් ව්‍යවහාරතිස් රජයයි කරණලද
නම් ඇතිවිය. කම්බුග්‍රාම වාසී දෙවස්ථිරයන් වෙත දහම්
30 අසා, පමමහාවාසයෙහි (රොගාතුරයන්ට) පිළියම්ද කර
වීය. අනුරා අරම් වැසි මහාතිස්ස තෙරුන් කෙරෙහි ප්‍රසන්න
31 වූයේ මුචෙල පටුන්හි දනවෘත්තිය කරවීය. ඒ තිස්ස රජ
32 මහාවිහාර දෙක්හිම මණ්ඩපද, මහබෝගෙයි නැගෙණ
හිරි ලොහොරු දෙකද (කරවීය). හුවඅවස්වන පරිදෙන්
සත්පත් පහය කරවා මසෙක් මසෙක්හි දහසබැගින් මහා
33 විහාරයට (දන්) දෙවීය. අභයගිරි විහාරය දක්ෂිණමූල
විහාරය මිරිසවැටි විහාරය කුලතිස්ස විහාරය මිහුගුණුවිහා
34 රය මාගම්හි මහානාගවිහාරය නාගදීවසින තිස්ස නම්
35 විහාරය එසේම කැලණිවිහාරය යන අටතැන පිහිටි
චෛත්‍යයන්හි ඡත්‍රකර්ම කරවීය. ගොළුනා සෙනෙව්යා
36 වෙහෙරද එසේම දකුණු වෙහෙරද මිරිසවැටි වෙහෙරද

Digitized by Google

එසේම පූත්තභාග වෙහෙරද ඉසුරුමුනි වෙහෙරද නාග
37 දිවයින තිස්ස වෙහෙරද යන විහාර සයෙහි පවුරුත් කරවීය.
38 අනුරා රාමයෙහි පොහෝගෙයද කරවීය. ඒ තෙමේ සද්ධර්ම
ගෞරවයෙන් මුළු ලක්දිව ආර්‍ය්‍යවංශ දෙසනා තන්හි දන්
39 වැට තැබ්බවීය. ශාසනප්‍රිය ජනාධිනාථ තෙමේ තුන්ලක්ෂ
40 යක් දී, නය සහිත භික්ෂූන් නසින් මිදූයේය. ඒ තෙමේ මහ
41 වෙසක් පූජාව කරවා ලක්දිව් වැසි සියලු භික්ෂූන්ටම, තුන්
සිවුරු දෙවීය. ඒ තෙමේ කපිල ඇමැතියා ලවා වෛතුල්‍ය
වාදය මිරිකා පාපනිග්‍රහය කරවා බුදුසස්නද බැබලවීය.

42 ඒ රජු මල් අභයනාගයයි ප්‍රසිද්ධවූ කුමර රජහු දෙවියහා
සංසර්ග ඇතොත් සියබෑ රජු විසින් දන්නාලදුයේ භයව
43 සේවකයන් සමග භල්ලතීර්ථයට පලාගොස් මයිලාහට
44 තිපියාගේ අත්පා සිඳවීය. රජහු රට හෙද පිණිස ඔහු
මෙහිම හිඳුවා බලුඋපමා දක්වා තමා කෙරෙහි සිනිඳුවූවන්
45 ගෙණ, එහිදීම නැව්නැගී තෙමේ පරතෙර ගියේය. මයිල්
46 සුභදෙව තෙමේ මිහිපලු වෙත එලඹ, සුහෘදයෙකුගේ
වෙසෙමින් රජුකෙරෙහි රටවැසි ජනයා හෙද කෙළේය.
47 අභයකුමර එය දන්නා පිණිස මෙහි දූතයෙක් එවීය. දූතයා
දැක ඒ තෙමේ පූවක් ගසක වට කරකැවෙමින් කුනපා මීවු
48 යෙන් පෙළා මුල් දුවිලකොට බාහුයෙන්ම (ගස) හෙලා
49 ඔහු තර්ජනයකොට පැලවීය. දූතතෙමේ දැන අභය කුමර
හට එපවත් දැන්වීය. අභය කුමර ඒ දැන ඒ රටින් බොහෝ
50 දෙමළුන් ගෙණ බැයාහා යුදපිණිස නුවරවෙත ආය. රජ
තෙමේ ඒ දැන අසෙකු නැගී දෙවිය සමග පලාගොස් මලය
51 රටට ගියේය. උහුමල් තෙමේ ලුහුබැඳ ගොස් මලයරටදී
රජු මරා කිසව් ගෙණ නුවරට ආයේ මිහිපල්ව අවහවූ
රුඅදක් නුවර රජකම් කරවීය.

52 ඒ රජතෙමේ මහබෝ සිහාර ගල් පිළිකඩද ලොහොපා
53 මිදුල්හි මණ්ඩපයද කරවීය. දෙලක්ෂයකින් නොයෙක්
වස්ත්‍රයන්ද ගත්වා ලක්දිව්හි භික්ෂු සඞ්ඝයාට වස්ත්‍ර දන්
54 දුන්නේය—අභය රජු ඇවෑමෙන් උහුබෑ වොහාරතිස්ස
රජු පිත් සිරිනාග කුමර දෙහවුරුඅදක් ලඞ්කාරජය කරවී.
55 ඒ රජතෙමේ මහබෝ හාත්පස පවුර පෙරලා සකස්කොට
56 මහබෝ ගෙහි වැලිතලායෙහිම මිදෙල්තුරින් ඔබ හංස
57 වෑත්තයද සිත්කළු මහාමණ්ඩපයද කරවී. සිරිනා රජු පිත්
විජය කුමාරක නම් තැනැත්තෝ පියරජු ඇවෑමෙන් එක්
හවුරුඅදක් රජය කරවී.

58 මිහුගුණු වෙහෙර සම්ප රට උපන් යහළුවූ සඟතිස්ස
සඟබෝය තුන්වෙනිවූ ගොළුඅබායයි යන ලම්බකණ්ණ
59 ගොත්‍රඇති තුන්දෙනෙක් වූහ. රාජෝපස්ථානයට එන ඒ
තුන්දෙනා තිසාවැව හේගෙහි උන් පණ්ඩිතවූ එක් අන්ධ
60 යෙක් පදශබ්දයෙන් හැඳින "මේ පොළෝහිමියන් තුන්
දෙනා පෘථුවිතොමෝ උසුලන්නීය"යි කීයේය. පසුව එන්
61 නාවූ අභය කුමර ඒ අසා "කවරක්හුගේ වංශය පවත්නේ
දැ"යි පෙරළා ගොස් අභය කුමර ඔහුම විචාළේය. ඒ තෙමේ
"පශ්චිමයාගේය"යි කීය. ඒ අසා අභයකුමර සෙසු දෙන්
62 නා සමග ගියේය. ඒ තුන්දෙනා නුවරට වැද රජහට ඉතා
ඇළුම්ව රාජකෘත්‍යයන් සිඩකෙරෙමින් විජයරජු වෙත
(විසූය)
63 (ඒ තුන්දෙනා) එක්ව විජයරජු රජගෙහිදීම මරා
සෙනෙව් සඟතිස් කුමරු ඉතිරි දෙදෙනා රාජ්‍යයෙහි අභි
64 ෂේක කළෝය. මෙසේ අභිෂේක කරණලද්දාවූ ඒ සඟතිස්
65 රජ නගරෝත්තම අනුරා පුරෙහි සතර සවුරුද්දක් රජය
66 කරවී. මහසෑයෙහි ඡත්‍රයද රන්කම්ද කරවීය. මිහිපල්
තෙමේ වෙන් වෙන්ව ලක්ෂයක් ලක්ෂයක් අගණා මිණිරු
67 වන් සතරක්ද සතර රිවිබිඹු මැද තැබවීය. එසේම සෑ
මුදුන්හි අනගි විදුරු සුඹුළුවක් හෝ කොත්කැරැල්ල
තැබවීය. ඒ නරශ්‍රේෂ්ඨතෙමේ ඡත්‍රොත්සව පූජායෙහි සත
68 ළිස් දහසක් සඞ්ඛ්‍යාට ෂට් චීවරයන් දෙවීය. දම්ගල් වැසි
මහාදෙව තෙරුන් විසින් දෙසනලද යාගුයෙහි අනුසස්
69 දක්වනනාවූ ඛණ්ඩකපාළියෙහි සූත්‍රය අසා, පහන්වූයේ
සඞ්ඝයාට සතස්කලාවූ කැඳඳනය නුවර සතර දොරටුයෙහි
70 යගපත්කොට දෙවීය—ඇතොද්ධුරන් ඇමැතියන් සහිත
ඒ රජ පැසුනාවූ දඹ අනුභවය පිණිස අතරෙන් අතර
71 නැගෙණහිරි දිවයිනට යෙයි. නැගෙණහිරි වැසි මිනිසු
මොහුගේ ගමනින් උපද්‍රැත වූවෝ රාජභොගයට සුදුසු දඹ
ඵලයන්හි වස යෙදූය. ඒ ජම්බුඵලයන් කා ඒතෙමේ එහිම
මෙළේය.
72 ගොළුඅභා කුමර සඟබෝ සෙනෙව් රජු රාජ්‍යයෙහි අභි
73 ෂේක කෙළේය. පන්සිල් රක්නා ඒ රජතෙමේ ශ්‍රීසඞ්ඝ
74 බොධියයි ප්‍රසිඬවීය. අනුරා පුරෙහි වෙසෙමින් දෙසවුරුද්
දක් රජය කරවී. මහවෙහෙර මනරම් ලහබත් ගෙයක්
75 කරවීය—එකල්හි ඒ රජ ලක්දිව මිනිසුන් නියංසායෙන්
බැහැබැව් දැන කරුණාවෙන් කම්පිත හෘදය ඇත්තා ඒ
76 තෙමේ මහසෑ මිදුල ධම මෙසේ නිශ්චයකොට ගෙණ

Digitized by Google

"වැසිවැස දිගෙහි මා නොඉල්පූකල මෙහි මැරෙනනා
වූද මම නොනැගිටිනෙනම්"සි හොත්තේය. රජු මෙසේ
77 හොත් කෙණෙහිම සියලු ලක්දිව පිනවමින් වැසි වැස්
78 සේය. එසේද ඒ තෙමේ දියෙහි නොසිල්පෙන්නෙන්
නොනැගිටී. ඉක්බිතෙතත් ඇමැතියෝ දිය බැසයන
79 සොරොවු ඇවුරුහ. ඉක්බිති දැහැමි රජතෙමේ දියෙහි ඉල්
පෙමින් නැගිට්ටේය. මෙසේ ලඞ්කාද්වීපයෙහි නියංසාය
80 කාරුණවෙන් බැහැරලීය——ඒ ඒ තැන සොරු වූහයි
මිහිපල්තෙමේ අසා සොරුන් ගෙන්වා රහසින් පලවා, රහ
81 සින් මලවුන්ගේ සිරුරු ගෙන්වා ගිනෙනන් පුලුස්සා සොර
උවදුරද නසනලදී.
82 රක්තාක්ෂ යයි ප්‍රසිද්ධවූ එක් යකෙක් මෙහි අවුත් ඒ ඒ
83 තැන මිනිසුන්ගේ ඇස් රතුකෙරෙයි. උන්නුත් රත්ඇස්බලා
84 කියවැද * මනුෂ්‍යයෝ නසිති. යක්‍ෂතෙමේ ඒ මිනිසුන් සැක
නැතිව කයි. රජතෙමේ උන් උවදුරු අසා තැතිගත් සිත්
85 ඇතෙත් ශුද්ධකලාව අටඟ පෙහෙවස් ඇතිව උපවස් ගෙයි
තුල "ඒ යකු නොදැක නොනැගිටිනෙනම්"සි හොත්
තේය. යක්තෙමේ රජහු දහම් තෙදින් රජහුවෙත ආය.
86 රජු විසින් කවරෙක්දැයි පුලුවුස්නා ලදුවූ යක්තෙමේ මම
(අසවලැයි) දැන්විය. "කවරහෙයින් මාගේ ප්‍රජාව කයිද
87 නොකව"සි කීයේය. යක්තෙමේ "මට එක් දනවෙවක මිනි
සුන් දෙව"සි කීය. නොහැක්කැයි කීකල යක්තෙමේ
88 ක්‍රමයෙන් ඉල්වා "එක් මිනිසෙක් දුනමැනව"සි කීය. රජ
තෙමේ "අනිකෙක් දෙන්ට මට නොපිළිවන මා (මස්) කයි"
89 කීයේය. යක්තෙමේ නොහැක්කැයි කියා "ගමක් ගමක්
පාසා බිලි දුනමැනව"සි රජුගෙන් ඉල්විය භූමීශ්වරතෙමේ
මැනවයි කියා සියලු දිව්හිම ගම්දොර තබ්බවා ඔහුට බලි
90 (බත්) දෙවිය. සියලු සතුන් කෙරෙහි අනුකම්පාඇති ලක්දිව
පහන්බදු ඒ මහසත්හු විසින් හටගත් මහාරෝගභය මේ
උපායෙන් නසනලදී.
91 රජහුගේ ඇමැතිවූ භාණ්ඩාගාර නායක ගොඨඅබා කුමර
92 දමරිකව උතුරුදිගින් නුවරට එලඹියේය, ඒ රජතෙමේ
පරහිංසා නොකැමැත්තේ පෙරහත්කඩ ගෙණ ශුද්ධකලාව
93 පලාගියේය——බත්මුලක් ගෙණ මගයනනාවූ මිනිසෙක්

* භාසිත්වා රත්ත නෙත්තාතං, යනෙනහි ඇස්රතුබැව් උන්න්ට
කියාසි අණසි.

බත් අනුභවය පිණිස නැවත නැවත යාච්ඤා කෙළේය.
94 කරුණා බහුල රජතෙමේ දිය පරයාගෙණ (බත්) අනුභව
කොට ඔහුට මේ උපායෙන් අනුග්‍රහයක් කරන්ට "පින්වත
95 මම සඞ්ඝබොධි රජයෙමි මා හිස ගෙණගොස් ගොඨඅබා
රජුට දක්වව, තට බොහෝ වස්තු දෙන්නේය"යි මේ බස
96 කීයේය. ඒ තෙමේ එසේ කරන්ට නොකමැති විය. මිහි
පල්තෙමේ ඔහු පිණිස හුන්නේම මෙළේයි. මිනිස්තෙමේ
97 රජු හිස ගෙණ (ගොස්) ගොඨඅබා රජුට දැක්විය. ඒ තෙමේ
විස්මිත සිත්ඇතෙත්, ඔහුට වස්තුදී (මළ) රජුට මැනවින්
සත්කාර කරවිය.

98 මෙසේ මේ ගොඨාභය තෙමේ මෙඝවණ්ණාභයයයි ප්‍රසිඬ
99 වූයේ තෙළෙස් හවුරුද්දක් ලක්රජය කරවිය. රජෙජදන
100 නය කරවා උයන් දොරටුයෙහි මණ්ඩපයක් තනවා අලඞ්
කාර කරවා සතින් භික්ෂූන් අටතුරා දහසක් ලැබගෙණ
එහි වඩා හිඳුවා මිහිරිවූ නන්වැදෑරුම් කෑද අවුළුහා භොජ
101 නයෙන් සිවුරු සහිතකොට දවස්පතා මහදන් පැවැත්
102 විය. මෙසේ එක්විසි දිනක් නොවලහා කරවූයේයි. මහා
103 විහාරයෙහි මහත් ශෛල මණ්ඩපයක් කරවිය, ලොහො
පාය වැම්ද පෙරලා තැබ්බවිය. ජයමහ බොධියෙහි ගල්
104 පිළිකඩද උතුරු දොරටුයෙහි තොරනද, සතර කොණ
චක්‍ර සහිත වැම්ද පිහිටවිය. දොරටු තුනෙහි සෙල්මුවා
105 පිළිම කරවා දකුණු දොරටුයෙහි සෙල්මුවා පලගක් තැබ්බ
විය. මහාවිහාරයට බටහිරින් පදන්බිම කරවිය. ලක්දිව්හි
106 ජීර්ණාවාස සියල්ලම අළුත්කොට කරවිය. ඒ තෙමේ ථූපා
රාම විහාරයෙහි දාගෙය හා එසේම අඹතලා දාගෙයද මිණි
107 සොම්නම් අරම දාගෙයද පිළිසකර කරවිය. ථූපාරාමය
මණිසොමාරාමය මිරිසවැටිය දක්ෂිණ විහාරය යන මෙ
තෙක් තැන පොහෝ ගෙවල්ද (පිළිසකර කරවී) මේඝ
108 වර්ණාභය නම් අළුත් විහාරයක්ද කරවිය. විහාරපූජා පෙළ
හරෙහි ලක්දිව් වැසි තිස්දහසක් භික්ෂූන් රැස්කරවා ෂට්
109 සිවුරු දෙවිය. එකල මහ වෙසක්පූජාවද එසේම කරවිය.
110 වසක් පාසා සඞ්ඝයාට ෂට්චීවර දෙවිය.

111 ඒ තෙමේ පව්වුන්ගේ නිග්‍රහය කරවා, බුදුසස්න ශුඬකර
වමින්, අභයගිරිවාසී වෛතුල්‍යවාදීවූ බුදුසසුන්හි කටුබඳු
112 සැටක් පමණ භික්ෂූන් ගන්වා, ඔවුන්ට නිග්‍රහකරවා පර
113 තෙර දැම්මවිය. එහි දමනලද තෙරහුගේ ආශ්‍රයඇති යක්ෂ
විදතදියෙහි දක්ෂවූ සඞ්ඝමිත්‍ර නම් සොළී භික්ෂුතෙනෙක්
මහාවිහාරයෙහි භික්ෂූන්ට කිපී මෙහි ආයේය——සිලාදි

Digitized by Google

114 සංයම නැති ඒ තෙමේ ථූපාරාමයෙහි සඞ්ඝ සන්නිපාතයට
115 වැද එහිදී පිරිවෙන් වැසි මහාස්ථවිරවූ සඞ්ඝපාල නම් මේ
ගොඨාභය රජු මයිල් මයණ තෙරුන් රජහුගේ නමින් කථා
116 කරන්නහුගේ බස ප්‍රතික්ෂෙප කොට, රජහුගේ කුලෝපග
විය. රජතෙමේ ඔහු කෙරෙහි පැහැද දෙටුපිත් දෙටුතිස්
117 කුමරද (උහු) මල් මහසෙන් කුමරද, ඒ භික්ෂුහට භාරකෙ
ළේය. ඒ තෙමේ දෙවෙනි කුමර සතුටුකොට ගතෙත්ය.
දෙටුතිස් කුමර වනාහි ඒ මහණහු කෙරෙහි වෛර බැන්
දේය.

118 පියරජු ඇවෑමෙන් ඒ දෙටුතිස් කුමර රජවිය. පියරජු
119 ශරීර සත්කාරයෙහි පැමිනෙනු නොකැමැති, දුෂ්ට ඇමැති
යන් නිග්‍රහ පිණිස රජතෙමේම නික්මගොස් මල්කුමරු
120 පෙරතුකොට යවා පියහු සිරුරත් ඉක්බිතිකොට යවා, ඉන්
ඉක්බිති කොට ඇමැතියනුදු මෙහෙයා තෙමේ පසුව මල්
121 හුද පියහු සිරුරද පිටත්වූකල ජට ඉක්බිතිව දොර වස්වා
දුෂ්ටාමාත්‍යයන් මරවා පියහු දරසෑය සියාරා ඒවස්හුල
122 හිදවී—රජහුගේ ඒ ක්‍රියාව කරණකොටගෙණ දෙටු
තිස් යන ඔහුගේ නාමය කක්ඛල යනු උපපදකොට ඇති
123 විය. සඞ්ඝමිත්‍ර ඒ භික්ෂුතෙමේ ඒ නරනාථයා කෙරෙන්
බියව ඔහු අභිෂෙකයට සමකාලවම මහසෙන් කුමරුහා
124 මන්ත්‍රණය කොටගෙණ ඒ මහසෙන්හුගේ අභිෂෙකය
අපෙක්ෂා කෙරෙමින් මෙයින් පරතෙර ගියේය—.ඒ දෙටු
තිස් රජ පියරජු විසින් කොටඅඩාල උතුම් ලොහො පහය
125 සත්බුමුකොට කෙළත් අගණසේ කරවීය. එම දෙටුතිස්
රජ සැවලක්ෂයක් අගණ මිණිරුවනක් පුදා එහි (ලොහො
126 පහයෙහි) උතුම් මිණිපහයක් කරවීය. මහගු මැණික්
දෙකක් පිදීය. මහබෝගෙහි තොරන් තුණද කරවීය.
127 ඒ පෘථිවීශ්වර තෙමේ පැදුම්තිස් පච්ච විහාරයක් කරවා
පමාවාසයෙහි සඞ්ඝයාට දුනොත්ය. ඒ දෙටුතිස් රජ දෙවෙනි
128 පැතිස් රජු විසින් පෙර ථූපාරාමයෙහි පිහිටුවනලද මනා
දැකුම්ඇති මහගල් පිළිමය ථූපාරාමයෙන් ගෙණගොස්
129 පැදුම්තිස් පච් අරම්හි පිහිටවීය. ඒ දෙටුතිස් තෙමේ කළු
130 මැටි වැව සෑගිරියට පිදීය. වෙහෙර පහ පෙළහර මහ
වෙසක් පූජය (යන මෙතෙක්) පූජකොට දහසක් සඞ්ඝ
131 යාට පච්චිවර දානය දුනොත්ය. ඒ රජතෙමේ ආලම්බගාම
132 වැවද කරවීය. ඒ රජතෙමේ මේ ආකාරයෙන් ප්‍රාසාද
කරණදිවූ නන්වැදෑරුම් පින්කම් කරවමින් දසහවුරුදුක්
රජය කරවී.

133 මේ ආකාරයෙන් නන්වැදෑරුම් පින්කමට හේතුවූ නර
පල්බව නොයෙක් පාපයන්ටද හේතුයයි (දැන) විෂයෙන්
මිශ්‍ර මධුරාහාරයක් සෙයින් එය කිසිකලෙකත් සත්පුරුෂ
යන්ගේ මනස භජනය නොකරනෙන්ය.

මෙතෙකින් සුදිජනයා පහන්සංවෙග පිණිස කළ මහාවංශ
තයොදසරාජක නම්වූ සතිස්වන අදියර නිමි.

---

37 වෙනි පරිච්ඡෙදය.

(පූ ර්ව භා ග ය.)

1 දෙවුතිස් රජු ඇවෑමෙන් උහුමල් මහසෙන් රජ සත්තිස්
2 හවුරුද්දක් රජය කරවීය. ඔහුගේ රාජ්‍යාභිෂෙකය කර
වන්ට සඞ්ඝමිත්‍ර ස්ථවිරතෙමේ කල් දැන පරතෙර සිට මෙහි
3 ආයේය. උහුගේ අභිෂෙකයද නොයෙක් පරිදෙන් අනික්
කිසද කරවා සීලාදී සංයම නැති හේතෙමේ මහාවිහාර
4 විධ්වංසනය කරණු කැමැතෙව් "මහරජනෙනි මහවිහාර
වාසී මොව්හු අවිනයවාදීහ අපි විනයවාදීයම්හ" යි රජහු
5 මෙසේ (දූෂ්‍ය) ගන්වා "යමෙක්තෙමේ මහවෙහරවැසි
මහණෙකුට ආහාරයක් දෙසිනම් ඒ තෙමේ සියයක් දඩට
6 සුදුසුය" යි රජුලවා දණ්ඩනය තැබ්බවී. මහාවිහාරවාසී ඒ
භික්ෂූහු ඔවුන් විසින් උපද්‍රුතවූවාහු මහාවිහාරය දමා
7 මලයරට රුහුණුරට(බලා)ගියෝය. එහෙයින් මේ මහාවිහා
රය තෙමේ නවහවුරුද්දක් හරණලද්දේ මහාවිහාරවාසී
8 භික්ෂූන්ගෙන් ශූන්‍යවිය භිස්විය——දුර්මතිවූ ඒ ස්ථවිර
9 "අස්වාමික වස්තුව පෘථිවීශ්වරයාට වනෙන්ය" යි දුර්මති රජ
හට හඟවා මහාවිහාරය නස්වන්ට රජහුගෙන් ලැබූ අනු
මති ඇති දුෂ්ට මනසින් යුක්ත ඒ තෙමේ මහාවිහාරය
10 නසන්ට නියමකෙළේය. සඟමිත් තෙරහුගේ මෙහෙකරු
රාජවල්ලභ දරුණුවූ සොණ ඇමැතිද අලජ්ජි භික්ෂූහුද
11 සත්වුමු උතුම් ලොහොපහයද නානාප්‍රකාර ගෙවල්ද බිඳ
12 මෙසින් අභයගිරියට ගෙණගියෝය. තවද මහවෙහෙරින්
ගෙණයන ලදුවූ බොහෝ ප්‍රාසාදෙපකරණයෙන් ඒ අභය
13 ගිරි විහාරය බොහෝ ප්‍රාසාද ඇතොත්විය. පාපමිත්‍රවූ සඞ්ඝ
මිත්‍ර නම් තෙරුන්ද සොණ නම් සේවකයාද ලැබ ඒ මිහි

Digitized by Google

14 පල්තෙම බොහෝ පවුකෙළේය. ඒ මිහිපල්තෙම පැදුම්
තිස් පව්වෙන් මහගල් පිළිරුව ගෙන්වා අභයගිරියෙහි
15 පිහිටවී. පිළිමගෙය බෝගෙය මනරම් ධාතුසාලාව සත
රැස් සාලාව යන මෙයද කරවීය. කුක්කුටගිරි පිරිවෙන්
16 පෙළ ජීර්ණ ප්‍රතිසංස්කරණයෙන් හැරසීය, දරුණු ක්‍රියා
ඇති ඒ සඟමිත් තෙරුන් කරණකොටගෙණ එකල ඒ අභය
ගිරි විහාරය තෙම දැකුම් කටයුතු විය.
17 රජහුගේ සර්වාර්ථ සාධකවූ මෙඝවර්ණාභය නම් යහළු
ඇමැතිතෙමේ මහවෙහෙර නැස්ම නිමිත්තකොට ගෙණ
18 කිපී (රජහට) දමරිකව මලයරටට ගොස් ලැබූ මහබල
19 සෙන් ඇත්තේ දුරතිස් වැව්හි කඳවුරු ලාගත්තේය. ඒ
මිහිපල්තෙමේ යහළුවා එහි ආබැව් අසා යුද පිණිස පෙරට
20 ගොස් කඳවුරු පිහිටවීය—මලයරටින් ගෙණෙනලද
මිහිරි පානයක් හා මාංසයක් ලැබ "සහාය රජු විනා නො
21 කන්නෙම්" සිතා එය තෙමේම ගෙණ රාත්‍රියෙහි හුදකලාව
22 නික්ම රජුවෙත අවුත් එපවත් දැන්වීය. ඔහු විසින් ගෙ
ණෙනලද්ද ඔහුහා විශ්වාසඇත්තේ අනුභවකොට රජ
තෙමේ "කවර හෙයකින් තෝ මාකෙරෙහි දමරික වූයෙහි
23 දැ"යි ඇමැතියා පිළිවිස්සේය. "තොප විසින් මහාවිහා
රය නැසූ බැවිනැ"යි කීයේය. රජතෙමේ "විහාරය පිහිටු
24 වන්නෙම් මාගේ වරද ක්ෂමා කර"යි මෙසේ කීයේය. ඒ
ඇමැතිතෙමේ රජු තමා කරවීය, ඔහු විසින් හගවනලද
25 රජතෙමේ පෙරළා නුවරට ආයේය. ඒ මෙඝවර්ණාභය
තෙමේ රජුට හගවා (විහාර කරණයට) ද්‍රව්‍ය සම්භාර හේතු
වින් රජු සමග නොආයේය.
26 රජහුගේ වලලභවූ ලේඛාවෙහිද, එක් බිරින්දක් තොම
මහාවිහාර නාසනයෙහි දුක්පූවා එසේම කිපියා, වඩුවාට
27 සඞ්ග්‍රහකොට ඒ විනාසක ෙ ාරණු මැරවීය. ථූපාරාමය න
සන්ට පැමිනියාවූ දුෂ්ට කල්පනා හා දරුණු ක්‍රියාඇති සඟ
28 මිත් තෙරණු මරවා නොසන්හුන් දරුණු සොණ ඇමැති
29 යාද මැරූහු— ඒ මෙඝවර්ණාභය තෙමේ ද්‍රව්‍යසම්භාරය
30 ගෙණ අවුත් මහවෙහෙර නොයෙක් පිරිවෙන් කරවීය.
අභයමහ ඇමැතියා විසින් ඒ භය සංසිඳවූකල භික්ෂූහු ඒ ඒ
31 දිගින් අවුත් මහාවිහාරයෙහි විසූහ. රජතෙමේ මහබෝ
ගෙහි බටහිරදිග ලෝහොරු දෙකක් කරවා තැබ්බවීය.
32 දකුණු අරම් වැසි කුහකවූ වඩක සිත්ඇති පාපමිත්‍රවූ
33 නොසන්හුන් තිස්සතෙරුන් කෙරෙහි පැහැද මහවිහාර
සීමා පෙදෙසන්වූ ජෝතිවන උයන්හි වලකනු ලබනුවාවූද

Digitized by Google

34 ඒ තෙමේ ජේතවන විහාරය කරවීය. ඉක්බිති ඒ තෙමේ
සීමාව උදුරන්ට භික්ෂු සඞ්ඝයාගෙන් ඉල්වීය; භික්ෂූහු ඒ
35 නොදෙනු කැමැත්තෝ විහාරයෙන් පලාගියෝය. මෙහි
සතුරන් විසින් කරණ ලබන්නාවූ සීමා සමූහනය කෝප
36 කරන්ට ඒ ඒ තැන කිසි භික්ෂුකෙනෙක් සැඟවී හුන්නෝය.
37 මෙසේ නවමසක් මහාවිහාරය මුලුල්ලෙහි භික්ෂූන්ගෙන්
තොරවීය. අන්‍යභික්ෂූහු "සීමාසමූහනය කරමහ" යි සිතූය.
38 ඉක්බිති සීමාසමූහන ව්‍යාපාරය නිෂ්ඵල කල භික්ෂූහු අවුදුන් මේ
මහාවිහාරයෙහි විසූහ——විහාර ප්‍රතිග්‍රාහක ඒ තිස්සතෙ
රුන්ට අන්තිම වස්තුවෙන් සත්‍යාර්ථ චෝදනාවක් සඟමැද
39 පැමිණියාය. ධාර්මිකයයි ලෝකසම්මතවූ මහඇමැතියෙක්
තෙමේ වූපරිච්ඡෙදන් දැහැමෙන් විනිශ්චය කොට රජහු
නොකැමැති කලම ඒ තෙරහු සිවුරු හැරවීය.

40 ඒ රජතෙමේම මිණෙනේරි විහාරය කරවීය. ඒ තෙමේම
41 දෙවොල නටබුන්කොට ගෝකණ්ණ විහාරය එකාකාපිල්ල
විහාරය බමුණුගම කලන්දක විහාරය යන විහාරත්‍රය කර
42 වීය. මෑගගම් විහාරය ගගසෙන්ගල වැලි බටගිරිදිග
දූසෙන්ගල යන විහාරද කරවී. තවද රජතෙමේ කොක්වා
43 ජනපදයෙහි මහාවිහාරයක් කරවී. රූපාරම්ම විහාරයද
ශූළපිටි විහාරයද උතුරු අඹගෙබ මෙහෙණවර දෙකක්ද
44 කරවීය. කාලවේලක යක්ෂයාගේ දෙවොලෙහි සෑයකුදු
45 බැඳවී. ලක්දිව්හි දිරූ බොහෝ ආවාසයන් අලුත්වැඩියා
කෙළේය. ඒ තෙමේ සඞ්ඝස්ථවිර දහසකට දහසක් අගණා
46 ස්ථවිරදානයද සියල්ලන්ටම වස්පාසා සිවුරුද දුන්නේය.
ආහාර පනාදි දානයාගේ පරිච්ඡේදය නොපැණේ.

47 ඒ රජතෙමේම රට සුභික්ෂය පිණිස සොලොස් වැවක්
කරවී. ඒනම්, මිණෙනේරි මහවැව ජල්ලූරවැව බාහු නම්
වැව මාමිණියාවැව කෝකවාතවැව මොතරවැව පරක
48 වැව කුම්බාලකවැව වාහනවැව රත්මල්කඩවැව තිහපනම්
49 වැව වෙලංවිට්වැව මාගල්වැව සිරුවැව මහාදරගල්ලක
වැව කළුපහන්වැව යන මොව්හු සොලොස්වැව්හුයි. ඒ
50 තෙමේ ගඟාවෙන් පබ්බත නම් මහාමාවූ ඇළක් කැනවී.
මේ ආකාරයෙන් ඒ රජතෙමේ ඉතා බොහෝවූ පින්හා
පවුත් රැස්කෙළේය.

පූර්වභාගය නිමි.

Digitized by Google

This book is a preservation photocopy.
It was produced on Hammermill Laser Print natural white,
a 60 # book weight acid-free archival paper
which meets the requirements of
ANSI/NISO Z39.48-1992 (permanence of paper)

Preservation photocopying and binding
by
Acme Bookbinding
Charlestown, Massachusetts
1996

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

3 2044 025 022 278

Digitized by Google

Digitized by Google